විගණකාධිපති

වාර්ෂික වාර්තාව

2016

විගණකාධිපති දෙපාර්තමේන්තුව

අපේ දැක්ම

රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙර දැරි කර ගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

අපේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා මනා මූල්‍ය කළමනාකරණ සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම තහවුරු කරනු වස්, විගණනය මෙහෙයවීම මගින් යහපාලනය සහ රාජ්‍ය ගණන්දීමේ වගකීම ප්‍රවර්ධනය කිරීම.

අපගේ අරමුණු

1. සම්පත්වල භාරකාරිත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.
2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.
3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය
නවෝත්පාදනය
නායකත්වය

විගණකාධිපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන රාජ්‍ය මූල්‍ය පාලනය ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයන් පැවැත්වීම හා එය පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයක් වේ. එම කර්තව්‍යන් ඉටු කිරීම සම්බන්ධව 2016 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ අට යටතේ වෙන වෙනම සහාගත කිරීමට කටයුතු යොදා ඇත.

පළමුවන කාණ්ඩය	-	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු
දෙවන කාණ්ඩය	-	රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල හා ව්‍යවස්ථාපිත අරමුදල්
තුන්වන කාණ්ඩය	-	ව්‍යවස්ථාපිත නොවන අරමුදල්
හතරවන කාණ්ඩය	-	විදේශ ආධාර ව්‍යාපෘති
පස්වන කාණ්ඩය	-	පළාත් සභා
හයවන කාණ්ඩය	-	පළාත් පාලන ආයතන
අටවන කාණ්ඩය	-	විශේෂ විගණන වාර්තා
නවවන කාණ්ඩය	-	රාජ්‍ය සමාගම්

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය හා ව්‍යවස්ථාපිත භූමිකාව පිළිබඳව මහජන කථිකාවේ පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය වීම නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුවට මෙම වර්ෂය කාර්ය බහුල වර්ෂයක් විය. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ක්‍රියාකාරී අංශයෙන් පමණක් නොව පරිපාලනය හා මූල්‍ය සම්බන්ධයෙන්ද විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා වැඩි බලතල විගණකාධිපතිවරයා හා ඔහුගේ කාර්යය මණ්ඩලයට ලබාදිය යුතු බව රජය පිළිගෙන තිබුණි. දිගු කාලයක් අපේක්ෂා කළ විගණන සේවා කොමිෂන් සභාව 2015 දෙසැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලදී. එම කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, කාර්ය මණ්ඩලය සේවයෙන් පහකිරීම් හා විනය පාලනය සිදුවිය යුතුව තිබුණි. නමුත් ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත කිරිම සඳහා ඉදිරිපත් නොවීම හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. එබැවින් තවදුරටත් ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ සාමාජිකයන් සිදුකරන ලද, සේවයේ වටිනා දායකත්වය අමාත්‍ය මණ්ඩලය හඳුනාගෙන තිබීම සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය නමින් අලුත් සේවයක් පිහිටුවීමට අනුමත කර තිබුණි. ඉහත සේවාවන් දෙකෙහි නිලධාරීන් නව ඒකීය සේවාවට අවශෝෂණය කිරීම විගණන සේවා කොමිෂන් සභාවට පැවැරී ඇත. අනෙක් ප්‍රධානතම වෙනස්කම වූයේ රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ සියයට 50 ක් හෝ ඊට වඩා වැඩි කොටස් හිමිකමක් ලබා ගෙන ඇති, සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්ද, විගණකාධිපතිවරයාගේ විෂයපථයට ඇතුළත් කිරිමය.

නීතිපතිවරයා, නීති කෙටුම්පත් සම්පාදකවරයා හා නොයෙකුත් ක්ෂේත්‍රයන්හි නිරත වෙනත් වෘත්තීයවේදීන් ගණනාවකගෙන් තොරතුරු විමසීමෙන් අනතුරුව දිගු කාලයක් අපේක්ෂා කළ ජාතික විගණන පනත කෙටුම්පත් කර ඇත. විගණකාධිපතිවරයාට වර්තමානයේ පවරා ඇති සීමිත අධිභාර බලය මුළු රාජ්‍ය අංශයම ආවරණය වන පරිදි තවදුරටත් ව්‍යාප්ත කිරීමට ඉන් යෝජනා කරයි. ගිණුම්කරණ හා විගණන වෘත්තියෙහි කොටසක් ලෙස ගොඩනැගෙන පීඩනය ඇතුළත්ව වඩා අභියෝගකාරී සහ නිරන්තරයෙන් වෙනස්වන පරිසරයකදී දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංවිධානය සිදුකිරීම ඉතා වැදගත් වේ. සියුම් අධීක්ෂණය හා විමර්ශනය සිදුකිරීමට හැකිවන පරිදි සහ විගණන විෂයය පථය පුළුල් කිරීමට හැකිවන පරිදි අංශ 59 ක් යටතේ විගණන හා සහායක සේවා සංවිධානය කරමින් ආයතනයේ සංවිධාන ව්‍යුහය පිළියෙල කර ඇත.

පාර්ලිමේන්තුවේ වැදගත් කාර්යභාරය සැළකිල්ලට භාජනය කිරීම් මෙන්ම රාජ්‍ය අංශය මුහුණදෙන ප්‍රධාන ගැටළු දෙපාර්තමේන්තුව හොඳින් අවබෝධකර ගැනීම සහතික කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව මුල් පිරීම් රාශියක් ක්‍රියාවට නංවා ඇත. විගණන වාර්තා කාර්යක්ෂමව හා ඵලදායීව බෙදාහැරීම උදෙසා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව වර්ධනය කිරීමට හා සමාලෝචනය කිරීමට දෙපාර්තමේන්තුව බැඳි සිටී. අවසානයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී තිබුණ විගණන ස්වාධීනත්වය දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවයේ ප්‍රධාන සාධකය ලෙස ඉතා පැහැදිලි ලෙස හඳුනා ගෙන ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ රාජකාරියට කැපවූ කාර්යය මණ්ඩලය සමඟ වැඩකිරීමට ලැබීම මා ලැබුවාවූ ගෞරවයක් වන අතර ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂමව තත්ත්වයෙන් ඉටුකිරීමට ඔවුන්ගේ කැපවීම සම්බන්ධයෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති තුමන්ලා සහ සාමාජිකයන්

පොදු වෘත්තීයේ යෙදෙන සහාය විගණනයන් සිදුකළ වරලත් ගණකාධිකාරිවරුන්ගෙන් සමන්විත ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය, විගණිත ආයතන, දෙපාර්මේන්තුවේ පරිපාලන කටයුතුවලදී සහයෝගය ලබාදුන් ජනාධිපති ලේකම්තුමා හා ඔහුගේ කාර්යය මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා හා කාර්යය මණ්ඩලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ පරිපාලන කටයුතුවලදී සහාය වූ අනෙකුත් රජයේ ආයතන, දෙපාර්තමේන්තුවේ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට දායක වූ ජාත්‍යන්තර සංවර්ධන සමායතනයේ සහයෝගිතාවයට ස්තුතිවන්ත කිරීමටද මම මෙම අවස්ථාව යොදාගනිමි.

පොදු මහජනතාවගේ හා පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයන් උදෙසා පවතින විගණනය පිළිබඳව සහතික වීමට මම දැඩිව උනන්දු වෙමි.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2017 ඔක්තෝබර් 27 දින.

අපගේ ඉතිහාසය

එවකට ලංකාව යනුවෙන් හැඳින්වුන ශ්‍රී ලංකාවේ වත්මන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාල සීමාව තරම් ඈතට දිවේ. 1776 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් දිවයින අත්පත් කර ගැනීමෙන් වසර 3 කට පසුව එනම්, 1779 වර්ෂයේදී සිසිල් ස්මිත් නමින් ගණකාධිකාරිවරයෙකු හා විගණකාධිපතිවරයෙකුව සිටි බව ලියකියවිලිවලින් සනාථ වේ. එතැන් පටන් ශ්‍රී ලංකාවේ උත්තරීතර විගණන ආයතනය වශයෙන් විගණකාධිපතිවරු 40 දෙනෙකු යටතේ ස්වාධීන ආයතනයක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

විගණන සම්බන්ධව අපේ අධිකාර බලය

රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය මූලික වශයෙන් ලැබෙනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙනි.

සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනක් විසින් දරනු ලබන සමාගම් පනත යටතේ පිහිටුවා ඇති සමාගම්ද, ආවරණය වන පරිදි දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලය තවදුරටත් පහත පරිදි පුළුල් කර ඇත.

''විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය.''

පහත අණපනත් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපති වෙත පවරා ඇති බලය විකාශනය කිරීමක් හෝ ප්‍රසාරණය කිරීමක් හෝ කර තිබේ.

- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය
- මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය
- ප්‍රාදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්තිය
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය
- ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය

පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරී කරගෙන යාමට විගණකාධිපතිවරයා සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද පවරනු ලැබේ. විගණකාධිපතිවරයාගේ කටයුතු හා රාජකාරී ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනීමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ

රාජකාරී කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී සියලු පොත්පත් හා වාර්තා ඉහතින් සඳහන් කරන ලද ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල ගබඩා හා වෙනත් දේපලවලට පිවිසීමට විගණනයන් සිදුකිරීම හා අවශ්‍යවිය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබාගැනීමට විධිවිධාන සලසා ඇත.

අපගේ සේවා ග්‍රාහකයෝ

විගණකාධිපතිවරයාගේ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නිර්වචනය කරන අතර තවදුරටත් එය දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සමාගම් ද ඇතුළත් කරමින් ව්‍යාප්ත කර තිබේ. වර්තමානයේදී අපගේ සේවාලාභී පදනම පහත සඳහන් පරිදි වේ.

අමාත්‍යාංශ	51
දෙපාර්තමේන්තු	95
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	25
සංස්ථා	211
රාජ්‍ය සමාගම් (දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විගණකාධිපතිවරයාගේ විෂය පථයට යටත් කර ඇති)	128
විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන, පර්යේෂණ හා අනෙකුත් පුහුණුකිරීම් ආයතන	75
රාජ්‍ය බැංකු	08
ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්	69
විදේශ අරමුදල් ව්‍යාපෘති	127
අනෙකුත් ස්වාධීන ආයතන	19
පළාත් සභා	09
පළාත් පාලන ආයතන	335
ගොවිජන සේවා මධ්‍යස්ථාන	559
ක්‍රීඩා සංගම්	59

අපගේ විෂය පථය

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂය පථය තීරණය කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන ප්‍රකාරව හඳුන්වා දී ඇති දැනට භාවිතයේ පවතින විගණන ප්‍රමිති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL), උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) හා උත්තරීතර විගණන ආයතන පිළිබඳ ආසියානු සංවිධානය (ASOSAI) විසින් අනුගමනය කරනු ලබන විගණනයට අදාළ සම්මුති සහ ප්‍රශස්ත පරිචයන් මගින් සහ පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපති වෙත මඟ පෙන්වනු ලබයි.

මෙයට අමතරව රාජ්‍ය සංස්ථා සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සලකා බලා තීරණය කළයුතු විගණන විෂය පථය

1971 අංක 38 දරන මුදල් පනත මඟින් වඩා සවිස්තරාත්මකව දක්වා ඇත. ඒ අනුව විගණකාධිපති විසින් සංස්ථාවේ කළමනාකරණය වෙත විස්තරාත්මක වාර්තාවක්, සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කිරීම සඳහා වන වාර්තාවක් සහ පාර්ලිමේන්තුවට වෙනම ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තාවක් වශයෙන් වාර්තා 03 ක් නිකුත් කරනු ලබයි. මුදල් පනතේ විස්තර කර දක්වා ඇති පරිදි හැකිතාක් සහ අවශ්‍යවන ප්‍රමාණයකට විගණන විෂය පථයට පහත කරුණු ඇතුළත් විය යුතුය.

- තොරතුරු ඉදිරිපත් කිරීමේ අංශයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි සංවිධාන ක්‍රම, කාර්ය පටිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලියකියවිලි නියමිත අන්දමට හා ප්‍රමාණවත් ලෙස සකස් කර තිබේද යන බව සහ එවැනි ක්‍රම, කාර්ය පටිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායීව ක්‍රියාත්මකව පවතීද යන බව;
- රාජ්‍ය සංස්ථාවේ වැඩ කටයුතු එම රාජ්‍ය සංස්ථාවට අදාළ නීති, රීති හා නියෝග අනුව වූයේ ද සංස්ථාවේ පරිපාලනයෙහිලා සාධාරණත්වයක් තිබේද යන බව;
- අරමුදල් වෙන්කිරීමේදී හා එම අරමුදල් උපයෝජනය කිරීමේදී ආර්ථිකභාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් ඉටු කර තිබේද යන බව;
- මුදල් තබා ගැනීමේ හා දේපල ආරක්ෂා කිරීමේ ක්‍රම සතුටුදායකද යන බව;
- සැලැකිල්ලට භාජනය වූ කාලපරිච්ඡේදයට අදාළව විගණනයට භාජනය කරන ලද ගිණුම් සංස්ථාවේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කෙරෙන පරිදි ගණකාධිකරණය, මූල්‍යනය හා තක්සේරු කිරීම යන මූලධර්මයන්ට නිසි සැලැකිල්ල යොමු කරමින් පිළියෙල කර තිබේද යන බව සහ
- විගණකාධිපති විසින් අවශ්‍යයැයි සලකනු ලැබිය හැකි වෙනයම් කරුණු.

අපගේ ස්වාධීනත්වය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කර ඇත. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය මත පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග ගැලපීමට මෙය තවදුරටත් විකාශනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව,

''විගණකාධිපතිවරයෙක් වන්නේය. ඔහු සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත්කරනු ලබන

අතර විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනතාක් ස්වකීය ධුරය දරන්නේය.''

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය මත හෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමත් යන තත්ත්වයන්හිදී පමණක් ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක්වනු ලබන අතර ඔහුගේ ධුර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ.

නීත්‍යානුකූල ඉටු කිරීම

නීත්‍යානුකූල ඉටුකිරීම් සඳහා අවශ්‍යතාවය

විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ස්වාධීනත්වය මෙතාක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර තිබුණද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය පවත්නා ව්‍යවස්ථාව හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමා කිරීම් සිදුකර ඇත. විගණකාධිපතිවරයා කිසිදු පුද්ගලයෙකුගේ හා ආයතනයක සියලු බැඳීම්වලින් නිදහස් විය යුතු අතර අත්තනෝමතික පළිගැනීම්වලින් තොරවිය යුතු නිසා මූල්‍ය හා මිනිස් බලය යන දෙවර්ගයෙන් දැක්වෙන ඔහුගේ සම්පත් සඳහා විගණකාධිපතිවරයා විධායකයේ රදාපැවැත්ම පාර්ලිමේන්තුව වෙනුවෙන් සිදුකරන ලද විගණනයේ ස්වාධීනත්වය සැබවින්ම හානියට ලක්වන බව පිළිගනී. මූල්‍ය පරිපාලන ස්වාධීනත්වය ඇතුළුව විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මඟින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැලසිය යුතු වේ. වර්තමානයේදී විගණකාධිපතිවරයා ඔහුගේ වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ සහයෝගය තුළ යැපීම සිදුවන අතර දෙපාර්තමේන්තුවට සම්පත් වෙන්කිරීම දෙපාර්තමේන්තුව මුහුණ දෙන අවදානමට ගැලපෙන පරිදි සිදු නොවේ. අනෙකුත් උසස් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල පරිදි ශ්‍රී ලංකාවේ විගණකාධිපති සඳහා වූ අයවැය, ව්‍යවස්ථාදායක සම්පාදක කමිටුවක් විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව අනුමත කර හෝ ඔහුගේ අයවැය පිළිබඳ විධායක පාලනයට එරෙහි වූ කිසිදු ආරක්ෂාවක් හෝ සලසා නොමැත.

විගණකාධිපතිවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ පරිපාලන ස්වාධීනත්වය සුරක්ෂිත කිරීමට අවශ්‍ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග, වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු පිළිබඳ පාලනය ප්‍රථමයෙන් ජනාධිපති ලේකම් වෙත පැවරී තිබුණු අතර,

පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වෙනි සංශෝධනයට අනුව එම බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) වෙත පැවරී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විගණකාධිපතිවරයා වෙත සම්පූර්ණ වශයෙන් බලතල පැවරීමක් කර නොමැති හෙයින් ප්‍රවර්තන වැඩ පිළිවෙල යටතේ වුවද, විගණකාධිපතිට තම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා පත් කිරීමේදී ගැටලුවලට මුහුණ පෑමට සිදු වී ඇත. විශේෂිත ආයතනයක් වූ අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය සීමාව යටතට එන අධිකරණ සේවය පරිදි භුක්ති විඳිය යුතු ස්වාධීනතාවය පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන කළ විගණන සේවය විශේෂ සේවාවක් වේ.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් පිළිබඳ විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විස්තර කර ඇති පරිදි රජයේ සියලුම පරිපාලන රෙගුලාසි විගණකාධිපතිට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට අදාළවේ. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීනතාවය සීමා කිරීමක් වේ. ඔහුගේ රාජකාරි පිළිබඳ මෙම පරිපාලනමය පාලන අඩුපාඩුව විගණන කටයුතුවලට සැලකිය යුතු ලෙස අවහිර කිරීම් කළ අවස්ථා බොහෝමයක් විය.

එක්සත් ජාතින්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දි අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය පිළිබඳව ස්ථිර වශයෙන් වන පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

1 ප්‍රතිපත්තිය

යෝග්‍ය වූ ද ඵලදායී වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල / ව්‍යවස්ථාපිත / නෛතික කාර්ය රාමුවක් සහ එම කාර්ය රාමුව තුළ තත්ත්වාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පැවතීම.

උත්තරීතර විගණන ආයතන සතු ස්වාධීනත්වයේ ප්‍රමාණය සවිස්තරව විදහා දැක්වෙන නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

2 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන් සහ (විද්‍යායතනික ආයතනවල) සාමාජිකයන් ස්වකීය රාජකාරී සාමාන්‍ය වශයෙන් ඉටු කිරීමේදී ඔවුන්ගේ ධූරයේ ආරක්ෂාව සහ නෛතික පරිසරයේ ස්වාධීනත්වය

පහත සඳහන් තත්ත්වයන්ට යටත්වන උත්තරීතර විගණන ආයතනවල

ප්‍රධානීන්ගේ සහ විද්‍යායතනික ආයතනවල සාමාජිකයන් ගේ පත්වීම්, නැවත පත්වීම්, සේවා නියුක්තිය, සේවයෙන් ඉවත් කිරීම සහ විශ්‍රාම ගැන්වීම පිළිබඳ කොන්දේසි අදාළ නීති සම්පාදනය මගින් විශේෂයෙන් දැක්විය යුතුය.

- ව්‍යවස්ථාදායකයෙන් සහතික කෙරෙන ක්‍රියාවලියක් මගින් ස්වාධීනත්වය තහවුරු කෙරෙන පත්කිරීම්, නැවත පත් කිරීම් හෝ සේවයෙන් ඉවත් කිරීම් (උත්තරීතර විගණන ආයතනවල ස්වාධීනත්වය හා සම්බන්ධ ISSAI II මාර්ගෝපදේශ සහ යහපත් පරිචයන්)
- ස්වකීය නියෝග (Mandate) විරෝධ මත ඉදිරිපත්වීමේ බියකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඉඩ ලැබෙන පරිදි ප්‍රමාණවත් තරම් දීර්ඝ සහ නිශ්චිත කාල සීමාවක් සහිතව කරනු ලබන පත්වීම් ; සහ
- ස්වකීය රාජකාරී නිසියාකාරයෙන් සාමාන්‍ය පරිදි ඉටු කිරීමේදී අතීතයේදී වර්තමානයේදී සිදුකරන ලද කවර හෝ කාර්යයක් හේතු කොට ගෙන සිදු කරනු ලබන පැමිණිල්ලකදී නිර්මුක්ත වීම. (Immune)

3 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනවල කාර්ය ඉටුකිරීමේදී ප්‍රමාණවත් තරම් පුළුල් වූ නියෝගයක් (Mandate) සහ පූර්ණ අභිමතය

පහත සඳහන් කාර්යයන් විගණනය කිරීමේ බලය, උත්තරීතර විගණන ආයතනවලට පැවරිය යුතුය.

- රාජ්‍ය මුදල්, සම්පත් හෝ වත්කම් ලබාගත් අයකු හෝ ප්‍රතිලාභියකු විසින් ඒවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එහි නෛතික ස්වභාවය නොතකා විගණනය කිරීම.
- රජයට හෝ රජයේ ආයතනවලට ලැබියයුතු ආදායම් එකතු කිරීම.
- රජයේ හෝ රජයේ ආයතනවල ගිණුම් පිළිබඳ නීත්‍යානුකූලභාවය සහ නියමානුකූලතාව;
- මූල්‍ය කළමනාකරණයේ සහ වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ; සහ
- රජයේ හෝ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු පිළිබඳ අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීභාවය.

නීති මඟින් එසේ කරන ලෙස නිශ්චිත වශයෙන් නියම කර ඇති අවස්ථාවලදී විනා, උත්තරීතර විගණන ආයතන විසින් රජයේ හෝ රජයේ ආයතනවල ප්‍රතිපත්තිය විගණනය නොකළ යුතු නමුත් ඔවුන්ගේ විගණනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට පමණක් සීමා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන විසින් එම ආයතනවලට අදාල වන අයුරින් ව්‍යවස්ථාදායකය පනවන නීතිවලට ගරු කළයුතු අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය හෝ විධායකය සිදුකරන විධානවලින් හෝ මැදිහත්වීම්වලින් එකී විගණන ආයතන නිදහස් වන්නේය;

- විගණන ගැටළු තෝරාගැනීම ;
- ඔවුන්ගේ විගණන සැලසුම් කිරීම, වැඩසටහන් ගතකිරීම, පැවැත්වීම, වාර්තා කිරීම සහ පසු විපරම් කටයුතු කිරීම ;
- ස්වකීය කාර්යාලය සංවිධානය කිරීම සහ කළමනාකරණය ;
- අනුමත කිරීම් ක්‍රියාත්මක කිරීම ස්වකීය නියෝගයේ (Mandate) කොටසක් වන අවස්ථාවලදී ස්වකීය තීරණ බලාත්මක කිරීම ;

උත්තරීතර විගණන ආයතන විසින් තමන් විගණනය කරනු ලබන සංවිධානවල කළමනාකාරීත්වය තුළ කිසිදු ආකාරයේ මැදිහත්වීමක් හෝ මැදිහත් වන බව පෙනී යන අයුරින් ක්‍රියාකිරීමක් හෝ නොකළ යුතුය.

උත්තරීතර විගණන ආයතන, ස්වකීය විගණිත ආයතන සමඟ වඩා සමීප සම්බන්ධතා ඇති කර නොගන්නා බවට සහතික විය යුතුය. ඒ අනුව ඔවුන් අරමුණුවලට අනුකූලව කටයුතු කරමින් සිටින බව විදහා දැක්විය යුතුය.

ස්වකීය වගකීම් ඉටු කිරීමේදී උත්තරීතර විගණන ආයතනවලට පූර්ණ අභිමතය අනුව ක්‍රියා කළහැකි විය යුතුය. ඔවුන් රාජ්‍ය අරමුදල් භාවිතය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට වෙහෙසෙන රාජ්‍ය හෝ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ද ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ ද අනෙකුත් පිළිගත් ප්‍රමිති නියම කරන ආයතනවලද නිල ලේඛන පදනම් කරගත් යෝග්‍ය වූ වැඩ සහ විගණන ප්‍රමිතීන් ද ආචාර ධර්ම සංග්‍රහයක් ද උත්තරීතර විගණන ආයතන විසින් භාවිත කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රඥප්තිවලින් හෝ නීති සම්පාදනය මඟින් නියම කර ඇති ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාවක් උත්තරීතර විගණන ආයතන විසින් ව්‍යවස්ථාදායකයට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට ඉදිරිපත් කළ යුතුය. එම ආයතන විසින් එකී වාර්තාව මහජනයා වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

4 ප්‍රතිපත්තිය

සීමාවකින් තොරව තොරතුරු ලබා ගතහැකි වීම

උත්තරීතර විගණන ආයතනය සතු ව්‍යවස්ථාපිත වගකීම් නිසියාකාරව ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන සහ තොරතුරු කලට වේලාවට, වැරදීමකින් තොරව, සෘජුවම සහ නිදහසේ ලබා ගැනීමට ප්‍රමාණවත් බලතල එම ආයතන සතු විය යුතුය.

5 ප්‍රතිපත්තිය

ස්වකීය වැඩ පිළිබඳව වාර්තා කිරීමට ඇති අයිතිය සහ බැඳීම

ස්වකීය විගණන කාර්යයේ ප්‍රතිඵල වාර්තා කිරීම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට සීමා කිරීම් නොකළ යුතුය. ස්වකීය විගණන කාර්ය ප්‍රතිඵල යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක්වත් වාර්තා කිරීමට ඔවුන්ට නීතියෙන් නියම කළ යුතුය.

6 ප්‍රතිපත්තිය

විගණන වාර්තාවල අන්තර්ගතය සහ කාල නියමය තීරණය කිරීමේ නිදහස සහ ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරීම

- ස්වකීය විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතනවලට තිබේ.

- විගණනය කරනු ලබන ආයතනයේ අදහස් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගනිමින් ස්වකීය විගණන වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.

- විගණන වාර්තාවල සඳහන් විය යුතු අවම අවශ්‍යතා නිශ්චිතව දැක්වීමත් යෝග්‍ය අවස්ථාවලදී විධිමත් විගණන මතයකට හෝ සහතික කිරීමකට නිශ්චිත කරුණු දැක්වීමක් නීති මගින් කළ යුතුය.

- වාර්තා කිරීමට අවශ්‍ය කරුණු නිශ්චිත වශයෙන් නීතියෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර ස්වකීය විගණන වාර්තාවල කාල නියමය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.

- සමස්තයක් වශයෙන් ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක්, හෝ රජය විසින් විමර්ශනයක් නැතහොත් විගණනයක් සඳහා විශේෂ ඉල්ලීම් කළ විට උත්තරීතර විගණන ආයතනවලට ඒවා ඉටු කළ හැකිය.

- උත්තරීතර විගණන ආයතනවල වාර්තා නීතියෙන් නියම වී ඇති පරිදි අදාළ බලධාරීන්ට විධිමත්ව ඉදිරිපත් කිරීමෙන් හෝ භාරදීමෙන් පසු ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරිය යුතුය.

7 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනයේ නිර්දේශ පිළිබඳ ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණ පැවතීම

- උත්තරීතර විගණන ආයතන ස්වකීය වාර්තාවල සඳහන් නිශ්චිත නිර්දේශ සමාලෝචනය කොට පසු විපරම් කටයුතු කරමින් විශෝධන පියවරවල් ගැනීම සඳහා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

- උත්තරීතර විගණන ආයතනවල මෙන්ම අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය යන මේවායේ නිරීක්ෂණ සහ නිර්දේශ නිසියාකාරව ක්‍රියාත්මක කරන බව තහවුරු කර ගැනීමට එම විගණන ආයතනවලට ස්වකීය වූ අභ්‍යන්තර පසු විපරම් ක්‍රමයක් පවතී.

- පසු විපරම් කටයුතු සහ අනුමත කිරීම් සඳහා ස්වකීයම වූ ව්‍යවස්ථාපිත බලතල උත්තරීතර විගණන ආයතන සතුව තිබිය දී පවා එකී විගණන ආයතන ස්වකීය පසු විපරම් වාර්තා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත, සලකා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරයි.

8 ප්‍රතිපත්තිය

මූල්‍ය සහ කළමනාකරණ / පරිපාලන ස්වායත්තතාව සහ යෝග්‍ය මානව, භෞතික සහ මූල්‍ය සම්පත් පැවතීම

- උත්තරීතර විගණන ආයතනවලට අවශ්‍යකරන සහ සාධාරණ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිබිය යුතුය. මෙම සම්පත් ලබා ගැනීම පාලනය කිරීමට හෝ මෙහෙයවීමට විධායකය ඉදිරිපත් නොවිය යුතුය. උත්තරීතර විගණන ආයතන ස්වකීය අය වැය ඔවුන් විසින්ම කළමනාකරණය කරගෙන සුදුසු පරිදි වෙන් කර ගනිති.

- ව්‍යවස්ථාදායකය හෝ එහි එක් කොමිෂන් සභාවක් උත්තරීතර විගණන ආයතනවලට ස්වකීය නියෝගය (Mandate) සපුරාලීමට අවශ්‍ය කරන නිසි සම්පත් ඉඳුරාම ලබාදෙන බවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.

- උත්තරීතර විගණන ආයතනවලට සපයා ඇති සම්පත් ඔවුන්ගේ නියෝගය (Mandate) සපුරාලීමට පියවර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඒ සම්බන්ධයෙන් කෙළින්ම ව්‍යවස්ථාදායකයට අභියාචනා කිරීමේ අයිතිය එකී විගණන ආයතන සතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම වෙනමම විගණන පනතක් මගින් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තර කිරීමට අවශ්‍ය වේ.

විගණකාධිපතිවරයාට පරික්ෂා කළ හැකිවනුයේ රාජ්‍ය ආයතනවල කටයුතු පමණක්ය. කෙසේ වුවද, සම්පූර්ණයෙන් හෝ කොටසක් අයිති, සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද රාජ්‍ය සමාගම් විගණකාධිපතිවරයාගේ විෂය පථයට නොගැනේ. කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 50 ක් හෝ ඊට වඩා වැඩි ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර ආයතනයෙන් ප්‍රාග්ධනය ලෙස යොදවන රාජ්‍ය සමාගම් 200 කට වඩා වැඩි ප්‍රමාණයක් පවතියි. රාජ්‍ය ව්‍යාපාර විසින් සැලකිය යුතු සමාගම් සංඛ්‍යාවක් පිහිටුවා ඇත. තවද, රාජ්‍ය ආයතනයකින් අරමුදල් ලැබුණු සංවිධානද ඇතුළුව පෞද්ගලික සංවිධාන විමර්ශනය කිරීමට විගණකාධිපතිවරයාට නොහැකි වී ඇත.

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ 153 හා 154 ව්‍යවස්ථාවන්ට සිදුකළ සංශෝධන

විගණකාධිපතිවරයා විසින් මුහුණ දුන් පරිපාලන හා මූල්‍ය ස්වාධීනත්වයේ අඩුපාඩු මඟ හැරීම සඳහා පහත සඳහන් සංශෝධනයන් දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදු කර ඇත. රාජ්‍ය විගණනය නවීකරණය කරමින් තවදුරටත් ප්‍රතිසංස්කරණයන් විගණන පනත් කෙටුම්පතෙහි ඇතුළත් කර ඇත.

- විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටිනතාක් ස්වකීය ධූරය දරන්නේය.

- විගණකාධිපතිවරයා සභාපතිත්වය දරන විගණන සේවා කොමිෂන් සභාවක් පිහිටවනු ලැබේ. නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධූරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙකු, ශ්‍රී

ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමලත් I වන පන්තියේ නිලධරයෙකු අනෙකුත් සාමාජිකයන් වනු ඇත. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශයන්ට යටත්ව වර්ෂ 03 ක ස්ථිර කාලපරිච්ඡේදයකට කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත්කරයි.

- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සමාජිකයන්ගේ බඳවාගැනීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවැරීමෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.

- රජය විසින් රාජ්‍ය සමාගමක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 50 කට වැඩි හිමිකමක් ඇති රාජ්‍ය සමාගම් සියල්ලේ විගණනය විගණකාධිපතිවරයාගේ විෂයය පථය යටතට ගැනේ.

- විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනිමට ''රාජ්‍ය නිලධාරියා'' යන නිර්වචනයෙන් ඉවත් කරයි.

- විධායකගේ කිසිදු මැදිහත්වීමකින් තොරව විගණකාධිපතිවරයාගේ කටයුතු සිදුකිරීමට ප්‍රමාණවත් අරමුදල් සපයන බවට සහතික කර ගැනීමට විගණන සේවා කොමිෂන් සභාව විසින් පිළියෙළ කරන ජාතික විගණන ආයතනයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුව විසින් නිශ්චය කිරීම.

යෝජිත ජාතික විගණන පනත් කෙටුම්පත

රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තු පාලනය ශක්තිමත් කිරීමට, රාජ්‍ය සම්පත් භාවිතා කිරීම පිළිබඳ වාර්තා කිරීමේ ගිණුම් කටයුතුභාවය සහතික කිරීමේ විගණකාධිපතිවරයාගේ කටයුතු, අධිභාර බලය සහ ස්වාධීනත්වය වැඩි කිරීමට, රාජ්‍ය සම්පත් භාවිතා කිරීමේදී පිරිමැසුම්බව, කාර්යක්ෂමතාවය ඵලදායිතාවය ඉහළ නැංවීමට අධිකාර බලය ඔප්නංවමින් විගණන කෙටුම්පත් පනතක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ජාතික විගණන පනත් කෙටුම්පත නීතිපතිවරයා සහ නීති කෙටුම්පත්වරයාගෙන් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර මහජන අදහස් සඳහා ගැසට් පත්‍රයේ පල කරනු ඇත.

ඉහතින් දක්වන ලද ජාතික විගණන පනත් කෙටුම්පතේ සඳහන් ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය, විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක් සිදුකිරීමට හැකිවෙන ලෙසට ඔවුන්ගේ ගිණුම්කටයුතුභාවය, තාක්ෂණික විගණනයන් සිදුකිරීමට විගණකාධිපතිවරයාට හැකිවන පරිදි විෂය පථය වැඩිකිරීමට අපේක්ෂා කරයි.

- මහජනයා අතරින් යම්කිසි පුද්ගලයෙකු විසින් විගණිත ආයතනයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යම්කිසි ගැටළුවක් විමර්ශනය කිරීමට සහ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා

කිරීම විගණකාධිපතිවරයාගේ අභිමතානුසාරී බලය පරිදි සිදු කිරීම.

- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය විසින් බාරගනු ලබන අතර එය සියලු විගණනයන්ට අදාළ වේ.
- විගණකාධිපතිවරයාට හෝ අධිකාර බලයලත් නිලධාරියෙකුට සහාය නොදැක්වීම වරදක් වන බවට පනතෙහි විධිවිධාන සළසා තිබේ.

- රහස්‍යභාවය නොසළකා, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, පොත්, ලියවිලි හෝ තොරතුරුවලට පිවිසීමේ ඉඩකඩ සළසාලමින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කර ඇත.

- ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හෝ ගිණුම් විගණනය කර විගණන පිරිවැය අයකර ගැනීමට විගණන ගාස්තුවක් නියම කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය දෙනු ලැබේ.

- විගණකාධිපතිවරයාගේ මතය පරිදි ගනුදෙනුවක් කවර හෝ නීතියකට, රෙගුලාසියකට හෝ රීතියකට පටහැනිව කර තිබීමෙන් එම ගනුදෙනුවට අදාල වුවන්ගේ වංචාව, නොසැලකිල්ල, දූෂණය හෝ විෂමාචාරය හේතුවෙන් අඩුවක් හෝ පාඩුවක් සිදුවන අවස්ථාවකදී හෝ ඇතුළත් කළ යුතු කවර වූ හෝ ගනුදෙනුවක් ගිණුම්වලින් අත්හැර තිබෙන අවස්ථාවකදී එවැනි සියලු ගනුදෙනුවල මූල්‍ය හෝ වෙනත් වටිනාකම, ප්‍රතික්ෂේප කිරීමට විගණකාධිපතිවරයාට හැකි වන්නේය. එවැනි ගනුදෙනුවට අදාල මුළු වටිනාකම අධිභාර කිරීමේ බලතල විගණකාධිපතිවරයාට ලබාදෙනු ලැබේ. එකී ගනුදෙනුවේ වටිනාකම එයට වගකිවයුතු පුද්ගලයන්ගෙන් වෙන් වෙන්ව හෝ සාමූහික වන පරිදි අධිභාර කිරීමට විගණකාධිපතිවරයාට හැකිය.

- අධිභාරයන් පැනවීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් පුද්ගලයෙකුට, එයට එරෙහිව විගණන සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමට අයිතිවාසිකම් තිබේ. කොමිෂන් සභාව අවසාන තීරණය ගනු ලැබේ.

- වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කාලරාමු නියම කිරීම.

- රටේ උත්තරීතර විගණන ආයතනය ලෙස ජාතික විගණන කාර්යාලයක් පිහිටුවනු ලැබේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු විගණන කාර්ය මණ්ඩලය ජාතික විගණන කාර්යාලයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

- ජාතික විගණන කාර්යාලය විගණනය කිරීමට සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයෙකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
- මේ පනත මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් නියම කරනු ලැබේ.

- අභ්‍යන්තර විගණනයේ පැවැත්ම සහ කර්තව්‍යන් මේ පනත මඟින් නිර්වචනය කරනු ලැබේ.

- ජනරජයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවධාරණය කර තිබේ.

- විගණන හා කළමනාකරණ කමිටුවල පැවැත්ම සහ ඒවායේ සඵල ක්‍රියාකාරීත්වය අවධාරණය කර තිබේ.

- විගණකාධිපතිවරයාට තොරතුරු සපයන පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කර තිබේ.

විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අවංක විශ්වාසයෙන් හෝ එකී අදහසින් යුක්තව සිදු කරනු ලබන කිසිදු කටයුත්තකින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉටු කරනු ලබන පූර්ව නීතිමය කටයුත්තකට එරෙහිව පැනනගින නීතිමය පියවරයන්ගෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

අපගේ සංවිධාන සටහන

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර දෙපාර්තමේන්තුවේ මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ වර්තමාන සංවිධාන ව්‍යුහය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය හා අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වල රැඳුණු නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධුරාවලි 4 කින් සමන්විත වේ.

පළමු මට්ටම අතිරේක විගණකාධිපතිවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් මධ්‍යම රජයේ හා පළාත් සභාවල විගණන කටයුතු සිදු කරනු ලැබේ. දෙවැනි මට්ටම නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනෙකු යටගේ අංශ 60 කින් සමන්විත වේ. එම අංශ 60 භාරව සහකාර විගණකාධිපතිවරුන් 44 ක් කටයුතු කරනු ලැබේ. මෙම අංශ ප්‍රධානීන් වෙත පැවැරෙන විගණන "ශාඛා" වන්හි ප්‍රධානත්වය "ශාඛා ප්‍රධානී" ලෙස විගණන අධිකාරිවරයෙකු හෝ විගණන පරීක්ෂක සේවයේ ජ්‍යෙෂ්ඨ තම නිලධාරියෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් තුන්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ට පැවැරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් කාර්යක්ෂව හා ඵලදායිව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කරවීම අපේක්ෂා කර ඇත.

ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම නිලධාරීන් සිව්වන මට්ටමට අයත් වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වේ. ඉහත සඳහන් දෙවන මට්ටමට අයත්වන අංශ 60 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ නවයක ප්‍රධානීන් 18 දෙනෙකු පළාත් මට්ටමින් ප්‍රාදේශීය කාර්යාල භාරව කටයුතු කරන අතර ඔවුන්ගේ අධීක්ෂණයට නියෝජ්‍ය විගණකාධිපතිවරුන් තිදෙනෙකු කටයුතු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන) යටතේ වන ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී යටතේ ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි. විගණනය ක්‍රියාත්මක කිරීමට අදාළ සංවිධාන සටහන පහත සඳහන් කර ඇත.

Auditor General
Add.AG(CGSE)
Add.AG(CGMD)
Add.AG(PZIA)
DAG(PEN)
DAG(TQC)
DAG(FBD)
DAG(CGL)
DAG(SBE)
DAG(OPE)
DAG(SOF)
DAG(ADM)
DAGFFP)
DAG(JPC)
DAG(SIN)
DAG(MDP)
Cheef Accountan
Directo(Admin)
DAG(WNS)
DAG(NNE)
DAG(USC)
AAG(PER) SA'S AE'S
AAG(JPA) SA'S AE'S
AAGHSM) SA'S AE'S
AAG(TIP) SA'S AE'S
AAG(FLS) SA'S AE'S
AAG(TRD) SA'S AE'S
AAGRQC) SA'S AE'S
AAGITE) SA'S AE'S
AAG(CMU) SA'S AE'S
AAG(LEG) SA'S AE'S
AAG(BAF) SA'S AE'S
AAG(POS) SA'S AE'S
AAG((AVA) SA'S AE'S
AAG(WSS) SA'S AE'S
AAG(EDU) SA'S AE'S
AAGHED) SA'S AE'S
AAG(LOR) SA'S AE'S
AAG(SUR) SA'S AE'S
AAG(TCM) SA'S AE'S
AAG(IEN) SA'S AE'S
AAG(HUD) SA'S AE'S
AAG(RCT) SA'S AE'S
AAG(MED) SA'S AE'S
AAG(CAS) SA'S AE'S
AAG(POE) SA'S AE'S
AAG(VTY) SA'S AE'S
AAG(FFP) SA'S AE'S
AAG(EGN) SA'S AE'S
AAG(DEF) SA'S AE'S
AAG(DMG) SA'S AE'S
AAG(TRE) SA'S AE'S
AAG(LEW) SA'S AE'S
AAG(AGL) SA'S AE'S
AAG(PLA) SA'S AE'S
AAG(SIN) SA'S AE'S
AAG(CTP) SA'S AE'S
AAG(CEN) SA'S AE'S
AAG(IMU) SA'S AE'S
AAG(EHA) SA'S AE'S
AAG(PUR) SA'S AE'S
Accountan MAS
AD(Admin) MAS
AAG(WNP1) SA'S AE'S
AAG(WNP2) SA'S AE'S
AAGNWP) SA'S AE'S
AAG(NWL) SA'S AE'S
AAG(SNP) SA'S AE'S
AAG(SNL) SA'S AE'S
AAG(NCL) SA'S AE'S
AAG(NNP) SA'S AE'S
AAG(NNL) SA'S AE'S
AAG(ENP) SA'S AE'S
AAG(ENL) SA'S SA'S
AAG(UVP) SA'S SA'S
AAG(UVL) SA'S SA'S
AAG(CLP) SA'S SA'S
AAG(CLL) SA'S SA'S
AAG(SGP) SA'S SA'S
AAG(SGL) SA'S SA'S

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වගකීම හා කාර්යභාරය පිළිබඳ ඇගැයීමකින් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2011 නොවැම්බර් 14 දින අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය අනුව ශ්‍රී ලංකා විගණන සේවයේ මුළු නිලධාරීන් ගණන 350 ක්ද, විගණන පරීක්ෂක සේවයේ මුළු නිලධාරීන් ගණන 1200 ක්ද විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්ථාපිත කළ ශ්‍රී ලංකා විගණන කොමිෂන් සභාව බලාත්මක කිරීම සඳහා ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත නොවීම නිසා එම කොමිෂන් සභාව බලාත්මක වී නොමැත. එනිසා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කෙටුම්පත් කර ඇති සේවා ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට නොහැකි වී ඇති අතර, ඇති වන පුරප්පාඩු පිරවීමට පැරැණි සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

එම තත්ත්වය යටතේ 2016 වර්ෂය ආරම්භයේ, 2016 වර්ෂය අවසානයට හා 2017 මැයි 31 දිනට දෙපාර්තමේන්තුවේ ඒ ඒ තනතුරුවල පැවැති පුරප්පාඩු සංඛ්‍යාව පහත වගුව 01හි දැක්වේ.

තනතුර	2016 ජනවාරි 01 දිනට			2016 දෙසැම්බර් 31 දිනට			2017 මැයි 31 දිනට		
	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
විගණන කාර්ය මණ්ඩලය									
අතිරේක විගණකාධිපති	3	2	1	3	2	1	3	1	2
නියෝජ්‍ය විගණකාධිපති	15	9	6	15	4	11	15	3	12
සහකාර විගණකාධිපති	44	32	12	44	29	15	44	28	16
විගණන අධිකාරි	288	160	128	288	227	61	288	229	59
විගණන පරීක්ෂක	1200	1022	178	1200	922	278	1200	1082	118
විගණන නොවන කාර්ය මණ්ඩලය									
අධ්‍යක්ෂ - පරිපාලන	1	1	-	1	1	-	1	1	-
ප්‍රධාන ගණකාධිකාරී	1	1	-	1	1	-	1	-	1
අනෙකුත් මාණ්ඩලික නිලධාරීන්	5	2	3	6	3	3	5	3	2
රාජ්‍ය කළමනාකරණ සහයක සේවාව හා සමාන්තර ශ්‍රේණි	184	153	31	185	149	36	186	155	31
කණිෂ්ඨ සේවකයින්	183	143	40	188	154	34	213	175	38
එකතුව	**1924**	**1525**	**399**	**1931**	**1492**	**439**	**1956**	**1677**	**279**

වගුව 01 - කාර්ය මණ්ඩල තත්ත්වය 2016 දෙසැම්බර් 31 දිනට හා 2017 මැයි 31 දිනට

ඉහත සටහනේ සඳහන් පරිදි අනුමත කාර්ය මණ්ඩලවල එක් එක් සේවාවන්හි විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත පැවරි ඇති වගකීම් හා කාර්යභාරය ඉටු කිරීම කෙරෙහි විශාල බාධාවක්ව පැවැතුණි. ඒ අනුව පවතින පුරප්පාඩු පියවා ගැනීම සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගැනීම දෙපාර්තමේන්තුව මට්ටමින් මේ වන විටත් සිදු කර ඇත.

- අළුතින් මිලදී ගත් වාහන සඳහා රියදුරන් 25 දෙනෙකු බඳවා ගැනීම.

- කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු 10 ක්, සංචාරක බංගලා භාරකරු පුරප්පාඩු 10 ක්, ජලනල කාර්මික පුරප්පාඩු 01 ක් හා විදුලි කාර්මික පුරප්පාඩු 01 ක් පිරවීමට 2017 සැප්තැම්බර් 30 දින වන විට කටයුතු කර ඇත.

- 2017 වර්ෂයේදී විගණන පරීක්ෂකවරුන් 174 ක් බඳවා ගන්නා ලදී.

සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීම

- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන්ගෙන් හා විගණන පරීක්ෂකවරුන්ගෙන් සමන්විත වේ. එවකට පැවති තත්ත්වය අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මෙම සේවාවන් දෙක සඳහා වෙන වෙනම සේවා ව්‍යවස්ථාවන් පිළියෙල කරනු ලැබුවත් ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් වූ විවිධ යෝජනා හා ඉල්ලීම් පිළිබඳව තවදුරටත් සලකා බැලීම සඳහා ජනාධිපති ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් හා හිටපු විගණකාධිපතිවරුන් දෙදෙනෙකු හා ජනාධිපති අතිරේක ලේකම්වරයෙකුගේ සාමාජිකත්වයෙන් සමන්විත විය. එම කමිටු නිර්දේශ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය යන සේවාවන් දෙක ඒකාබද්ධ කර "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" නමින් නව සේවයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 දෙසැම්බර් 23 දින අනුමැතිය ලබාදී තිබුණි.

- එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය ඒකාබද්ධ කර, ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබුණි. ඒ අනුව නව සේවාව සඳහා සේවා ව්‍යවස්ථාවක් පිළියෙල අවසන් කර තිබුණත්, රාජ්‍ය විගණන කොමිෂන් සභාව ස්ථාපිත කර තිබුණත්, එය බලාත්මක වීම සඳහා ජාතික විගණන සේවා පනත 2016 සැප්තැම්බර් 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සම්මත නොවීම හේතුවෙන් කටයුතු අවසන් කර ඇති සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීමට නොහැකි වී ඇත. නව සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම තුළින් විගණකාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයන් හා කර්තව්‍යන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වඩාත් පුළුල් වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩල පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. එසේම, නව සේවාවේ පත්වීම් හා විනය බලධාරියා විගණන සේවා කොමිෂන් සභාව බැවින් ප්‍රමාදයකින් තොරව එම කටයුතු ඉටු

කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට පිටිවහලක් වනු ඇත.

කාර්ය මණ්ඩල පුහුණුව

විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටුකිරීමේදී වර්තමාන ආයතනික හා සමාජයීය අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස වඩා කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමටත්, ජාත්‍යන්තර උත්තරීතර විගණන ආයතනවල (INTOSAI and ASOSAI) මගපෙන්වීම් හා අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි කාර්යසාධන (Performance), පාරිසරික (Environment), තොරතුරු තාක්ෂණ හා පද්ධති (IT and System), සැපයුම් හා සේවා (Procurement), රාජ්‍ය ව්‍යාපාර (Public Enterprises) හා වොහාරික (Forensic) යන ක්ෂේත්‍රයන්ද ආවරණය වන පරිදි විගණනයන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ඉටු කිරිම කළ යුතුව ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මකවීමත් සමගම, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ඇති හා රජයට සියයට 50 ක් හෝ ඊට වැඩි හිමිකමක් ඇති සීමිත සමාගම් (පොදු හා පෞද්ගලික) 100 කට වැඩි සංඛ්‍යාවක විගණනයද, විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යභාරයට අලුතින් ඇතුළත් වී තිබුණි. ඒ අනුව විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යභාරය තවත් පුළුල් විය. එම කාර්යභාරය ඉටු කිරීම උදෙසා විගණන නිලධාරීන් 1182 ක් හා සහයක සේවාවන්වලට අයත් නිලධාරීන් 306 කින් සමන්විත කාර්ය මණ්ඩලයක දායකත්වය වර්තමානයේ විගණකාධිපති දෙපාර්තමේන්තුට සතුව පැවැතුණි.

විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යභාරය පුළුල් වුවද, ඊට සමගාමීව කාර්යභාරය ඉටුකිරීමට අවශ්‍ය පරිදි විගණකාධිපතිවරයාගේ විගණන කාර්ය මණ්ඩලය දැනුමෙන් හා කුසලතාවන්ගෙන් සංවර්ධනය කිරීමට අවශ්‍ය දේශීය හා විදේශිය පුහුණු අවස්ථාවන් නිලධාරීන්ට පසුගිය වර්ෂ 10 කට ආසන්න කාලය තුළ ප්‍රමාණවත් ලෙස නොලැබීම නිසා ව්‍යවස්ථාපිත කාර්යභාරය ඵලදායී ලෙස ඉටුකිරීම මහත් අභියෝගයක් වී තිබුණි.

එබැවින් එම අභියෝගවලට මුහුණ දීමේදී, විගණන කාර්ය මණ්ඩලය න්‍යායාත්මක, ශිල්පීය/තාක්ෂණික දැනුමෙන් හා කුසලතාවන්ගෙන් සන්නද්ධ කිරීමේ අවශ්‍යතාවයේ වැදගත්කම සැලකිල්ලට ගෙන විගණන කාර්ය මණ්ඩලය වර්තමානයට සරිලන ලෙස දැනුමෙන් හා කුසලතාවයෙන් සන්නද්ධ කිරීම අරමුණ ඇතිව දෙපාර්තමේන්තුවේ සෑම විගණන නිලධාරියෙකු විසින්ම තම වෘත්තීයේ අඛණ්ඩ සංවර්ධනය (Continuous Professional Development – CPD) සඳහා වර්ෂයකට පැය 80 කට නොඅඩු දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලාවන් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය දෙපාර්තමේන්තුවේ වර්තමාන පරිපාලනය විසින් හඳුනා ගන්නා ලදී.

ඒ අනුව නිලධාරීන්ට ඔවුන්ගේ අවශ්‍යතාවයට ගැලපෙන ලෙස නේවාසික හා අනේවාසික පුහුණු වැඩසටහන් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය විසින් සංවිධානය කිරීම තුළින් ඔවුන්ට අවශ්‍ය සහය ලබා දෙමින් ඔවුන්ව දිරිගැන්වීමට කටයුතු කරනු ලැබේ. එහිදී සම්පත්දායකයින් ලෙස දෙපාර්තමේන්තුවේ සිටින සුදුසුකම් සහිත දක්ෂ නිලධාරින්ගේ සහය මෙන්ම බාහිර දේශකවරුන්ගේ සහයද ලබා ගැනීමට කටයුතු කරනු ලැබන අතර පුහුණු කිරීම් ක්‍රමවේද ලෙස දේශන,

සාකච්ඡා, කණ්ඩායම් ඉලක්ක, ක්ෂේත්‍ර චාරිකා ආදිය යොදා ගැනීම තුළින් පහත අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- නිලධාරීන්ගේ දැනුම හා තාක්ෂණික කුසලතා සංවර්ධනය
- නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- නිලධාරීන්ගේ කළමනාකරණ හැකියාවන් වර්ධනය
- රාජකාරී ඉටුකිරීමෙහිලා අවශ්‍යවන දැනුම, මෙවලම් හා ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම
- නිලධාරීන්ගේ ආකල්පමය වශයෙන් වෙනසක් ඇතිකිරීම සඳහා වූ වැඩසටහන් පැවැත්වීම

ඉහත අරමුණු සපුරා ගැනීම උදෙසා 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය මගින් සියලුම ස්ථරවල විගණන නිලධාරීන් ආවරණය වන පරිදි නිලධාරීන් 2,269 දෙනෙකු සඳහා මාතෘකා 13ක් යටතේ පුහුණු වැඩසටහන් 39 ක් පවත්වා තිබුණි. අවස්ථා 4 කදී දෙපාර්තමේන්තුවේ සිටින විගණන නොවන කාර්යමණ්ඩලයේ නිලධාරීන් 31ක් සඳහාද පුහුණු පහසුකම් ලබා දී තිබුණි. එසේම රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් යහපාලනය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව බාහිර රාජ්‍ය ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ද සමාලෝචිත වර්ෂයේදී පළාත් 3ක් ආවරණය වන පරිදි නිලධාරීන් 387ක් සඳහා වැඩමුළු 3ක් පවත්වන ලදී. වගුව 02 හි විස්තර දක්වා ඇත.

දේශීය පුහුණු වැඩසටහන් වලට සමගාමීව, භාණ්ඩාගාර ලේකම්වරයාගේද එකඟත්වය ඇතිව, මැලේසියාවේ ජාතික විගණන ඇකඩමියේ සති දෙකක කාර්යසාධන විගණනය පිළිබඳ පුහුණු වැඩසටහනට නිලධාරීන් සහභාගී කරවීමට තීරණය කරන ලදුව, සහකාර විගණකාධිපති, විගණන අධිකාරී හා විගණන පරීක්ෂක තනතුරුවලට අයත් නිලධාරීන් 80කින් සමන්විත මුල්ම කණ්ඩායම 2016 නොවැම්බර් මාසයේ පැවති පුහුණු වැඩසටහනට සහභාගී කරවීමට හැකිවූ අතර සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 80 ක් හා මාතෘකා 10ක් ආවරණය වන පරිදි නිලධාරීන් 95 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන් 15 කට සහභාගී කරවා ඇත. විස්තර වගුව 02 හි දක්වා ඇත.

	වැඩසටහන් විස්තරය	සහභාගී වූ නිලධාරීන්						දින ගණන	මිනිස් දින ගණන
		වැඩ සටහන් ගණන	අංශ ප්‍රධානීන්	විගණන අධිකාරී	විගණන පරීක්ෂක	විගණන නොවන නිලධාරීන්	එකතුව		
	දේශීය පුහුණු:								
1.	මූල්‍ය විගණන පුහුණුව	1	-	9	21		30	3	90
2.	නවක නිලධාරීන් පුහුණුව	1			40		40	10	400
3.	ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් විගණනය	10	10	145	135	4	294	34	941
4.	ව්‍යාපෘති විගණනය	2		25	48		73	4	146
5.	අධිභාර ක්‍රියාවලිය හා පළාත් පාලන විගණනය	2	6	24	83		113	12	466
6.	ප්‍රමිත පිළිබඳ පුහුණුව	5		29	51		80	30	366
7.	පරිගණක පිළිබඳ පුහුණුව	1		2	32		34	2	68
8.	පුහුණුකරුවන් පුහුණු කිරීම	1	4	16	20		40	3	120
9.	පරිපාලන හා අධීක්ෂණය පිළිබඳ පුහුණුව	3		2	1	3	6	6	18
10.	ධනාත්මක චින්තන සංවර්ධන වැඩසටහන	3	107	464	673	20	1264	3	1264
11.	යහපාලනය සම්බන්ධ දැනුවත් කිරීම	9	6	36	182	387	611	6	611
12.	අංශ ප්‍රධානීන් සඳහා වන වැඩමුළු	2	83				83	4	168
13.	වෙනත් පුහුණු වැඩසටහන්	4		9	6	4	19	5	28
	එකතුව	43					**2,687**	**119**	**4,686**
	විදේශීය පුහුණු :								
1.	කාර්යසාධන විගණනය	2	4	17	60		81	20	820
2.	තානාපති කාර්යාල විගණනය	3	4				4	29	48
3.	තොරතුරු තාක්ෂණ පුහුණුව	1			1		1	12	12
4.	E-governance	1		1			1	26	26
5.	ASSOSAI/ SAI පුහුණු වැඩසටහන්	3	1	2			3	13	13
6.	රාජ්‍ය විගණන කළමනාකරණය	1		1			1	20	20
7.	රජයේ ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණය	1		1			1	21	21
8.	දූෂණ විරෝධී ක්‍රමෝපාය	1		1			1	6	6
9.	සංවර්ධනය වන රටවල් සඳහා මූල්‍ය හා ආර්ථික පරිපාලනය	1				1	1	30	30
10.	පශ්චාත් උපාධි	1		1			1	365	365
	එකතුව	15					**95**	**542**	**1,361**

අදාල කාර්යසාධන විගණන පුහුණුව තුළින් නිලධාරීන් ලබාගත් දැනුම, කුසලතාවය හා ආකල්ප සංවර්ධනය භාවිතයට ගෙන හෙට දිනයේ, මූල්‍ය විගණනයෙන් ඔබ්බට යමින් කාර්යසාධන විගණනයද ආවරනය කරමින් රාජ්‍ය විගණනය වඩා ඵලදායී විගණනයන් කරා මෙහෙයවීමට අවැසි ලෙස මානව සම්පත සංවර්ධනය කරගැනීමට ඉවහල්වී තිබේ.

සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

පවතින පුරප්පාඩු හේතුවෙන් වූ සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී මෙන්ම අවශ්‍යවන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදා ගැන්මට විගණකාධිපතිවරයාට බලය පවරා ඇත.

මුදල් අමාත්‍යාංශය, විගණිත ආයතනය, අදාළ අමාත්‍යාංශය, හා විගණන සමාගමේ නියෝජිතයන්ද ඇතුළත් වන පරිදි දෙපාර්තමේන්තුවේ විගණන ගාස්තු කමිටුවේ අනුමැතිය මත අදාළ විගණන සමාගම්වලට ඔවුන් සපයන ලද විගණන සේවා වෙනුවෙන් 2016 හා 2015 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 61.24 ක් හා රු.මිලියන 37.94 ක් වශයෙන් ගෙවීමට නියමිතව ඇත. සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සමඟ සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව යනාදී සාධක සලකා බලන ලදි. මීට අමතරව, සමාගමේ ප්‍රමිතිය දැක්වීමේ කරුණක් වශයෙන් ඔවුන්ගේ ජාත්‍යන්තර සම්බන්ධතාවය හා ඔවුන් සලසන වෘත්තීය සේවාවන්වල තත්ත්වය ආදී කරුණු ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට ඇතුළත් වී තිබුණි.

සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 5 ක කාලයක් සඳහා අඛණ්ඩව එක් විගණන කාර්යභාරයක් පවරනු ලැබේ.

ප්‍රධාන රාජ්‍ය වාණිජ බැංකු 3 ක් හා එහි තෝරාගත් ශාඛාවන් සහ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතිය ඇති සමාගම් ඇතුළත්ව 2016 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් ආයතන 180 ක් හා 139 ක් විගණනය කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් පිළිවෙලින් 87 ක් හා 89 ක් මට සහය විය.

පාර්ලිමේන්තුවට සහාය වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය. රාජ්‍ය ගණන්දීමේ වගකීම් පද්ධතිය පිළිබඳ ප්‍රධාන දායකත්වයක් සලසන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින්, මූල්‍ය භාරකාරත්වය හා රාජ්‍ය ආයතනවල මෙහෙයුම්හි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ සෘජුවම පාර්ලිමේන්තුවට වාර්තා කරන රජයේ බාහිර විගණක ලෙස කටයුතු කරයි. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 125 හා 126 යටතේ ස්ථාපිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වශයෙන් හඳුන්වන පාර්ලිමේන්තු කාරක සභා මගින් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තා පරීක්ෂා කරනු ලැබේ. මෙම කාරක සභා දෙකෙහි කාර්යභාරය වනුයේ රාජ්‍ය ගිණුම් පරීක්ෂා කිරීම් මඟින් රාජ්‍ය අරමුදල් හා සම්පත් නිසියාකාරව භාවිත කෙරේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට ව්‍යවස්ථාදායකයට සහාය වීමයි. එබැවින් රාජ්‍ය අංශයේ ගණන් දීමේ වගකීම හා ඵලදායී පාලනය තහවුරු කර ගැනීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් මෙම කමිටු දෙක මඟින් සිදු කරනු ලැබේ. ඉතා සරලාකාරයෙන් බැලූ විට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමාගමක හෝ රාජ්‍ය

ව්‍යවසායක ඇති විගණන කමිටුවකට සමානතාවයක් දක්වයි.

ස්ථාවර නියෝග 125 ප්‍රකාරව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය වනුයේ රාජ්‍ය වියදම් දැරීම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් වෙන් කරන ලද මුදල් යෙද වූ ආකාරය දැක්වෙන ගිණුම්, පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද අනිකුත් ගිණුම්වලින් කාරක සභාව සුදුසු යැයි සලකන ගිණුම් සහ ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා ද පරීක්ෂාට ලක් කිරීම වේ. පොදුවේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ගිණුම්, මූල්‍යයනයන්, මූල්‍ය පරිපාටි, කාර්ය සාධනය සහ කළමනාකරණය පරීක්ෂා කිරීම හා ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට කලින් කලට වාර්තා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 126 යටතේ පිහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය වනුයේ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ රජයට පැවරී ඇත්තා වූ වෙළඳ හෝ වෙනත් ව්‍යාපාරයක ගිණුම් හා ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාද පරීක්ෂා කිරීමය. කවර හෝ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇත්තා වූ වෙළඳ හෝ වෙනත් ව්‍යාපාරයක පරීක්ෂාවට භාජනය කරන ලද ගිණුම්, අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මුදල් තත්ත්වයන්, මුදල් කටයුතු පිළිබඳ කාර්ය පරිපාටි හා සාමාන්‍ය කළමනාකාරීත්වය හා ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් පිළිබඳව කාරක සභාව විසින් කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය. කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය විටක කාරක සභාවේ ම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද හැකියාව පවතින අතර, කාරක සභාවට මෙන්ම එහි අනුකාරක සභාවලටත් එයට අයත් කාර්යයන් ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත්, ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් පවතී.

එක් එක් කමිටුව පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය හා විරුද්ධ පක්ෂය විධිමත්ව නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීන් 26 දෙනෙකුගෙන් වර්තමානයේ සමන්විත වේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන සභා දෙකෙහි පරීක්ෂා කිරීම්වලින් අනතුරුව ඒවායේ නිර්දේශ විධායකය පිළිගනු ලැබුවේද යන්න පමණක් නොව එම නිර්දේශ ඵලදායීව හා සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ ද, වඩාත් වැදගත් ලෙස මූල්‍ය කාර්යක්ෂමතාවය හා සේවා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ධනාත්මක වෙනසක් සිදු කළේ ද යන්න පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පිළිබඳව කමිටුවලට ආපසු වාර්තා කිරීමද විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.

විගණකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයින් විසින් විශේෂයෙන් විගණනයන් සඳහා සෘජුවම සම්බන්ධ නිලධාරීන් සමඟ කමිටුවලට සහාය වේ. කමිටුවල කටයුතුවලට සහාය වීම තුළින් විගණකාධිපතිවරයා ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරන අතර සමාලෝචිත කරුණු පිළිබඳව අවශ්‍ය සියලු තොරතුරු හා මතයන් ප්‍රකාශ කරමින් කමිටුවලට සහාය වේ.

විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය වනුයේ පසුබිම් තොරතුරු සැපයීම හා සලකා

බලන විෂය පිළිබඳ අදාළ අදහස් දැක්වීම මඟින් කමිටුවට සහාය වීමයි. කාරක සභා පරීක්ෂාවේ දී තොරතුරු ලබා දීම හා කමිටුවට අදහස් දැක්වීම හා කමිටු සාමාජිකයන්ගෙන් පැන නගින ප්‍රශ්නවලට පිළිතුරු දැක්වීම ද විගණකාධිපතිවරයාගෙන් අපේක්ෂා කෙරේ. ඇසිය හැකි ප්‍රශ්න කිරීම් පිළිබඳ ක්‍රියාපරිපටියක් හෝ කිසියම් සාකච්ඡා කළ යුතු ගැටළු පිළිබඳ පසුබිම් තොරතුරු විගණකාධිපතිවරයා යෝජනා කරයි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව පදනම් කරගෙන අදාළ රාජ්‍ය ආයතනයේ මෙහෙයුම් පිළිබඳ කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයට සාමාන්‍යයෙන් මාසයක කාලයක් කමිටුව විසින් ලබා දේ. විගණිත ආයතනය විසින් යාවත්කාලීන ප්‍රගති වාර්තාවක් විගණකාධිපතිට පිටපතක් සහිතව නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත කමිටුවට ඉදිරිපත් කළ යුතුය. කමිටුවේ සාකච්ඡා කිරීම සඳහා කෙටි සාකච්ඡා සටහනක් පිළියෙල කිරීම සඳහා විගණකාධිපතිවරයාට හැකිවන පරිදි ප්‍රතිචාරයක් ලිඛිතව විගණිත ආයතනය විසින් පිළියෙල කළ යුතුය. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිර්දේශ විගණිත ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරුවල සාධාරණ බව තහවුරු කර ගැනීම සඳහා විගණිත ආයතනයේ සියලු ලිඛිත ප්‍රතිචාර විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කෙරේ. සමාලෝචනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, ගණන් දීමේ නිලධාරී හෝ පාලක මණ්ඩලය විසින් සිදු කරන අදහස් දැක්වීම් හා නිරීක්ෂණ සැලකිල්ලට ගෙන විගණන වාර්තාව මඟින් පාර්ලිමේන්තුවට වාර්තා කරන ලද වැදගත් විගණන නිරීක්ෂණ පිළිබඳව කෙටි සාකච්ඡා සටහනක් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබයි. එබැවින් කමිටු සාමාජිකයන්ට එම විගණන නිරීක්ෂණ මගින් විගණිත ආයතනයේ වර්තමාන තත්ත්වය පිළිබඳ මැනවින් අවබෝධයක් ලබා දේ. තවද, පෙර පවත්වන ලද රැස්වීම් වලදී ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනයත් එම සාකච්ඡා සටහනේ වෙනම ඇතුළත් කෙරේ.

2016 වර්ෂය තුළදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතන 67 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභාවාර 67 ක් හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන 43 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභා වාර 60 ක් පවත්වා ඇත. 2015 පෙබරවාරි සිට 2016 මැයි දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ විශේෂ විගණනයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට විගණකාධිපතිවරයාට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පවරන ලද අතර එයට ප්‍රතිචාර වශයෙන් විස්තරාත්මක විගණන වාර්තාවක් 2016 ජුනි 29 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව පදනම් කරගෙන නිලධාරින්ගේ ද සහය ඇතිව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් තවදුරටත් විශේෂ කමිටු සභා වාර 15 ක් පවත්වා නිලධාරින්ගෙන් සාක්ෂි ලබා ගෙන හා ලියකියවිලි හා වාර්තා පරීක්ෂා කර විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර එයට විගණකාධිපතිවරයා හා ඔහුගේ නිලධාරිගේ සහාය ලබා දෙන ලදි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාව පාර්ලිමේන්තුවේ විවාදයට ගෙන තවදුරටත් විමර්ශනය කිරීම සඳහා විශේෂ ජනාධිපති කොමිෂන් සභාවකට යොමු කර තිබේ.

විශේෂයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ප්‍රශ්නමාලාවක් සංවර්ධනය කිරීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් රාජ්‍ය ගිණුම් කාරක

සහාවට සහාය වී ඇත. එක් එක් හා සියලු ආයතන විසින් තම නිරවද්‍යතාවය තහවුරු කිරීම් සඳහා දෙන ලද පිළිතුරුවල වලංගුභාවය තහවුරු කිරීම මගින් විගණන නිලධාරීන් තවදුරටත් කමිටුවට සහාය වීම සිදු කරයි.

විගණකාධිපති විසින් පනවන ලද අධිභාර

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 335 ක් පවතින අතර, මහා නගර සභා 23 ක්, නගර සභා 41 ක් හා ප්‍රාදේශීය සභා 271 ක් ඊට අයත් විය. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥා පනත් සහ පනත්වලින්, නීතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදුවූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපති වෙත බලය පවරා ඇත.

එකී බලය අනුව 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 11 ක කාලපරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පාර්ශවකරුවන් 888 ක් වෙනුවෙන් රු.මිලියන 70.92 ක අධිභාර සහතික 133 ක් නිකුත් කර තිබුණි. 2017 ජූලි 31 දින වන විට ඉන් රු.මිලියන 3.47 ක් හෙවත් සියයට 4.89 ක් පමණක් අයකර තිබුණි. අදාළ බලධාරීන් විසින් අධිභාර අයකර ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි නිසි අවධානයක් යොමු කර නොතිබුණි.

විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන විගණනය

තෝරාගත් විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන්ගේ කටයුතුවල ආර්ථිකබව, කාර්යක්ෂමබව, ඵලදායීබව හා පාරිසරික බලපෑමද ඇගයීමට ලක්කර අදාළ විගණන නිරීක්ෂණ අනුව සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් නිර්දේශයන් ඇතුළත්ව වාර්තා කිරීම කාර්යසාධන විගණනය මගින් සිදු කරනු ලැබේ.

රාජ්‍ය ආයතනවල විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වෙනත් විගණන ශාඛාවලින් ඉදිරිපත් කරනු ලබන යෝජනා හා මෙම කාර්යසාධන හා පරිසර විගණන ඒකකය මගින් තෝරා ගනු ලබන ආර්ථික, සමාජීය හා පාරිසරික බලපෑම් ඇති විශේෂ ක්ෂේත්‍ර ඔස්සේ කාර්යසාධන හා පරිසර විගණනයන් සිදු කරනු ලැබේ. තවද මූල්‍ය විගණන වාර්තාවන්ට අමතරව ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණන වාර්තාවන්ද පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම ක්ෂේත්‍රයට අදාළ දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීමද සිදු කරනු ලැබේ.

කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යඵල පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා එක් එක් ආයතනය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators) නිශ්චය කිරිම ඉතා වැදගත් වන නමුත් ශ්‍රී ලංකාවේ දැනට කාර්යඵලය පදනම් කරගත් අයවැය ක්‍රමයක් හා කාර්යසාධන දර්ශක නිශ්චය කර ක්‍රියාත්මක කරනු නොලැබේ. මේ හේතුවෙන් එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව කාර්යසාධන දර්ශක අප විසින් නිශ්චය කර කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද කාර්යසාධන

විගණනවලදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ඛණිජ වැලි නිධි උපයෝජනය සම්බන්ධව සිදුකරනු ලබන කාර්යසාධන විගණනය

ලොව ජීවත්වන සියළු මිනිසුන්ට අවශ්‍යවන බොහෝ නිෂ්පාදන බිහිකිරීමට යොදා ගන්නා අමුද්‍රව්‍යයක් වන කළු රත්රන් (Black Gold) යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන, ලොව අනෙක් රටවල පවතින ඛනිජ වැලිවලට සාපේක්ෂව ඉතා ඉහළ ඛනිජ සංයුතියකින් යුක්ත බවට පර්යේෂණවලින් සොයාගෙන ඇති වටිනා ඛනිජ වැලි නිධි ශ්‍රී ලංකාවේ පිහිටා ඇත.

ඡායාරූප 01 –පුල්මුඩේ යන්ත්‍රාගාරයේ කොටසක්.

මෙම ඛනිජ වැලි සංයුතිය තුළ ඇතුළත් ඉල්මනයිට් සහ රූටයිල් ප්‍රධාන වශයෙන් ටයිටේනියම් ඩයොක්සයිඩ් හා ටයිටේනියම් ලෝහය නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන අතර තීන්ත, ප්ලාස්ටික් සහ කඩදාසි කර්මාන්තයට මෙම ටයිටේනියම් ඩයොක්සයිඩ් අත්‍යවශ්‍ය අමුද්‍රව්‍යකි. ටයිටේනියම් ලෝහය අභ්‍යවකාශ යානා නිෂ්පාදනයට අමුද්‍රව්‍යයක් ලෙස හා වෙල්ඩිං කූරු නිෂ්පාදනයටද යොදා ගනී. සර්කෝන් නැමැති ඛනිජ වැල්ල පිඟන් භාණ්ඩ හා සනීපාරක්ෂක භාණ්ඩ නිෂ්පාදනය සඳහා ද වාත්තු කර්මාන්තය හා උදුන් කර්මාන්තය සඳහාද භාවිතා කරනු ලැබේ.

ඡායාරූප 02 - ශ්‍රී ලංකාවේ ඛනිජවැලි නිධි පිහිටීම

1950 වර්ෂයේදී මෙම ඛනිජවැලි නිධි ශ්‍රී ලංකාවේ ඇති බවට සොයා ගැනීමත් සමඟ 1957 වර්ෂයේදී ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය ස්ථාපිත කර තිබුණි. පසුව 1992 වර්ෂයේදී කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 100 ක් රජය සතු රාජ්‍ය සමාගමක් බවට පත් කර තිබුණි. මෙම රාජ්‍ය සමාගම විසින් වාර්ෂිකව උපයන ලාභයෙන් මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ ගෙවන අතර 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 2,415 ක් භාණ්ඩාගාරයට ගෙවීමට තරම් ප්‍රමාණවත් මෙහෙයුම් ලාභයක් උපයා තිබුණි.

පසුගිය තිස් අවුරුදු යුධ සමයේදීද අඛන්ඩව ක්‍රියාත්මක වූ පුල්මුඩේ පිහිටි මෙම කර්මාන්ත ශාලාව රටට විදේශ විනිමයද මහා භාණ්ඩාගාරයට ලාභාංශ ද උපයා දෙමින් දේශීය ආර්ථිකයට ශක්තියක් ගෙන දුන් ආයතනයක් විය.

නිජ වැලි කැණීම් කටයුතු

සමාගම විසින් කුච්චවලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ කෝකිලායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුල්මුඩේ ප්‍රදේශයෙනුත් ඛනිජ වැලි කැණීම් කිරීම සඳහා බලපත්‍ර ලබාගෙන තිබුණත්, පොඩුවාකට්ටු ප්‍රදේශයේ සිට පුල්මුඩේ දක්වා වැලි ප්‍රවාහනය කරන මාර්ගයේ ඇති පාලම අබලන් වීම මත එම ප්‍රදේශයෙන් වැලි කැණීම් කර නොතිබුණි. තෙවික්කල්ලු ප්‍රදේශයේ වැලි කැණීම් කිරීම සඳහා බලපත්‍ර ලබාගත් ප්‍රදේශයේ හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම මත එම ප්‍රදේශයෙන්ද වැලි කැණීම් කර නොතිබුණි.

ඡායාරූප අංක 03 : වැලි ප්‍රවාහනය කිරීමට බාධා වී ඇති පාලම

ඛනිජ වැලි සමාගම විසින් දිගින් දිගමට ඛනිජ වැලි කැණීම් හේතුවෙන් පුල්මුඩේ නිධියෙන් ලබාගත හැකි ඉහළ ගුණත්වයෙන් යුතු ඛනිජ වැලි ප්‍රමාණය අඩු වෙමින් පැවැතුණි. වෙරළෙන් වැලි කැණීම් කල පසු නැවත වෙරළ වැලිවලින් පිරීම (Re filling) ස්වාභාවික සංසිද්ධියක් බැවින් ඒ සඳහා යම් කාලයක් අවශ්‍ය වේ. එසේ වුවද, දිගින් දිගටම මෙම ප්‍රදේශය තුළ කැණීම් සිදු කිරීම නිසා පුල්මුඩේ වෙරළ තීරයේ සිට ගොඩබිම දෙසට වැලි කැණීම් කටයුතු පුළුල් කිරීමට සිදු වී තිබුණි. යන්ත්‍රාගාරයේ කටයුතු උපරිම ධාරිතාවයෙන් අඛණ්ඩව සිදුකිරීම සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් ඛනිජ වැලි

නොඅඩුව පැවතිය යුතුය. මෙම තත්ත්වය නිසා වැලිවල තිබිය යුතු අවම ඛණිජ වැලි සංයුතිය (සියයට 40 ක්) නොතිබුණත්, වැලි කැණීම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

එසේම වැලි කැණීම් කිරීමේ ක්‍රමවේදයන්හි පැවති අඩුපාඩු හා පාරිසරික නීති,රීති උල්ලංඝනය වන අයුරින් වැලි කැණීම් කරන ලද අවස්ථාද විගණනයේදී නිරීක්ෂණය විය.

ඡායාරූප අංකය 04 : කැනීම් කරන ලද වැලි රැගෙන එන ආකාරය.

කෝකිලායි කලපුවෙන් උතුරු දෙසට මුලතිව් දක්වාද, කෝකිලායි කලපුවේ සිට කොක්කුකුඩුවායි දකුණු දෙසට හා නයාරු හා වෙන්මලෛයි දක්වා ද ඉතා පොහොසත් ඛණිජ වැලි ඇති බව සමාගම විසින් හඳුනාගෙන තිබුණි.

ඡායාරූප අංක 05 - සමාගමට පවරා ගන්නා ලද කොකිලායි ඉඩම

ඡායාරූප අංක 06 කොකිලායි වෙරළ තීරයේ ඇති ප්‍රශස්ථ මට්ටමේ ඛනිජ වැලි

සමාගම සතුව ඇති යන්ත්‍රාගාරය වසර 50කට වඩා පැරණිවීමත් එම කාලය තුළ පුල්මුඩේ ඛනිජ නිධියෙන් අඛන්ඩව වැලි කැණීම් කිරීම නිසා නිෂ්පාදනය අඩු වී තිබීම හේතුවෙන් නව යන්ත්‍රාගාරයක් පිහිටුවීමේ අවශ්‍යතාවය මත කෝකිලායි ප්‍රදේශයේ එය ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි.

ඒ අනුව හෙක්ටයාර 17.6938ක් වන අදාල භූමි ප්‍රදේශය 2013 පෙබරවාරි 13 දින සමාගමට පවරා ගෙන ඇත. ඉදිකිරීම සඳහා ඉඩම පවරා ගැනීමටත් පෙර රු.මිලියන 39.34ක් වටිනා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සමාගම කටයුතු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා බලපත්‍ර ලබා ගැනීමට අපහසුව තිබියදීත්, 2015 ජූනි මාසයේ සිට කම්කරු තනතුරු සඳහා 120 දෙනෙකු බඳවාගෙන තිබුණි. ඒ අනුව එම ප්‍රදේශයෙන් පවරාගත් ඛනිජවැලි සහිත ඉඩම විගණන දිනය වන විටත් නිෂ්ක්‍රීයව පැවැතුණි.

ඛනිජ වැලි සඳහා අගය එකතු කිරීම

ඛනිජ ද්‍රව්‍ය ප්‍රාථමික ස්වරූපයෙන් අපනයනය කිරීම අධෛර්යමත් කර, ඛනිජ පදනම් කරගත් නිපැයුම් දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම දිරිගැන්වීම පරමාර්ථයෙන් සමාගමට ඛනිජ වැලි කැනීම සඳහාත්, අපනයනය කටයුතු සඳහාත් අවශ්‍ය වන බලපත්‍ර ලබාගැනීම සීමා කර තිබුණි. මේ හේතුවෙන් සමාගමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම ප්‍රශ්ණකාරී වී තිබුණි. එමෙන්ම මෙම නිෂ්පාදනයේ අගය එකතු කළ නිෂ්පාදන කටයුතුවලට ප්‍රවේශවීමට අවශ්‍ය වැඩි ඛනිජ සංයුතියක් සහිත ඛනිජ වැලි ලබා ගැනීමද ගැටළු සහගත වී තිබුණි.

අගය එකතු කිරීමේ ක්‍රියාවලියකට ප්‍රවේශ නොවීම නිසා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මෙම රාජ්‍ය සමාගමට වාර්ෂික කැණීම් බලපත්‍ර නිකුත් කර නොතිබුණත්, වෙනත් පෞද්ගලික ආයතනයකට වසර 10කට වලංගු වන පරිදි කැනීම් බලපත්‍ර නිකුත් කර තිබුණු බව මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. එසේම ඛනිජ වැලි සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය පාරිසරික වශයෙන් විශාල බලපෑමක් සිදුවිය හැකි කර්තව්‍යයක් බැවින් ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමුකර අඛණ්ඩව නිෂ්පාදන කටයුතු කරගෙන යාම සඳහා අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනවලින්ද සහයෝගය අවශ්‍ය බවත් නිරීක්ෂණය විය.

ඉල්මනයිට් හා රූටයිල්වලින් ලබා
ගත හැකි අගය එකතු කළ නිෂ්පාදන

සර්කෝන්වලින් ලබාගත හැකි අගය
එකතු කළ නිෂ්පාදන

නිෂ්පාදන ක්‍රියාවලිය

නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රධාන යන්ත්‍රාගාර 5ක් යටතේ සිදු කරන අතර ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් වශයෙන් ප්‍රධාන නිපයුම් 3ක් නිපදවනු ලබන අතර එකී නිෂ්පාදන බිහිකිරීමේදී ඇතිවන අතුරු නිෂ්පාදන ලෙස නන් මැග්නටික් හෙවි මිනරල් (Nonmagnetic heavy mineral) හා හයිටයි ඉල්මනයිට් මෙන්ම කෘඩ් මොනසයිට් (Crude Monazite) දැක්විය හැකිය.

පසුගිය දශකය තුළ මෙකී නිෂ්පාදනවල තත්ත්වය පහත පරිදි වේ.

ප්‍රස්ථාරය 01 ප්‍රධාන නිෂ්පාදන අයිතම

ප්‍රස්ථාරය 02 ප්‍රධාන නිෂ්පාදන අයිතම

මෙසේ සමාගමේ ප්‍රධාන නිෂ්පාදනයන් බිහිවීම ක්‍රමයෙන් අවමවීමත්, වෙනත් අතුරු නිෂ්පාදනයන් බිහිවීම වර්ධනයවීමත් යන කරුණු දෙකම කර්මාන්තයේ පැවැත්මට අහිතකර ලෙස බලපා තිබුණි. මේ සඳහා පහත සඳහන් හේතු බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

- වර්ෂ 50 කට වඩා පැරණි යන්ත්‍රාගාරයේ පවතින යන්ත්‍ර වර්තමානය වන විට නිෂ්පාදිත ධාරිතාවයෙන් (Design Capacity) සියයට 25 ක සිට සියයට 75 ක් දක්වා ඌන උපයෝජනය වීම.

- එක් එක් යන්ත්‍රාගාරයෙහි පවතින ප්‍රධාන දෝෂ අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.

- යන්ත්‍රාගාර අතර පැවැතිය යුතු ප්‍රමිත යෙදවුම් හා නිමවුම් සත්‍ය යෙදවුම් හා නිමවුම් සමඟ සැසැඳීමේදී විශාල විචලනයන් තිබීම.

- එක් එක් යෙදවුම් හා නිමවුම්වල තිබිය යුතු අපේක්ෂිත රසායනික පරාමිතිවල විචලනයන් තිබීම නිසා නිෂ්පාදිතයන්හි ගුණාත්මකභාවය නොමැතිවීම.

- වැඩි ලාභයක් ඉපයීමට හැකි නිෂ්පාදන හඳුනාගෙන ඒවායේ නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීමට සමාගම අපොහොසත්වීම.

- 2015 වර්ෂයේ මුල් අර්ධ වර්ෂය තුළ පැවැති දින 181 න් දින 117 කදී පැය 142 ක් විදුලිය බිඳ වැටීම් පැවැතුණි.

යන්ත්‍රාගාරය දෛනිකව පැය 24 ක් පුරා සේවා මුර දෙකක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. පසුගිය වර්ෂ කිහිපයක සක්‍රියව නිෂ්පාදනයට දායක වී ඇති කාලයත්, නිෂ්පාදනයේ අක්‍රීයව පැවැති කාලයත් අතර සැසඳීමේදී අඛන්ඩ විදුලිය බල සැපයුම නොමැතිවීම හා පිරිසිදු ජලය නොමැතිවීම වැනි කරුණු සහ ප්‍රමාණවත් අමුද්‍රව්‍ය නොතිබීම හේතුවෙන් මුළු කාලයෙන් අඩක් පමණ කාලයක් අක්‍රිය වී තිබුණු බව නිරීක්ෂණය විය.

රූප සටහන 03 නිෂ්පාදන කාලය අක්‍රීය වී පැවැතීම.

ඛනිජ වැලි නිෂ්පාදන අලෙවි කිරීම

සමාගම විසින් 2007 වර්ෂය වන තෙක්ම ඛනිජ වැලි නිෂ්පාදන සෘජු අපනයනය කර තිබුණි. පසුව අතරමැදියන් මගින් ඒවා අපනයනය කිරීම ආරම්භ කර තිබුණි. එසේ වුවද, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය අනුව මාස 03කදී සෘජු අපනයනය සඳහා යොමු විය යුතු බව දන්වා තිබුණි. එසේ වුවද, අලෙවිකරණ අංශය නව ගැණුම්කරුවන් සොයා ගැනීම සඳහා ඵලදායීව කටයුතු කර නොතිබුණි. අලෙවිකරණ පර්යේෂණයක් කර අලෙවිකරණ සැලැස්මක් නිසියාකාරව සකස් කර නොතිබුණු අතර තථ්‍ය විකුණුම් අයවැයගත විකුණුම් සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේ ඉල්මනයිට්, රූටයිල් හා සර්කෝන් යන නිෂ්පාදනවල විකුණුම් ප්‍රමාණයන් පිළිවෙළින් සියයට 18 ක් සියයට 58.5 ක් හා සියයට 56.7 ක් ලෙස ඇස්තමේන්තුගත තත්ත්වයට වඩා අඩු වී තිබුණි.

“ Industrial Mineral ” යන වෙබ් අඩවියෙහි සමාගම ලියාපදිංචි වී එහි ප්‍රදර්ශනය කෙරෙන ඛනිජ වැලි නිෂ්පාදනවල අන්තර්ජාතික වෙළඳපොල මිල ගණන් සළකා බලමින් අතරමැදියන්ට ඛනිජ වැලි අලෙවිකර තිබුණද, අන්තර්ජාතික වෙළඳපොල මිල ගණන් හා අලෙවි කළ මිල ගණන් අතර විචලනයක්ද පැවතුණි. ස්පයිරල් ෆයින් කන්සන්ට්‍රේට් (Spiral fine concentrate) හා දළ සර්කෝන් නම් අතරමැදි නිෂ්පාදන අලෙවි කිරීමද සමාගමට ලාභදායික වී නොතිබුණි. ඛනිජ වැලිවල ප්‍රමිතිය අන්තර්ජාතික වෙළඳපොල ප්‍රමිතියට නොතිබුණු අතර සමාගම සතු වූ පුල්මුඩේ ජැටිය විනාශ වීම හා කොඩ්බේ වරාය ටෝකියෝ සිමෙන්ති සමාගමට පවරා දීම වැනි හේතු නිසා ඛනිජ වැලි කොළඹ වරායෙන් නැව්ගත කිරීමට සිදුවීමෙන් අමතර ප්‍රවාහන වියදමක් කිරීමට සිදුවේ. කොඩ්බේ භූමියේ වත්කම් 2013 වර්ෂයේ රු.මිලියන 32.32 කට තක්සේරු කර තිබුණු අතර ඒවා අලෙවිකර නොතිබීමෙන් වර්තමානයේදී දිරාපත්වෙමින් විනාශ වෙමින් පැවැතුණි.

ශ්‍රී ලංකාවේ විකල්ප ජාත්‍යන්තර ගුවන්තොටුපල ලෙස මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීම.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයුම් කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල හරහා 1967 වර්ෂයේදී ආරම්භ වූ අතර, එයට පෙර එම ගුවන් සේවා රත්මලාන ගුවන් තොටුපල මඟින් සිදුවිය. එසේම ඉන්දියාව හා මාලදිවයින වැනි ආසන්න රටවල ස්ථාපිත ගුවන් තොටුපලවල් විකල්ප ගුවන් තොටුපල ලෙස භාවිතා කර තිබුණු අතර පසුගිය කාල වකවානුව තුළ ශ්‍රී ලංකාවේ පැවති ත්‍රස්තවාදී ක්‍රියා සහ 2000 වර්ෂයේදී මීගමුව කදිරාන ප්‍රදේශයේ සිදු වූ ගුවන් අනතුර හේතුවෙන් විකල්ප ගුවන් තොටුපලක අවශ්‍යතාවය පැන නැගී තිබුණි. මේ නිසා ජාත්‍යන්තර ගුවන් තොටුපල සඳහා සුදුසු ප්‍රදේශයක් තෝරා ගැනීමේදී එවකට පැවති රජයන් විසින් පලාලි, කොග්ගල, හිඟුරක්ගොඩ, කුඩාඔය සහ වීරවිල ඇතුළු විවිධ ස්ථාන හඳුනාගෙන ගෙන තිබුණි. එම ස්ථාන පිළිබඳව මූලික අධ්‍යයනයන් සිදුකර වාර්තා පිළියෙල කිරීම, මිනුම් කටයුතු සහ මුල්ගල තැබීමේ උත්සව පැවැත්වීම යන කාර්යයන් ඉටු කර තිබුණු අතර, ඒ සඳහා රු.මිලියන 52.44 ක් වැය කර තිබුණි. මහජනතාවගේ විරෝධතා හා රජයන්ගේ වෙනස්වීම් වැනි විවිධ හේතූන් මත එම ප්‍රදේශවල ගුවන් තොටුපලවල් ඉදිකිරීම අතහැර තිබුණි. එම කරුණුද සැලැකිල්ලට ගත් විට විකල්ප ජාත්‍යන්තර ගුවන් තොටුපලක් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරාගැනීම ප්‍රශ්නකාරී වී තිබුණි.

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ තරුණ පරපුරේ විරැකියාව සහ ආර්ථික පසුබෑම වැනි විවිධ හේතූන් මත කැරලි හා වර්ජන ක්‍රියාමාර්ග රජයන්ට එරෙහිව පැන නැගීම නිසා එවකට රජය විසින් දකුණු පළාතට මූලිකත්වය ලබාදී ආර්ථික සංවර්ධනය ඇති කිරීමට 1994 වර්ෂයේදී හම්බන්තොට නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර වරායක් සහ ජාත්‍යන්තර ගුවන් තොටුපලක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි. ඒ අනුව හම්බන්තොට වරාය සමග සංවර්ධනයට පහසු වන පරිදි ගුවන් තොටුපල ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ පහසුව හේතුවෙන් ආරම්භයේදී වීරවිල ප්‍රදේශයත් පසුව එම ප්‍රදේශයේ ජනතාවගෙන් එල්ල වූ විරෝධතාවය හේතුවෙන් මත්තල ප්‍රදේශය ගුවන්තොටුපල ඉදිකිරීම සඳහා තෝරා ගෙන තිබුණි. ඒ අනුව මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීමේ කටයුතු ඇමෙරිකානු ඩොලර් මිලියන 209 කට ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා මහජන

චීන සමූහාණ්ඩුව අතර 2009 දෙසැම්බර් 23 දින ගිවිසුම්වලට එළඹ තිබුණි. හෙක්ටයාර් 2000 ක භූමි භාගයක් යොදාගෙන ඉදිකිරීම් කටයුතු 2009 නොවැම්බර් 17 දින දී ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 243.7 ක් වැය කර තිබුණි.

ගුවන් තොටුපල ගොඩනැගිලි පරිශ්‍රය

ගුවන් තොටුපල ගුවන් පථය

මේ සඳහා තෝරාගත් භූමිය මෙම ප්‍රදේශයේ ස්වභාවික අභය භූමියට ආසන්නව පිහිටීමෙන් පාරිසරික වශයෙන් මතු වූ ගැටළු වූයේ වන සතුන්ගෙන් ධාවන පථයට එල්ල වූ බාධාවන් මෙන්ම වන සතුන්ගේ වාසස්ථාන අත්පත් කර ගැනීමෙන් මතු වූ ගැටළු විය.

ගුවන් තොටුපල භූමිය

ගුවන් තොටුපල ප්‍රවේශ මාර්ගය

ගුවන් තොටුපල මෙහෙයුම් කටයුතු සඳහා 2013 මාර්තු 18 දින විවෘත කරන ලද අතර සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම (ශ්‍රී ලංකා සමාගම) යටතේ එහි මෙහෙයුම් කටයුතු සිදු කර තිබුණි.

මත්තල ගුවන් තොටුපල විවෘත කිරීමෙන් පසු එනම් 2013 වර්ෂයේ සිට 2015 නොවැම්බර් මාසය දක්වා ජාත්‍යන්තර ගුවන් යානාවන් 14 ක් අයහපත් කාලගුණ තත්ත්වය, ඉන්ධන ලබා ගැනීමේ ගැටළු හා යානාවල කාර්මික දෝෂ හේතුවෙන් කටුනායක ගුවන් තොටුපලට ගොඩ බෑමට නොහැකි වී මත්තල ගුවන් තොටුපල වෙත යොමු කළ අවස්ථාවන් පිළිබඳ තොරතුරු වාර්තා වී තිබුණි.

මත්තල ගුවන් තොටුපල විවෘත කිරීමෙන් පසු දේශීය ගුවන් යානා 03 ක් සහ විදේශීය ගුවන්යානා 03 ක් ගමන් ආරම්භ කර තිබූ නමුත් 2015 වර්ෂය අවසානය වන විට එක්

යානාවක් පමණක් ගුවන් ගමන් ආරම්භ කර තිබුණි.

මෙහෙයුම් කටයුතු පිළිබඳ විස්තර වගුව 03 හි දැක්වේ.

කාරණය	2013	2014	2015 ජුනි මාසය තෙක්
මත්තල ගුවන් තොටුපල හරහා ගමන්ගත් දේශීය හා විදේශීය මගීන් සංඛ්‍යාව (පැමිණීම හා පිටවීම)	36,137	40,386	4,945
ඉපැයූ ආදායම (රු.මිලියන)	48	136	49
මුළු වියදම (සේවක පඩිනඩි/නඩත්තු කටයුතු/ විදුලිය/ ජලය ආදිය	2,153	2,865	1,323

වගුව : 03 - මත්තල ගුවන් තොටුපලේ මෙහෙයුම් කටයුතු
මූලාශ්‍රය - සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

2015 වර්ෂයේ ඇතිවූ දේශපාලන වෙනස්වීමත් සමඟ අලාභ සහිතව පවත්වාගෙන ගිය දේශීය විදේශීය ගුවන් යානාවන් පැමිණීම නතර වී තිබුණු අතර ගුවන් තොටුපලේ මෙහෙයුම් එක් යානාවකට සීමා කර තිබීම නිසා 2015 වර්ෂයේ ආදායම අඩු වී තිබුණි.

සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින්, 2015 වර්ෂයේදී වී ගබඩා කිරීම සම්බන්ධයෙන් උග්‍ර අර්බුදයකට පත්වී තිබුණු වී අලෙවි මණ්ඩයට වී ගබඩා කිරීම සඳහා මත්තල ගුවන් භාණ්ඩ ගබඩා සංකීර්ණය 2015 සැප්තැම්බර් 01 දින සිට මාස තුනක කාලයකට කුලී පදනමින් ලබාගෙන ඒ සඳහා මාසිකව රු.835,132 ක් ගෙවීමට ගිවිසුමකට එළඹ තිබුණි. මෙහිදී එහි තිබුණු සමහර වටිනා උපකරණ ඉවත් නොකර වී ගබඩා කිරීම සඳහා ලබා දී තිබුණු බව අනාවරණය විය.

වාර්ෂිකව උපයා තිබුණු ආදායම අපේක්ෂිත ඉලක්කයන්ට වඩා අඩුවීම නිසා එය සිය මෙහෙයුම් වියදම් පියවා ගැනීමට හෝ ප්‍රමාණවත් වී නොතිබුණි. තවද, මහජන චීන සමුහාණ්ඩුවෙන් ලබාගත්, 2030 වර්ෂය දක්වා වර්ෂ 15 කින් ගෙවා නිම කළ යුතු ණය මුදලේ වගකීම් ගාස්තු සහ කළමනාකරණ ගාස්තු රු.මිලියන 1,989.82 ක් භාණ්ඩාගාරය විසින් ගෙවා තිබුණු අතර, 2015 වර්ෂයේදී ගෙවිය යුතුව තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 8.4 ක්වූ පළමු වාරිකය සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ කෙටිකාලීන ඩොලර් තැන්පතු මුදල් යොදා ගෙන ගෙවා තිබුණි.

පහසුකම් ස්ථාපිත කළ හැකි භූමිය

නිස්ව පවතින කවුළු

විශාල මුදලක් වැයකර ඉහළ මට්ටමින් ගොඩනගා නවීණ උපකරණවලින් සමන්විතව ඉදිකිරීම් අවසන් කර තිබුණු බැවින් ගුවන් තොටුපල ඵලදායි ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත්කර ගැනීම හදිසි සහ අත්‍යාවශ්‍ය කටයුත්තක් ලෙස සැලකිය යුතු වේ.

ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය

විද්‍යුත් හා විදුලි උපකරණ භාවිතය මගින් ජන ජීවිතය වඩා පහසු කලද, එම උපකරණ භාවිතය වැඩි වෙත්ම ජනනයවන අපද්‍රව්‍ය ප්‍රමාණයද දිගින් දිගටම ඉහළ යන අතර, ඒවා නිසිලෙස කළමනාකරණය නොකිරීම පරිසරයට හානිදායක තත්ත්වයන් ඇති කරයි.

විදුලි හා විද්‍යුත් උපකරණවල සංගතව පවතින රසායනික ද්‍රව්‍යයන්වල ඇතුළත් බැර ලෝහයන් පරිසරයට එකතුවීම මගින් සමේ රෝග, පෙනහළු පිළිකා, ස්නායු ආබාධ, වකුගඩු රෝග, ඇස් රෝග යනාදි විවිධාකාර වූ රෝගවලට මුහුණ දීමට සිදු වේ. ඊට අමතරව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සමඟ පරිසරයට එකතුවන උපාංගද නිසි ලෙස කළමනාකරණය නොකිරීමෙන් සියළු ජීවීන්ට නොයෙකුත් පාරිසරික ගැටළුවලට මුහුණ දීමට සිදුවන බව හඳුනාගෙන ඇත.

ලෝකයේ දියුණු රටවල් මේ සඳහා ප්‍රමුඛ අවධානයක් යොමුකර ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති හා රෙගුලාසි සකස් කර ඒ සඳහා පිළියම් යොදමින් සිටියි. ඒ සඳහා වූ එක් පිළියමක් ලෙස උත්පාදකයා විසින්ම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යවල වගකීම බාර ගැනීම හඳුන්වා දී ඇත. ඒ අනුව ඉලෙක්ට්‍රොනික උපකරණයක් භාවිතයෙන් පසු ඉවත් කිරීමේදී එම අපද්‍රව්‍ය උත්පාදකයා අතට පත් කරන අතර උත්පාදකයා විසින්ම නිසි ක්‍රමවේදයන්ට අනුකූලව ඒවා කළමනාකරණය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ ජනනය කරනු ලබන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය තුළ ප්‍රධාන වශයෙන් CFL බල්බ්, ජංගම දුරකථන, රූපවාහිනී, බැටරි, පරිගණක යනාදි උපකරණ භාවිතයෙන් පසු ඉවතලන දෑ ඇතුළත් වේ. මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යවල හානිකර ප්‍රතිවිපාක සම්බන්ධයෙන් මහජනතාව හා ආයතන තුළ දැනුවත්භාවය අවමවීම නිසා ඒවා නිසිලෙස කළමනාකරණය කිරීමට ඇති උනන්දුව අඩු වී තිබුණි. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සාමාන්‍ය අපද්‍රව්‍ය සමඟ පරිසරයට බැහැර කිරීම, පිළිස්සීම, පස්යට වැළලීම වැනි ක්‍රම යොදාගනු ලබන්නේ එම නොදැනුවත්භාවය නිසා බව පැහැදිලි වේ.

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතෙහි 23 (අ) සහ (ආ) යන වගන්ති යටතේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කරුණු සඳහන් කර ඇති අතර 2008 අංක 1 දරන ජාතික පාරිසරික නියෝගයන්හි 15 වන නියෝගයෙහි මේ පිළිබඳ වැඩි විස්තර සඳහන් වේ.

එම නියෝග අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ සහ අධිකාරිය විසින් නිශ්චිතවම සඳහන් කරනු ලැබිය හැකි යම් ප්‍රමිති සහ වෙනත් නිර්ණායකවලට අනුකූලව මිස එහි උපලේඛනයේ සඳහන්

අපද්‍රව්‍ය උත්පාදනය කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, නිෂ්කර්ෂණය කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ බැහැර කිරීම හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් පිහිටුවීම හෝ පහසුකම් කිසිම තැනැත්තෙකු විසින් කරනු හෝ සපයනු නොලැබිය යුතු බව දක්වා ඇත.

විදුලි සහ විද්‍යුත් අපද්‍රව්‍ය ගණයට අයත් ඉවත දමන පරිගණක, රෙදි සෝදන යන්ත්‍ර, විදුලි පංකා, වායු සමීකරණ යන්ත්‍ර, ජංගම දුරකථන, විදුලි උදුන්, බත් පිසින උදුන්, ඡායා පිටපත් යන්ත්‍ර, කැසට් යන්ත්‍ර යනාදි බොහෝ අයිතම ගණනාවක් අයත්වන නමුත් ජාතික පාරිසරික නියෝගවලට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ලෙස භාවිතයෙන් ඉවත් කරන ලද සංයුක්ත, බිඳුණු හා ප්‍රමිතියෙන් තොර ප්‍රතිදීප්ත බල්බ/ විදුලි පහන් සහ ඉවත දමන ලද පරිගණක, උපාංගයන් හා ජංගම දුරකථන යන උපකරණ පමණක් ඇතුළත් කර තිබුණි.

ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන ආනයනකරුවන් පමණක් 1,080ක් සිටින අතර 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති ජංගම දුරකථන ප්‍රමාණය මිලියන 16.2ක් වී තිබුණි. මෙම පාවිච්චි කරන ලද ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනයේදී පමණක් මධ්‍යම පරිසර අධිකාරියේ නීති,රීති අදාළ කරගෙන තිබුණි. පාවිච්චි නොකරන ලද උපකරණ ආනයනය සම්බන්ධයෙන් කිසිදු පාලනයක් ක්‍රියාත්මක වී නොතිබුණි. එසේ වුවද, පාවිච්චි නොකරන ලද උපකරණ තුළ ඉතා බාල වර්ගයේ මාස කිහිපයක් ඇතුළත අපද්‍රව්‍ය බවට පත්වන භාණ්ඩද ආනයනය කර තිබුණු අතර, එය රට තුළ ජනිතවන ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ යාම කෙරෙහි සෘජුවම දායක වී තිබුණි.

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි ක්‍රමවේදයන්ට අනුව කළමනාකරණය සිදු කරන පෞද්ගලික ආයතන 12ක් මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වී තිබුණි. ඊට අමතරව CFL බල්බ් ප්‍රතිචක්‍රීකරණය සිදු කරන විශාල ධාරිතාවයක් සහිත පෞද්ගලික ආයතනයක් හෝමාගම ප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණි. එම ආයතන සම්බන්ධයෙන් මහජනතාව මෙන්ම රජයේ ආයතනවලද දැනුවත්භාවය අවම වීම නිසා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විධිමත් කළමනාකරණය සඳහා යොමුවීම සාර්ථකව සිදු නොවන බව නිරීක්ෂණය විය. එසේම මෙම ආයතන බස්නාහිර පළාත තුළ පමණක් ස්ථාපිත වී තිබුණු අතර අනෙකුත් පළාත්වල අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ගැටළු මතුවී තිබුණි.

ඉලෙක්ටොනික අපද්‍රව්‍ය එකතු කරන්නන් හට මෙරටදී අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ පහසුකම් නොමැතිවීම මත වටිනා ලෝහ වෙන් කර ගැනීමට හැකි අපද්‍රව්‍ය පමණක් එකතු කර අපනයනය කිරීමට බලපත්‍රලාභී එකතු කරන්නන් වැඩි නැඹුරුවක් දක්වා තිබුණි. මේ නිසා අඩු වටිනාකමකින් යුතු වැදගත් නොවන එහෙත් හානිකර වූ අපද්‍රව්‍ය නැවත අවිධිමත් ලෙස පරිසරයට එකතුවීම බහුලව සිදුවී තිබුණි.

ඉලෙක්ට්‍රොනික උපකරණ මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයා ඍජුවම සම්බන්ධවන ප්‍රධාන ස්ථානය ප්‍රදර්ශනාගාරය වන බැවින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඒවා නිසි පරිදි බැහැර කිරීමේ ඇති වැදගත්කම සහ ඒවා බැහැර කළ යුතු ක්‍රමවේදය එම ස්ථානයේදී ප්‍රදර්ශණය කිරීම හෝ එය අලෙවිකරුවන්ගේ ප්‍රධාන වගකීමක් බව තහවරු කරන ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. එමගින් ඍජුවම පාරිභෝගිකයා අපද්‍රව්‍යකළමනාකරණ ක්‍රියාවලියට දායක කර ගැනීමට හැකි වේ.

විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු

පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් අසාධාරණව හෝ නීතියට පටහැනි ආකාරයට වාසියක් හෝ ප්‍රතිලාභයක් ලබාගැනීමට ඇති අවදානම් පිළිබඳව එහි මූලයන් පරීක්ෂා කිරීම විමර්ශන විගණනයකින් අපේක්ෂා කරයි. මෙවැනි අවස්ථාවකදී වංචාවන් සොයා ගැනීම හා ඒවා වැලැක්වීමට පාලන පද්ධතිය ශක්තිමත් කිරීම කෙරෙහි විමර්ශන විගණනයේ සැලකිල්ල යොමු වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය මූල්‍යනය නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය විගණනය ශක්තිමත් කර ඇත. විගණිත ආයතනවල රාජකාරි ලිපි ලේඛන පරීක්ෂා කිරීමට අමතරව, විමර්ශනය පුළුල් කිරීම පිණිස මහජන නියෝජන ද, කොමිෂන් සභාවල ඉල්ලීම්, ගිණුම් කාරක සභා නියෝජන, ආයතන ප්‍රධානීන්ගේ නියෝජන හා මාධ්‍ය මගින් අනාවරණය වන තොරතුරු ලබා ගනිමින් රාජ්‍ය මූල්‍යනය කළමනාකරණය කාර්යක්ෂමව කිරීම කෙරෙහි විමර්ශන විගණනයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙයට සමගාමීව දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන්ගේ දැනුම හා කුසලතාව වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමත්, අවශ්‍ය පුහුණුවීම් ලබාදීමත්, භෞතික සම්පත්, ක්ෂණික ඇමතුම් අංකයන්, විද්‍යුත් තැපැල යනාදිය වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් පවතී.

විශේෂ විමර්ශන අංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වැදගත් හා ක්ෂණික අවධානය

යොමුවිය යුතු නියෝජන කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව නියෝජන 26 කට අදාළව රු.බිලියන 3.87 ක වියදම් පරීක්ෂා කිරීමේදී රජයට සිදුවී තිබුණු ඇස්තමේන්තුගත අලාභය රු.බිලියන 2.31 ක් වී තිබුණි. 2016 වර්ෂයේදී සිදුකළ විමර්ශනයන්ට අදාළ වැදගත් නිරීක්ෂණ සාරාංශ කර පහත දක්වා ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ෆාරා III නෞකාව අපහරණය

උතුර මුදවා ගැනීමේ මානුෂික මෙහෙයුමේදී වෙල්ලමුල්ලිවයික්කාල් මුහුදු තීරයේදී හමුවී තිබූ අබලන් තත්ත්වයේ පැවති ෆාරා III නෞකාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් යකඩ වශයෙන් රු.මිලියන 80.3 කට අලෙවි කිරීමට 2013 සැප්තැම්බර් 12 දින පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- රජයට අයත් මෙම ලැබීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුව තිබුණි. නමුත් ඊට පටහැනිව එම මුදල් "යුද්ධ හමුදාපති සුභසාධක අරමුදල" නමින් රේඛනය කරන ලද චෙක්පත් මගින් ගෙවිය යුතුය යනුවෙන් එම ගිවිසුමෙහි 5.2 ඡේදයේ දක්වා තිබුණි.

- 2014 පෙබරවාරි 18 දින වන විට මේ සඳහා රු.මිලියන 47 කින් රු.මිලියන 32 ක් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවසථාවේ 149 ව්‍යවස්ථාවට පටහැනිව යුද්ධ හමුදාපති සුභසාධක අරමුදලට හා රු.මිලියන 15 ක් අපි වෙනුවෙන් අපි අරමුදලට බැර කර තිබුණි.

- යුද්ධ හමුදාපති සුභසාධක අරමුදලට බැර කළ රු.මිලියන 32 ක මුදල 2016 නොවැම්බර් 17 දින ඒකාබද්ධ අරමුදල වෙත බැර කර තිබුණත්, අපි වෙනුවෙන් අපි අරමුදලට බැර කළ රු.මිලියන 15 ක මුදල ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

- යුද්ධ හමුදාපතිවරයාගේ අනුමැතිය පරිදි ඉවත් කරගනු ලබන යකඩ ටොන් 20 ක් සඳහා රු.මිලියනයක් ගෙවිය යුතුය යන කොන්දේසිය ගිවිසුමට ඇතුළත් කළ යුතු වුවත්, යකඩ ටොන් 225 සඳහා එසේ නොකිරීම හේතුවෙන් රු.මිලියන 22.5 ක අලාභයක් සිදුවී තිබුණි.

- අදාළ ගිවිසුම තුළ ප්‍රමාණවත් කොන්දේසි ඇතුළත් නොවීම හේතුවෙන් පහසුවෙන් කපා ගත හැකි මුහුද මතුපිට පිහිටි යකඩ ප්‍රමාණය පමණක් ගැනුම්කරු විසින් ඉවත් කරගෙන තිබුණත්, නෞකාව ඉවත් කිරීම අතරමඟ නතර කර දැමීමට ගැනුම්කරුට ඉඩ සැලසී තිබුණි.

2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවයේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබාගැනීම

සී.ඩබ්ලිව්.ජී.හම්බන්තොට 2018 පෞද්ගලික සමාගම පිහිටුවීම සඳහා ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් 2010 දෙසැම්බර් 16 දින අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා 2010 දෙසැම්බර් 29 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශයේ 06(II) වගන්තියට අනුව, සංස්ථාපනය කළ සී.ඩබ්ලිව්.ජී.හම්බන්තොට 2018 පෞද්ගලික සමාගමේ කොටස්වලින් සියයට 51 ක් ශ්‍රී ලංකා රජයටත්, ඉතිරි සියයට 49 ක කොටස්වල අයිතිය රජයට අයත්

ආයතනවලටත් හිමි වන ලෙස කොටස් නිකුත් කිරීමට යෝජනා කර තිබුණි. ඒ අනුව පහත සඳහන් ආයතන විසින් එහි ආරම්භක කොටස් ප්‍රාග්ධනය සඳහා රු.මිලියන 128 ක මුදල් ලබාදී තිබුණි. එම කොටස් ප්‍රාග්ධනය ලෙස සලකා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට අදාළ මුද්දර ගාස්තුව වූ රු.640,000 ක මුදලද ගෙවා තිබූ අතර, ඒ සඳහා අනුමැතිය අදාළ සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මගින් තහවුරු වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ක්‍රීඩා අමාත්‍යාංශයෙන් රු.මිලියන 100 ක්ද, ක්‍රීඩා අමාත්‍යාංශයේ ජාතික ක්‍රීඩා අරමුදලින් රු.මිලියන 10 ක්ද, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් රු.මිලියන 8 ක් හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම රු.මිලියන 10 ක් වශයෙන් රු.මිලියන 128 ක් කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් ලබාදී තිබුණු අතර, එයින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් යොදවා තිබූ මුදල පමණක් අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික ගිණුම්වල ආයෝජන ලෙස ඇතුළත් කර තිබුණි.

- සමාගමේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මගින් නිකුත් කර තිබූ රු.මිලියන 128.00 ක කොටස් ප්‍රාග්ධනය පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

ඉහත සී.ඩබ්ලිව්.ජී. හම්බන්තොට 2018 පෞද්ගලික සමාගම පිහිටුවීම සඳහා (118,000,000 /128,000,000 X 100) සියයට 92 ක කොටස් ප්‍රාග්ධනය සම්පූර්ණ රාජ්‍ය අරමුදල් මගින් යොදවා තිබුණි. එසේම පෞද්ගලික ආයතනවලින් ලබාගන්නා මුදල් වුවද, ඒවා රාජ්‍ය සමාගමක් වෙත ලබාගැනීමේදී හා එම මුදල් වියදම් කිරීමේදී ඒ සඳහා රජයේ නීති,රීතිවලට හා මුදල් රෙගුලාසි සංග්‍රහයට අනුව ඉතා අරපිරිමැස්මෙන් වියදම් කළ යුතු අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කටයුතු හා උපදේශනාත්මක සේවාවක් ලබාගැනීමේදී කටයුතු කිරීම අනිවාර්ය වන අතර ඉහත සමාගම විසින් සිදුකර තිබූ රු.මිලියන 696.70 ක වියදම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් 2016 ජූනි 30 දිනට අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා 190 දෙනෙකු බඳවාගෙන තිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මෙහෙයුම් තනතුර සඳහා සුදුසුකම් ඇති නිලධාරියෙකු සංස්ථාවේ සිටියදී අයදුම්පත් කැඳවීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මූලික සුදුසුකම් සපුරා නොතිබුණු පුද්ගලයෙකු බඳවා ගැනීම මගින් එම තනතුරට නිලධාරීන් දෙදෙනෙකු පත්කිරීම මත අනුමැතියකින් තොරව රු.මිලියන 3.62 ක් ගෙවා තිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය නොමැතිව සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණ තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. එම නිලධාරියා හට අතිරේක වැටුප් වර්ධක හා දීමනා වශයෙන් රු.474,907 ක් ගෙවා තිබුණි. සංස්ථාවේ මූල්‍ය කළමනාකරණ තනතුර සඳහා පත්කළ නිලධාරියෙකු හට අතිරේක වැටුප් වර්ධක හා දීමනා වශයෙන් රු.975,851 ක් ගෙවා තිබුණි.

සභාපතිගේ රහස්‍ය ලේකම් තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන අනුමත වැටුප් තලයට ඉහළ වැටුප් තලයක පිහිටුවා වැටුප් හා දීමනා ගෙවීම මත රු.මිලියන 1.16 ක මූල්‍ය අලාභයක් සිදුකර තිබුණි. නීත්‍යානුකූල නොවන අයුරින් විගණන නිලධාරි තනතුරට නිලධාරියෙකු පත්කිරීම මත වැටුප් හා දීමනා

ගෙවීම මත රු.437,836 ක මූල්‍ය අලාභයක් සිදුකර තිබුණි.

ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2015 ඔක්තෝබර් 15 දිනට අනුමැතියකින් තොරව කම්කරුවන් 420 දෙනෙකු බඳවාගෙන තිබුණි. ඔවුන්ට වැටුප් හා දීමනා ලෙස දළ වශයෙන් වර්ෂයකට රු.මිලියන 95 ක් පමණ ගෙවා තිබුණි. සිවිල් පරිපාලන අධ්‍යක්ෂ කාර්යාලයේ සිවිල් පරිපාලන අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරි තනතුරු පුරප්පාඩු වීම හා මාණ්ඩලික සහකාර හා ප්‍රධාන ලිපිකරු තනතුරුවලට නිලධාරීන් නම් නොකිරීම මත නිසි අධීක්ෂණයකින් අදාළ අංශයේ කටයුතු සිදු නොවීම හා කාර්යමණ්ඩල අතර මතභේදාත්මක තත්ත්වයක් නිර්මාණය වී තිබුණි.

සීමාසහිත ලංකා සතොස ආයතනය

සී/ස ලංකා සතොස ආයතනය දේශීය ලොකු ඒණු මිලදී ගැනීම

වාර්ෂික ලොකු ඒණු අවශ්‍යතාවය දේශීය ලොකු ඒණු අස්වැන්න නිසි පරිදි කළමනාකරණය තුළින් සපුරා ගැනීමත්, දේශීය ඒණු කර්මාන්තයෙහි යෙදෙන ගොවීන් හට අස්වනු සඳහා ඉහළ මිලක් ලබාදීමත්, වෙළඳපොල ලොකු ඒණු මිල උච්චාවචනය අවම කිරීමත් අරමුණු කරගෙන ඒණු මිලදී ගැනීම, ඒණු තේරීම, ගබඩා කිරීම සහ ගබඩා කිරීමට ප්‍රමාණවත් නොවන ඒණු ලංකා සතොස හරහා දිනපතා අලෙවි කිරීම, ගබඩා ද්‍රව්‍ය මාස 04 ක් කල්තබා ගැනීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම හා ඒ සඳහා වී අලෙවි මණ්ඩලයේ ගබඩා තාක්ෂණය පරිදි සකස් කිරීමට සැලැසුම් කර තිබුණි. මෙම සැලැසුම් ක්‍රියාත්මක කිරීම පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් මිලදී ගැනීම් සඳහා සුදුසු ක්‍රමවේදයක් හා ලොකු ඒණු මිලදී ගැනීමට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

- 2014/15 මහ කන්නය සඳහා දේශීය ලොකු ඒණු මිලදී ගැනීමේදී එම නිෂ්පාදනවල ප්‍රමිතිය පිළිබඳව සලකා බලා නොතිබුණි.

- කාර්යසාධන මෙහෙයුම් කමිටුව විසින් ලොකු ඒණු කිලෝග්‍රෑමයකට වැය වන නිෂ්පාදන පිරිවැය ආදිය පිළිබඳ සලකා බැලීමකින් තොරව කිලෝග්‍රෑමයකට රු.60 ක සහතික මිලක් නියම කර තිබුණි. නමුත් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි කිලෝ ග්‍රෑමයකට රු.90 ක් බැගින් මිලකට ගැනීමට සිදුවී තිබුණි. මේ නිසා 2014 නොවැම්බර් 26 දින සිට 2014 දෙසැම්බර් 13 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා සතොස මගින් මිලදීගත් ලොකු ඒණු කිලෝග්‍රෑම් 4,522,342 ක් සඳහා රු.මිලියන 135.67 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- මිලදීගත් ලොකු ඒණු මාස 04 ක් කල්තබා ගත හැකි වන පරිදි ගබඩා කිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට සැලැසුම්කර තිබුණද, ඒ සඳහා යොදාගෙන තිබූ වී අලෙවි මණ්ඩලයට අයත් ගබඩාවල ලොකු ඒණු ගබඩා කිරීමට සුදුසු වන පරිදි තාක්ෂණික ක්‍රම භාවිතා නොකිරීම හා අලෙවි කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් නොයෙදීම හේතුවෙන් මිලදීගත් ලොකු ඒණු කිලෝග්‍රෑම් 1,121,135 නරක් වීම නිසා රු.මිලියන 100.90 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි.

- සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලොකු ඊෑණු කිලෝග්‍රෑමයක් රු.65 කට සහ රු.60 කට අලෙවි කිරීමට අනුමැතිය ලබා දී තිබුණත්, ඊට වඩා අඩු මිල ගණන්වලට අලෙවි කිරීම නිසා සීමාසහිත ලංකා සතොසට ආයතනයට රු.මිලියන 44.31 ක මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි.

- සීමාසහිත ලංකා සතොස ආයතනය දේශීය ලොකු ඊෑණු මිලදීගත් කාලපරිච්ඡේදය තුළදීම ආනයනික ලොකු ඊෑණු කිලෝ ග්‍රෑම් 959,541 ක් මිලදී ගෙන තිබූ අතර ඒ සඳහා රු.මිලියන 63.22 ක් වැයකර තිබුණි.

ක්‍රීඩා අමාත්‍යාංශය වෙනුවෙන් සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් කැරම්බෝඩ් හා දාම්බෝඩ් ආනයනය කිරීම.

ක්‍රීඩා අමාත්‍යාංශය වෙනුවෙන් සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් 2014 නොවැම්බර් 20 දින සිට 2014 දෙසැම්බර් 05 දින දක්වා කාලය තුළ කැරම්බෝඩ් 14,000 ක් හා දාම්බෝඩ් 11,000 ක් තීරුබදු රහිතව ආනයනය කිරීම වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 39.06 ක් 2016 මැයි මාසය වන විටත් ලබා ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- මේ සම්බන්ධයෙන් වූ ඉල්ලීම ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2014 නොවැම්බර් 07 දින සීමාසහිත ලංකා සතොස ආයතනය වෙත කර තිබුණි. නමුත් ඊට ප්‍රථමයෙන් 2014 ඔක්තෝබර් 01 දින හා 21 දින එම ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනිම සඳහා ඉන්වොයිස්පත් ලබාගෙන ණයවර ලිපි විවෘතකර තිබුණි. පූර්ණ රාජ්‍ය සමාගමක්වූ සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් මෙම මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර ඉන්දියානු ආයතනයකින් අදාළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ණයවර ලිපි විවෘත කර තිබුණි.

- ඇණවුම් කරන ලද රු.මිලියන 26.80 ක් වටිනා කැරම්බෝඩ් 14,000 ක් අඩංගු බහලුම් 14 ක් ද, රු.මිලියන 12.26 ක් වටිනා දාම්බෝඩ් 11,000 ක් අඩංගු බහලුම් 03 ක්ද, 2014 නොවැම්බර් 17 දින සිට 2014 දෙසැම්බර් 06 දින දක්වා කාලය තුළදී මැක්ලම් තොග බෙදාහැරීමේ ශාඛාව වෙත ලැබී තිබුණි. එම ලැබීම් වෙනුවෙන් භාණ්ඩ ලැබීමේ තුණ්ඩු (GRN) නිකුත් කර නොතිබූ අතර තොග ලේඛනයට ඇතුළත් කරද නොතිබුණි. එමෙන්ම මෙම භාණ්ඩ තොගය ක්‍රීඩා අමාත්‍යාංශයට භාර නොදී ක්‍රීඩා අමාත්‍යාංශයේ රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරියෙකුට සෘජුවම ලබාදුන් බවට ලේඛන සකස් කර තිබුණි.

ක්‍රීඩා අමාත්‍යාංශය වෙනුවෙන් තීරුබදු රහිතව ආනයනය කරන ලද කැරම් බෝඩ් හා දාම්බෝඩ් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු නොකර, විධිමත් අනුමැතියකින් තොරව වරාය අධිකාරියට අයත් මාබිම ගබඩාවක් වෙත යවා තිබුණි.

සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් ණයට අලෙවි කිරීම හා මුදල් අයකර ගැනීම

සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් 2014 වර්ෂයේදී රු.මිලියන 501 ක් වටිනා භාණ්ඩ ණය පදනම යටතේ අලෙවිකර තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට අලෙවිසැල් 112 ක ණයගැතියන් 337 දෙනෙකුගෙන් රු.මිලියන 218 ක් අයවීමට තිබුණි. එම මුදල අයකර ගැනීමට 2016

සැප්තැම්බර් මාසය වන විටත් කටයුතු කර නොතිබුණි. එම ණයගැති ශේෂය තුළ රු.මිලියන 1 ක සිට රු.මිලියන 5 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් වූ ණයගැතියන් 11 දෙනෙකුද, රු.මිලියන 5 කට වැඩි ණයගැතියන් 8 දෙනෙකුද විය. තවද මැක්ලම්, තිස්සමහාරාම, කතරගම, වොක්ෂෝල් වීදිය, දෙබරවැව හා කුරුණෑගල යන ශාඛා මගින් 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ණය පදනම මත අලෙවි කර තිබුණු එකතුව රු.මිලියන 11.37 ක් වටිනා භාණ්ඩ වෙනුවෙන් අය විය යුතු මුදල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කිහිපයකදී පරිත්‍යාග ලෙස සැලකීමට තීරණය කර තිබුණි.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් Botulinum Toxin මිලදී ගැනීම

රජයේ රෝහල්වලට අවශ්‍ය Botulinum Toxin ml 100 ඖෂධයෙන් Vials 750 ක් 2014 සැප්තැම්බර් මාසය වන විට සපයන ලෙස 2014 මාර්තු 12 දින රජයේ වෛද්‍ය සැපයුම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙතින් ඇණවුම් කර තිබුණි. එම ඇණවුම නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා 2015 වර්ෂයේදී රෝහල් 05 කට එම ඖෂධය ප්‍රාදේශීයව සපයා ගැනීම සඳහා රු.මිලියන 4.76 ක් වැය කර තිබුණි. එම එන්නත් වර්ගය 2014 වර්ෂයේදී ලැබී තිබුණු මිල ගණන් අනුව සපයා තිබුණේනම් එක් එන්නතක් සඳහා රු.18,536.72 ක් බැගින් වැය වන මුදල රු.මිලියන 2.56 ක් වී තිබුණි. නිසි පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු නොකිරීම නිසා රෝහල් 05 ක් සඳහා රු.මිලියන 2.20 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

කොළඹ මහ නගර සභාව

ආහාර පරිහරණ ආයතන ලියාපදිංචි කිරීම

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වගන්තිය ප්‍රකාරව හා 2012 ජනවාරි 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය ප්‍රකාරව කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සෑම ආහාර පරිහරණය කරන ව්‍යාපාරයක් විසින්ම භාවිතා කරන වතුර සාම්පල, ආහාර සාම්පල හා ආහාර පරිහරණය කරන්නන් හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් සිටින බව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂා කර නිර්දේශ කළ පසු බලපත්‍රය නිකුත් කළ යුතුව තිබුණි. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ එවැනි ව්‍යාපාරික ස්ථාන 285 ක කිසිදු පරීක්ෂාවකින් තොරව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධරියා විසින් නිර්දේශයන් ලබාදී බලපත්‍රය නිකුත්කර තිබුණි.

රසායනික ද්‍රව්‍ය කල් ඉකුත්වීම

ආහාර හා ජලය වෛද්‍ය පරීක්ෂණ සාම්පල් පරීක්ෂා කිරීමට නාගරික අනුජීවී රසායනාගාරය සතුව ප්‍රමාණවත් තරම් නවීන යන්ත්‍ර හා රසායන ද්‍රව්‍ය පැවතුණි. ආහාර පරිහරණය කරන්නන්ගේ වෛද්‍ය පරීක්ෂණ 2015 මැයි මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු කර නොතිබුණි. එමෙන්ම ආහාර සාම්පල් පරීක්ෂාවන්ද 2016 වර්ෂයේදී සිදුකර නොතිබුණි. මේ නිසා පරීක්ෂණ කටයුතු සඳහා මිලදී ගෙන තිබුණු රු.මිලියන 4.89 ක් වටිනා ද්‍රව්‍ය අයිතම 21 ක හා වටිනාකම හඳුනා ගැනීමට නොහැකි වූ ද්‍රව්‍ය අයිතම 30 ක කාලය ඉකුත් වී තිබුණි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

වෛස්රෝයි විශේෂ දුම්රිය ධාවනය කිරීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වෛස්රෝයි විශේෂ දුම්රිය නමින් හඳුන්වන මැදිරි හතරකින් හා වාෂ්ප එංජිමකින් සමන්විත වාෂ්ප දුම්රිය ධාවනය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සීමාසහිත

සමාගමක් සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. 2016 මැයි 01 දින වන විට ඉකුත් කාල පරිච්ඡේද වෙනුවෙන් එම සීමාසහිත සමාගමෙන් දුම්රිය ගාස්තු ලෙස රු.මිලියන 9.79 ක්ද, අළුත්වැඩියා ගාස්තු වශයෙන් රු.මිලියන 6.12 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 15.91 ක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අය විය යුතුව තිබුණි. සමාගම විසින් එම ගෙවීම් පැහැර හැර තිබුණි. එම මුදල් අයකර ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු නොකර නැවත 2016 මැයි 02 දින සිට 2021 මැයි 01 දින දක්වා වර්ෂ 05 ක කාලපරිච්ඡේදයකට 2016 ජුනි 01 දින එම සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණි.

දුම්රිය මැදිරි පෞද්ගලික සමාගම් වෙත බදුදීම

දුම්රියන්හි ගමන් කරන මගී ජනතාවට ඉතා උසස් සේවාවක් ඉටු කිරීම සඳහා විශේෂ සුඛෝපභෝගී දුම්රිය මැදිරි හඳුන්වාදීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. මේ සම්බන්ධව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ප්‍රවාහන අමාත්‍යාංශය එක්ව එම විශේෂ සුඛෝපභෝගී මගී ප්‍රවාහන සේවාව ඉටු කිරීම සඳහා 2011 වර්ෂයේ සිට පුද්ගලික සමාගම් දෙකක් වෙත දුම්රිය මැදිරි බදු දී තිබුණි. එම බදු ගිවිසුම්වලට එළඹ තිබුණු දිනයේ සිට මාස 6 ක් පමණ කාලයක් සේවා ඉටු කිරීම අදාළ සමාගම් දෙක විසින් පැහැර හැර තිබුණි. මේ නිසා ගත්මිල රු.මිලියන 34.87 ක් වූ දුම්රිය මැදිරි 12 ක් එම කාලය තුළ නිෂ්ක්‍රීයව පැවතුණි. මෙම මැදිරි පළමු පන්තියේ ප්‍රවේශපතක ගාස්තුව අනුව ධාවනයට යෙදවීමෙන් රු.මිලියන 22.08 ක ආදායමක් උපයා ගැනීමට හැකියාව තිබුණත්, එම ආදායමද දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.

දෙපාර්තමේන්තුවේ T1 515 රේල්කාර් රථය බදුදීම

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විදේශීය සංචාරකයන්ට සුඛෝපභෝගී සේවාවක් සැලසීම සඳහා දෙපාර්තමේන්තුව සතුව පවත්නා මගීන් 32 කට ගමන් කළ හැකි T 1 515 දරන රේල් කාර් රථය බදු කුලී ගාස්තු මත සීමාසහිත සමාගමක් වෙත බදු දී තිබුණි. එම සමාගම විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා රේල්කාර් රථය වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 2015 වර්ෂය අවසන් වන විට දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 2.32 ක් වැය කර තිබුණත්, එම වියදම සමාගමෙන් අයකර ගෙන නොතිබුණි.

"රේල් ටුවර්ස් " කාර්යාලය සඳහා කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් ගොඩනැගිලි ඉඩ පහසුකම් ලබාදීම

කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ ගොඩනැගිලි පරිශ්‍රයේ සංචාරක තොරතුරු සැපයීම සඳහා "රේල් ටුවර්ස්" නමින් කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා සීමාසහිත සමාගමක් වෙත 1987 වර්ෂයේ සිට වර්ග අඩි 565 කින් යුත් ගොඩනැගිලි ඉඩ පහසුකම් ලබා දී තිබුණි. 2011 අගෝස්තු 30 දිනට අයවිය යුතු බදු කුලිය රු.මිලියන 1.32 ක් වී තිබුණි. එම හිඟහිටි බදු කුලිය අයකර ගැනීමට කටයුතු නොකර නැවත 2011 සැප්තැම්බර් 01 දින සිට 2016 අගෝස්තු 31 දින දක්වා වර්ෂ 05 ක් සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගේ අභිමතය පරිදි තීරණය වූ රු.40,000 ක මාසික කුලියක් යටතේ එම සමාගම වෙත නව බදු ගිවිසුමක් යටතේ බදු දී තිබුණි.

2016 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හඳුන්වාදීම තුළින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සලසා දෙන ලද ප්‍රතිපාදනවලින් ජනිතවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමෙන් ඒවායේ පාලනය මෙන්ම රටක් වශයෙන් රජය සතු වත්කම්වල වටිනාකම ගණනය කිරීමෙන්, ඒවායේ ආරක්ෂාව තහවුරුවන පරිදි වගකීම පැවැරීමටත් හැකි තත්ත්වයක් නිර්මාණය වන බව සඳහන් කළ යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශනවල සඳහන් උපචිත පදනම මත ගණනය කළ ආදායම හා වියදම සමඟ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් ආදායම් හා වියදම් සැසඳිය හැකිවීම තුළින් ආදායම් රැස්කිරීමට හා වියදම් පාලනයක් ඇති කර ගත හැකිය.

වාර්ෂික විසර්ජනයන්

2016 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදනය කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය රු.මිලියන 1,390 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 1,186 ක් විය.

2016 වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන බලමණ්ඩල, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු වශයෙන් රු.මිලියන 169 ක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්කිරීමට අපේක්ෂා කළ විගණන ගාස්තුව රු.මිලියන 120 ක් වුවත්, එම ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 49 ක් වැඩියෙන් සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු රැස්කිරීමට හැකි වී තිබුණි.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

වත්කම් පාලනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය මැන බැලීම සඳහා මෙවලමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ මූලික වැඩ කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කෙරුණි. යටත් විජිත සමයේ සිට විසර්ජන ගිණුම් පමණක් ඉදිරිපත් කරමින් පවතින ආයතන කාණ්ඩය යටතේ පවතින දෙපාර්තමේන්තුවලට ප්‍රථම වතාවට මෙම ගිණුම්කරණය හඳුන්වා දී ඇත. තවදුරටත් 2013 වර්ෂයේ සිට සෑම අමාත්‍යාංශයකම හා දෙපාර්තමේන්තුවකටම මෙම ගිණුම් ක්‍රමය 2013 ජනවාරි 24 දිනැති අංක SA/AS/AA/Circular දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියෙන් හඳුන්වා දී ඇත. මේ මගින් ආරම්භක පියවරක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මුළු රාජ්‍ය ක්ෂේත්‍රයටම ආදර්ශයක් වී ඇත.

ගිණුම් ප්‍රතිපත්ති

1 වාර්තා කිරීමේ අස්ථිත්වය

විගණකාධිපති දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් කිසියම් විශේෂ නීතියක් නොමැත. කෙසේ වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවෙහි විගණකාධිපතිවරයෙක් විය යුතු බව දක්වා ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හා (3) ව්‍යවස්ථාවල සඳහන් ආයතනවලට විගණන සේවා සැපයීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වේ.

2 වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය

වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය ජනවාරි 01 දිනෙන් ආරම්භ වී දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය වේ.

3 සකස් කිරීමේ පදනම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර සියලුම වටිනාකම් ආසන්නම රුපියල් දහසේ වටිනාකමට වටයා ඇත.

4 ආදායම්

භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන, විගණන ගාස්තු, ණය සඳහා පොළි, ගොඩනැගිලි කුලී, සංචාරක බංගලා ගාස්තු, වත්කම් අපහරණයෙන් ලාභ, දඩ හා ගාස්තු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන අතර ඒවා උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. ආදායම ඒවාට ලැබුණු ප්‍රතිෂ්ඨාව අනුව සාධාරණ පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන ආයතන, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු අයකරනු ලබයි. කාලපරිච්ඡේදයට අදාළ ආදායමක් ලෙස ගාස්තු හඳුනාගනී. විගණන ගාස්තුවල වටිනාකම, විගණනය සඳහා ගත කරනු ලබන කාලය හා එම විගණනය සඳහා වැය කරන සෘජු පිරිවැය පදනම් කරගෙන තීරණය කරනු ලැබේ.

ණය සඳහා පොලී, ගොඩනැගිලි කුලී, සංචාරක බංගලා ගාස්තු, දඩ හා ගාස්තු, වත්කම් අපහරණයෙන් ලද ආදායම් පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වෙනත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වුවත්, දෙපාර්තමේන්තුවට අදාල එම ආදායම් එකතු කරන නිලධාරියා විගණකාධිපති වන හෙයින් හා එකතු කරන ලද ආදායම සමස්ථ ආදායමෙන් සුළු ප්‍රතිශතයක් වන හෙයින්, එම ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. මුදල් පදනම මත භාණ්ඩාගාර පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදානයන් ගිණුම්ගත කර ඇතත්, ස්ථාවර වත්කම් ක්ෂයවීම් පුනරාවර්තන වියදම් සඳහා ලැබිය යුතු ප්‍රදාන යටතේ ගිණුම්ගත කර ඇත.

5 වියදම්

උපචිත පදනම යටතේ සියළු පුනරාවර්තන වියදම් ගිණුම්ගත කරනු ලැබේ.

6 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුව සිදුවන දිනට පවතින විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. එම ගනුදෙනු පියවීමේදී සිදුවන විදේශ විනිමය ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

7 මුදල් හා මුදල්වලට සමාන දෑ

අතැති මුදල් හා බැංකුවල ඇති වැඩි ද්‍රවශීලතාවයෙන් යුක්ත කෙටිකාලීන තැන්පතු, මුදල් හා මුදල්වලට සමාන දෑ ඇතුළත් වේ.

8 ණයගැතියන් හා අනෙකුත් ලැබිය යුතු මුදල්

ණයගැතියෝ හා ලැබිය යුතු දෑ මූලිකව සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. ලැබිය යුතු ශේෂ පිළිබඳ මූලික කොන්දේසිවලට අනුව

දෙපාර්තමේන්තුවට මුදල් අයකර ගැනීමට නොහැකි බවට සාක්ෂි තිබෙන විට ලැබිය යුතු මුදලක් හානිකරණය වූ ලෙස සලකනු ලැබේ.

9 දේපල, පිරියත හා උපකරණ

ඉඩම්, ගොඩනැගිලි, ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ, පරිගණක දෘඩාංග හා මෝටර් රථ යනාදියෙන් දේපල, පිරියත හා උපකරණ සමන්විත වේ. දේපල පිරියත හා උපකරණ පිරිවැයට සමුච්චිත ක්ෂය හා අපහරණයෙන් වූ පාඩු අඩුකර දක්වනු ලැබේ. 2009 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ශේෂ පදනම් කරගෙන පළමුවරට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර 2010 ජනවාරි 01 දිනට පැවැති සියළුම ඉඩම් හා ගොඩනැගිලි මැණුම් දෙපාර්තමේන්තුවේ සැලැසුම්වලට අනුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කරන ලද තක්සේරුවට අනුව ගිණුම් ගත කරන ලදී. සියළුම මෝටර් රථ වාහන රජයේ තක්සේරුකරු විසින් කරන ලද ප්‍රත්‍යාගණනය පදනම් කරගෙන ගිණුම්ගත කර ඇති අතර, ලීබඩු, පරිගණක හා වෙනත් විෂයයන් ස්වාධීන තක්සේරු කණ්ඩායමක් විසින් සිදුකරන ලද තක්සේරුව මත පදනම් කරගෙන ගිණුම්වලට ගන්නා ලදී.

දේපල පිරියත හා උපකරණ විෂයයක පිරිවැය වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ විෂයය සමඟ සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ විය හැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේ නම් හා එම විෂයෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය. බොහෝ අවස්ථාවලදී දේපල පිරියත හා උපකරණ විෂයයන් එහි පිරිවැයට හඳුනාගනු ලැබේ. පිරිවැය රහිතව අත්කර ගත් හෝ නාමික පිරිවැයට අත්කර ගත් වත්කමක පිරිවැය, එම වත්කම අත්කර ගත් දිනයේදී සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

9.1 අපහරණයන්

අපහරණයේදී ලැබෙන මුදල වත්කමෙහි ධාරණ වටිනාකම සමඟ සසඳා අපහරණයෙන් උද්ගතවන ලාභය හා පාඩුව තීරණය කරනු ලැබේ. අපහරණය මත ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

9.2 පසුව සිදුවන පිරිවැය

මුල් අත්පත් කර ගැනීමෙන් අනතුරුව දරනු ලබන පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එමගින් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ හෝ ලැබිය හැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේනම් සහ එම විෂයන්හි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය.

9.3 ක්ෂය කිරීම

සියළුම දේපල, පිරියත හා උපකරණවල පිරිවැය අඩුකළ ඇස්තමේන්තුගත අවශේෂ වටිනාකම් සහ ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය අනුපාතයට අනුව සියළුම දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය සරල මාර්ග පදනම මත ප්‍රතිපාදනය කරනු ලබයි. ප්‍රධාන වත්කම්වලට ප්‍රයෝජනවත් ආයු කාලය හා සම්බන්ධිත ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි ඇස්තමේන්තු කර ඇත. වත්කම මිලදී ගන්නා වර්ෂය සඳහා මුළු වර්ෂය සඳහාම ක්ෂය කිරීමත් විකුණන වර්ෂය සඳහා ක්ෂය නො කිරීමත් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිය වේ.

වත්කම	ආයු කාලය	ක්ෂය අනුපාතය
	වර්ෂ	ප්‍රතිශතය
ගොඩනැගිලි	50	2.0
කුඩා පරිමාණ මුද්‍රණාලය	20	5.0
විදුලි සෝපානය	20	5.0
මෝටර් වාහන	8	12.5
ලීබඩු හා උපකරණ	5	20.0
පරිගණක හා දෘඩාංග	4	25.0

10. ගෙවිය යුතු මුදල්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට පවතින වටිනාකමට ගෙවිය යුතු මුදල් ගිණුම්වලට ගනු ලැබේ. මූලිකව සාධාරණ අගයට ගෙවිය යුතු මුදල් ගණනය කරනු ලැබේ.

11. වාර්ෂික ඇස්තමේන්තු

පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන පනත මගින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන සංඛ්‍යා ප්‍රධාන ඇස්තමේන්තුවේ සංඛ්‍යා වේ. මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ වීරමොං පරිපාටියෙන්ද, පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් හා පරිපූරක ඇස්තමේන්තු මගින් ගැලැපීම් කිරීමෙන් පසුව මෙම සංඛ්‍යා අවසාන සංඛ්‍යා ලෙස දක්වනු ලැබේ.

12. විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම්

ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වාර්තා කරන ලද වත්කම් හා බැරකම්, ආදායම් හා වියදම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු කිරීම්, උපකල්පනයන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වේ. අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගැලපෙන පරිදි ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පනයන් ඓතිහාසික අත්දැකීම් හා වෙනත් විවිධ කරුණු මත පදනම් වේ.

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඇස්තමේන්තුව 2016 රු.000		සටහන	2016 රු.000	2015 රු.000
	ආදායම			
120,000	විගණන ගාස්තු	1	136,504	104,025
320	කුලී		493	280
9,000	පොලී		8,957	9,384
-	දඩ මුදල් හා රාජසන්තක කිරීම්		21	15
4,000	අනෙකුත්		8,152	3,053
	වත්කම් අපහරණයෙන් ලාභ	2	20,808	3,255
133,320	**මුළු මෙහෙයුම් ආදායම**		**174,935**	**120,012**
1,107,210	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය	3	1,025,749	1,134,428
1,240,530	**මුළු ආදායම**		**1,200,684**	**1,254,440**
	වියදම			
1,046,800	පුද්ගල පඩිනඩි	4	960,036	1,015,033
30,400	ගමන් වියදම්	5	29,935	14,663
25,800	සැපයීම්	6	28,154	18,133
12,850	නඩත්තු වියදම්	7	12,081	16,510
87,000	සේවා	8	80,326	68,283
11,500	මාරු කිරීම්	9	11,384	10,379
26,180	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය		26,022	1,889
-	ක්ෂයවීම්	10	56,050	85,715
-	විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය ක්‍රමක්ෂය	11	24,904	24,904
1,240,530	**මුළු වියදම**		1,228,892	1,255,509
0	**වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය/(ඌනතාවය)**		(28,208)	(1,069)

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2016 දෙසැම්බර් 31		2015 දෙසැම්බර් 31	
		රු.000	රු.000	රු.000	රු.000
ජංගම නොවන වත්කම්					
දේපල,පිරියත හා උපකරණ	10		1,080,367		1,123,327
විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීම	11		126,476		151,380
ජංගම වත්කම්					
මුදල් ශේෂය		-		-	
තොගය	12	6,007		5,225	
රජයේ නිලධාරීන්ට අත්තිකාරම්	13	214,319		218,238	
ලැබිය යුතු විගණන ගාස්තු	14	184,299		214,429	
මුළු ජංගම වත්කම්			**404,625**		**437,892**
මුළු වත්කම්			**1,611,468**		**1,712,599**
ජංගම වගකීම්					
ගෙවිය යුතු වියදම්	15	1,092		2,232	
ගෙවිය යුතු තැන්පත්		19,473		24,990	
මුළු ජංගම වගකීම්			**20,565**		**27,222**
සමුච්චිත අරමුදල					
ජනවාරි 01 දිනට ශේෂය		**217,422**		218,491	
වර්ෂයේ අතිරික්තය/(ඌනතාවය)		(28,208)		(1,069)	
දෙසැම්බර් 31 දිනට ශේෂය			**189,214**		**217,422**
දායකය					
භාණ්ඩාගාර	16	629,448		639,118	
රාජ්‍ය අංශයේ ධාරිතාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	17	772,241	1,401,689	828,837	1,467,955
මුළු බදු ගෙවන්නන්ගේ ස්කන්ධය			**1,611,468**		1,712,599

එච්.එම්.ගාමිණි විජේසිංහ
විගණකාධිපති

එස්. එස්.කේ.ලියනගේ
ප්‍රධාන ගණකාධිකාරී

2017 ඔක්තෝබර් 27 දින

මූල්‍ය ප්‍රකාශනවල සටහන්

ඇස්තමේන්තුව 2016	විස්තරය	2016	2015
රු.දහස්		රු.දහස්	රු.දහස්
120,000	ලැබීම්		
	රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන	63,256	32,787
	පළාත් පාලන ආයතන	20,985	26,307
	ගොවිජන සේවා මධ්‍යස්ථාන	1,160	1,225
120,000	එකතුව	85,401	60,319
	ලැබිය යුතු		
	රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන	34,661	20,850
	පළාත් පාලන ආයතන	15,334	19,986
	ගොවිජන සේවා මධ්‍යස්ථාන	1,108	2,870
-	එකතුව	51,103	43,706
120,000	මුළු එකතුව	136,504	104,025

සටහන 02	වත්කම් අපහරණය		
ඇස්තමේන්තුව 2016	විස්තරය	2016	2015
රු.දහස්		රු.දහස්	රු.දහස්
	වාහන අපහරණය		
-	වාහනවල විකුණුම් වටිනාකම	-	6,349
-	ධාරණ අගය	-	(3,212)
-	වාහන අපහරණයෙන් ලාභය	-	3,137
	ලීබඩු හා උපකරණ අපහරණය		
-	ලීබඩු හා කාර්යාල උපකරණ විකුණුම් වටිනාකම	18,558	133
-	ධාරණ අගය	0	(46)
-	ලීබඩු හා උපකරණ අපහරණයෙන් ලාභය	18,558	87
	පරිගණක හා දෘඩාකාංග අපහරණයෙන්		
-	පරිගණක හා දෘඩාංග විකුණුම් වටිනාකම	2,250	31
	ධාරණ අගය	0	-
-	පරිගණක හා දෘඩුකාංග අපහරණයෙන් ලාභය	2,250	31
-	වත්කම් අපහරණයෙන් ලාභය	20,808	3,255

සටහන 3	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය		
ඇස්තමේන්තුව. 2016		2016	2015
රු.දහස්		රු.දහස්.	රු.දහස්.
1,240,530	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම	940,762	1,023,809
-	ක්ෂයවීම් සඳහා ලැබිය යුතු අග්‍රිම	56,050	85,715
-	විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය	24,904	24,904
1,240,530	**පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය**	**1,021,716**	**1,134,428**

සටහන 04	පුද්ගල පඩිනඩි		
ඇස්තමේන්තුව 2016	විස්තරය	2016	2015
රු.දහස්		රු.දහස්	රු.දහස්
451,800	වැටුප් හා වේතන	447,334	384,461
5,000	අතිකාල හා නිවාඩු දින දීමනා	4,619	3,196
590,000	අනෙකුත් දීමනා	508,083	627,376
1,046,800	**එකතුව**	**960,036**	**1,015,033**

සටහන 05	ගමන් වියදම්		
ඇස්තමේන්තුව 2016	විස්තරය	2016	2015
රු.දහස්		රු.දහස්	රු.දහස්
10,500	දේශීය	10,488	10,945
19,900	විදේශීය	19,447	3,718
30,400	**එකතුව**	**29,935**	**14,663**

සටහන 06	සැපයීම්		
ඇස්තමේන්තුව 2016	විස්තරය	2016	2015
රු.දහස්		රු.දහස්	රු.දහස්
14,500	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	16,989	9,080
10,800	ඉන්ධන	10,665	8,599
500	ආහාර පාන හා නිල ඇඳුම්	500	454
25,800	**එකතුව**	**28,154**	**18,133**

සටහන 07	නඩත්තු වියදම්		
ඇස්තමේන්තුව 2016	විස්තරය	2016	2015
රු.දහස්		රු.දහස්	රු.දහස්
6,500	මෝටර් වාහන	5,970	7,727
5,350	පිරියත, යන්ත්‍ර හා උපකරණ	5,114	4,714
1,000	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	997	4,069
12,850	එකතුව	**12,081**	**16,510**

සටහන 08	සේවා		
ඇස්තමේන්තුව 2016	විස්තරය	2016	2015
රු.දහස්		රු.දහස්	රු.දහස්
23,350	ප්‍රවාහන	18,707	9,491
17,000	තැපැල් හා සංනිවේදනය	16,806	16,144
15,000	විදුලිය හා ජලය	13,410	12,201
650	බදු කුලී හා පළාත් පාලන ආයතන බදු	608	339
31,000	අනෙකුත්	30,795	30,108
87,000	එකතුව	**80,326**	**68,283**

සටහන 09	මාරු කිරීම්		
ඇස්තමේන්තුව 2016 රු.දහස්	විස්තරය	2016 රු.දහස්	2015 රු.දහස්
650	දායක මුදල් හා සම්මාදම්	650	270
10,850	රජයේ නිලධාරීන්ගේ දේපල ණය මත පොළී	10,734	10,109
11,500	එකතුව	11,384	**10,379**

සටහන 10 දේපල, පිරියත හා උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් වාහන	පරිගණක හා දෘඩාංග	ගෘහ භාණ්ඩ හා උපකරණ	මුද්‍රණ යන්ත්‍රය	විදුලි සෝපානය හා විදුලි ජනක යන්ත්‍ර	එකතුව
	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්	රු.දහස්
පිරිවැය								
2016 ජනවාරි 01 දිනට ශේෂය	256,147	**775,685**	**119,513**	**133,597**	**98,845**	**26,023**	**15,830**	**1,425,640**
එකතු කිරීම්	-	5,518	406	204	13,691	-		19,819
අපහරණය කිරීම්	-	-	-	(15)	(58)	-	-	(73)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**256,147**	**781,203**	**119,919**	**133,786**	**112,478**	**26,023**	**15,830**	**1,445,386**
ක්ෂය කිරීම්								
2016 ජනවාරි 01 දිනට ශේෂය	-	55,375	53,531	125,497	67,412	5,205	2,022	309,042
අපහරණය කළ වත්කම් වෙනුවෙන් ක්ෂය	-	-	-	(15)	(58)	-	-	(73)
එකතු කිරීම්	-	15,624	14,990	**1,198**	22,496	1,301	**441**	**56,050**
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**70,999**	**68,521**	**126,680**	**89,850**	**6,506**	**2,463**	**365,019**
2016 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය	**256,147**	**710,204**	**51,398**	**7,106**	**22,628**	**19,517**	**13,367**	**1,080,367**

සටහන 11 විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ වියදම්

විස්තරය	2016	2015
	රු.දහස්	රු.දහස්
2016 ජනවාරි 01 දිනට ශේෂය	151,380	176,284
2016 වර්ෂයට අදාල පිරිවැය ක්‍රමක්ෂය (පිරිවැයෙන් 10%)	(24,904)	(24,904)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**126,476**	**151,380**

සටහන 12 තොගය

විස්තරය	2016	2015
		රු.දහස්
ගොඩනැගිල්ල නඩත්තු කිරීමේ ද්‍රව්‍ය	-	273
ටෝනර්	3,397	-
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	1,560	4,396
ටයර් හා ට්‍යුබ්	856	556
සනීපාරක්ෂක භාණ්ඩ	194	-
එකතුව	6,007	5,225

සටහන 13 රජයේ නිලධාරීන්ට අත්තිකාරම්

විස්තරය	2016	2015
	රු.දහස්	රු.දහස්
දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ගෙන් අය විය යුතු ශේෂ එකතුව	211,655	210,890
වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	330	3,284
විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	1,339	3,069
තනතුර අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	662	456
සේවය අවසන් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	333	539
එකතුව	214,319	218,238

සටහන 14 ලැබිය යුතු විගණන ගාස්තු

විස්තරය	2016	2015
	රු.දහස්	රු.දහස්
සංවර්ධන සභා	30	30
මහා නගර සභා	20,229	25,044
නගර සභා	34,087	46,054
ප්‍රාදේශීය සභා	17,454	23,105
රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා අනෙකුත් රාජ්‍ය ආයතන	101,583	108,056
ගොවිජන සේවා මධ්‍යස්ථාන	10,852	12,140
ආර්ථික මධ්‍යස්ථාන	64	-
එකතුව	184,299	214,429

සටහන 15 උපචිත වියදම්	2016	2015
	රු. දහස්	රු. දහස්
දුම්රිය බලපත්‍ර - නිවාඩු	301	351
දුම්රිය බලපත්‍ර - රාජකාරී ගමන්	2	3
අනෙකුත් වියදම්	270	138
තැපැල් ගාස්තු	23	15
දුරකථන බිල්පත්	**330**	500
විදුලි බිල්පත්	2	1,026
ජල බිල්පත්	110	76
වාහන අළුත්වැඩියා	3	46
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	-	3
දේපල හා පිරියත නඩත්තු කිරීම	-	74
කාර්ය මණ්ඩල පුහුණු	51	-
එකතුව	**1,092**	**2,232**

සටහන 16 මූලධන වියදම් හා පොදු තැන්පත් ගිණුම සඳහා භාණ්ඩාගාර දායකය

විස්තරය	2016	2015
	රු.දහස්	රු.දහස්
රජයේ නිලධාරින්ට අත්තිකාරම් සඳහා	214,319	218,238
තැන්පත් ගිණුම සඳහා	(19,473)	(24,990)
ස්ථාවර වත්කම් සඳහා	434,602	445,870
එකතුව	**629,448**	**639,118**

සටහන 17 රාජ්‍ය අංශ ධාරිතාවය වර්ධනය ව්‍යාපෘතියේ දායකය

විස්තරය	2016	2015
	රු.දහස්	රු.දහස්
ස්ථාවර වත්කම් සඳහා	645,765	677,457
විගණන ක්‍රමවේදය සඳහා	126,476	151,380
එකතුව	**772,241**	**836,086**

2016 වර්ෂයේදී ප්‍රසිද්ධ කළ විශේෂ විගණන වාර්තා

2015 පෙබරවාරි මාසයේ සිට 2016 මැයි දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ඉහත සඳහන් වාර්තාව 2016 ජුනි 29 වන දින ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාවේ ඇතුළත් ප්‍රධාන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර සුරැකුම්පතක් ලෙස වර්ෂයකට වැඩි දිගු කාලයකින් කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 පෙබරවාරි 27 දින දක්වා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයන් 2 ක් අනුගමනය කර තිබුණි. එනම් වෙන්දේසි (auction) ක්‍රමය සහ සෘජු නිකුතු ක්‍රමයයි. 2014 ජනවාරි මාසයේ සිට සෘජු ක්‍රමය තාවකාලිකව අත්හිටුවීමට ගත් තීරණය මුළුමනින්ම ක්‍රියාත්මක වූ 2015 අප්‍රේල් මාසය දක්වා වූ මාස 15 ක කාලය තුළ, සෘජු ක්‍රමය පමණක් යොදාගත් මාසයන් ද, වෙන්දේසි ක්‍රමය පමණක් යොදා ගත් මාසයන් ද, මෙම ක්‍රම දෙකම යොදාගත් මාසයන් ද, පැවති බව නිරීක්ෂණය විය. කෙසේ වුවත් එම මාස 15 ක කාලය තුළ නිකුත් කළ සමස්ථ බැඳුම්කරවලින් සියයට 80 කට වඩා සෘජු ක්‍රමය යොදාගෙන නිකුත් කර තිබුණු බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

2015 පෙබරවාරි 27 දින සිදු කළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම

- 2015 මාර්තු මාසයට අදාලව රජයේ සමස්ථ මුදල් අවශ්‍යතාවය රු.බිලියන 261.683 ක් විය. එම මුදල් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් සපයා ගත යුතුව තිබුණි. මුදල් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා රු. බිලියන 89.683 ක් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන්ද, රු.බිලියන 172 ක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරිමෙන්ද සපයා ගත යුතුව තිබුණි. මුදල් අවශ්‍යතාවයෙන් 2015 මාර්තු 02 දින සඳහා පමණක් වූ රජයේ මුදල් අවශ්‍යතාවය රු.බිලියන 13.550 ක් සපයා ගත යුතුව තිබුණි.

- ඉහත සඳහන් රු.බිලියන 172 න් රු. බිලියන 1 ක් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසියෙන් ද, ඉතිරිය සෘජු ක්‍රමය මගින් ද සපයා ගැනීමටත්, 2015 මාර්තු 02 දින සඳහා පමණක් වූ මුදල් අවශ්‍යතාවය රු.බිලියන 13.550 න් රු.බිලියන 1 ක් ප්‍රාථමික වෙන්දේසියක් තුළින් ද, ඉතිරිය සෘජු ක්‍රමය මගින් ද, සම්පාදනය කර ගැනීමට දේශීය ණය කළමනාකරණ කමිටුව (DDMC) විසින් 2015 පෙබරවාරි 27 දින 1300 පැයට පවත්වන ලද රැස්වීමේදී නිර්දේශ කර තිබුණි. මෙම තීරණය සඳහා මහ බැංකු අධිපතිගේ අනුමැතිය 2015 මාර්තු 02 දින ලබා ගෙන තිබුණි. මෙහිදී, නිරීක්ෂණය වන ඉතාම වැදගත් කරුණ වන්නේ 2015 මාර්තු 27 දින පැය 0830 සිට පැය 1100 දක්වා වූ වෙන්දේසිය පවත්වන අවස්ථාව වන විටත්, එම වෙන්දේසිය මගින් 2015 මාර්තු 02 දිනට අවශ්‍ය රු.බිලියන 13.550 ක් වූ මුදල් අවශ්‍යතාවයද ඇතුළත් 2015 මාර්තු මස මාසික මුදල් අවශ්‍යතාවයද ඇතුළත් දේශීය ණය කළමනාකරණ කමිටුවේ නිර්දේශය මෙන්ම මහ බැංකු අධිපතිගේ අනුමැතිය, වෙන්දේසිය අවසන් වී ටෙන්ඩර් කමිටු තීරණය ලබා ගැනිමටත් පසුව ලබා ගැනීමයි.

- ඒ අනුව 2015 මාර්තු 02 දින සඳහා වූ මුදල් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා 2015 පෙබරවාරි 25 දින සහ 26 දින

පිළිවෙලින් අන්තර්ජාලයේ සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කරන ලද දැන්වීම්වලට අනුව ප්‍රාථමික වෙළඳුන් 16 දෙනා වෙත වසර 30 ක කාලයකින් කල්පිරෙන රු.බිලියන 1 ක භාණ්ඩාගාර බැඳුම්කර සියයට 12.5 ක් වන පොළී අනුපාතයක් යටතේ නිකුත් කිරීම සඳහා මිල ගණන් කැඳවා තිබුණි.

- ලංසු ලැබීමේ තොරතුරු වාර්තාව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ සේවක අර්ථසාධක අරමුදල සහ ප්‍රාථමික ගැනුම්කරුවන් 16 දෙනෙකු විසින් රු.බිලියන 20.708 ක එකතු වටිනාකමක් දක්වා මිල ගණන් ඉදිරිපත් කර තිබූ බවයි. තවද, එම මුදලින් සියයට 75 ක් පමණ එනම් රු.බිලියන 15.531 ක් එක් පෞද්ගලික ප්‍රාථමික ගනුදෙනුකරුවකු විසින් සහ ඔහු වෙනුවෙන් වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවකු වන ලංකා බැංකුව මගින් ඉදිරිපත් කර තිබූ බවද නිරීක්ෂණය විය.

- රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් සඳහා වාර්තාවක් පිළියෙල කර තිබුණි. එම වාර්තාවේ රු. බිලියන 2.608 ක් වෙන්දේසි මගින් උපයා ගැනීමට සුදුසු බව නිර්දේශ කර තිබුණි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරි විසින් ඉහත වාර්තාව මත "රජයේ අතිරේක මුදල් අවශ්‍යතාවය පිළිබඳව සැලකිල්ලට ගැනීමෙන් පසු රුපියල් බිලියන 10 ක් දක්වා අරමුදල් සපයා ගැනීමට මහ බැංකු අධිපතිතුමා විසින් උපදෙස් දෙන ලදී." යනුවෙන් සිය අත්අකුරින් සටහනක් යොදා තිබුණි. ඒ අනුව, සංශෝධිත නිර්දේශය භාණ්ඩාගාර බැඳුම්කර ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කර තිබුණි.

- කැඳවූ ප්‍රමාණය මෙන් දසගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයක් එනම් රු.බිලියන 10.058 ක් දක්වා ලංසු පිළිගැනීමට 2015 පෙබරවාරි 27 වන දින වෙන්දේසිය පැවැත්වීමෙන් ද අනතුරුව පැය 1230 සිට පැය 1310 දක්වා පැවැත්වුනු අංක 2/2015 දරන භාණ්ඩාගාර බැඳුම්කර ටෙන්ඩර් කමිටුව විසින් තීරණය කර තිබුණි. මෙහිදී නිරීක්ෂණය වූ වැදගත්ම කරුණ වන්නේ ඉහත තීරණය ගෙන ඇත්තේ වෙන්දේසිය පැවැත්වීමෙන්ද අනතුරුව බවය. මෙය දේශීය ණය කළමනාකරණ කමිටුව විසින් රු.බිලියන 12.550 ක් ඍජු ක්‍රමයෙන් සපුරා ගැනීමට කර තිබූ තීරණයෙන් සම්පූර්ණයෙන්ම බැහැර වීමකි. ටෙන්ඩර් කමිටු තීරණය මහ බැංකු අධිපති විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත දෙන ලද උපදෙස් ප්‍රකාරව ගෙන තිබුණි. පිළිගත් ලංසු වල බරතැබූ ඵලදා අනුපාතය 11.7270 ක් වුවද, වෙන්දේසියට දින දෙකකට පෙර එනම් 2015 පෙබරවාරි 25 දිනට පෙර අවසන් සතියේ ද්විතියික වෙළෙඳපොළ සාමාන්‍ය ඵලදා අනුපාතය 10.03 ක් පමණක් විය.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඍජු ක්‍රමය තාවකාලිකව අත්හිටුවීම අනුමත කර නොතිබුණි. 2015 මාර්තු 06 දිනැති හා MB/ER/5/3/2015 අංක දරණ මුදල් මණ්ඩල පත්‍රිකාවට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී භාවිතා කරන ඍජු ක්‍රමය තාවකාලිකව අත්හිටුවීම පිළිබඳව මහ බැංකු අධිපති විසින් මුදල් මණ්ඩලයට දැනුවත් කිරීමක් පමණක් කර තිබුණි.

- අනුපාතිකයන් ස්ථාවර කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල (EPF), ජාතික ඉතිරිකිරීමේ බැංකු අරමුදල් කළමනාකරණ සමාගම **(NSB)** සහ ශ්‍රී ලංකා රක්ෂණ සමාගම **(SLIC)** වෙත බැඳුම්කර නිකුත් කිරීමට විමසන ලෙස වැනි අදහසක් දැක්වෙන සටහනක් සහ වර්ෂ 20, 30 සහ 50 ලෙස එක් වර්ගයකින් රු.බිලියන 10 ක් බැගින් නිකුත් කර බැඳුම්කර රු.බිලියන 40 ක් රැස්කර ගන්නා ලෙස සටහනක් ද තබමින් දේශීය ණය කළමනාකරණ කමිටු නිර්දේශයට ශ්‍රී ලංකා මහ බැංකු අධිපති විසින් 2015 මාර්තු 02 දින අනුමැතිය දී තිබුණි. එහිදී ඍජු ක්‍රමය අත්හිටුවීම සම්බන්ධයෙන් කිසිවක් එම අනුමැතියෙහි සඳහන් කර නොතිබුණි.

- බැඳුම්කර වෙන්දේසියේ කැඳවූ වටිනාකම වූ රු.බිලියන 1 කට සීමා කරනු ලැබුවේ නම් එම වෙන්දේසියේ දී ලැබුණු මිල ගණන් අඩුම බර තැබූ ඵලදා අනුපාතිකයේ සිට ඉහළම බර තැබූ ඵලදා අනුපාතිකය දක්වා වර්ගීකරණය කිරීමෙන් ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගෙන් බර තැබූ ඵලදා අනුපාතිකය 10.4652 ට රු.බිලියන 01 ක මුදල සපුරාගැනීමට හැකිව තිබුණි. එසේ සීමා කලේ නම් බර තැබූ ඵලදා අනුපාතිකය 11.7270 දක්වා වැඩි නොවනු ඇත.

- ප්‍රාථමික වෙන්දේසිය රු.බිලියන 1 කට සීමා කලේ නම් එදිනට ලැබී තිබූ එකතුව රු.බිලියන 20.708 ක් වූ සියළුම මිල ඉදිරිපත් කිරීම්වලින් සියයට 75 ක ප්‍රමාණයක් සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ ඉහත සඳහන් ප්‍රාථමික ගනුදෙනුකරුට බැඳුම්කර මිලදී ගැනීමට අවස්ථාවක් නොතිබුණි. එදින වෙන්දේසිය මගින් නිකුත් කිරීමට අපේක්ෂා කළ රු.බිලියන 1 ක මුදල රු.බිලියන 10.058 දක්වා වැඩිකිරීමට තීරණය කිරීම හේතුවෙන් ඉහත සඳහන් ප්‍රාථමික ගනුදෙනුකරුට එදින නිකුත් කරන ලද මුළු බැඳුම්කර වටිනාකමින් සියයට 50 ක් එනම් රු.බිලියන 5 ක් ලබා ගැනීමේ අවස්ථාව උදාවී තිබීම කැපී පෙනෙන ලක්ෂණයක් විය. මෙහිදී එම රු.බිලියන 5 කින් රු. බිලියන 2 ක් ඍජුවමත් රු. බිලියන 3 ක් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු වූ ලංකා බැංකුව හරහා වක්‍රාකාරයෙනුත් ලබා ගැනීමට එම ප්‍රාථමික ගනුදෙනුකරු කටයුතු කර තිබුණි.

- ඉහත බැඳුම්කර නිකුත් කිරීමේ දී සිදුවූ තවත් වැදගත් කරුණක් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධීක්ෂණයට යටත් වන සහ ප්‍රාථමික වෙන්දේසියෙන් බැඳුම්කර මිලදී ගැනීමේ හැකියාවක් ඇති ආයතනයක් ලෙස සේවක අර්ථසාධක අරමුදල වැඩි ඵලදා අනුපාතිකයන් සහිත ප්‍රාථමික වෙන්දේසියෙන් සාපේක්ෂව අඩු බැඳුම්කර ප්‍රමාණයක් ලබා ගෙන තිබූ අතර අඩු ඵලදා අනුපාතිකයක් සහිතව ද්විතීක වෙළෙඳපොළෙන් පෞද්ගලික ගනුදෙනුකරුවන්ගෙන් මිලදී ගැනීම හේතුවෙන් ලබා ගත හැකිව තිබූ මූල්‍ය අවාසිය අහිමි කර ගෙන තිබුණි.

- 2015 පෙබරවාරි 27 දින බැඳුම්කර නිකුත් කිරීම අපේක්ෂා කළ පරිදි රු.බිලියන 01 ට සීමා කලේ නම් එම වටිනාකම ආවරණය වන පරිදි ලබා තිබූ ලංසු ප්‍රමාණය අනුව බැඳුම්කරයක ලංසු වටිනාකම රු.104.5073 ක් දක්වා පමණක් බැඳුම්කර නිකුත් කලේ නම් රු.මිලියන 1,403 ක් ලබා ගත හැකිව තිබුණි. එලෙස එම වටිනාකමට බැඳුම්කර නිකුත් කිරීම සීමා නොකිරීම නිසා රජයට රු. 889,358,050 ක ඇස්තමේන්තුගත අවාසියක් සිදුව තිබුණි.

- මෙම වෙන්දේසියට අදාලව ලබා ගැනීමට අපේක්ෂා කළ රු. බිලියන 01 ක බැඳුම්කර වටිනාකමට එරෙහිව එකතුව රු. බිලියන 10.058 ක් ලංසු පිළිගැනීමට ගත් තීරණය සඳහා මහ බැංකු අධිපතිගේ ක්‍රියා කලාපය (ඉදිරිපත් වූ මුළු ලංසු ප්‍රමාණය වූ රු. බිලියන 20 ම නොගන්නේ මන්දැයි විමසීම, රු.බිලියන 10 කට නොයන්නේ මන්දැයි විමසීම) ප්‍රබල ලෙස බලපා ඇති බව රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අනු කමිටුව විසින් මෙම වෙන්දේසිය පිළිබඳ සිදු කරන ලද විමර්ශණයේදී අදාල නිලධාරීන් විසින් ලබා දී ඇති වාචික සාක්ෂි සටහන්හි ඇති කරුණු හේතුවෙන් තහවුරු විය.

2016 මාර්තු 29 දින සිදුකළ

භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව

- 2016 මාර්තු 10 දින හා මාර්තු 24 යන දිනවල බැඳුම්කර අලෙවි කිරීම සඳහා පවත්වා තිබූ වෙන්දේසි දෙකම අපේක්ෂා කල අනුපාතයන්ට වඩා වැඩි අනුපාතයන් දක්වමින් ලංසු ඉදිරිපත් වීම හේතුවෙන් ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වෙතත්, මෙම අවස්ථාවලදී සෘජු ක්‍රමයට අරමුදල් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කර තිබූ බව අනාවරණය නොවීය.

- අනතුරුව 2016 මාර්තු 29 දින රු.බිලියන 10 බැගින් වූ විවිධ පරිනත කාලයන් සහිත කල්පිරෙන බැඳුම්කර 04 ක් එනම් රු.බිලියන 40 ක බැඳුම්කර නිකුතුවක් සඳහා මිල ගණන් කැඳවා තිබුණි.

- මෙහිදී නිරීක්ෂණය වන එක් වැදගත් කරුණක් වන්නේ රු.බිලියන 40 ක සීමාවකට කැඳවන ලද මිල ගණන් මත තවත් අමතර රු.බිලියන 37.732 ක් (මුහුණත අගය) එනම් රු.බිලියන 77.732 ක් (මුහුණත අගය) දක්වා බැඳුම්කර නිකුත් කර තිබීමයි. එලෙස මිල ගණන් කැඳවූ වටිනාකම ඉක්මවා නිකුත් කළ බැඳුම්කර වලින් සියයට 60 ක් ඉහත සඳහන් ප්‍රාථමික ගනුදෙනුකරු හිමි කර ගෙන තිබුණි. එම ප්‍රාථමික ගනුදෙනුකරු විසින් විවිධ පොළී අනුපාතයන් යටතේ ඉහත සඳහන් බැඳුම්කර වර්ග 04 හිමිකරගත් අනුපාතය විග්‍රහ කිරීමේදී අනාවරණය වන්නේ අඩුම ඵලදා අනුපාතය යටතේදී පළමු බැඳුම්කරයෙන් සියයට 0.5 ක් පමණක් හිමිකරගන්නා ඉහත සඳහන් ප්‍රාථමික ගනුදෙනුකරු ඉහළ ඵලදා අනුපාතය යටතේ නිකුත් කර ඇති අනෙක් බැඳුම්කර තුනෙන් සියයට 35 ක සිට සියයට 44 ක් දක්වා ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් වී ඇති බවයි. එනම් වට්ටම් ප්‍රමාණය වැඩිවන විට වැඩි බැඳුම්කර ප්‍රමාණයක් ලබා ගෙන තිබීමය.

- මෙම බැඳුම්කර නිකුත් කළ දිනයට පෙර පැවති වෙන්දේසි දෙකම ප්‍රතික්ෂේප කර තිබූ පදනම වූ ඵලදා අනුපාත වැඩිවීම මෙම වෙන්දේසියේ දීද එලෙසම නිරීක්ෂණය වුවද, ඉහළ ඵලදා අනුපාතයන්ට එනම් සියයට 14.0742 ක් දක්වා ඵලදා අනුපාතයන්ට මෙම බැඳුම්කර නිකුත් කර තිබුණි.

- ඉහත පරිදි බැඳුම්කර 4 ක් මගින් රු.බිලියන 77.73 ක මුහුණත අගයක් ලැබෙන පරිදි බැඳුම්කර නිකුත් කිරීමට තීරණය කර තිබුණද, වට්ටම් අනුපාතයට බැඳුම්කර නිකුත් කිරීම නිසා රු.බිලියන 59.325 ක් පමණක් ලැබී තිබුණි.

- මෙහිදී අනාවරණය වූ ඉතා වැදගත් කරුණක් වන්නේ ප්‍රාථමික

වෙළඳපොළෙන් බැඳුම්කර මිලදී ගත හැකි ආයතනයක් වන සේවක අර්ථසාධක අරමුදල විසින් 2016 මාර්තු 29 දින තුළදී නිකුත් කළ බැඳුම්කරයන්ගෙන් ඵලදා අනුපාතය සියයට 12.20 ක සිට සියයට 12.45 ක් දක්වා පරාසයක් තුළ රු.බිලියන 9.736 ක් වටිනා බැඳුම්කර ද්විතියික වෙළඳපොළෙන් ලබා ගෙන තිබුණු බවයි. සේවක අර්ථසාධක අරමුදල මෙම බැඳුම්කර සඳහා 2016 මාර්තු 29 දිනට ප්‍රාථමික වෙළඳපොළ මිල ගණන් ඉදිරිපත් කර තිබුනේ ඉතා අඩු බැඳුම්කර ප්‍රමාණයක් වූ අතර සියලු ඉල්ලීම් සාර්ථක වී තිබුණි. මෙලෙස බැඳුම්කර සෘජුවම ප්‍රාථමික වෙළඳපොළෙන් මිලදී ගැනීම වෙනුවට ද්විතියික වෙළඳපළෙන් මිලදී ගෙන තිබීම ප්‍රශ්නකාරී වේ. තවද මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ භාරකාරීත්වයේ පවතින ආයතනයක් වන සේවක අර්ථසාධක අරමුදල මෙලෙස කටයුතු කිරීම පිළිබඳ මහ බැංකුව විසින් අවධානය යොමු නොකිරීම ද ප්‍රශ්නකාරී තත්ත්වයකි.

- මෙම බැඳුම්කරය නිකුත් කිරීමෙන් අපේක්ෂිත නාමික වටිනාකම වූ රු.බිලියන 40 ක් වෙනුවට රු.බිලියන 77.732 ක් දක්වා පිළිගෙන තිබුණි. එසේ නොකර බැඳුම්කර නිකුතුව මුහුණත වටිනාකම වූ රු.බිලියන 40 කට සීමා කළේ නම් රු.784,898,755 ක ඇස්තමේන්තුගත අවාසිය වලක්වාගත හැකිව තිබුණි.

- 2015 පෙබරවාරි 27 දිනෙන් පසුව සිදු කළ ක්‍රමවේදයේ වෙනසින් පසුව ප්‍රාථමික ගනුදෙනුකරුවන් විසින් ද්විතියික වෙළඳපොළේ පවතින අනුපාතයන්ට සාපේක්ෂව ඉහළ අනුපාතයන් සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය විය. ඉහත දක්වා ඇති ප්‍රවනතාවය විවිධ වූ සාධකයන්ගේ බලපෑම මත සිදුව ඇති බව නිරීක්ෂණය කළද 2015 පෙබරවාරි 27 දින ගත් බැඳුම්කර නිකුතුවට අදාල ප්‍රතිපත්තිමය තීරණයද ඉවහල් වූ බවට අනුමාන කිරීම ප්‍රශ්නකාරී නොවන බව නිරීක්ෂණය විය.

පහත නිගමනයන්ට එළඹුණි

- 2015 පෙබරවාරි 27 සහ 2016 මාර්තු 29 දින පැවැති භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි දෙකේදී වලක්වා ගැනීමට හැකිව තිබූ එකතුව රු.1,674,256,805 ක ඇස්තමේන්තුගත අවාසිය වලක්වා ගැනීමට කටයුතු නොකිරීම පිළිබඳව බලධාරීන් වගකිව යුතු බව නිගමනය කරනු ලැබේ.

- මහ බැංකු අධිපති විසින් ස්වකීය කාර්යය මෙහෙයවීමේ දී මහ බැංකු අධිපතිවරයකුගෙන් අපේක්ෂා කරනු ලබන මට්ටමේ වෘත්තිමය විචක්ෂණභාවයකින් (Professional Due Care) යුතුව කටයුතු කර ඇති බව තහවුරු නොවීය.

2009 වර්ෂයේ සිට 2016 ජුනි දක්වා නොරොච්චෝලේ ලක්විජය බලාගාරය සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම මගින් සිදු කරන ලද ගල් අඟුරු ප්‍රසම්පාදනය

2009 වර්ෂයේ සිට 2016 ජුනි මාසය දක්වා නොරොච්චෝලේ ලක්විජය බලාගාරය සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම මගින් සිදු කරන ලද ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳව විශේෂ විගණකාධිපති වාර්තාව සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර එම වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩණය කර පහත සඳහන් කර ඇත.

2016 ජූලි 20 දින පැවති පාර්ලිමේන්තු බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටු සාකච්ඡාවේදී 2009 වර්ෂයේ සිට 2016 ජූනි මාසය දක්වා කාලය තුළ සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම (Lanka Coal Company (Pvt) Limited) විසින් ලංකා විදුලි බල මණ්ඩලයේ (Ceylon Electricity Board) නොරොච්චෝලේ ලක්විජය බලාගාරයට අවශ්‍ය ගල් අඟුරු ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විගණකාධිපති වෙත කරන ලද ඉල්ලීම පරිදි මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව දිගුකාලීන ප්‍රසම්පාදන (Term Contract) හයකට, ක්ෂණික ප්‍රසම්පාදන (Spot Cotract) පහකට සහ සීමාසහිත ලංකා නැව් සංස්ථාව (Ceylon Sipping Corporation Ltd.) වෙතින් මිලදී ගත් / ලබාගත් ගල් අඟුරුවලට අදාළ කරුණු පරීක්ෂා කරන ලදි. මෙම ගනුදෙනුවල අනුකූලතා පිළිබඳ පරීක්ෂාවේදී පදනම් ලේඛනයක් ලෙස රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ එයට අදාළව මේ දක්වා නිකුත්කර ඇති සංශෝධනයන් අදාළකර ගන්නා ලදී.

දිගුකාලීන ප්‍රසම්පාදන 6 කට සහ ක්ෂණික ප්‍රසම්පාදන ලංසු 5 කට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සහ තීරණ, ලංසු ලියකියවිලි , තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු වාර්තා, ලංසු බැඳුම්කර සහ කාර්යසාධන බැඳුම්කර, ගිවිසුම්, නඩු තීන්දු, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩල වාර්තා, විශේෂ කමිටු වාර්තා, වෙනත් විවිධ ලේඛන පරීක්ෂාවට භාජනය කරන ලදී.

උක්ත ක්‍රියාවලියට අදාළව විවිධාකාරයෙන් ලද තොරතුරු විශ්ලේෂණාත්මක විග්‍රහයකට ලක්කරන ලදී. විගණන කණ්ඩායම අදාළ පාර්ශවයන් සමග කීප අවස්ථාවකදීම සාකච්ඡා පවත්වන ලද අතර නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ ස්ථානීය පරීක්ෂාවක්ද සිදුකරන ලදී.

2006 අප්‍රේල් 05 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගල් අඟුරු තාප විදුලි බලාගාර සඳහා අවශ්‍ය ගල් අඟුරු මිලදී ගැනීම් කටයුතු සිදුකිරීම වෙනුවෙන් ලංකා ගල් අඟුරු සමාගම 2008 ජනවාරි 23 දින පිහිටුවා තිබුණි.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ පළමු අදියරෙහි බලශක්ති උත්පාදනය 2011 පෙබරවාරි මාසයේදී ආරම්භ කර තිබුණු අතර, එහි දෙවන හා තෙවන අදියරයන්හි බලශක්ති උත්පාදනය පිළිවෙලින් 2013 අප්‍රේල් සහ සැප්තැම්බර් මාසයන්හිදී ආරම්භ කර තිබුණි. එහි ගල් අඟුරු මුළු වාර්ෂික අවශ්‍යතාවය මෙ.ටො. 2,250,000 කි. සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා නොරොච්චෝලයේ ප්‍රදේශයට වාරකන් කාලය පැවතීම හේතුවෙන් ගල් අඟුරු

ගොඩබෑම සිදුකළ නොහැකි බැවින් වාර්ෂික ගල්අඟුරු අවශ්‍යතාවය ඔක්තෝබර් මාසයේ සිට ඉදිරි වර්ෂයේ මාර්තු මාසය දක්වා කාලය තුළදී ගබඩා කර තබා ගනු ලැබේ.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් සපයන ලද තොරතුරු අනුව ලක්විජය බලාගාරය ආරම්භයේ සිට 2016 ඔක්තෝබර් 31 දින දක්වා ජනනය කර තිබුණු මුලු විදුලි ඒකක ප්‍රමාණය ගිගා වොට් පැය 15,744 කි. දැනට ජනනය කරනු ලබන තාප ඉන්ධන කිලෝ වොට් පැයක් සඳහා රු. 21.44 ක් වැය වන අතර, ලක්විජය බලාගාරය මඟින් නිෂ්පාදනය කරන කිලෝ වොට් පැයක් සඳහා වැයවන සෘජු පිරිවැය රු. 5.23 කි. බලාගාරය විසින් උපයා ඇති සමස්ථ ආදායම එ.ජ.ඩො මිලියන 1,823 ක් වන අතර බලාගාරය ඉදිකිරීම සඳහා කර තිබුණු වියදම එ.ජ.ඩො.මිලියන 1,346 ක් විය. ඒ අනුව දැනට උපයා ඇති මුළු වියදම ඉක්මවූ ආදායම එ.ජ.ඩො.මිලියන 477 කි.

2008 මාර්තු 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දීගු කාලීන ප්‍රසම්පාදනය යටතේ ගල් අඟුරු මිලදී ගැනීමේ කටයුතු ලංකා ගල් අඟුරු සමාගම විසින් 2008 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ අනුව 2016 ජූනි මාසය දක්වා කාලය තුල කටයුතු ආරම්භ කර තිබුණු දීගු කාලීන ප්‍රසම්පාදන 06 කින් 02 ක් Noble Resources (Pvt) සමාගම සහ Swiss Singapore Overseas (Ptv) සමාගම වෙත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. ඉන් 03 ක් විවිධ හේතූන් මත අවලංගුකර තිබුණු අතර කටයුතු ආරම්භකර තිබුණු 4 වන ප්‍රසම්පාදනය ලංසු කැඳවීමකින් තොරව අවලංගුකර තිබුණි.

හදිසි අවශ්‍යතාවය සඳහා ක්ෂණික මිලදීගැනීම් ප්‍රසම්පාදන ක්‍රියාවලීන් 06 ක් ආරම්භ කර තිබුණි. ඉන් තෙවන ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණු අතර ඉතිරි ප්‍රසම්පාදන 05 අපේක්ෂිත පරිදි Liberty Commodities සමාගමට සහ Adani Global (Ptv) සමාගමට ප්‍රදානය කර තිබුණි.

කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර අවස්ථා තුනකදී ලංකා නැව් සංස්ථාව සැපයුම්කරුවකු ලෙස සලකමින් ගල් අඟුරු මිලදීගෙන තිබුණි. තවද ලංකා ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව එක් අවස්ථාවකදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර ගල් අඟුරු මිලදීගෙන ලංකා විදුලිබල මණ්ඩලය වෙත සපයා තිබුණි.

ලංකා ගල් අඟුරු සමාගම සමාලෝචිත කාලය තුළ එ.ජ.ඩො.මිලියන 484.53 ක් වටිනා තාප ගල් අඟුරු මෙ.ටොන් 6,775,199 ක් මිලදීගෙන තිබුණි. මෙහිදී එක් සැපයුම් කරුවකුගෙන් සමාලෝචිත කාලයේ මාස 52 ක් තුළ එ.ජ.ඩො.මිලියන 338.36 ක් වටිනා තාප ගල් අඟුරු මෙ.ටොන් 4,298,692 මිලදීගෙන තිබුණි. සමාලෝචිත කාලය තුළ මිලදීගෙන තිබුණු ගල් අඟුරු ප්‍රමාණයෙහි පිරිවැය එ.ජ.ඩො.මිලියන 145.14 ක් විය.

ලංසු ලියකියවිලිවල අඩුපාඩු, ලංසු භාරගැනීමේ කාලය නිතර දීර්ඝ කිරීම, එම සංශෝධන ලංසුකරුවන් වෙත සංනිවේදනය කිරීමේ දුර්වලතා, අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුකූල නොවීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය නොකිරීම, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ කාර්යන්හි දීර්ඝ ප්‍රමාදයන්, සම්බන්ධිත ආයතන අතර නිසි සම්බන්ධීකරණයන් නොතිබීම, අවශ්‍ය අවස්ථාවන්හිදී නීති උපදේස් ලබා නොගැනීම, ලංසු ප්‍රතිග්‍රහනය කිරීමෙන් අනතුරුව කොන්දේසි වෙනස් කිරීම, සිදුවන පරිසර හානිය සම්බන්ධයෙන් අවධානය අඩුවීම, රු.මිලියන 1,130 ක් වටිනා නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් ඵලදායී

ක්‍රියාමාර්ග නොගැනීම වැනි ප්‍රධාන අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණයවිය.

මෙම දුර්වලතා මඟහරවා ගැනීමට සහ අඩුපාඩු නිවැරදිකර ගැනීමට කරන ලද නිර්දේශ විස්තරාත්මකව වාර්තාවේ දැක්වේ.

සමස්ථයක් වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී නීති, රීති, රෙගුලාසි සහ මනා පරිචයන්ට අනුව කටයුතු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් රු.මිලියන 4,145.43 ක ඇස්තමේන්තුගත අලාභය/අමතර වියදම/ආදායම අහිමිවීම සිදු වී තිබීමෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, සීමා සහිත ලංකා ගල් අඟුරු සමාගම, ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා නැව් සංස්ථාව යන ආයතනද තාක්ෂණ අගැයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය මගින් පත් කෙරෙන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවද සිය කටයුතු ඉටු කිරීමේදී නිසි වෘත්තියමය පරීක්ෂාවකින් (professional due care) කටයුතු කර තිබුණු බව විගණනයේදී තහවුරු වී නොතිබුණි. තවද සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම තවදුරටත් පවත්වාගෙන යා යුතුද යන්න ප්‍රශ්නකාරී වන අතර නීති විරෝධී හෝ සාපරාධීකටයුතු සිදුවී ඇත්නම් ඒ සඳහා විශේෂිත වූ ආයතනයන් මගින් පරීක්ෂාවන් සිදුකිරීම අවශ්‍යවේ.

සීමාසහිත ලංකා සතොස විසින් 2014 සහ 2015 වර්ෂවලදී සිදු කරන ලද සහල් ආනයන ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ඉහත සඳහන් විශේෂ විගණකාධිපති වාර්තාව සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර එම වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2014 හා 2015 වර්ෂවලදී රු.මිලියන 15,996 ක් වැය කර සහල් මෙ.ටො.257,559 ක්, ණයවර ලිපි විවෘත කිරීම මගින් සහ පසු ගෙවීම් ක්‍රමය යටතේ ඉන්දියාවෙන් හා බංගලාදේශයෙන් ආනයනය කර තිබුණි. මීට අමතරව රු.මිලියන 1,199 ක් වූ ආනයනික සහල් මෙ.ටො.18,134 ක්ද, දේශීය වෙළෙඳපොලෙන් මිලදී ගෙන තිබුණි. විස්තර වගුව 04 හි දැක්වේ.

පසු ගෙවීම් ක්‍රමය හෝ ණයවර ලිපි අංකය	ණයවර ලිපි විවෘත කළ දිනය	ණයවර ලිපි වටිනාකම (එ.ජ.ඩො).	සහල් වර්ගය	සැපයුම්කරු	ලැබුණු ප්‍රමාණය (මෙ.ටො).	මි.ර.ගැ. (CIF) වටිනාකම රු.	කි.ග්‍රෑ .1ක CIF වටිනාකම (රු).	අරමුදල් සැපයීම
1. දේශීය මිලදී ගැනීම්								
දේශීයව ආනයනික සහල් මිලදී ගැනීම				සැපයුම්කරුවන් 14 කි	18,134	1,199,495,609		ලංකා සතොස
2. ලංකා සතොස සෘජුවම සහල් ආනයනය කිරීම								
පසු ගෙවීම් ක්‍රමය (DP)			නාඩු සහ සම්බා සහල්	සැපයුම්කරුවන් 07 කි	29,262	1,851,055,933		ලංකා සතොස
42002140026193	2014.09.22	455,000	නාඩු සහල්	Omvishkar Exports	1,040	62,634,808	60.23	මහජන බැංකුව
3. අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව විදේශීය වෙළඳපොලෙන් සහල් ආනයනය කිරීම								
42002140024186	2014.09.01	21,500,000	සුදු සහල්	United Foods (pvt) Ltd	50,002	2,843,606,997	56.87	මහජන බැංකුව
BTD-M 064568	2014.12.10	11,250,000	නාඩු සහල්	බංග්ලාදේශ රජය	25,000	1,504,335,376	60.17	ලංකා බැංකුව
4. මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත විදේශීය වෙළඳපොලෙන් සහල් ආනයනය කිරීම								
BTD-M 63519	2014.10.29	1,994,018	නාඩු සහල්	ACP Industries Ltd	4,887	268,319,420	54.90	ලංකා බැංකුව
BTD-M 63519 (දීර්ඝ කිරීම)	2015.02.17	18,056,000	පොන්නි සම්බා සහල්	ACP Industries Ltd	37,704	2,500,017,885	66.31	ලංකා බැංකුව
BTD-M 63537	2014.10.30	2,403,837	පොන්නි සම්බා සහල්	ACP Industries Ltd	4,926	323,514,220	65.68	ලංකා බැංකුව
BTD-M 63537 (දීර්ඝ කිරීම)	2015.02.13	21,996,163	පොන්නි සම්බා සහල්	ACP Industries Ltd	43,384	2,861,893,578	65.97	ලංකා බැංකුව

42002140033283	2014.12.03	12,150,000	සුදු සහල්	United Foods (pvt)Ltd	30,000	1,630,038,846	54.33	මහජන බැංකුව
42002140033274	2014.12.03	15,300,000	පොන්නි සම්බා සහල්	Trident Chemphar Ltd	31,354	2,151,117,709	68.61	මහජන බැංකුව
එකතුව					**275,693**	**17,196,030,381**		

වගුව 04 - සීමාසහිත ලංකා සතොස 2014 හා 2015 වර්ෂවල සහල් ආනයන කිරීම
මූලාශ්‍ර : සීමාසහිත ලංකා සතොස

වගුවෙහි දක්වා ඇති එක් එක් සහල් මිලදී ගැනීම පිළිබඳව අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ කර පහත පරිදි දක්වා ඇත.

- සීමාසහිත ලංකා සතොස ආයතනය විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සකස් කර අනුමත කරගෙන නොමැති බැවින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වුවත්, ඉහත සඳහන් සහල් මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත්, යථෝක්ත සහල් මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් සමග ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

- 2014 වර්ෂයේ සහල් ආනයන ක්‍රියාවලිය සිදු කරමින් පැවතියදී ඒ සම්බන්ධ අවධානයකින් තොරව ලංකා සතොස ආයතනය විසින් රු.මිලියන 1,199 ක් වටිනා ආනයනික සහල් මෙ.ටො. 18,134 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත්, දේශීය සැපයුම්කරුවන්ගෙන් විවිධ මිල ගණන් යටතේ මිලදී ගෙන තිබුණි.

- ආහාර සුරක්ෂිතභාවය හා වෙළඳපල සහල් මිල ස්ථාවර කිරීම සඳහා ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩා භාවිතා කරමින් ආරක්ෂිත තොගයක් පවත්වා ගැනීමට සහල් මෙ.ටො. 50,000 ක් මෙ.ටො. 5,000 බැගින් ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, එකවර සුදු සහල් මෙ.ටො. 50,000 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රේඛීය අමාත්‍යාංශය නම් කළ සැපයුම්කරුවෙකු ගෙන් මිලදී ගෙන ආනයනය කර තිබුණි. එමෙන්ම සහල් තොගය එකවර ආනයනය කිරීම නිසා ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩාවලට අමතරව, වැඩි පිරිවැයක් දරමින් පෞද්ගලික අංශයේ ගබඩාවක්ද භාවිතා කිරීමට සිදු වී තිබුණි.

- සහල් මෙ.ටො. 257,559 කින් මෙ.ටො. 75,002 ක් පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ආනයනය කර තිබූ අතර, රු.මිලියන 9,735 ක් වටිනා සහල් මෙ.ටො. 152,255 ක් අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් තොරව මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත ආනයනය කර තිබුණි. එමෙන්ම ලංකා සතොස ආයතනය විසින් සෘජුවම ආනයනය කර තිබූ එකතුව රු.මිලියන 1,914 ක් වටිනා මෙ.ටො. 30,302 ක සහල් තොග සඳහාද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, සභාපතිවරයාගේ උපදෙස් මත මිලදී ගැනීම සිදු කර තිබුණි.

- ඉන්දියානු සමාගමක් විසින් සහල් මෙ.ටො. 100,000 ක් සැපයීමට එකඟවන බව දන්වා එවකට සිටි ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත එවන ලද ලිපියක් පදනම් කරගෙන අදාළ සමාගමෙන් වහාම සහල් මිලදී ගැනීමට කටයුතු කරන ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් සතොස සභාපතිවරයා වෙත දන්වා තිබුණද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම දැනුම්දීමෙන් දෙදිනකට පසු, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා විසින්ම පොන්නි සම්බා සහල් මෙ.ටො. 50,000 ක් සහ නාඩු සහල් මෙ.ටො. 50,000 ක් මිලදී ගැනීමට ඇණවුම් කර තිබුණි.

- ඇනවුම් කරන ලද මෙ.ටො. 100,000 ක සහල් තොගය 2014 දෙසැම්බර් 31 දිනට පෙර සපයන ලෙස ඉන්දියානු සමාගමට දන්වා තිබුණද, විවෘත කරන ලද ණයවර ලිපි දෙක කල් ඉකුත් වූ 2015 පෙබරවාරි මාසය වන විටත් සහල් මෙ.ටො. 9813 ක් පමණක් ලැබී තිබූ අතර ණයවර ලිපිවල කාලය දීර්ඝ කර ඉතිරි වටිනාකම් සඳහා පොන්නි සම්බා සහල් ආනයනය කිරීමටත්, ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය දැනුවත් කරන ලෙසත් අමාත්‍යවරයා විසින් 2015 පෙබරවාරි 12 දින උපදෙස් ලබා දී තිබුණි.

- ණයවර ලිපි සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය දැනුවත් කරන ලෙස අමාත්‍යවරයා විසින් උපදෙස් ලබා දී තිබුණද, ඊට පටහැනිව අධිකාර බලයකින් තොරව පසු දිනම එනම් 2015 පෙබරවාරි 13 දින සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වූ අමාත්‍යාංශයේ එවකට සිටි අතිරේක ලේකම්වරයාගේ සහ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ අත්සනින් ණයවර ලිපිවල කාලය 2015 අප්‍රේල් 20 දක්වා දීර්ඝ කරන ලෙස බැංකුව වෙත දන්වා රු.මිලියන 5,362 ක් වූ සහල් මෙ.ටො.81,088 ක් ආනයනය කිරීමට කටයුතු කර තිබුණි.

- 2014/15 මහ කන්නයේ වී අස්වැන්න වෙළඳපළ වෙත ලැබෙමින් පවතින නිසා කල් ඉකුත් වූ ණයවර ලිපිවල කාලය තවදුරටත් දීර්ඝ නොකරන ලෙස භාණ්ඩාගාරය විසින් දන්වා තිබුණද, ඒ වන විටත් ණයවර ලිපිවල කාලය දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි.

- "අවලංගු කළ නොහැකි" ණයවර ලිපියක් විවෘත කිරීමට කටයුතු කරන ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් කරන ලද දැනුම් දීමට පටහැනිව සැපයුම්කරුගේ නාමමාත්‍ර ඉන්වොයිසියේ පරිදි "වෙනත් පාර්ශවයන්ට පැවරිය හැකි" ලෙස ණයවර ලිපි විවෘත කිරීමට ලංකා සතොස ආයතනය කටයුතු කර තිබූ අතර, එමඟින් සැපයුම්කරු මුලින් එකඟ වූ පරිදි තම වගා බිම්වලින් සහල් සැපයීම වෙනුවට අතරමැදියකු ලෙස වෙනත් සමාගම්වලින් සහල් සැපයීමට අදාළ සමාගමට අවස්ථාව සලසා දී තිබුණි.

- ණයවර ලිපිවල කාලය දීර්ඝ කිරීමේදී ඇනවුම් කර ලැබෙමින් තිබූ සහල් ප්‍රමාණය මෙන්ම පවත්නා ගබඩා පහසුකම් සම්බන්ධයෙන් ද අවධානය යොමු නොකිරීම හේතුවෙන් වරායට ලැබී තිබූ මෙ.ටො. 90,901 ක් වූ සහල් තොගයෙන් මෙ.ටො. 42,992 ක් එනම් සියයට 47.3 කට ආසන්න ප්‍රමාණයක් වරායෙන් කිදහස් කර ගැනීමට දීර්ඝ කාලයක් ගත වී තිබූ අතර, ඒ වෙනුවෙන් වරාය අධිකාරියට ගෙවූ සහ ගෙවිය යුතු ප්‍රමාද කුලී මෙන්ම අනෙකුත් වියදම්වල එකතුව රු.මිලියන 694 ක් වී තිබුණි.

- වරාය පරිශ්‍රයේ මෙන්ම වරායෙන් නිදහස් කර ගත් පසු පෞද්ගලික බහාලුම්

අංගනවල බහාලුම් තුළම දීර්ඝ කාලයක් අයහපත් පාරිසරික තත්ත්වයන් යටතේ පැවතීම හේතුවෙන් සහල් විශාල වශයෙන් මිනිස් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්ව විනාශ වී තිබුණු අතර බහාලුම් අංගනවල බිම් කුලිය වශයෙන් විගණනය දිනය වූ 2016 නොවැම්බර් 16 දින වනවිට රු.මිලියන 15.64 ක් ගෙවීමටද සිදු වී තිබුණි.

- මැතිවරණ සමයේදී සහල් මිල අසාමාන්‍ය ලෙස ඉහළ යාමේ ප්‍රවණතාවය අධෛර්යමත් කිරීම සඳහා අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි රු.මිලියන 1,630 ක් වටිනා සුදු සහල් මෙ.ටො. 30,000 ක් සහ රු.මිලියන 2,151 ක් වටිනා පොන්නි සම්බා සහල් මෙ.ටො. 31,354 ක් අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් තොරවද, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවද, ආනයනය කර තිබූ අතර එම සහල් තොග මිලදී ගැනීමට පෙර ඒ වන විටත් ලංකා සතොස මගින් ඇනවුම් කර තිබූ මෙ.ටො. 193,460 ක සහල් තොග සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

- ආනයනය කළ සහල් මෙ.ටො. 257,559 හි වටිනාකම වූ රු.මිලියන 15,997 ට අමතරව ඒ සම්බන්ධයෙන් දැරීමට සිදු වූ රේගු බදු, බැංකු ණය සඳහා පොලී, නිෂ්කාශන ගාස්තු, වරාය ගාස්තු, ගබඩා කුලී යනාදී විවිධ වියදම්වල එකතුව රු.මිලියන 11,015 ක් විය. ඉන් රු.මිලියන 1,503 ක් නිෂ්කාශන නියෝජිත ආයතනයකට අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර එම මුදලින් රු.මිලියන 303 ක් 2016 ඔක්තෝබර් 18 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

- සහල් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමට ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් එකතුව රු.මිලියන 14,087 ක් වූ ණය මුදලක් ලබාගෙන තිබූ අතර, ඒ සඳහා 2016 දෙසැම්බර් මාසය වන විට ගෙවූ සහ ගෙවිය යුතු ණය පොලිය රු.මිලියන 1,939 ක් විය. ඒ වන විට ණය මුදලින් රු.මිලියන 7,786 ක්ද ආපසු ගෙවිය යුතුව තිබුණි.

- ආනයනික සහල් මෙ.ටො.257,559 න් මෙ.ටො.176,208 ක් රු.මිලියන 9,666 ක් වූ මුදලකට සතොස අලෙවිසැල් මගින් අලෙවි කර තිබූ අතර සහල් මෙ.ටො.57,600 ක් එනම් ආනයනික සහල්වලින් සියයට 22.36 ක් රු.මිලියන 2,189 ක් වූ මුදලකට සත්ව ආහාර සඳහාද අලෙවි කර තිබුණි.

- සහල් ආනයන ක්‍රියාවලිය සඳහා දැරීමට සිදු වී තිබුණු පිරිවැය රු.මිලියන 27,012 වූ අතර සහල් අලෙවියෙන් ලබා තිබූ ආදායම රු.මිලියන 11,855 ක් වූයෙන් සිදු වී තිබූ අලාභය රු.මිලියන 15,157 ක් විය.

විගණන නිරීක්ෂණවල සාරාංශය

(ක්ෂේත්‍ර අනුව)

ඒකාබද්ධ අරමුදල

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය සඳහන් කර ඇත.

2016 අංක 23 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2015 අංක 16 දරන විසර්ජන පනත අනුව, 2016 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. බිලියන 1,156 ක් හා මූලධන වියදම් වෙනුවෙන් රු. බිලියන 1,323 ක් වශයෙන් එකතුව රු. බිලියන 2,479 ක ප්‍රතිපාදන සලසා තිබුණි. පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී තිබුණු, ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු විශේෂ නීති සේවා වියදම් යටතේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.බිලියන 648 ක් හා මූලධන වියදම් වෙනුවෙන් රු.බිලියන 544 ක් වශයෙන් එකතුව රු. බිලියන 1,192 ක් හා ඊට අතිරේකව රු.බිලියන 228 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ වියදම් සඳහා මුළු වාර්ෂික ප්‍රතිපාදනය රු.බිලියන 3,899 ක් වී තිබුණි. විස්තර වගුව 05 හා දැක්වේ.

සේවාව	ප්‍රතිපාදනය		
	පුනරාවර්තන රු.බිලියන	මූලධන රු.බිලියන	එකතුව රු.බිලියන
රජයේ සැපයුම් හා සේවා සඳහා	1,156	1,323	2,479
විශේෂ නීති සේවා සඳහා	648	544	1,192
විශේෂ නීති සේවා සඳහා (අතිරේක)	167	61	228
එකතුව	**1,971**	**1,928**	**3,899**

වගුව 05 2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රතිපාදනය
මූලාශ්‍රය :- ජනරජයේ මූල්‍ය ප්‍රකාශන.

සමාලෝචිත වර්ෂය සඳහා සංශෝධිත වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.බිලියන 3,899 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේදී රු.බිලියන 3,475 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන රු.බිලියන 424 කින් හෙවත් සියයට 12.20 කින් වැඩි කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු. බිලියන 3,106 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර, රු. බිලියන 793 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 20.34 ක් ඉතිරි කර තිබුණි. ඉකුත් වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිය රු. බිලියන 271 ක සමග සැසඳීමේදී ඉතිරිවීම්වල රු. බිලියන 522 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. වැය විෂයයන් 416 ක් සඳහා සලසා තිබුණු රු.බිලියන 521ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර එය මුළුමණින්ම ඉතිරි කර තිබුණි. එසේම වැය විෂයයන් 2261 ක සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදයෙන් සියයට 25 කට වැඩියෙන් ඉතිරිවීම් නිරීක්ෂණය වූ අතර, එම ඉතිරිවීම්වල සමුච්චිත එකතුව රු.බිලියන 711 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18.24 ක් නියෝජනය විය. ඉතිරිය පිළිබඳ විස්තර වගුව 06 හි දැක්වේ.

ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතවල පරාසයක් ලෙස	ශුද්ධ ප්‍රතිපාදනය	උපයෝජනය	ඉතිරිය
	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන
සියයට 25 ට අඩු	3,003	2,921	82
සියයට 26 - සියයට 50	207	132	75
සියයට 51 - සියයට 75	123	47	76
සියයට 76 - සියයට 99	45	6	39
සියයට 100 ක	521	-	521
එකතුව	**3,899**	**3,106**	**793**

වගුව 06 - ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය - භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත වගුව 33

සමාලෝචිත වර්ෂයේදී සමහර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජන කිරීමට ප්‍රමාණවත් අග්‍රිම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී නොතිබුණු නිසා සලසා තිබුණු ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් සහතික කර තිබුණු විසර්ජන ගිණුම්වල දක්වා තිබුණි. එසේ අග්‍රිම ලබා නොදීම නිසා වර්ෂය අවසාන වනවිට පුනරාවර්තන ප්‍රතිපාදන රු. බිලියන 14 ක්ද, මූලධන ප්‍රතිපාදන රු. බිලියන 38 ක්ද වශයෙන් එකතුව රු.බිලියන 52 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකිව ඉතිරි වී තිබුණි. එම ඉතිරිය මුළු ප්‍රතිපාදන ඉතිරියෙන් සියයට 6.68 ක ප්‍රමාණයක් වී තිබුණි.

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ 126-2-4-1-1407 වැය විෂය යටතේ රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යාමේ පිරිවැය (ඉඩම් හා ගොඩනැගිලි) සඳහා රු. බිලියන 121 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම පුනරාවර්තන ප්‍රතිපාදනය නාමික අගයක් පමණක් වූ අතර, එවැනි ප්‍රතිපාදනය අදාල අමාත්‍යංශය විසින් ඉල්ලුම් කර නොතිබුණි. ඒ අනුව, 2016 වර්ෂයේදී එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් කර නොතිබුණු අතර, එය අධ්‍යාපන අමාත්‍යාංශයේ මුළු ප්‍රතිපාදන ඉතිරියෙන් සියයට 88 ක් වී තිබුණි.

එසේම, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත 111-01-05-0-1407(11) වැය විෂයය යටතේ රාජ්‍ය ආයෝජන පවත්වා ගෙනයාමේ පිරිවැය (ඉඩම් හා ගොඩනැගිලි) ලෙස රු.බිලියන 17.8 ක පුනරාවර්තන ප්‍රතිපාදන සලසා තිබුණි. එම පුනරාවර්තන ප්‍රතිපාදනය නාමික අගයක් පමණක් වී තිබුණු අතර අදාල අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී එවැනි ප්‍රතිපාදන ඉල්ලුම් කර නොතිබුණු බව අනාවරණය විය. එම ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොකරන ලෙස භාණ්ඩාගාරය විසින් අදාල අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. එය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මුළු ප්‍රතිපාදන ඉතිරිවීම්වලින් සියයට 42 ක ප්‍රමාණයක් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයට අදාලව ණය ගෙවීම් හැර, මූලධන ප්‍රතිපාදනය රු.බිලියන 1,185 ක් වූ අතර ඉන් රු.බිලියන 594 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 50.13 ක් උපයෝජනය කර තිබුණි. ඉකුත් වර්ෂයේ

මූලධන ප්‍රතිපාදන උපයෝජනය රු.බිලියන 684 සමඟ සැසඳීමේදී එය රු. බිලියන 90 කින් අඩු වී තිබුණි. එනම්, ඉකුත් වර්ෂයේදී මුළු වියදමෙන් සියයට 29 ක් වූ මූලධන ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේදී මුළු වියදමෙන් සියයට 25 ක් දක්වා අඩු වී තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනය රු. බිලියන 1,971 ක් වූ අතර, ඉන් රු.බිලියන 1,771 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 89.85 ක් උපයෝජනය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම වූ රු. බිලියන 1,673 සමග සැසඳීමේදී රු.බිලියන 98 කින් වැඩි වී තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයේ රු. බිලියන 2,357 ක් වූ මුළු වියදම සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 2,365 ක් දක්වා රු. බිලියන 8 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ණය ගෙවීම් හැර මුළු වියදම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.97 ක් වි තිබුණි. 2010 වර්ෂයේ සිට සමස්ථ වියදම එනම් ප්‍රනරාවර්තන හා මූලධන වියදමද අඛණ්ඩව වැඩි වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී මූලධන වියදම අඩු වී තිබුණි. විස්තර රූපසටහන 04 හි දැක්වේ. එසේම සමස්ථ වියදම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සැලැකීමේදී පසුගිය වර්ෂ 2 ක කාල පරිච්ඡේදයට වඩා අඩු වි තිබුණි. විස්තර රූපසටහන 05 හි දැක්වේ.

රූපසටහන 04 - සමස්ථ වියදම
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

රූපසටහන 05සමස්ථ වියදම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය : ජනරජයේ මූල්‍ය ප්‍රකාශන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව

සමාලෝචිත වර්ෂයේදී දේශීය හා විදේශීය ණය වෙනුවෙන් පොලී ගෙවීම සඳහා රු. බිලියන 611 ක් හෙවත් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 34.5 ක ප්‍රමාණයක් වැයකර තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 84 කින් හෙවත් සියයට 15.94 කින් වැඩිවී තිබුණි. මීට අමතරව පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු. බිලියන 453 ක්ද, ප්‍රදානයන් හා සහනාධාර වෙනුවෙන් රු. බිලියන 557 ක්ද හා අනිකුත් භාණ්ඩ හා සේවා වියදම් සඳහා රු. බිලියන 149 ක්ද වැයකර තිබුණි. මුළු පුනරාවර්තන වියදම කෙරෙහි ඉහත සඳහන් වියදම් ඉහළ දායකත්වයක් ගෙන තිබුණු අතර, සමස්ථ පුනරාවර්තන වියදම පියවා ගැනීම සඳහා වර්ෂය තුල රැස්කළ ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි. එසේම, මූලධන වියදම් සඳහාද සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 594 ක් වැයකර තිබුණු අතර, පුනරාවර්තන වියදමේ කොටසක් සහ රාජ්‍ය ආයෝජන හා ණය වාරික ගෙවීමට දේශීය ණය, විදේශීය ණය හා අධාර ලබා ගැනීමට සිදුවී තිබුණි. ඒ

අනුව, වාර්ෂික ණය වාරික හා පොලී ලෙස විශාල මුදලක් ගෙවීමට සිදුවී තිබුණු අතර එය වාර්ෂිකව වර්ධනය වන පිරිවැයක් බව නිරීක්ෂණය විය.

2016 වර්ෂයේ පුනරාවර්තන, මූලධන හා ණය ආපසු ගෙවීම්වල එකතුව රු.බිලියන 3,106 ක් වී තිබුණු අතර සමස්ථ වියදමින් සියයට 23.86 ක් ණය ගෙවීම සඳහාද සියයට 19.67 ක් ණය පොලී ගෙවීම සඳහාද වැයකර තිබුණි. හඳුනාගත් අංශ 16 ක් අතර 2016 වර්ෂයේ මුළු වියදම සිදුකළ ආකාරය රූපසටහන 06 හි දැක්වේ.

රූපසටහන 06 - සමස්ථ වියදම හඳුනාගත් ක්ෂේත්‍ර 16 ක දායකය.
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ආදායම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව, සමාලෝචිත වර්ෂය සඳහා දේශීය හා විදේශීය ණය ගැනීම් හැර ඇස්තමේන්තු කළ රාජ්‍ය ආදායම රු.බිලියන 1,668 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම වූ රු.බිලියන 1,441 සමඟ සැසඳීමේදී රු. බිලියන 227 ක් හෙවත් සියයට 15.75 ක වැඩිවීමක් විය. 2016 වර්ෂයේදි ඇස්තමේන්තු කළ ආදායම රු.බිලියන 31 කින් ඉක්මවා රු.බිලියන 1,699 ක ආදායම් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදි රැස්කළ ආදායම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.බිලියන 305 ක් හෙවත් සියයට 21.88 ක වර්ධනයක් ලබාගෙන තිබුණි. රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේදී ඉකුත් වර්ෂයේ සියයට 12.47 ක් වි තිබුණත්, 2016 වර්ෂයේදි එම ප්‍රතිශතය ඉක්මවා සියයට 14.35 ක් ලබා ගැනීමට හැකි වී තිබුණි. විස්තර රූප සටහන 07 හි දැක්වේ.

රූපසටහන අංක 07 - රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය - ශ්‍රී ලංකා ජනරජයේ මූල්‍ය ප්‍රකාශන 2016

රාජ්‍ය ආදායම වර්ගීකරණය

රාජ්‍ය ආදායම "බදු ආදායම හා බදු නොවන ආදායම" ලෙස ප්‍රධාන ප්‍රභේද දෙකක් යටතේ වාර්තා වී තිබුණු අතර, බදු ආදායම නැවත "ආදායම් බදු, දේශීය භාණ්ඩ හා සේවා මත බදු හා ජාත්‍යන්තර වෙළඳාම මත බදු වශයෙන් වර්ග කර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වශයෙන් රු.බිලියන 261ක් රැස්කිරිමට අපේක්ෂා කර තිබුණත්, ඉන් රු.බිලියන 259 ක් පමණක් රැස්කිරිමට හැකි වී තිබුණි. එමෙන්ම දේශීය භාණ්ඩ හා සේවා මත පනවනු ලබන බදුවලින් රු.බිලියන 846 ක් රැස්කිරීමට අපේක්ෂා කර තිබුණත්, ඉන් රු.බිලියන 841 ක් පමණක් රැස් කිරීමට සමත් වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවනු ලබන බදුවලින් රු.බිලියන 367 ක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.බිලියන 364 ක් රැස් කර තිබුණි. මේ අනුව බදු ආදායම්වලින් රු.බිලියන 1,474 ක් රැස්කිරිමට අපේක්ෂා කර තිබුණත්, ඉන් සියයට 99.32 ක් හෙවත් රු.බිලියන 1,464 ක් පමණක් රැස්කර ගැනීමට හැකිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී බදු නොවන අනෙකුත් ආදායම්වලින් රු.බිලියන 194 ක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණු අතර එම ඇස්තමේන්තුගත ඉලක්කය රු.බිලියන 41 කින් ඉක්මවා රු.බිලියන 235 ක ආදායම් රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව හා රැස්කළ ආදායම දැක්වෙන විස්තරයක් රූපසටහන 08 වේ.

රූපසටහන 08 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන 2016

බදු ආදායම

රාජ්‍ය ආදායම තුල ආදායම් බදු වශයෙන් රු.බිලියන 259 ක ආදායම් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රැස්කළ ආදායම රු.බිලියන 263 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂ සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 4 කින් ආදායම් බදු ආදායම අඩු වී තිබුණි. 2016 වර්ෂයේදී රු.බිලියන 1,464 ක බදු ආදායමක් රැස් කර තිබුණත්, පාරිභෝගිකයන් වෙත විතැන් කළ හැකි බදු සේ සැලකිය හැකි වක්‍ර බදු ප්‍රභවයන්ගෙන් රු.බිලියන 1,205 ක ආදායමක් හෙවත් මුළු බදු ආදායමෙන් සියයට 82.31 ක් නියෝජනය වී තිබුණි. ඉකුත් වරෂයේ එම අනුපාතය සියයට 79.49 ක් වී තිබුණි. ඒ අනුව බදු ආදායම පාරිභෝගිකයා වෙත විතැන් කිරීම අවම කිරීමට සමාලෝචිත වර්ෂයේදීද අපොහොසත් වී තිබුණි.

වක්‍ර බදු සේ හඳුනාගත හැකි දේශීය පරිභෝජනය හා ආනයන මත පදනම් වූ බදු ආදායම, රාජ්‍ය ආදායම් ව්‍යුහය තුල සියයට 70 කට ආසන්න ඉතා ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. මෙසේ රැස් කර ඇති ආදායමෙන් සියයට 18 කට වැඩි ප්‍රතිශතයක් මත්පැන් හා සිගරැට් යන භාණ්ඩ මත පනවා ඇති බදුවලින් සමන්විත වී තිබුණ අතර සියයට 16 කට වැඩි ප්‍රතිශතයක් මෝටර් රථ වාහන මත පනවා ඇති බදුවලින් සමන්විත වී තිබුණි.

ඉහත සඳහන් පරිදි රාජ්‍ය ආදායම් ව්‍යුහය තුළ වක්‍ර බදු සේ සැලකිය හැකි ආදායමේ ඉහළ දායකත්වය සහ වර්ධනය සඳහා පහත සඳහන් සාධකයන්ගෙන් ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කර තිබුණ ද එම බලපෑම්වල මූල්‍යමය වටිනාකම ගණනය කිරීම සඳහා ආදායම් එකතු කරන දෙපාර්තමේන්තු විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. එම හේතුවෙන් ආදායම් රැස් කරන දෙපාර්තමේන්තුවල සැබෑ කාර්සාධනය මැනීම සඳහා රැස් කරන ආදායමේ වර්ධනය පමණක් සැලකිල්ලට ගැනීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

- රජය විසින් ඉහළ බදු අනුපාතයන් නියම කිරීම.
- විශේෂ අවස්ථාවලදී සිදු වන ආනයනයන්ගේ වර්ධනය හේතුවෙන් ඇති වන බදු ආදායමේ වර්ධනය.
- භාණ්ඩ හා සේවාවල විදේශීය වෙළඳපල මිල ගණන් ඉහළ යාම නිසා සිදු වන බදු ආදායමේ වර්ධනය.
- විදේශ විනිමය අනුපාතයේ පිරිහීම හේතුවෙන් ඇති වන ආනයන පිරිවැය වර්ධනය මත බදු ආදායම වර්ධනය වීම.

තවද, විදේශීය වෙළඳ ගිවිසුම් සහ වෙනත් නීතීන් මත සිදු කරනු ලබන බදු අත්හැරීම්, ලිහිල් කිරීම් සහ බදු නිදහස් කිරීම් හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදු වන බලපෑම සම්බන්ධ විස්තරාත්මක තොරතුරුද අදාල දෙපාර්තමේන්තුවල කාර්යසාධනය මැනීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

අයවැය හිඟය

සමාලෝචිත වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඇස්තමේන්තුගත අයවැය හිඟය රු.බිලියන 1,488 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු. බිලියන 317 ක හෙවත් සියයට 27 ක වැඩිවීමකි. 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය අයවැය හිගය රු.බිලියන 666 ක් වූ අතර, එය ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු. බිලියන 822 ක හෙවත් සියයට 55.24 ක අඩුවීමකි. 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 කට සීමා විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 12.57 ක් වී තිබුණි. 2010 වර්ෂයේදී එම ප්‍රතිශතය සියයට 9.78 ක සිට 2013 වර්ෂය වන විට එය සියයට 7.6 ක් දක්වා අඩු වී තිබුණි. නමුත් 2014 වර්ෂයේ සිට එම ප්‍රතිශතය 2016 වර්ෂය වන විට සියයට 12.57 ක් දක්වා වැඩි වී තිබුණි. රූපසටහන 09 හි දැක්වේ. එමෙන්ම 2010 වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය රු.බිලියන 473 ක් වී තිබුණත්, 2015 වර්ෂය වන විට එය රු.බිලියන 963 ක් දක්වා වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට එය රු.බිලියන 666 ක් දක්වා අඩු වී තිබුණි. රූපසටහන 10 හි දක්වා ඇත.

රූපසටහන 09 - තථ්‍ය අයවැය හිඟය
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

රූපසටහන 10 -ඇස්තමේන්තුගත අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස

තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අයවැය හිඟය රු.බිලියන 297 කින් එනම් සියයට 30.84 කින් අඩු වී තිබුණද, ශුද්ධ විදේශ ණය ගැනීම් රු.බිලියන 369 ක සිට රු.බිලියන 429 ක් දක්වා රු.බිලියන 60 කින් එනම් සියයට 16.2 කින් වැඩි වී තිබුණි. එසේම, ශුද්ධ දේශීය ණය ගැනීම් ඉකුත් වර්ෂයේ රු.බිලියන 528 ක සිට සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 445 ක් දක්වා රු.බිලියන 83 කින් එනම් සියයට 15.7 කින් අඩු වී තිබුණි. මේ අනුව, අයවැය හිඟය පියවා ගැනීම සඳහා විදේශ ණය ගැනීම් වැඩි වී තිබුණි.

පුනරාවර්තන වියදම පියවා ගැනීමට අදායම ප්‍රමාණවත් නොවීම

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන වියදම රු. බිලියන 1,771 ක් හා රජයේ මූලධන වියදම රු. බිලියන 594 ක් වී තිබුණි. එහෙත් රජය විසින් උපයා තිබූ සමස්ත ආදායම රු. බිලියන 1,699 ක් වීම හේතුවෙන් එම ආදායම 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමටවත් ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව, සමස්ත රාජ්‍ය ආදායම ඉක්මවා රු.

බිලියන 72 ක පුනරාවර්තන වියදම් සිදු කර තිබුණි. 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රාජ්‍ය ආදායම පුනරාවර්තන වියදම පියවා ගැනීමට ප්‍රමාණවත් වී නොතිබීම රූපසටහන 11 හි විස්තර වේ.

රූපසටහන 11 -රාජ්‍ය ආදායම පුනරාවර්තන වියදම පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව ණය ඇතුළුව සම්පූර්ණ මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතු වන අතර ජනරජයේ සියළු ණය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුවේ. ඒ අනුව 2016 අංක 23 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2015 අංක 16 දරන විසර්ජන පනතේ 2.1 (ආ) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව ණය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා දී තිබුණි.

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී විදේශීය ණය රු. බිලියන 574 ක් ද, දේශීය බැංකු නොවන ණය රු. බිලියන 2,517 ක්ද වශයෙන් රු.බිලියන 3,091 ක ණය ලබා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු රු. බිලියන 3,350 ක ණය ප්‍රමාණය සමග සැසඳීමේදී, රු.බිලියන 259 කින් හෙවත් සියයට 7.73 කින් අඩු වී තිබුණි. රජය දේශීය ණය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 2,517 ක්වූ දේශීය ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයේදි ලබා ගෙන තිබුණු රු.බිලියන 2,794 ක දේශීය ණය ප්‍රමාණය සමග සැසඳීමේදී රු.බිලියන 277 කින් හෙවත් සියයට 9.91 කින් අඩු වි තිබුණි.

විස්තරය	2011	2012	2013	2014	2015	2016
	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන
විදේශ ණය ගැනීම්	**287**	**366**	**183**	**423**	**556**	**574**
දේශීය ණය ගැනීම්						
භාණ්ඩාගාර බිල්පත්	1,116	1,553	1,135	1,066	1,533	1,635
භාණ්ඩාගාර බැඳුම්කර	538	639	802	858	926	668
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක	5	3	3	1	-	17
සංවර්ධන බැඳුම්කර	60	60	238	95	335	197
මුළු දේශීය ණය ගැනීම්	**1,719**	**2,255**	**2,178**	**2,020**	**2,794**	**2,517**
වර්ෂයේදී ලබාගත් මුළු ණය ප්‍රමාණය	**2,006**	**2,621**	**2,361**	**2,443**	**3,350**	**3,091**

වගුව 07 - පසුගිය වර්ෂ කිහිපයක රාජ්‍ය ණය ගැනිම
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය රු. බිලියන 8,794 ක්වූ අතර, එය 2015 දෙසැම්බර් 31 දිනට පැවති රු. බිලියන 7,684 ක ණය ශේෂය සමග සැසඳීමේදී රු. බිලියන 1,110 කින් හෙවත් සියයට 14.45 කින් වැඩිවී තිබුණි. ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ලබාගෙන තිබූ රාජ්‍ය ණය පිළිබඳ විස්තර වගුව 08 හි දැක්වේ.

විෂයය	දෙසැම්බර් 31 දිනට ශේෂය	
	2015 රු. බිලියන	**2016** රු. බිලියන
භාණ්ඩාගාර බිල්පත්	633	792
භාණ්ඩාගාර බැඳුම්කර	3,187	3,567
රුපියල් ණය	24	24
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	613	572
විදේශ ව්‍යවහාර මුදලින් දේශීය ණය	22	42
ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාව භාණ්ඩාගාර බැඳුම්කර	-	105
කල්බදු ණය හිමියන්	5	16
මුළු දේශිය ණය	**4,484**	**5,118**
මුළු විදේශිය ණය	**3,200**	**3,676**
මුළු රාජ්‍ය ණය ශේෂය	**7,684**	**8,794**
ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදනය	11,183	11,839
නොපියවූ රාජ්‍ය ණය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස	68.71	74.28

වගුව 08 – 2015 හා 2016 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු ණය ශේෂ
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන 2016

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 වර්ෂයේ නොපියවූ රාජ්‍ය ණය ශේෂය රු. බිලියන 8,794 ක් ලෙස දක්වා තිබුණද, ශ්‍රී ලංකා රජය විසින් ගිවිසුම්ගත වී ලබාගෙන රාජ්‍ය ආයතන තුනක් වෙත පවරන ලද හා ශේෂපත්‍රයෙන් පිටත ගිණුම් තබන ලද විදේශ ණය ගිවිසුම් 07 කට අදාලව 2016 දෙසැම්බර් 31 දිනට වූ ණය ශේෂය රු. බිලියන 332 ක් වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය රු. බිලියන 487 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දිනට නොපියවූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය රු. බිලියන 9,613 ක් වී තිබුණි.

රජයේ මුළු නොපියවූ ණය ශේෂයද ඇතුළත්ව සමාලෝචිත වර්ෂය අවසානයට මුළු බැරකම් වටිනාකම රු.බිලියන 9,864 ක් වූ අතර, එය රු. බිලියන 11,839 ක් වූ 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 83.32 ක් විය. එසේම, එය ඉකුත් වර්ෂයේ සියයට 79.68 ක් වූ ප්‍රතිශතය සමග සැසඳීමේදී සියයට 3.64 ක වැඩිවීමකි. 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 2(ආ) වගන්තිය ප්‍රකාරව 2013 ජනවාරි 01 දින ආරම්භ වන මුදල් වර්ෂයේ සිට රජයේ මුළු බැරකම ඒ ඒ මුදල් වර්ෂයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන්

සියයට 80 ක් නොඉක්මවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ සඳහන් එම උපරිම බැරකම් සීමාව ඉක්මවා තිබුණි. විස්තර වගුව 09 හි දැක්වේ.

බැරකම්	දෙසැම්බර් 31 දිනට බැරකම්වල වටිනාකම*	
	2015 රු.බිලියන	2016 රු.බිලියන
බැංකු අයිරාව	198	168
මහ බැංකු අත්තිකාරම්	151	83
රාජ්‍ය ණය	7,685	8,794
මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකළ බැරකම්:		
- ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් තබන විදේශ ණය	338	332
- භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය අඩුවෙන් ගිණුම්ගතකිරීම	509	487
- භාණ්ඩාගාර බිල්පත් ශේෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම	30	-
මුළු බැරකම	**8,911**	**9,864**
දළ දේශිය නිෂ්පාදිතය	11,183	11,839
මුළු බැරකම ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස	79.68	83.32
***මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන තිබූ ණය සඳහා බැංකු වෙත ලබාදී තිබූ රු. මිලියන 563,337 ක් වූ ඇපකරවල වටිනාකම ඉහත බැරකම්වල ඇතුළත් කර නොතිබුණි.**		

වගුව 09 – 2015 හා 2016 වර්ෂවලට අදාළව ජනරජයේ බැරකම්
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන 2016

2016 දෙසැම්බර් 31 දිනට මුළු රාජ්‍ය ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමග සැසඳීමේදී ඒකපුද්ගල ණය ප්‍රමාණය රු. 417,865 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ ඒකපුද්ගල ණය ප්‍රමාණය වූ රු. 373,462 කට සාපේක්ෂව රු. 44,403 කින් වැඩිවී තිබුණි

සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 305 කින් එනම් සියයට 21.9 කින් වැඩිවී තිබුණද, එම මුළු රාජ්‍ය ආදායම වර්ෂය තුළ ගෙවිය යුතු මුළු ණය වාරික හා ණය පොලියෙන් සියයට 60.1 ක් නිරවුල් කිරීම සඳහා පමණක් ප්‍රමාණවත් වී තිබුණි. ඒ අනුව, රු. බිලියන 1,129 ක් එනම් සියයට 39.9 ක් නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දේශීය හා විදේශීය වශයෙන් ලබාගත් ණය යොදා ගැනීමට සිදුවී තිබුණි. එසේම, වර්ෂයේ ණය වාරික හා පොලී ගෙවීම් රාජ්‍ය ආදායමෙන් සියයට 166.4 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී එය රාජ්‍ය ආදායමෙන් සියයට 213.7 ක් විය. විස්තර වගුව 10 හි දැක්වේ.

විස්තරය	2011	2012	2013	2014	2015	2016
	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන
රාජ්‍ය ආදායම	943	997	1,066	1,128	1,394	1,699
ණය වාරික හා පොලී ගෙවීම්වල එකතුව	1,917	2,542	2,255	2,136	2,979	2,828
ණය වාරික හා පොලී ගෙවීම්වල එකතුව රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස	203.29	254.96	211.54	189.36	213.70	166.45

වගුව 10 රාජ්‍ය ණය වාරික හා පොලී ගෙවීමට රාජ්‍ය ආදායම ප්‍රමාණවත් නොවීම
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

බදු සහන සහ බදු අත්හැරීම

නියැදි විගණන පරීක්ෂණවල දී අනාවරණය වූ පරිදි, 2016 වර්ෂයේදී රාජ්‍ය සහ පෞද්ගලික ආයතන විසින් ආනයන කර තිබුණු භාණ්ඩ මත රු.මිලියන 44,639 ක් ද , විවිධ පාර්ශවයන් සඳහා සහනදායී බදු පදනම මත ලබා දී ඇති වාහන ආනයන බලපත්‍ර වෙනුවෙන් රු.මිලියන 6,619 ක් ද, විදේශ වෙළඳ ගිවිසුම් 4 ක් මත රු.මිලියන 6,975 ක් ද සහ ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල වෙනුවෙන් රු.මිලියන 23,084 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 81,317 ක බදු සහනයන් ශ්‍රී ලංකා රජය විසින් ලබා දී තිබුණි.

ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකා රේගුවේ ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුව වෙත ලැබිය යුතුව පැවති හිඟ බදු ආදායම රු.මිලියන 21,316 ක් ලෙස වාර්තා කර තිබුණු අතර එම හිඟ බදු ආදායමින් සියයට 85 ක පමණ ප්‍රමාණයක් 2015 වර්ෂය හෝ ඊට පෙර වර්ෂවලට අදාළ හිඟ බදු ආදායම් විය. එසේම මෙම හිඟ බදු ආදායමින් රු.මිලියන 15,644 ක් හෙවත් සියයට 73 ක් රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන 9 කින් ලැබිය යුතුව තිබුණි. නියමිත පරිදි ප්‍රතිපාදන ලබාගෙන අදාළ හිඟ බදු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර විවිධ රේගු වැරදි සඳහා පනවා ඇති දණ්ඩනවලින් රු.මිලියන 945 ක් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණි. එම හිඟ දණ්ඩන ආදායම් තුළ වර්ෂ 5 කට වඩා පැරණි හිඟ බදු ආදායම් ඇතුළත්ව තිබුණි.

- කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මගී පර්යන්තය හරහා නීත්‍යානුකූල නොවන අයුරින් වාණිජමය ස්වරූපයේ භාණ්ඩ ආනයනය බහුලව සිදු වන අතර එම භාණ්ඩ සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුව රජයට අය විය යුතු බදු ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2016 වර්ෂයේ දී ගුවන් මගීන් 60 දෙනෙකු පමණක් අවස්ථා 1,533 ක දී වාණිජමය ස්වරූපයේ භාණ්ඩ ආනයනය කර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය විය. එසේ ආනයනය කරනු ලබන සාරි, සල්වාර් සහ වෙනත් ඇඳුම් වර්ග සඳහාත්, වෙනත් කුඩා ප්‍රමාණයේ වටිනාකමින් වැඩි භාණ්ඩ සඳහාත්, පිළිගත හැකි ඉන්වොයිසියක් හෝ ඉදිරිපත් කර නොතිබුණු අවස්ථා

අනාවරණය විය. එසේ ආනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. එසේම නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කරන ගමන් මළු පිළිබඳව වෙනත් අභ්‍යන්තර පරීක්ෂාවක්ද සිදු නොවන බව නිරීක්ෂණය විය.

- ගුවන් තොටුපලේ පිහිටුවා ඇති තීරු බදු නිදහස් වෙළඳසැල්වල අලෙවිකරණ භාණ්ඩවල මිල නියාමනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් වගකිවයුතු පාර්ශවයන් විසින් හඳුන්වා දී නොතිබුණි. ඒ හේතුවෙන් අලෙවිසැල් හිමිකරුවන්ගේ අභිමතය පරිදි භාණ්ඩවල මිල තීරණය කර ඇති බව නිරීක්ෂණය විය. මෙම වෙළඳසැල්වල අලෙවිකරණ භාණ්ඩ සඳහා තීරු බදු අය කිරීම අත්හැරීම හේතුවෙන් රජය විසින් විශාල බදු අලාභයක් ලැබුව ද, එම සහනය ගුවන් මගීන් වෙත ලැබී තිබුණු බව තහවුරු කර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොතිබුණි.

- ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ නියමිත ප්‍රමිතීන්ට අනුකූලව පවතී ද යන්න තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ඒ සඳහා වගකිව යුතු ආයතනයන්ගේ සහාය ලබාගත යුතුව තිබුණි. එම ආයතනයන්ගේ සහතික ලැබෙනතෙක් අදාළ භාණ්ඩ පෞද්ගලික ඇපකර මත ආනයනකරුවන්ගේ පරිශ්‍ර වෙත මුදා හැරෙන නමුත්, එම භාණ්ඩ වෙළඳපලට නිකුත් නොකළ යුතුය. එහෙත් එසේ පෞද්ගලික ඇපකර මත නිදහස් කරන භාණ්ඩ පිළිබඳව ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය සතුටුදායක මට්ටමක නොතිබුණි. මෙසේ භාණ්ඩ නිදහස් කර ඇති අවස්ථා 1,200 කින් 937 ක්ම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණයක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. කලින් ලබාගත් පෞද්ගලික ඇපකර නිරවුල් කර නොතිබියදී නැවත පෞද්ගලික ඇපකර මත භාණ්ඩ නිදහස් කර ඇති අවස්ථා ද නිරීක්ෂණය විය.

- කොළඹ වරාය, කටුණායක ගුවන් තොටුපළ සහ රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව යන ස්ථානවල පිහිටුවා ඇති තීරු බදු නිදහස් විදේශීය මත්පැන් අලෙවිසැල්වල කටයුතු පිළිබඳව වගකිවයුතු පාර්ශවයන්ගේ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. මේ හේතුවෙන් තීරු බදු රහිත විදේශ මත්පැන් වෙළඳපළට පැමිණීමත් ඒ තුළින් දේශීය මත්පැන් මත රජයට අය විය යුතු බදු ආදායමට සිදු වන බලපෑමත් පිළිබඳව විගණනය විසින් පෙන්වා දී තිබුණ ද තත්ත්වය නිවැරදි කිරීම සඳහා විධිමත් පියවර ගෙන තිබුණු බව විගණනයේදී තහවුරු වී නොතිබුණි.

- ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ ඇතුළත් බහාලුම් විධිමත් පරීක්ෂාවකට ලක් නොවන බව ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණි. ආනයනික භාණ්ඩ ඇතුළත් බහාලුම් ගැඹුරු පරීක්ෂාවකට ලක් නොවීම හේතුවෙන්,

  - නීති විරෝධී මත් කුඩු වැනි ආනයනයන් සිදු කිරීම,
  - ප්‍රකාශ නොකළ භාණ්ඩ ආනයනය කිරීම තුළින් බදු වංචා සිදු කිරීම,
  - ප්‍රකාශ කළ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් භාණ්ඩ ආනයනය කර රේගු බදු වංචා කිරීම,
  - වැරදි වර්ගීකරණ අංකයන් යටතේ භාණ්ඩ ආනයනය කර බදු අක්‍රමිකතාවල නිරත වීම,

- ප්‍රකාශ කළ භාණ්ඩ වෙනුවට වෙනත් භාණ්ඩ අනයනය කිරීම,
- නියමිත ප්‍රමිතියෙන් තොර භාණ්ඩ ආනයනය කිරීම,
- භාණ්ඩවල පැවතිය යුතු උපාංග අඩුවෙන් හෝ වැඩියෙන් යොදා භාණ්ඩ ආනයනය කිරීම,

යනාදී රේගු වැරදි ගණනාවක් සිදු කරන බව රේගු නිලධාරීන්ගේ විමර්ශන තුළින්ම තහවුරු වී ඇත. එමනිසා දැනට පවත්නා පරීක්ෂණ ක්‍රමවේදය වඩාත් විධිමත් විය යුතු බව පෙන්වා දිය යුතු වේ.

නැව් බඩු පරීක්ෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණු අතර 2016 වර්ෂයේ දී ආනයනික භාණ්ඩ ඇතුළත් බහාලුම් 203,712 ක් පරික්ෂා කිරීම සඳහා අදාළ අංශ වෙත අනුයුක්ත කර තිබුණු නිලධාරීන් සංඛ්‍යාව 101 ක් වී තිබුණි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- බදු කරුවන්ගෙන් අය විය යුතුව පවතින හිඟ බදු මුදල් කාලීනව නිරවුල් කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට අය විය යුතුව පැවති හිඟ බදු ආදායම රු.මිලියන 295,296 ක් වී තිබුණි. විගණනයට ලබා දුන් තොරතුරු අනුව, මෙම හිඟ බදු මුදල්වලින් බදු අභියාචනා හා අධිකරණමය කටයුතු සිදු නොවන රු. මිලියන 85,708 ක් කඩිනමින් නිරවුල් කර ගැනීමේ හැකියාව පැවතියද, එයද නිරවුල් කර නොතිබුණි.

- එකතු කිරීමේ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සම්බන්ධයෙන් බදු කරුවන් විසින් ඉදිරිපත් කළ බදු වාර්තා මත මුදල් ගෙවා නොතිබුණ අවස්ථාවලදී පරිගණක පද්ධතිය ඇසුරින් ස්වයංක්‍රීයව තක්සේරු වාර්තා නිකුත් කර හිඟ බදු ලෙස වාර්තා කිරීමත්, දඩ මුදල් ගණනය කිරීමේත් ක්‍රමවේදයක් 2012 මාර්තු 31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණු අතර 2012 අප්‍රේල් 01 දින සිට එම ක්‍රමවේදය නතර කර තිබුණි. ඒ හේතුවෙන් එකතු කළ අගය මත බද්දට සහ ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව 2012 අප්‍රේල් 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වූ බදු කාල පරිච්ඡේදය තුළ බදුකරුවන් විසින් ඉදිරිපත් කළ එකතුව රු.මිලියන 15,283 ක බදු වාර්තා සඳහා මුදල් ගෙවා නොතිබුණි. ඊට අදාළව තක්සේරු වාර්තා නිකුත් වී නොතිබුණි. ඒ අනුව මෙම හිඟ බදු මුදල හා ඒ මත ගණනය කළ රු.මිලියන 9,238 ක දඩ මුදලක්ද වශයෙන් එකතුව රු.මිලියන 24,521 ක හිඟ ශේෂයක් 2016 දෙසැම්බර් 31 දිනටත් දෙපාර්තමේන්තුව විසින් අය කර ගෙන නොතිබුණු අතර එය හිඟ බදු ලෙස වාර්තා කිරීමට හෝ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට වාර්ෂිකව සැපිරිය යුතු අතිරේක බදු රැස් කිරීමේ ඉලක්ක ලබා දී තිබුණද ඇතැම් නිලධාරීන් අදාළ ඉලක්ක සපුරා නොතිබුණු බව අදාළ වාර්තා අනුව තහවුරු විය. මෙම ඉලක්කයන් දෙපාර්තමේන්තුවේ දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා ද ප්‍රධාන වශයෙන් පාදක කර ගෙන තිබුණි. 2014 , 2015 සහ 2016 වර්ෂවලට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරික්ෂාවේදී එසේ

සම්පූර්ණ නොකළ ඉලක්කවල වටිනාකම හෙවත් අතිරේක බදු ලෙස රාජ්‍ය ආදායමට එකතු නොවූ මුදල රු.මිලියන 4,652 ක් විය. කෙසේ වුවද නිලධාරීන් දිරි දීමනා ලබා ගැනීමේදී මෙම ඉලක්ක සම්පූර්ණ කර තිබුණු බව වාර්තා කර දිරි දීමනා ද ලබා ගෙන තිබුණි.

- දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව පැහැර හරින ලද බදු මුදල්, මහේස්ත්‍රාත්වරයෙකුගේ තීරණය මත පමණක් වාරික වශයෙන් අය කර ගැනීමේ හැකියාව ඇත. එහෙත් ඊට පටහැනිව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංශ හා ප්‍රාදේශීය කාර්යාල 35 ක් විසින් 2016 මැයි මාසය වන විට රු.මිලියන 8,914 ක හිඟ බදු මුදල් වාරික වශයෙන් ගෙවීම සඳහා බදු කරුවන් 918 දෙනෙකුට ඉඩ සලසා දී තිබුණි. මෙසේ රාජ්‍ය ආදායම කාලීනව එක් රැස් නොකිරීම රාජ්‍ය ආදායම් කළමනාකරණයට අහිතකර ලෙස බලපා තිබුණි.

- බදු කරුවන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබා දෙනු ලබන චෙක්පත් අගරුවීමේ ප්‍රවණතාව වාර්ෂිකව ඉහළ යමින් පැවතියද එය නිවැරදි කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ අතර අගරු වූ චෙක්පත් සඳහා මුදල් අය කර ගැනීමේදීද මන්දගාමී ස්වරූපයෙන් කටයුතු කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. 2016 දෙසැම්බර් 31 වන දින වන විට එලෙස අගරු වී පැවති චෙක්පත් සංඛ්‍යාව 5,936 ක් වූ අතර ඒවායේ වටිනාකම රු.මිලියන 1,976 ක් වී තිබුණි.

- දෙපාර්තමේන්තුව තුළ නීති අංශයක් වෙනමම ස්ථාපිතව පැවතියද, එම අංශය මඟින් ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල පවතින හිඟ බදුවලට අදාළ නඩු පිළිබඳව සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් පියවරක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් පවරා ඇති ඇතැම් නඩු විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර පවරා ඇති ඒවා දැයි තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නීති අංශයේ නොතිබුණි. තවද, ප්‍රාදේශීය කාර්යාල විසින් පවරා ඇති බව වාර්තා කර තිබුණු ඇතැම් නඩු තථ්‍ය වශයෙන්ම පැවරූ නඩු බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නීති අංශයේ නොතිබුණි. එම නඩු සම්බන්ධයෙන් ලබා දී තිබුණු නඩු තීන්දු අනුව, හිඟ බදු මුදල් නියමානුකූලව අදාළ පාර්ශවයන් විසින් ගෙවන්නේ ද යන්න පිළිබඳ පසු විපරම් කටයුතු ද නීති අංශය විසින් මෙහෙයවා නොතිබුණි. ලබාගත හැකි වූ තොරතුරු අනුව, එසේ පවරා ඇති නඩු 413 කට අදාළව පමණක් අය විය යුතුව පැවති හිඟ බදු මුදල් ප්‍රමාණය රු.මිලියන 1,771 ක් වී තිබුණි.

- දෙපාර්තමේන්තුව වෙත ලැබෙන බදු අභියාචනා සම්බන්ධයෙන් කඩිනම් පියවර නොගැනීම නිසා රජයට ලැබිය යුතු බදු ආදායම් කාලීනව නොලැබෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව, දෙපාර්තමේන්තුව යටතේ ඇති මහා පරිමාණ බදු ගෙවන්නන්ගේ අංශ 6 සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී 2012/13 වර්ෂයේ සිට 2014/15 වර්ෂය දක්වා වූ තක්සේරු වර්ෂ 3 කට අදාළව ලැබී තිබුණු බදු අභියාචනා 594 කින් 9 ක් පමණක් විසඳා ඇති බව වාර්තාවී තිබුණි. ලබාගත හැකි වූ තොරතුරු අනුව ලැබී ඇති අභියාචනාවල වටිනාකම රු.මිලියන 53,804 ක් වූ අතර විසඳා තිබුණු අභියාචනාවල වටිනාකම රු.මිලියන 67 ක් වී තිබුණි.

- පාර්ලිමේන්තුව මගින් නීතිගත කර ඇති ඇතැම් අණ පනත්වල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර නොගැනීම නිසා රජයට කාලීනව ලැබිය යුතු බදු මුදල් අහිමි වීමක් හෝ ප්‍රමාද වීමක් සිදු වන අවස්ථා පැවැතුණි. ඒ අනුව, 2015 අංක 10 දරන මුදල් පනත ප්‍රකාරව කැසිනෝ ව්‍යාපාරය වෙනුවෙන් අය විය යුතුව පැවති රු.මිලියන 3,490 ක බදු ආදායමක් නොලැබී පැවති අතර විධිවිධාන ප්‍රකාරව අය කළ යුතු මන්දිර බද්ද සඳහා අවශ්‍ය නීති සකසා නොතිබුණි.

- රාජ්‍ය ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් වාර්ෂිකව ඉදිරිපත් කරන අයවැය යෝජනා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි. 2016 වර්ෂයේ දී රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් අයවැය යෝජනා 18 ක් ඉදිරිපත්ව තිබුණද, එයින් ක්‍රියාත්මක මට්ටමක යෝජනා 4 ක් පමණක් පැවැතුණි. ඒ අනුව, යෝජිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ දී වාර්ෂික අයවැය යෝජනා මගින් ප්‍රමාණවත් දායකත්වයක් සිදු වී නොතිබුණි.

සුරා බදු දෙපාර්තමේන්තුව

සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- ශ්‍රී ලංකාව තුල සැර මත්පැන් පරිභෝජනය කිරීම අධෛර්යමත් කිරීම සඳහා රජය විසින් මත්පැන් මත ඉහළ බදු අනුපාතයන් පනවා තිබුණද, ලබා ගත හැකි වූ තොරතුරු අනුව සැර මත්පැන් නිෂ්පාදනය හා පරිභෝජනය අඛණ්ඩව ඉහළ යමින් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව 2014 වර්ෂයේ ලීටර් මිලියන 43.9 ක්ව පැවති සැර මත්පැන් නිෂ්පාදනය 2015 වර්ෂයේ දී ලීටර් මිලියන 51.8 ක් දක්වා ද, නැවත එය 2016 වර්ෂයේ දී ලීටර් මිලියන 55.5 දක්වා ද වැඩි වී තිබුණි. එසේම 2015 වර්ෂයේදී රු.මිලියන 105,263 ක්ව පැවති සුරා බදු ආදායම 2016 වර්ෂයේදී රු.මිලියන 120,238 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සැර මත්පැන්වලට අය කරන බදු අනුපාත ඉතා සීඝ්‍රලෙස ඉහළ නංවා තිබියදී මත්පැන් පරිභෝජනයේ ඉහළ යාමක් වාර්තාවීමට බලපා ඇති හේතු පිළිබඳ ප්‍රමාණවත් විමර්ශනයක් දෙපාර්තමේන්තුවෙන් සිදු කර නොතිබුණි.

- සුරා බදු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තා අනුව අය විය යුතු ප්‍රමාද ගාස්තු සහිත මුළු හිඟ බදු ආදායම රු.මිලියන 2,545 ක් වී තිබුණි. එම හිඟ බදු ආදායමින් සියයට 57 ක්ම අවුරුදු 5 ට වැඩි කාලයක සිට පැවත එන හිඟ බදු ආදායම්වී තිබුණි.

- පහසුවෙන් හා නිවැරදිව සුරා බදු ආදායම එකතු කිරීමට හා ගිණුම් ගත කිරීමට සුදුසු පරිගණක ජාල පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් මත්පැන් අපනයනයේ දී ලබා දෙනු ලබන අපනයන බදු ප්‍රතිදාන ලබාදීම සඳහා පදනම් කර ගනු ලබන්නේ අපනයනකරු විසින් ඉදිරිපත් කරනු ලබන රේගු ලියකියවිලි පමණි. මේ අනුව සත්‍ය වශයෙන්ම අපනයනය කළ ප්‍රමාණය

තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නො තිබුණි.

- 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම සිගරට්ටුවක්ම, සුරුට්ටුවක්ම, බීඩියක්ම හා සෑම පයිප්ප දුම් කොළ කිලෝග්‍රෑමයක් සඳහාම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ඒ ඒ අනු ප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අය කරනු ලැබිය යුතුව තිබුණි. දෙපාර්තමේන්තුව විසින් දුම්කොළ බද්ද අය කරනු ලබන්නේ සිගරට් සඳහා පමණක් විය. මේ අනුව දෙපාර්තමේන්තුව විසින් දුම් කොළ බදු පනතට අනුකූලව කටයුතු කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

- බීඩි නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන බීඩි කොළ වර්ගයේ නිවැරදිතාව තහවුරු කර ගැනීමටද ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි.

- සිගරට් අපනයනය සඳහා වූ බලපත්‍ර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර අපනයනය කළ බවට වාර්තා කර ඇති ප්‍රමාණය සත්‍ය වශයෙන් අපනයනය කර තිබුණු බව තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි.

- මත්පැන් නිෂ්පාදන සමාගම්වලට අනුයුක්ත කර ඇති නිලධාරීන් මඟින් සිදු කරනු ලබන ආදායම් රැස් කිරීමේ කාර්ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අඛණ්ඩ සෝදිසි පරීක්ෂාවකට ලක් කර නොතිබුණි.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- දෙපාර්තමේන්තුවේ වර්තමාන පරිගණක පද්ධතිය පිළිබඳව පෞද්ගලික සමාගමක් විසින් සිදු කළ අධ්‍යනයකින් අනතුරුව ඊ මෝටරින් ව්‍යාපෘතිය පිළිබඳ මූලික යෝජනාව ඉදිරිපත් කර තිබුණු අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 741 ක ප්‍රතිපාදන සලසා තිබුණි. තවද, 2012 ඔක්තෝබර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ද මෙම කාර්යය සඳහා සුදුසු සමාගමක් විවෘත තරගකාරී ලංසු ක්‍රියාවලිය යටතේ තෝරා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.

  පරිගණක පද්ධතියේ පවත්නා දුර්වලතා මඟ හරවා ගනිමින් විශාල වශයෙන් සිදු වන වැරදි, වංචා හා අක්‍රමිකතා වැළැක්වීමට/ අනාවරණය කර ගැනීමට හැකි වන පරිදි නවීන තාක්ෂණය යොදාගැනීමට අත්‍යාවශ්‍ය හා අනිවාර්ය කරුණක් වුවත්, මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා පිළිගත හැකි කාර්යසාධනයක් ළඟා කර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි. මේ හේතුවෙන් පවත්නා පරිගණක පද්ධතියේ තොරතුරු සාවද්‍ය ලෙස වෙනස් කිරීම, රේගු සටහන් කර වෙනස් කර සාවද්‍ය ලියාපදිංචි සිදු කිරීම

ඇතුළුව විවිධ අක්‍රමික ක්‍රියාවන් දිගින් දිගටම සිදු වන බවත්/සිදු කරන බවත් එමඟින් විශාල ආදායමක් රජයට අහිමි වන බවත් නිරීක්ෂණය විය.

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා BOT පදනම යටතේ වර්ෂ 7 ක කාලයකට 2009 මාර්තු 27 දින සිට බල පැවැත්වෙන පරිදි පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව එහි කටයුතු 2016 මාර්තු 26 දින නැවත දෙපාර්තමේන්තුවට පවරා ගෙන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යා යුතුව තිබුණි. නමුත් එසේ නොකර 2016 මාර්තු 26 දින දක්වා කාලය දීර්ඝ කර නැවත එම කාලය 2017 මාර්තු 26 දින සිට 2018 මාර්තු 26 දින දක්වා දීර්ඝ කර තිබුණි. මේ නිසා තාක්ෂණික දියුණුව නිසා ඇති වන පිරිවැය වාසිය රියදුරු බලපත්‍රලාභීන්ට නොලැබෙන බවත්, රාජ්‍ය ආදායමට ලැබිය යුතු ආදායමක්, පෞද්ගලික පාර්ශවයන් විසින් භුක්ති විඳින බවත් නිරීක්ෂණය විය. මෙම ගිවිසුම යටතේ 2016 වර්ෂයේ රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා පමණක් අදාළ කොන්ත්‍රාත්කරුට රු.මිලියන 968 ක් ගෙවා තිබුණි.

- දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහනවලට අංක තහඩු මුද්‍රණයට අදාළ කොන්ත්‍රාත්තුව 2010 මැයි 01 දින සිට 2015 අප්‍රේල් 30 දින දක්වා පුද්ගලික කොන්ත්‍රාත් සමාගමකට පිරිනමා තිබුණි. නමුත් 2015 අප්‍රේල් 30 දිනෙන් පසුව නැවත මිල ගණන් කැඳවා ඒ සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගත යුතු වුවත්, එසේ නොකර පැරණි කොන්ත්‍රාත්කරුගේ සේවා කාලය 2015 මැයි 01 දින සිට 2017 ඔක්තෝබර් 31 දින දක්වා අවස්ථා කිහිපයක දී විටින් විට පැරණි මිලටම දීර්ඝ කර තිබුණි.මේ නිසා තාක්ෂණික දියුණුව හේතුවෙන් අඩු මිලට අංක තහඩු මුද්‍රණය කරවා ගැනීමෙන් ඇතිවෙන පිරිවැය වාසිය ලබා ගැනීමේ අවස්ථාව වාහන හිමිකරුවන්ට අහිමි වී තිබුණි. වර්තමාන කොන්ත්‍රාත්කරු අය කරන මිලට වඩා එක් අංක තහඩුවක් වෙනුවෙන් රු.300 ක් අඩුවෙන් අංක තහඩු සැපයීමට මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහතික කිරීම සහ ගුවන්, මුහුදු හා ගොඩබිම ආරක්ෂාව පවත්වා ගෙනයාම මෙම ක්ෂේත්‍රයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කිරීම සඳහා පහත සඳහන් කාර්යභාරය ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු පහක් හා ව්‍යවස්ථාපිත ආයතන අටක් විසින් ඉටු කළ යුතුව ඇත.

- ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ජාතික ආරක්ෂාව සහතික කිරීම.
- ගුවන්, මුහුදු සහ ගොඩබිම කළාපයන්හි ආරක්ෂාව පවත්වා ගෙන යාම.
- ජාතික ආරක්ෂාව හා සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙහෙය වීම.
- ශ්‍රී ලංකාවේ අභිමානය හා ප්‍රෞඩත්වය පවත්වා ගෙන යාම සඳහා සහායවීම.
- ආරක්ෂක කටයුතු සම්බන්ධ වැඩසටහන් හා ව්‍යාපෘතීන් පිළිබඳව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පොලිසිය වෙත සහායවීම.
- ජීවිත හා දේපළ වල ආරක්ෂාව සහතික කිරීම.
- කුඩා ප්‍රමාණයේ ගිනි අවි නියාමනය කිරීම.

ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වූ ආයතන සම්බන්ධයෙන්, විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම

1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් 2000 වර්ෂයෙන් පසු කිසිදු සංශෝධනයක් සිදුකර නොතිබුණි. ගිනිඅවි බලපත්‍ර අළුත්කර නොගැනීම හේතුවෙන් උද්ගතවී තිබුණු රු.මිලියන 1.26 ක් වූ හිඟ බලපත්‍ර ආදායම ද ඇතුළුව 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු. මිලියන 2.58 ක් වී තිබුණි. ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් පනත්වල දක්වා ඇති නියමයන් අනුව ආරක්ෂක අමාත්‍යාංශය විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් 22 ක් සම්බන්ධයෙන් සම්මත කර ගන්නා ලද අභ්‍යන්තර කාර්ය පටිපාටි සංග්‍රහයන් හෝ අභ්‍යන්තර චක්‍රලේඛ මඟින් විෂය භාර නිලධාරීන් සන්නිවේදනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අදාල අංශ තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

ජාතික ආරක්ෂාවට හා විවිධ සමාජ විරෝධී ක්‍රියා සම්බන්ධව සිදුවන ක්‍රියාකාරකම්වලට එරෙහිව අමාත්‍යාංශය යටතේ වූ ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වූ කාර්යයන් 03 ක් වෙනුවෙන් නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම් මගින් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 450 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර වර්ෂය අවසානය වන විට ඉන් දරා තිබුණු වියදම රු.මිලියන 244 ක් විය. තවද, විදේශ ප්‍රදාන හා ප්‍රතිපූර්ණය කලහැකි විදේශ ප්‍රදාන යටතේ වූ මෙරිටයිම් ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදන වලින් රු. මිලියන 8.50 ක් මු.රෙ. 66 මගින් මෙරිටයිම් ආරක්ෂක ධාරිතා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය නම් වෙනත් ව්‍යාපෘතියක් සඳහා මාරු කරගෙන තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම ව්‍යාපෘතිය යටතේ කිසිදු වියදමක් දරා නොතිබුණි. අයවැයගත ව්‍යාපෘතියක ප්‍රතිපාදන, අවශ්‍යතාවයකින් තොරව වෙනත් ව්‍යාපෘතියක් සඳහා විධිමත් සැලසුමකින්

තොරව මාරු කර තිබුණු බව මේ අනුව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා අධි ප්‍රතිපාදන සැලසීම

ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා වැය විෂයයන් 37 ක් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඉන්දියානු ආනයන හා අපනයන බැංකු ණයක් මත 2013 වර්ෂයේදී පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 133.10 ක් වූ නවීන වර්ගයේ සාගර මුර යාත්‍රා දෙකක් මිලදී ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. යාත්‍රා නිෂ්පාදන සමාගම වෙත කළ යුතු ගෙවීම් වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රු.මිලියන 7,040 ක ප්‍රතිපාදන අයදුම් කර තිබුණු නමුත්, 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් එම වැය විෂය යටතේ රු.මිලියන 8,145 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,355 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකළ ආයෝජනයට ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් මෙන්ම අරමුදල් උපයෝගි කර ගනිමින් ගුවන් හමුදාව සතු පෞද්ගලික ආයතනයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන හෙලිටුවර්ස් සමාගම 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වසර 7 ක කාලයක් තුල රු. මිලියන 43.7 ක ලාභයක් ලබා ඇතත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකල ආයෝජනයට ප්‍රතිලාභ වශයෙන් කිසිඳු ලාභාංශයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි.

අභ්‍යන්තර අරමුදල් මගින් උත්පාදනය කරන ආදායම්

2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදාපතිගේ හා ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය අනුව, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් 97 ක් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් කරනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(අ) ව්‍යවස්ථාව අනුව කිසියම් ලිඛිත නීතියක් යටතේ දක්වා නොමැති, ජනරජයට ලැබෙන සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, එම අරමුදල් මගින් උත්පාදනය කරන ආදායම රාජ්‍ය ආදායමට එකතු කර නොතිබුණි.

සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සඳහා ශික්ෂණ රෝහල ඉදිකිරීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් ණය මුදල වෙනුවෙන් පොලිය ගෙවීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු. මිලියන 4,554.31 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 4,486.39 ක් ඒ වෙනුවෙන් වැය කර තිබුණි. ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 67.92 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ අනෙකුත් කටයුතු සඳහා වියදම් කර තිබුණි.

ආරක්ෂක සේවා ගොඩනැගිල්ල ඉදිකිරීම

ශ්‍රවනාගාරය, සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල හා ත්‍රිවිධ හමුදා

සාමාජිකයන්ගේ නේවාසික ගොඩනැගිලි ආදියෙන් සමන්විතව වර්ග අඩි 4,700,000 ක් වූ මහල් 10 කින් යුතු ගොඩනැගිලි 08 කින් සමන්විතව අකුරේගොඩ ප්‍රදේශයේ ඉදිකරමින් පවතින ආරක්ෂක සේවා මූලස්ථානය ගොඩනැගිල්ල සන්නද්ධ සේවා නිලධාරීන් 10,250 කට කාර්යාල ඉඩ පහසුකම් හා 6,850 කට නේවාසික පහසුකම් සැපයීමට අරමුණු කරගෙන සැලැසුම් කර තිබුණි. මේ සඳහා ශ්‍රම දායකත්වය ත්‍රිවිධ හමුදා නිලධාරීන් විසින් සපයමින් පැවතුණි. 2012 වර්ෂයේදී කටයුතු ආරම්භ කර තිබුණු මෙම ඉදිකිරීම් සඳහා රු.බිලියන 25 ක ඇස්තමේනතුව පසු කාලීනව විෂය පථය සංශෝධනය වීම හේතුවෙන් රු.බිලියන 53.29 ක් දක්වා වැඩි කර තිබුණි. නව පිරිවැය ඇස්තමේන්තුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2016 ඔක්තෝම්බර් 04 දින ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ කර පහත දක්වා ඇත.

- සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු රු.මිලියන 5,546 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,987 ක් හෙවත් සියයට 53 ක ප්‍රමාණයක් පමණක් උපයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1,869ක ඉදිරියට ගෙන එන ලද බැදීම් පැවති බව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වාර්තා කර තිබුණි.

- ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා ලංසු ලියවිලි සකස් කිරීමේ ප්‍රමාදය, තාක්ෂණික ඇගයීම් කටයුතුවල ප්‍රමාදය හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යයන් 21 ක් දින 244 ක සිට දින 1081 ක් දක්වා කාල පරාසයකින් ප්‍රමාද වී තිබුණි. තවද, වගකීම් කාලය දීර්ඝ කිරීමට සිදුවීම හේතුවෙන් සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් කාලය දීර්ඝ කිරීමේ ඉල්ලීම් හා මිල උච්චාවචනයන් සඳහා රු.මිලියන 222.88 ක අතිරේක මුදලක් සඳහා වූ ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි.

පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල

මහල් 20 කින් සමන්විත පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල 2012 ජූලි මාසයේ සිට වර්ෂ 03 කින් ඉදිකිරීම් නිම කිරීමේ පදනම මත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ සඳහා රාජ්‍ය බැංකු 02 කින් හා පෞද්ගලික බැංකු 02 කින් 2015 අගෝස්තු මාසයේ සිට වර්ෂ 15 කින් ආපසු ගෙවීමේ පදනම මත රු.මිලියන 7,550 ක ණයක් 2012 වර්ෂයේදී ලබාගෙන තිබුණි. මෙම ඉදිකිරීම් කටයුතු 2015 ජූලි 31 දින වන විට අවසන් කර තිබුණි. මේ සම්බන්ධව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ කර පහත දක්වා ඇත.

- අදාළ ණය මුදල ආපසු ගෙවීම් ආරම්භ වූ 2015 අගෝස්තු 01 දිනෙන් පසුවද, තව දුරටත් රු.මිලියන 337.71 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ අනුව අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු ණය වාරිකය රු.මිලියන 267.61 ක සිට රු.මිලියන 278.87 ක් දක්වා ද, පොලී ප්‍රතිශතය සියයට 8 ක සිට සියයට 13.12 ක් දක්වා පරාසයකින් ද වැඩි වී තිබුණි.

- ගොඩනැගිල්ලේ අයිතිය පැවරීම හා කුලී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පත්කර තිබුණු කමිටුව විසින් ගොඩනැඟිල්ලේ ඇස්තමේන්තුගත නඩත්තු වියදම වූ රු.මිලියන 11,597.31 ක් පමණක් පදනම් කරගෙන වර්ග අඩියක් සඳහා රු.37.65 ක කුලී මුදලක් අයකිරීමට තීරණය කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිල්ලේ මහල් 16 ක් ආයතන 05 ක් විසින් කුලී පදනම මත ලබා ගෙන තිබුණද, 2016 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු ආයතනයක් සමඟ ගිවිසුම් අත්සන් කිරීම හෝ කුලී මුදල් අය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලයක් පිහිටුවීම

ආරක්ෂක අමාත්‍යාංශය විසින් ත්‍රිවිධ හමුදා අතර පවතින නවීන සන්නිවේදන පද්ධතියට සමාන අයුරින් අඛන්ඩව ආරක්ෂකාරී හා විකල්ප සන්නිවේදන ජාලයක් සැපයීම අරමුණු කරගෙන උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලයක් පිහිටුවීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සාරාංශ කර පහත දක්වා ඇත.

- මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1,192.00 ක් වී තිබුණත්, එය රු.මිලියන 1,297.25 ක් දක්වා සංශෝධනය කර තිබුණි. ඒ සඳහා අදාළ පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

- සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු රු.මිලියන 590 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 20.32 ක් පමණක් අපේක්ෂිත ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් උපයෝගී කරගෙන තිබුණි.

- 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මධ්‍යකාලීන වියදම් රාමුවක් තුළ ව්‍යාපෘතියේ සැලැසුම් කළ කාර්යය නිම කිරීමට අපේක්ෂිතව තිබුණද, සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීම සහ භූමි පරීක්ෂණ කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් කුළුණු ඉදිකිරීමේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී තිබුණි. ඒ හේතුවෙන් මයික්‍රො තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධති මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියද ප්‍රමාද වී තිබුණි. තවද, මේ සඳහා මිලදී ගෙන තිබුණු ජෙනරේටර් 22 ක් අතරින් ජෙනරේටර් 12 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, නියමිත ස්ථානවල ස්ථානගත කර නොතිබුණි.

සාලාව කඳවුරු භූමිය තුළ පිහිටි අවි ගබඩාවේ ඇති වූ පිපිරීමෙන් සිදු වූ අලාභහානිය

2016 ජුනි 05 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාලාව කඳවුර තුළ පිහිටි අවිගබඩාවේ ඇති වූ පිපිරීමෙන් සිදුවූ අලාභයන් සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) යටතේ සිදුකරන ලද පරීක්ෂණයට අනුව ඇස්තමේන්තු ගත දළ අලාභය රු.මිලියන 12,735.45 ක් බව ප්‍රාරම්භක වාර්තාව අනුව අනාවරණය විය. ආරක්ෂක අමාත්‍යංශය විසින් මෙම සිදුවීම සම්බන්ධව පරීක්ෂාකර වාර්තා කිරීමට පත් කර තිබුණු මූලික පරීක්ෂණ උසාවි මණ්ඩලය විසින් පරීක්ෂා කිරීම් කටයුතු 2017 අප්‍රේල් 30 දින වන විටත් සිදුකරමින් පැවති හෙයින් අලාභය නිශ්චිත වශයෙන් ප්‍රකාශයට පත් කර නොතිබුණි.

ෆාරා III නෞකාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් යකඩ වශයෙන් අලෙවි කිරීම

උතුරු ප්‍රදේශය ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදවා ගැනීමේ මානුෂික මෙහෙයුමේදී වෙල්ලමුල්ලීවයික්කාල් මුහුදු තීරයේදී හමුවී තිබුණු අබලන් තත්ත්වයේ පැවති ෆාරා III නෞකාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් යකඩ වශයෙන් අලෙවි කිරීමට කටයුතු කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 80.30 ක් ලෙස මිල ගණන් ඉදිරිපත් කර තිබුණු දේශීය ලංසුකරුවකු වෙත ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු විසින් කපා ඉවත් කරගත් යකඩ ප්‍රමාණය වෙනුවෙන්

රු.මිලියන 47 ක් ගෙවා තිබූ අතර එම කාර්යය අතර මැද නවතා තිබුණි. නැව විකිණීමෙන් ලැබී තිබුණු මුදලින් රු.මිලියන 15 ක් අපි වෙනුවෙන් අපි අරමුදලටද, ඉතිරි රු.මිලියන.32 යුද්ධ හමුදා සුභසාධක අරමුදලටද, බැරකර තිබුණි. යුද්ධ හමුදා සුභසාධක අරමුදලට බැරකර තිබුණු මුදල විගණනය විසින් පෙන්වාදීමෙන් පසුව රජයේ ආදායමට 2016 නොවැම්බර් 17 දින බැරකර තිබුණි.

මුහුදු බත් වූ නෞකාවේ ජලය මතුපිට ඇති කොටස් කපා ඉවත් කිරීමට වඩා ජලයට යටවූ කොටස් කපා ඉවත් කිරීම සඳහා භාවිතා කළ යුතුව පැවති ඉහළ පිරිවැයක් සහිත තාක්ෂණික ක්‍රම පිළිබඳව සැළකිල්ලට ගෙන ඊට අදාළ කොන්දේසි ගිවිසුමේ ඇතුළත් නොකිරීම හේතුවෙන් පහසුවෙන් කපා ඉවත් කළහැකි කොටස් ඉවත් කර ගෙන අපහසු කොටස් අත්හැර දැමීමට ගැණුම්කරුට හැකි වී තිබුණි. ඉතිරි කොටස් ඉවත් කිරීමට වඩා එලෙසම තැබීමෙන් මත්ස්‍ය සම්පත බෝ වීම තුළින් ආර්ථිකමය වශයෙන් වාසිදායක වන බැවින් නෞකාවේ ඉතිරි කොටස එලෙසම තබා ඇති බවට පසුව කරුණු දක්වා තිබුණි. ඒ සඳහා අදාළ ආයතන වෙතින් ලබා ගත යුතු පාරිසරික වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණු නමුත්, 2017 ජුනි 30 දින වන විටත් එම වාර්තා ලබාගෙන නොතිබුණි.

වත්කම් පවරා ගැනීම හා අපහරණය කිරීම

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 1995 වර්ෂයේ සිට 1997 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ මිලදී ගෙන තිබුණු, පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණු පිළිවෙලින් රු.මිලියන 239.97 ක් වටිනා මැෂින් තුවක්කු (Machine Gun) 101 ක් හා රු.මිලියන 47.97 ක් වටිනා ගුවන් යානා තුවක්කුවක් (Anti – Aircraft Gun) පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ ලබාගෙන අපහරණය කිරීමට කටයුතු නොකර නිෂ්කාර්ය ලෙස ගබඩා කර තිබුණි. තවද, 1999 වර්ෂයේදී ස්ටර්ලීන් පවුම් මිලියන 2.03 ක් ගෙවා මිලදීගත් නෞකාවක් වර්ෂ 03 කට අධික කාලයක සිට වයඹ නාවික විධානයේ ගර්භිත තත්ත්වයේ පවතින අතර එය අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වෙනත් ආයතන සතු ඉඩම් අක්කර 5,821 ක්, ගොඩනැගිලි 219 ක් හා මෝටර් වාහන 55 ක් විධිමත් පරිදි පවරා නොගෙන ශ්‍රී ලංකා නාවික හමුදාවේ කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි.

මෝටර් වාහන නඩත්තුව, නවීකරණය හා අළුත්වැඩියාව

වවුනියාව ගුවන් හමුදා මූලික කඳවුරේ 2එම්ටීආර් සහ ඕඩබ්ලිව් ඒකකය මඟින් මෝටර් වාහන නඩත්තු කිරීම්, නවීකරණය හා අළුත්වැඩියා කර නැවත සකස් කිරීම සිදු කරනු ලබයි. මෙම ඒකකය ස්ථාපනය කර වර්ෂ 2 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණු නමුත් 2016 දෙසැම්බර් 02 දින වන විට අළුත්වැඩියාව සඳහා මෝටර් වාහන 55 ක් ලැබී තිබුණු අතර, ඉන් මෝටර් වාහන 19 ක් පමණක් අළුත්වැඩියා කටයුතු නිම කර ආපසු භාර දී තිබුණි. එසේම එහි කටයුතු ක්‍රමානුකූලව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය වන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 33 ක් පැවැතුණි. මේ හේතුවෙන් මෝටර් වාහන එන්ජින් 10 ක් අළුත්වැඩියා කිරීමේ කටයුතු රු.මිලියන 4.74 ක පිරිවැයකට පෞද්ගලික ආයතනයක් වෙතට 2016 ජුනි 05 දින පවරා තිබුණි.

රාජ්‍ය ව්‍යවසායන්

රාජ්‍ය ව්‍යවසායන් යනු තම නමින් ගිවිසුම්ගත වීමට බලයක් සහිත, ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මූල්‍ය හා මෙහෙයුම් අධිකාරය පවරා ඇති සහ ලාභයක් සහිතව හෝ සම්පූර්ණ පිරිවැය ආවරණය කරගන්නා පරිදි සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ අනෙකුත් අස්ථිත්වයන්ට භාණ්ඩ හා සේවා විකිණීම් කරනු ලබන සහ රාජ්‍ය අංශයේ අස්ථිත්වයක් මගින් පාලනය වන ආයතනයක් ලෙස හැඳන්විය හැකිය. උපයෝගීතා සේවා සපයන වෙළෙඳ ව්‍යවසායන් සහ මූල්‍ය ආයතන වැනි මූල්‍ය ව්‍යවසායන් රාජ්‍ය ව්‍යවසායන් යටතට අයත් වේ. රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සමහරක් ප්‍රජා සේවා සැපයීම පිළිබඳව වගකීමක් සහිතව ඇතැම් පුද්ගලයන්ට සහ ජන කොටස්වලට හා සේවා මිල අයකිරීමකින් තොරව හෝ සැළකිය යුතු පරිදි අවම ගාස්තු පදනමක් මත භාණ්ඩ හා සේවා සැපයීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වුවත් සාමාන්‍යයෙන් ලාභයක් ඉපයීම සඳහා ක්‍රියාත්මක වේ.ඒ අනුව එහි වත්කම් මත ප්‍රතිලාභයක් ඉපැයීම අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය වේ. නියාමන, ප්‍රවර්ධනාත්මක හා අධ්‍යාපනික රාජ්‍ය ව්‍යවසායන් සම්ප්‍රදායානුකූලව වාණිජ අංශයන්ට අයත් නොවන අතර එම ව්‍යවසායන් ලාභ නොලබන සංවිධාන ලෙස සැලකෙන අතර, ලාභදායීත්වය හැර වෙනත් නිර්ණායකයන් භාවිතා කරමින් ඒවායේ කාර්යසාධනය පරික්ෂා කළ යුතු වේ. පහත සඳහන් ශීර්ෂයන් යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් පුළුල් ලෙස වර්ගීකරණය කළ හැක.

- විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්
- ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්
- රජය සතු සීමිත වගකීම් සමාගම්
- නියාමන හා අධීක්ෂණ ආයතන
- විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ වෙනත් පුහුණු ආයතන
- වෙනත් සංවර්ධන හා ලාභ නොලබන ආයතන

විදුලි බලය, ජලය, ඛනිජ තෙල් නිෂ්පාදිත, විදුලි සංදේශ හා ගුවන් ප්‍රවාහන, වරාය ආදී ආර්ථිකයේ උපාය මාර්ගිකව ඉතා වැදගත් ක්ෂේත්‍ර රාජ්‍ය ව්‍යවසායන් මගින් මෙහෙයවනු ලැබේ. ආර්ථිකයේ සමස්ත හිමිකම් සහ තරඟකාරිත්වය කෙරෙහි සියළු රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික පාලනය ඉතා වැදගත් වේ. 2016 දෙසැම්බර් 31 දිනට එක් එක් වර්ගයන්හි රජය සතු සීමිත වගකීම් සහිත සමාගම් හැර රාජ්‍ය ව්‍යවසායන් 344 ක මුළු වත්කම්වල සංයුතිය ඉකුත් වර්ෂය අවසානය සමඟ සසඳා පහත රූපසටහන 12 හි දැක්වේ.

රූපසටහන 12 - *2015 වර්ෂය සමඟ සසඳා 2016 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන්හි මුළු වත්කම්*

2016 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන්ට දළ වශයෙන් රු.බිලියන 55.4 ක රජයේ පුනරාවර්තන ප්‍රදාන ලබාදී තිබුණ ද, එය රජයේ මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 3.13 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ සංඛ්‍යාව පිළිවෙලින් රු.බිලියන 64.3 ක් සහ සියයට 3..84 ක් විය. මෙයට අතිරේකව ප්‍රාග්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී දළ වශයෙන් රු.බිලියන 230.2 ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබූ අතර එය රජයේ මුළු ප්‍රාග්ධන වියදමෙන් සියයට 17.24 ක් විය. ඉකුත් වර්ෂයට අනුරූපීව එම සංඛ්‍යා පිළිවෙලින් රු.බිලියන 212.6 ක් සහ සියයට 13.90 ක් විය.

කාර්යසාධනය ඇගයීම

රාජ්‍ය ව්‍යවසායන් විගණනය මූල්‍ය හා අනුකූලතා විගණනයට පමණක් සීමා නොවන අතර අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමතාවය, ආර්ථික බව හා ඵලදායීතාවය කෙරෙහි ද අවධානය කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය හා ඵලාදායීතාවය පිළිබඳ විගණනය සමහර ප්‍රමිතින් හා නිර්නායකයන් මත පදනම්ව සිදු කරනු ලැබේ. ලාභය කාර්යසාධනයේ ප්‍රධාන නිර්නායකය නොවන අතරම රාජ්‍ය අරමුදල් ආර්ථිකභාවයෙන් හා කාර්යක්ෂමව යොදා ගැනීමේ කළමනාකරණයේ කාර්යසාධනය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම වඩාත් ඵලදායී වේ. ව්‍යවසායෙන් ව්‍යවසායට අරමුණු වෙනස් වේ. විගණනයේ එක් ප්‍රමුඛ කාර්යයක් වනුයේ ව්‍යවසායක කාර්යසාධනය ඇගයීම සඳහා නිර්නායකය හඳුනාගැනීමයි. නිෂ්පාදන ව්‍යවසායක, උදාහරණයක් වශයෙන්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත් විට, අරමුණු සහ ආයෝජනයේ පදනම, ධාරිතාවය, පිරිවැය හා කාල සැලැසුම්, පරිභෝජන නියමයන්, ඉපැයීම්, ඵලදායීතාවය, පිරිවැය, ප්‍රතිලාභ අනුපාතය ආදිය කාර්යසාධනය මැනීමේ මිනුම් දඬු වේ. ව්‍යවසායක් වෙත ඇති දිගු හා කෙටි කාලීන ප්‍රාග්ධනය හා මෙහෙයුම් සැලැසුම් කාර්යසාධනය තක්සේරු කිරීමේ වෙනත් සමුද්දේශ ලක්ෂණයන් වේ.

භෞතික කාර්යසාධනය ඇගයීම අදාළ වන අවස්ථාවක ඒකකයක තක්සේරු කළ ධාරිතාවය පිළිගත හැකි මිණුම් ලකුණක් වේ. අනුපාතික ධාරිතාවය උපයෝජනය යනු අමු ද්‍රව්‍ය සහ උපයෝගීතා පරිභෝජනය සඳහා සම්මතයන් ඉපැයීම් හා ප්‍රතික්ෂේපිතයන්

මෙන්ම විධිමත් නඩත්තුව හා උපකරණ සේවා කිරීම සඳහා අවශ්‍යතාවයන් සමඟ තක්සේරු කිරීමයි. කාර්යසාධනය ඇගයීම සඳහා අනෙක් වැදගත් පදනම වන්නේ පිරිවැය කාර්යක්ෂමතාවයයි. ධාරිතා උපයෝජනය, පරිභෝජනයන්, ඵලදායීතාවය, ඉපයීම් ආදිය පිළිබඳ සම්මතයන් මත පදනම්ව ප්‍රමිති හා පිරිවැය ඉලක්කයන් තීරණය කරනු ලැබේ. ආයතනික පාලනය, සාමාන්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, ඉදිකිරීම් කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායයක් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අතර මෙම මාර්ගෝපදේශ ව්‍යවසායයක කාර්යසාධනය හා පද්ධති ඇගයීම් කිරීම සඳහා වෙනත් පදනමක් වේ. අභ්‍යන්තර හා බාහිර විශේෂඥයින් විසින් සිදුකරන වෙනත් තාක්ෂණික අධ්‍යයනයන් හා ප්‍රමිතීන් මෙම මාර්ගෝපදේශයට පදනම් වන වෙනත් නිර්නායකයන් වේ.

කාර්යසාධන විගණනය කාලීන අවශ්‍යතාවයකි. මූල්‍ය විගණයේදී මූල්‍ය පාලනය හා ගිණුම්වල නිවැරදිතාවය පිළිබඳ සහතිකවීමක් සිදුකරයි. නමුත් සම්පත් ආර්ථිකබවින්, කාර්යක්ෂම හා ඵලදායීව උපයෝජනය වීම පිළිබඳ පරීක්ෂා කිරීම කාර්යසාධන විගණනයෙන් අපේක්ෂා කෙරේ. මෙම සාධක තුනට අමතරව වර්තමානයේදී පරිසරාත්මක බලපෑම පිළිබඳවද පරීක්ෂා කරනු ලබයි. කාර්යසාධන විගණනය පිළිබඳව විවිධ නාමයන් භාවිත කරනු ලබයි.

- මුදලට අගය විගණනය
- කළමනාකරණ විගණනය
- මෙහෙයුම් විගණනය
- 3 "E" විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වර්තමාන විගණන වාර්තා තුළින් මූල්‍ය විගණනයට හා සමානවූ ස්ථානයක් කාර්යසාධන විගණනයටද ලබා දීමත් ඒ තුළින් රාජ්‍ය ව්‍යවසායන් වෙත ලබාදෙන සම්පත් හා අරමුදල් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් උපයෝජනය සිදුවූයේද යන්න පුළුල්ව විග්‍රහ කරනු ලබයි.

රාජ්‍ය ව්‍යවසායන්හි 2016 වර්ෂයේ නිකුත්කරන ලද විගණකාධිපති වාර්තා මගින් ඉකුත් වර්ෂයන්ට සාපේක්ෂව කාර්යසාධන විගණනය සඳහා වැදගත් ස්ථානයක් ලබාදෙන ලදී. ඊට අමතරව වර්තමානයේ සමාජීය හා ආර්ථික වශයෙන් විශාල අර්බුදකාරී තත්ත්වයක් මතුව ඇති හා මහජනතාවගේ අවධානයට ලක් වී ඇති ආන්දෝලනාත්මක සිද්ධීන් කිහිපයක් තෝරා ගනිමින් ඉන් රටට, මහජනයාට මෙන්ම පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ මේ වන විට කාර්යසාධන විගණන වාර්තා කිහිපයක් නිකුත් කරන ලදී.

විගණකාධිපතිවරයා විසින් පවත්වනු ලබන බාහිර විගණනය ගණන්දීමේ වගකීම් පිළිබඳ උපකරණයක් වේ. රජයට සහායක් සේම ව්‍යවසාය කළමනාකාරිත්වයේ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලාදායිතාවය වැඩිදියුණු කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර විගණනය සමානවම වැදගත් වන කාරණයක් වේ. මූල්‍ය හා මෙහෙයුම් අඩුපාඩු, පද්ධති ප්‍රමාණාත්මක නොවීම හෝ අකාර්යක්ෂමතාවය, කාර්යසාධනයේ ඌනතාවයන්, නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් ආදිය සහ කාර්යසාධනය පිළිබඳ පිළිගත හැකි ප්‍රමිතීන් පිළිබඳ ඉලක්කයන් සපුරා නොගැනීම සම්බන්ධයෙන් හේතු විග්‍රහ කිරීම මඟින් මෙය සපුරා ගැනේ. මූල්‍ය කාර්යසාධනය භෞතික කාර්යසාධනය සමඟ සම්බන්ධවන අතර කාර්යක්ෂම හා ආර්ථික මෙහෙයුම් සහ සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු විගණන වාර්තාවෙන් අවධාරණය කරනු

ලැබේ. ආයතනවල කළමනාකරිත්වය සමඟ මාගේ නිලධාරින් විසින් පවත්වන විධිමත් රැස්වීම්වලදී අවශ්‍ය පද්ධති හා මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ. විගණකාධිපතිවරයා විසින් නිරීක්ෂණය කෙරෙන අහිතකර සොයා ගැනීම් සඳහා රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය පසු විපරම් කටයුතු සිදුකිරීමද වැදගත් වේ. එකම කරුණ සඳහා වර්ෂයක් පාසාම කෙරෙන අහිතකර සොයා ගැනීම් නැවත නැවත සිදුවීමෙන් තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා වැඩි ප්‍රවනතාවය පෙන්නුම් කරනු ලැබේ.

මූල්‍ය කාර්යසාධනය

ලැබී ඇති තොරතුරුවලට අනුව රාජ්‍ය ව්‍යවසායන් 338 කට අදාළව තොරතුරු පහත වගුව 11 හි දැක්වේ.

	ආයතන විස්තරය	ආයතන ගණන	අලාභ ලබන ආයතන	ලාභ ලබන ආයතන	තොරතුරු ඉදිරිපත් නොකළ ආයතන
(i)	වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතන	65	17	27	21
(ii)	ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත අරමුදල්	53	-	23	30
(iii)	නියමන හා අධීක්ෂණ ආයතන	25	1	18	06
(iv)	විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්	54	6	33	15
(v)	විශ්වවිද්‍යාල පර්යේෂණ හා වෙනත් පුහුණු ආයතන	62	17	23	22
(vi)	රජය සතු සීමිත වගකීම් සමාගම්	79	13	42	24
	එකතුව	**338**	**54**	**166**	**118**

වගුව 11 - රාජ්‍ය ව්‍යවසායයන් 338 කට අදාළ තොරතුරු

ඉහත තොරතුරුවලට අනුව රාජ්‍ය ව්‍යවසායන් 54 ක මූල්‍ය ප්‍රතිඵලය ඌනතාවයක් පෙන්නුම් කළ අතර මුළු වටිනාකම රු.මිලියන 17,576 ක් වී තිබුණි. සැලකිය යුතු මූල්‍ය ඌනතාවයක් සහිත ආයතන අතර තල් සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ජයවර්ධනපුර රෝහල හා විශ්වවිද්‍යාල 17 ක් අන්තර්ගත විය. ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජාතික මූලික අධ්‍යයන ආයතනය, රණවිරුසේවා අධිකාරිය, ශ්‍රී ලංකා පදනම් ආයතනය ආදිය මූල්‍ය ඌනතාවය අඩුකර ගැනීමට සමත් වී තිබුණි.

ඊට අමතරව ආයතන 166 කට අදාලව එකතුව රු.මිලියන 383,821 ක මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම හා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය අතිරික්තය ඉකුත් වර්ෂයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සහ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයක් නොමැති විටෙක.

තත්ත්වාගණනය කළ මතය (හැර මතය)

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් ඇතත් ඒවා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල විකෘති කර දැක්වීවට තරම් පෘථුල නොවන විටක,

අභිතකර මතය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට නොහැකිවන ලෙස විෂය පථය සීමාකර ඇති විට.

මතය ව්‍යාවනය කිරීම

තෝරාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඒවා ව්‍යවහාර කරන ලද ක්‍රමය හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව යනාදී කරුණු පිළිබඳව කළමනාකරණය හා විගණනය අතර ප්‍රමාණාත්මක/පෘථුල නොඑකඟතාවයන් හා වරදවා දැක්වීම් ඇතිවිට.

මූල්‍ය ප්‍රකාශන සඳහා මතයක් ප්‍රකාශ කිරීමේදී එය වඩාත් සාධාරණීකරණය වීම උදෙසා මූල්‍ය විගණනයේදී භාවිතා කළ හැකි පරිගණක විගණන මෘදුකාංගයක උපකාරයද ඉවහල් කර ගනු ලැබීය. ගිණුම් පරීක්ෂා කරමින් තෝරා ගන්නා ලද නියැදියක් ආශ්‍රයෙන් හා සමස්ථ ප්‍රමාණාත්මකභාවයට ප්‍රතිශතයක් ලෙස නිවැරදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් එකතුව ගලපා එම ප්‍රතිඵලය මත විගණන මතය තීරණය කරනු ලබයි.

2016 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 337 ක් විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කළ විගණන වාර්තාවල ඇතුළත් විගණන මතය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුව 12 හි දැක්වේ.

විගණන මතයේ ආකාරය	2016	2015
තත්ත්වාගණනය නොකළ	70	83
තත්ත්වාගණනය කළ	108	184
ව්‍යාවනය කළ	06	11
අහිතකර	09	13
මෙතෙක් තීරණය නොකළ	144	46

වගුව 12 - රාජ්‍ය ව්‍යවසායන් විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කළ විගණන මතයන්

ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම

දේපළ පිරියත හා උපකරණ යනු නිෂ්පාදනයේදී හා සේවා සැපයීමේ දී භාවිතා කරනු ලබන සහ වෙනත් අයට කුලියට දීම සඳහා හෝ පරිපාලනමය කටයුතු සඳහා තබාගෙන ඇති වත්කම් වන අතර එම වත්කම් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලයක් තුළ භාවිතා කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය වත්කම් වේ. තවද ජංගම වත්කම් ලෙස හඳුන්වනුයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන හෝ වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව මාස දොළහක් තුලදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම් වේ. සෑම ස්ථාවර වත්කමක්ම නිවැරදිව අංකනය කිරීමක් හා ස්ථාවර වත්කම් ලේඛන නිසිපරිදි නඩත්තු කිරීම නොකරන්නේ නම් වත්කම් නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වන අතර ඒවා පිළිබඳ භෞතික සත්‍යාක්ෂණය අසාර්ථක කාර්යයක් බවට පත්වන බව නිරීක්ෂණය විය. ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර තබා ගැනීමේ ක්‍රියාමාර්ගය මගින් වත්කම් පාලනය තහවුරු වීම හා වත්කම් සාවද්‍ය පරිහරණයෙන් වලක්වා ගැනීම තහවුරු කරයි. ක්ෂය ගණනය කිරීම, බදු සඳහා සහ රක්ෂණ කාර්යයන් සඳහා ඉඩ සැලසෙන වත්කම්වල නිවැරදි වටිනාකම තබා ගැනීමේ ක්‍රියාමාර්ගයක් ද වේ. ස්ථාවර වත්කම් ලේඛනය කළමනාකරණ අවශ්‍යතාවලට ගැලපෙන සම්පූර්ණ සහ නිවැරදි වාර්තා ජනනය කරයි. ගණන්දීමේ නිලධාරීන් විසින් රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල්, බඩුබාහිරාදී උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව පවත්වා ගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් හා විධිමත් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, නියමිත රෙගුලාසි හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවටත් සෑහීමකට පත්විය යුතු වුවද බොහෝමයක් ආයතන චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් ලේඛන පවත්වාගෙන නොයන අතර මුදල් රෙගුලාසි අංක 756 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක්ද සිදුකර නොතිබූ බව විගණනයේදී අනාවරණය විය.

බොහෝ රාජ්‍ය ආයතනවල භාවිතයෙන් ඉවත්කරන ලද වත්කම් නිෂ්ක්‍රීයව පවතින අතර එම වත්කම් 2009 නොවැම්බර් 13

දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ආයතනවල අපහරණය කළ යුතු භාණ්ඩ සහ වත්කම් නියමිත පරිදි අපහරණය නොකිරීමෙන් එම භාණ්ඩ සහ වත්කම් විකිණීමෙන් ලබාගත හැකි ආදායම රජයට අහිමි වන අතර එම භාණ්ඩ ආරක්ෂා කිරීම හා ගබඩා කිරීම සඳහා අමතර පිරිවැයක්ද දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

කජු සංස්ථාව, ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, මධ්‍යම පරිසර අධිකාරිය සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මෙම තත්ත්වය සඳහා නිදසුන් වේ.

වගකිව යුතු නිලධාරීන් විසින් වැඩ නිම කිරීම් සහතික නිකුත් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවන බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් නිම කරන ලද විදුලි බල ව්‍යාපෘතිවලදී ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය විය. ජාතික අධිවේගී මාර්ග හා මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසින් නිම කරන ලද වෙනත් ප්‍රධාන මාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් ද මෙම තත්ත්වය නිරීක්ෂණය විය. ප්‍රාග්ධනිත කිරීමේ වැදගත්කම විගණනය විසින් පෙන්වාදීමෙන් පසුව මෙම තත්ත්වය පසුව නිවැරදි කර, මෙම මාර්ගවල පිරිවැය ප්‍රාග්ධනිත කර තිබූ අතර එය මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර තිබුණි.

රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳ වාර්තාද අසම්පූර්ණ බව නිරීක්ෂණය වූ අතර පැවැත්ම හා අයිතිය තහවුරු කර ගැනීම සඳහා පිහිටි ස්ථානය හා ප්‍රමාණය සහිතව විස්තරාත්මක උපලේඛනයක් සැපයීමටද හැකි තත්ත්වයක නොතිබුණි. කෙසේ වුවද ආයතන සැලකිය යුතු සංඛ්‍යාවක් ඔවුන්ගේ වත්කම් අනිවාර්ය සාධාරණ අගය පදනමට ගෙන ඒම සඳහා නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමට දැනට ඔවුන්ගේ වත්කම් හඳුනා ගැනීම හා රජයේ ප්‍රධාන තක්සේරුකරු මඟින් තක්සේරු කර ගැනීම සිදුකරමින් තිබෙන බවද නිරීක්ෂණය විය.

ආයතන විසින් ගෙවන ලද උපයන විට ගෙවීම් බදු

ඇතැම් රාජ්‍ය ව්‍යවසායන් මේ වනවිටත් සේවයකයන්ගේ වැටුපෙන් අඩුකරගත යුතු උපයන විට ගෙවීම් බදු ඔවුන්ගෙන් අය නොකර එම මුදල් ආයතනයට වැය බරක් ලෙස ගෙවීම් කරන බව නිරීක්ෂණය වී ඇත. මේ සම්බන්ධව වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛවලට අමතරව 2016 අප්‍රේල් 29 දිනැති අංක 3/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රෙගුලාසිවලට අනුකූලව බදුගෙවිය යුතු සේවකයින්ගේ ඉපයීම්වලින් උපයනවිට බදු අයකළ යුතුය. උපයනවිට බදු ගෙවිය යුතු සේවකයින්ගේ ඉපයීම්වලින් එම බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිසිලෙස ප්‍රේෂණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකාරීත්වය විසින් වගබලාගත යුතුව ඇත. එනමුත් රාජ්‍ය ව්‍යවසායන් 155 න් විසින් උපයන විට බදු නීතිය හා චක්‍රලේඛ උල්ලංඝණය කරමින් තම ඉපයීම් ප්‍රයෝජනයට ගනිමින් සේවකයන් වෙනුවෙන් බදු ගෙවා තිබුණි. බදු චක්‍රලේඛවලට පටහැනිව එසේ ගෙවන ලද බදු මුදල 2016 වර්ෂයේදී රු.මිලියන 3,421.9 ක් වූ අතර එය 2015 වර්ෂයේදී රු.මිලියන 3,347 ක් විය. මේ කරුණු අනුව නිරීක්ෂණය වන්නේ රජය අපේක්ෂා කළ

පරිදි උපයනවිට බදු පැනවීමේ අරමුණු සාක්ෂාත් නොවන බවයි.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 290 ක මූල්‍ය ප්‍රකාශන 2017 සැප්තැම්බර් 30 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද 2016 දෙසැම්බර් 31 දිනට මුදල් වර්ෂය අවසානවී මාස 9 ක් ඉකුත්වීමෙන් පසුවත් ආයතන 54 ක් විසින් තම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනයට ලැබුණු දින සිට දින 30 ක කාලයක් ඇතුළත අදාළ රාජ්‍ය ව්‍යවසායට විගණන වාර්තාව නිකුත් කිරීමට හැකි වන පරිදි රාජ්‍ය ව්‍යවසායන් විසින් ඔවුන්ගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා අදාළ මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර අදාල මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත රාජ්‍ය ව්‍යවසායන් විසින් වාර්ෂික වාර්තා හා විගණිත මූල්‍ය ප්‍රකාශන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. භාණ්ඩාගාර ලේකම් විසින් 2002 මැයි 24 දිනැති අංක පීඑෆ් /පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් නියෝග නිකුත් කර තිබුණි.

වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා රඳවා ගැනීම සඳහා ස්වාධීනත්වය නොමැතිවීම

වාණිජමය තීරණ ගැනීමේදී හා පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීමේ දී බලපාන විවිධ අනුමත කිරීමේ අවශ්‍යතාවයන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාකාරීත්වයන්ටද අහිතකර ලෙස බලපානු ලබයි. මෙම සීමා කිරීම හේතුවෙන් බොහෝ ව්‍යවසායන් ඉහළ වැටුප් මත කොන්ත්‍රාත් පදනමින් වෘත්තීකයන් බඳවා ගැනීම සිදුකරන බව නිරීක්ෂණ විය. පුද්ගලික අංශය සමඟ සැසඳීමේදී ඉතා අඩු වැටුප් ව්‍යුහයක් හේතුවෙන් විශේෂයෙන් ගණකාධිකාරිවරුන්, ඉංජිනේරුවරුන් හා තක්සේරුකරුවන් ආදී තනතුරු සඳහා බඳවා ගැනීමට හා වෘත්තීමය සුදුසුකම්ලාභීන් රඳවා ගැනීමට රාජ්‍ය ව්‍යවසායන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

රජය සතු සීමිත වගකීම් සමාගම්

රාජ්‍ය ව්‍යවසායන් ලෙස රජය සතු සීමිත වගකීම් සමාගම්, සමාගම් පනත යටතේ ස්ථාපිත කර තිබූ අතර මෙම සමාගම් සම්පූර්ණයෙන් රජය සතුවන හෝ රාජ්‍ය පුද්ගලික බද්ධ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන කොටස් ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් රජය සතුවන සමාගම් වේ. සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යවසායන් කෙරෙහි ඇතිවන බොහෝ ගැටළු වළක්වා ගැනීමට පුද්ගලික අංශයේ මැදිහත්වීම පාලන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමක් නොමැතිව අදාළ පුද්ගලික ව්‍යවසායන් මගින් ප්‍රාග්ධනය යොදවන පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ලෙස රාජ්‍ය ව්‍යවසායන් මගින් ඇති කරන ලද හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද රජය සතු සමාගම්ද පවතී.

රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ පරීක්ෂාව සඳහා සමහර සමාගම් කැඳවූ අවස්ථාවලදී එම සමාගම් විසින් පෙනී සිටීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවන්ද විය. රජය මගින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ එසේ නොමැති නම් ඍජුව හෝ වක්‍රව රාජ්‍ය සම්පත් සපයමින් ඕනෑම ලිඛිත නීතියක් යටතේ ඕනෑම කෙනෙකුට හෝ ස්ථාපනය කරන ලද අධිකාරියක් ආවරණය

කිරීම සඳහා කෙටුම්පත් විගණන පනතට දැනටමත් සංශෝධන යෝජනා කර තිබූ බව නිරීක්ෂණය විය. මෑත කාලයේදී සමහර රාජ්‍ය ව්‍යවසායන් හා විශ්වවිද්‍යාල විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් තොරව පවා සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගම් විශාල ප්‍රමාණයක් සංස්ථාපනය කර තිබූ බව නිරීක්ෂණය විය.

කොටස්වලින් සියයට 100 ක්ම රජය හෝ රාජ්‍ය ව්‍යවසායක් සතුවන සීමිත වගකීම් සමාගම්වල අධ්‍යක්ෂවරු පත්කිරීමේ බලය රජය සතුවන අතර කිසිදු පුද්ගලික තැනැත්තෙකුට ලාභයෙන් කොටසක් ලැබිය නොහැකිය. එය සැබැවින්ම රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රජය විසින් සරල කොටස් විකිණීමක් මගින් සාමාන්‍ය "පුද්ගලික අංශයේ" සමාගමකට පරිවර්තනය කිරීම ප්‍රමාණවත්වීම හා සමාන වේ. කොටස්වලින් සියයට 50කට අඩු ප්‍රමාණයක් විකිණීමේදී ද සමාගම් අධ්‍යක්ෂවරු පත් කිරීමේ බලය රජය සතුවේ. කොටස්වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් විකිණීමේදීද රජය ආයතනික ප්‍රතිපත්තියට බලපෑම් කිරීමට හැකි වන ප්‍රමාණවත් බලවත් තත්ත්වයක ඇත. කෙසේ වුවද බොහෝ රාජ්‍ය සංස්ථා විසින් පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත වුවද ඔවුන්ගේ පාලන බලතල පරිපාලනයන් සඳහා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

ලාභ මූලික නොවන අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්

මෙම ව්‍යවසායන් නියාමන හා අධීක්ෂණ ආයතන, විශ්වවිද්‍යාල, පර්යේෂණ හා අනෙකුත් පුහුණු ආයතන හා වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතනයන්ගෙන් සමන්විත වන අතර ආයතනවල ප්‍රධාන ලක්ෂණය නම් වාර්ෂික රජයේ ප්‍රදාන හෝ සමහර භාණ්ඩ හා සේවා මත රජය පනවන ලද බදු එම ආයතනවල ප්‍රධාන ආදායම් ප්‍රභවය වීමයි.මෙම ආයතන 152 ක මූල්‍ය ප්‍රකාශන අනුව, මහා භාණ්ඩාගාරය විසින් 2016 වර්ෂයේදී ලබා දෙන ලද රු.බිලියන 43.8 ක පුනරාවර්තන ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසු එකතුව රු.බිලියන 40.8 ක්වූ බදු පෙර ලාභ උපයා තිබුණි. කෙසේ වුවද මහා භාණ්ඩාගාරයෙන් සපයන ලද පුනරාවර්තන ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසුවත් ආයතන 35 ක් එකතුව රු.බිලියන 2.8 ක ඌනතාවයන් දරා තිබුණි

පළාත් පාලනය

ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 335 න් මහා නගර සභා 23 ක් මහා නගර සභා ආඥා පනතේ (පරි.252) විධිවිධාන මගින්ද, නගර සභා 41 ක් නගර සභා ආඥා පනතේ (පරි.255) විධිවිධාන මගින්ද, ප්‍රාදේශීය සභා 271 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන මගින්ද පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම පළාත් පාලන ආයතනයන්ගේ 2016 වර්ෂයේ ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම හා එම ගිණුම් පිළිබඳ විගණන මතයන් පිළිබඳ සාරාංශයක් පහත වගුව 13 හි දැක්වේ.

පළාත් පාලන ආයතන වර්ගය	ගිණුම් ඉදිරිපත් කළයුතු සභා ගණන	2017.09.30 දිනට ගිණුම් ඉදිරිපත් කළ සභා ගණන	විගණන වාර්තා නිකුත් කළ සභා ගණන	2017 .09.30 දිනට නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය			
				තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	මතය ව්‍යාවනය	අහිතකර මතය
මහා නගර සභා	23	23	14	14	-	-	-
නගර සභා	41	41	35	34	-	-	01
ප්‍රාදේශීය සභා	271	271	231	229	01	-	01
එකතුව	335	335	280	277	01	-	02

වගුව 13 - පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා විගණන මතයන්

පළාත් පාලන බලමණ්ඩල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තාවලින් අනාවරණය කර ඇති වැදගත් නිරීක්ෂණ කීහිපයක් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- ගලෙන්බිඳුණු වැව ප්‍රාදේශීය සභාව විසින් හුරුළුනිකවැව බටතුන අසලින් දිවෙන ඇළ හරහා පාලමක් ඉදි කිරීම සඳහා 2014 වර්ෂයේදී රු.මිලියන 1.95 ක් වියදම් කර තිබූ නමුත්, පාලමට ප්‍රවේශ වීමෙන් පසු පාලමෙන් පිටවීමට මාර්ගයක් නොමැතිවීම නිසා එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර තිබුණු වියදම නිෂ්කාර්ය වී තිබුණි.

- අශ්වයාබැඳිවැව සහ ඉහලගම ගම්මානවලට පානීය ජලය ලබාදීම වෙනුවෙන් වූ ජල ව්‍යාපෘතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නිම කර 2009 වර්ෂයේදී ගලෙන්බිඳුණු වැව ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණි. නමුත් එහි පැවති අඩුපාඩු ප්‍රාදේශීය ලේකම් මගින් සම්පූර්ණ කරවා ගැනීමට සභාව අපොහොසත් වීම නිසා එම ජල ව්‍යාපෘතියට වැය කර තිබුණු රු.මිලියන 18.13 ක මුදල සහ රු.මිලියන 3.45 ක් වටිනා, ජලනල උපකරණ නිෂ්කාර්යය වී තිබුණි.

- පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේදී නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු රු.මිලියන 7.97 ක් වටිනා ටොන් 8-10 මාර්ග තලන යන්ත්‍රය ක්ෂේත්‍රයේ ප්‍රවාහනය සඳහා සුදුසු වාහනයක් නොමැති වීම නිසා නිෂ්කාර්ය වී තිබුණු අතර, 2017 මැයි 22 දිනට යන්ත්‍ර පැය 321 ක් පමණක් භාවිත කර තිබුණි.

- නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සායන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ වූ කඩ කාමර 09 කින් වර්ෂ 04 ක කාලයක සිට අයවිය යුතු රු.මිලියන 3.43 ක පෙර ගෙවුම් මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් නිසි පියවර ගෙන නොතිබුණි.

- අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශයේ මාර්ග ව්‍යාපෘති 03 ක් බොරළු දමා අළුත්වැඩියා කිරීමට රු.මිලියන 5.83 ක් වැය කර තිබුණු අතර එම ව්‍යාපෘති භෞතිකව පරීක්ෂා කිරීමේදී ඉටු නොකරන ලද වැඩ විෂයයන් 08 ක් සඳහා රු.මිලියන 3.66 ක් ගෙවා තිබුණි.

- පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් 2016 වර්ෂයේ පළමු හා දෙවන භාගය සඳහා නිකුත් කර තිබුණු දිස්ත්‍රික් මිල කමිටු තීරණ අනුව, අනුමත බොරළු කියුබ් එකක මිල රු.1,000 ක් වූ නමුත් නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් බොරළු කියුබ් 01 ක් සඳහා රු.2,300 සිට රු.3,600 දක්වා මිල ගණන් 04 ක් යටතේ බොරළු කියුබ් 964 ක් මිලදී ගෙන ඒ සඳහා රු.මිලියන 3.16 ක් ගෙවා තිබූ බැවින් රු.මිලියන 2.19 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

- 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලැසුම් හා ගොඩනැගිලි නියෝගයන්ට කරන ලද සංශෝධනයන්හි V වන උපලේඛනය පරිදි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී අයකළ යුතු ගාස්තු නිසි පරිදි අය නොකිරීම නිසා සභා බල ප්‍රදේශවල ස්ථාපිත සන්නිවේදන කුළුණුවලින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට රු.මිලියන 2.66 ක ආදායමක් ද, නිවිතිගල ප්‍රාදේශීය සභාවට රු.මිලියන 1.21 ක ආදායමක්ද අහිමි වී තිබුණි.

- සබරගමුව පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රත්නපුර මහ නගර සභාව විසින් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 04 කදී එකතුව රු.මිලියන 2.82 ක් වැයකර කළුගඟ අද්දර ඉදිකර තිබූ නාගරික උයන වල් බිහිවී විනාශ වී තිබුණි. එය නිසියාකාරව නඩත්තු කර ප්‍රදේශයේ ජනයාගේ සුභසිද්ධිය උදෙසා යොදවන ලෙස පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් හා සංචාරක අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2010 සැප්තැම්බර් 21 දින රත්නපුර මහා නගර සභාවේ නගරාධිපති වෙත දන්වා තිබුණි. නමුත් 2017 මාර්තු 02 දින වන විටද අදාළ නාගරික උයන ඵලදායි ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම වගකිවයුත්තන් විසින් පැහැර හැර තිබුණි.

- 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කට්ටිකර විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට 01 ක ප්‍රමාණයක් සභා ආදායමට බැර කළයුතු වුවත්, ඉඩම් වෙන්දේසි 03 කට අදාළව නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් අයකිරීම හේතුවෙන් කුරුවිට ප්‍රාදේශීය සභා අරමුදලට රු.764,444 ක් අහිමි වී තිබුණි.

- කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 ක් බදු දුන් 2009 වර්ෂයේ සිට බදු කුලී ගෙවීම පැහැරහැරීම හේතුවෙන් 2014 ජූලි 30 දින එම කඩ කාමර මුද්‍රා තබා සභාව වෙත පවරා ගෙන තිබුණි. එහෙත් බදුකරුවන් සමඟ ගිවිසුම්ගත වී නොතිබුණු හෙයින් සභාවට ලැබිය යුතු එකතුව රු.මිලියන 4.44 ක් වූ හිඟ කුලී සහ දඩ මුදල් අයකර ගැනීම

සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බව දක්වමින් හිඟ කුලිය කපා හැරීම සඳහා සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමුකර තිබුණි.

- කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට ද ෆිනෑන්ස් නව ජනපද ජල ව්‍යාපෘතියට අදාල ළිඳ සකස් කිරීම සඳහා 2014 වර්ෂයේ අවස්ථා 02 කදී සහා අරමුදලින් රු.මිලියන 1.58 ක් වැයකර තිබූණද ළිදේ පැවති අධික මලකඩ සහිත බව ළිං ඉවුරුවල කොන්ක්‍රීට් ස්ථරයන්හි ඇති යකඩ කම්බි කොන්ක්‍රීට් තට්ටුවෙන් පිටතට නිරාවරණය වී මල බැඳීමට ලක්ව තිබීම හා ළිඳ තුළට වැව දෙපසින් ජලය ගලා එමින් පැවතීම නිසා ළිදෙහි ජලය බීමට නුසුදුසු තත්ත්වයක් පැවතීම නිසා වැය කර තිබුණු මුදල නිෂ්කාර්ය වී තිබුණි.

- 2016 මැයි 21 දින වෙසක්පුර පසලොස්වක පෝය දිනයේදී රට බීම මිලිලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව බලංගොඩ නගර සභාවට අයත් බලංගොඩ තානායමේ තබා ගැනීම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින රු.මිලියන 1.52 ක දඩ මුදලක් සභාවට නියම කර තිබුණි. එම දඩ මුදල වාරික 9 කින් ගෙවීමට ඇති කරගත් එකගත්වය අනුව 2017 ජුනි 19 දින වන විට වාරික 04 කින් රු.793,571 ක් ගෙවා තිබුණි. මෙම දඩ මුදල්, සිද්ධියට සම්බන්ධ නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා සභාව විසින් බලංගොඩ දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

- පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් දඹුල්ල ප්‍රාදේශීය සභාවට ලැබී තිබුණු කැබ් රථයක් 2015 අප්‍රේල් 13 දින අනතුරකට ලක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පවත්වා තිබූ පරීක්ෂණයේ නිර්දේශ අනුව වාහනයට සිදුව තිබූ රු.මිලියන 7.99 ක් වූ අලාභයෙන් රු.මිලියන 7.19 ක් සභාවේ සභාපතිවරයාගෙන්ද රු.798,761 ක් වාහනයේ රියදුරුගෙන්ද අයකිරීමට තීරණය කර තිබුණත් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් එම මුදල් අයකර ගෙන නොතිබුණි.

- දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් දඹුල්ල නගරයේ තොග පොලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 11.27 ක කොන්ත්‍රාත් වටිනාකමකට 1995 වර්ෂයේ එක් අවුරුද්දක කොන්ත්‍රාත් කාලයකට ගිවිසුම්ගත වී තිබුණි. නමුත් 1999 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2001 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ රු.මිලියන 1.44 ක අවසාන බිල්පත සඳහා සභාව විසින් ගෙවීම් කර නොතිබුණි. මේ නිසා කොන්ත්‍රාත්කරු නඩු පවරා තිබූ අතර 2016 අගෝස්තු 18 දිනැති නඩු තීන්දුව අනුව එම බිල්පත සඳහා රු.මිලියන 5.51ක් ගෙවීම හේතුවෙන් රු.මිලියන 4.09 ක පාඩුවක් සභාවට සිදු වී තිබුණි.

- දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජලයෝජනා ක්‍රමවලින් සපයන ජලය පිරිසිදු නොකර බෙදා හැරීම නිසා එහි අහිතකර බැක්ටීරියා අඩංගු බවට දැරණියගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ පරීක්ෂණ වාර්තා මගින් තහවුරු වී තිබුණි.

- 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 8.1 වගන්තිය වැරදි ලෙස අර්ථකථනය කර

මුද්දර ගාස්තු ආදායම් එකතු කිරීම වෙනුවෙන් මාතර මහා නගර සභාවේ නිලධාරීන් 11 දෙනෙකුට රු.මිලියන 1.37 ක කොමිස් මුදල් ගෙවා තිබුණි.

- 2015 පෙබරවාරි 07 දින අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ලැබී තිබූ රු.මිලියන 24.93 ක් වටිනා මෝටර් ග්‍රේටර් යන්ත්‍රය එදින සිට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කිසිදු සංවර්ධන කාර්යයකට යොදවා නොගෙන ආදාහනාගාර භූමියේ ගාල්කර තිබුණි.

- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් වැලිකඩ පොලිසිය අසල සභාවට අයත් ඉඩමේ නගර සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගෘහ නිර්මාණ සහ උපදේශක සේවා ලබාගැනීමට 2014 සැප්තැම්බර් 03 දින ටෙන්ඩර් ක්‍රියාවලිය මත තෝරාගත් ආයතනයකට 2015 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා රු.මිලියන 23.16 ක (බදු හැර) මුදලක් ගෙවා තිබුණු අතර රු.මිලියන 16.93 ක් (බදු හැර) ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණි. එහෙත් 2015 මැයි 07 දින පැවති මහා සභාව, වැලිකඩ පොලිසිය අසල ඉඩමේ ඉදිකිරීමට යෝජිත සභා ගොඩනැගිල්ල එම භූමියේ ඉදි නොකර දැනට සභා ගොඩනැගිල්ල ඇති භූමියේම ඉදිකිරීමට තීරණය කර තිබුණි. උපදේශක සේවා කොන්ත්‍රාත් ගිවිසුමේ කාල රාමුවට අනුව 2015 අප්‍රේල් 20 දින වන විට ගොඩනැගිල්ල ඉදිකිරීමට ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන ඉදිකිරීම් කර්මාන්තය ඔවුන්ට භාර දියයුතු වුවද, 2017 ජූලි 31 දින වන විටත් උක්ත ගොඩනැගිල්ලේ ටෙන්ඩර් කැඳවා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවට කිසිදු නෛතික හිමිකමක් නොමැති අක්කර 02 රූඩ් 01 පර්චස් 34 ක් විශාල රජයට අයත් වගුරු බිමක්ව පැවති ඉඩමක සභාවේ වැඩ ඒකකය, වාහන නඩත්තු ඒකකය සහ ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම රු.මිලියන 46.97 ක වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට 2014 අගෝස්තු 21 දින පවරා 2015 මැයි 27 දින අවසන් කිරීමට ගිවිසුම් ගතව තිබුණි. 2015 ජනවාරි මාසයේදී රු.මිලියන 9.39 ක අත්තිකාරම් මුදලක් සහ 2015 පෙබරවාරි මාසයේදී පළමු කොටස් ගෙවීම ලෙස රු.මිලියන 8.26 ක් ගෙවා තිබුණත් එදිනට කොන්ත්‍රාත්තුවේ කළ වැඩ වටිනාකම රු.මිලියන 11.94 ක් වූයෙන් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 5.72 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2017 ජූලි 12 දින වන විට පොළොව මතුපිටට නොපෙනෙන අත්තිවාරමක කොන්ක්‍රීට් කනු 42 ක් සඳහා කම්බි සිටුවා තිබුණු අතර ගොඩනැගිලි පරිශ්‍රය කැලයෙන් යට වෙමින් පැවතුණි. සිටුවා තිබූ කම්බි මලකඩ බැඳී දිරා තිබූ අතර වර්තමානය වන විට කොන්ත්‍රාත්කරු වැඩ බිම අත හැර ගොස් තිබුණි.

- සේරුවිල ප්‍රාදේශීය සභාව ආදාහනාගාරයක අවශ්‍යතාවය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව පුරනැගුම ව්‍යාපෘතිය (NELSIP) යටතේ රු.මිලියන 16 ක වියදමකින් 2014 වර්ෂයේ ආදාහනාගාරයක් ඉදිකර තිබුණු අතර, 2017 මැයි 31 දින වන විට එමගින් මල සිරුරු 5 ක් පමණක් ආදාහනය කර තිබුණි.

අපද්‍රව්‍ය කළමනාකරණය නිසි අයුරින් ක්‍රියාත්මක නොවන බව පළාත් පාලන ආයතන කිහිපයක වූ පහත සඳහන් නිරීක්ෂණවලින් පැහැදිලි විය.

- කැකිරාව ප්‍රාදේශීය සභාව විසින් දෛනිකව ටොන් 8 ක පමණ කසළ තොගයක් එකතු කරන නමුත් කසල ප්‍රතිචක්‍රීයකරන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකිරීම නිසා එකතු කරන කසළ වර්ගීකරණයකින් තොරව ස්ථාන 03 කදී අවිධිමත් පරිදි බැහැර කිරීමෙන් පාරිසරික හා සාමාජීය ගැටළු ඇතිවීමේ අවදානමක් පැවතුණි.

- නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2016 වර්ෂයේ දී රු.මිලියන 1.78 ක ප්‍රතිපාදන ලැබී තිබූ නමුත් ව්‍යාපෘතිය සඳහා යෝග්‍ය ඉඩමක් අත්පත් කර ගැනීමට ප්‍රාදේශීය සභාව අපොහොසත් වීම හේතුවෙන් එකී ප්‍රතිපාදන ආපසු පවරාගෙන තිබුණි. ඒ අනුව, දැනට එක්රැස් කරනු ලබන කසළ තාවකාලික ඉඩමකට බැහැර කිරීම සිදු කරනු ලබන තත්ත්වය තුළ පරිසර විනාශයක් මෙන්ම විවිධ ලෙඩරෝග පැතිරයාමේ ප්‍රවණතාවයක්ද ඇති වී තිබුණි.

- වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව රු.මිලියන 2.95 ක පිරිවැයක් දරමින් ඉදිකර තිබුණු කොම්පෝස්ට් අංගනයේ දෛනික පොහොර නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය සේවකයින් ප්‍රමාණය නොයෙදවීම නිසා අදාළ ව්‍යාපෘතිය අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

- මධ්‍යම පරිසර අධිකාරියේ " පිළිසරු " ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ආධාර මත රු.මිලියන 8.86 ක් වැය කර ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර 2016 පෙබරවාරි මාසයේදී වැඩ අවසන් කර තිබුණි. නමුත් එම මධ්‍යස්ථානයට වාර්ෂිකව එකතුවන අපද්‍රව්‍ය වලින් දිරන අපද්‍රව්‍ය දළ වශයෙන් ටොන් 720 ක් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට ක්‍රමවේදයක් 2017 ජුනි මාසය වන විටත් සකස් කර නොතිබීමෙන් ව්‍යාපෘතියේ අරමුණ ඉටු කර නොතිබුණි.

- මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 18.09 ක් වැය කර රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් ඉදල්පොල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මෙය දිරන කසළ පමණක් සකස් කරන මධ්‍යස්ථානයක් වූයෙන් නොදිරන කසළ ඒ ආසන්නයේ ගොඩගැසීම නිසා මැස්සන් බෝවීම මගින් ගම්වැසියන්ට ලෙඩ රෝග පැතිරීම නිසා ජනතා විරෝධය එල්ලවීම මත මධ්‍යස්ථානය වසා දමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ කසළ කළමනාකරණ මධ්‍යස්ථාන භූමියට ගලි බවුසරය මගින් රැගෙන එන මල අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගන්නා අනාරක්ෂිත වල උතුරා යාමට ආසන්නව තිබුණු අතර, සුළු වර්ෂාවකදී පවා වල උතුරා කසල කළමනාකරණ මධ්‍යස්ථාන භූමිය ආසන්නයෙන් ඇති මාඔයට ගලායාමේ අවදානමක් පැවතුණි. තවද කසළ කළමනාකරණ මධ්‍යස්ථාන භූමියට මල අපද්‍රව්‍ය ගලා යාමෙන් එහි කටයුතු අඩාලවීමට හා පරිසරයට විවෘත වීමෙන්

සේවකයින්ගේ සෞඛ්‍යයට තර්ජනයක් වීමට හේතු වී තිබුණි.

- මාතර මහා නගර සභාව කසළ එකතු කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.මිලියන 103.92 ක වියදමක් කර තිබුණි. 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන මත රු.මිලියන 13.60 ක වියදම් කර ඉදිකර තිබූ කාබනික පොහොර මධ්‍යස්ථානය, පිහිටි ගොඩනැගිල්ල, බයෝගෑස් නිෂ්පාදන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට 2011 වර්ෂයේ ලබා දී තිබුණි. ඒ සඳහා රු.මිලියන 64.36 ක් වැයකර තිබුණත්, ව්‍යාපෘතිය අතරමග අත හැර තිබුණි. කාබනික පොහොර මධ්‍යස්ථානය ඉහත කරුණට යොදාගැනීම නිසා වාර්ෂිකව එකතු වන කසළ ටොන් 12,600 ක් අවිධිමත්ව බැහැර කර තිබුණි.

- හක්මණ ප්‍රාදේශීය සභාව විසින් කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් ඉදිකිරීම සඳහා 2012 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 1.00 ක් ගෙවා රුඩ් 3 පර්.37.8 ක ඉඩමක් මිලදීගෙන තිබුණි. 2017 ජුනි 20 දින වන විටත් එම ඉඩමේ අදාළ කාර්යය ආරම්භ කර නොතිබුණි. කසළ එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 7.39 ක් හා ඉකුත් වර්ෂ 05 තුළ රු.මිලියන 25.25 ක් ද, වැයකර තිබූ නමුත් ඉන් කිසිදු ආදායමක් උපයා ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

- කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ කසළ එකතු කිරීමට රු.මිලියන 6.17 ක් වැය කර තිබුණද, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවර්ධනය වෙනුවෙන් පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ 2015 වර්ෂයේදී ලබා දුන් රු.මිලියන 1.00 ක මුදල අදාළ කර්මාන්තයට යොදවා නොගෙන සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කිරීම සඳහා යොදවාගෙන තිබුණි.

විදේශ ආධාර ව්‍යාපෘති

2016 වර්ෂය සඳහා වූ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව අනුව, රාජ්‍ය ණය ගැනීමේ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී රජය දේශීය මූලාශ්‍ර වලින් රු.බිලියන 945 ක් හා විදේශීය මූලාශ්‍ර වලින් රු.බිලියන 574 ක් රාජ්‍ය ණය වශයෙන් ලබාගෙන තිබුණි. විදේශීය මූලාශ්‍රවලින් ලබාගත් ණය මුදලින් රු.බිලියන 218 ක් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමෙන් සහ රු.බිලියන 102 ක් විදේශ විනිමය පාලන මූල්‍ය පහසුකම යටතේ ලබාගෙන තිබුණි. තවද, විදේශ ආධාර හා වැඩ සටහන් ණය වශයෙන් රු.බිලියන 254 ක් ලබා ගෙන තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී රජය විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් සහ ණය දෙන නියෝජිත ආයතන සමඟ නව විදේශ මූල්‍යයන එකගතා ගිවිසුම් 56 කට එළඹ තිබුණු අතර එමගින් ඉදිරි වර්ෂවලදී එක්සත් ජනපද ඩොලර් මිලියන 3,078.80 ක් ලබා ගැනීමට නියමිතව තිබුණි. ප්‍රදාන ආධාර ගිවිසුම් 29 ක් මඟින් ඉදිරි වර්ෂවලදී ලැබීමට නියමිතව තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 240.50 ක්ද ඊට ඇතුළත් විය. මෙම ණය හා ආධාර වශයෙන් ලැබෙන මුදලින් සියයට 33 ක් ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහාත්, සියයට 26 ක් ආර්ථික හා මූල්‍ය සහයෝගීතා අංශය සඳහාත් ආයෝජනය කිරීමට අපේක්ෂිත විය. එසේම, මහා මාර්ග හා පාලම් සංවර්ධනය වෙනුවෙන් සියයට 16 ක් ආයෝජනය කිරීමට බලාපොරොත්තු විය.

සමාලෝචිත වර්ෂය වන විට විදේශ ආධාර ව්‍යාපෘති 146 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර ඒ අතරින් විදේශ ආධාර ව්‍යාපෘති 111 ක වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් සහ ණය දෙන නියෝජිත ආයතන මඟින් සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් හරහා ලැබී තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 1,586.60 ක ණය සහ එක්සත් ජනපද ඩොලර් මිලියන 53.80 ක ප්‍රදාන සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, ඉන්දියානු ණය ක්‍රමය, චීන රජයේ ආධාර සහ වෙනත් ද්විපාර්ශ්වික ණය යෝජනා ක්‍රම යටතේ ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘතිවලට අදාළ ණය ගිවිසුම්වල, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාගේ පරීක්ෂණයට භාජනය විය යුතු බව සඳහන් කොන්දේසි අනිවාර්ය අවශ්‍යතාවයන් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. 2016 වර්ෂයේ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණය දෙන නියෝජිත ආයතන මඟින් ක්‍රියාත්මක කර තිබුණු විදේශ ව්‍යාපෘති සහ ඒවායේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම පිළිබඳ තත්ත්වය පහත වගුව 14 හි දක්වේ.

විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්/ ණය දෙන නියෝජිත ආයතනය	ක්‍රියාත්මකව පැවැති විදේශාධාර ව්‍යාපෘති ගණන	විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ගණන
ආසියානු සංවර්ධන බැංකුව	35	30
ලෝක බැංකුව	21	19
ජපානය	17	14
චීනය	14	11
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන	11	4
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර් ජාතික අරමුදල	4	4
කුවෙට්	4	3
කොරියා	4	3
වෙනත්	36	23
එකතුව	**146**	**111**
එකතුව	**146**	**111**

වගුව :- 14 - විදේශ ව්‍යාපෘති විගණනය සඳහා ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මකව පැවති මහා පරිමාණ විදේශාධාර ව්‍යාපෘති කිහිපයක කාර්යසාධනය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු සාරාංශ ගත කර පහත දක්වා ඇත.

- ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත ක්‍රියාත්මක වන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ දිවයින තුළ කිලෝ මීටර් 3,313 ක් වූ පළාත් හා ග්‍රාමීය මාර්ග 742 ක් පුනරුත්ථාපනය කිරීමට සැලැසුම් කර තිබුණි. මෙම වැඩ සටහනේ කටයුතු 2014 ජුනි 01 දින ආරම්භ කර තිබුණු අතර 2024 මාර්තු 30 දින දක්වා වර්ෂ 10 වැඩි කාලයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණත්, එම වැඩසටහන සඳහා ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

  ඒ හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට පළාත් හා ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා පැකේජ් 42 ක් යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමට අපේක්ෂා කර තිබුණු නමුත් විෂය කාර්යපථයේ පසුකාලීනව සිදුකරන ලද වෙනස් කිරීම් හේතුවෙන් පැකේජ 15 ක් යටතේ පමණක් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. 2017 ජූලි 31 දින වන විට කිලෝ මීටර් 84.74 ක් වූ පළාත් හා ග්‍රාමීය මාර්ග 25 ක පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කර තිබුණි.

- ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය හා ජාත්‍යන්තර පිළිගැනීම වර්ධනය කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුව හා ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ආධාර මත වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ වූ ආයතන 09 ක් හරහා නිපුනතා අංශ සංවර්ධන ව්‍යාපෘතිය 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන විවිධ රාජ්‍ය ආයතන අතර නිසි සම්බන්ධීකරණයන් නොවීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු

අපේක්ෂිත පරිදි ඉටුකරගෙන නොතිබුණි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ආයතන විසින් දැනටමත් පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහල නැංවීමට හා ජාත්‍යන්තර පිළිගැනීම වර්ධනය කිරීම සඳහා එම පාඨමාලා නැවත සමාලෝචනය කිරීම ව්‍යාපෘතියේ එක් අරමුණක් විය. කෙසේ වෙතත්, දැනට ක්‍රියාත්මකව පවතින වෘත්තීය පාඨමාලා 2,484 ක් අතරින් 2016 දෙසැම්බර් 31 දින වන විට පාඨමාලා 242 ක් පමණක් සමාලෝචනයට භාජනය කර තිබුණි.

- මහනුවර, ගාල්ල සහ යාපනය නගර සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබී තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 147 කට සමාන රු.මිලියන 19,257 ක ණය මුදල උපයෝගී කර ගෙන උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය, මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ 2 ½ කට වැඩි කාලයක් ගතවී තිබුණද, ව්‍යාපෘතිය සඳහා විස්තීරණ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබීම හේතුවෙන් එහි කටයුතු මන්දගාමී විය. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන සහ ජල ප්‍රවාහන මණ්ඩලය සහ අදාල මහ නගර සභාවල නියෝජිතයන්ගෙන් සමන්විතව පත් කළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව, ස්ථාවර පදනමක් මත පත් කර නොතිබීම මෙම ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමීවීමට හේතුවී තිබුණි.

- ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන ආකාරයේ ආර්ථිකයක් සහිත රටක් බවට පත් කිරීමේ අරමුණින් ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබී තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 110 කට සමාන රු.මිලියන 14,382 ක් වූ ණය මුදල උපයෝගී කර ගෙන දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබුණි. ශ්‍රී ලංකාවේ නායයාම් හා වෙනත් ආපදා අවම කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් තාක්ෂණික දැනුම සහිත පුද්ගලයින්ගේ හිඟතාවය, ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමීව සිදුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

- ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලැබී තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 59 ක ණය ආධාර මත ක්‍රියාත්මක කර තිබුණු පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වූ කොන්ත්‍රාත් සම්බන්ධ භෞතික ප්‍රගතිය, එම ඉදිකිරීමේ කොන්ත්‍රාත් පිරිනැමීමට කල්ගතවීම හේතුවෙන් මන්දගාමී වී තිබුණි. තවද, ව්‍යාපෘතියේ අරමුදල් යොදා ගනිමින් දිවුලපිටිය, රත්තොට, විල්ගමුව, ගල්ගමුව, තිරප්පනේ සහ ඉපලෝගම යන ප්‍රාදේශීය සභා විසින් ඉදිකර තිබුණු පරිපාලන සහ වෙනත් වාණිජමය කටයුතු සඳහා වූ ගොඩනැඟිලි, වර්ෂ 2 ½ කට වැඩි කාලයක් මුළුල්ලේ මහජනතාවගේ අවශ්‍යතා සඳහා විවෘත නොකර නිෂ්කාර්යව පැවතුණි. 2012 ජූලි මාසයේදී කටයුතු ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතිය, 2017 ජූනි මාසය වන විට නිම කළ යුතුව පැවතුණි.

උක්ත නිරීක්ෂණවලට අමතරව, 2016 වර්ෂයේදී විදේශ ආධාර ව්‍යාපෘති

විගණනයේදී හෙළිදරව් වූ ව්‍යාපෘති කාර්යසාධනය සම්බන්ධව පොදු අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

- ණය දෙන විදේශ නියෝජිත ආයතන විසින් විදේශ ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද අරමුදල් උපයෝජනය පහළ මට්ටම පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ හේතුවෙන් අපේක්ෂිත පරිදි උපයෝජනය නොකළ අරමුදල් සඳහා අමතර පොලී මුදල් ගෙවීමට සිදුවී තිබුණු අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේ අවදානමක් පැවතීම, උද්ධමනකාරී බලපෑම් හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය මත ව්‍යාපෘති කටයුතු ඉටුකිරීමට නොහැකිවීම වැනි අහිතකර ප්‍රතිවිපාක උද්ගත වන බව නිරීක්ෂණය විය. විදේශ අරමුදල් උපයෝජනය පහළ මට්ටමක පැවති ව්‍යාපෘති කිහිපයක් පිළිබඳව තොරතුරු පහත වගුව 15 හි දැක්වේ.

ව්‍යාපෘතියේ නම	විදේශ නියෝජිත ආයතනය	මූල්‍යාණය කිරීමට එකඟවූ මුදල	2016 දෙසැම්බර් 31 දිනට	
			උපයෝජනය	ගතවී තිබුණු කාලය
		එ.ජ.ඩොලර් මිලියන	එ.ජ.ඩොලර් මිලියන	වර්ෂ
උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය	ජා.සං.සං.	212.00	11.00	02 ½
දේශගුණික විපර්යාසවලට ඔරොත්තුදීම වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	ජා.සං.සං.	110.00	29.00	02
වේලි ආරක්ෂාව හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය	ජා.සං.සං.	83.00	39.90	02
දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය	ජා.සං.සං.	190	9.36	3 ½
අධ්‍යාපන අංශ සංවර්ධන වැඩ සටහන	ආ.සං.බැ.	200	72.33	03
මහවැලි ජල සුරැකුම් ආයෝජන වැඩ සටහන	ආ.සං.බැ.	150	9.10	1 ½
දක්ෂිණ අධිවේගී මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය	ආ.සං.බැ.	70	11.79	2 ½
වියලි කලාපීය නාගරික ජල සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය	ආ.සං.බැ.	125	72.81	07
ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර් ජාතික අරමුදල	25.00	12.30	03

වගුව 15- විදේශ අරමුදල් උපයෝජනය - 2016

- විදේශ ව්‍යාපෘතිවල ක්‍රියාකාරී කාල සීමාව අවසාන වීමෙන් පසුවද, සමහර ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. මුදල් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ අවසාන මූල්‍ය වර්ෂයේදී, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ආකාරය පිළිබඳව විධිමත් උපදෙස් ලබාදී නොතිබීම හේතුවෙන් මේ තත්ත්වය උද්ගතවී පැවතුණි. තවද, විදේශ අරමුදල් උපයෝජනය කර මිලදීගත් දේපල, පිරියත හා උපකරණ යනාදී වත්කම් ව්‍යාපෘතියේ ක්‍රියාකාරී කාල සීමාව අවසන්වීමෙන් පසු අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත භාරදී තිබුණු නමුත් ඒවා අපේක්ෂිත අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීම පිළිබඳව පසු විපරම් කර නොතිබීම ප්‍රධාන අඩුපාඩුවක් වී තිබුණි.

  භෞතික හා මූල්‍ය ප්‍රගතිය මන්දගාමී වූ විදේශ ව්‍යාපෘති රාශියක් පැවති අතර සැලැසුම් කිරීමේ දුර්වලතා, මහජන විරෝධතා, ඉඩම් පවරා ගැනීමේ ප්‍රමාදය, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ නොහැකියාවන්, ප්‍රසම්පාදන ක්‍රමවේදයේ දුර්වලතා, ප්‍රමාණවත් සුපරීක්ෂණයන් නොමැතිවීම හා තාක්ෂණික දැනුම සහිත පුද්ගලයින් ව්‍යාපෘති කළමනාකරණය සඳහා බඳවා ගැනීමේ අපහසුතා වැනි කරුණු රාශියක් ඊට හේතුවී තිබුණි. මේ අනුව ව්‍යාපෘතිවල කටයුතු අධීක්ෂණය සම්බන්ධයෙන් සංවර්ධන කාර්ය භාර අමාත්‍යාංශය යටතේ වූ ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය භාර්ය පුළුල්වීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ.

රාජ්‍ය බැංකු

බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) වලින් බැංකු අංශය සමන්විත වේ. 2016 වසර අවසන් වන විට බැංකු අංශය බලපත්‍රලාභී වාණිජ බැංකු 25 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 කින් සමන්විත විය. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු අතරින් විදේශ බැංකු 12 ක් පැවතුනි. බැංකු සේවාවන් වැඩිදියුණු කිරීම සහ දිවයින පුරා සිය ජාලය සහ ප්‍රවේශය ව්‍යාප්ත කිරීම මගින් බැංකු අංශය විසින් අඛන්ඩව ආර්ථික ක්‍රියාකාරකම් හා සංවර්ධනය සඳහා දායක විය. ඒ අනුව 2016 වන විට නව ශාඛා 65 ක් විවෘත කර තිබූ අතර නව ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 366 ක් ස්ථාපිත කර තිබුණි.

2016 වර්ෂය අවසානය වන විට බැංකු සහ ශාඛාවන්හි ව්‍යාප්තිය					
කාණ්ඩය		බැංකු	ශාඛා	ශිෂ්‍ය ඉතුරුම් එකක	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර
LCBs	දේශීය බැංකු	13	2763	2870	3523
	විදේශ බැංකු	12	221		
LSBs	ජාතික මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු	1	255	175	320
	ජාතික මට්ටමේ ඉතිරිකිරීමේ බැංකුව	1	228		
	නිවාස මූල්‍ය ආයතන	2	57		
	පුද්ගලික ඉතිරිකිරීම් හා සංවර්ධන බැංකු	3	90		

වගුව: 16 - මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

වත්කම්

බැංකු අංශයේ වත්කම් කළඹ 2016 වසර තුල තවදුරටත් ප්‍රසාරණය වූ අතර වසර අවසන් වනවිට එය රු. ට්‍රිලියන 9 ක් විය. සමස්ත වත්කම් කළඹ ප්‍රධාන වශයෙන් ණය සහ අත්තිකාරම් වලින් සමන්විත වූ අතර, එය බැංකු අංශයේ වත්කම් වලින් සියයට 60 ක අගයක් ගනු ලැබීය. ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකේ වත්කම් ප්‍රමාණය, එනම් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ පිළිවෙළින් රු. බිලියන 1,669.3 ක් සහ රු. බිලියන 1,302 ක් වූ අතර එය බැංකු අංශයේ මුළු වත්කම්වලින් සියයට 33 ක් විය.

රූපසටහන : 13 - මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

අක්‍රීය ණය

බැංකු අංශයේ සමස්ත අක්‍රීය ණය අනුපාතිකය 2015 වර්ෂයේ සියයට 3.2 සිට 2016 වන විට සියයට 2.6 දක්වා බිලියන 6.9 කින් නිරපේක්ෂ වටිනාකම පහත වැටී ඇත. ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකෙහි එනම් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ 2016 වසර අවසානය වන විට අක්‍රීය ණය පිළිවෙළින් රු.බිලියන 29.8 ක් සහ රු.බිලියන 17.3 ක් විය. එපරිදිම අක්‍රීය ණය අනුපාතිකය පිළිවෙළින් සියයට 2.9 සහ සියයට 1.95 ලෙස වාර්තා වී ඇත.

රූපසටහන : 14 - ශ්‍රී ලංකා මහ බැංකුව

රූපසටහන : 15 - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

වගකීම් සහ ප්‍රාග්ධනය

ගනුදෙනුකරුවන්ගේ තැන්පතු තවදුරටත් වගකීම්වල ප්‍රධාන මූලාශ්‍රය බවට පත්ව ඇති අතර එය බැංකු අංශයේ මුළු වගකීම් සහ ප්‍රාග්ධනයෙන් සියයට 69.6 ක අගයක් ගනු ලැබීය. 2016 වර්ෂයේ අවසානය වන විට ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකෙහි තැන්පතු ප්‍රමාණය එනම් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ පිළිවෙළින් රු. බිලියන 1,257 ක් සහ රු. බිලියන 1,077.8 ක් වූ අතර එය බැංකු අංශයේ මුළු තැන්පතු වලින් සියයට 37 ක අගයක් ගනු ලැබීය.

බැංකු අංශයේ සමස්ත ණය ගැනීම් 2016 වසර අවසානය වන විට සියයට 3.5 ක අවාසිදායක වර්ධනයක් පෙන්නුම් කළ අතර විදේශ ණය ගැනීම් රු. බිලියන 47.8 කින් සහ රුපියල් ණය ගැනීම් රු. බිලියන 14.2 කින් අඩුවීම මෙයට හේතු වී ඇත. කෙසේවෙතත්, සමස්ත ණය ගැනීම් සඳහා ඉහළම දායකත්වය සියයට 60.7 ක් වූ විදේශ ණය ගැනීම් මගින් සපයන ලදි. ප්‍ර2016 වර්ෂය අවසන් වන විට ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකහි ණය ගැනීම් රු. බිලියන 429.2 ක් විය. එය විදේශ මුදලින් ණය ගැනීම් රු. බිලියන 297.4 සහ රුපියල් ණය ගැනීම් රු. බිලියන 131.8 ක් නියෝජනය කරයි.

රූපසටහන : 16 මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

තැන්පතු

ශ්‍රී ලංකා රුපියල් මගින් ජනිත වූ කාලීන තැන්පතු වැඩි වීම නිසා කාලච්ඡේදය තුළදී බැංකු අංශයේ තැන්පතු පදනම වැඩි වී තිබුණි. පසු ගිය වර්ෂයේ සියයට 13.9 ක වර්ධනයට සාපේක්ෂව 2016 දී කාලීන තැන්පතු සියයට 23.8 ක වැඩිවීමක් වාර්තා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2015 දී මුළු තැන්පතු වලින් සියයට 57.0 ක් වූ කාලීන තැන්පතු 2016 දී මුළු තැන්පතු වලින් සියයට 60.6 ක් දක්වා වැඩි වී තිබුණි.

ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකේ කාලීන තැන්පතු 2016 වර්ෂය අවසන් වන විට රු. බිලියන 1,300.3 ක් විය.

රූපසටහන : 17 මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික හා මිල ස්ථායීතාවය සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපනය කර ඇත.

දේශීය මුදල් ස්ථායීකරණය සඳහා දේශීය මුදල් ප්‍රතිපත්තිය නිර්ණය කිරීමට මුදල් නීති පනත මඟින් බලය ලබා දී ඇති ක්‍රියාවන් මගින් සැපයුම, තිබෙන බව සහ මුදල් පිරිවැය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය උත්සාහ කළ යුතුය. මුදල් සැපයුමේ වෙනස්වීම් මිල ස්ථායීතාවයට බලපාන ප්‍රධාන සාධකයක් වේ. ගුණිතයක් හරහා සංචිත මුදල් වලට සම්බන්ධ වන පුළුල් මුදල් සැපයුමේ වෙනස්කම්වලට බලපෑම් ඇති කිරීම මඟින් මිල ස්ථාවරත්වය ලබා ගත යුතුය. සංචිත මුදල් යනු මුදල් ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කයයි. වර්තමානයේ භාවිතා කරන ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති මෙවලම් වන්නේ ප්‍රතිපත්ති පොලී අනුපාත, විවට වෙළෙඳපොළ මෙහෙයුම් (OMO) සහ වාණිජ බැංකු තැන්පතු වගකීම් මත ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා (SRR) වේ.

ස්ථාවර තැන්පතු අනුපාතිකය, ස්ථාවර ණය අනුපාතිකය හා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය වැනි ප්‍රතිපත්ති අනුපාතිකයන් 2016 වර්ෂය තුළදී පිළිවෙළින් සියයට 6, සියයට 7.5 හා සියයට 6 සිට සියයට 7, සියයට 8.5 හා සියයට 7.5 දක්වා වැඩි කර තිබුණි. 2016 වසර අවසානය වන විට රු. බිලියන 856.1ක් දක්වා රු. බිලියන 182.7 ක සැලකිය යුතු වර්ධනයක් සිදු වී තිබුණි. සංචිත මුදල් වල ඇතුළත් වාණිජ බැංකු තැන්පතු රු. බිලියන 121.6 සිට රු. බිලියන 303.3 දක්වා 2016 වර්ෂය අවසන් වන විට සැලකිය යුතු ඉහළ යාමට ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ඉහළ යාම බලපා තිබුණි. එසේම සංචිත මුදල් වල ඇතුළත් සංසරණය වන මුදල් රු.බිලියන 552.8 ක් දක්වා රු. බිලියන 61.1 කින් වර්ධනය වී තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වත්කම් පැත්තෙන් බැලූ විට, සංචිත මුදල් ප්‍රසාරණය වීම සම්පූර්ණයෙන්ම පාහේ 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් (NFA) රුපියල් බිලියන 7.7 කින් පහත වැටී තිබියදී, ශුද්ධ දේශීය වත්කම් (NDA) බිලියන 207.3 කින් වැඩි වීම බලපා තිබුණි. ශුද්ධ දේශීය වත්කම් තුල ඇතුළත්, මහ බැංකුව විසින් විවට වෙළඳපොළ මෙහෙයුම්

යටතේ මිලදී ගත් රජයේ සුරැකුම්පත් 2016 වසර අවසානය වන විට රු. බිලියන 351.4 ක් දක්වා රු. බිලියන 248.6 කින් වර්ධනය වී ඇති අතර එය 2015 වසර අවසානයේ දී රුපියල් බිලියන 102.8 ක් විය.

ශ්‍රී ලංකා රුපියලෙහි ජාත්‍යන්තර ස්ථාවරත්වය පවත්වාගෙන යාම සඳහා සහ එහි වත්මන් ජාත්‍යන්තර ගනුදෙනු නිදහස සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර ගෙවුම් ශේෂයේ ඕනෑම පුරෝකථන හිඟයක් සපුරාලීමට ප්‍රමාණවත් වන ජාත්‍යන්තර සංචිතයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය උත්සාහ කළ යුතුය. 2016 වර්ෂය තුළදී විදේශීය මූල්‍ය වත්කම් වල ඇතුලත් විදේශ මුදල් හා බැංකු ශේෂයන් පහත වැටීම හේතුවෙන් 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් රු. බිලියන 544.2 ක් දක්වා බිලියන 7.7 කින් පහත වැටී තිබුණු අතර, 2015 වර්ෂයේ දී, රු. බිලියන 125.3 කින් පහත වැටී තිබුණි.

ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය 2016 දීත් අඛණ්ඩව අවප්‍රමාණය විය. රුපියලේ අගය ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 2015 වසර අවසානය වන විට රු. 144.1 සිට 2016 වර්ෂය අවසානය වන විට රු.149.80 ක් දක්වා සියයට 3.8 කින් පහත වැටී තිබුණි. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම, 2015 දී රු. 131 සිට රු .144.1 දක්වා සියයට 9.1 ක් විය. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමට දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත්වීම සීමා කිරීමට සහ වෙළඳපොළේ ඉල්ලුම සහ සැපයුම මඟින් විනිමය අනුපාතය තීරණය වීමට ඉඩ ලබා දීම සඳහා 2015 සැප්තැම්බර් 03 දින මහ බැංකුව විසින් ගන්නා ලද තීරණය ප්‍රධාන වශයෙන්ම හේතු වී තිබුණි.

ලංකා බැංකුව

ලංකා බැංකුව මාලේ, චෙන්නායි හා සීෂෙල්ස් හි එතෙර ශාඛා සහ එක්සත් රාජධානියේ පරිපාලිතයක් සහිත බලපත්‍රලාභී රාජ්‍ය වාණිජ බැංකුවකි. 2016 වර්ෂයේ දී එකතු කළ ශාඛාවන් 2 ක් සහිතව ශාඛාවන් 580 සමඟ දේශීය බැංකු කටයුතු පවත්වා ගනී. 2016 දී බැංකුවේ මුළු සේවක සංඛ්‍යාව 7,569 ක් වන අතර, ශ්‍රම බලකායෙන් සියයට 63 ක් අවුරුදු 35 ට අඩු තරුණ සේවකයන් වේ.

බැංකුව 2016 වර්ෂයේ දී රු. බිලියන 53.95 ක ශුද්ධ පොලී ආදායමක් උපයාගෙන තිබූ අතර, එය පසුගිය වර්ෂය සමඟ සසඳන කල සියයට 16 ක අඩු වීමකි. කෙසේ වෙතත්, බැංකුව 2016 වර්ෂයේ දී රු. බිලියන 31.2 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර එය සියයට 23 ක වර්ධනයකි. රු. ට්‍රිලියන 1.67 ක වත්කම් පදනමක් සහිතව රු. ට්‍රිලියන 1 ක් ගනුදෙනුරුවන් හට ණය හා අත්තිකාරම් වශයෙන් ප්‍රදානය කර තිබූ අතර, එය මුළු වත්කම් වලින් සියයට 60 ක් වන අතර, එය පසුගිය වසර හා සසඳන කල සියයට 21 ක ඉහළ වර්ධනයකි. තවද, බැංකුවේ අක්‍රිය අත්තිකාරම් අනුපාතය 2015 වර්ෂයේ දී සියයට 4.3 සිට 2016 වර්ෂයේ දී සියයට 2.9 දක්වා පහත වැටී තිබුණි. මීට අමතරව, බැංකුවේ තැන්පතු පදනම රු. ට්‍රිලියන 1.08 සිට රු. ට්‍රිලියන 1.3 ක් දක්වා 2016 වර්ෂය තුලදී වර්ධනය වී තිබුණි.

බැංකුවේ ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 28.2 ක සිට 2016 වර්ෂයේ දී සියයට 21.6 ක් දක්වා අඩු වී තිබූ අතර එය අවම අවශ්‍යතාවය වන සියයට 20 ට ළඟා වී තිබුණි. ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (පෙළ II) සියයට 13.1 සිට සියයට 12.3 ක් දක්වා 2016 වර්ෂයේදී අඩු වී තිබූ අතර, එය අවම අවශ්‍යතාවය වන සියයට 10 මට්ටම ඉක්මවා ගොස් තිබුණි.

ලංකා බැංකුව ලාභාංශ ගෙවුම් අනුපාතය සියයට 70 ක් ලෙස තබා ගනිමින් රු. බිලියන 17.3 ක ලාභාංශයක් ශ්‍රී ලංකා රජයට ගෙවීමට හැකි වී ඇත. එය පසුගිය වසරේ රු. බිලියන 11 සමඟ සසඳන කල සියයට 57 ක වර්ධනයකි.

මහජන බැංකුව

බැංකුවේ වත්කම් සංයුතිය ඉකුත් වසර සමඟ සැසඳීමේ දී, සාපේක්ෂ නොවෙනස් ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, වත්කම් සමුදායේ ආධිපත්‍ය දරා සිටියේ ණය වත්කම, 2016 දෙසැම්බර් අග වන විට සියයට 68.4 ක කොටසකට හිමිකම් පෙන්වමින්ය. ඊට සමගාමී අන්දමින් වසර තුලදී සමූහයේ වත්කම් වෘද්ධිය රු. බිලියන 1,444.4 ක් දක්වා සියයට 11.6 කින් ව්‍යාප්ත වෙමින් ඉතා ප්‍රබල මට්ටමක පැවතුණි. එපමණක් නොව මේ වසර තුළදී ගනුදෙනුකාර භවතුන් හට පිරිනැමුණු ණය සහ අත්තිකාරම් රු. ට්‍රිලියනයේ සන්ධිස්ථානය සමූහය පසු කරන ලදි.

අරමුදල් සපයා ගැනීම අරභයා බැංකුව විසින් විභේදනය වූ හිතකර සංයුතියක් පවත්වාගෙන යයි. 2016 වර්ෂය අගදී තැන්පතු පදනම රු. ට්‍රිලියනයකට ලගා වී තිබුණි.

බැංකුව විසින් 2016 වර්ෂයේදී සියයට 19 ක ලාභ වෘද්ධියක් ලබා ගනිමින් රු.බිලියන 14.9 ක ලාභයක් සහ භාරක මත ප්‍රතිලාභය සියයට 27.5 ක් වාර්තා කරන ලදි.

බලපත්‍රලාභී බැංකු පිළිබඳ නියමු අවශ්‍යතා අනුව සියයට 5 කට නොඅඩු 1 වැනි ස්ථරයේ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතයක් හා සමස්ථයක් වශයෙන් සියයට 10 කට නොඅඩු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතයක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. 2016 දෙසැම්බර් අවසානය වනවිට බැංකුවේ 1 වැනි තලයේ සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය කලින් වර්ෂයේ සියයට 9.9, සියයට 12.6 හා සැසඳීමේදී පිළිවෙලින් සියයට 9.8 සහ සියයට 12.1 දක්වා අඩු වී තිබුණි.

බාසල් 111 අවම ප්‍රාග්ධන අවශ්‍යතා හා උත්තෝලන අනුපාත රාමු ක්‍රියාත්මක කිරීම 2017 ජූලි 1 දින සිට ක්‍රියාත්මක වනු ඇත. වඩා ඔරොත්තු දෙන ආකාරයේ බැංකු කර්මාන්තයක් උදෙසා දායක වීමේදී මේ යෝජිත වෙනස්කම් ක්‍රියාවේ යෙදවීමට බැංකුව සූදානමින් සිටී.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ජාතික ඉතිරි කිරීමේ බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතින් ශ්‍රී ලංකාව තුල රජය සතු බැංකුවක් ලෙස සංස්ථාපනය කර තිබූ අතර 1988 අංක 36 දරන බැංකු පනත ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂ බැංකු තත්වය පිරිනමා තිබුණි. පනතේ 2 (අ) වගන්තිය හා ඊට අදාල සංශෝධනයන් පරිදි බැංකුවේ අරමුණ විය යුත්තේ, විශේෂයෙන් සීමිත හැකියාව ඇති ශ්‍රී ලංකාවේ ජනතාව අතර ඉතිරි කිරීම් ප්‍රවර්ධනය සහ එසේ එක්රැස් කරනු ලබන ඉතුරුම් ලාභදායිව ආයෝජනය කිරීමයි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව 2016 වර්ෂය තුළදී නව ශාඛාවන් කිහිපයක් පිහිටුවන ලද අතර, ඒ අනුව 2016 වර්ෂය අවසානය වන විට මුළු ශාඛාවන් සංඛ්‍යාව 250 ක් විය. ඊට අමතරව ඉතුරුම් එක් රැස් කිරීමේ අදහසින් පාසල් බැංකු ඒකක 2,858 ක් පැවති අතර වර්ෂය තුල එවැනි ඒකක 571 ක වැඩි වීමක් වාර්තා විය. වර්ෂය තුලදී බැංකුවේ මුළු තැන්පතු පදනම රු. බිලියන 61.5 කින් හෙවත් සියයට 10 කින් ප්‍රසාරණය වී තිබූ අතර 2016 වර්ෂය අවසානය වන විට රු. බිලියන 657.3 කට ආසන්නව පැවතුණි.

බැංකුවේ මුළු වත්කම් පදනම රු. බිලියන 63.6 කින් හෙවත් සියයට 7.5 කින් ප්‍රසාරණය වී තිබූ අතර, 2016 දෙසැම්බර් වන විට රු. බිලියන 911 ඉක්මවා යමින්

පැවතුණි. වර්ෂය තුලදී බැංකු හා වෙනත් ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය රු. බිලියන 52 කින් වැඩිවීම වත්කම් වැඩිවීමේ ප්‍රධාන සාධකයක් වූ අතර, එය වර්ෂය තුළ සියයට 10 ක් වූ තැන්පත් වර්ධනයෙන් මූලිකවම මූල්‍යනය කර තිබුණි. 2015 වර්ෂයේ වාර්තා කරන ලද සියයට 3.5 හා සැසඳීමේදී ක්‍රියාකාරී නොවන ණය අනුපාතය සියයට 1.7 ක් ලෙස වාර්තා වීමෙන් වර්ෂය තුලදී බැංකුවේ වත්කම් තත්වය (Asset quality) වැඩි දියුණු වී තිබුණි.

බැංකුව රු. බිලියන 13 ක බදු පෙර ලාභයක් 2016 වර්ෂයේදී වාර්තා කර තිබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 2.1 ක වැඩි වීමකි. කෙසේ වුවද, 2015 වර්ෂය හා සැසඳීමේදී බැංකුවේ ශුද්ධ පොළී ආදායම රු. බිලියන 1.5කින් හෙවත් සියයට 5.6 කින් පහත වැටී තිබුණි.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන නමුත් ඒවා අවම නියාමක අවශ්‍යතාවයන්ට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනිමින් තිබුණි. මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පිළිවෙලින් සියයට 12.53 (අවම සියයට 5) සහ සියයට 14.68 (අවම සියයට 10) ක් විය. තවද, බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පවත්වාගෙන යාම පිණිස පෞද්ගලික ස්ථාපනයක් (Private Placement) ලෙස 2016 දෙසැම්බර් මාසයේදී වර්ෂයකට සියයට 13 අනුපාතයට එකක් රු. 100 බැගින් වන ප්‍රමිත, සුරැකුම් නොලත්, යටත්, නිදහස් කළ හැකි රු. බිලියන 6 ක් වටිනා ණයකර නිකුත් කර තිබුණි. 2016 දෙසැම්බර් 29 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2016 අංක 1 දරන නියමය පරිදි 2017 ජූලි 01 දින සිට ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් 6.25, 7.75 සහ 11.75 ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පවත්වාගෙන යා යුතුය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය අනුව පිහිටුවන ලද අතර එයට අදාල සංශෝධන හා අදාල නීතියේ 2 වන වගන්තිය අනුව, පනතේ විධිවිධානවලට අනුකූලව මූල්‍ය හා වෙනත් ආධාර සැපයීමෙන් කෘෂිකාර්මික, කර්මාන්ත හා නිවාස සංවර්ධනයට සහායවීම බැංකුවේ කාර්ය වන්නේය.

2016 වර්ෂය අවසානය වන විට බැංකුවේ මුළු තැන්පතු ප්‍රමාණය රු. බිලියන 28 ඉක්මවා ඇති අතර 2015 වර්ෂය හා සැසඳීමේදී එය සියයට 3.6 ක වැඩිවීමකි.

2016 වර්ෂයේදී රු. බිලියන 1 කින් හෙවත් සියයට 3 කින් ප්‍රසාරණය වී තිබූ බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය වර්ෂය අවසාන වන විට රු. බිලියන 35 ඉක්මවා තිබුණි. ගණුදෙනුකරුවන්ට ලබා දුන් ණය රු. බිලියන 1.6 කින් වැඩිවීම වත්කම් වැඩි වීමේ ප්‍රධාන කාරකය විය.

බැංකුව විසින් රු. මිලියන 706 ක බදු පෙර ලාභයක් වාර්තා කර තිබූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 3.68 ක වැඩි වීමකි. එසේ වුවත්, 2015 වර්ෂය හා සැසඳීමේදී බැංකුවේ ශුද්ධ පොළී ආදායම රු. බිලියන 6 කින් හෙවත් සියයට 0.34 කින් පහත වැටී තිබුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 1997 අංක 07 දරන (සංශෝධිත 2003 අංක 15 දරන පනත හා 2011 අංක 45 දරන පනත) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත යටතේ සංස්ථාපනය කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත මඟින් බලපත්‍ර ලාභී විශේෂ බැංකුවක් බවට පත් විය.

පනතේ අංක 12(අ) හා සංශෝධිතවලට අනුව බැංකුවේ අරමුණු වනුයේ, සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ නිවාස සිහිනය සැබෑ කර ගැනීමට නිවාස ආශ්‍රිත මූල්‍ය සම්පාදනයේ අවිවාදාත්මක වෙළඳපොළ නායකයා බවට පත් වීමය.

2016 වර්ෂයේදී නව ශාඛා විවෘත කිරීමක් සිදු නොවූ අතර, මුළු ශාඛා ජාලය එම වර්ෂය අවසන් වන විට 39 ක් විය. 2015 දී බැංකුවේ ණය කළඹ රු.බිලියන 26.684 ක් වූ අතර බැංකුවේ ණය කළඹ සියයට 13.39 කින් වර්ධනය වී 2016 වර්ෂය අවසාන විට එය රු.බිලියන 30.259 ක් වී තිබුණි. එහෙයින් බැංකුවේ පොළී ආදායම පෙර වර්ෂයේ රු.බිලියන 4.7 ට සාපේක්ෂව මේ වර්ෂයේ රු.බිලියන 5.4 දක්වා සියයට 17 කින් වර්ධනය වී තිබුණි. බැංකුවේ තැන්පතු පදනම, 2015 වර්ෂය අවසාන වන විට පැවති රු.බිලියන 28.59 සාර්ථකව සියයට 12.3 කින් වර්ධනය වී 2016 වර්ෂය අවසාන වන විට රු.බිලියන 32.12 ක් බවට පත් වී තිබුණි.

බැංකුවේ සමස්ථ වත්කම් පදනම රු.බිලියන 3.69 කින් එනම්, සියයට 8.8 කින් වර්ධනය වී 2016 වර්ෂය අවසාන වන විට එය රු.බිලියන 45.6 ක් විය. වත්කම් වල වර්ධනය සඳහා මූලික දායකත්වය ණය හා අත්තිකාරම් වල සිදු වූ සියයට 13 ක වර්ධනය හේතු විය.2015 වර්ෂයේදී සියයට 18.38 ක්වූ අක්‍රීය ණය ශේෂ අනුපාතය 2016 වර්ෂයේදී සියයට 17.58 ක් දක්වා අඩුවීම වර්ෂයේ වත්කම් වල ගුණාත්මකභාවය වර්ධනයට හේතු විය.

2016 වර්ෂය සඳහා බැංකුවේ බදු පෙර ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 17.8 ක අඩුවීමක් වාර්තා කරමින් රු.මිලියන 660 ක් බවට පත් වී තිබුණි. එසේම, ශුද්ධ ණය පොළී ආදායම 2015 වර්ෂය හා සසඳන විට රු.මිලියන 157 කින් එනම් සියයට 7.4 කින් පහත වැටී තිබුණි.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සහ කොටස් හිමියන්ට වටිනාකම් නිර්මාණය කිරීම පළමු ප්‍රමුඛතාවය වන අතර, සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ කොටස් හිමියන්ගේ අරමුදල් සියයට 10.4 කින් වර්ධනය වී ඇත. කොටසක වත්කම් අගය රු.51.98 සිට 2016 වර්ෂයේ දී, රු.57.68 දක්වා සියයට 10 ක වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් දුර්වල ඉපයීම් තත්ත්වය නිසා 2016 වර්ෂය තුලදි කොටසක ඉපයුම රු.7.87 සිට රු.6.03 දක්වා අඩු වී ඇත. ප්‍රධාන ප්‍රාග්ධන අනුපාතය (Tier 1) සහ මුළු ප්‍රාග්ධන අනුපාතය (Tier 2) අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 5 හා සියයට 10 ඉක්මවූ අතර එය පිළිවෙලින් සියයට 13.11 සහ සියයට 11.76 විය. කෙසේ වුවද, 2014 ජනවාරි 17 වන දින මූල්‍ය අංශයේ ආයතන ඒකාබද්ධ කිරීමට අදාළ ප්‍රධාන සැලසුමට අනුව නිකුත් කරන ලද ශ්‍රී ලංකා බැංකු මඟ පෙන්වීම් අංක 02/17/402/0073/002 යටතේ මූලික ප්‍රාග්ධනය 2016 ජනවාරි 01 වන විට රු.මිලියන 5,000 ක් විය යුතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රධාන වශයෙන් සූක්ෂම මූල්‍ය ආයතන සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා මූල්‍යමය සහාය ලබාදෙමින් සංවර්ධනය කාර්යයන් ප්‍රවර්ධනය කිරීම සහ කාන්තා අභිවෘද්ධිය මඟින් ශ්‍රී ලංකාවේ සමස්ත කලාපීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමේ අරමුණු ඇතිව 2010 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකු 06 ක් ඒකාබද්ධ කිරීම මඟින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිහිටුවන ලදී.

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී බැංකුවේ ශුද්ධ පොළී ආදායම රු.මිලියන 1, 025 ක් හෙවත් සියයට 15 ක ප්‍රතිශතයකින් වැඩිවී තිබුණි. 2015 වර්ෂය හා සැසඳීමේදී, සියයට 21 ප්‍රතිශතයක් සහිතව 2016 වර්ෂය තුළදී ලාභය රු.මිලියන 641 ක් දක්වා වැඩි

වී තිබුණි. තවද, 2016 වර්ෂය අවසානයේදී අක්‍රීය ණය අනුපාතය සියයට 2.85 ක් දක්වා අඩු වී ඇති බව නිරීක්ෂණය විය. ණය හා අත්තිකාරම් සහ ගණුදෙණුකරුවන්ගේ තැන්පතු පිළිවෙලින් සියයට 21 ක් හා සියයට 22 බැගින් වර්ෂය අවසානයේදී වැඩි වී තිබුණි. කෙසේ වුවද, අවදානම මත බර තැබූ මුළු වත්කම් වලට සාපේක්ෂව අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වූ සියයට 10 පවත්වාගෙන නොතිබූ අවස්ථාවක් 2016 වර්ෂයේදී නිරීක්ෂණය විය.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී බැංකුවේ ශුද්ධ පොළී ආදායම රු.මිලියන 85 ක් හෙවත් සියයට 15 ක ප්‍රතිශතයකින් වැඩිවී තිබුණි. 2015 වර්ෂය හා සැසඳීමේදී, සියයට 34 ප්‍රතිශතයක් සහිතව 2016 වර්ෂයේ ලාභය රු.මිලියන 258.7 ක් දක්වා වැඩි වී තිබුණි. පසුගිය වර්ෂය අවසානයට සාපේක්ෂව ණය හා අත්තිකාරම් රු.මිලියන 271 හෙවත් සියයට 10 කින් වැඩි වී තිබුණි. කෙසේ වුවද, වර්ෂය අවසානය වන විට අක්‍රීය ණය අනුපාතය සියයට 39.2 ක් දක්වා තවදුරටත් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. ගණුදෙණුකරුවන්ගේ තැන්පතු 2016 වර්ෂය අවසානය වන විට සියයට 19 කින් අඩු වී තිබුණි.

ප්‍රධාන විගණන සොයා ගැනීම්

ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගොඩනැගිලි කුලියට දීම

මුදල් නීති පනතේ 117 වන වගන්තියට අනුව "ශ්‍රී ලංකා මහ බැංකුව, ස්වකීය හිමිකමක් සපුරා ගැනීමේදී අත්පත් කර ගන්නා සම්බන්ධතාවයක් හැර වෙළෙඳාමක හෝ වෙනත් ලෙසකින් වාණිජ, කාර්මික හෝ වෙනත් ව්‍යාපාර කටයුත්තක නියැලිය නොයුතුය." මෙම විධිවිධානයට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් ගොඩනැගිලි අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන බාහිර පාර්ශ්වයන් සඳහා කුලියට ලබා දී තිබූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කුලී ආදායම ලෙස රු. මිලියන 426.6 ක් 2016 වර්ෂය තුළදී උපයා තිබුණි.

උපදේශක සභාව වෙනුවෙන් දැරූ උපදේශන සේවා පිරිවැය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් උතුරු හා නැගෙනහිර පළාත් වල පදිංචි අතුරුදහන් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා උපදේශක සභාවක් 2014 ජුනි මස 28 වන දින පත් කර තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කිසිදු ප්‍රතිපූරණය කිරීමේ පදනමකින් තොරව උපදේශක සභාව සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සඳහා උපදේශන ගාස්තු, නවාතැන් හා අනෙකුත් වියදම් වෙනුවෙන් 2015 වර්ෂය සඳහා රු. මිලියන 145 ක් සහ 2014 වර්ෂය සඳහා රු. මිලියන 111.5 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපාදන යොදා ගෙවා තිබුණි. උපදේශක සභාව සඳහා උපදේශන ගාස්තු ලෙස 2016 වර්ෂය තුළදී රු. මිලියන 21 ක් ගෙවා තිබුණි. ඉහත වියදම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කිසිදු ප්‍රතිපූරණය කිරීමේ පදනමකින් තොරව දරා තිබුණත්, මහ බැංකුව හා ඉහත සඳහන් උපදේශකවරුන් අතර කිසිදු ගිවිසුමක් නොතිබුණි. ඉහත උපදේශකවරුන්ගේ රාජකාරි ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු වලට සෘජුවම සම්බන්ධ නොවන බව තවදුරටත් නිරීක්ෂණය විය.

දෝෂ සහිත ක්‍රියාවන් සහ මූල්‍ය අක්‍රමිකතා

ප්‍රාථමික ගනුදෙනුකරුවකු සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි අරමුදල් වෙළෙඳාම් කළ හැකි ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීම් (tradable reverse repo) ආයෝජනවල

ආයෝජනය කර තිබුණි. ආපසු ගන්නා ලද සුරැකුම් සම්බන්ධයෙන් කිසිදු සුරැකුම් යළි පැවැරීමෙන් තොරව පාදක වූ සුරැකුම්පත් ප්‍රාථමික ගනුදෙනුකරු විසින් ආපසු ගැනීම හේතුවෙන් මෙම ආයෝජනයන් සම්බන්ධයෙන් ලංකා සිකියූර් සිස්ටම් (Lanka Secure System) හි ශූන්‍ය ශේෂයක් දක්වා තිබුණි. 2015 දෙසැම්බර් 04 දින ගන්නා ලද මුදල් මණ්ඩලයේ තීරණය ප්‍රකාරව, සහතික ඇප නොමැතිව ඉහත සඳහන් ආයෝජනයන් යළි යළි ආයෝජනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම ප්‍රාථමික ගනුදෙනුකරු සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් මඟින් කරන ලද සහතික ඇප නොමැති ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන වටිනාකම 2015 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 1.9 ක් විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2012 දෙසැම්බර් 10 සහ 14 දින වලදී පවත්වන ලද පරීක්ෂණ වලදී අනාවරණය කර ගන්නා ලද උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් (ඇතැම් ආයෝජකයින්ට ප්‍රමාණවත් සුරැකුම්පත් වෙන් නොකිරීම සහ දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් ලබා ගැනීම සඳහා ආයොජකයින්ගේ සුරැකුම්පත් භාවිතා කිරීම) ඉහත ප්‍රාථමික ගනුදෙනුකරු වෙත අවවාදාත්මක ලිපි කිහිපයක් සහ 2013 ජුනි 06 දින නියෝගයක්ද නිකුත් කර තිබිය දී, මෙම ප්‍රාථමික ගනුදෙනුකරුගේ ඉහත දෝෂ සහිත ක්‍රියාවන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා 2015 වර්ෂයේදී මෙම ප්‍රාථමික ගනුදෙනුකරු විසින් නැවතත් එවැනි දෝෂ සහිත ක්‍රියාවන් සිදු කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ අංශය විසින් 2015 මැයි 20 සහ 21 දින වලදී එම ප්‍රාථමික ගනුදෙනුකරු පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තිබුණි. ඉහත සඳහන් උල්ලංඝනයන් ඇතුළුව විවිධ රෙගුලාසි සහ නිර්දේශ උල්ලංඝනය කිරීම් ඉහත සඳහන් ස්ථානීය පරීක්ෂණය තුළදී නිරීක්ෂණය වී තිබුණි.

ලංකා බැංකුව

- 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ණය හා අත්තිකාරම් ශේෂය රු. මිලියන 1,047,189 ක් විය. ඉහත මුළු ණය සංයුතියෙන් රු. මිලියන 319,952 ක් හෙවත් සියයට 31 ක් සමන්විත වන්නේ රාජ්‍ය අධිකාරීන්ගෙන් හා රජයට අයිති ව්‍යවසායන්ගෙන් වන අතර, ඉතිරි රු. මිලියන 727,237 හෙවත් සියයට 69 ක් සමන්විත වන්නේ රාජ්‍ය නොවන ආයතනයන්ගෙනි. රජයේ ණය සංයුතියෙන් රු. මිලියන 30,998 ක ශේෂයක් රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු යයි හේතු සහිතව හඳුනාගත් ප්‍රමාණාත්මක ණය වලින් සමන්විත වන අතර ඒ සඳහා දරන ලද පාඩු සඳහා ප්‍රමාණාත්මක සාක්ෂි තිබුණ ද, එය තනි හානිකරණය යටතේ ගෙන නොමැත. ඉහත ශේෂයන් තුල රු. මිලියන 12,635, රු. මිලියන 7,742, රු. මිලියන 9,772, රු. මිලියන 496 සහ රු. මිලියන 352 ක් වශයෙන් පිළිවෙලින් නාගරික සංවර්ධන අධිකාරිය, සීමාසහිත සතොස, වී අලෙවි මණ්ඩලය, ආගරපතන වැවිලි සමාගම සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් ලැබිය යුතුව ඇත. වී අලෙවි මණ්ඩලයෙන් ලැබිය යුතු රු. මිලියන 3,802ක් හැර අනිත් සියලු ණය 2016 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර ඇපකර හෝ වෙනත් සුරැකුම් මඟින් ආවරණය වී නොමැත.

- බැංකුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 235,458 ක හඳුනාගත් ප්‍රමාණාත්මක ණය ප්‍රමාණයක් රාජ්‍ය නොවන ආයතනවලට ප්‍රදානය කර තිබුණි. එවැනි ප්‍රමාණාත්මක ණය වටිනාකමක් ලංකා බැංකුවේ මාලඹේ ශාඛාව විසින් දකුණු ආසියාතික

තාක්ෂණික හා වෛද්‍ය (පුද්.) ආයතනයට (South Asian Institute of Technology and Medicine (Pvt.) Ltd – SAITM) ප්‍රදානය කර තිබුණි. 2011 අගෝස්තු 30 දිනැති ගැසට් නිවේදනය අනුව, බැංකුව ශික්ෂණ රෝහලේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 600 ක් ප්‍රදානය කළ යුතුය. කෙසේ වෙතත්, 2017 ජුනි 05 දිනට ශික්ෂණ රෝහල, පශ්චාත් උපාධි ආයතනය හා ඉංජිනේරු පීඨයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් බැංකුව රු. මිලියන 1,820 ක් ප්‍රදානය කර ඇත. මීට අමතරව රු. මිලියන 925.5 ක් විශ්ව විද්‍යාලයේ හා රෝහලේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රදානය කර තිබුණි.

කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 28/2015 අනුව, ප්‍රදානය කළ යුතු උපරිම අගය වාණිජ දේපලක් අත්පත්කර ගැනීම සඳහා යන වියදමෙන් සියයට 60 කට සීමා කල යුතුය. නමුත් බැංකුව විසින් රෝහල් දේපලේ බලකල විකුණුම් වටිනාකමෙන් සියයට 87.4 ක ප්‍රතිශතයක් හා විශ්ව විද්‍යාල දේපලේ බලකල විකුණුම් වටිනාකමෙන් සියයට 94.81 ක ප්‍රතිශතයක් ලබා දී තිබුණි.

ඉහත පහසුකම් වලින් රු. මිලියන 1,625 ක අගයක් රෝහලේ දේපල උගස මත ප්‍රදානය කර තිබුණි. එම දේපලට නාගරික සංවර්ධන අධිකාරියෙන් 2012 මාර්තු 13 දින අවු. 30 ක කාලයකට ලබාගත් අක්කර 5 පර්චස් 28 ක ප්‍රමාණයක් සහිත කල්බදු ඉඩමක් අයත් වී තිබුණි. එසේ වුවත්, නාගරික සංවර්ධන අධිකාරියට රු. මිලියන 130 ක කල්බදු අගයක් ගෙවා ඇති අතර, ඉහත ණය ප්‍රදානය කරන විට බැංකුව ඉහත ඉඩමේ බලකල විකුණුම් වටිනාකම රු. මිලියන 414 ක් ලෙස සලකා තිබුණි.

තත්ත්වය එලෙස වුවත්, SAITM ආයතනයට 2017 මාර්තු සිට ණය වාරික ගෙවීමට නොහැකි වී ඇති අතර, එම ණය අක්‍රිය ණය ලෙස වර්ග වීම වැලැක්වීම සඳහා බැංකුව විසින් 2017 මැයි 02 වන දින මණ්ඩලයේ අනුමැතිය යටතේ පහසුකම් කිහිපයක් ලබා දී තිබුණි. ඒවා නම්, පවත්නා කාලීන ණය සඳහා 2017 මාර්තු සිට සැප්තැම්බර් දක්වා මාස 7 ක සහන ගෙවීම් කාලයක් අනුමත කිරීම, පවත්නා ණය වල පොලී ප්‍රමාණය ගෙවීම සඳහා සියයට 4 ක වාර්ෂික සහන අනුපාතයක් යටතේ රු. මිලියන 103 ක කාලීන ණයක් අනුමත කිරීම සහ රෝහලේ හා විශ්ව විද්‍යාලයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වාර්ෂිකව සියයට 12.5 ක සහන ප්‍රතිශතයක් යටතේ රු. මිලියන 300 ක කාලීන ණයක් අනුමත කිරීම මඟිනි. ඉහත ණය දෙක සඳහා ඉහත සහන කාලය සහ SAITM ආයතනයේ අධ්‍යක්ෂ වරුන්ගේ පුද්ගලික ඇප එදිරිව ප්‍රදානය කර තිබුණි. තවද SAITM ආයතනයේ ඉල්ලීම පරිදි, 2017 පෙබරවාරි මස අයකරගත් රු. මිලියන 27 ක ණය වාරික ආපසු ගෙවීමට බැංකුව කටයුතු කර තිබුණි. මෙම ණය පහසුකම් මාලඹේ ශාඛාවේ මුළු ක්‍රියාකාරි ණය වලින් සියයට 45.5 ක ප්‍රතිශතයක් වන අතර මෙවැනි තත්වයක් තුල ණය අයකර ගැනීමේ අවදානම වැඩි කරයි.

- ලංකා බැංකුවට අයිති මහල් 6 කින් සමන්විත වර්ග අඩි 261,610 ක ගොඩනැගිල්ලක් යෝර්ක් වීදියේ පිහිටා ඇත. එම මුළු ප්‍රමාණයෙන් වර්ග අඩි 163,890 ක් අගනුවර ශාඛාව (මෙට්‍රොපොලිටන්) හා බස්නාහිර පළාත් උතුරු කාර්යාලය 2013 වසර දක්වා භාවිතා කර තිබූ අතර ඉතිරි වර්ග අඩි 97,720 ක් සීමාසහිත හොටෙල්ස්

කළම්බු (1963) (Grand Oriental Hotel) ආයතනය විසින් මේ දක්වා භාවිතා කරනු ලබයි. 2016 ඔක්තෝම්බර් 17 දිනැති තක්සේරු වාර්තාවට අනුව ඉඩමේ සහ ගොඩනැගිල්ලේ වටිනාකම රු. මිලියන 3,413 ක් විය. කෙසේවෙතත් 2013 වසරේ සිට ගොඩනැගිල්ලෙන් සියයට 60 කට වැඩි සැලකිය යුතු ප්‍රමාණයක් භාවිතයට ගෙන නොමැත.

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉන්ජිනේරු පීඨයේ සිවිල් ඉන්ජිනේරු දෙපාර්තමේන්තුව විසින් එම ගොඩනැගිල්ලේ ව්‍යුහගත තක්සේරුව පිළිබඳ 2010 වසරේ දී කරන ලද වාර්තාව අනුව, උග්‍ර ලෙස දිරාපත්වීමට ලක් වූ බොහෝමයක් බරඋසුලන ව්‍යුහගත අංගයන් පෙන්වා දී, ගොඩනැගිල්ල පිළිබඳ නිර්දේශයන් 15ක් යෝජනා කර ඇත. කෙසේවෙතත්, ඉහත සඳහන් කාර්යාල දෙක සඳහා කුලිය වශයෙන් රු. මිලියන 359 ක අමතර පිරිවැයක් බැංකුව විසින් 2013 වසරේ සිට දරා තිබුණි.

සමාගම් 3ක් ලංකා බැංකුව සමඟ බදු ගිවිසුමකට එළඹීමෙන් හෝ කිසිඳු බද්දක් ගෙවීමෙන් තොරව ගොඩනැගිල්ලේ පළමු මහලේ කොටස් 3ක පදිංචි වී සිටින බව 2017 අප්‍රේල් 27 වන දින සිදු කළ අපගේ පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කළමනාකාරීත්වය ඉහත ගැටළුව විසඳීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගෙන නොමැත.

මහජන බැංකුව

- බැංකුව විසින් පුත්තලම ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, උඩුපුස්සැල්ලාව ශාඛාව හා ඇවරිවත්ත ශාඛාව ඉදිකිරීම් ව්‍යාපෘති වෙනුවෙන් රු.3,601,897 ක වියදම් දැරීමෙන් අනතුරුව, මෙම අයවැයගත ව්‍යාපෘතීන් නවතා දැමීමට තීරණය කල අතර එම වියදම ලාභ අලාභ ගිණුමට හර කර තිබුණි.
- බැංකුවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ත්‍රිකුණාමලය ශාඛාව, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, බේරුවල ශාඛාව සහ මාතලේ ශාඛාව ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර රු.10,725,573 ක වියදමක් දැරීමෙන් අනතුරුව ඉදිකිරිම් ඉංජිනේරු කටයුතු පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම වෙත භාරදෙන ලදි. මේ හේතුවෙන් ත්‍රිකුණාමලය ශාඛාවට අදාල වූ රු.2,536,340, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයට අදාල වූ රු.6,378,155 සහ බේරුවල ශාඛාවට අදාල වූ රු.202,356 වියදම් ලාභඅලාභ ගිණුමට මාරු කර තිබූ අතර මාතලේ ශාඛාවට අදාල වූ රු.1,608,722 ක වියදම අවිනිශ්චිත ගිණුමේ රඳවා තිබූ බව නිරීක්ෂණය විය.

- බැංකුව විසින් ඉදිකිරීමට තීරණය කරන ලද වදුරඹ, බදුරලිය හා බොරලන්ද ශාඛා පරිශ්‍ර වෙනුවෙන් වෙනත් වියදම් දැරීමෙන් අනතුරුව ඉදිකිරීම් තාවකාලිකව නවතා දැමීමට තීරණය කරන ලද අතර එම වියදම් ලාභාලාභ ගිණුමට මාරු කර තිබූ බව නිරීක්ෂණය විය.

- 1961 අංක 29 දරන මහජන බැංකු පනතට අනුව බැංකුවේ අනුදත් කොටස් ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් 20,000,000 කට සීමා විය. බැංකුව කොටස් 999,960 ක් නිකුත් කර තිබුණද, විභජනයට නියමිතව ඇති ප්‍රාග්ධනය රු.මිලියන 7,152 ක් වන අතර, එය පනතේ සඳහන් අනුදත් ප්‍රාග්ධනයද ඉක්මවන කොටස් 143,040,000 ප්‍රමාණයකට සමානය. කෙසේ වුවද, ප්‍රාග්ධන විභජනයට නියමිත ගිණුමේ රඳවා ඇති රු.මිලියන 7,152 ක් වන

අනුදත් කොටස් ප්‍රාග්ධනය මහජන බැංකු පනත සංශෝධනය කර තවදුරටත් වැඩි කළයුතුව ඇත.

- බැංකුව විසින් ඉදිකිරීම් අවසන් කරන ලද බේරුවල, හතරලියද්ද, හක්මන, කොඩික්කාමම්, මතුගම සහ නාවුල්ල ශාඛාවන්ට අදාල රු.634,655,694 ක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ රඳවා තිබුණි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

- ස්වැප් පිරිවැය(swap cost) ලෙස බැංකුව විසින් 2016 වර්ෂයේදී ගෙවන ලද රු. මිලියන 403.232 සහ රු. මිලියන 842.667 ක් පිළිවෙලින් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස පෙන්වා තිබුණි.ස්වැප් පිරිවැය (swap cost) සම්බන්ධයෙන් කිසිදු ලේඛණගත සාක්ෂි හෝ ණය ගිවිසුමේ කිසිදු කොන්දේසියක් නොමැති වීමෙන් 2016 දෙසැම්බර් 31 දිනට මෙම වටිනාකම අයකරගැනීම අවිනිශ්චිතව පැවතුණි.

- පෙර වර්ෂය හා සැසඳීමේදී 2016 දෙසැම්බර් 31 දිනට වංචනික මුදල් ආපසු ගැනීම් වටිනාකම රු.මිලියන 95.5 ක් වන අතර එය රු. මිලියන 1.2 හෙවත් සියයට 1.27 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මේ අතරින් රු. මිලියන 95 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟව පවතින අතර රු. මිලියන 8.8 ක් වසර 5 කට වඩා වැඩි කාලයක් හිගව පැවතුණි. තවද, හිඟ ශේෂ අතුරින් කෑගල්ල හා මීගමුව ශාඛාවන් සම්බන්ධයෙන් රු. මිලියන 0.19 ක් හා රු, මිලියන 0.05 ක් පිළිවෙලින් වසර 21 ක් හා වසර 14 ක් පුරා හිඟව පැවතුණි.

- 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 47 (4)වගන්තිය ප්‍රකාරව, හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කල මුදලින් ගණුදෙනුකරුවන්ට ගෙවූ මුදල්, භාණ්ඩාගාර ලේකම් විසින් ඒකාබද්ධ අරමුදලින් බැංකුවට හැකි තරම් ඉක්මනින් ගෙවිය යුතුය. බැංකුව විසින් 2000-2016 දක්වා කාලය ඇතුලත රු. මිලියන 1,115.432 ක් එලෙස ගෙවා තිබුණද, 2017 ජූලි වන විටත් භාණ්ඩාගාර ලේකම් විසින් කිසිදු මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

- 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා බැංකු අංශයේ මුළු තැන්පතු පදනම සියයට 143 කින් වැඩි දියුණු වී තිබුණද, අදාල කාලය තුල ජාතික ඉතිරි කිරීමේ බැංකුව සියයට 85 ක් පමණක් වන වර්ධනයක් ලභා කරගෙන තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් වසර 7 ක කාලයක් තුල ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෙළඳපොළ කොටස සියයට 13.7 සිට සියයට 10.4 දක්වා අඩුවෙමින් පැවතුණි. තවද, බැංකු අංශයේ මුළු වත්කම් අනුව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෙළඳපොළ කොටස 2014 වර්ෂයේදී සියයට 11 කට වැඩි වුවද, ඉන් පසු සියයට 11 කට පහලින් පැවතීම මගින් අඩුවීමේ නැඹුරුවක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුවද, 2015 සහ 2016 වර්ෂයන්හිදී බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ වෙළඳපොළ කොටස සියයට 75 කට වැඩියෙන් පවත්වාගෙන ගොස් තිබුණි.

- එක්සත් ජනපද ඩොලර් මිලියන 250 ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවට_අදාල නිකුත්කිරීමේ ලියවිල්ල ප්‍රකාරව, බැඳුම්කර නිකුත් කිරීමෙන් ලැබෙන මුදල් යටිතල පහසුකම් සපයන රාජ්‍ය ව්‍යවසායන්, රජයට අයිති හෝ පාලනය කරන ව්‍යාපෘතිවලට නිකුත්කළ යුතුය

යන්නට අනුගත නොවී ලැබූ මුළු මුදල් ප්‍රමාණයම ලද දින සිටම භාණ්ඩාගාර බැඳුම්කර සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

- 2016 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් රු. මිලියන 280,718 ක මුදලක් ණය පහසුකම් ලෙස ලබා දී තිබුණු අතර ඉන් රු. මිලියන 4,774 ක් හෙවත් සියයට 1.70 ක් අක්‍රීය ණය ශේෂ ලෙස පෙන්නුම් කර තිබුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට මුළු උකස් ණය අතරින් රු. මිලියන 2,348 ක් හෙවත් සියයට 12.37 ක් අක්‍රීය ණය ලෙස වාර්තා වී තිබුණි.

- බැංකුවේ ප්‍රධාන කාර්යාලය සඳහා මහල් 18 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් 2008 වර්ෂයේ සිට රු. මිලියන 35.23 ක මුදලක් වියදම් කර තිබුණි . මෙම ප්‍රදේශය අධි ආරක්ෂක කලාපයක් යටතට අයිති වන බැවින්,පසුගිය වර්ෂයන් තුල කිසිදු ඉදිකිරීමක් සිදු නොකර 2016 දෙසැම්බර් 31 දිනට මෙම වියදම කෙරීගෙන යන වැඩ ලෙස පෙන්වා තිබුණි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

- 2016 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි නොසැසඳූ පාලන ගිණුම් ලෙස රු. 8,614,361 ක ප්‍රමාණයක් පෙන්වා තිබුණි. වර්ෂය තුලදී පිළිවෙලින් රු. 58, 137 ,838 ක සහ රු. 42, 526,685 ක මුදලක් මෙම ගිණුමට හර සහ බැර කර තිබුණ ද, ඉන් හර හා බැර සටහන් බොහොමයක් පසුගිය වර්ෂයන්ට අදාල වන අතර ඒවා සඳහා ප්‍රමාණවත් තොරතුරු ලැබී නොතිබුණි. ඒ අනුව රු. 24, 225, 514 ක හර ශේෂයක් මූල්‍ය ප්‍රකාශනයේ වෙනත් වත්කම් යටතේ පෙන්වා තිබුණි. ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම හේතුවෙන් මෙම වටිනාකම අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත විය.

- 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු සහ ජාතික ගොඩනැගීමේ බදු ගිණුම් වල රු. 13,199,560 ක අසාමාන්‍ය හර ශේෂයක් පවතී. මෙම ශේෂයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සනාථ කර නොතිබූ අතර, ඒ අනුව එම දිනට මෙම ශේෂය අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත විය.

- 2016 දෙසැම්බර් 31 දිනට "උපලබ්ධිය සඳහා වූ චෙක්පත්" ගිණුමේ රු.12,407,870 ක අසාමාන්‍ය හර ශේෂයක් තිබූ අතර, එසේ හෙයින් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙනත් ණයගැති වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

- ණය ගිණුම්වලට වෙන් නොකළ ශේෂය ලෙස රු.168,317,332 ක් මූල්‍ය ප්‍රකාශනයන්වල පැවතුණි. එසේ වුවත්, ඊට සැපයූ කාල විශ්ලේෂණය ප්‍රකාරව, එම ශේෂය රු.148,743,268 ක් වීමෙන් 2016 දෙසැම්බර් 31 දිනට වෙනත් ණයහිමියෝ රු.19,574,064 කින් වැඩියෙන් දක්වා තිබුණි.

- 2016 දෙසැම්බර් 31 දිනට නොසසඳන ලද අන්තර් බැංකු ගිණුම් අතර වෙනස රු. 1,856,831 ක් විය.

- අවිනිශ්චිත ස්වභාවයේ පවතින රු. 799,884 ක වටිනාකමක් වෙනත් ණයගැතියෝ තුල ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් විගණනයට සපයා නොතිබුණි.

- මූල්‍ය ප්‍රකාශනයන්හි පෙන්නුම් කරන ලද රු.30, 891,485 ක වටිනාකමකින් යුත්

ගිණුම් තුනක ශේෂයන් සඳහා විගණනයට ප්‍රමාණවත් සාක්ෂි ලබා නොදීම හේතුවෙන් විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි වීය.

- 2015 හා 2016 වර්ෂයන් දෙකෙහිම බැංකුවේ ද්‍රවශීලතාවය බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට වඩා පහළ තත්වයක පැවතුණි. විස්තර පහත වගුව හි දැක්වේ.

ද්‍රවශීලතා අනුපාතය	2016		2015	
	රා.උ.ආ.බැංකුව සියයට	බ.වි.බැංකු අංශය සියයට	රා.උ.ආ.බැංකුව සියයට	බ.වි.බැංකු අංශය සියයට
ද්‍රවශීල වත්කම්/තැන්පතු	22.82	61	23.64	67.2

- ද්‍රවශීලතා අනුපාතය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හා බලපත්‍රලාභී විශේෂ බැංකු

ඒ අනුව 2015 හා 2016 වර්ෂය තුළදී බැංකුවේ ද්‍රවශීලතා අනුපාතය කර්මාන්තයේ සාමාන්‍යයට වඩා පහත තත්වයක පැවතුණ අතර 2015 වර්ෂය හා සැසඳීමේදී එය 2016 වර්ෂයේදී සියයට 0.82 කින් අඩු වී තිබුණි.

- 2011 වර්ෂයේ සිට 2016 වර්ෂයට බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය මත පදනම් වූ බැංකුවේ වෙළඳපොළ කොටස පදනම් ලකුණු (Basis Points) 10 කින් අඩු වී තිබුණි. කෙසේ වුවත්, 2015 වර්ෂය සමඟ සසඳන විට එය පදනම් ලකුණු (Basis Points) 16 කින් අඩු වී ඇත.

- 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය රු. මිලියන 28,528 ක් වූ අතර ඉන් රු. මිලියන 7,815 ක වටිනාකමක් ක්‍රියාකාරී නොවන ණය ලෙස හඳුනාගෙන තිබුණි. එය මුළු හිඟ ණය වලින් සියයට 27 ක් නියෝජනය කෙරිණි.

- අභ්‍යන්තර විගණන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව සේවකයින් පහකට සීමා වී තිබුණි. රු. මිලියන 4,918 ක් වන බැංකුවේ ශුද්ධ වත්කම් ප්‍රමාණය සහ මෙහෙයුම් ක්‍රියාවලියේ සංකීර්ණතාවය අනුව අභ්‍යන්තර පාලනයේ වැදගත් ප්‍රදේශයන් ආවරණය කිරීමට අභ්‍යන්තර විගණන අංශයේ කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීය. තවද, බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2016 ජනවාරි 01 වන දින සිට පුරප්පාඩුව පැවතුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

- 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 9.2 (ආ) හා (ඇ) ඡේද වලට ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයක් සහිත සංවිධාන සටහනක් බැංකුව සතු නොවූ අතර එය මහා භාණ්ඩාගාරයේ ලියාපදිංචි කළ නොතිබුණි.

- 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව, සෑම රාජ්‍ය ව්‍යවසායක් සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් හා එක් එක් තනතුර සඳහා උසස්වීම් පටිපාටියක් තිබිය යුතු අතර එම පරිපාටි මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය සහිත අධ්‍යක්ෂ මණ්ඩලය හා අදාළ අමාත්‍යාංශ විසින් අනුමත කළ යුතු වුවද, එම අවශ්‍යතාවයට බැංකුව අනුකූල වී නොතිබුණි.

- පවරාගත් දේපළ වල හිඟව තිබූ රු.මිලියන 14.42 ක සම්පූර්ණ ශේෂයම අයකර ගැනීමකින් තොරව විකිණීම හේතුවෙන් රු.මිලියන 9.36 ක අලාභයක් බැංකුවට දැරීමට සිදුවී තිබුණි.

- 1997 අංක 7 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනය රු. මිලියන 1,000 විය යුතු වුවද, 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.මිලියන 962.09 ක් විය.

- 2012 අංක 2 දරන බැංකු පනතේ වගන්ති අංක 4(1)(IV) යටතේ මඟපෙන්වීම් 6.1 ට අනුව, බාහිර පාර්ශවයකින් සේවා ලබා ගැනීමේදී ටෙන්ඩර් ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතුය. බැංකුව ඊට අදාළව 2014 දී ස්ථාපිත ප්‍රතිපත්තිය අනුව ද, මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවීම මඟින් බාහිර පාර්ශවයකින් සේවා ලබාගැනීම කළ යුතු බවට තහවුරු කර තිබුණ ද, එය අනුගමනය නොකරමින් ණය අය කර ගැනීමේ කාර්යය සඳහා ආයතනයක් පත් කරගෙන තිබුණි.

- සීබැන්ක් අරමුදලේ රු.මිලියන 25ක ආයෝජනයට අදාළව ආයෝජන ප්‍රතිලාභ 2015 වර්ෂයේ සිට ලැබී නොතිබුණි.

- 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැසුම, විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුම හා ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

- ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සඳහන් අරමුණු ළඟාකර ගැනීම සඳහා මුළු ඉලක්ක ගත ණය වූ රු.මිලියන 73,735 න් රු.මිලියන 38,014 ක් හෙවත් සියයට 52 ක ප්‍රතිශතයක් ඉලක්ක කර තිබුණි. බැංකුව කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳ හා වාණිජ, පශු සම්පත් හා ධීවර යන අංශ සඳහා රු.මිලියන 21,428 ක ණය ද, කුඩා හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා රු.මිලියන 9,342 ක් ණය ද, ලබා දී තිබුණි. තවද, පාරිභෝගික ණය, නිවාස ණය, තැන්පතු මත ලබාදුන් ණය සහ කාර්ය මණ්ඩල ණය වශයෙන් රු.මිලියන 27,166 ක් ද, උකස් ණය වශයෙන් රු.මිලියන 13,471 ක් ද, ලබා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට බැංකුව මුදා හැර ඇති මුළු ණය ප්‍රමාණය රු.මිලියන 71,407 ක් විය.

- අයවැය යෝජනාවක් වූ ලිය ඉසුර ණය ක්‍රමය මඟින් 2015 දෙසැම්බර් 31 දිනට 15,199 ක ණය සංඛ්‍යාවක් රු.මිලියන 2,443.93 ක වටිනාකමකින් යුතුව පොළී රහිතව ලබා දී තිබුණි. කෙසේ වුවද, ඊට අදාළ අරමුදල් පිරිවැය රජය මඟින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 62.92 ක් මුළු අක්‍රීය ණය ලෙස වාර්තා වූ අතර ඉන් රු.මිලියන 23.12 ක් අලාභ වර්ගීකරණයේ විය.

- 2006 අංක 10 දරන ආදායම් බදු පනතේ 114 වන වගන්තිය අනුව උපයන විට ගෙවීමේ බද්ද සේවකයින්ගේ ආදායමෙන් අඩු කර ප්‍රේෂණය කළයුතු වුවද, එසේ අඩුකිරීමකින් තොරව 2016 වර්ෂය සඳහා සේවකයින්ගේ උ.වි.ගෙ. බදු වියදම ලෙස රු. මිලියන 20.4 ක් බැංකුව වැය කර තිබුණි.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව

- ප්‍රධාන බැංකු කටයුතු කෙරෙහි ඇති අඩු අවධානය නිරූපණය කරමින් 2016 වර්ෂය සඳහා මුළු පොළී ආදායම වූ

රු.මිලියන 707 න් රු.මිලියන 339 ක් හෙවත් සියයට 48 ක පමණක් ණය හා අත්තිකාරම් මත පොළී ආදායම නිරූපණය විය. 2016 වර්ෂයේ දී ආයෝජන මත පොළී ආදායම් රු.මිලියන 368 ක් හෙවත් සියයට 52 ක ප්‍රතිශතයක් විය. එබැවින්, ආයෝජන ක්‍රියාකාරකම් මත පොළී ආදායම් ඉපයිය නොහැකිව තිබුණේ නම් බැංකුවට මෙහෙයුම් අලාභයක් හිමිවිය හැකිව තිබුණි.

- බැංකුවේ තැන්පතු පදනම 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 420.8 ක් දක්වා අඩු වී තිබූ අතර පසුගිය වර්ෂය අවසානය හා සැසඳීමේදී සියයට 19 ක ප්‍රතිශතයකින් අඩු වීමක් නිරූපණය විය. වසර 5 ක කාලපරිච්ඡේදය තුළ බැංකුවේ වෙළඳපොළ කොටස සියයට 1 ප්‍රතිශතයකට වඩා අඩු අගයක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී ණය හා තැන්පතු වල වෙළඳපොළ කොටස පිළිවෙළින් සියයට 5.5 ක ප්‍රතිශතයකින් හා සියයට 27 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

- බැංකුවේ අක්‍රීය ණය හා අත්තිකාරම්, මුළු ණය හා අත්තිකාරම් වලින් රු.මිලියන 1,467 ක් හෙවත් සියයට 39.2 ක් විය. එයින් රු.මිලියන 919 ක් හෙවත් සියයට 63ක් පාඩු වර්ගීකරණය යටතේ වර්ග කර ඇත.

රට තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා ආහාර නිෂ්පාදනය වැඩි කිරීම මෙම ක්ෂේත්‍ර යෙන් අපේක්ෂා කරන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනිම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- කෘෂිකර්ම ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මික විවිධාංගීකරණය හා නිෂ්පාදන වැඩිදියුණු කිරීම.
- කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම.
- පාංශු සංරක්ෂණ පනත, ගස් කැපීම පාලනය කිරීමේ පනත, බීජ පනත, පැලෑටි ආරක්ෂණ ආඥා පනත, පොහොර පනතේ විධිවිධාන සහ පලිබෝධනාශක පනත පරිපාලනය.
- කෘෂිකාර්මික අධ්‍යාපනය, පර්යේෂණ හා ව්‍යාප්ති සේවා.
- පුරන් කුඹුරු සංවර්ධනය.
- කෘෂි ව්‍යවසාය, පශු අස්වනු තාක්ෂණය හා අධීතාක්ෂණික කටයුතු සංවර්ධනය.

කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු දෙකකින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන 12 කින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි. එම ආයතන පිළිබඳව සිදු කරන ලද විගණනවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පින්ඩනය කර පහත දැක්වේ.

"ගම්දොර" වැඩසටහන ක්‍රියාත්මක කිරිම

කෘෂිකර්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ ප්‍රායෝගික දැනුම හා තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි "ගම්දොර" නමින් විශේෂ වැඩසටහනක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර තිබුණි. මෙම වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් ද මේ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේද එය ඇතුළත් කර නොතිබුණි. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතියද ලැබී නොතිබුණු අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ලේඛනයෙන් පොහොර සහනාධාරය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 62 ක් මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන සලසා ගෙන එය ක්‍රියාත්මක කර තිබුණි.

"ගොවි සතිය" වැඩසටහන

කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන හතරක් මගින් " ගොවි සතිය" වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. මෙහිදී කිරි අම්මාවරු 252 ක් සඳහා දානය පිරිනැමීමට රු.මිලියන 1.97 ක් ද, කාන්තා ගොවි සම්මේලනය සඳහා රු.මිලියන 8.9 ක් හා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් සඳහා රු.මිලියන 14.4 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. මීට අමතරව ගොවි සතිය වැඩසටහන වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මාධ්‍ය ආවරණය කටයුතු සඳහා රු.මිලියන 16.78 ක් වැය කර තිබුණි.

වැව්, අමුණු, ඇල මාර්ග,ජල ප්‍රවාහ පද්ධති හා කෘෂි පාරවල් ප්‍රතිසංස්කරණය කිරීම

අතහැර දමන ලද වැව් පිළිසකර කිරීම, ගොවීන්ට අවශ්‍ය ජලය අඛණ්ඩව සැපයීම සඳහා අමුණු ප්‍රතිසංස්කරණය කිරීම හා ජල ප්‍රවාහ පද්ධති, ඇල මාර්ග වැඩි දියුණු කිරීමේ අරමුණෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 1,971 ක් වැය කර තිබුණි. එම වියදම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අමුණක් තැනීම සඳහා රු.මිලියන 2.05 ක් වැය කර තිබුණි. නමුත් එම ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිම කර නොතිබුණි.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉලුපන්කඩවල සිට ඉදිගස්පොතාන දක්වා කෘෂි පාර රු.මිලියන 1.53 ක් වැය කර ප්‍රතිසංස්කරණය කිරීම සැලැසුම් කළ පරිදි ඉටු කර නොතිබුණි.

- ඉහළ ඉදිගස්පොතාන පහලතලාව කෘෂි පාර රු.මිලියන 1.03 ක් වැය කර ඉදි කර තිබුණත්, එය සැලැසුම් කළ පරිදි බෝක්කුවේ පැති බැමි ඉදි කර නොතිබුණි. මේ හේතුවෙන් බෝක්කු කැඩීයාමේ අවධානමක් පැවතුණි.

- දිස්ත්‍රික්ක 4 ක කෘෂි මාර්ග ඇස්තමේන්තු අනුව ඉදිකර නොතිබූ අතර ඇල මාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා ඒවා වල් බිහි වී තිබුණි.

පොහොර සහනාධාර ගෙවීම

2016 වර්ෂයේ පොහොර සහනාධාරය ගෙවීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.බිලියන 35 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 යල කන්නය සඳහා රු.බිලියන 6.47 ක් හා මහා කන්නය සඳහා රු.බිලියන 6.85 ක් වැය කර තිබුණි. බැංකු මඟින් සහනාධාර මුදල් ගෙවීමේ දී ලංකා බැංකුව මඟින් වී ගොවීන් 454 ක් සඳහා රු.මිලියන 2.41 ක් ගොවීන් නොවන වෙනත් පුද්ගලයින්ගේ ගිණුම්වලට බැර කර තිබුණි. රාජාංගනය වම් ඉවුර ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයේ එක් ගොවි මහත්මියක් සඳහා ගෙවිය යුතු රු.10,000 ක මුදල වෙනුවට රු.මිලියන 2.81 ක් වැරදීමකින් බැර කර තිබුණි. එසේම 2016 යල කන්නයේ වගා නොකළ දිස්ත්‍රික්ක 12 ක හෙක්ටයාර 740110 ක ඉඩම් සඳහා රු.මිලියන 1,045.25 ක සහනාධාර ගෙවා තිබුණි. නමුත් 2016 යල කන්නය අවසන් වීමෙන් පසුව 2016 යල කන්නය වෙනුවෙන් රු.මිලියන 3,554.39 ක් 2016 ජූනි 30 දිනෙන් පසුව ගෙවා තිබුණි. මේ හේතුව නිසා පොහොර සහනාධාර නිකුත් කළ යුතුව තිබුණු යල කන්නය අවසානවීමට ප්‍රථම වුවත්, ඊට පසුව සහනාධාර ගෙවීම නිසා වැඩසටහනේ මූලික අරමුණු ඉටු වී නොතිබුණි.

පුරන් කුඹුරු අස්වැද්දීම

2016 වර්ෂය සඳහා දිස්ත්‍රික්ක 25 සඳහා පුරන් කුඹුරු අක්කර 30,000 ක් අස්වැද්දීමට රු.මිලියන 1,320 ක ප්‍රතිපාදන සලසා තිබුණි. පුරන් කුඹුරු අක්කර 30,000 ක් හා සුළු වාරිමාර්ග 902 ක් සංවර්ධනය කළ යුතු වුවත් පුරන් කුඹුරු අක්කර 5,950 ක් එනම් සියයට 20 ක් හා වාරිමාර්ග 587 ක් හෙවත් සියයට 65 ක් පමණක් සංවර්ධනය කර තිබුණි. දිස්ත්‍රික්ක 16 ක පුරන් කුඹුරු කිසිවක් අස්වද්දා නොතිබුණි.

අතිරේක කාර්යාල ඉඩ අවශ්‍යතා ලබා ගැනීම

2015 සැප්තැම්බර් 27 දිනැති අංක 15/130/702/007 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය ලබා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යංශයේ ස්ථාපිත කර තිබුණු ගොවිජන මන්දිරය ගොඩනැගිල්ල යොදා ගැනීමට තීරණය කර තිබුණි. ඒ සඳහා රාජගිරියේ ඉදි කර තිබුණු මහල් 9 කින් යුත් ගොඩනැගිල්ලක් බාහිර පුද්ගලයෙකුගෙන් බදු පදනමට ලබාගෙන තිබුණි. මෙම ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියෙන් තොරව මහල් දෙකක් ඉදිකර තිබුණු අතර 2016 අප්‍රේල් මාසයේ සිට 2017 ජූලි මාසය දක්වා කුලී වශයෙන් රු.මිලියන 315 ක්ද, ඒ සඳහා එකතු කළ අගය මත බදු, තුන්වන හා හතරවන කාර්තු සඳහා ජාතිය ගොඩනැගීමේ බදු සඳහා රු.මිලියන 53.64 ක් හා තුන්වන හා හතරවන වර්ෂ දෙක සඳහා ගෙවීමට නියමිත කුලිය වෙනුවෙන් රු.මිලියන 504 ක අත්තිකාරම්ද ඇතුළුව එකතුව රු.මිලියන 872.64 ක් 2017 ජූලි 31 දින වන විටත් ගෙවා තිබුණි. මෙම ගොඩනැගිල්ල කාර්යාල පරිසරයකට සුදුසු ලෙස සකස් කිරීම සඳහා 2017 ජූලි මාසය වන විට තවත් රු.මිලියන 148 ක් වැය කර තිබුණි. මාස 15 ක කාලයක් ගොඩනැගිල්ල පරිහරණය කර නොතිබුණු අතර ඒ සඳහා රු.මිලියන 6.18 ක් සේවා ගාස්තු සඳහා ගෙවා තිබුණි.

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය 2000 වර්ෂයේ පිහිටුවීමෙන් පසු සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 16 ක් තුළ යාන්ත්‍රික ඉංජිනේරු අංශය යටතේ විවිධ තාක්ෂණික යන්ත්‍ර 37 ක් නිෂ්පාදනය කර තිබුණි. ඉන් යන්ත්‍ර 03 කට පමණක් පේටන්ට් හිමිකම ලබාගෙන තිබුණු නිසා එම නිෂ්පාදනවලින් සියයට 92 ක් වූ යන්ත්‍ර සඳහා ආයතනයට අනන්‍යතාවයක් ලැබී නොතිබුණි. එම යන්ත්‍ර වර්ග 37 කින් යන්ත්‍ර වර්ග 24 ක් 2016 දෙසැම්බර් 31 දිනවන විටත් ක්ෂේත්‍රයේ භාවිතයට ගෙන නොතිබුණි.

- 2015 වර්ෂයේදී ආයතනයේ රසායනාගාරය නවීකරණය කිරීම වෙනුවෙන් රු. මිලියන 61.6 ක උපකරණ මිලදී ගැනීමේදී විධිමත් තාක්ෂණික ඇගයීමක් සිදු නොකිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා ආයතනයට රු. මිලියන 16.6 කට වැඩි අලාභයක් සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර රසායනාගාරය සඳහා මිලදී ගෙන තිබු යන්ත්‍ර අතරින් පූර්ණ වායුසමන තත්ත්වයක පවත්වා ගැනීම සඳහා මිලදී ගෙන තිබුණු රු.මිලියන 15.22 ක් වූ Gas chromatograph mass Spectrometer උපකරණය 2017 ජුනි 30 දින වන විටත් ආයතනයේ කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය

වී වගා රක්ෂණය ගොවියාට හඳුන්වාදෙමින් 1973 දී ආරම්භ කළ මෙම යෝජනා ක්‍රමය වර්තමානය වන විට කෘෂිකාර්මික උද්‍යාන භෝග හා ඖෂධීය පැළෑටි, පශු සම්පත්, ධීවර හා වනවගා, කෘෂි උපකරණ, ගබඩා හා තෙවන පාර්ශව රක්ෂණාවරණය ලබාදීම තුළින් ගොවියාට සහන සැලසීමට අරමුණු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ධීවර හා

වන වගා නිෂ්පාදනය සම්බන්ධ රක්ෂණය ආරම්භ කර නොතිබුණු අතර ඉලක්කගත ගබඩා 275 කින් එක් ගබඩාවක් පමණක් රක්ෂණය කර තිබුණි. පශු සම්පත්, තොග, කෘෂි උපකරණ, සුවසෙත රක්ෂණ ක්‍රමවල භෞතික හා මූල්‍ය ඉලක්ක ඉටුකර ගැනීම සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. එසේම තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ඉලක්ක ගත ආදායම රු.මිලියන 27.95 ක් වුවද, සත්‍ය ආදායම රු.මිලියන 8.47 ක් වී තිබුණි. ඉන් මෙහෙයුම් වියදම් අඩුකළ විට ලබා තිබූ ශුද්ධ ආදායම රු.මිලියන 1.96 ක් වී තිබුණි.

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත මඟින් පිහිටවා තිබුණු මෙම අරමුදල සඳහා 2016 දෙසැම්බර් 31 දිනට දායකත්වය ලබා සිටින ගොවීන් සංඛ්‍යාව 959,254 ක් වන අතර මාසික විශ්‍රාම වැටුප්ලාභීන් සංඛ්‍යාව 141,260 ක් වී තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා යෝජනා ක්‍රමයට සමාජිකයින් බඳවා ගෙන නොතිබුණි.

2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පල කර තිබුණු දැන්වීමේ සඳහන් නව යෝජනා ක්‍රියාත්මක විය යුතුව තිබුණද, විශ්‍රාම වැටුප් ගෙවීම නව යෝජනා ක්‍රමය අනුව සිදුකර, දායක මුදල් අයකිරීම පැරණි ක්‍රමය මත සිදුකර තිබුණි. මේ අනුව 2014 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා එකතුව රු.මිලියන 5,047.72 ක විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 63.06 ක් පමණක් දායක මුදල් ලෙස රැස්කර ගෙන තිබුණි.

අරමුදලේ මූල්‍ය අර්බුදකාරී තත්ත්වය මත මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාගැනීමේ තත්ත්වයකට මණ්ඩලය පත්ව, 2016 වර්ෂයේදී රු.මිලියන 2,450 ක් භාණ්ඩාගාරයෙන් ලබා ගෙන තිබුණි.

ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

1991 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලැබූ මෙම යෝජනා ක්‍රමය යටතේ 2016 දෙසැම්බර් මාසය වන විට දායකත්වය ලබා සිටින ධීවර සංඛ්‍යාව 68,915 ක් වී තිබුණු අතර මාසික විශ්‍රාම වැටුප් ලබන සංඛ්‍යාව 3,724 ක් වී තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අරමුදලට නව සමාජිකයින් බඳවා ගැනීම විශාල ලෙස අඩුවීමේ ප්‍රවණතාවයක් පැවැති අතර, එය 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 85 ක අඩුවීමක් වී තිබුණි. 2016 වර්ෂයේදී අරමුදලට ලැබීම් හා අරමුදලින් ගෙවීම් සංසන්දනය කිරීමේ දී රු.මිලියන 51.17 කින් ලැබීම් ඉක්මවා ගෙවීම් කර තිබුණි. විශ්‍රාම වැටුප්ලාභීන් සංඛ්‍යාව වර්ධනය වීම නිසා 2014 වර්ෂයෙන් පසු අරමුදල ක්ෂය වන තත්ත්වකට පත් වී 2020 වන විට ශුන්‍ය වන තත්ත්වයකට පත්විය හැකි බව හඳුනාගෙන තිබියදී මෙම අරමුදල ප්‍රතිශෝධනය කිරීම සඳහා පියවර ගැනීමට මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ගොවීන්ගේ භාරකාර අරමුදල

2002 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් පුළුල් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන හා ගොවි ජනතාවගේ සුබසාධනය වැඩි දියුණු කිරීම, සුළු ගොවීන්ට කෘෂිකාර්මික ණය පහසුකම් වෙළඳපළ ණය පහසුකම් සැපයීම, කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන්, විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, භෝග හා සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදන පිරිසැකසුම සඳහා අවශ්‍ය

වෙනත් අනුග්‍රහයන් ලබාදීම යන අරමුණු වෙනුවෙන් අරමුදල ක්‍රියාත්මක විය. අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- භාරකාර අරමුදල පිහිටුවා ඇති ප්‍රධාන අරමුණු අතරින් සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය හා සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම් සඳහා අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබාදීම යන කරුණු ඉටු කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේ මෙම අරමුදල යටතේ ව්‍යාපෘති 41 ක් වෙනුවෙන් රු.මිලියන 142.36 ක් ඇස්තමේන්තු කර තිබූ අතර ව්‍යාපෘති 27 කට රු.මිලියන 44.62ක් නිදහස් කර තිබුණි. වර්ෂය අවසානයේ ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණු අතර සැලැසුම් කළ සංවර්ධන වැඩසටහන් 14 ක් ආරම්භ කර නොතිබුණි.

- ගොවිසෙත ලොතරැයියේ විකුණුම් ආදායමෙන් සියයට 10 ක් අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවයක් ලෙස යොදා ගත යුතු වුවත්, 2009 වර්ෂයේ සිට එම මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එසේ ප්‍රයෝජනයට නොගත් ආදායම රු.මිලියන 2,353.06 ක් වී තිබුණි.

- කෙටිකාලීන ණය යටතේ වර්ෂ 10 ඉක්මවූ එකතුව රු.මිලියන 21.22 ක් වන ණය ශේෂ 07 ක්ද, දිගුකාලීන ණය යටතේ වර්ෂ 15 ඉක්මවූ රු.මිලියන 9.11 ක ණය ශේෂයක් ද, අත්තිකාරම් යටතේ වර්ෂ 03 ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක් තුළ නිරවුල් නොවී පවතින එකතුව රු.මිලියන 4.12 ක ණය ශේෂ 03 ක් ද, ලැබිය යුතු වෙනත් ණය පොලී තුළ ඇතුළත් වර්ෂ 10 කට වඩා පැරණි රු.මිලියන 98.48 ක ණය ශේෂ 04 ක් ද පැවතිණි.

වැවිලි කර්මාන්තය

රටෙහි සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් වෙනුවෙන් අපනයන වෙළෙඳපොල ඉලක්ක කර ගනිමින් ප්‍රධාන වැවිලි බෝගයන්ගේ ඵලදායිතාවය, ලාභදායකත්වය හා තිරසාරභාවය වර්ධනය කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි.
ඉහත සඳහන් අපේක්ෂිත ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත ආයතන 14 කින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- වැවිලි භෝගවල ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම.
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාව සඳහා අන්තර්ජාතික තරඟකාරිත්වය ඉහළ නැංවීම.
- වැවිලි බෝග මත පදනම් වූ එකතුකළ වටිනාකම වැඩි කිරීම සම්බන්ධ කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම.
- තේ අපනයනය සඳහා අවසරපත් නිකුත් කිරීම.
- තේ හා රබර් වතු කැබලි කිරීම සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය.
- බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩි කරලීම.
- තේ, රබර් සහ පොල් කර්මාන්ත සංවර්ධනය සහ එමඟින් පර්යේෂණයන්ට අදාළ කටයුතු.
- අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන සඳහා ව්‍යවසායන් හා ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වා දීම.

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ප්‍රධාන වැවිලි බෝග තුනෙහි නිෂ්පාදනය අඩුවීම

ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රයට අයත් තේ, රබර් හා පොල් 2016 වර්ෂයේ නිෂ්පාදනය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 11.01 කින්ද, සියයට 10.72 කින් හා සියයට 1.47 ක ප්‍රමාණවලින් අඩු වී තිබුණි. විස්තර වගුව 17 හි දැක්වේ.

බෝගය	නිෂ්පාදනය		2015 වර්ෂයට සාපේක්ෂව අඩුවීම	2015 වර්ෂයට සාපේක්ෂව අඩුවීමේ ප්‍රතිශතය
	2015	2016		
තේ කි.ග්‍රෑම් මිලියන	328.8	292.6	36.2	11.01
රබර් කි.ග්‍රෑම් මිලියන	88.6	79.1	9.5	10.72
පොල් ගෙඩි මිලියන	3,056	3,011	45	1.47

වගුව : 17 ප්‍රධාන වැවිලි බෝග නිෂ්පාදනය අඩුවීම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2016

එමෙන්ම 2016 වර්ෂයේදී තේ හා පොල් නිෂ්පාදන දළ දේශීය නිෂ්පාදනයට වූ දායකත්වය, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අඩු වී තිබුණි. විස්තර වගුව 18 හි දැක්වේ.

නිෂ්පාදනය බෝගය	දළ දේශීය නිෂ්පාදනයට වූ දායකය (ප්‍රතිශතය)	
	2015	2016
තේ	0.8	0.7
රබර්	0.3	0.3
පොල්	0.8	0.7

වගුව: 18 - වැවිලි බෝග නිෂ්පාදනය දළ දේශීය නිෂ්පාදනයට වූ දායකත්වය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහා බැංකුවේ වාර්ෂික වාර්තාව 2016

කල් බදු කුලී පදනමට ඉඩම් පවරා දීම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව කල් බදු කුලී පදනම මත ලබා දී තිබුණු ඉඩම්වලින් එකතුව රු.මිලියන 450.96 ක ආදායම් වර්ෂ 1 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට හිඟහිටව පැවැතුණත් එම හිඟහිටි ආදායම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. ආගරපතන, උඩුපුස්සැල්ලාව හා ඇල්කඩුව යන සමාගම් 3ට අයත් වතු 45 ක් සඳහා 1992 වර්ෂයේ සිට බදු කුලී හිඟහිටව පැවැතුණි.

වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට අනුව රු. මිලියන 900 ක ආදායමක් රැස්කළ යුතුව තිබුණු අතර වර්ෂය අවසාන වන විට හිඟ ආදායම් රැස් කිරීම් ද ඇතුළුව රු. මිලියන 767 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු. මිලියන 121 කින් වැඩි වී තිබුණි.

වැවිලි සමාගම්වලට අයත් වතු 571 ක ඉඩම්වලින් යටිතල පහසුකම් වැනි පොදු කටයුතු සඳහා ඉඩම් ලබා දී තිබුණි. මෙම පවරණ ලද ඉඩම්වල නිවැරදි භූමි ප්‍රමාණයන් හඳුනා ගැනීමට, සීමා මායිම් නිර්ණයට අදාළ තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

වර්ෂ 53 ක කාලයකට වතු බදු දීමේදී එක් එක් ප්‍රාදේශීය වැවිලි සමාගම්වල සංශෝධිත බදු ගිවිසුමට ඇතැම් වතු ඇතුළත් කර නොතිබුණි. මේ නිසා එම වතුවලින් ලැබිය යුතුව තිබූ බදු කුලී ආදායම අහිමි වී තිබුණි.

2009 නොවැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව උප බදු දීමට පෙර ස්වර්ණමය කොටස් හිමිකරු ලෙස භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. 2014 හා 2015 වර්ෂවලදී ප්‍රාදේශීය වතු සමාගම් 08 කට අයත් ඉඩම් කොටස් 18 ක් සමාගම් 14 කට උපබදු දී තිබුණද කොටස් හිමිකරු ලෙස භාණ්ඩාගාර

ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

විදේශාධාර ව්‍යාපෘති

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව විදේශ ණය ආධාර මගින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති දෙකක් සඳහා රු.මිලියන 885.9 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එක් ව්‍යාපෘතියක් සඳහා පමණක් රු.මිලියන 306.5 ක ණය ආධාර ලැබී තිබුණි. අනෙක් ව්‍යාපෘතිය 2016 අප්‍රේල් 26 දින ගිවිසුම්වලට එළඹ තිබුණත්, සලසා තිබුණු රු. මිලියන 441.4 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

තේ,රබර් හා පොල් වතු කැබැලි කිරීම

තේ, රබර් හා පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ අරමුණුවලට අනුව පනත සංශෝධනය කර වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ කාලීන අවශ්‍යතාවයක් ඉටු කර නොතිබුණි. තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය මඟින් කොන්දේසි සහිතව ඉඩම් පැවරීම සඳහා අනුමැතිය ලබා දුන් පසුව අදාල කොන්දේසි අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි. පලාත් පාලන ආයතන විසින් ඉඩම් කැබලි කිරීම සඳහා අවසරය ලබා දීමේදී මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබේද යන්න පරීක්ෂා කර නොතිබුණි. 2005 අංක 20 දරන තේ, රබර්, පොල් වතු (කැබැලි කිරීම පාලන) (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1958 අංක 2 දරන තේ,රබර්,පොල් වතු (කැබැලි කිරීම පාලන) පනතේ 12(8) හා 24 වගන්තිය ප්‍රකාරව තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය අදාළ කාර්යයන් ඉටු කිරීමේ රෙගුලාසි පිළිබඳව ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකර පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2009 ජුනි 10 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලනය) මණ්ඩලය වෙනම ආයතනයක් ලෙස ස්ථාපනය කිරීම අවශ්‍ය නොවන බව දක්වා තිබුණ ද මණ්ඩලයට සභාපතිවරයකු පත් කර ඇති අතර ඒ වෙනුවෙන් වැටුප් හා ඉන්ධන දීමනා සඳහා 2016 වර්ෂයේදී එකතුව රු.මිලියන 1.09 ක් වැය කර තිබුණි.

වැවිලි ඉඩම් මැනීම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්ය භාරයන් යටතේ දිස්ත්‍රික්ක 7 ක ඉඩම් හෙක්ටර්යාර 31,435.12 ක් හෙවත් භාර දී තිබුණු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 16.6 ක් මැනීම් කටයුතු ඉටු කර තිබුණි. ඒ සඳහා එකතුව රු. මිලියන 9.09 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 22.7 ක් උපයෝජනය කර තිබුණි. ඉඩම් මැනීම මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වන අතර අපේක්ෂිත දිස්ත්‍රික්ක 12 ක මැනුම් නොකළ ප්‍රමාණය සියයට 52.9 ක සිට සියයට 91.0 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

කුලියට ගත් ගොඩනැගිල්ල

2016 අගෝස්තු 16 දින සිට 2017 පෙබරවාරි 16 දින දක්වා කාලයකට මාසයකට රු.500,000 ක් බැගින් රු.3,000,000 ක කුලියක් වෙනුවෙන් 2016 අගෝස්තු 16 දින අත්තිකාරම් ගෙවා වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. 2017 ජනවාරි 5 දින වන විටත් වැවිලි කර්මාන්ත අංශය විසින් එම ගොඩනැගිල්ල භාවිතයට නොගැනීම නිසා එදින වන විට ගෙවා තිබුණු රු.මිලියන 2.25 ක කුලිය නිෂ්ඵල වියදමක් වී තිබුණි.

අගය එකතු කරන ලද රබර් නිෂ්පාදන අපනයනය

2014 වර්ෂයේ දී රබර් මෙට්‍රික් ටොන් 16,305 ක් වූ රබර් අපනයනය 2015 දී මෙට්‍රික් ටොන් 10,374 දක්වා සියයට 36 කින් අඩු වී තිබුණි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දී රබර් අපනයනය මෙට්ට්‍රික් ටොන් 16,167 දක්වා සියයට 56 කින් වැඩි වී තිබුණි. එහෙත් 2014 වර්ෂයේ රු. මිලියන 5,915 ක් වූ රබර් අපනයන ආදායම 2015 වර්ෂයේදී රු.මිලියන 4,758 දක්වා සියයට සියයට 19 කින් අඩු වී තිබුණි. විස්තර රූපසටහන 18 හි දැක්වේ.

රූපසටහන18 - රබර් නිෂ්පාදනය හා අපනයන ආදායම
මූලාශ්‍රය - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශයේ තොරතුරු

රබර් ආනයනය වැඩිවීම

ශ්‍රී ලංකාවට ස්වභාවික හා කෘතිම රබර් ආනයනය කිරීම අඛණ්ඩව ඉහළ යමින් පවතින අතර 2014 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 68,685 ක් වූ රබර් ආනයන ප්‍රමාණය 2016 දී මෙට්‍රික් ටොන් 142,476 දක්වා සියයට 107 කින් වැඩි වී තිබුණි. 2014 වර්ෂයේ රු. මිලියන 17,809 ක් වූ ආනයන වියදම 2016 දී රු. මිලියන 30,971 දක්වා සියයට 74 කින් වැඩි වී තිබුණි.

රබර් නිෂ්පාදනය අඩුවීම

රබර් බිම් ප්‍රමාණය හා රබර් වගා බිම්වල ඵලදායිතාව ඉහළ නංවීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සහනාධාර වැඩ සටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි. 2014 වර්ෂයේ සිට සමස්ථ රබර් ආදායම අඛන්ඩව අඩු වෙමින් පැවැති අතර 2014 වර්ෂයේ මෙට්‍රික් ටොන් 98,573 ක් වූ රබර් නිෂ්පාදනය 2016 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 79,100 ක් දක්වා සියයට 20 කින් අඩු වී තිබුණි.

ඉඩම් හෙක්ටයාර 7000 ක රබර් නැවත වගා කිරීම හා අළුතින් වගා කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, රබර් මිල අඩු වීම නිසා රබර් වගා කිරීම හෙක්ටයාර 1183 ක් හෙවත් ඇස්තමේන්තු කළ ප්‍රමාණයෙන් සියයට 17 කට සීමා වී තිබුණි.

මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්ක තුළ රබර් පැල සිටුවීම අපේක්ෂාවෙන් රබර් පැල ලක්ෂ 5 ක් ප්‍රවාහනය කිරීමට සැලැසුම් කර තිබුණත්, පැල 88,170 ක් පමණක් ප්‍රවාහණය කර තිබුණි. ඒ අනුව අපේක්ෂිත රබර් පැල ප්‍රමාණයෙන් සියයට 82 ක් සිටුවීමට අපොහොසත් වී තිබුණි.

මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කරන ලද ගොවීන් 659 දෙනෙකුට අයත් රබර් අක්කර 816 රූඩ් 1 පර්චස් 13 ක් අසාර්ථක රබර් ඉඩම් බව හඳුනාගෙන තිබුණි. එම ඉඩම් සඳහා සහනාධාර වශයෙන් රු. මිලියන 5.01ක් ලබා දී තිබුණි.

රබර් වගා ප්‍රදේශවල අතුරු බෝග වගා කිරීම

රබර් වගා ප්‍රදේශවල හෙක්ටයාර 830 ක අතුරු බෝග වගා කිරීම සඳහා

ඇස්තමේන්තු කර තිබුණද එය සියයට 17 ක වූ ඉලක්කයක් පමණක් සපුරා තිබුණි.

රබර් සඳහා සහතික මිලක් ගෙවීම

2014 හා 2015 වර්ෂවල කුඩා රබර් වතු හිමියන්ට රබර් සඳහා සහතික මිලක් ගෙවා තිබුණි. ඒ පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී වෙළඳ ආයතන තුනකට රබර් කිලෝග්‍රෑම් 77,458.9 කට සහතික මිල යටතේ රු.මිලියන 7.44 ක් ගෙවා තිබුණද, රබර් මිලදී ගැනීම කුඩා රබර් වතු හිමියන්ගෙන් සිදු කළ බව තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. තවද රබර් වෙළඳ නියෝජිතයකුට සහතික මිල ලෙස රු.මිලියන 16.38 ක් ගෙවා තිබුණද, ඉන් රු.මිලියන 2.01 ක් වැරදි තොරතුරු මත ගෙවා තිබුණි.

රබර් වගාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම

සමාලෝචිත වර්ෂයේදී රබර් වගාව පිළිබඳ පර්යේෂණ 111 ක් ඉටු කරමින් පැවතුණි. එම පර්යේෂණ අතරින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලච්ඡේදය තුළ පර්යේෂණ 63 ක් අවසන් කර තිබුණි. ඇතැම් පර්යේෂණ සඳහා වර්ෂ 18 ක සිට වර්ෂ 20 ක් දක්වා කාලයක් ගතවී තිබුණි. පර්යේෂණ සඳහා ගතවන කාලය අවම කර ගැනීමට විකල්ප ක්‍රමවේද හඳුනාගෙන නොතිබුණු අතර අවසන් නොවූ පර්යේෂණ 48 ක් පැවතිණි. එම පර්යේෂණ අතර වර්ෂ 5 ක සිට වර්ෂ 28 ක් දක්වා කාල පරාසයක සිට සිදු කරමින් පවතින පර්යේෂණ අවසන් කිරීමට නියමිතව තිබුණි. වර්ෂ 20 ක් තුළ සිදුකළ පර්යේෂණයක් මඟින් වාර්ෂික රබර් ඵලදායීතාව වැඩිකරගත් බව සඳහන් කර තිබුණද, ඩාර්ටන් ෆීල්ඩ් වතුයායේ වාර්ෂික අපේක්ෂිත ඵලදාව කිලෝ ග්‍රෑම් 3004 ක් වුව ද, සත්‍ය ඵලදාව කිලෝ ග්‍රෑම් 800 ක සිට කිලෝ ග්‍රෑම් 900 ක් අතර වී තිබුණි.

මානව සම්පත් කළමනාකරණය

රබර් පර්යේෂණ මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ වතු අධිකාරීවරයකුට 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/2010 දරන වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව තීරු බදු සහන ඇතුළත් මෝටර් රථ බල පත්‍රයක් නිකුත් කිරීම හා ආනයනය කළ මෝටර් රථය වෙනුවෙන් රේගු බදු හා අනෙකුත් බදු සහන ලෙස රු.මිලියන 8.09 ක බදු සහන සලසා දී තිබුණි.

- කාර්ය මණ්ඩලය සඳහා රු.මිලියන 23.30 ක වෛද්‍ය බිල් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපූරණය කර තිබුණු අතර, එම ගෙවීම් ක්‍රමවේදය සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. තවද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත වෛද්‍යාධාර ගෙවීම වෙනුවෙන් රු.මිලියන 5.05 ක් වෙනත් බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි.

- 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සේවක අර්ථසාධක, සේවක භාරකාර අරමුදල් දායකය හා පාරිතෝෂිත මුදල් නිසි පරිදි නොගෙවීම නිසා අධිභාර වශයෙන් රු.මිලියන 1.75 ක් ගෙවා තිබුණි.

තුරුසවිය අරමුදල

තුරුසවිය අරමුදල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2016 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක අනුව අක්‍රීය තුරුසවිය සමිති 365 ක් වූ අතර 2000 අංක 33 දරන තුරුසවිය අරමුදල් පනතේ 4 වගන්තිය අනුව ලියාපදිංචි තුරුසවිය සමිතියක ලියාපදිංචි

අවලංගු කර එහි නිවේදනයක් ගැසට් පත්‍රයේ පල කිරීම කළ යුතුව තිබුණි. නමුත් අක්‍රීය සමිති සම්බන්ධයෙන් එසේ ක්‍රියාකර නොතිබුණි.

- 2015 ජුනි 09 දිනැති අංක 90 : 15795 දරන කළමනාකරණ මණ්ඩල පත්‍රිකාව මඟින් ඉදිරි යෝජිත වැඩ සැලැස්මක් ඉදිරිපත් කර තිබුණි. එම තීරණ අනුව එක් සාමාජිකයකුගෙන් රු.10 බැගින් මසකට රු.1,000,000 ක් අරමුදලට බැරකර ගැනීමට හැකිවන සේ සාමාජික සංඛ්‍යාව 100,000 දක්වා වැඩිකර ගැනීමට අපේක්ෂා කර තිබුණද, එය ඉටුකරගෙන නොතිබුණි.

- තුරුසවිය සමූහ සැකසුම් මධ්‍යස්ථාන 09 ක නිෂ්පාදන කටයුතුවලින් මසකට රු.ලක්ෂ 2 ක ආදායමක් අපේක්ෂා කර තිබුණි. අපේක්ෂිත ආදායම අයකර ගැනීමට අරමුදල ක්‍රියාකර නොතිබුණි. දිස්ත්‍රික්ක 07 ක රබර් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන හා ඔට්ටපාලු ක්‍රේප් නිෂ්පාදනාගාර ආරම්භ කර මසකට රු.මිලියක ආදායමක් අපේක්ෂා කර තිබුණ ද, 2016 දෙසැම්බර් 31 දින වන විටද මධ්‍යස්ථාන ආරම්භ කර නොතිබුණි.

- ලියාපදිංචි තුරුසවිය සමිති සංඛ්‍යාව 707 ක් වුවත්, 2014, 2015 හා 2016 වර්ෂවල රෝල් යුගල සහනාධාර ලබා දීමේදී සහනාධාර මුදලින් සියයට 50 ක් දැරිය හැකි සමිති 80 ක් අතරේ පමණක් වසර 03 ක් තුළ රෝල් යුගල සහනාධාර බෙදා දී තිබුණි.

පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ කාර්යභාරයන් ඉටු කිරිම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නිරීක්ෂණවල සාරාංශයක් පහත දැක්වේ.

- අධිකාරිය විසින් දීසිඳි නිෂ්පාදන සඳහා අයකරන කි.ග්‍රෑ. 01 කට ශත 20 බැගින් වූ මුදල වර්ෂ 40 කට පෙර සිට තීරණය කර තිබුණු අතර කාලානුරූපව එම මුදල සංශෝධනය කිරීමට ක්‍රියාකර නොතිබුණි.
- පොල් කිරි, පොල් කිරි පිටි, පොල් ක්‍රීම් පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන වෙනුවෙන් රූපවාහිනී සංස්ථාවට රු.මිලියන 9.34 ක් ගෙවා තිබුණි. පවත්වා තිබූ වැඩ සටහන්වල පිරිවැය රු.මිලියන 2.28 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 7.06 ක වැඩි පුර ගෙවා තිබුණු මුදල ආපසු ලබා ගැනීමට හෝ ඒ වෙනුවට වෙනත් වැඩසහන් පැවැත්වීමට හෝ කටයුතු කර නොතිබුණි.

- 1985 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබූ රු.මිලියන 26.72 ක ණය මුදල වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල් සහ ණය වාරික ගෙවා නොතිබියදීත්, එම සමාගම් වෙත නැවත පොලී රහිතව 2002 වර්ෂයේ දී රු.මිලියන 25 ක් හා 2004 වර්ෂයේදී රු.මිලියන 6.60 ක් බැගින් රු.මිලියන 31.60 ක ණය මුදලක් ලබා දී තිබුණි. ඉන් රු.මිලියන 31.55 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකාරියට ලැබී නොතිබුණි.

- අධිකාරිය විසින් රු.මිලියන 1.07 ක් වැය කර 2014 ඔක්තෝබර් මාසයේ සිට සවිකර තිබුණු සීසීටීවී කැමරා පද්ධතියේ කැමරා 32 කින් 19 ක්ම ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

- අධිකාරිය විසින් කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදලට දායක වී ඇති සේවකයන් 91 ක් වෙනුවෙන් 2006

වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.මිලියන 2.66 ක් හා මහ බැංකුව යටතේ පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලට දායක වී ඇති සේවකයන් 116 ක් වෙනුවෙන් රු.මිලියන 3.25 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි. තවද ඉහත කාලය තුළ සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායක මුදල් ගෙවීමේ දී ජීවන වියදම් දීමනාව අදාළ කර නොගැනීම නිසා ඒ අවස්ථාවේදී සේවකයන් විසින් ගෙවිය යුතුව තිබුණු ජීවන වියදම් දීමනාවට අදාළ සියයට 10 ක අර්ථසාධක අරමුදල් දායකය වන රු.මිලියන 1.18 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

පොල් පර්යේෂණ

පොල් පර්යේෂණ මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී ආරම්භ කර 2018 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබූ පර්යේෂණ ව්‍යාපෘතියක්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භකර නොතිබුණි. ක්‍රියාත්මක කරමින් තිබූ පර්යේෂණ ව්‍යාපෘති 24 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ඒවායේ භෞතික කාර්යසාධනය සියයට 0 ක සිට සියයට 50 ත්අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය

වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණු වීමේ රෝග මර්ධන වැඩසටහන යටතේ 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල රෝගය වැලදීම නිසා ඉවත්කළ ගස් ගණන 288,683 ක් වි තිබුණි. ඒ සඳහා රු.මිලියන 305.41 ක් වන්දි ලෙස ගෙවා තිබුණි. අනෙකුත් වියදම්වල එකතුව රු.මිලියන 75.36 ක් ද වැය කර තිබුණත්, මෙම රෝගයට ඔරොත්තු දෙන සාර්ථක පොල් ප්‍රභේදයක් හඳුන්වා දීමට හෝ මර්ධනයට පොල් වගා කිරීමේ මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

කප්රුක් අරමුදල

2016 අගෝස්තු 01 දින කප්රුක අරමුදලේ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රථම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව කළාප සමිතිවලට ලබා දී තිබුණු භාවිතා නොකරන ලද මුදල් නැවත අයකර ගෙන ප්‍රාථමික සමිතිවලට ලබා දීමට තීරණය කර තිබුණි. ඒ අනුව කළාප සමිතිවලට ලබා දී තිබුණු භාවිතා නොකරන ලද රු.මිලියන 18.80 ක් නැවත අයකර ගෙන ප්‍රාථමික සමිතිවලට ලබාදීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

ඔයිල්පාම් ව්‍යාපෘතිය නවතා දැමීම

පොල් පර්යේෂණ මණ්ඩලය විසින් දේශීය එළවළු තෙල් අවශ්‍යතාවය පිරිමසා ගැනීමේ විකල්ප ක්‍රමයක් ලෙස 2012 වර්ෂයේදී ආරම්භ කර තිබූ ඔයිල්පාම් ව්‍යාපෘතියේ ව්‍යාපෘති සැලැස්මට අනුව රු.මිලියන 31.17 ක් ඇස්තමේන්තු කර පර්යේෂණ ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒවායේ ව්‍යාපෘති කාලය 2013 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාල පරාසයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී එම ව්‍යාපෘතිය අතරමග නවතා තිබුණු අතර ඒ වන විට එම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 3.88 ක් වැය තර තිබුණි.

නව පොල් ප්‍රභේද හඳුන්වාදීම

පොල් පර්යේෂණ මණ්ඩලයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය විසින් නව පොල් ප්‍රභේද හඳුන්වා දීම සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු දිගින් දිගටම සිදු කර තිබුණි. 2012 වර්ෂයෙන් පසු නව පොල් ප්‍රභේද හඳුන්වා දීම සිදුකර නොතිබුණි. හඳුන්වා දී තිබූ පොල් ප්‍රභේද 06 ක් අතරින්

කප්රුවන, කප්සෙත සහ කප්සුවය යන පොල් ප්‍රභේද මහජනතාව අතර ව්‍යාප්ත වී නොතිබුණි.

පොල් කටු අගුරු නිෂ්පාදනය

පොල් කටු අගුරු නිෂ්පාදනයේදී පිටවන තාපය පරිසරයට මුදා නොහැර එම තාපය යොදාගෙන කොප්පරා වියලීම අරමුණුකොට ගෙන රු.මිලියන 1.72 ක් වැය කර පොල් පර්යේෂණ මණ්ඩලයේ බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානයේ තාප සුරැකුම් ඒකකයක් 2008 වර්ෂයේ ආරම්භ කර තිබුණි. එය 2012 වර්ෂයේ සිට පොල් කටු අගුරු නිෂ්පාදනය සිදු නොකර නිෂ්ක්‍රීයව පැවතුණි.

පොල් වෙන්දේසියේ තීරණය වූ මිලට වැඩියෙන් ගෙවීම

පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් 2016 වර්ෂයේ දී උසස් ශාකවලින් බීජ පොල් (pp) 3,910,110 ක් ද, තෝරා ගන්නා ලද බීජ පොල් (PP2) 3,424,931 ක් සඳහාද, පොල් වෙන්දේසියේ තීරණය වන උපරිම මිලට වඩා පිළිවෙලින් රු.9 ක් හා රු.6 ක් වශයෙන් රු.මිලියන 55.74 ක් වැඩිපුර ගෙවා තිබුණි. මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

පොල් වතු හා තවාන් සඳහා පොහොර මිලදී ගැනීම

2016 වර්ෂය සඳහා පොල් වතු සහ තවාන් සඳහා පොහොර මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. පොහොර මෙට්‍රික්ටොන් 708.175 ක් රු.26,393,369 කට මිලදී ගැනීම සඳහා 2016 නොවැම්බර් 01 දින පොල් වගා කිරීමේ මණ්ඩලය අදාළ සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ලංසු කැඳවීමේ ලේඛනය අනුව අදාළ පොහොර තොගය දින 30 ක කාලයක් තුළදී සැපයිය යුතු වුවත්, එම කාලය තුළ පොහොර මෙට්‍රික් ටොන් 323.15 ක් පමණක් සපයා තිබුණි. ඉතිරි පොහොර අදාළ සමාගම විසින් නියමිත දිනයට සපයා නොතිබීම සම්බන්ධයෙක් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ කොන්දේසි ගිවිසුමේ ඇතුළත් කර නොතිබුණි.

පොහොර සහනාධාර ගෙවීම

කුඩා පොල් වගාකරුවන් අතර පොහොර භාවිතා කිරීම ප්‍රචලිත කිරීම සඳහා 2016 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් රු. මිලියන 654 ක් පොහොර සහනාධාර ගෙවීමට ප්‍රතිපාදන සලසා තිබුණි. එමඟින් පොල් ගස් 11,678,571 ක් සඳහා පොහොර ලබා දීමට ඉලක්ක කර තිබුණද, 2016 වර්ෂයේදී පොල් ගස් 8,839,272 ක් සඳහා අයදුම්කරුවන් 72,384 ක් අතරේ රු. මිලියන 495ක් පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

තේ නිෂ්පාදනය හා අපනයන අඩුවීම

ශ්‍රී ලංකාව තුළ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම හා නියාමනය කිරීමත්, ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධන කිරීමේ ප්‍රධාන අභිමතාර්ථය ඉටු කිරීම වෙනුවෙන් මූලාධාර යෝජනා ක්‍රම ගණනාවක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාවට නංවා තිබුණි. නමුත්, 2014 වර්ෂයේ සිට සමස්ත තේ නිෂ්පාදනය අඩු වෙමින් පැවති අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ තේ නිෂ්පාදනයේ සියයට 11 ක අඩුවීමක් තිබුණි. එමෙන්ම 2001 වර්ෂයේ ලෝක තේ වෙළඳපලේ (World Percentage Share of Tea Exports) ප්‍රබල තරඟ කරුවෙකු ලෙස ශ්‍රී ලංකා තේ සියයට 20.6 ක අපනයන දායකත්වයක් ලබා ගෙන තිබුණි. නමුත් 2015 වර්ෂයේ එය සියයට 16.9 ක් දක්වා අඩු වී තිබුණු අතරම 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ අපනයන තේ ප්‍රමාණය සියයට 3.41 කින් පහත වැටී තිබුණි. විස්තර රූපසටහන 19 හි දැක්වේ.

රූපසටහන 19 - මුළු තේ නිෂ්පාදනය හා තේ අපනයනය අඩුවීම

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවලින් හා සංඛ්‍යා ලේඛන අංශයේ තොරතුරු

ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම

සමාලෝචිත වර්ෂයේදී "සිලෝන් ටී" සන්නාමය ජාත්‍යන්තරව ව්‍යාප්ත කිරීමේ ගෝලීය අලෙවිකරණ ව්‍යාපාරයත්, "සිංහ ලාංඡනය", "පරිසර - ඕසෝන් හිතකාමී ලාංඡනය" සහ "භූගෝලීය දර්ශක - කළාප හතෙහි ලාංඡනය" ආදී සියයට 100 ක් පිරිසිදු ශ්‍රී ලංකා තේ බවට සහතික කෙරෙන තත්ත්ව සළකුණු හඳුන්වා දී තිබුණු අතර තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2014-2016 කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 8 ක් වැය කර තිබුණි. නමුත් අපේක්ෂිත වූ ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන 2016 වර්ෂය අවසාන වන විටත් අපේක්ෂිත මට්ටමට ලඟා වී නොතිබුණි.

පාංශු සංරක්ෂණ සහනාධාරය ගෙවීම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කළාප 8 ක කුඩා තේ වතු අක්කර ¼ ක් හා අක්කර 1 ට අඩු කාණ්ඩයේ සියළුම කුඩා තේ වතු හිමියන්ට පාංශු සංරක්ෂණ සහනාධාරය ලබා දී දැනට නිෂ්පාදනය කරන අමු තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 10 කින් වැඩි කර විදේශ විනිමය රු.මිලියන 9,010 කින් වැඩි කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. 2014 හා 2015 වර්ෂවල අදාළ සියළුම කුඩා තේවතු හිමියන්ට පාංශු සංරක්ෂණ සහනාධාර ගෙවා තිබුණත්, අපේක්ෂිත ඉලක්කය වෙත ළඟාවීමට නොහැකි වී තිබුණි.

තේ වල පලිබෝධනාශක අවශේෂ පරීක්ෂා කිරීම

තේ වල පවත්නා පලිබෝධනාශක අවශේෂ පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රු.මිලියන 44.41 ක් වැය කර මිලදී ගෙන ස්ථාපිත කර තිබූ උපකරණ වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි

කුඩා තේවතු හිමියන්ගේ දායකත්වය අඩුවීම

සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය සියයට 74.5 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම දායකත්වය සියයට 72.91 ක් වී තිබුණි. කුඩා තේ වතුහිමියන්ගේ නිෂ්පාදනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 21.79 ක් හෙවත් සියයට 9 කින් අඩුවී තිබුණි. කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායීත්වය 2014, 2015 හා 2016 වර්ෂයන්හි දී පිළිවෙලින් හෙක්ටයාරයකට හිමි තේ කිලෝග්‍රෑම් 2,123 ක් 2,059 හා 1,872 ක් ලෙස අඩු වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඵලදායීතාවය සියයට 9 කින් අඩු වී තිබුණි. උපරිම ඵලදාවක් ලබමින් තේ වගා බිම් ප්‍රමාණය ස්ථායීව පවත්වා ගැනීම සඳහා වර්ෂයකට පවත්නා කුඩා තේ භූමි ප්‍රමාණයෙන් සියයට 2 ක තේ භූමි ප්‍රමාණයක් නැවත වගාව කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ එම අගය සියයට 0.61 ක් වී තිබුණි.

කුඩා තේවතු හිමියන්ට සහනාධාර ගෙවීම අඩුවීම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් විකල්ප භෝග හා ආදායම් මාර්ග නොමැති ප්‍රදේශවල අළුතින් තේ වගාව සඳහා ලබා දුන් සහනාධාර ප්‍රමාණය 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු. මිලියන 81.39 කින් හෙවත් සියයට 64 කින් අඩු කර තිබුණි. එමෙන්ම පාංශු හා ජල සංරක්ෂණ ඵලදායීතා විශේෂ වැඩ සටහන යටතේ කුඩා තේ ඉඩම් වල පාංශු සාරවත්භාවය වැඩි දියුණු කිරීමෙන් පොහොර කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 32.08 ක් වී තිබුණත්, කුඩා තේවතු සංවර්ධන අධිකාරිය විසින් එම ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා යොදවා නොතිබුණි.

තේ කර්මාන්තය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ඵලදායීතාවය හා නිමි තේ වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ මූලික අරමුණින් ක්ෂේත්‍රයන් පිළිබඳව අරමුදල් වැයකරමින් තේ පර්යේෂණ ආයතනය විසින් ආරම්භකරන ලද පර්යේෂණ ව්‍යාපෘතීන් 38 ක් විවිධ සීමාකාරී සාධක හේතුවෙන් අතරමග නවතා තිබුණි.

තේ කර්මාන්තයේ උග්‍ර ශ්‍රම හිඟය සඳහා විසඳුමක් ලෙස 2013 වර්ෂයේදී තේ පර්යේෂණ ආයතනය විසින් ආරම්භ කරන ලද යාන්ත්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 44.85 ක් වැය කර තිබුණු නමුත්, බෑවුම් සහිත ප්‍රදේශ සඳහා යොදා ගැනීමට අපහසු වීම නිසා අස්වනුවලට හානි වීම හේතුවෙන් එම යන්ත්‍ර ඵලදායීව භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

තේ ශක්ති අරමුදල

අරමුදලට අයත් කර්මාන්තශාලා 14 ක් හා පොහොර හා දේශීය තේ අලෙවිය යන සියළු අංශ පාඩු ලැබීමෙන් අරමුදලේ උද්ගත වී ඇති දැඩි මූල්‍ය අර්බුදය හේතුවෙන් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන් 94,425 දෙනෙකු සතුව රු.මිලියන 206.01 ක් වටිනා කොටස් ප්‍රමාණයක් වූ අතර එම කොටස් හිමියන් සඳහා 2007 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රතිලාභ ගෙවීමට හැකිවනු පිණිස අරමුදල මෙහෙයවා නොතිබුණි.

තේ කර්මාන්තයට අයත් නිලධාරීන් පුහුණු කිරීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් තේ කර්මාන්තශාලා නිලධාරි සහ තේ ක්ෂේත්‍ර නිලධාරි පුහුණු කිරීමේ පාඨමාලාවන් සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර තිබුණද, වර්ෂය අවසාන වන විට එකී පාඨමාලාවන් සඳහා ශිෂ්‍ය සහභාගීත්වය පිළිවෙලින් ලියාපදිංචි කල ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 66 ක් සහ සියයට 64 ක් වී තිබුණි. පැවැත්වීමට නියමිතව තිබූ ආදායම් උත්පාදන වැඩසටහන් 25 කින් 17 ක් පමණක් පවත්වා තිබුණි.

උක් නිෂ්පාදන

සුදුසු උක් ප්‍රභේද හඳුන්වා දීම, රෝග පාලනය, උක් වගා ක්‍රමවේද හා සීනි උකහා ගැනීම් ප්‍රතිශතය වැඩි කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද හඳුන්වා දීම මන්දගාමී අයුරින් සිදු වී තිබීම හේතුවෙන් උක් පර්යේෂණ ආයතනය පිහිටුවා දැනට වසර 33 ක් පමණ ගතවී තිබුණ ද, මුළු සීනි අවශ්‍යතාවයෙන් දේශීය සීනි නිෂ්පාදනය සියයට 9 ක පමණ මට්ටමක පැවතුණි.

උක් පර්යේෂණ ආයතනයේ සේවකයින්ගේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම ක්‍රියාත්මක කර තිබුණු සුභසාධක වැඩ සටහන සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගෙන නොතිබුණු අතර ආයතනය භාවිතා කරන කාර්ය සංවිධාන සංග්‍රහය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2016 වර්ෂයේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය සඳහා රු.මිලියන 11.35 ක් වැයකර තිබුණි.

උක් පර්යේෂණ ආයතනය සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 100 ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කළ පර්යේෂණ ව්‍යාපෘති 19 කින් පර්යේෂණ ව්‍යාපෘති 17 ක භෞතික ප්‍රගතිය සියයට 5 සිට සියයට 75 මට්ටමක පැවතුණි.

දෙනියාය එන්සාල් වත්තේ හෙක්ටයාර 5.4 ක් ද, කන්තලේ හෙක්ටයාර 200 ක් සහ කිලිනොච්චියේ හෙක්ටයාර 12 ක භූමියේ නීත්‍යානුකූල අයිතිය පවරා නොගත් ඉඩම්වල උක් තවාන් ඇති කිරීම සහ පර්යේෂණ කටයුතු සිදු කිරීමට උක් පර්යේෂණ ආයතනය විසින් රු.මිලියන 20.35 ක් වැය කර තිබුණි.

1981 අංක 75 දරන උක් පර්යේෂණ පනතේ 18 වගන්තිය ප්‍රකාරව දේශීය සීනි නිෂ්පාදන ආයතන විසින් නිෂ්පාදිත සීනි ප්‍රමාණය මත සෙස් බද්දක් අයකළ යුතු වුවද, ගල්ඔය සීනි කර්මාන්තායතනයෙන් රු.මිලියන 1.08 ක් අයවිය යුතුව තිබුණි.

ඉඩම්

තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් සම්පත ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම අමාත්‍යාංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ළඟා කර ගැනීමට පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ඉඩම් විෂයයට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් පරිහරණය ප්‍රතිපත්තිවලට අනුකූලව සිදු කරනු ලබන අධ්‍යයනයන් මත අදාළ අංශ සඳහා උපදෙස් ලබාදීම.
- රජයේ ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය.
- නීතියෙන් නිශ්චය කොට දක්වා ඇති පරිදි ඉඩම් අන්සතු කිරීම.
- ජාතික අවශ්‍යතාවන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.
- රජයේ ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා දිමනා පත්‍ර ලබා දීම.
- සංවර්ධන සහ නේවාසික අවශ්‍යතා සඳහා රජයේ ඉඩම් දීර්ඝකාලීනව හා කෙටිකාලීනව බදුදීම.
- ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා හිමිකම් සහතික ලියාපදිංචි කිරීම.
- ජාතික සැලැසුම්කරණය ඉලක්ක කරගෙන ඉඩම් මැනීම, සිතියම් සකස් කිරීම හා අනුරේඛන සම්පාදනය කිරීම.
- රටේ සියළුම ඉඩම් පිළිබඳව තොරතුරු පද්ධතියක් සකස් කිරීම.

ඉඩම් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 4 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩලයකින් සමන්විත ආයතන මගින් ඉහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි. එම කාර්යභාරයට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවන්වලදී අනාවරණය වූ අඩුපාඩු සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

ඉඩම් බැංකුව පිහිටුවීම

ඉඩම් බැංකුව පිහිටුවීම සඳහා ඉඩම් අමාත්‍යාංශය යටතේ රු.මිලියන 500 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා රු.මිලියන 195 ක අක් මුදල් භාණ්ඩාගාරය විසින් නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම නිදහස් කළ අක්මුදලින් සියයට 55.5 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 22 ක පත්ඉරු පරිලෝකනය කර පරිගණකගත කිරීමේ කාර්ය ඉටු කළ යුතුව තිබුණත්, එහි ප්‍රගතිය සියයට 41 ක් වී තිබුණි.

රජයේ අවශ්‍යතා සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා පෞද්ගලික ඉඩම් රජයට අත්කරදීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමද, අත්කරගනු ලබන ඉඩම්වලට වන්දි ගෙවීම් සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමද, අත්කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අත්කර ගැනීමේ නිලධාරීන් නියාමනය කිරීමද අමාත්‍යාංශයේ ඉඩම් අත්පත් අංශය මඟින් සිදු කර තිබුණි. ඉඩම් අත්පත් අංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ඉඩම් 244 ක් අත්පත් කර ගැනීමට අමාත්‍යාංශය සැලැසුම් කර තිබුණත්, වර්ෂය අවසන් වන විටත් ඉඩම් 134 ක් හෙවත් සැලැසුම් කළ ප්‍රමාණයෙන් සියයට 55 ක් පමණක් අත්පත් කර ගෙන තිබුණි.

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ දැනට ක්‍රියාත්මක වන ඉඩම්

අත්පත් ලිපිගොනු ගණන 18,841 ක් වූ අතර ඉන් ලිපිගොනු 401 ක් අක්‍රීය වී අතහැර දමා තිබුණි. එසේම එම කාල සීමාව තුළ ලිපිගොනු 1168 ක ඉඩම් ආඥා පනතේ 38 (අ) අතුරු විධාන ආඥාව නිකුත් කර තිබුණු අතර ඉන් ලිපිගොනු 236 කට වන්දි ගෙවා වැඩ අවසන් කර තිබුණි.

2016 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි මුදල් ලෙස රු.මිලියන 697.59 ක්ද, පොලිය ලෙස රු.මිලියන 160 ක්ද ගෙවා තිබුණි. එසේ ගෙවා තිබුණු පොලියෙන් රු.මිලියන 49 ක් 1976 - 1995 කාලපරිච්ඡේදය තුළ අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන්ද, රු.මිලියන 71 ක් 1996 - 2005 කාලසීමාව තුළ අත්කර ගත් ඉඩම් වෙනුවෙන්ද හා 2006 - 2014 කාලසීමාව තුළ අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් ඉතිරි රු.මිලියන 40 ක්ද වී තිබුණි.

බිම්සවිය වැඩසටහන

ශ්‍රී ලංකාවේ ඉඩම් සම්පතෙහි හිමිකම නිරවුල් කර අනාගත පරපුර සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. 2016 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ නිකුත් කිරීමට ඉලක්කගත හිමිකම් සහතික ප්‍රමාණය 100,000 ක් වී තිබුණත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් වරින්වර සිදු කරන ලද සංශෝධනයන්ට අනුව මාස 06 ක කාලය ඉකුත් වීමෙන් පසු සංශෝධිත ඉලක්කය 45,000 ක් ලෙස වෙනස් කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කරන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 35,031 ක් වී තිබුණු අතර එම සංශෝධිත ඉලක්කයද සපුරා ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද ලියාපදිංචි හිමිකම් සහතික ප්‍රමාණය වූ 35,031කින් පුද්ගලයින් විසින් ලබාගෙන තිබුණු හිමිකම් සහතික ප්‍රමාණය 21,872 ක් වී තිබුණි. මේ නිසා ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රමාණයෙන් සියයට 62 ක් පමණක් පුද්ගලයින් විසින් ලබා ගෙන තිබුණි.

ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීමට කටයුතු කර තිබුණි. 2016 වර්ෂය අවසන් වනවිට රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 ක ක්‍රියාත්මක කර තිබුණි. 2016 වර්ෂය අවසන් වන විට e- slims ව්‍යාපෘතිය යටතේ ඉඩම් කැබලි 689,120 ක දත්ත පරිගණකගත කර තිබුණි. 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉඩම් කැබලි 1,000,000 ක දත්ත තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමට සැලැසුම් කර තිබුණද, තොරතුරු ඇතුළත් කිරීම කැබලි 498,622 ක් වූයෙන් ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය සියයට 50 ක් වී තිබුණි.

රාජ්‍ය ඉඩම්, ඉඩම් තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් පරිගණක විද්‍යාගාරයක් සැකැසීම 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. පුහුණු කටයුතු කළ හැකි ආකාරයට එම විද්‍යාගාරය සකස් කිරීමට 2016 වර්ෂයේදී මාස 9 කට අධික කාලයක් ගත කර තිබුණි. 2017 ජූනි 30 දින වන විටත් නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. එසේ වුවද, එම පරිගණක විද්‍යාගාරය වෙනුවෙන් 2015 හා 2016 වර්ෂවලදී මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රු.මිලියන 1.56 ක්ද, පරිගණක යන්ත්‍ර සඳහා රු.මිලියන 3.56 ක්ද, පරිගණක මේස සඳහා රු.මිලියන 0.78 ක්ද, පරිගණක පුටු සඳහා රු.මිලියන 0. 67 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 6.57 ක් වැය කර තිබුණි. නමුත් විද්‍යාගාරයේ කටයුතු ආරම්භ නොකිරීම නිසා එම උපකරණ හා ගොඩනැගිල්ල නිෂ්කාර්ය වී තිබුණි.

රජයේ ඉඩම් බදු ආදායම

රජයේ ඉඩම් සම්පත ප්‍රශස්ථව කළමනාකරණය කිරීම මගින් රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමට නේවාසික, කෘෂිකාර්මික සහ වාණිජ කටයුතු සඳහා රජයේ ඉඩම්, රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට, පුද්ගලයින්ට බදු දීමෙන් රාජ්‍ය ආදායම් රැස්කරනු ලැබේ. නමුත් සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට හිඟහිට බදු ආදායමෙන් සියයට 75 ක ප්‍රමාණයක් අයකර ගැනීමට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සැලැසුම් කර තිබුණද, 2016 ජනවාරි 01 දින වන විට එම හිඟ ආදායමෙන් සියයට 17 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට හැකි වී තිබුණි.

ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම

හිමිකම් ලියාපදිංචි ක්‍රියාවලියේදී පැනනගින විවිධ ගැටළු හේතුවෙන් ක්‍රියාවලියේ විවිධ පියවරයන්හිදී මැනුම් කරන ඉඩම් කැබලිවලට අදාළ ලිපිගොනු තාවකාලිකව පසෙක තැබීමක් සිදු කරනු ලැබේ. 2016 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා ඉඩම් කැබලි 22,485 කට අදාළ ලිපිගොනු ප්‍රමාණයක් පසෙක තබා තිබුණු අතර, පූර්ව වර්ෂවලදී පසෙක තබන ලද ලිපිගොනුද ඇතුළුව ලිපිගොනු 8331 ක් සඳහා පමණක් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් විසඳුම් ලබාදී, හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන සකස් කර තිබුණි.

මැනුම් නියෝග ඉටු කිරීම

සමාලෝචිත වර්ෂයේදී මිනුම්දෝරු දෙපාර්තමේන්තුව වෙත නිම කිරීමට තිබූ මුළු මැනුම් නියෝග සංඛ්‍යාව 32,924 ක් වූ අතර, ඉන් මැනුම් නියෝග 18,413 ක් හෙවත් මුළු මැනුම් නියෝගවලින් සියයට 49 ක් නිම කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා බිම් සවිය වැඩසටහන සඳහා දිරිදීමනා වශයෙන් රු.මිලියන 245 ක් ගෙවා තිබුණත්, එහි සමස්ත ප්‍රගතිය සියයට 10 ක ප්‍රමාණයක් වී තිබුණි. වර්තමානයේ මැනුම් කටයුතු සඳහා ඉතා දියුණු තාක්ෂණික උපකරණ සහ ශිල්ප ක්‍රම දෙපාර්තමේන්තුව භාවිතා කලද, පසුගිය වර්ෂ 35 කට ආසන්න කාල සීමාවක් තුළදී මිනින්දෝරුවරයෙකුගේ මාසික ප්‍රතිමාන (Norms) ප්‍රමාණය 20 ක් වූ අතර කාලීනව එය සමාලෝචනය කර නොතිබුණි.

ගොඩනැගිලි ඉදිකිරීම

මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 62.34 ක් වැය කර ත්‍රිකුණාමලය, වවුනියාව, කැකිරාව, කුච්චවේලි, දියතලාව සහ කටුමාන ප්‍රදේශවල දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැඟිලි ඉදිකර තිබුණි. එම ඉදිකිරීම් කටයුතුවලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානයන් සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (ICTAD) විධිවිධානයන්ද කඩකර තිබුණි. අඩුමිල කොන්ත්‍රාත්කරුවන් තෝරා නොගැනීම නිසා රජයට රු.මිලියන 3.47 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. කොන්ත්‍රාත්කරු ඉල්ලා ඇති මුදල ඉක්මවමින් රු.මිලියන 3.49 ක් ගෙවා තිබුණි. වවුනියාව සහ කුච්චිවේලි ප්‍රදේශවල ගොඩනැඟිලි ඉදිකිරීමේදී රු.මිලියන 2.70 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල ඉදිකිරීමේ දී රු.මිලියන 1.05 ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකර ගෙන නොතිබුණි.

උපකරණ මිලදී ගැනීම

සමාලෝචිත වර්ෂයේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා රු.මිලියන 76.85 ක් වැයකර පූර්ණමාන 25 ක්, ලැප්ටොප් හා ඩෙස්ක්ටොප් පරිගණක 165 ක් හා Hand Held GPS 189 ක් මිලදී ගෙන තිබුණු අතර CORS පාලන පද්ධති 06 ක්ද පිහිටුවා

තිබුණි. මෙම සැපයුම් හා සේවා ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් බැහැරවීම් හා ස්වාධීනත්වයෙන් බැහැරවීම්ද නිරීක්ෂණය වී තිබුණි. පිටපළාත් කාර්යාලවලද විවිධ මිලදී ගැනීම් සඳහා රු.මිලියන 3.47 ක් වැයකර තිබුණු අතර එම මිලදී ගැනීම්වලදීද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි කටයුතු කර නොතිබුණි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් හිමියන්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම, පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජන වල යෙදවීම, කොමිෂන් සභාවට ලැබිය යුතු ආදායම් රැස් කිරීම හා ඉඩම් ආරක්ෂා කිරිම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. කොමිෂන් සභාව එම කාර්ය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- ඉඩම් කොමිෂන් සභාව සතුව පවතින ඉඩම් ප්‍රමාණය දැක්වෙන ලේඛනගත සාක්ෂි 2016 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය වාර්තා පවත්වා නොතිබුණු අතර එම හිඟ ආදායම් අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

- 1972 -1974 කාල පරිච්ඡේදයේදී ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබූ ඉඩම්වලට අදාළව වර්ෂ 40 ක් ඉක්මවා තිබුණු ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබා නොදුන් පුද්ගල සංඛ්‍යාව 235 ක් වී තිබුණි. ඉන් සියයට 25 ක් පිඹුරු ඉදිරිපත් නොකිරීම මතද, සියයට 53 ක් ප්‍රකාශකයින් ඉදිරිපත් නොකිරිම මතද එසේ ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබා දීමට නොහැකි වී තිබුණි. ව්‍යවස්ථාපිත නිශ්චයන් ප්‍රමාද වුවද, ඉඩම්වල භුක්තිය ප්‍රකාශක වෙත තිබීම තුළ සභාවට පවරා ගන්නා ලද මෙම ඉඩම් ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීමට සහ ආදායම් උපයා ගැනීමට පවතින ඉඩකඩ සීමාවී තිබුණි.

- 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාළ ගැසට් නිවේදන පලකරන ලද හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 104 ක් වර්ෂය ආරම්භයේදී පැවතුණු අතර ඉන් 2016 වර්ෂයේදී වන්දි ගෙවීමට හැකිව තිබුණේ ලිපිගොනු 3 ක් සඳහා පමණි.

- අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් තහනම් කරනු ලැබූ ව්‍යාපෘති නැවතත් කොමිෂන් සභාවට පවරා ගැනීමට කටයුතු කිරීම හෝ සාධාරණ හේතු පවතී නම් වෙනත් අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් නැවතත් එය බල ගැන්වීමට හෝ කටයුතු නොකිරිම හේතුවෙන් කිසිදු ආදායමක් අය කිරීමකින් තොරව එම ව්‍යාපෘතිලාභීන් ඉඩම් පරිහරණය කර තිබුණි. මේ නිසා කොමිෂන් සභාවට විශාල ආදායම් අහිමිවී තිබුණි.

අධ්‍යාපනය

ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා පාසල් නිර්දේශය තුළින් බුද්ධිය, ගුණගරුකභාවය, පෞරුෂත්වය හා යහපැවැත්ම යනාදියෙන් පරිපූර්ණ මානව සම්පත් බිහිකිරීම මෙම ක්ෂේත්‍රයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 04 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 9 ක් ස්ථාපිත කර තිබුණි. එම ආයතනවලින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කර අදාළ අරමුණ ඉටු කරගත යුතුව ඇත.

- ලෝක තරඟකාරිත්වයට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශවීමට ශ්‍රී ලාංකික ළමා සහ යෞවන පරපුරට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.
- ජාතික අරමුණු ළඟා කර ගත හැකි පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ජාතික පාසල් සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, පාවහන් හා දිවා ආහාර ලබා දීම.
- සමස්ථ අධ්‍යාපන පද්ධතිය තුළ හා සිසුන් අතර අධ්‍යාපනයෙහි ගුණාත්මක බව සහ විනය සහතික කර ගැනීම.
- බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම.
- ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම

ඉහත සඳහන් කාර්යභාරය අදාළ ආයතන විසින් ඉටු කිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපයෝජනය

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වැය විෂයයන් 15 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 543.51 ක ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. 2016 වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් 126-2-4-1-1407 දරන වැය විෂය යටතේ අමාත්‍යාංශය විසින් වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇතුළත් කර නොතිබුණු, රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යාමේ පිරිවැය ඉඩම් හා ගොඩනැගිලි ලෙස රු.මිලියන 121,352 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නාමික අගයක් වශයෙන් දක්වා තිබුණු මෙම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 23 දින රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් ප්‍රතිපාදන නිදහස් කිරීමක් සිදුනොවන හෙයින් එය වියදමක් ලෙස ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව දන්වා එවා තිබුණි.

අධ්‍යාපන ප්‍රතිඵල

2016 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා පෙනී සිටි පාසල් අයදුම්කරුවන් 211,865 කින් සිසුන් 17,702 ක් හෙවත් සියයට 8.36 ක් සියළුම විෂයයන් අසමත් වී තිබුණි. සියළුම විෂයයන් සඳහා A සමාර්ථ ලද සංඛ්‍යාව 6,468 ක් හෙවත් සියයට 3.05 ක් විය. වාණිජ විෂය ධාරාවෙන් සියයට 69.64 ක්ද, භෞතික විෂය ධාරාවෙන් සියයට 53.26 ක්ද හා ජීව විද්‍යා විෂය ධාරාවෙන් සියයට 53.35 ක්ද විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලබා තිබුණි. තාක්ෂණික විෂය ධාරාවෙන් උසස් පෙළ සඳහා පෙනී සිටි දෙවන වසර වන සමාලෝචිත වර්ෂයේදී ජෛව පද්ධති තාක්ෂණ විෂය ධාරවෙන් සියයට 60.16 ක් හා ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාවෙන් සියයට 55.58 ක් විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලබා තිබුණි.

ජාතික පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම

ජාතික පාසලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් හා ද්විතියික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක්ද, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී පන්තියක් සඳහා තෝරාගත යුතු මුළු සිසුන් සංඛ්‍යාව 40 ක්ද, වශයෙන් අමාත්‍යාංශය විසින් සඳහන් කර තිබුණි. ජාතික පාසල් 116 ක් විසින් එම සීමාවන් ඉක්මවා සිසුන් 9,639 ක් පාසල්වලට ඇතුළත් කරගෙන තිබුණි. ඒ අතර, ජනප්‍රිය පාසල් ලෙස සැලකෙන ජාතික පාසල් 32 ක් විසින් අදාළ සීමාව ඉක්මවා සිසුන් 5,373 ක් ඇතුළත් කර ගෙන තිබුණි.

පත් කිරීම් හා පුරප්පාඩු

ආයතන සංග්‍රහය අනුව නිත්‍ය පත්කිරීමක් කරන තෙක් තාවකාලික පිළියමක් වශයෙන් වැඩ බැලීමේ නිලධාරියකු පත් කළ හැකි වුවත්, 2017 ජුනි මාසය වන විට දිවයින පුරා පිහිටි ජාතික පාසල් 352 කින් පාසල් 228 ක විදුහල්පති පුරප්පාඩු සඳහා වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් යොදවාගෙන තිබුණි. ජාතික පාසලක් සඳහා නියමිත නියෝජ්‍ය විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසල් 55 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 99 දෙනෙකු පත්කර තිබුණි. එමෙන්ම ජාතික පාසලක් සඳහා නියමිත සහකාර විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසල් 28 ක සහකාර විදුහල්පතිවරුන් 61 දෙනෙකු පත්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිවයින පුරා තාක්ෂණික විෂය ධාරාව සඳහා ගුරු පුරප්පාඩු 327 ක් පැවතුණි.

2016 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 183 ක පවතින ගුරු ඌනතා 2,361 ක් හා ජාතික පාසල් 163 ක පවතින ගුරු අතිරික්තතා 1,527 ක් අවම කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

විනය පරීක්ෂණ

2008 වර්ෂයේ සිට 2017 අගෝස්තු 30 දින දක්වා කාලපරිච්ඡේද තුළ අක්‍රමිකතා හා විවිධ අවිනය ක්‍රියා හේතුවෙන් පාසල් පද්ධතිය තුළ නොවිසඳී තිබුණු විනය ගැටළු ප්‍රමාණය 343 ක් විය. ඒ තුළ විදුහල්පතිවරුන් 69 කට, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල 274 කට අදාළ ගැටළු විය. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය හා සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් විය. පාසල් තුළ සිදුවන ළමා අපචාර සිද්ධීන්වලට අදාළව ඉතා කඩිනම්ව විනය

පරීක්ෂණ පවත්වා දඬුවම් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

නිවාඩු

2016 වර්ෂයේදී ජාතික පාසල් 35 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 198 දෙනෙකු විසින් විධිමත් අනුමැතියකින් තොරව දින 5,072 ක් රාජකාරියට වාර්තා කර නොතිබුණි. එම නිලධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2016 වර්ෂයේදී ජාතික පාසල් 143 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 712 දෙනෙකු විසින් දින 15,973 ක වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණු නමුත්, එම නිවාඩු දින සඳහා වැටුපෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ස්ථාන මාරුවීම්

අධ්‍යාපන ක්‍රියාවලිය වඩා ඵලදායී අන්දමින් සිදුවන පරිදි හා ගුරුභවතුන් හා ශිෂ්‍යයින්ගේ සුභසාධනය උපරිම වන පරිදි පාසල්වල ගුරුමාරු ප්‍රතිපත්තියක් සකස්කර ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය නිකුත් කර තිබුණද, එහි විධිවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් ජාතික පාසල් 193 ක ගුරුභවතුන් 5,905 දෙනෙකු වර්ෂ 08 ක සිය වර්ෂ 27 ක් දක්වා කාල පරාසයක සිට ස්ථාන මාරුවීම් ලබා නොගෙන එකම පාසලක සේවයේ යෙදී තිබුණි.

විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කිරීම හා කාල පරිච්ඡේද පැවරීම්

ජාතික පාසල් 152 ක ගුරුභවතුන් 873 දෙනෙකු ඔවුන් පත්වීම් ලද විෂයයට පරිභාහිර විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කර තිබුණි. විශේෂයෙන් ජාතික පාසල් 36 ක ප්‍රාථමික ගුරු පුහුණුව නොලද ගුරුභවතුන් 137 දෙනෙකු ප්‍රාථමික ශ්‍රේණිවලට අනුයුක්ත කර තිබුණි.

ජාතික පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙත සතියකට අවම වශයෙන් කාල පරිච්ඡේද 10 ක් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතුව තිබුණත්, ජාතික පාසල් 101 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 225 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි. ජාතික පාසල් 5 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 6 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ක සිට 06 ක් දක්වා කාල පරාසයකින් යුක්ත විය.

සහකාර විදුහල්පතිවරුන් වෙත අවම වශයෙන් සතියකට කාල පරිච්ඡේද 12 ක් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතුව තිබුණත්, ජාතික පාසල් 33 ක සහකාර විදුහල්පතිවරුන් 69 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි. ජාතික පාසල් 6 ක සහකාර විදුහල්පතිවරුන් 6 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ක සිට 06 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

විෂයය ඉගැන්වීමේ කටයුතුවල නියුතු ගුරුභවතුන් පිළිවෙලින් සතියකට අවම වශයෙන් විනාඩි 40 ක කාලපරිච්ඡේද 35 ක් ඉගැන්වීමේ කාර්යයෙහි නියුක්ත කර විය යුතුව තිබුණි. ජාතික පාසල් 136 ක ගුරුභවතුන් 769 දෙනෙකු වෙත එකම ඉගැන්වීම් කාලපරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණි. ජාතික පාසල් 144 ක ගුරුභවතුන් 1,075 දෙනෙකු වෙත ඉගැන්වීම්

කාලපරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි.

ජාතික පාසලක අධීක්ෂණ කාර්යයේ නියුතු ගුරුභවතුන් වෙත සතියකට අවම වශයෙන් විනාඩි 40 ක ඉගැන්වීම් කාල පරිච්ඡේද 16 ක් පැවරිය යුතු වුවත්, ජාතික පාසල් 14 ක ගුරුභවතුන් 59 දෙනෙකු වෙත කිසිදු කාල පරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණි. ජාතික පාසල් 12 ක ගුරු භවතුන් 66 දෙනෙකු වෙත ඉගැන්වීම් කාල පරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි.

දිවයිනේ පළාත් 9 යෙහි විශේෂ අධ්‍යයන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 411 ක් වී තිබුණි. විශේෂ අධ්‍යයන ගුරු පුහුණුව ලැබූ ගුරුවරුන් 355 ක් වෙනත් පාසල් හෝ පන්ති කාමරවල සේවයේ යොදවා තිබුණි.

පුස්තකාල පොත් ආපසු භාර නොදීම

ජාතික පාසල් 35 ක ගුරුභවතුන් 243 දෙනෙකු ස්ථාන මාරුවීම්, විදේශගත වීම්, විශ්‍රාමයාම් හා සේවයෙන් ඉවත්වීම් වැනි අවස්ථාවලදී ආපසු භාරදී නොතිබුණු වටිනාකම රු.522,181 ක් වූ පුස්තකාල පොත් සංඛ්‍යාව 605 ක් වී තිබුණි. එම පොත් හෝ ඒවායේ වටිනාකම හෝ ආපසු ලබා නොගෙන එම ගුරුභවතුන් සේවයෙන් නිදහස් කර තිබුණි.

පෞද්ගලික පාසල් අධීක්ෂණය

1961 අංක 8 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව අවුරුදු 05 ක සිට අවුරුදු 14 ක් දක්වා වයස් සීමාවල පසුවන ළමුන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කිසිදු පුද්ගලයෙකුට පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි විය. ඊට අනුකූල නොවන අයුරින් ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් 214 ක් පමණ ආරම්භ කර තිබුණි. මීට අමතරවත් පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් අරඹා තිබුණු අතර, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් විය.

පෞද්ගලික පාසල්වල පවතින මානව හා භෞතික සම්පත්වල ගුණාත්මකභාවය තක්සේරු කිරීම හා විෂයමාලා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්ති හා ප්‍රමිතියක් අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබුණි.

සිසු අරුණ අධ්‍යාපනික අරමුදල

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2001 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ පාසල්වල ඉගෙනීමෙහි දක්ෂ නමුත් ආර්ථිකමය වශයෙන් දුෂ්කරතා ඇති අඩු ආදායම්ලාභී හා 5 වන ශ්‍රේණි ශිෂ්‍යාධාර නොලැබෙන ළමුන් වෙත ආර්ථිකමය වශයෙන් මාසිකව සහනදායී මුදලක් ලබාදීම අරමුණු කරගෙන 2001 වර්ෂයේදී සිසු අරුණ අධ්‍යාපනික අරමුදල පිහිටුවාගෙන තිබුණි. අරමුදල පිහිටුවා වර්ෂ 15 ක් ඉක්මවා 2016 වර්ෂය අවසාන වන විට අරමුදලේ රු.මිලියන 3.58 ක ශේෂයක් පැවතුණි. අරමුණුගත පරිදි ශිෂ්‍යත්ව ලබාදීම 2017 ජූනි 30 වන විටත් සිදුකර නොතිබුණි.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල කටයුතු

නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් තනතුරු 13 ක පුරප්පාඩු 45 ක්ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 16 ක පුරප්පාඩු 30 ක්ද පැවතුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 05 කට අදාළව අතිරික්ත කාර්ය මණ්ඩල 06 ක් විය. විද්‍යාපීඨයේ කාථිකාචාර්යවරුන් 09 දෙනෙකු වර්ෂ 14 ක සිට වර්ෂ 22 ක් දක්වා කාල පරාසයක් ස්ථාන මාරුවීම් නොලබා මෙම විද්‍යාපීඨයේම සේවය කරමින් සිටිති.

පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 151 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 61 ක් විය. එය මුළු අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 40 ක් පමණක් විය. දෙමළ මාධ්‍ය කිසිදු ස්ථිර කථිකාචාර්යවරයෙකු නොසිටි බැවින්, බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙකු එම විෂය ආවරණය කර තිබුණි.

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ උසස්වීම් පරිපාටිය නිසි අයුරින් අප්‍රමාදව ක්‍රියාත්මක කර නොතිබුණි. වෘත්තීය ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් පරිදි එම කාර්ය මණ්ඩලයට ලබා දී නොතිබුණි. ප්‍රමාණවත් පරිගණක හා අන්තර්ජාල පහසුකම් නොමැතිවීම හා දුරකථන දීමනා ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වීම නිසා නිලධාරීන් අපහසුතාවයට පත්වී තිබුණි.

පිරිවෙන් අධ්‍යාපනයේ කාර්යසාධනය

1980 ඔක්තෝබර් 01 දිනැති අංක 108/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර තිබුණු නිවේදනයක සඳහන් නියෝග අනුව පහත සඳහන් කාර්යභාරයන් අමාත්‍යාංශය විසින් ඉටු කර නොතිබුණි.

- 2016 දෙසැම්බර් 31 දිනට පිරිවෙන් 754 ක් ලියාපදිංචි වී තිබුණු අතර, ඒවායෙහි 66,003 ක ගිහි පැවිදි සිසුන් සංඛ්‍යාවක් විය. ගිහි පැවිදි අනුමත ගුරුභවතුන් සංඛ්‍යාව 6,503 ක්ද, අනුමත නොවූ ගුරුභවතුන් සංඛ්‍යාව 306 ක්ද විය. 1980 ඔක්තෝබර් 01 දිනැති අංක 108/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර තිබුණු නිවේදනයේ සඳහන් නියෝග මාලාවේ 16.3 වගන්තිය ප්‍රකාරව වාර්ෂික පැමිණීමේ ශිෂ්‍ය සාමාන්‍ය අගය ගැලපීමේදී එදිනට පැවැති ගුරු අතිරික්තයද සැලැකිය යුතු වුවද, දළ වශයෙන් 1,700 ක්ව පැවැති ගුරු අතිරික්ත තත්ත්වය නොසලකා 2017 පෙබරවාරි 14 දින පැවිදි ගුරුභවතුන් 122 ක් සහ ගිහි ගුරුභවතුන් 77 ක් වශයෙන් ගුරුභවතුන් 199 ක් වෙත පත්වීම් ලබාදී තිබුණි.

- ගිණුම් ශාඛාවේ තොරතුරු අනුව 2015 වර්ෂයට අදාළව පිරිවෙන් 60 ක් සඳහා ගෙවීමට අනුමත වූ රු.මිලියන 18.24 ක වාර්ෂික ආධාර මුදල් විගණන අවස්ථාව වන විටත් අමාත්‍යාංශය විසින් ගෙවා නොතිබුණි.

- ඇතැම් විද්‍යායතන පිරිවෙන්වල ශිෂ්‍යයින් 500 කට වැඩි ප්‍රමාණයක් සිටින නමුත්, පිරිවෙන් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලැසුම්කරණයක් හා අධීක්ෂණයක් නොතිබුණි.

- පිරිවෙන්වල ගුරුභවතුන් වෙත විධිමත් පුහුණු වැඩසටහන් ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

- මුලතිව් දිස්ත්‍රික්කයේ එක් මූලික පිරිවෙනක්ද, වව්නියාව දිස්ත්‍රික්කයේ එක් විද්‍යායතන පිරිවෙනක්ද හැර උතුර පළාතේ පිරිවෙන් ආරම්භ කර නොතිබුණි.

කළමනාකරණ දුර්වලතා

පෞද්ගලික දුරකථන සමාගම් දෙකක් විසින් 2005 වර්ෂයේ සිට පාසල් පරිගණක ජාලයට සම්බන්ධිතව ලබාදී තිබුණු අන්තර්ජාල පහසුකම් සංඛ්‍යාව 1,724 ක් විය. 2016 වර්ෂයේ එම අන්තර්ජාල පහසුකම් අත්හිටුවීමට අමාත්‍යාංශය තීරණය කර

තිබුණි. 2016 වර්ෂයේදී එක් පෞද්ගලික දුරකථන සමාගමකට අදාළ සම්බන්ධතා 123 ක් හා ටෙලිකොම් සම්බන්ධතා 910 ක් විසන්ධි කර තිබුණු අතර, කිසිදු පාසලක් වෙත 2017 ජුනි මාසය අවසන් වන විටත් නව අන්තර්ජාල පහසුකම් ලබාදී නොතිබුණි. එක් පෞද්ගලික සමාගමක් විසින් පාසැල් 192 ක් සඳහා ලබාදී තිබුණු සබඳතා සඳහා රු.1,500 ක මාසික ගාස්තුවක් යටතේ නව සබඳතා බවට පරිවර්තනය කිරීමේ කටයුතු පමණක් ආරම්භ කර තිබුණු බව විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවල සඳහන් විය.

2006 ජුනි 20 දිනැති අංක 2006/27 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ගෙවීම සඳහා වන වවුචර් සෑම මාසයකම 7 වන දිනයට පෙර කළාප අධ්‍යාපන කාර්යාල වෙත භාරදීමට අදාළ විදුහල්පතිවරුන් විසින් වගබලාගත යුතුව තිබුණි. එසේ භාර දෙනු ලබන වවුචර්පත් සඳහා නියමිත ශිෂ්‍යාධාර චෙක්පත් මාසයේ 25 දිනට පෙර අදාළ බැංකු වෙත යැවීමට කළාප ගණකාධිකාරිවරයා කටයුතු කළයුතුව තිබුණි. 2015 වර්ෂය වෙනුවෙන් ජාතික පාසල් 09 ක් සඳහා රු.211,000 ක් වටිනා ශිෂ්‍යාධාරද, 2016 වර්ෂය වෙනුවෙන් ජාතික පාසල් 28 ක් සඳහා ශිෂ්‍යාධාරද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවා නොතිබුණි.

නිල ඇඳුම් හා වවුචර්පත්

1993 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පාසල් ළමුන් වෙත නිල ඇඳුම් සඳහා රෙදි ලබාදී තිබුණි. 2016 වර්ෂයේදී නිල ඇඳුම් රෙදි ලබා දීම වෙනුවට වවුචර්පත් ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් ඒ වෙනුවෙන් රු.මිලියන 2,298.06 ක් වැය කර තිබුණි. එම වියදමින් ප්‍රතිලාභී සිසුන් 4,342,381 ක් වෙත වවුචර්පත් නිකුත් කර තිබුණු අතර, ඒ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය රු.529.22 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.74.98 කින් වැඩි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව නිල ඇඳුම් සඳහා රෙදි ලබාදීමේදී 2014 වර්ෂය වෙනුවෙන් වැයකර තිබුණු මුළු මුදල 2013 වර්ෂයට සාපේක්ෂව සියයට 38.77 කින් වැඩි වී තිබුණි. එය 2015 වර්ෂයේදී 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 14.46 කින් අඩුවී තිබුණි. නමුත් 2016 වර්ෂයේදී වවුචර්පත් බෙදා දීම වෙනුවෙන් වැය කර තිබුණු මුදල 2015 වර්ෂයේ නිල ඇඳුම් රෙදි වෙනුවෙන් වැයකර තිබුණු මුදලට වඩා සියයට 11.91 කින් වැඩිවී තිබුණි.
- 2016 වර්ෂය සඳහා මුද්‍රණය කළ රු.මිලියන 2,616.57 ක් වටිනා වවුචර්පත්වලින් කළාප කාර්යාල හරහා පාසල් වෙත රු.මිලියන 2,414.08 ක් වටිනා වවුචර්පත් නිකුත් කර තිබුණි. නිකුත් කළ වවුචර් සඳහා බැංකු මඟින් ගෙවන ලද මුදල රු.මිලියන 2,267.61 වූයෙන් රු.මිලියන 146.47 ක් වටිනා වවුචර් කළාප කාර්යාල, ගුරුවරුන් හෝ ශිෂ්‍යයින් අත රඳවාගෙන තිබුණි. සමස්ථයක් ලෙස 2016 වර්ෂය තුළ මුද්‍රණය කළ සම්පූර්ණ වවුචර්වලින් රු.මිලියන 348.96 ක් වටිනා වවුචර්පත් ඉතිරිව තිබුණි.

අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය

ගුරු තොරතුරු ඇතුළත් දත්ත සංචිතයක් (Data Base) පිළියෙල කර ගැනීම හා ඊට අනුබද්ධිත ගුරු සේවා කළමනාකරණය සහ ගුරුවරුන්ට හා කාර්යාල පද්ධතියට අවශ්‍ය සේවාවන් සැපයීම යනාදී වූ අරමුණු පෙරදැරිව, මොරටුව විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව අධ්‍යාපන කළමනාකරණ

තොරතුරු පද්ධතියක් (EMIS) ස්ථාපිත කර තිබුණි. ඒ සඳහා 2011 මාර්තු මාසයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළදී දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘති (EKSP) අරමුදලින් රු.මිලියන 64.06 ක් වැය කර තිබුණි.

2012 පෙබරවාරි 27 දින පළමුවන පියවර යටතේ ගුරුවරුන් සඳහා වන දත්ත පද්ධතිය නිර්මාණය කර දීම සඳහා රු. 900,000 (බදු රහිත) මුදලක්ද, 2013 ජුනි 27 දින දෙවන පියවර යටතේ පළමුවන පියවරෙහි සඳහන් දත්ත පාදක කරගෙන මොඩියුල නවයක් නිර්මාණය කර ලබාදීමට රු.13,877,100 (බදු රහිත) මුදලක්ද, මොරටුව විශ්ව විද්‍යාලය වෙත ගෙවා තිබුණි. එසේ වුවද දැනට වර්ෂ හතරකටත් වඩා පැරණි මෙම පද්ධතිය නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට 2017 ජුනි 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

පාසල් පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීම

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී පෙළපොත් මුද්‍රණය සඳහා රු. මිලියන 3,888 ක් වැය කර තිබුණි. ඉන් රු. මිලියන 2,985 ක් පොත් වර්ග 315 කින් පිටපත් 30,033,000 ක් මුද්‍රණය කිරීම සඳහා පෞද්ගලික මුද්‍රණාල 22 ක් වෙත ලබාදී තිබුණු අතර, එය මුළු මුද්‍රණ වියදමෙන් සියයට 77 ක් වී තිබුණි.

2016 වර්ෂයේදී පළමුවරට කෘතිම කඩදාසියේ මුද්‍රණය කර තිබුණු 7 වසර සඳහා භූගෝල විද්‍යාව පොත සඳහා රු. මිලියන 129 ක් වැඩිපුර වැය කර තිබුණි. සාමාන්‍ය කඩදාසියෙන් වසර 8 සඳහා සෑම වසරකදීම වාර 08 ක් මුද්‍රණය කළද, එහි වියදම දළ වශයෙන් රු. මිලියන 206.43 ක් පමණක් වී තිබුණි. කෘතිම කඩදාසියෙන් පොත දෙවරක් පමණක් මුද්‍රණයේදී රු.මිලියන 309.49 ක් වැය වෙතැයි අපේක්ෂා කර තිබුණි.

ප්‍රසම්පාදන කටයුතු

කොළඹ විසාකා විද්‍යාලයේ සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 97 කට ලංසුවක් ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවෙකු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මුළු වියදම පියවා ගැනීම සඳහා අදාළ විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ රු.මිලියන 137 ක ස්ථාවර තැන්පතු යොදා ගන්නා බව අදාළ විදුහල්පතිනිය අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. ඒ අනුව අදාළ ඉදිකිරීම පාසල් සංවර්ධන සමිතියේ මුදලින් සිදු කළ පසු තවත් රු.මිලියන 40 ක් ඉතිරි කර ගැනීමට හැකියාව තිබුණත්, ඒ පිළිබඳව සැලැකිලිමත් නොවී 2017 වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 63.5 ක් ඒ වෙනුවෙන් වෙන් කර තිබුණි.

නුගේගොඩ අනුලා විද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා තුන්වන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුවෙකු වෙත 2010 නොවැම්බර් 19 දින රු.මිලියන 14.01 කට (එකතු කළ අගය මත බදු හැර) කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2010 නොවැම්බර් මාසයේදී ආරම්භ කර 2011 ජුනි 01 දින අවසන් කළ යුතුව තිබුණි. අවස්ථා කිහිපයකදීම දින දීර්ඝ කිරීම්ද සිදු කර තිබුණු අතර එම දින අවසාන වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට කළ වැඩවල වටිනාකම රු.මිලියන 8.10 ක් වී තිබුණි. අදාළ විද්‍යාලය විසින් මේ සඳහා රු.මිලියන 25.60 ක් අමාත්‍යාංශයේ තැන්පත් කර තිබුණු අතර, ඉන් රු.මිලියන 17.36 ක් රජයේ ආදායමට බැර කර තිබුණි. මේ සඳහා වර්ෂ පහකට අධික කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණු අතර, ප්‍රමාදය හේතුවෙන් ද්‍රව්‍යවල මිල

විචලනයන්ගෙන් වන අලාභයන්ට හා ඉදිකරන ලද කොටස්වලට වන හානිවලින් සිදුවන අලාභයන්ට අදාළ නිලධාරීන් වගකීමට බැඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

කොළඹ ඉසිපතන විද්‍යාලයේ පිහිනුම් තටාකයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 43.40 කට ඉදිරිපත් කර තිබුණු ලංසුවකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර අදාළ කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එම කොන්ත්‍රාත්තුව 2014 ජූලි 29 දින වැඩ ආරම්භ කර දින 280 කින් අවසන් කළ යුතුව තිබුණත්, 2016 ඔක්තෝබර් 11 දින දක්වා එහි කාලය දීර්ඝ කර තිබුණි. ඉටු කර තිබුණු වැඩවල මුළු වටිනාකම වූ රු.මිලියන 33.04 ක් අදාළ කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත්තුව ඉටු කිරීම ප්‍රමාද කළ කාලය වෙනුවෙන් කිසිදු ප්‍රමාද ගාස්තුවක් අයකළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

පිහිනුම් තටාකයක් ඉදිකිරීමේ අරමුදලක් සඳහා කොළඹ මහානාම පිරිමි ජාතික පාසල විසින් එකතු කරන ලද රු.මිලියන 6.00 ක මුදලක් 2007 දෙසැම්බර් 19 දින ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට එම ආයෝජනයේ වටිනාකම රු.මිලියන 22.53 ක් වී තිබුණි. 2017 ජූලි 21 දින වන විටත් අදාළ පිහිණුම් තටාකය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

වාහන උපයෝජනය

අධ්‍යාපන අමාත්‍යාංශය සතු සියළුම වර්ගයන්ට අයත් වාහන 147 ක් පැවති අතර, ඉන් වාහන 17 ක් භාවිතයට ගැනීමට නොහැකි තත්ත්වයේ පැවතුණි. එයින් වාහන 71 ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ හිමිකාරීත්වය තිබුණද, අමාත්‍යාංශයේ නොතිබුණි. අමාත්‍යාංශයට අයත් නොවූ වාහන 25 ක් අමාත්‍යාංශය විසින් භාවිතයට යොදවා තිබුණි.

පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම් හා වැටුප් ගෙවීම

2014 ඔක්තෝබර් 22 දිනැති අංක 1885/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට අන්තර්ග්‍රහණය කර තිබුණු නිලධාරීන් සංඛ්‍යාව 12,160 ක් විය. අනුමත නිලධාරී සංඛ්‍යාව 16,512 ක් වූ නමුත්, තථ්‍ය සංඛ්‍යාව 13,517 ක් වූ බැවින් තවත් තථ්‍ය සංඛ්‍යාව තුළ සිටින 1,357 ක් අන්තර්ග්‍රහනය කළ යුතුව තිබුණි.

රාජ්‍ය සේවයේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිකුත් කළ 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම III හි සඳහන් සටහන හා 2006 නොවැම්බර් 10 දිනැති අංක 06/2006 (II) හි 04 ඡේදයට අනුකූල නොවන පරිදි 2006 ජනවාරි 01 දිනට පසුව අමාත්‍යාංශයේ ජාතික පාසල්, විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල සඳහා බඳවාගෙන තිබුණු රසායනාගාර සේවක හා පුස්තකාල සේවක අදාළ තනතුරුවල III ශ්‍රේණියෙහි තබා, වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි තැබිය යුතු වුවද, II ශ්‍රේණියෙහි තබා 12 වන වැටුප් පියවර ලබාදී තිබුණි. මුරකරු හා ගිලන්හල් සේවක තනතුරු සඳහාද ආරම්භක වැටුප් පියවර වෙනුවට 12 වන වැටුප් පියවර ලබාදී තිබුණි.

2007 ජූලි 01 දින සිට 2009 නොවැම්බර් 01 දින දක්වා කාලසීමාව තුළ අනියම් සේවක තනතුරු 324 ක් සඳහා පත්වීම් ලබාදී තිබුණි. 2016 වර්ෂය අවසානය වන විට වැටුප දළ වශයෙන් (වැටුප් වර්ධක රහිතව) රු. මිලියන 46.61 ක් වැඩිපුර ගෙවා තිබුණි.

2010 නොවැම්බර් 10 දිනැති අංක NSCC/1/84/TU – 2 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ ලිපියේ, 2008 දෙසැම්බර් 04 දින, 2009 ජනවාරි 06 දින හා 2009 මැයි 18 දින ලිපිවලින් කොමිෂන් සභාවේ උපදෙස් අමාත්‍යාංශය වෙත එවා තිබුණු බවත්, ඒ අනුව කටයුතු නොකර නව පත්වීම් ලබාදෙන බව 2009 ජුනි 30 දිනැති අංක ED/5/67/11/20 දරන පත්වීම් ලිපියෙන් පැහැදිලි වන බව සඳහන් කර තිබුණි. එම තත්ත්වය වහාම නිවැරදි කළයුතු බවත්, 2006 ජනවාරි 01 දිනෙන් පසුව බඳවාගත් සේවකයින් නිවැරදි වැටුප් ක්‍රමයේ පිහිටුවන ලෙසත් හා එම සාවද්‍ය තීරණයෙන් වැඩියෙන් ගෙවීමට සිදුවූ වැටුප් අදාළ නියෝග ලබාදුන් නිලධාරීන්ගෙන් අධිභාර ලෙස අයකර ගැනීමට කටයුතු කරන ලෙසත්, නිර්දේශ කර තිබුණි. එම නිර්දේශ සම්බන්ධයෙන් ගනු ලබන පියවර පිළිබඳව කොමිෂන් සභාව හා විගණකාධිපතිව දැනුවත් කරන ලෙසද වැඩි දුරටත් සඳහන් කර තිබුණි. කෙසේ වුවත්, ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර පිළිබඳව එම ලිපියේ සඳහන් පරිදි විගණකාධිපතිවරයා දැනුවත් කර නොතිබුණි.

2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළකර තිබුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති xviii පරිච්ඡේදයේ 193 වන කොන්දේසිය අනුව සෑම රජයේ නිලධාරියෙක්ම ස්ථාන මාරුකිරීම්වලට යටත් වන අතර, එහි ස්ථාන මාරුවීම්වලට හා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් ක්‍රියා කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය තුල සේවයේ නියුතු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල 203 කගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කර නොතිබුණි.

බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳිමින් පවතින වත්කම්

අමාත්‍යාංශයේ ජාතික පාසල්, ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සතුව පවතින පර්චස් 04 ක සිට පර්චස් 224 ක් දක්වා පරාසයක භූමි ප්‍රමාණයන් සහිත වූ නාගරිකව පිහිටා තිබුණු ඉඩම් 80 ක් අනුමැතියකින් හා අවසරයකින් තොරව බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳිමින් පැවතුණි. ඉහළ තක්සේරු වටිනාකම්වලින් යුක්ත ඇතැම් ඉඩම්වල විශාලත්වය හා වර්තමාන වටිනාකම්වල තොරතුරු අමාත්‍යාංශයේ නොතිබුණි.

පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණයෙහි ප්‍රගතිය

2011 පෙබරවාරි 02 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කළ 2011 ජනවාරි 18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් උපයන ආදායමෙන් පුරාවිද්‍යා ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය වෙනුවෙන් සියයට 25 ක ප්‍රතිපාදන පුරාවිද්‍යා උරුම කළමනාකරණ භාරයට ලබාදිය යුතුව තිබුණි. පුරාවිද්‍යා උරුම කළමනාකරණ භාරය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. 2016 වර්ෂයේදී මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි ආදායම රු.මිලියන 3,446 ක් වූ අතර එයින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු මුදල රු. මිලියන 861.5 ක් වී තිබුණි. එම ආදායමට අනුව 2016 වර්ෂයේදී මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ව්‍යාපෘති 75 ක් සඳහා රු. මිලියන 115 ක් ලැබී තිබූ අතර, එය ලැබිය යුතු ආදායමින් සියයට 13 ක ප්‍රමාණයක් විය. එම මුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 19 ක් වැය කර තිබුණි. එය අරමුදලේ ආදායමෙන් සියයට 16.5 ක් වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 37

ක්වූ ව්‍යාපෘතීන් 29 ක් සඳහා 2016 වර්ෂයේදී කිසිදු වියදමක් කර නොතිබුණි. ව්‍යාපාතීන් 39 ක් සහා රු.මිලියන 7 ක් වැය කර තිබුණත්, එහි භෞතික ප්‍රගතිය සියයට 0 ක සිට සියයට 50 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ව්‍යාපෘති 51 ක් සඳහා වැය කර තිබුණු රු.මිලියන 10 ක මූල්‍ය ප්‍රගතිය සියයට 0 සිට 50 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

පුරාවිද්‍යා ස්ථාන ගැසට් නොකිරීම , අනවසර අත්පත්කර ගැනීම හා පුරාවිද්‍යා ස්ථානවලට හානි සිදු කිරීම

ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලවලින් ලද තොරතුරු අනුව පුරාවිද්‍යා ස්ථානවලට වැඩි බලපෑමක් වූ දිස්ත්‍රික්ක 8 කට අදාළව ගැසට් නොකළ පුරාවිද්‍යා ස්ථාන 66 ක්ද, අනවසර අත්පත්කර ගැනිම්වලට ලක්වූ පුරාවිද්‍යා ස්ථාන 86 ක් සහ හානි සිදුකිරීම් කරන ලද පුරාවිද්‍යා ස්ථාන 85 ක්ද විය. ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත සඳහන් වගුව 19 හා දැක්වේ. පොළොන්නරුව, මුලතිව් හා වව්නියා දිස්ත්‍රික්කවල සංඛ්‍යාලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

දිස්ත්‍රික්කය	ගැසට් නොකළ	අනවසර අත්පත් කර ගැනීම් *	හානි සිදුකිරීම් **
යාපනය	15	03	01
කිලිනොච්චිය	15	-	-
අම්පාර	-	23	22
අනුරාධපුරය	03	04	25
ගාල්ල	-	21	03
මොණරාගල	16	20	11
කුරුණෑගල	-	13	15
ත්‍රිකුණාමලය	17	02	08
එකතුව	**66**	**86**	**85**

වගුව 19 :- පුරාවිද්‍යා ස්ථාන ගැසට් නොකිරිම, අනවසර අත්පත් කර ගැනීම හා හානි සිදු කිරීම
මූලාශ්‍රය- ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලවලින් රැස්කර ගන්නා ලද තොරතුරු

කොළඹ දිස්ත්‍රික්කයේ ඇතුල් කෝට්ටේ ඉපැරණි කෝට්ටේ රාජධානිය වටා ඇති කොටු බැම්මෙහි ඉවත් කළ යුතු අනවසර ඉදිකිරීම් ප්‍රමාණය 110 ක් විය.

පුරාවිද්‍යා ස්ථාන වෙබ් පිටුවට ඇතුළත් නොවීම

1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ 40 (අ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ ලේඛනයක් පවත්වාගත යුතු බව සඳහන් වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන වෙබ් පිටුව තුළ 2012 දෙසැම්බර් 30 දිනෙන්

පසුව ගැසට් කර ඇති ස්මාරක යාවත්කාලීන කර නොතිබුණ අතර ඒ අනුව පුරාවිද්‍යා ස්මාරක 802ක් පමණ වෙබ් අඩවියේ සඳහන් කර නොතිබුණි.

පුරාවස්තු ආඥා පනතේ 33 වගන්තිය ප්‍රකාරව ගැසට් මගින් ප්‍රකාශයට පත් කළ පුරාවිද්‍යා රක්ෂිතවල ලෙඛනයක් පුරාවිද්‍යා වෙබ් අඩවියේ දක්වා නොතිබුණි.

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අංශය විසින් කම්කරු හා වෘත්තිය සමිති සබඳතා විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම, ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම, වෘත්තිය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියළුම වෘත්තිය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම, ජාතික මිනිස්බල හා රැකී රක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම, කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු කිරීම හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කිරීම කළ යුතුව තිබුණි.

ශ්‍රී ලංකාවට අදාළව ශ්‍රම බලකායේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත 20 වගුවෙහි දැක්වේ.

	2015	2016
කුටුම්භ ජනගහනය		
පුද්ගලයින්	15,282,000	15,449,000
ශ්‍රම බලකාය		
පුද්ගලයින්	8,214,000	8,311,000
සේවා නියුක්ත	7,831,000	7,948,000
සේවා වියුක්ත	383,000	363,000
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය	53.8	53.8
පුරුෂ	74.7	75.1
ස්ත්‍රී	35.9	35.9

වගුව 20 - ශ්‍රම බලකායේ ප්‍රධාන ලක්ෂණ
මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2016

කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු පරිගණකගත කිරීම.

ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ 2010 වර්ෂයේදී හඳුන්වාදුන් කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු පරිගණකගත කිරීමේ වැඩසටහනේ (LISA) සාධනීය ප්‍රගතියක් 2016 වර්ෂය අවසාන වන විටත් කම්කරු දෙපාර්තමේන්තුව ලඟා කරගෙන නොතිබුණි. මෙම වැඩසටහන සඳහා මිලදී ගත් රු.මිලියන 30.16 ක් වටිනා තල පරිගණක 314 ක් කම්කරු නිලධාරීන් වෙත

ලබා දී තිබුණ ද, එම පරිගණක වැඩසටහන සඳහා භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතුණි. කම්කරු නිලධාරීන් විසින් තොරතුරු හා දත්ත මෙම පද්ධතියට ඇතුළත් නොකරන බැවින් කම්කරු කාර්යාල හරහා එම ක්‍රියාවලිය සිදුකර ගැනීමට නැවතත් රු.මිලියන 18.47 ක් වැය කර පරිගණක 138 ක් හා අනෙකුත් උපාංග 245 ක් මිලදී ගැනීමට කම්කරු දෙපාර්තමේන්තුවට සිදුව තිබුණි. ඉන් රු.51,800 ක් වටිනා උපාංග 22 ක් 2016 වර්ෂය අවසාන වන තුරුත් නිලධාරීන් වෙත බෙදාදීමට කටයුතු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට කම්කරු කාර්යාලවල පැමිණිලි හා නඩු ප්‍රගතිය පිළිබඳ ඉදිරිපත් කළ තොරතුරු හා LISA පද්ධතියේ තොරතුරු අතර බොහෝ නොගැලපීම් පැවතුණි.

කම්කරු කාර්යාලවල නඩු කටයුතු විසඳීම

1999 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 18 ක කාලය තුළදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තිය හා කම්කරු නීතිරීති කඩවීම් සම්බන්ධව නඩු 73,329 ක් පවරා තිබුණි. ඉන් 2016 වර්ෂය අවසාන වන විට නඩු 14,750 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. 2016 වර්ෂය අවසාන වන විට රු.මිලියන 1,803.51 ක වටිනාකමක් සහිත නඩු 3,680 ක් අක්‍රියව පැවතුණි. වටිනාකම රු.මිලියන 812.20 ක් සහිත නඩු 2,461 ක් විවෘත වරෙන්තු ලෙසද පැවතුණි. එම අක්‍රිය හා විවෘත වරෙන්තු නඩු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නීතිමය ක්‍රමවේදයක් නොතිබීම, නඩු නැවත සක්‍රීය කිරීමට කම්කරු නිලධාරින්ට විධිමත් වගකීමක් නොපැවරීම හා කම්කරු නිලධාරීන් සිය රාජකාරී ඉටු කිරීමේ පවතින අකාර්යක්ෂමතාවය නිසා එම නඩු 2016 වර්ෂය අවසාන වන විටත් විසඳීමකින් තොරව කම්කරු කාර්යාලයේ පැවතුණි.

අම්පාර සංචාරක නිවාසය ඉදිකිරීම

1954 පෙබරවාරි 12 දිනැති අංක 10640 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදන යටතේ අම්පාර අභය භූමියේ හෙවත් ගල්ඔය නිම්න ඊසාන දිග අභය භූමියට අයත් ඉඩමක කම්කරු හා වෘත්තීය සමිති සබඳතා සහ සබරගමු සංවර්ධන අමාත්‍යාංශය විසින් සංචාරක නිවාසයක් 2015 වර්ෂයේ සිට ඉදිකරමින් පැවැතුණි. ඒ සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනතේ (469 අධිකාරය) යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරයක් ලබා ගෙන නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.(i)(අ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ඉටු කළ යුතු ආරම්භක පාරිසරික පරීක්ෂණය, පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව, සමාජ බලපෑම් පිළිබඳ තක්සේරුව යනාදිය අමාත්‍යාංශය විසින් ඉටුකර නොතිබුණි. එසේම එම ඉදිකිරීමට අදාළ ගොඩනැගිලි සැලසුම2017 ජූලි 31 දින වන විටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමත කර නොතිබුණි. මෙම ඉඩම් කොටසේ අයිතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර 2017 මාර්තු 23 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද, එම ගිවිසුම අනුව ඉඩමේ පූර්ණ අයිතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු විය. එබැවින් අමාත්‍යාංශයට නීත්‍යානුකූලව හිමි නොවූ රක්ෂිත භූමියක පිහිටි ඉඩමක සිදුකළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2017 මැයි මාසය අවසන් වන විටත් රු.මිලියන 16.3 ක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි.

කම්කරු වන්දි ගෙවීම

ආපදාවකට හෝ මරණයකට පත්වන සේවානියුක්තිකයන් වෙනුවෙන් සේවා යෝජකයින්ගෙන් අප්‍රමාදව වන්දි අය කර දීම මඟින් සේවක තෘප්තිය ඇති කිරීමේ

දැක්ම සහිතව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කර තිබුණි.

බාල වයස්කරුවන්ගේ තැන්පත් ගිණුම්වල පැවති වන්දි මුදල් නොගෙවීම

2016 වර්ෂය අවසාන වන විට වයස පූර්ණත්වයට පත්ව සිටි ප්‍රතිලාභීන් 429 ක ගේ එකතුව රු.මිලියන 8.1 ක් වටිනා තැන්පතු ගිණුම්වල ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණද, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

වාර්තා වූ අනතුරු සහ වන්දි ගෙවීම

මාරක හෝ මාරක නොවන අනතුරු හේතුවෙන් වන්දි ඉල්ලීම් සඳහා කරන ලද පැමිණිලිවලින් 763 ක් 2016 වර්ෂයේ දී කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ විභාග වෙමින් පැවති අතර ඉන් පැමිණිලි 533 ක් 2016 වර්ෂයට පෙර පැවරූ නඩු වූ අතර එම නඩු මාස 08 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. වන්දි ලබාගැනීම සඳහා පවරන ලද නඩු සඳහා විශාල කාලසීමාවක් ගතවීමෙන් සේවා නියුක්තිකයන්ට එකී වන්දිවලින් අත් කර ගත හැකි ප්‍රතිලාභ ලබා ගැනිමට නොහැකි වී තිබුණි.

සේවා යෝජකයින් විසින් තැන්පත් කළ වන්දි නොගෙවීම

සේවායෝජකයින් විසින් ආපදාවට ලක් වූවන් වෙත වන්දි ගෙවීම සඳහා වන්දි කොමසාරිස් කාර්යාලය වෙත රු.මිලියන 3.13 ක් ලබා දී තිබුණි. කොමසාරිස් කාර්යාලය විසින් අදාළ පාර්ශවයන් වෙත එම වන්දි ලබා නොදී වර්ෂ 2 ක සිට වර්ෂ 6 ක් අතර කාල සීමාවක සිට පොදු තැන්පතු ගිණුමේ රඳවා තබාගෙන තිබුණි.

ළමා ශ්‍රමය ශූන්‍යත්වයට පත්කිරිමේ ව්‍යාපෘතිය

"සුනිසි මෙහෙවර" වැඩසටහන වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 8.00 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 2.00 ක් ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය ශූන්‍යත්වයට පත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ දුම්රිය මැදිරි 08 ක දැන්වීම් පල කිරීමට තීරණය කර තිබුණද, එම ව්‍යාපෘතිය සැලැසුම් කිරීමේ අදියරේදී විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීමත්, නිසි පිරිවැය ප්‍රතිලාභ ඇගයීමේ ක්‍රමයක් සහිතව සැලැසුම් සකස් නොකිරීමත් නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම අනාර්ථික බව පසුව තීරණය කර ව්‍යාපෘතිය අත්හැර තිබුණි.

සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2016 වර්ෂය අවසාන වන විට පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය ලෙස 3,682,695 ක් වාර්තා කර තිබුණි. ඉන් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය ඇති සක්‍රීය සාමාජික සංඛ්‍යාව 2,400,000 ක් හෙවත් සියයට 65 ක් විය. අනෙකුත් අනුමත අර්ථසාධක අරමුදල්වල සාමාජිකත්වය දරන සේවක සංඛ්‍යාව සියයට 11 ක් පමණක් වීමෙන් ඉතිරි සියයට 24 ක් වූ ප්‍රමාණය කිසිදු අරමුදලකට දායකත්වයක් ලබා ගෙන නොතිබුණි. එම සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දීම සඳහා අවධානයක් යොමු කර නොතිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2016 වර්ෂය අවසාන වන විට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සක්‍රීය සාමාජික සංඛ්‍යාව සහ දායක මුදල් ගෙවන සේවා යෝජක සංඛ්‍යාව පිළිවෙළින්

2,500,000 ක් හා 77,842 ක් ලෙස වාර්තා වී තිබුණි. සේවක අර්ථසාධක අරමුදලේ එම සංඛ්‍යාවන් පිළිවෙලින් 2,400,000 ක් හා 73,973 ක් වී තිබුණි. එය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට වඩා අඩු අගයක් ගෙන තිබුණි. ඒ අනුව, සාමාජිකයින් 100,000 ක් හා සේවා යෝජකයින් 3,869 ක් ලියාපදිංචි කර ගැනීමට සේවක අර්ථසාධක අරමුදල අපොහොසත් වී තිබුණි.

අරමුදලට අදාළව ලැබෙන දායක මුදල් කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කරන තුරු පොදු තැන්පත් ගිණුමක රඳවා ගෙන තිබුණි. 2016 වර්ෂයේදී රු.මිලියන 240.21 ක් ලැබී තිබුණු අතර රු.මිලියන 107.75 ක් නිරවුල් කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 356.42 ක් තවදුරටත් නිරවුල් කළ යුතුව තිබුණි.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 23 වන වගන්තිය අනුව, අරමුදලෙහි සාමාජිකයෙකුගේ පෞද්ගලික ගණනෙහි අය පක්ෂයට ඇති මුළු ගණන හැකිතාක් ඉක්මණින් සාමාජිකයාට ගෙවිය යුතුව තිබුණි. නමුත් ප්‍රතිලාභ ඉල්ලුම්කර 2017 ජුනි 30 දින වන විට වර්ෂ 01 ක සිට වර්ෂ 15 ක් දක්වා කාලයක් ගත වී තිබුණද, ගෙවීම් සිදු කර නොතිබුණු සාමාන්‍ය ප්‍රතිලාභ ඉල්ලුම්පත් 186 ක්ද, මරණ ප්‍රතිලාභ ඉල්ලුම් කළ ඉල්ලුම්පත් 39 ක් ද පැවතුණි.

පරිසරය

තිරසාර පරිසරයක් උදෙසා ක්‍රියාකිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සහ ඒ යටතේ දෙපාර්තමේන්තු දෙකකින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 08 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- පරිසර හා මහවැලි ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම, වර්තමාන හා අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීම.
- පරිසර දූෂණය මැඩලීම පිණිස වැඩසටහන් සම්පාදනය කිරීම හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම.
- සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු සහ නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.
- වනාන්තර, වනසතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය.
- රටේ දැව අවශ්‍යතා සපුරාලීම සඳහා වාණිජ වන වගා ප්‍රවර්ධනය.
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළඳාම ප්‍රවර්ධනය හා නියාමනය.
- වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය.

ඉහත සඳහන් ආයතන විසින් එම කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමාඔය ද්‍රෝණියේ පාරිසරික හා අනෙකුත් ජල අවශ්‍යතාවලට බලපෑමක් ඇති නොවන අයුරින් එම ද්‍රෝණියේ සිට ජල ඌණතාවයෙන් පෙළෙන දක්ෂිණ කළාපයේ කිරිඳිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කොටගෙන ශ්‍රී ලංකා රජය හා ඉරාන රජය අතර අවබෝධතා ගිවිසුමක් 2007 නොවැම්බර් 27 දින අත්සන් කර තිබුණි. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) හරහා ලැබෙන විදේශ ණය එක්සත් ජනපද ඩොලර් මිලියන 450 ක්, ශ්‍රී ලංකා රජය ලබාදෙන එක්සත් ජනපද ඩොලර් මිලියන 79 ක් හා රු.මිලියන 15,474 කින් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සම්පූර්ණ වියදම රු.මිලියන 49,736 ක් වූ අතර, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හා හදිසියේ ඇති වූ ජල කාන්දුව හේතුවෙන් විවිධ දුෂ්කරතාවලට පත් මහජනතාව වෙනුවෙන් දේශීය අරමුදලින් රු.මිලියන 901ක් මුදල් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය හේතුවෙන් එම ප්‍රදේශවල මහජනයාට ඔවුන්ගේ නිවාස, ඉඩම්, අනෙකුත් දේපල හා බීමට ලබාගන්නා ජලය සම්බන්ධයෙන් දුෂ්කරතා රාශියකට මුහුණදීමට සිදුවී තිබුණි.

පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපාතිය

පාරිසරික වශයෙන් ඉහළ වැදගත්කමක් සහිත ප්‍රදේශවල සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් ජෛව විවිධත්වය හා පරිසර පද්ධති සේවාවන් සංරක්ෂණය සිදුවන ආකාරයට කළමනාකරණය කිරීමේ යාන්ත්‍රණයක් ලෙස පරිසර සංවේදී භූමි ප්‍රදේශ නම් කර ප්‍රකාශයට පත් කර තිබුණි. ඒ අනුව නියමු ප්‍රදේශ දෙකක් ලෙස කලාවැව පරිසර සංවේදී භූමි ප්‍රදේශය හා විල්පත්තු පරිසර සංවේදී භූමි ප්‍රදේශය හඳුනාගැනීම අරමුණු කර ගෙන, 2015 ඔක්තෝබර් 01 දින සිට වර්ෂ 05 කට මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි.

මෙම ව්‍යාපෘතියේ වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 19.28 ක් වන අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 6.50 ක්ද, ගෝලීය පාරිසරික පහසුකම (GEF) විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 2.63 ක්ද, රාජ්‍ය ආයතනවල සහයෝගීතාවය (Government Co – Finance) මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 10.15 ක්ද ඇස්තමේන්තු කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සැලැසුම්ගත වන අලි කළමනාකරණ ප්‍රතිපත්ති උපායමාර්ග හා ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කිරීම, සැලසුම් හා ක්‍රියාත්මක කිරීම කරගෙන යාමට අදාළ ධාරිතා වර්ධනය, සීමාංකනය නොකරන ලද කැලෑවල මායිම් සීමාංකනය කිරීම, සන්නිවේදන උපායමාර්ග ගොඩනැගීම, කහල්ල පල්ලේකැලේ කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම හා එකිනෙක ක්‍රියාකාරකම්වලට අදාළව ක්ෂේත්‍ර වාරිකා සිදුකිරීම යන ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.

ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළුවීම හා පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය

ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළුවීම හා පැතිරරීමේ තර්ජනය සැලැකිල්ලට ගෙන 2011 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා ගෝලීය පාරිසරික පහසුකම් (GEF) හි මූල්‍ය ප්‍රතිපාදන ඇතිව ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 5.24 ක් වන අතර 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 80.00 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 61.53 ක් උපයෝජනය කර තිබුණි.

ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිතව මැදිරිගිරිය, ලංකාපුර හා වලපනේ ප්‍රදේශවල ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ අරමුණින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ලෝක ආහාර වැඩසටහන අතර වර්ෂ 03 ක් සඳහා ගිවිසුමකට 2014 අගෝස්තු 11 දින එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය එක්සත් ජනපද ඩොලර් මිලියන 7.99 ක විදේශ ප්‍රදානයක් යටතේ ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, එක් එක් වර්ෂය සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 20 කටත් වඩා අඩු ප්‍රමාණයක මූල්‍ය කාර්යසාධනයක් ලබා කරගෙන තිබුණි.

තවද ව්‍යාපෘතියේ අපේක්ෂිත කාල සීමාවෙන් වර්ෂ 02 ක් අවසන් වී තිබුණද, සැලකිය යුතු මට්ටමක භෞතික ප්‍රගතියක් ලබාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 41.89 ක් වී තිබුණි. ඉන් වාර්ෂිකව සියයට 0.15 ක පොලියක් යටතේ වර්ෂ 10 ක ගෙවීමේ සහන කාලයක් ඇතුළත්ව වර්ෂ 40 කින් ගෙවා නිම කිරීමට යටත්ව කොරියානු ණය ආධාර යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 33.54 ක ණය ලබා ගෙන තිබුණි. ව්‍යාපෘතියේ දේශීය අරමුදල් ප්‍රතිපාදනය එක්සත් ජනපද ඩොලර් මිලියන 8.35 ක් වී තිබුණි. එම ණය ගිවිසුම 2013 ජූලි 23 දින අත්සන් කර තිබුණු අතර, ගිවිසුම ප්‍රකාරව වර්ෂ 4 ක් ඇතුළත පොකුරු ක්‍රමය යටතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජනනය වන කසළ අවසාන ලෙස බැහැර කිරීමේ පහසුකම් සැපයීම සඳහා සනීපාරක්ෂක කසළ රඳවන 04 ක් අනුරාධපුරයේ කීරික්කුලම, හික්කඩුව, මොන්රෝවියාවත්ත, පානදුර මාලමුල්ල හා උඩුනුවර ගොනාධිකාවත්ත යන ස්ථානවල ඉදිකිරීමට සැලසුම්කර තිබුණි.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර සනීපාරක්ෂක කසළ රඳවන සඳහා ස්ථාන තෝරා ගැනීමට ව්‍යාපෘතිය ආරම්භයේදීම කටයුතු කර නොතිබුණු අතර, පානදුර මාලමුල්ල හා උඩුනුවර ගොනාධිකාවත්ත ඉදිකිරීම් වෙනුවට යාපනය කීරිමලේ හා මැදිරිගිරිය යුධගනාව යන ස්ථානවල මෙම කසල රඳවන ස්ථාපිත කිරීමට ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 1½ ක් පමණ ගත වී තිබුණි. රූපසටහන 05 හා 06 හි දැක්වේ. ඒ අනුව ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු කාලානුරූපීව හා සඵලදායී ලෙස ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විට මාස 37ක් පමණ කාලයක් ගත වී තිබුණත්, කසළ රඳවන ඉදිකිරීමට අදාළ ව්‍යාපෘතියේ කටයුතු සැලැසුම් අදියරේ පැවැතුණි.

රූප සටහන 05 - යාපනය කීරමලේ යෝජිත බිම් පිරවුම

රූප සටහන 06 මොන්රෝවියාවත්ත යෝජිත බිම් පිරවුම

පිළිසරු ව්‍යාපෘතිය

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද පිළිසරු ව්‍යාපෘතිය මගින් නිසි සම්පත් සංරක්ෂණය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තහවුරු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ පුද්ගලයින්ගේ දැනීම හා දක්ෂතා වර්ධනය කිරීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම, වැඩසටහන් නිරීක්ෂණය කිරීම, පහසුකම් සැපයීම, අවශ්‍ය මූලික ප්‍රතිපාදන සැපයීම, ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ බැංකු ක්‍රමයක් ස්ථාපිත කිරීම, නිසි පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අපේක්ෂා කර තිබුණි. වර්ෂ 06 ක් සඳහා වූ අරමුදල් සැලැස්ම අනුව ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.බිලියන 5.6 ක් වී තිබුණි. ඉන් රු.බිලියන 2.68 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින්ද, 2008 වාර්ෂික අයවැය මගින් හඳුන්වා දී තිබූ "හරිත බද්ද" තුළින් රු.බිලියන 2.92 ක්, ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කොම්පෝසට් අංගන 132ක් ඉදි කර තිබුණු අතර, ඉන් කොම්පෝස්ට් අංගන 20 ක් අතර මග නවතා තිබුණි. 2016 වර්ෂයේදී කොම්පෝස්ට් අංගන 18 ක් හා ජීව වායු ඒකක 03 ක් ඉදිකර තිබුණු අතර, අංගන 09 ක වැඩිදියුණු කිරීම් සිදු කර තිබුණි. මීට අමතරව පළාත් පාලන කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා තිබුණි.

විදේශ කටයුතු

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ජාතික අභිලාශයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම හා සුරක්ෂා කිරීමත්, ජාත්‍යන්තර සබඳතා ජාතික අභිලාෂයන්ට අනුකූලව කළමනාකරණය සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමත් යන අරමුණු ඉටුකරගැනීම මෙම අංශයෙන් අපේක්ෂා කර ඇත. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- විදේශ කටයුතු පිළිබඳ දේශපාලනික සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විදේශ රටවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- ජාත්‍යන්තර ගිවිසුම් සහ සම්මුතිවලට එළඹීම.
- ශ්‍රී ලංකාවේ දී විදේශ රටවල ආණ්ඩු සහ ජාත්‍යන්තර සංවිධාන නියෝජනය කිරීම.
- විදේශ රටවල දී සිදුකරන ප්‍රචාරණ කටයුතු.
- රාජ්‍යතාන්ත්‍රික විනිර්මුක්තීන් හා වරප්‍රසාද සහ කොන්සියුලර් කටයුතු.

ඉහත සඳහන් කාර්යයන් දේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීම විදේශ කටයුතු අමාත්‍යාංශයේ අංශ 15ක් යටතේ සිදුකරනු ලබන අතර, විදේශීය වශයෙන් එම කාර්යයන් ඉටුකිරීම සඳහා 2016 වර්ෂය අවසාන වන විට තානාපති කර්යාල 37 ක්, නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල 13 ක්, කොන්සියුලර් ජනරාල් කාර්යාල 12 ක්, එක්සත් ජාතීන් සඳහා නිත්‍ය දූත මණ්ඩල 02 ක් හා නියෝජිත කාර්යාලයක් වශයෙන් ගෝලීයව ව්‍යාප්ත වී ඇති දූත මණ්ඩල ජාලයක් පවත්වා ගෙන යනු ලැබීය.

මෙම අංශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

අග්‍රිම ගිණුමේ ශේෂය නිරවුල් නොකිරීම

2013 හා 2016 වර්ෂවලට අදාළ අග්‍රිම ගිණුම් දෙකක 2016 දෙසැම්බර් 31 දින වන විට පැවැති එකතුව රු.මිලියන 860.34 ක ශේෂවලින් රු.මිලියන 423.88 ක ශේෂ අමාත්‍යාංශය විසින් 2017 මැයි 31 දින වන විට පියවා නොතිබුණි. එම නොපියවූ ශේෂ තුළ 2013 වර්ෂයේ සිට පැවැත එන ශේෂය රු.මිලියන 226.07 ක් වී තිබුණි.

2016 දෙසැම්බර් 31 දිනට විදේශ දූතමණ්ඩල කාර්යාල විසින් පියවා නොතිබුණු අත්තිකාරම් ශේෂය රු.මිලියන 310.80 ක් වී තිබුණි. එම ශේෂවලින් රු.මිලියන 136.87 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් දක්වාද, රු.මිලියන 81.33 ක් වර්ෂ 04 ක සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක හා රු.මිලියන 92.60 ක් වර්ෂ 06 ට වැඩි කාලයක සිටද පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අත්තිකාරම් ශේෂ නිරවුල් කර නොතිබුණි.

කල් ඉකුත් වූ තැන්පතු

2016 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වල වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු රු.මිලියන 99.61 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

විදේශ දූත මණ්ඩලවලට අදාළව හා දූත මණ්ඩල කාර්යාලවල නිලධාරීන්ගේ පෞද්ගලික මිලදී ගැනීම්වලට අදාළව ගෙවා තිබුණු රු.මිලියන 8.29 ක් වූ බදු මුදල් ආපසු දූත මණ්ඩලවලට ලැබී තිබුණි. එසේ ලැබී තිබුණු බදු මුදල් වර්ෂ 4ක කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම බදු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ඕස්ට්‍රේලියාවේ කැන්බරා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ඕස්ට්‍රේලියානු ඩොලර් 2,589,000 ක ගොඩනැගිලි 02 ක් 2007 හා 2012 වර්ෂවල සිට භාවිතයෙන් ඉවත්කර තිබුණි. එම ගොඩනැගිලි ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

2007 වර්ෂයේ එක්සත් ජනපද ඩොලර් මිලියන 1.2 ක් ගෙවා මැලේසියාවේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ඉදි කිරීම සඳහා විශාලත්වය අක්කර 1.681ක ඉඩමක් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි කිසිදු ඉදිකිරීමක් සිදු කර නොතිබුණි.

පාඩු හා හානි

ඔස්ලෝ තානාපති කාර්යාලයේ අමාත්‍ය තනතුරේ 2013 මැයි මාසයේ සිට 2016 ජූලි මාසය දක්වා රාජකාරී කටයුතු කළ නිලධාරිනියක් නිවාස 3 ක අවස්ථා තුනකදී නවාතැන් පහසුකම් ගෙන තිබුණි. එම නිවාස 3 ට රු.මිලියන 6.16 ක අලාභහානි සිදු වී තිබුණි. එම අලාභහානි සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඒ අය ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර, කුලී වියදම් ලෙස රජයේ වියදමින් ගෙවීම් කර තිබුණි.

නිව්යෝර්ක් තානාපති කාර්යාලයේ පළමු ලේකම්ගේ කුලී නිවාසයේ ගිවිසුම් කාලය අවසන්වීමට ප්‍රථම එම නිවාසයෙන් ඉවත්වීම හා ගිවිසුම් ප්‍රකාරව එම ඉවත්වීම දැනුම් නොදීම හේතුවෙන් මාසික කුලී ගාස්තු හා ආරක්ෂක ඇප තැන්පතුව පිළිවෙලින් රු.693,500 ක් හා රු.440,040 ක් ආපසු ලබාගැනීමට නොහැකි වී තිබුණි.

විදේශ රැකියා නියුක්තිය

විදේශ රැකියා අවස්ථා වැඩිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා විදේශ ප්‍රේෂණ හරහා ජාතික ආර්ථිකයට ඇති දායකත්වය වැඩිකිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. එම අපේක්ෂාව ඉටු කර ගැනීම සඳහා විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම ස්ථාපිත කර ඇත. මෙම ආයතන විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතු වේ.

- විදේශ රැකියාවලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම හා ක්‍රියාත්මක කිරිම.
- සංක්‍රමනික සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සහ අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය.
- ලියාපදිංචි රැකියා නියෝජිත ආයතන නියාමනය හා අධීක්ෂණය.
- විදේශ රැකියා සඳහා වෘත්තිය මාර්ගෝපදේශනය.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විගමණික ශ්‍රමිකයින් සම්බන්ධ පවුල් පැතිකඩ නිර්මාණය කිරිම

විදේශ රැකියා අමාත්‍යාංශය විසින් විගමණික ශ්‍රමිකයින් සම්බන්ධ පවුල් පැතිකඩ නිර්මාණය කිරීම, පරිගණකගත කිරීම හා සංකල්ප ක්‍රියාත්මක කිරීම අරමුණුගතව එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එක් පරිගණක කට්ටලයක් බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 300 ක් අතර බෙදා හැරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව අවශ්‍ය පරිගණක කට්ටල 300 ක් මිලදී ගැනීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලබා දීම සඳහා රු.මිලියන 30 ක ප්‍රතිපාදන 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් සලසා ගෙන තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කර පරිගණක 242 ක් පමණක් මිලදී ගෙන තිබුණි. මිලදී ගන්නා ලද පරිගණක හා උපාංග ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණත්, අවශ්‍ය ජාලගත කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් විගණිත දිනය වූ 2017 අගෝස්තු 14 දින වන විටත් මාස 08 ක කාලයක් ගත වී තිබුණත්, අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා එම පරිගණක යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

තොරතුරු දත්ත බැංකුවක් ස්ථාපිත කිරිම

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා පිටව යන හා සේවා නියුක්තියෙන් පසු පෙරලා පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් ස්ථාපිත කිරීමේ කාර්ය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැවරී තිබුණි. ඒ අනුව 2016 ජනවාරි 08 දින සිට 2016 ජනවාරි 14 දින දක්වා වූ කාල සීමාව තුළ දී දත්ත බැංකුවට තොරතුරු රැස් කිරීම ක්‍රියාත්මක කළ ශ්‍රම සුරැකුම වැඩසටහනේ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කාර්යාංශය රු.මිලියන 8.27 ක් වැය කර තිබුණි. එහෙත් 2014 හා 2015 වර්ෂවල ශ්‍රමිකයින් 563,768 ක් විදේශගත වී තිබුණත්, ඔවුන්ගෙන් සියයට 25 කට අඩු ප්‍රමාණයක් එම කාල සීමාව තුළදී දත්ත බැංකුවේ ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව ඒ සඳහා සිදු කළ වියදම ඵලදායී වී නොතිබුණි.

විදේශ රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයන් සැපයීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරමාර්ථ අතරට ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම ඇතුළත්ව තිබුණි. නමුත් කාර්යාංශය වෙත 2008 වර්ෂයේ සිට අනුමත කිරීම සඳහා ලැබී තිබූ රැකියා ඇණවුම් ප්‍රමාණයෙන් සියයට 12 ක සිට සියයට 84 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ශ්‍රමිකයන් සැපයීම සඳහා විදේශ රැකියා නියෝජිත ආයතන පෙළඹවීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. විස්තර වගුව 21 හි දැක්වේ. එමෙන්ම 2008 වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත ලැබී තිබුණු 1,014,610 ක්වූ රැකියා ඇණවුම් ප්‍රමාණය පහත රූප සටහන 20 හි දක්වා ඇති පරිදි 2016 වර්ෂය වන විට 275,634 ක් දක්වා සීඝ්‍ර ලෙස අඩු වී තිබුණි.

වර්ෂය	විදේශ රැකියා ඇණවුම් ප්‍රමාණය	විදේශගත කළ ශ්‍රමිකයින් ගණන	විගමණිත ශ්‍රමිකයින් ගණන ඇණවුමේ ප්‍රතිශතයක් ලෙස
2008	1,014,610	160,973	16
2009	797,168	156,567	20
2010	753,382	160,498	21
2011	660,844	146,293	22
2012	501,040	175,169	35
2013	607,336	180,463	30
2014	419,625	176,829	42
2015	356,115	116,866	33
2016	275,634	242,930	88

වගුව 21 : විදේශ රැකියා සඳහා ඇණවුම් ප්‍රමාණය හා විදේශගත කළ ප්‍රමාණය
මූලාශ්‍රය : ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව

රූප සටහන - 20 රැකියා ඇණවුම් ප්‍රමාණය පහළ යාම
මූලාශ්‍රය :. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව

කොරියානු රැකියාලාභීන්ගේ වෛද්‍ය පරීක්ෂණවල පරිපාලන වියදම්

ශ්‍රී ලංකා විදේශ සේවා කියුක්ත කාර්යංශය විසින් කොරියානු රැකියාලාභින්ගේ වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීම සඳහා රෝහල් දෙකක් සමග ගිවිසුම්වලට එළඹ තිබුණි. එම ගිවිසුම්වලට අනුව අවශ්‍ය වන පරිපාලන සේවාවන් ලබාදීමේ කටයුතු වෙනුවෙන් අදාළ මාසයේ වෛද්‍ය ගාස්තු ආදායමින් සියයට 25 ක් එහි පරිපාලිත සමාගමක් වූ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම වෙත ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී වෛද්‍ය ගාස්තු ආදායමෙන් රු. මිලියන 9.51 ක් සමාගම විසින් ලබා ගෙන තිබුණු නමුත් එහි සියලු පරිපාලන කටයුතු කාර්යාංශයේ බඳවා ගැනීම් අංශය විසින් සිදු කර තිබුණි.

පුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා වෙළෙඳපල වෙත යොමු කිරීම

පුහුණු ශ්‍රමිකයින් වැඩි වශයෙන් විදේශ රැකියා වෙළඳපල වෙත යොමු කිරීමේ අරමුණින් ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියන් දැනුවත් කිරීම සඳහා රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත දිස්ත්‍රික්කවලින් පිළිවෙලින් සම්බන්ධීකරණ නිලධාරීන් 06 දෙනෙකු හා 04 දෙනෙකු වශයෙන් 10 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එක් අයෙකුට මාසික දීමනාව රු.30,000 ක් වශයෙන් 2016 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.මිලියන 2.34 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 7 වන ඡේදයට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් මත ඉහත සඳහන් නිලධාරීන් බඳවා ගෙන තිබුණි.
- විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරනු ලැබූ සංවර්ධන නිලධාරීන් මාර්ගයෙන් සිදු කරනු ලබන කාර්යයෙන් කොටසක් ඉටු කිරීම එම නිලධාරීන්ට පවරා තිබුණි. කෙසේ වුවද, එම නියමු ව්‍යාපෘතියේ කාල සීමාව අවසන්ව තිබුණ ද, ඊට අදාල ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ කාර්යසාධනය

ශ්‍රී ලංකාව තුළ හෝ විදේශීය වශයෙන් වෘත්තීමය, පරිපාලනමය, තාක්ෂණිකමය, කාර්මික පුහුණු, අර්ධ පුහුණු හෝ නුපුහුණු සියළුම වර්ගවලට අයත් සේවකයින් සඳහා රැකියා පිරිනැමීම හෝ සැපයීම සිදු කිරීමත්, එම සේවක පුහුණු කිරීම් සිදු කිරීම හා ව්‍යවස්ථාපිත නීතිවලට අනුකූලව පවත්ගෙන යාම ප්‍රධාන අරමුණු කරගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ඊට පූර්ණ අනුයුක්තව ඇති විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම 1996 වර්ෂයේ පිහිටුවා තිබුණි. පසුගිය වර්ෂ හතරක විදේශගත කිරීම් සලකා බැලීමේ දී රාජ්‍ය ආයතනයක් ලෙස සමාගම ඒ සඳහා ලබා දී ඇති දායකත්වය පිළිබඳ විස්තර වගුව 22 හි දැක්වේ.

වර්ෂය	නියෝජිත රැකියා ආයතන හරහා විදේශගත කරන ලද සංඛ්‍යාව	සමාගම මඟින් කරන ලද විදේශගත කිරීම් සංඛ්‍යාව	ශ්‍රමිකයන් යොමු කරන ලද රටවල් සංඛ්‍යාව	සමාගම මඟින් කරන ලද විදේශගත කිරීම් මුළු විදේශගත කිරීම්වල ප්‍රතිශතයක් ලෙස
2013	180,463	460	15	0.25
2014	176,829	529	12	0.30
2015	116,749	374	10	0.32
2016	88,164	820	06	0.93

වගුව : 22 - විදේශීය රැකියා ඒජන්සි (පෞද්ගලික) සමාගම

මූලාශ්‍රය : විදේශ රැකියා ඒජන්සි (පෞද්ගලික) සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු

උක්ත විග්‍රහය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාගමේ මූලික අරමුණ විදේශ රැකියා වෙළඳපොලට ශ්‍රමිකයින් සැපයීම වුවද, සමස්ත වෙළඳපල කොටසින් සියයට 01

ට වඩා අඩු ප්‍රතිශතයක් සමාගම විසින් අත්පත් කරගෙන තිබුණි.

- 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සමාගම මගින් විදේශගත වූ ශ්‍රමික සංඛ්‍යාවේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ද, රැකියාවන් සඳහා යොමු කරන ලද රටවල් සංඛ්‍යාව ක්‍රමයෙන් 15 ක සිට 06 දක්වා අඩුවී තිබුණි.

- 2016 වර්ෂයේ දී විගමණිකයන් 820 දෙනෙක් සමාගම මඟින් රැකියාවන් සඳහා යොමු කර තිබුණත්, ඉන් ශ්‍රමිකයන් 787 දෙනෙක් එනම් සියයට 96 ක් රටවල් 03 ක් සඳහා පමණක් විදේශගත කර තිබුණි. අනෙක් රටවල් වෙතින් රැකියා ඉල්ලුම හා අවස්ථා වර්ධනය කර ගැනීම කෙරෙහි සමාගම විසින් ප්‍රමාණවත් අවධානය යොමු කර නොතිබුණි.

- විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් යොමු කිරීමේ දී රැකියා වෙළඳපලේ රැකියා ක්ෂේත්‍ර/ වර්ග කිහිපයකට පමණක් සීමා වී තිබුණු අතර 2014, 2015 හා 2016 යන වර්ෂ වලදී පිළිවෙලින් විදේශ රැකියා වර්ග 78 , 39 හා 13 කට සීමා වී තිබුණි.
- 2016 වර්ෂයේදී සමාගම වෙත ලැබී තිබුණු රැකියා ඇණවුම් 22 කින් රැකියා අවස්ථා 3,138 ක් ලැබී තිබුණ ද, ඉන් විවිධ රැකියා සඳහා විගමණිකයන් 820 දෙනෙකු පමණක් විදේශගත කිරීමට හැකි වී තිබුණි. ඒ අනුව රැකියා අවස්ථා 2,318 ක් එනම් සියයට 74 ක් සඳහා ශ්‍රමිකයින් යැවීමට ඒජන්සිය අපොහොසත් වී තිබුණි.

- 2016 වර්ෂයේදී රැකියා වර්ග අනුව විදේශගත වූ ශ්‍රමික සංඛ්‍යාව විශ්ලේෂණය කිරීමේදී ගෘහස්ථ සේවක, කම්කරු හා කෘෂිකාර්මික සේවක යන නුපුහුණු අංශ කෙරෙහි ඒජන්සියේ වැඩි නැඹුරුවක් පැවැතී තිබුණි. වෘත්තීය සුදුසුකම් සහිත පුද්ගලයින් දේශීය රැකියා වෙළඳපොලින් සොයා ගැනීමට ප්‍රමාණවත් ප්‍රවර්ධන වැඩපිළිවෙලක් ඒජන්සිය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය

ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම, ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා වැඩිකිරීම, විදේශ විනිමය ඉපැයීම වැඩිකිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම මෙන්ම සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ක්ෂේත්‍රයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 05 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව ඇත.

- ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගැයීම.
- සමුද්‍ර කිවුල් දිය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය.
- රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය සහ මෙහෙයවීම.
- අනන්‍ය ආර්ථික කලාපය තුළ ධීවර කටයුතු සංවර්ධනය සහ කළමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ වෙනත් යටිතල පහසුකම් පිහිටුවාලීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජීව සහ අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම.
- ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම.
- මුහුදු මත්ස්‍ය වගාව ඇතුළු ජලජීවී වගා සංවර්ධනය සහ කළමනාකරණය.
- මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම.
- ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම හා එම ප්‍රතිඵල ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහා යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් පර්යේෂණ කටයුතු පුළුල් කිරීමට පහසුකම් සැපයීම.

එම ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය හා අපනයනය

දිවයින වටා කි.මී. 1585 ක වෙරළ තීරයක් සතු වුවද, දකුණු ආසියානු කළාපයේ මුළු මත්ස්‍ය ආනයනයෙන් සියයට 75 කට වැඩි දායකත්වයක් දරන ශ්‍රී ලංකාව දකුණු ආසියානු කළාපයේ ප්‍රධානතම මත්ස්‍ය ආනයන කරු බවට පත්ව තිබුණි. ආනයන වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 4,443 කින් හෙවත් සියයට 14.45 කින් වැඩි වී තිබීම නිසා ශුද්ධ විදේශ විනිමය ඉපයීම රු.මිලියන 8,370 ක සෘණ අගයක් බවට පත්ව තිබුණි.

පශ්චාත් සුනාමි වැඩසටහන

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ ආධාර මත පශ්චාත් සුනාමි වැඩසටහන 2009 වර්ෂයේ ආරම්භ කර 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට යෝජිතව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 31.3 ක ප්‍රතිපාදන කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලින්ද, එක්සත් ජනපද

ඩොලර් මිලියන 4.79 ක ප්‍රතිපාදන දේශීය අරමුදල්වලින්ද ලබා දී තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 3,919 ක් වූ ව්‍යාපෘතිය 2013 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූල්‍ය ආයතන ලෙස ලංකා බැංකුව, මහජන බැංකුව සහ ග්‍රාමීය සංවර්ධන බැංකුව මගින් ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් ලබා දී තිබුණි. එම ණය මුදලට අමතරව ව්‍යවසායකයකු වීමට මූල්‍යාධාර මුදලින් රු.4,000 ක් සමුපකාර සමිති කොටස් සඳහා ද, රු.1,000 ක් විස්මා ප්ලස් සමාගමේ කොටස් ලබාදීම සඳහා ද අඩුකර ඉතිරි මුදල් සාමාජිකයන්ට ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. එහෙත් සමුපකාර සමිති 7 හි සියලුම සාමාජිකයින් (2250) විස්මා ප්ලස් සමාගමේ කොටස්කරුවන් බවට පත්කිරීමේ අරමුණින් අරමුදල් එක් රැස්කර තිබුණත් සමාගමේ හිමිකාරිත්වය සාමාජිකයන් 7 දෙනෙකුට පමණක් සීමා වී තිබුණි. 2013 ජූලි 31 දින ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව විස්මා ප්ලස් සමාගමේ කොටස්කරුවන් සංඛ්‍යාව 1,276 ක් බවත් මුළු ආයෝජන වටිනාකම රු.මිලියන 1.28 ක් බවත් දක්වා තිබුණත් මෙම සාමාජිකයන් සඳහා කොටස් ප්‍රාග්ධනය නිකුත් කර නොතිබුණු අතර සමාගමේ ප්‍රතිලාභ සාමාජිකයන් 7 දෙනෙකුට පමණ සීමා කර තිබුණි.

- ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන වැඩ සටහන මගින් ආරම්භ කරන ලද සමුපකාර සමිති සහ විස්මා ප්ලස් සමාගමේ මැදිහත්වීම මත ත්‍රිකුණාමලය, බලපිටිය හා මාතර යන දිස්ත්‍රික්වල සී/ස සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතියකින් සාමාජිකයන් තිදෙනෙකු වන සේ සාමාජිකයන් 09 දෙනෙකු වෙත කඩ කාමර 9 ක් ලබා දී තිබුණි. එම කඩ කාමර සමුපකාර සමිති විසින් අධීක්ෂණය නොකිරීම හේතුවෙන් සමුපකාර සමිතියේ අරමුණු ගත ව්‍යාපාර කටයුතුවල යෙදවීම වෙනුවට අදාළ කඩ කාමර කුලියට ලබාගත් පුද්ගලයින් විසින් ඔවුන්ගේ අවශ්‍යතාවන් අනුව ආදායම් උපයන තත්ත්වයක පැවතුණි. සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතියට ලබා දී තිබුණු අලෙවිසැල්වල මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වීමක් සිදුකර නොතිබුණි.

- මෙම ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර සංවර්ධන කාර්ය සඳහා පශ්චාත් සුනාමි පුනරුත්ථාපන වැඩසටහන විසින් රු.මිලියන 374.82 ක් වැය කර තිබුණි. එමගින් ව්‍යාපෘතියට සහභාගි වන මූල්‍ය ආයතන සඳහා මුදාහරින ලද මුදල් ප්‍රමාණය, එම ව්‍යාපෘති මුදල්වලින් එක් එක් බැංකුව විසින් සාමාජිකයන්ට ණය ලබාදීමේ විස්තර, ණය මත දෙන ලද ආධාර මුදල්, ලබාදුන් සංඛ්‍යාව සහ මුදල් පිළිබඳව විස්තරද, බැංකුව වෙත ලබාදෙන ලද ප්‍රතිපාදන මුදල් සමිති සාමාජිකයන් වෙත සම්පූර්ණයෙන්ම ලබා දී තිබේද, ඉතිරියක් වේ නම් එම මුදල කොපමණද, ණය ආපසු අයකර ගැනීම් පිළිබඳව විස්තර අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය අවසානයේ ලබාගත යුතු වුවත්, එවැනි ක්‍රියාදාමයක් අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි.

- දිස්ත්‍රික් හතක පිහිටුවන ලද සමුපකාර සමිති සාමාජිකයින් ලබාගත් ණය මුදල් අනුව බැංකුව විසින් ප්‍රදානය කරන ලද මූල්‍ය ආධාරවලින් එක් සාමාජිකයකුගෙන් රු.4,000 ක මුදලක් සමිතිවල කොටස් මිල දී ගැනීම සහ

රු.1000 ක මුදලක් විස්මා ප්ලස් සමාගමේ කොටස් මිල දී ගැනීම සඳහා අඩුකර ගෙන තිබුණි. නමුත් එම මුදල් යොදාගෙන සමුපකාර සමිතිවල සාමාජිකත්වය සහ සමාගමේ කොටස් මිලදී ගෙන තිබුණු සාමාජිකයන්ට ඔවුන්ගේ කොටස් මත ප්‍රතිලාභයක් ලබාදී තිබුණු බව තහවුරු කිරීමට විස්තර ලේඛනගත කර නොතිබුණි.

වෙරළ පුනරුත්ථාපනය හා සම්පත් කලමනාකරණ වැඩ සටහන

සමාලෝචිත වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම් කටයුතු සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත රු.මිලියන 50 ක් ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 26 ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. ඉන් රු.මිලියන 16.10 ක් පම්බල මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එම අධිකාරිය විසින් රු.මිලියන 15.97 ක් වැය කර තිබුණත්, එම වියදමට අදාළ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 15.00 ක් වී තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම රු.969,060 කින් ඉක්මවා ගෙවීම් කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) මාර්ගෝපදේශය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණයක් මත සියයට 20 ක උපරිමයක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවිය හැකි වුවත්, කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 43 ක් වූ රු.මිලියන 7.37 ක අත්තිකාරම් ගෙවා තිබුණි. 2017 ජූලි 31 දින වන විටත් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින් ඉදිරිපත් කර නොතිබුණි. කළපු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ධීවර දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් ව්‍යාපෘතියට අදාළ කාර්යයක් නොවන වෙනත් කාර්යයන් සඳහා රු.මිලියන 2.96 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් ඉටුකිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත රු.මිලියන 1.70 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එම ප්‍රතිපාදනය රු.මිලියන 3.30 කින් ඉක්මවා රු.මිලියන 5.00 ක් වැය කර තිබුණි.

මිරිදිය ජලාශවල නොමිලේ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් මිරිදිය ජලාශවල නොමිලේ මත්ස්‍ය පැටව් තැන්පත් කිරීම සඳහා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.මිලියන140 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 123.3 ක් උපයෝජනය කර තිබුණි. එම උපයෝජනයන් වලින් අපේක්ෂිත ඉලක්කයන් ලගා කර ගත් බව හා ඒ පිළිබඳව පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.මේ නිසා 2014 වර්ෂයේ ලබා ගත් මත්ස්‍ය නිෂ්පාදනයට සාපේක්ෂව 2016 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,820 කින් අඩු වී තිබුණි.

ධීවර ප්‍රජාව බල ගැන්වීමේ වැඩසටහන

ධීවර ප්‍රජාව බල ගැන්වීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු.මිලියන 91.85 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 74.32 ක් වැය කර තිබුණි. මෙම වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත රු.මිලියන 5.43 ක ප්‍රතිපාදන ලබා දී තිබුණත්, එමගින් කළ උපයෝජනයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ධීවර ප්‍රජාව බල ගැන්වීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

වෙත ලබා දී තිබුණු රු.මිලියන 4.39 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 1.92 ක් උපයෝජනය කර තිබුණි. 2016 වර්ෂයේ දී රු.මිලියන 44.95 ක් වැය කර මිරිදිය ධීවර යෙදවුම් මිලදී ගෙන තිබුණත් එම භාණ්ඩ ධීවරයින් අතර බෙදා දුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තංගල්ල ධීවරයන්ට බෙදාදීම සඳහා දැල් 990 ක් මිල දී ගැනීමට රු.මිලියන 2.27 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ආම්පන්න ධීවරයන් අතර බෙදාදුන් බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

අන්තර්ජාල හා පරිගණක පද්ධතිය

ධීවර අමාත්‍යාංශයේ සියලු කටයුතු පරිගණක ජාල ගත කිරීම හා එක් එක් නිලධාරියාගේ කාර්යසාධනය මැනීමට හා පරීක්ෂා කළ හැකි වන පරිදි අන්තර්ජාල ගත පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව රු.මිලියන 5.65 කට ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මෙම උපක්‍රම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයේදී රු. මිලියන 3.65 ක් සහ 2014 වර්ෂයේදී රු.මිලියන 8.00 ක් වශයෙන් එකතුව රු. මිලියන 11.65 ක් වැයකර තිබුණත්, 2017 වර්ෂය වන විටත් එවැනි පරිගණක පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

වැවක් සමඟ ගමක් වැඩ සටහන

"වැවක් සමඟ ගමක්" වැඩසටහන යටතේ බැඳි වැව වසම තුළ ධීවර ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1.49 ක් වැයකර ධීවර ප්‍රජා ශාලාවක් ඉදිකර තිබුණි. ව්‍යාපෘතියේ අරමුණ ධීවර ජනතාව නඟා සිටුවීම වුවද, එම ප්‍රදේශය ධීවර පවුල් පදිංචි ප්‍රදේශයක් නොවන බව අනාවරණය විය. එමෙන්ම ගෙබිම සිමෙන්ති දැමීමට රු.147,960 ක් ගොවි සංවිධානයට ගෙවා තිබුණත්, ගෙබිම ඉරි තලා පළුදු වී තිබුණු අතර ගෙබිම ඉදිකිරීමේ කාර්ය නිසි ප්‍රමිතියකට අනුකූලව සිදු කර ගෙන නොතිබුණි.

මාර්ග සංවර්ධන ව්‍යාපෘති තුනක් ඉදිකිරීම

ධීවර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ තංගල්ල හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති තුනක ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි ඉටු කර නොතිබුණි. එම ව්‍යාපෘති පිළිබඳව සිදු කළ භෞතික පරීක්ෂණවලදී ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් එකතුව රු.මිලියන 2.1 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ධීවර වරාය නැංගුරම් පොළවල් තොටුපල සංවර්ධන හා ප්‍රතිසංස්කරණය කිරීම

කළමැටිය ධීවර වරාය ඉදිකිරීම 2014 ජූලි 09 දින වැඩ ආරම්භ කර 2016 ජූලි 08 දින වැඩ අවසන් කිරීමට ගිවිසුම අනුව එකඟ වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 660.25 ක් වැය කර තිබුණත්, එහි භෞතික ප්‍රගතිය සියයට 70 ක් වී තිබුණි.

කයිකාවල නැංගුරම් තොටුපොල ඉදිකිරීමේ කටයුතු 2014 සැප්තැම්බර් මාසයේදී ආරම්භකර රු.මිලියන 83.4 ක් වැය කර තිබුණු අතර, 2014 ඔක්තෝබර් 23 දින වන විට එම කාර්යය නවතා තිබුණි.

ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම්

2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් කිරීම ශ්‍රී ලංකා ජාතික

ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කර්තව්‍යයක් වී තිබුණි. ඒ සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් හා නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලැසුම් හා පරිසර හිතකාමී වගා වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් සිදුකර නොතිබුණි.

මිරිදිය ජලාශවල මත්ස්‍ය ඇගිල්ලන් තැන්පත් කිරීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් මිරිදිය ජලාශවල මත්ස්‍ය ඇගිල්ලන් තැන්පත් කිරීම 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී මිලියන 12.6 කින් වැඩි කර තිබුණි. අධිකාරිය විසින් මත්ස්‍ය ඇගිල්ලන් තැන්පත් කිරීම තුළින් ලබාගන්නා ප්‍රගතිය (පසු අස්වැන්න) මැනීම හා වැඩිදියුණු කිරීම සඳහා සමීක්ෂණ හා පර්යේෂණ සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් රජයේ එකම පර්යේෂණ හා සංවර්ධන ආයතනය වන ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය මගින් මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කරගැනීම සඳහා උපදෙස් ලබාදීම හා පර්යේෂණ සිදුකර ගෙන නොතිබුණි.

මත්ස්‍ය ඇගිල්ලන් නිෂ්පාදනය

2014 වර්ෂයේදී මත්ස්‍ය ඇගිල්ලන් නිෂ්පාදනය මිලියන 40.98 ක් වී තිබුණු අතර, මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය මෙ.ටො. 70,600 ක් වී තිබුණි. 2014 වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මත්ස්‍ය ඇගිල්ලන් නිෂ්පාදනය මිලියන 25.49 කින් වැඩිවී තිබුණද, මත්ස්‍ය නිෂ්පාදන මෙ.ටො. 67,480 දක්වා අඩුවී තිබුණි. 2014 වර්ෂයට සාපේක්ෂව 2015 හා 2016 වර්ෂවල මිරිදිය ජලජීවී වගා නිෂ්පාදනය පිළිවෙලින් මෙ.ටො. 10,390 කින් හා මෙ.ටො. 3,120 කින් අඩුවී තිබුණි. මිරිදිය ජලාශවල මත්ස්‍ය ඇගිල්ලන් තැන්පත් කිරීම තුළින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීමේ ඉලක්ක ගණනය කර නොතිබුණි. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා පාරිභෝජනය වැඩි දියුණු කිරීම සහ ධීවර ජනතාවගේ රැකියා අවස්ථා ඇති කර ගැනීම හා ප්‍රවර්ධනය කිරීම යන අරමුණද අවශ්‍යතාවයට අනුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ඉටු කර නොතිබුණි.

මත්ස්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණක් වන රටතුල මත්ස්‍ය නිෂ්පාදනය හා පරිභෝජනය වැඩි දියුණු කිරීමේ අරමුණින් මිරිදිය, කිවුල්දිය, වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගාව වැඩිදියුණු කිරීම හා එමඟින් රැකියා අවස්ථා ඇති කිරීම හා ප්‍රවර්ධනය ඉටු කළ යුතුව තිබුණි. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා 2011, 2012, 2013 සහ 2014 යන වර්ෂවල දිවිනැගුම ණය යෝජනා ක්‍රමය මගින් ප්‍රතිලාභීන් 6,450 ක් සඳහා රු.මිලියන 229.04 ක් ලබාදී තිබුණි. ඒ සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී ඒ ඒ ප්‍රදේශවල ජල භිඟය පිළිබඳව අවධානය යොමු නොකිරීම, ප්‍රතිලාභීන්ට මත්ස්‍ය පැටවුන් ලබාගැනීමේ ගැටළු පැවතීම, ප්‍රතිලාභීන් නිසි පරිදි පුහුණු නොකිරීම, ව්‍යාපෘති භූමියන්ගේ ග්‍රාමීය හෝ දිස්ත්‍රික් සංවිධානයක් ක්‍රියාත්මක නොවීම යන හේතු නිසා එම වැඩසටහන අසාර්ථක වී තිබුණි.

ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයේ ජාතික ව්‍යාපාරය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් දිවිනැගුම චක්‍රීය අරමුදලක් ලෙස පවත්වාගෙන යාම සඳහා ව්‍යාපෘතිය අරඹා මාස 6 ක සහන කාලයකින් පසුව

වාරික 10 කින් වර්ෂ 2 ක් තුළ සියයට 50 ක් ආපසු අයකර ගැනීමට ප්‍රතිලාභීන් සමග ගිවිසුම් ගතවී තිබුණි. නමුත් ආපසු අයකරගැනීම් සඳහා ක්‍රමවේද හඳුන්වා දී තිබුණද, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කළ පොදු උපදෙස් මාලාව අනුගමනය නොකිරීම, විධිමත්ව වාරික මුදල් අයකිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක නොකිරීම, මත්ස්‍ය අස්වැන්න වැඩිවීම පිළිබඳ සමීක්ෂණ දත්ත අධිකාරිය සතුව නොතිබීම, ව්‍යාපෘතිය සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු නොකිරීම හේතුකොට ගෙන දිවි නැගුම චක්‍රීය අරමුදල මගින් පවුලේ ආර්ථිකය සහ පෝෂණය වැඩි දියුණු කරන ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයේ ජාතික ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාත්මක කර නොතිබුණි.

වේක්කයා මසුන් අභිජනනය කිරීම පිළිබඳ තාක්ෂණය වැඩි දියුණු කිරීම

ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද රු.මිලියන 3.87 ක් වූ මුදලක් ආයෝජනය කර 2005 සැප්තැම්බර් 28 දින ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික සමාගමක් සමඟ වේක්කයා මසුන් අභිජනනය කිරීම පිළිබඳ තාක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. අධිකාරිය හා පෞද්ගලික සමාගම අතර ඇතිවූ ගිවිසුම අනුව එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර වර්ෂ 02 කට පසු වර්ෂ 05 ක් තුළ මුළු මුදලම සමාගම විසින් අධිකාරියට ගෙවිය යුතු වුවත්, 2008 දෙසැම්බර් 24 දින සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘතියෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට 2015 වර්ෂයේ ලබා දුන් මුදලින් රු.මිලියන 3.18 ක් අයකර ගැනීමට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අපොහොසත් වී නොතිබුණි.

මිරිදිය ජලාශවල මත්ස්‍ය අස්වන්න සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම

1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනතට අනුව පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ එම කාර්යයන්වල නියැලුනු ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම, පුහුණුව ලබාදීම, නියෝජිතායතනයේ අරමුණක් වී තිබුණි. නමුත් මිරිදිය ජලාශවල මත්ස්‍ය අස්වනු ප්‍රවර්ධනය කිරීම පිළිබඳව හා පසු අස්වනු ප්‍රවර්ධනය පිළිබඳ සමීක්ෂණ හා පර්යේෂණ සිදුකර උපදෙස් නිකුත් කිරීම වැනි ප්‍රධාන අරමුණු ගත කාර්යයන් නියෝජිතායතනය විසින් සිදු කර නොතිබුණි. තවද, ඉන් ජලජ සම්පත් හඳුනාගැනීම තක්සේරු කිරීම, කළමනාකරණ සහ සංවර්ධනයට අදාළ කටයුතු සඳහා උපදෙස්, විශේෂඥ දැනුම සැපයීම හා සම්බන්ධීකරණය යන අරමුණු ඉටුකරගැනීම සඳහා නියෝජිතායතනයේ අවධානය යොමු කිරීම අවම මට්ටමක පැවැතුණි.

මත්ස්‍ය පැවැත්ම සම්බන්ධයෙන් ජෛව විවිධාත්මක කරුණු හඳුනාගැනීම

2015 වර්ෂය සඳහා වූ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ කාර්යසාධන වාර්තාව අනුව මන්නාරම හා නිලාවේලි ප්‍රදේශවල මත්ස්‍ය පැවැත්ම සම්බන්ධයෙන් ජෛව විවිධාත්මක කරුණු හඳුනාගැනීම හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියනයක ප්‍රතිපාදන සලසා තිබුණත්,ඉන් රු.884,292 ක් වැයකර තිබුණි. නමුත් එකී ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූ පරිසර පද්ධතිය සම්බන්ධව සිතියමක් නිර්මාණය කිරීම හා ජෛව විවිධත්ව කරුණු පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම ඉටුකර නොතිබුණි. කල්පිටිය ප්‍රදේශයේ මුහුදු කැස්බෑවන් අභිජනන මධ්‍යස්ථාන හා ව්‍යාප්තිය සම්බන්ධයෙන් විශේෂ අවස්ථා

හඳුනාගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතිය සඳහා රු. 600,000 ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් රු.250,131 ක් වැයකර දත්ත රැස්කිරීම පමණක් සිදුකර තිබුණි.

වෙරළාසන්න කලාපයේ පර්යේෂණ කටයුතු

වෙරළාසන්න කළාපයේ පර්යේෂණ කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු.මිලියන 15.69 ක් වැයකර ඉදිකර තිබූ "තරණි" යාත්‍රාව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. 2014 නොවැම්බර් 12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අදාළ නැව විකිණීමට කටයුතු කරන ලෙසට නියෝග කර තිබුණද, 2016 අගෝස්තු 04 දින වන විටත් එය විකුණා නොතිබුණි. තවද මෙම යාත්‍රාව ඉදිකළ දිනයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා යාත්‍රාවේ නියුතු නිලධාරීන්ගේ වැටුප්, අතිකාල දීමනා හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් රු.මිලියන 8.07 ක් වැය කර තිබුණි.

ධීවර වරායන්වල මෙහෙයුම් අලාභයන්

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ ධීවර වරායන් 21 න් වරාය 15 ක්ම සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 170.74 ක මෙහෙයුම් අලාභ ලබා තිබුණි. එම වරායයන් සියල්ලම ඉකුත් වර්ෂයේදීද අලාභ ලබා තිබුණි. පුරාණවැල්ල , කුඩාවැල්ල , හලාවත , තංගල්ල හා නිල්වැල්ල ධීවර වරායන්හි මෙහෙයුම් අලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 104, සියයට 328 , සියයට 35 , සියයට 18 ක් හා සියයට 10 කින් වැඩිවී තිබුණි. අලාභ ලබන වරායන්වල අලාභ ලැබීමට හේතූන් අධ්‍යයනය කර ලාභ ලබන තත්ත්වයකට ගෙන ඒම හෝ අලාභ අඩුකර ගැනීම හා ලාභය අඩුවෙමින් පවතින වරායන්වල එය වැඩිකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

රටෙහි සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් වෙනුවෙන් දායක වන නිරෝගීමත් ජනතාවක් බිහිකිරීම උදෙසා ප්‍රතිපත්ති, උපායමාර්ග හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්පාදනය තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් තහවුරු කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂිත අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- සෞඛ්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- සෞඛ්‍ය සේවා ලබාදීම සඳහා ප්‍රමිතින් හා නීති,රීති සම්පාදනය කිරිම.
- මානව සම්පත් සංවර්ධනය.
- කළමනාකරණය, සැලැසුම්කරණය සහ පද්ධති සංවර්ධනය.
- සම්පත් බෙදා හැරීම, වැඩසටහන් හා ව්‍යාපෘතීන් මෙහෙයවීම, අධීක්ෂණය හා ඇගැයීම.
- ප්‍රධාන රෝහල් පරිපාලනය.
- පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය.
- ජාතික සෞඛ්‍ය හා පෝෂණ වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරිම.
- සෞඛ්‍ය අංශයේ පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 07 කින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම කළ යුතුව තිබුණි. එම ආයතන විසින් එම කාර්යභාරය ඉටු කිරීමේදී සිදු කර තිබුණු ගනුදෙනු පිළිබඳව අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රතිපාදන ඌන උපයෝජනය

වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මඟින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 177,059 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 134,780 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 42,279 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අදාළ නොවන වියදමක් වූ රජයේ ඉඩම් හා ගොඩනැගිලි අත්පත්කර ගැනීමේ ප්‍රාග්ධන පිරිවැය (Capital Carrying Cost of Government Lands and Buildings) වෙනුවෙන් පුනරාවර්තන වැය විෂයයක් යටතේ රු.මිලියන 17,878 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි.

රාජකාරි බලතල ඉක්මවා පත්කිරීම්, මාරුකිරීම් හා වැඩ තහනම් කිරීම් සිදු කිරීම

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කරමින් ප්‍රතිසංවිධානය කිරීමට 2001 ජුනි 21 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලය බෙදා හරිමින් රජයේ නිලධාරීන් පත් කිරීම්,

උසස් කිරීම්, මාරු කිරීම් හා විනය පාලන බලතල දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා දී තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රධානියා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2013 ඔක්තෝබර් 24 දින තීරණය කර තිබුණි. නමුත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු විසින් ඉහත සඳහන් විධිවිධානවලට පටහැනිව තම රාජකාරී බලතල ඉක්මවා අවස්ථා 09 කදී පත්වීම්, මාරුකිරීම්, උසස් කිරීම්, විනය නියෝග ලබාදීම් හා නැවත සේවයේ පිහිටුවීම් සිදුකර තිබුණි.

කාර්ය මණ්ඩල පුරප්පාඩු

වෛද්‍ය නිලධාරී පුරප්පාඩු හේතුවෙන්, දිස්ත්‍රික්ක 10 කට අයත් ප්‍රාථමික සත්කාරක ඒකක 15 ක් හා ප්‍රාදේශීය රෝහල් 04 ක් වසා දමා තිබුණි.

වැඩිපුර ගෙවූ සන්නිවේදන දීමනා

රජයේ නිලධාරීන්ට සන්නිවේදන පහසුකම් සැපයීම මැයෙන් වූ 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 දරන හා 2015 මාර්තු 10 දිනැති අංක 03/2014 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛවලට හා 2015 සැප්තැම්බර් 10 දිනැති අංක එන්පීසී/9/1/30-17 දරන ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම්ගේ ලිපියෙහි උපදෙස්වලට පටහැනිව, වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ හා ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍යවරුන්ට සන්නිවේදන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් රු.මිලියන 411 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ගිවිසුම් කඩවීමෙන් රජයට අයවිය යුතු මුදල් අයකර ගෙන නොතිබීම

2016 දෙසැම්බර් 31 දිනට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු මත විදේශගත වීමෙන් හා රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු මත විදේශගත වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම හෝ අනිවාර්ය සේවා කාලය රජයට සේවය නොකිරීම නිසා එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව අදාළ වෛද්‍යවරුන්ගෙන් රු.මිලියන 62.71 ක් අය කළ යුතුව තිබුණි. ඉන් වෛද්‍යවරුන්ගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකිවීම නිසා රු.මිලියන 22.57 ක් ද, අයවිය යුතු වටිනාකම් අඩුවෙන් ගණනය කිරීම නිසා රු.මිලියන 4.35 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

අනාර්ථික වූ විදේශ ගමන් වියදම්

ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 11:1 වගන්තිය ප්‍රකාරව විදේශ ගමන්වලදී සියළුම නිලධාරීන් පිරිමැසුම් පන්තියෙහි ගමන් කළයුතු වුවද, අවස්ථා 06 කදී නිලධාරීන් දෙදෙනෙකු ව්‍යාපාරික පන්තියෙහි ගමන් කර තිබීම නිසා රජයේ මුදලින් රු.මිලියන 1.58 ක අතිරේක වියදමක් කර තිබුණි.

වෛද්‍ය සැපයුම් මිළදී ගැනීම

ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව කිසිම වෛද්‍ය සැපයීමක් මිලදී නොගත යුතු බව අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණත්, භාවිතයේ පවතින වෛද්‍ය සැපයීම් අයිතම 16,988 ක් අතුරින් අයිතම 4,619 ක් හෙවත් සියයට 27 ක් එම කමිටු අනුමැතියෙන් තොරව මිලදී ගෙන තිබුණි.

විධිමත් කාල සටහනක් අනුව ඖෂධ ඇණවුම් නොකිරීම

වෛද්‍ය සැපයීම් අංශය විසින් ඇස්තමේන්තුගත අයිතම මිලදී ගැනීම සඳහා මාස 11 ක සැපයුම් කාලයක් සහිතව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුම්

නිකුත් කිරීම ප්‍රතිපත්තිය වී තිබුණි. ප්‍රමාදයකින් තොරව වෛද්‍ය සැපයීම් කිරීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අපොහොසත් වී තිබුණි. 2016 වර්ෂයට අදාළ වෛද්‍ය සැපයීම්වල මුළු ඇණවුම් අයිතම සංඛ්‍යාව 8,384 ක් වූ අතර, ඉන් ඇණවුම් අයිතම 5,178 ක් හෙවත් සියයට 62 ක් නියමිත කාලය තුළදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සපයා නොතිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් සෑම වර්ෂයකදීම ඉතා විශාල පිරිවැයක් සහිත වෛද්‍ය සැපයීම් දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පමණක් දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයීම්වල මුළු පිරිවැය රු.මිලියන 8,292 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 192 ක වැඩිවීමක් විය. වෛද්‍ය සැපයීම් දේශීය වෙළඳපලින් මිලදී ගැනීමට සිදුවීම හේතුවෙන් 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළදී රු.මිලියන 5,166 ක අතිරේක වියදමක් කර තිබුණි.

වෛද්‍ය සැපයීම් තත්ත්ව පරීක්ෂණය සඳහා යොමු නොකිරීම

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් හෝ දේශීය වෙළඳපලින් මිලදී ගන්නා සියළුම වෛද්‍ය සැපයීම්වල නියැදියක් තත්ත්ව පරීක්ෂණය සඳහා යොමු කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. වෛද්‍ය සැපයීම්වල තත්ත්වය පිළිබඳව පසුකාලීනව අවිනිශ්චිතතා ඇති වූ අවස්ථාවලදී පමණක් ඒවා තත්ත්ව පරීක්ෂණ සඳහා යොමුකර තිබුණි.

තත්ත්ව පරීක්ෂණ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොතිබීම

වෛද්‍ය සැපයීම්වල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පිහිටුවා තිබුණු ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය සඳහා ප්‍රමාණවත් රසායනාගාර පහසුකම් ස්ථාපිත කර ගැනීමට හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. පරීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන්, නැවත භාවිතයට සුදුසු වුවත්, පිරිවැය රු.මිලියන 5.16 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 07 ක් කල් ඉකුත් වී තිබුණු බව සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ අයිතම 23 ක් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවකදී තහවුරු විය.

තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම්

සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කළ (withdraw) වෛද්‍ය සැපයීම් වර්ග 30 ක මුළු පිරිවැය රු.මිලියන 602 ක් වූ අතර එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 258 කින් වැඩිවී තිබුණි.

තත්ත්වයෙන් අසමත් බව ප්‍රමාදවී දැනුම්දීම

තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් අත්හිටුවීමේ නියෝග නිකුත් කිරීම සඳහා පරිගණක පද්ධතිය උපයෝගී කර නොගෙන චක්‍රලේඛ මඟින් පමණක් දැනුම්දී තිබුණි. තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් පිළිබඳ අනාවරණය වූ අවස්ථා 57 කින් අවස්ථා 16 කදීම, දින 20 ක සිට දින 140 ක් දක්වා වූ කාලයකට පසුව එම වෛද්‍ය සැපයීම් භාවිතය අත්හිටුවීමේ නියෝග අදාළ රෝහල් හා ආයතන වෙත යවා තිබුණි.

තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් රෝගීන් වෙත නිකුත් කිරීම

හදිසි සැත්කම් සඳහා යොදා ගන්නා ඖෂධ, දියවැඩියා රෝගය සඳහා ලබාදෙන ඖෂධ, ගර්භණී මව්වරුන්ට ලබා දෙන ඖෂධ, ප්‍රතිජීවක ඖෂධ (Antibiotics), රුධිර බෑග් හා බැන්ඩේජ් වර්ග ඇතුළු සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 602 ක් තත්ත්වයෙන්

අසමත්වූ වෛද්‍ය සැපයීම් භාවිතයෙන් ඉවත් කරන ලෙසට නියෝග ලැබෙන අවස්ථා වන විටත් රු.මිලියන 525 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 30ක් රෝගීන් වෙත නිකුත් කර තිබුණි. එය තත්ත්වයෙන් අසමත් මුළු ඖෂධ වටිනාකමින් සියයට 87 ක් වූ අතර ඉන් රු.මිලියන 377 ක් වටිනා අයිතම 19 ක සියයට 93 ත් සියයට 100 ත් අතර ප්‍රමාණයක් රෝගීන්ට නිකුත් කර අවසන්ව තිබුණි.

තත්ත්වයෙන් අසමත් ඖෂධවල පිරිවැය සැපයුම්කරුවන්ගෙන් අයකර නොගැනීම

තත්ත්වයෙන් අසමත් ඖෂධවල පිරිවැය හා සියයට 25 ක පරිපාලන වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විට තත්ත්වයෙන් අසමත් ඖෂධවල මුළු පිරිවැය වූ රු.මිලියන 3,374 කින් රු.මිලියන 893.6 ක් පමණක් වෛද්‍ය සැපයීම් අංශය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අයකර තිබුණු නමුත් සැපයුම්කරුවන්ගෙන් රු.මිලියන 380.3 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඖෂධ ගබඩා හා ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා වාහන නියමිත ප්‍රමිති තත්ත්වයෙන් නොතිබෙන බවත්, ඒ හේතුවෙන් ඖෂධ දිවයින තුළට පැමිණි පසු තත්ත්වයෙන් අසමත් වන බවත් සැපයුම්කරුවන් විසින් චෝදනා කර තිබුණු බැවින් ඉතිරි වටිනාකම් ඔවුන්ගෙන් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

වෛද්‍ය සැපයීම් බහාලුම්වල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය නොකිරීම

ඖෂධ සංස්ථාව මගින් සපයනු ලබන වෛද්‍ය සැපයීම් බහාලුම්වල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර තිබිය යුතුවීම ඇණවුම් කොන්දේසියක් මෙන්ම හඳුන්වාදී තිබුණු අභ්‍යන්තර පාලන උපක්‍රමයක්ද විය. නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොතිබුණු රු.මිලියන 97.6 ක පිරිවැයක් සහිත වෛද්‍ය සැපයීම් අයිතම 04 ක් ගබඩාවල තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවකදී තහවුරු විය.

කාර්යක්ෂම තොග පාලනයක් නොතිබීම

වෛද්‍ය සැපයීම් අංශය විසින් මාස 03ක ආරක්ෂිත තොගයක් (Buffer Stock) තබා ගත යුතු වුවත්, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු වෛද්‍ය සැපයීම් වර්ග 7,223 ක් පැවති අතර ඉන් අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයීම් අයිතම 1,607 ක තොගය ශුන්‍ය වී තිබුණු බව බව නියැදි විගණන පරීක්ෂණයකදී තහවුරු විය.

වෛද්‍ය සැපයීම් සුදුසු පරිදි ගබඩා කර නොතිබීම

වෛද්‍ය සැපයීම් අංශය, ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් මධ්‍යස්ථාන (RMSD) හා රෝහල්වල ඖෂධ ගබඩා නියමිත උෂ්ණත්වයන්ගෙන් තොරව පවතින අතරම ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශයේ කොරිඩෝවල දින 08 ක සිට දින 53 ක් දක්වා කාලයක් ඖෂධ ගබඩා කර තිබුණි. නියමිත උෂ්ණත්වයේ නොතිබූ ඖෂධ අතර, ඇස් වැනි සියුම් ඉන්ද්‍රියන්ට යොදන ඖෂධද, වකුගඩු රෝග, සිසේරියන් සැත්කම් සඳහා අවශ්‍ය වන්නාවූ ඖෂධද පැවති බව අනාවරණය විය.

වෛද්‍ය සැපයීම් හා උපකරණ ප්‍රයෝජනයට නොගැනීම

ජාතික ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිෂ්කාශන හා ප්‍රවාහන ගාස්තු ලෙස

විශාල මුදලක් වැයකර තිබුණු, ගංවතුර වැනි හදිසි ආපදා තත්ත්වයන්හිදී ආධාර වශයෙන් ලද වටිනාකම ගණනය කළ නොහැකි ඖෂධ හා උපකරණ නිසි ලෙස ගබඩා කර නොතිබුණි. එම ඖෂධ අදාළ පාර්ශවයන් වෙත නිකුත් නොකිරීම නිසා විනාශ වෙමින් පැවැතුණි. අධිකරණ ක්‍රියාමාර්ගවලින් පසුව වෛද්‍ය සැපයීම් අංශය වෙත නොමිලේ ලැබී තිබුණු වටිනාකම ගණනය කර නොතිබුණු විශාල ඖෂධ ප්‍රමාණයක් 2016 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත්වී තිබුණි. කල් ඉකුත්වී වර්ෂ ගණනාවක් ගතවී තිබුණද, ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

මතභේදයට තුඩුදුන්, පියයුරු පිළිකා රෝගීන්ට ලබා දෙන ඖෂධය

පියයුරු පිළිකා සඳහා වූ ඖෂධීය නාමය Trastuzumab හා වෙළඳ නාමය Herticad වූ ඖෂධයේ ගුණත්වය, ආරක්ෂාකාරීබව හා ප්‍රත්‍යක්ෂබව (quality, safety, efficacy) සම්බන්ධයෙන් පිළිකා රෝග වෛද්‍යවරුන්ගේ විරෝධතා සැලකිල්ලට භාජනය නොකර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 567.7 ක් වැයකර එම ඖෂධය මිලදී ගෙන තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ඇගයීම් කමිටු රැස්වීම් 03 කදී Herticad ඖෂධය සම්බන්ධව සාකච්ඡා නොකර හා පිළිකා රෝග විශේෂඥවරයා සහභාගීවී නොතිබුණු කමිටු රැස්වීමකදී මෙම ඖෂධය ලියාපදිංචිය පිළිබඳ නිර්දේශ ලබාදී තිබුණි. ඖෂධ ඇගයීමේ කටයුතු සිදුවෙමින් පවතින බැවින් එය සතුටුදායක වුවහොත් 2016 පෙබරවාරි මාසය අවසානයේදී ලියාපදිංචිය ප්‍රදානය කළ හැකි බවට වූ එම නිර්දේශය ලබාදී තිබුණු දිනට දින 05 කට පෙර මෙම ඖෂධය සඳහා ලියාපදිංචිය ලබාදී තිබුණි.

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය

ජාත්‍යන්තර සංවර්ධන අරමුදල විසින් මූල්‍යනය කරනු ලබන පස් අවුරුදු ව්‍යාපෘතියක් වන දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර 2018 වර්ෂයේදී අවසන් වීමට නියමිතව තිබුණි. 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 04 කදී රු.මිලියන 5,584 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට තථ්‍ය වියදම රු.මිලියන 2,818 ක් වී තිබුණි.

රජයේ රෝහල් 14 ක හදිසි ප්‍රතිකාර ඒකක අළුතින් ඉදිකිරීමත්, වෙනත් රජයේ රෝහල් 14 ක දැනට පවතින හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීමත් ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කයන් වූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අළුතින් ඉදිකරන හදිසි ප්‍රතිකාර ඒකක 04 කට අදාළ කොන්ත්‍රාත් පමණක් පිරිනමා තිබුණු අතර පවතින හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම් 09 ක කටයුතු පමණක් අවසන් කර තිබුණි.

බෝ නොවන රෝග හඳුනාගැනීම සඳහා වයස අවුරුදු 40 ට වැඩි පුද්ගලයින් සුවදිවි මධ්‍යස්ථාන වෙත යොමුවීමේ ප්‍රවණතාවය ඇගයීම ව්‍යාපෘතියේ තවත් ඉලක්කයක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී සුවදිවි මධ්‍යස්ථාන වෙත යොමු වූ පුද්ගලයින් සංඛ්‍යාව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී 251,368 කින් අඩුවී තිබුණි. ඒ අනුව බෝ නොවන රෝග හඳුනාගැනීම සඳහා සුවදිවි මධ්‍යස්ථාන වෙත ජනතාව ගෙනයාමට ප්‍රමාණවත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

සමාලෝචිත වර්ෂයේදී අළුතින් ක්ෂය රෝගීන් 13,577 ක් හඳුනාගැනීමට අපේක්ෂා කර තිබුණද, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රතිකාර සඳහා පහසුකම්

වැඩිදියුණු කිරීමට ගෙන තිබුණු ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රෝගීන් 9,293 ක් පමණක් හඳුනාගෙන තිබුණි.

අපස්මාර ඒකකය ඉදිකිරීම් කටයුතු

ශ්‍රී ලංකා ජාතික රෝහලෙහි මහල් 08 කින් සමන්විත අපස්මාර ඒකකය ඉදිකිරීම හා දිවයින පුරා අපස්මාර කළමණාකරන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම සෞදි රියාල් මිලියන 281.25 ක් වී තිබුණි. 2008 වර්ෂයේදී ආරම්භකර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා සෞදි සංවර්ධන අරමුදල මගින් ලබා දුන් සමස්ථ ණය මුදල සෞදි රියාල් මිලියන 120 වූ අතර ව්‍යාපෘතිය 2016 වර්ෂය අවසාන වන විට නිම කළ යුතුව තිබුණි. නමුත් 2017 අගෝස්තු 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණු අතර, දිවයින පුරා අපස්මාර කළමනාකරණ වැඩසටහන ආරම්භ කර හෝ නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට එකතුව සෞදි රියාල් මිලියන 13.13 ක ණය වාරික හා එකතුව සෞදි රියාල් මිලියන 2.83 ක පොලී ආපසු ගෙවා තිබුණද, ව්‍යාපෘති ප්‍රමාදය නිසා ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතියේ අරමුණුවලට අදාළ නොවන ජාතික රෝහලේ ස්නායු ඒකකය සඳහා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනයට රු.මිලියන 337.26 ක් වැයකර තිබුණි.

පිළිකා රෝගීන් සඳහා අධිශක්ති විකිරණ උපකරණ මිලදී ගැනීම

පිළිකා රෝගීන් සඳහා යල්පැනගිය කොබෝල්ට් (Cobalt) ප්‍රතිකාර ක්‍රමය වෙනුවට, අධිශක්ති විකිරණ ප්‍රතිකාර ක්‍රමය හඳුන්වාදීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 53.38 ක ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2012 වර්ෂයේදී ලැබී තිබුණි. රෝහල් 10 ක අදියර 02 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු මෙම ව්‍යාපෘතිය මූල්‍යකරණය කිරීමට විදේශ බැංකුවක් විසින් සිය කැමැත්තෙන් යෝජනාවක් (unsolicited proposal) ඉදිරිපත් කර තිබුණි. නමුත් ඉදිරිපත් කර තිබුණු ණය කොන්දේසිවලට එකඟතාවය ලබාදීම මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් ලෝක බැංකු ණය ආධාර හා දේශීය අරමුදල් මගින් ප්‍රතිපාදන සලසා ගෙන, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව කටයුතු කරමින් හා භාණ්ඩගාරය විසින් ප්‍රතික්ෂේප කළ යෝජනාවේ සඳහන් මිල ගණන්වලටම හා එම සැපයුම්කරුගෙන්ම අධිශක්ති විකිරණ උපකරණ (Linear Accelerator) 04 ක් ඒවායේ පිරිවැයෙන් සියයට 80 ක් වූ රු.මිලියන 8.8 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. යන්ත්‍ර සවිකිරීමෙන් පසු ඉතිරි සියයට 20 ගෙවීමට නියමිතව තිබුණි.

රෝහල් 05 ක මෙම විකිරණ උපකරණ සවිකිරීම සඳහා අවශ්‍ය බංකර් ඉදිකිරීමට, නිර්මාණය කර ඉදිකිරීමේ පදනම යටතේ රු.මිලියන 1,103 ක කොන්ත්‍රාත්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත 2014 ජුනි 11 දින පිරිනමා තිබුණි. 2015 අප්‍රේල් මාසය වන විට අවසන් කළ යුතු ඉදිකිරීම් 2017 අගෝස්තු 01 දින වන විටත් අවසන් කර නොතිබුණි. ඒ සඳහා වර්ෂ 2 කට අධික කාලයක් ප්‍රමාද කර තිබුණි. බංකර් ඉදිකිරීමේ ප්‍රමාදය නිසා මෙම යන්ත්‍ර 04 කින් යන්ත්‍ර 03 ක්ම වර්ෂයකට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

ජනහිතකාමී වුත්, සංවර්ධන නම්‍යවුත්, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකික ජනමාධ්‍ය කලාවක් ඇති කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 12 කින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- ජනතා ආකල්ප යහපත් මානයක් කර කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම.
- ජනතාව තුළ දැනුම ආකල්ප සහ රසඥතාවයන් ඇතිකරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම.
- උසස් මාධ්‍ය සදාචාරයන් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම.
- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම.
- ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තු ප්‍රකාශන භාර රජයේ ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම හා නිකුත් කිරීමේ කටයුතු.
- ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම.
- වාණිජ රූපවාහිණී හා ගුවන්විදුලි ප්‍රචාර හා විදේශ විකාශනයන් ඇතුළු ප්‍රචාරක කටයුතු.

ඉටුකළ කාර්යභාරයන් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් භෞමික රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකන තාක්ෂණය හඳුන්වා දීමේ ව්‍යාපෘතිය හා රූපවාහිනී වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් රු. මිලියන 1,698 ක හා රු.මිලියන 101.6 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ව්‍යාපෘතීන් සඳහා කිසිදු උපයෝජනයක් සිදු නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර සියයට 2.1 ක පොලී අනුපාතිකයක් මත 1999 දෙසැම්බර් 10 දින සැපයුම්කරු හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹී ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණ ණය ආධාර යටතේ ප්‍රංශ ෆ්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601) කට සමාන රු.මිලියන 102.2 කට 2003 වර්ෂයේදී මිලදී ගෙන තිබූ වර්ණ රසායනාගාරය සඳහා උපකරණ 2016 මැයි මාසය වන විටත් නිෂ්ක්‍රීයව හා නිසි නඩත්තු කිරීමකින් තොරව පැවතුණි. මේ සම්බන්ධයෙන් 2010 වර්ෂයේ ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබූ අතර, එහි නිර්දේශය වූයේ එම යන්ත්‍ර ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් මඟින් අලෙවි කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙසත්, දෙපාර්තමේන්තුව විසින් 2016 මැයි 31 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ගුවන් විදුලි සේවාවන් ස්වයංක්‍රීයකරණය කිරීම

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ගුවන් විදුලි සේවාවන් ස්වයංක්‍රීයකරණය කිරීමේ කටයුතු 2008 වර්ෂයේදී ආරම්භ කර එදින සිට 2012 මැයි 14 දින දක්වා ඒ වෙනුවෙන් රු.මිලියන 3.40 ක් වැය කර තිබුණි. ස්වයංක්‍රීයකරණය කළයුතු ගුවන් විදුලි සේවාවන් සංඛ්‍යාව 06 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විටත් සේවාවන් 03 ක් පමණක් ස්වයංක්‍රීයකරණය කර තිබුණි.

ජපානයෙන් ලබා ගනු ලබන වැඩසටහන් සිංහලෙන් හා දෙමළ භාෂාවලින් හඬ කැවීම

ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාවේ වැඩසටහන් වැඩිදියුණු කිරීමේ අරමුණින් ජපානයෙන් රු.මිලියන 589.00 කට වැඩසටහන් 449 ක් ලබා ගෙන සිංහල හා දෙමළ භාෂාවලින් හඬ කැවීමට සැලැසුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා ගිවිසුම්වලට එළඹීම පමණක් සිදු කර තිබුණි.

ක්ෂේත්‍ර නිෂ්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව විසින් ක්ෂේත්‍ර නිෂ්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 16.20 ක පිරිවැය වූ මධ්‍යම මට්ටමේ කැමරා, බැටරි හා තාක්ෂණික උපකරණ මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණි. නමුත් ඒ සඳහා අදාළ පිරිවිතර සකස් කර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීම පමණක් සිදුකර තිබුණි.

ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ කාර්යයන්

ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

- සේවක කාර්යසාධනය පදනම් කරගත් ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දීම, සේවකයන්ට ප්‍රසන්න කාර්යාල පරිසරයක් නිර්මාණය කිරීම තුළින් එස් 5 සම්මානය දිනා ගැනීම සහ සංචාරක බංගලා 05 ක් හඳුන්වා දීම.
- ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් යටතේ මාධ්‍ය නගරයක් ස්ථාපනය කිරීම සහ නව වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යාම.
- පවතින ආදායම් උත්පාදන මාර්ගවලට අමතරව නව අතිරේක ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දීම.

- පවතින රූපවාහිනී පනත සමාලෝචනය කර සංශෝධනයන් සිදු කිරීම සහ සංස්ථාවට අවශ්‍ය නව නීති හා රෙගුලාසි සූත්‍රණය (formulating) කිරීම.

සීමාසහිත ස්වාධීන රූපවාහිණී මාධ්‍ය ජාලය

සීමාසහිත ස්වාධීන රූපවාහිණී මාධ්‍ය ජාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු අලාභය රු.මිලියන 107.19 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය රු.මිලියන 433.02 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 540.21 ක් හෙවත් සියයට 125 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම රු.මිලියන 656.66 කින් හෙවත් සියයට 27 කින් අඩු වී තිබුණු අතර ඊට සාපේක්ෂව අනෙකුත් වියදම් අඩු විය යුතු වූවත් වැඩ සටහන්, පරිපාලන සහ අලෙවිකරණ යන සියලුම වියදම් පිළිවෙලින් සියයට 09 ක්, සියයට 02 ක් සහ සියයට 34 ක් බැගින් වැඩි වී තිබුණි.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

"ශ්‍රී ලංකාවේ වඩාත් විශ්වාසනීය සහ නිර්මාණශීලී මාධ්‍ය සැපයුම්කරු" යන දැක්මෙන් යුත් සමාගමේ ප්‍රධාන ව්‍යාපාර කාර්යය පුවත්පත් සහ වාර සඟරා මුද්‍රණය සහ ප්‍රසිද්ධ කිරීම වී තිබුණි. සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී වර්ග 06 ක පුවත්පත් හා වර්ග 09 ක වාර සඟරා ප්‍රසිද්ධ කර තිබුණු අතර, 2015 වර්ෂයේ ප්‍රසිද්ධ කළ වාර සඟරා 11 ක් 2016 වර්ෂයේදී මුද්‍රණය අත්හැර දමා තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සියලුම පුවත්පත්වලින් සහ වාර සඟරා 07 කින් ලද විකුණුම් ආදායම රු.මිලියන 67.9 කින් අඩු වී තිබුණි. පුවත්පත් 06 ක සහ වාර සඟරා 07 ක මුද්‍රණය පසුගිය වසරට සාපේක්ෂව සියයට 7 කින් අඩු වී තිබුණි. පාසල් පෙළ පොත් මුද්‍රණය සහ දුරකථන නාමාවලීන් මුද්‍රණය කිරීම අත්හැර දැමීම හේතුවෙන් වාණිජ මුද්‍රණ කටයුතුවලින් ඉපැයූ ආදායම රු.මිලියන 312.7 සිට රු.මිලියන 50.7 ක් දක්වා සියයට 84 කින් අඩු වී තිබුණි.

සමාගමේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයන් වන සීමාසහිත ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ඔබ්සර්වර් ජොබ්ස් (පුද්ගලික) සමාගම බුන්වත් තත්ත්වයේ වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල එකතුව පිළිවෙලින් රු.මිලියන 19.4 ක් සහ රු.මිලියන 11.6 ක් බැගින් පාඩු පෙන්නුම් කර තිබුණි.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතට අනුව පුවත්පත් හා පත්‍ර කලාවේදීන් විසින් උසස් පත්‍රකලාවේදී ආචාර ධර්ම පවත්වාගෙන යනු ලැබීම ගැන වගබලා ගැනීම ප්‍රධාන අරමුණක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතන වලින් ලද පැමිණිලි 105 කින් පැමිණිලි 53 ක් වර්ෂය අවසන් වන විට ද විසඳා නොතිබුණි.

නීතිය, සාමය හා පාර්ලිමේන්තු කටයුතු

නීති ගරුක සමාජයක් සඳහා නීතිය හා සාමය පවත්වා ගෙන යාම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ලගා කර ගැනීම සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන දෙකක් කටයුතු කරනු ලැබේ. එම ආයතන විසින් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන විෂයයන්ට අදාළ දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම, නීතිය හා සාමය පවත්වා ගෙනයාම, සමාජ විනය තහවුරු කරන පුළුල් ප්‍රතිසංස්කරණ කිරීම ඇතුළත් උපාය මාර්ග සංවර්ධනය හා රථවාහන ගමනාගමනය පාලනය කිරීම මෙම ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන කාර්යභාරයන් වී තිබුණි.

අපරාධ පැමිණිලි විසඳීම

රට තුළ නීතිය හා සාමය ආරක්ෂාවීමේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට තුළ අපරාධ වාර්තාවීම් වල නිරපේක්ෂ ප්‍රමාණය හා වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. පුද්ගලයන්ට එරෙහි සුළු වැරදි පැමිණිලි, ළමයින්ට එරෙහි අපරාධ පැමිණිලි හා සුරා සම්බන්ධ වැරදිවලට අදාළ පැමිණිලිවලින් විසඳුම් ලබාදුන් පැමිණිලි සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි. විස්තර වගුව 23 හි දැක්වේ.

අපරාධ වර්ගය	2015			2016		
	වාර්තා වූ	විසඳනු ලැබූ	විසඳූ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳනු ලැබූ	විසඳූ ප්‍රතිශතය
බරපතල අපරාධ	40,188	23,575	58.66	36,937	26,869	72.74
සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි	43,870	30,292	69.05	45,579	30,481	66.88
සුළු වැරදි දේපළවලට එරෙහි	30,685	14,407	46.95	33,349	15,969	47.88
සුළු පැමිණිලි	1,014,812	1,014,291	99.95	1,039,350	1,038,942	99.96
ළමයින්ට එරෙහි අපරාධ	5,911	5,102	86.31	5,709	3,294	57.70
කාන්තාවන්ට එරෙහි අපරාධ	8,288	4,579	55.25	9,042	4,986	55.14
සුරා සම්බන්ධ වැරදි	113,944	109,256	95.89	120,105	111,028	92.44
නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි	89,996	87,846	97.61	88,352	86,330	97.71
දූෂණ වැරදි	1,796	1,788	99.55	1,255	1,217	96.97
ව්‍යවස්ථාපිත වැරදි	46,290	43,869	94.77	46,171	44,177	95.68

වගුව 23 : අපරාධවලට අදාළව ලැබී තිබුණු පැමිණිලි හා විසඳූ පැමිණිලි
මූලාශ්‍රය : වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2016 නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

රථවාහන අනතුරු වැළැක්වීම

ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සැලසෙන පරිදි රථවාහන ගමනාගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයකි. රටෙහි ගමනාගමනයට යොදාගෙන ඇති වාහන ප්‍රමාණය වර්ධනය වීම හා ඊට සමානුපාතිකව වාහන අනතුරු ප්‍රමාණය වර්ධනයවීමේ වේගය වාහන 1,000 කට අනතුරු 6 ක් ලෙස 2014 – 2016 කාලපරිච්ඡේදය තුළ ස්ථාවරව පැවතුණි. එම කාලපරිච්ඡේදය තුළ වාර්තා වී තිබුණු රිය අනතුරු පිළිබඳ තොරතුරු වගුව 24 හා දැක්වේ.

අනතුරු	2014	2015	2016
මාරක අනතුරු	2,260	2,600	2,824
බරපතල තුවාල අනතුරු	7,071	8,186	8,148
සුලු තුවාල අනතුරු	12,781	13,595	14,604
අලාභ අනතුරු	13,854	13,726	13,380
මුළු අනතුරු සංඛ්‍යාව	**35,966**	**38,107**	**38,956**
මියගිය සංඛ්‍යාව	2,440	2,816	3,017

වගුව : 24 – 2014 -2016 කාල පරිච්ඡේදය තුළදී සිදු වූ අනතුරු
මූලාශ්‍රය : පරිගණක හා සංඛ්‍යාලේඛන අංශයේ වාර්තාව
රථවාහන පොලිස් මූලස්ථානය

මත්ද්‍රව්‍ය පාලනය

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ වාර්ෂික වාර්තා අනුව ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සැසඳීමේදී අත්අඩංගුවට ගෙන තිබුණු හෙරොයින්, හෂීස් හා කොකේන් මත්ද්‍රව්‍ය ප්‍රමාණයන් ඉකුත් වර්ෂයේදී අත්අඩංගුවට ගත් ප්‍රමාණයට වඩා වැඩි වී තිබුණි. විස්තර වගුව 25 හි දැක්වේ.

ආයතනය	හෙරොයින් කි.ග්‍රෑ		ගංජා කි.ග්‍රෑ		හෂීස් කි.ග්‍රෑ		කොකේන් කි.ග්‍රෑ	
	2015	2016	2015	2016	2015	2016	2015	2016
මත් ද්‍රව්‍ය නාශක කාර්යාංශය (PNB)	22.6	147.7	196.3	108.3	-	4.6	-	1,486.3
පොලිස් ස්ථාන	16.6	48.7	5,481.1	3,531.8	1.2	35.6	0.1	1.5
විශේෂ කාර්ය බලකාය	-	-	676.1	409.8	-	-	-	-
වෙනත් ආයතන	6.3	10.4	215.9	124.4	2.9	-	5.5	82.9
එකතුව	**45.5**	**206.8**	**6,569.4**	**4,174.3**	**4.1**	**40.2**	**5.6**	**1,570.7**

වගුව : 25. - මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම
මූලාශ්‍රය - වාර්ෂික වාර්තාව - 2016 පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය

2016 වර්ෂයේ අත් අඩංගුවට ගෙන තිබූ හෙරොයින් හා කොකේන් තොගයේ සාමාන්‍ය තොග මිල අනුව වටිනාකම පිළිවෙලින් රු.මිලියන 1,034 ක් හා රු. මිලියන 23,560.5 ක් වී තිබුණි.

මූලධන ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් සලසා තිබුණු මූලධන ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි විය.

- පෙරසවි ගොඩනැගිලි 572 ක් සම්පූර්ණ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 985 ක ප්‍රතිපාදන සලසා තිබුණි. පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් රු.මිලියන 485 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 285 ක්ද, විශේෂ කාර්ය බලකාය වෙත ලබා දුන් රු.මිලියන 485 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 340 ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි. පොලිස් දෙපාර්තමේන්තුවේ පෙරසවි ගොඩනැගිලි 75 කද විශේෂ කාර්ය බලකායේ පෙරසවි ගොඩනැගිලි 13 කද ඉදි කිරීම් කටයුතු අරම්භකර නොතිබුණි.

- පොලිස් අභ්‍යාස ආයතනය සංවර්ධනය කිරීමේ කටයුතුවලින් සියයට 80 ක ප්‍රමාණයක් ඉටු කිරීම සඳහා රු.මිලියන 800 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 600 ක් වෙනත් ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි. කටාන හා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයන්හි ව්‍යාපෘති 16 කින් ව්‍යාපෘති 02 ක් සඳහා පමණක් රු.මිලියන 44 ක් වැයකර තිබුණි.

- පොලිස් තොරතුරු හා සංනිවේදන ජාලයේ හදිසි සංනිවේදන ගොඩනැගිල්ලේ සියයට 75 ක වැඩ කොටස් හා ජාල ගත කිරීම් වලින් සියයට 75 ක් සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 500 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කටයුත්ත ඉටු නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

දක්ෂිණ සංවර්ධනය

දක්ෂිණ සංවර්ධන මණ්ඩල පනත් කෙටුම්පත සම්මත කරන තෙක් සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත අතුරු මණ්ඩලයක් පත් කිරීමට 2016 අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. දකුණු පළාත් මාර්ග සංවර්ධනය සඳහා දක්ෂිණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබූ රු.මිලියන 864.69 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 483.04 ක් පමණක් වැයකර තිබුණි.

පාර්ලිමේන්තු කටයුතු

සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා කාර්යසාධන වාර්තා අනුව පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

2016 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා 08 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් වාර 101 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණු අතර ඉන් රැස්වීම් වාර 97 ක් පවත්වා තිබුණි. එම රැස්වීම් වාර 97 සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය වගුව 5 පරිදි විය.

සහභාගීවූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව	රැස්වීම් වාර ගණන
51 - 75	01
76 - 100	01
101 - 125	13
126 - 150	21
151 - 175	45
176 - 200	11
201 - 225	05
එකතුව	97

වගුව 26 - සහභාගීවූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව

ඉහත සඳහන් තොරතුරු අනුව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225 න් 150 කට වඩා වැඩියෙන් සහභාගීවී තිබුණු රැස්වීම් වාර 61 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණු අතර, පවත්වා තිබුණු මුළු රැස්වීම් වාර 97 න් වාර 36 ක් සඳහාම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 150 කට අඩුවෙන් සහභාගීවී තිබුණි. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 200 කට වැඩියෙන් සහභාගීවී තිබුණු රැස්වීම් වාර සංඛ්‍යාව 5 කි.

ගරු අමාත්‍යවරයෙකු හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් පාර්ලිමේන්තුවේ ශීර්ෂය හා පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශීර්ෂය යටතේද, ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් අදාළ අමාත්‍යාංශයේ ශීර්ෂයන් යටතේද, 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ වර්ෂ 05 ක කාල පරිච්ඡේදය තුළදී වැය කර තිබුණු වැටුප්, වේතන, දීමනා, කාර්ය මණ්ඩල වියදම්, ප්‍රවාහන, ඉන්ධන, ලිපි ද්‍රව්‍ය, ගමන් වියදම්, ආහාර පාන, කාර්යාල නඩත්තු වියදම්, තැපැල් හා සන්නිවේදන, විදුලිය හා වෙනත් වශයෙන් වැය කර තිබුණු මුළු වියදම පිළිබඳ විස්තර වගුව 27 හි දැක්වේ.

වර්ෂය	ගරු අමාත්‍යවරයෙකු වෙනුවෙන් වැය කර තිබුණු මුළු වාර්ෂික වියදමේ සාමාන්‍ය	ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් වැය කර තිබුණු මුළු වාර්ෂික වියදමේ සාමාන්‍ය
	රු.	රු.
2012	30,566,054	7,359,408
2013	32,996,514	7,233,803
2014	34,506,004	7,489,911
2015	32,703,193	7,738,108
2016	37,277,857	8,575,404

වගුව 27 - ගරු අමාත්‍යවරයෙකු හා ගරු පාර්ලිමේන්තු මන්තීවරයෙකු වෙනුවෙන් වැය කර තිබුණු මුළු වාර්ෂික වියදමේ සාමාන්‍ය

වරාය හා නාවික කටයුතු

ජාතික ආර්ථික වර්ධනය සඳහා සමුද්‍රික ගමනාගමන කටයුතු ක්ෂේත්‍රය තුළ දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරඟකාරිත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක වරාය හා නාවුක සේවාවන් සැලසීමට ඉවහල් වන වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙළ කිරීම හා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන අරමුණ වී තිබුණි. එම අරමුණ **ඉටුකර ගැනීම සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වෙළඳ නාවික ලේකම් කාර්යාලය, සී/ස ලංකා නැව් සංස්ථාව හා නාවික හා ගුවන් සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගම යන ආයතන පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.**

- වරාය හා නාවික විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය හා තෙල් ටැංකි සහ උපකරණ සහ ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධනය හා පරිපාලනය.
- නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය.
- නාවික සේවාවන් සඳහා තරඟ රීති මාලාවක් පැනවීම.
- නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහයවීම.
- බුන් යාත්‍රා හා සමුද්‍ර මුක්තාවශේෂ භාර ගැනීම.
- නාවික සංවර්ධන අරමුදල පරිපාලනය කිරීම.
- නැව් ගාස්තු හා නාවික සේවා කටයුතු පරිපාලනය.
- වෙරළාසන්න මගී ප්‍රවාහනය.
- අමාත්‍යාංශ යටතේ වන ආයතන අධීක්ෂණය.

ඉහත සඳහන් ආයතන විසින් අදාළ කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව සිදුකරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

බහාලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස

2016 වර්ෂය සඳහා ලෝක වරාය පිළිබඳව ඇල්ෆාලයින් සංවිධානය විසින් නිකුත් කරන ලද ඇල්ෆාලයිනර් වාර්තාව (Alphaliner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Unit) 5,734,923 ක මෙහෙයුම් සිදු කරමින් ලෝකයේ 23 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර, 2015 වර්ෂයට සාපේක්ෂව එම කටයුතුවල සියයට 10.6 ක වර්ධනයක් ළඟා කර ගෙන තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එම වෙළෙඳපොළ කොටස 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සියයට 6.75 කින් පහත වැටී තිබුණි.

නැව්බඩු මෙහෙයුම් කටයුතු

කොළඹ, ගාල්ල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායයන් මගින් පසුගිය වර්ෂ 05 ක් තුළ මෙහෙයවන ලද බහළුම් ඒකක සහ සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණයන් පිළිබඳ විස්තර පහත වගුව 28 හි දැක්වේ.

විස්තරය	2012	2013	2014	2015	2016
පැමිණි නැව් සංඛ්‍යාව	4,178	4,024	4,298	4,760	5,023
මෙහෙයවන ලද විසිසම (TEUs) බහළුම් ඒකක ගණන (ඒකක 000)	4,187	4,306	4,908	5,185	5,735
මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (මෙ.ටොන් 000)	6,508	5,664	6,339	7,156	7,811

වගුව28 - ප්‍රධාන වරායන්වල මෙහෙයවන ලද බහළුම් ඒකක හා සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය
මූලාශ්‍රය :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

2016 වර්ෂයේදි ශ්‍රී ලංකාවට පැමිණි මුළු නැව් ප්‍රමාණය 5,023 ක් වී තිබුණු අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5.5 කින් වැඩි වී තිබුණි. 2016 වර්ෂයේදි මෙහෙයවන ලද විසිසම බහළුම් ඒකක ගණන 5,734,923 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 10.6 කින් වැඩි වී තිබුණි. එසේම සම්ප්‍රදායික නැව් බඩු මෙහෙයවීම 2016 වර්ෂයේදී මෙ.ටොන් (දහස්)වලින් 7,811 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ මෙහෙයුම්වලට සාපේක්ෂව සියයට 9.1 කින් වැඩි වී තිබුණි.

කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු

යාත්‍රා පැමිණීම (ආගමනය)

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කොළඹ වරාය වෙත පැමිණි නෞකා පිළිබඳ විස්තර පහත සඳහන් වගුව 29 හි දැක්වේ.

යාත්‍රා වර්ගය	පැමිණි නැව් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
බහළුම්ගත	3,092	3,142	3,239	3,643	3,804
සාම්ප්‍රදායික	52	38	28	45	40
වෙනත්	726	487	475	509	561
එකතුව	**3,870**	**3667**	**3,742**	**4,197**	**4,405**

වගුව 29 - කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය)
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

ඉකුත් වර්ෂය හා සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේදි කොළඹ වරාය වෙත බහළුම්ගත යාත්‍රා 161 ක් හෙවත් සියයට 4 ක පැමිණීමේ වර්ධනයක් ලබා ගෙන තිබුණි. 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදි කොළඹ වරාය වෙත බහළුම් යාත්‍රා පැමිණීමේ වර්ධනයක් පෙන්නුම් කළත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් මෙහෙයුම් සිදු කරන පර්යන්ත වෙත මෙම නෞකා ගෙන්වා ගැනිමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. විස්තර ඉහත සඳහන් වගුව 29 හි දැක්වේ.

බහළුම්ගත යාත්‍රා විශ්ලේෂණය

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කොළඹ වරාය වෙත පැමිණි බහළුම්ගත නෞකා පිළිබඳ විස්තර පහත වගුව 30 හි දැක්වේ.

පර්යන්ත සේවා සැපයුම්කරු	පැමිණි නැව් සංඛ්‍යාව				
	2012	2013	2014	2015	2016
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	1,972	2,084	1,926	1,616	1,460
දකුණු ආසියානු පිවිසුම් පර්යන්ත (SAGT)	1,120	1,011	855	1,026	1,087
කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තය (CICT)	-	47	458	1,001	1,257
එකතුව	**3,092**	**3,142**	**3,239**	**3,643**	**3,804**

වගුව 30 - බහළුම්ගත යාත්‍රා විශ්ලේෂණය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

2015 වර්ෂයේදී අධිකාරියේ පර්යන්ත වෙත මෙහෙයුම් කටයුතු සඳහා පැමිණ තිබූ නැව් සංඛ්‍යාව 2016 වර්ෂයේදී 156 කින් අඩු වී තිබුණි. අධිකාරියට අයත් පර්යන්තයන්හි ගැඹුර ප්‍රමාණවත් නොවීම, නැංගුරම් කිරීම ප්‍රමාදවීම හා පවත්නා ග්‍රැන්ට් දොඹකරවල පළල ප්‍රමාණවත් නොවීම නිසා වරාය අධිකාරියේ පර්යන්ත වෙත නැව් පැමිණීම අඩු වී තිබුණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2001 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා වර්ෂ දහසයක කාලය තුළ බහළුම් මෙහෙයවීමේ ධාරිතාවය මුළු බහළුම් හැසිරවීමේ ප්‍රතිශතයක් ලෙස සැලැකීමේදී සියයට 81 ක සිට සියයට 37 ක් දක්වා සීඝ්‍ර ලෙස පහත වැටී තිබුණි. කෙසේ නමුත්, කොළඹ වරාය තුළ තරඟකාරිව කටයුතු කරන පුද්ගලික සමාගම් දෙකෙන් 2013 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කළ සමාගම සියයට 01 ක සිට සියයට 35 ක් දක්වා සීඝ්‍ර වර්ධනයක් ලබා ගෙන තිබූ අතර, අනෙක් සමාගම 2001 වර්ෂයේදී සියයට 19 ක් වූ සිය වෙළෙඳපල කොටස 2016 වර්ෂය වන විට සියයට 28 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. පසුගිය වර්ෂ දහසයක බහළුම් හැසිරීම පිළිබඳ විස්තර පහත සඳහන් රූපසටහන 21 හි දැක්වේ.

වගුව 21 – ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ2016 කාර්යසාධන සමාලෝචන වාර්තාව

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහළුම් මෙහෙයවීම සඳහා හිමිව තිබුණු වෙළෙඳපොළ කොටස ක්‍රමානුකූලව පුද්ගලික අංශය වෙත නතු වෙමින් පැවැතුණි. අධිකාරියේ බහළුම් මෙහෙයුම් කටයුතු සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Terminal Occupancy Ratio) සලකා බැලීමේදී 2014, 2015 හා 2016

වර්ෂවල එය පිළිවෙලින් සියයට 78 ක්, සියයට 68 ක් හා සියයට 63 ක් වී තිබුණි. ඒ අනුව අධිකාරියේ පර්යන්ත උපයෝජනය අනුපාතය ක්‍රමයෙන් අඩුවී තිබුණි.

නැගෙනහිර බහළුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම

අධිකාරිය විසින් කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ දිග (Quay Length) මීටර් 450, ගැඹුර (Water Depth) මීටර් 18 ක් හා ධාරිතාවය (Capacity) විසිසම ඒකක 800,000 ක් වන නැගෙනහිර බහළුම් පර්යන්තය ඉදිකිරීම් කාර්යයන් වරාය අධිකාරිය විසින් රු.මිලියන 11,168.47 ක් වැය කර 2016 අප්‍රේල් මාසයේදී වැඩ අවසන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවශ්‍ය උපකරණ මිලදී ගෙන මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.

ශුද්ධ මෙහෙයුම් ලාභ හා අලාභ

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ප්‍රධාන වරායන් මගින් පසුගිය වර්ෂ 05 ක කාලය තුළ ඉපැයූ ශුද්ධ මෙහෙයුම් ලාභ/අලාභ පිළිබඳ විස්තර පහත රූපසටහන 22 හි දැක්වේ.

රූපසටහන 22 - ශුද්ධ මෙහෙයුම් ලාභ අලාභ
මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන

ත්‍රිකුණාමලය වරාය ඉකුත් වර්ෂ 4 ක් තුළ අඛණ්ඩව අලාභ ලබමින් පැවැතුණු අතර එහි සමුච්චිත අලාභය රු.මිලියන 4,129 කි. හම්බන්තොට වරාය ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් පළමු අදියර සඳහා රු.මිලියන 73,833.64 ක්ද, දෙවන අදියර සඳහා රු.මිලියන 70,336.77 ක්ද, වශයෙන් රු.මිලියන 144,170.41 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 129,848.19 ක විදේශ ණය ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත්, හම්බන්තොට වරාය මෙහෙයුම් සඳහා විවෘත කළ වර්ෂයේ සිට දිගින් දිගටම පාඩු ලබමින් තිබුණු අතර වත්කම් ඌන උපයෝජිතව පැවැතුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10,860 ක අලාභයක් වාර්තා වූ අතර, 2016 වර්ෂය දක්වා විදේශ විනිමය පරිවර්තන අලාභයද ඇතුළුව ලබා තිබුණු සමුච්චිත අලාභය රු.මිලියන 46,699 ක් වී තිබුණි.

ඔලුවිල් වරාය උපයෝජනය නොකිරීම

ඩෙන්මාර්ක් රජයෙන් ලබාගත් යුරෝ මිලියන 42.2 ක් හා වරාය අධිකාරිය විසින් රු.මිලියන 531 ක්ද, උපයෝජනය කර ඔලුවිල් වරායේ ඉදිකිරීම් කටයුතු 2013

සැප්තැම්බර් 01 දින අවසන් කර තිබුණි. එසේ වුවද, වරාය වෙත නැව් පැමිණීම හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. එසේම මෙම වරාය මීටර් 9 ක් වැනි අඩු ගැඹුරක් සහිත වරායක් බැවින් වරාය විවෘත කිරීමෙන් පසු කිසිදු නෞකාවක් වරායට පැමිණ නොතිබුණි. තවද, වරාය අභ්‍යන්තරයට වැලි පිරීම නිසා අභ්‍යන්තරික වැලි පිරීම වැලැක්වීමට යුරෝ මිලියන 1.8 ක් වැය කර මීටර් 100 ක් බැගින් වූ දියකඩන තුනක් ඉදිකර තිබුණද, අපේක්ෂිත අරමුණ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉටු වී නොතිබුණි.

හම්බන්තොට වරාය ඉදිකිරීම හා සංවර්ධනය කටයුතු

හම්බන්තොට මාගම්පුර වරාය පරිශ්‍රය තුළ රු.මිලියන 2,652 ක් වටිනා ග්‍රැන්ට් දොඹකර (Quay Side Gantry Crane) 2 ක් 2014 ජූලි 30 දින සිට වරාය පරිශ්‍ර යේ ස්ථානගත කර තිබුණි. මාගම්පුර වරාය තුළ ප්‍රධාන වශයෙන් වාහන මෙහෙයුම් කටයුතු (RO-RO Operation) පමණක් සිදු කරන බැවින් වර්ෂයේ වැඩි කාලයක් බහළුම් කටයුතු මෙහෙයවීමට අවශ්‍ය වන මෙම ග්‍රැන්ට්‍රි දොඹකර 2 නිෂ්කාර්යව පැවැතුණි. එසේම ග්‍රැන්ට් දොඹකර 2 ට සමගාමීව භාවිතයට ගනු ලබන රු.මිලියන 270 ක් වටිනා රබර් ටයර් සහිත හුවමාරු දොඹකරය (Rubber Tyre Transfer Crane) ද මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවැතුණි.

හම්බන්තොට වරාය පරිශ්‍රයේ වරාය අධිකාරිය සමඟ පරිපාලිත සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද තෙල් ටැංකි සංකීර්ණයේ මෙහෙයුම් කටයුතු අපේක්ෂිත පරිදි සිදු නොවීමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තෙල් ටැංකි සංකීර්ණය සඳහා ආයෝජනය කරන ලද රු.මිලියන 6,987.64 ක් වටිනා වත්කම් ඌන උපයෝජිතව පැවැතුණි. එමෙන්ම නැව් තෙල් අලෙවිය ආරම්භ කළ දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා තෙල් අලෙවියට අදාළ මෙහෙයුම් කටයුතු මගින් රු.මිලියන 2,738.9 ක සමස්ථ මෙහෙයුම් අලාභයක් ද සිදු වී තිබුණි.

ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම

ගාළු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2006 වර්ෂයේ ණය ගිවිසුම අත්සන් කර තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී රජයේ කඩිනම් ව්‍යාපෘතියක් ලෙසද හඳුනා ගෙන තිබුණි. ඒ සඳහා යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ අනුමැතිය ලැබී තිබුණි. ණය කාල සීමාව දීර්ඝ කිරීමට ඉල්ලා තිබුණත්, එය දීර්ඝ නොකිරීම හේතුවෙන් 2017 අප්‍රේ ල් 30 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව

සමාගම විසින් මිලදී ගත් සිලෝන් බ්‍රිස් හා සිලෝන් ප්‍රින්සස් යන නෞකා දෙක පිළිවෙලින් 2016 මාර්තු හා 2016 ජූලි යන මාසවලදී වාණිජමය ප්‍රවාහන කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි. එම නෞකා දෙක හා කුලී පදනම මත ලබාගත් යාත්‍රාද උපයෝගි කරගෙන ලක්විජය තාප විදුලි බලාගාරය සඳහා ගල් අඟුරු ප්‍රවාහන සේවා සැපයීම ඇතුළු නැව් බඩු ප්‍රවාහන කටයුතු, නෞකාමය නොවන පොදු ප්‍රවාහක සේවා සැපයීම (Non Vessel Operations Common Carriers), නැව් බඩු නිශ්කාෂණය හා නියෝජිත සේවා සැපයීම නාවික පුහුණුව ඇතුළුව මෙහෙයුම් කටයුතුවල නිරතව තිබුණි. සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාගම විසින් 2015/2016 ගිණුම් වර්ෂය තුළ රු.මිලියන 74.31 ක ලාභයක් උපයා තිබුණු අතර ඊට අනුරූපව 2014/2015 වර්ෂයේදි උපයා තිබුණු ලාභය රු.මිලියන 124.94 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී 2015/2016 ගිණුම් වර්ෂයේ ලාභය සියයට 40.5 කින් පිරිහී තිබුණි. සමාගමේ සෘජු මෙහෙයුම් වියදම සියයට 93 කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

- සමාගමේ ඉපැයුම් වර්ධනය කිරීම මෙන්ම විදේශ විනිමය ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව පිරිවැය මත පදනම් විය යුතු නැව් ගාස්තු මත රටට අවශ්‍ය ගල් අඟුරු හා බොරතෙල් ප්‍රවාහනය කිරීම ලංකා නැව් සංස්ථාවට පමණක් හිමිකර දීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2014 වර්ෂයේදි ප්‍රතිපත්තිමය තීරණයකට එළඹ තිබුණි. එහෙත් බොරතෙල් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ එකඟතාවයකට පැමිණීමට නොහැකිවීම හේතුවෙන් 2015 ජනවාරි මාසයෙන් පසු බොර තෙල් ප්‍රවාහනය කිරීම ඇනහිට තිබුණි.

- සමාගම විසින් භාර කරුවෙකු රහිතව පැමිණෙන පුද්ගලික ගමන් මළු නිෂ්කාශණය කිරීම සඳහා ගුදම් (Unaccompanied Personal Baggage) Clearance Warehouse) පවත්වා ගෙන යාමට 2016 වර්ෂයේදි සැලැසුම් කර තිබුණත්, ඊට සුදුසු භූමිභාගයක් සොයා ගැනීමේ අපහසුතාවය නිසා එම කාර්යය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- සමාගම විසින් 2016 වර්ෂයේදි තෙවන පාර්ශවකරුවෙකු සමඟ එක්ව ස්ව බලයෙන් ක්‍රියාකරණ බත්තල් (Self Propelled Barges) දෙකක් මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණත්, අදාළ ආයතන සමඟ එකඟතාවයකට පැමිණීමට නොහැකිවීමෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- තෙවන පාර්ශවකරුවෙකු සමඟ එක්ව නෞකා සඳහා ඉන්ධන සැපයීමේ පාවෙන ගබඩා පහසුකම් (Floating Bunker Storage) පවත්වාගෙන යාම සමාලෝචිත වර්ෂයේදී ඉටු කිරීමට සමාගම සැලැසුම් කර තිබුණත්, බලපත්‍ර ලබාගැනීමේ ප්‍රමාදය මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වි තිබුණි.

- දකුණු ඉන්දියානු කළාපය තුළ මගී ප්‍රවාහන පාරු/නැව් සේවා කටයුතු (Passenger Ferry/Cruise Operations) පවත්වා ගැනීමට සැලැසුම් කර තිබුණත්, පහසුකම් සීමිතවීම හා සංචාරක ආකර්ශණයක් නොමැති ගමනාන්තයක් පැවැතිම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වි තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් වෙරළාසන්න නාවික සේවා පවත්වාගෙන යාමට සැලැසුම් කර තිබුණත්, අවශ්‍ය දත්ත නොමැතිවිම හේතුවෙන් ශක්‍යතා අධ්‍යයනය අවසන කිරීමට නොහැකි වී තිබුණි.

නාවික සංවර්ධන අරමුදල පරිපාලනය

2012 වර්ෂයේ සිට අක්‍රියව පවත්නා මෙම අරමුදලට රාජ්‍ය ආයතන තුනකින් රු.මිලියන 422.64 ක් අයවිය යුතුව තිබුණි. එම ආයතන විසින් ශේෂ සනාථ නොකරන ලද මෙම හිඟහිටි ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කර අරමුදල ඈවර කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානයේ සම්මුතියන් ප්‍රකාරව දේශීය නීති සම්පාදනය

අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානයේ සම්මුතියන් ප්‍රකාරව දේශීය නීති සම්පාදනය සඳහා වූ නීති කෙටුම්පත 2016 ජූනි 30 දින වන විට පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට සැලැසුම් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය ඉදිරිපත් කර නොතිබුණි. අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානයේ සමුතියන්ට අනුකූල නීති, රීති හා මඟපෙන්වීම් සම්පාදනය සඳහා වන නීති කෙටුම්පත් අනුමත කිරීම හා ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැසුම් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය සාකච්ඡා මට්ටමේ පැවැතුණි.

නාවික හා ගුවන් සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගම

සමාගම 2012 වර්ෂයේ සිට අඛන්ඩව අලාභ ලබා තිබුණි. එම කාලය තුළ ස්ථාවර තැන්පතු ආයෝජනය මත ලැබුණු පොලි ආදායම හැරුණු විට වෙනත් මෙහෙයුම් ආදායම් උපයා නොතිබුණි. නමුත් සමාගමේ කොටස් ප්‍රාග්ධනය රු.මිලියන 30 ක් වී තිබුණි. සමාගමේ පැවැති ස්ථාවර තැන්පතු කොටස් වශයෙන් උපලබ්ධි කර ආයතන හා පරිපාලන වියදම් ලෙස උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමාගමේ සමුච්චිත අලාභය රු.මිලියන 6.2 ක් වූ අතර, එය ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රු.මිලියන 30 ට ගැලැපූ පසු රු.මිලියන 23.8 ක් දක්වා බාදනය වී තිබුණි.

මහාමාර්ග

ඉහළ සංසරණ පද්ධතියක් ඇති කිරීම තුළින් ගමන් කාලය හා පිරිවැය අවම කිරීම සහ මාර්ග ආරක්ෂාව හා සුවපහසුව වැඩි කිරීම තුළින් මාර්ග භාවිතා කරන්නන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණින්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- මහාමාර්ග විෂයට අදාළව ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධව ජාතික ප්‍රතිපත්ති පදනම් කරගත් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සම්බන්ධව සිදු කළ විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩල බඳවා ගැනීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව බඳවා ගෙන තිබුණු උපදේශකවරුන් 73 දෙනෙකු රු.65,000 ක් බැගින් වූ මාසික වැටුපකට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් 2016 වර්ෂය තුළ සේවයේ යොදවා ගැනීමට කටයුතු කර තිබුණි. මේ සඳහා රජයට මසකට රු. මිලියන 4.74 ක වියදමක් දැරීමට සිදු වී තිබුණි.

දේශීය බැංකු අරමුදල් මගින් මාර්ග පුළුල් කිරීම හා පුනරුත්ථාපනය කිරීම

දිග කි.මී.1434 ක් වූ මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.බිලියන 143.51 ක ණය මුදලක් දේශීය බැංකු ලබාගෙන තිබුණු අතරථ, අදාළ කොන්ත්‍රාත්, දේශීය කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. මාර්ග පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණු අතර, එක් එක් මාර්ගයන්ට කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය යෝජනාවල අවසන් කොන්ත්‍රාත් මිල තීරණය කිරීම, විශේෂයෙන් පත්කළ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් (SCAPC) විසින් සිදුකර තිබුණි. අධිකාරිය විසින් ලබාගත් ණය මුදලින් මාර්ග 28 ක් ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් අනුමත රු.මිලියන 55,392.2 ක ණය මුදලින් රු.මිලියන 28,000 ක් මාර්ග පුනරුත්ථාපනයෙන් පරිබාහිරව අධිකාරිය, අමාත්‍යාංශය හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා වැය කර තිබුණි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 28,000 ක ලබා ගෙන 2015 වර්ෂයේදී රු.මිලියන 5,400 ක් ද, 2016 වර්ෂයේ රු.මිලියන 6,250 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 11,650 ක ඉදිකිරීම් කටයුතුවලට අදාළ බිල්පත් පියවා තිබුණි. අමතර වැඩ සඳහා වැය කරන ලද මුදල් අප්‍රමාදව නොලැබීම හේතුවෙන් ඉදිකිරීමට යෝජිත මාර්ගවල දිග, පළල, කොන්ක්‍රීට් කාණු පද්ධති, බෝක්කු, පැති බැමි සහ මාර්ගයේ මතුපිට ස්ථරයේ ඉදිකිරීම්

යනාදී කළයුතු වැඩ කොටස් අඩුකර ඉදිකිරීම් කටයුතු සිදු කර තිබුණි.

මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් වලට අදාළ කාර්යසාධනය

වැඩ ආරම්භ කර නොතිබුණු ව්‍යාපෘති

2016 වර්ෂයේදී වැඩ ආරම්භ කිරීමට සැලැසුම් කළ නමුත්, 2016 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 7,778.44 ක් වූ ව්‍යාපෘතීන් 114 ක වැඩ සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි. මෙම ව්‍යාපෘති 114 න් ව්‍යාපෘති 39 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගවලට අදාළ ව්‍යාපෘති වී තිබුණු අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 3,206.28 ක් වී තිබුණි.

සියයට 50 කට අඩුවෙන් වැඩ නිම කළ ව්‍යාපෘති

භෞතික ප්‍රගතිය සියයට 50 කට අඩු කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 4,292.90 ක් වූ ව්‍යාපෘතීන් 87 ක් පැවති අතර එයින් ව්‍යාපෘති 49 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන (Non RDA) මාර්ගවලට අදාළ ව්‍යාපෘති වී තිබුණි. එහි කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 1,649.95 ක් හා ඒ සඳහා වැයකළ පිරිවැය රු. මිලියන 302.47 ක් වී තිබුණි. සියයට 50 කට අඩු භෞතික ප්‍රගතියක් ඇති ව්‍යාපෘති 38 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වූ අතර එහි කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 2,642.95 ක් වූ අතර රු.මිලියන 300.21 ක් වැයකර තිබුණි.

වර්ෂය තුළ වැඩ නිම නොකළ ව්‍යාපෘති

2016 වර්ෂය අවසන් වන විට වැඩ නිම කිරීමට යෝජිත කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 16,771.37 ක් වූ කොන්ත්‍රාත් 342 ක වැඩ අවසන් කර නොතිබුණු අතර, එම ව්‍යාපෘති ප්‍රමාදවීම්වලට හේතුන් වාර්ෂික ප්‍රගති වාර්තාවේ දක්වා නොතිබුණි.එ

ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගයේ ඉදිකිරීම

මඩකලපුව - තිරික්කොන්ඩායි ආරු - ත්‍රිකුණාමලය (A-15) සහ අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය (A-6) මාර්ග, ත්‍රිකුණාමලය නගරයෙන් පිටත සම්බන්ධ වනසේ ඉදිකරන ලද පිටත වටරවුම් මාර්ගය සඳහා එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ 2009 සහ 2010 වර්ෂවලදී රු.මිලියන 3,495 ක් වැයකර පාලම් 08 ක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, 2016 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 06 ක කාලයක් ගත වී තිබුණත්, මෙම පාලම් සම්බන්ධ කෙරෙන මාර්ග ඉදිකිරීම් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සම්පූර්ණ කර නොතිබුණි.

මාර්ග පුළුල් කිරීම, පුනරුත්ථාපනය හා මාර්ග නඩත්තු කටයුතු

2016 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා රු. මිලියන 8,065.0 ක ප්‍රතිපාදනය අවශ්‍ය වී තිබුණි. ඉන් රු.මිලියන 4,637.6 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඒ අනුව ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන මුදල් නොලැබීම හේතුවෙන් 2016 වර්ෂය තුළ කළ වැඩ සඳහා ගෙවිය යුතු බිල්පත් වටිනාකම 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 3,523.45 ක් ලෙස පැවතුණි.

ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම

2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම්වලට අදාළව එකතුව රු.මිලියන 56,771.69 ක් වූ කොන්ත්‍රාත් 2773 ක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව පුද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. මහාමාර්ග ගාස්තු උපලේඛනයේ (HRS) (මූලික) ගාස්තු මත පොදු කාර්ය පිරිවැය ද, සහිතව සියයට 28 ක ලාභ ආන්තිකයක් සහිතව මෙම කොන්ත්‍රාත්වල මිල තීරණය කර තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ 2008 අගෝස්තු 15 දිනැති චක්‍රලේඛයට අනුව මෙම කොන්ත්‍රාත් සඳහා උප කොන්ත්‍රාත් දීමට නොහැකි වුවද, එම සමාගම විසින් සෘජුව මෙම ඉදිකිරීම් කටයුතු සිදු නොකර කිසිදු ලංසු කැඳවීමකින් තොරව බාහිර කොන්ත්‍රාත්කරුවන් වෙත උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි.

මාර්ග නඩත්තු කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාගමකින් 2004 වර්ෂයේ සිට 2017 මාර්තු මාසය දක්වා රු.මිලියන 5,079.53 ක ඉමල්ෂන් මිලදී ගෙන තිබුණි. මහාමාර්ග ගාස්තු උපලේඛනයේ පිරිවැයට (HSR) ගැනුම් මිල තීරණය කර ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව ඉමල්ෂන් මිලදී ගැනීම සඳහා කටයුතු කර තිබුණි.

ණයගැතියන්ගේ මුදල් එකතු කිරීම හා අත්තිකාරම් නිරවුල් කිරීම

1987 සිට 2015 දක්වා වර්ෂවල සිට පැවැත එමින් තිබුණු රු.මිලියන 1,264.96 ක් වූ ණයගැති ශේෂ 2016 දෙසැම්බර් 31 දින වන විටත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අයකර ගෙන නොතිබුණි. අධිකාරිය විසින් ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් විවිධ මිලදීගැනීම් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට සහ රජයේ අමාත්‍යාංශ හා මණ්ඩල වෙත ලබාදී තිබුණු එකතුව රු.මිලියන 5,174.78 ක අත්තිකාරම් නොපියවා වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාලයක සිට පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අත්තිකාරම් නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට හෝ අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදය

කොන්ත්‍රාත්කරුවන් හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එළඹ තිබුණු ගිවිසුම් අනුව නියමිත දිනට වැඩ අවසන් කිරීමට අපොහොසත් වීම මත ප්‍රමාද කාල අලාභයන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කළ යුතුව තිබුණි. 2010 වර්ෂයට පෙර සහ 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කොන්ත්‍රාත් 344 කට අදාළව අයකර ගත යුතු ප්‍රමාද කල අලාභවල වටිනාකම (Liquidation Damages) රු.මිලියන 116.02 ක් වී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පසුවිපරමක් කර එම ප්‍රමාදය මත වූ අලාභ අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

කුලී ආදායම් රැස්කර ගැනීම

මහනුවර පිහිටි මගී උමං මාර්ගයේ කඩ කාමර 02 ක් සඳහා වර්ෂ 04 කාලය තුළ අයකර නොගත් කුලී ආදායම රු. 699,463 ක් හා බොරැල්ල පිහිටි මගී උමං මාර්ගවල කඩ කාමර 01 ක් සඳහා වර්ෂ 09 දක්වා කාලය තුළ අයකර නොගත් කුලී ආදායම රුපියල් මිලියන 1.47 ක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

සේවාදායක තැන්පතු නිරවුල් කිරීම

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බාහිර පාර්ශවයන් වෙනුවෙන් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතුවලට අදාළව වර්ෂ 03 ක සිට වර්ෂ 05 ක් දක්වා සහ වර්ෂ 05 කට වඩා පැරණි සේවාදායකයින් විසින් ලබා දී තිබුණු වැඩ 148 කට අදාළව එකතුව රු.මිලියන 205.94 ක් වූ සේවාදායක තැන්පතු සම්බන්ධයෙන් පසුවිපරම් කර එම තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

භාවිතයට නොගත් අමතර කොටස් හා තොග

2012 වර්ෂයේ සිට භාවිතයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණු වටිනාකම රු.මිලියන 32.14 ක් වූ උපයෝජනය නොකළ හා සෙමින් චලනය වන අමතර කොටස් තොග සහ 2008 වර්ෂයේ සිට ගබඩාවේ රඳවා තිබූ රු.මිලියන 5.28 ක් වූ යල් පැනගිය නිල ඇඳුම්, සපත්තු හා සැන්ඩ්ල්ස්, ටයර් හා ද්‍රව්‍ය තොගය සහ ඇස්පෝල්ට් පිරියත මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

දේශීය බදු නිදහස් කිරීම

ජාතික මාර්ග ජාලයේ නායයාම් ආපදා වැළැක්වීම් ව්‍යාපෘතියේ සහ දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ උපදේශකයන් හා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් කිරීම වෙනුවෙන් වූ දේශීය බදු නිදහස් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි. ඒ අනුව එකතු කළ අගය මත බදු සහ ආදායම් බදු රු.මිලියන 23.39 ක් එම ව්‍යාපෘති විසින් ගෙවා තිබුණි.

අයකර නොගත් වැඩපූර්ව අත්තිකාරම්

ජාතික මාර්ග ජාලයේ නායයාම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතියේ උපදේශකයින් වෙත ගෙවන ලද වැඩ පූර්ව අත්තිකාරම් රු.මිලියන 78.88 ක් උපදේශක සේවා ගිවිසුම අනුව 2016 ජූනි 08 දින වන විට සම්පූර්ණයෙන් අය කර ගත යුතු වුවත්, එම අගයෙන් රු. මිලියන 9.78 ක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

විචලතා නියෝග සඳහා අනුමැතිය නොමැති වීම

මධ්‍ය අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීමට අපේක්ෂා කළ චීන රජයේ ආයෝජකයා ඉවත්වීම නිසා දේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් එම ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට තීරණය කර තිබුණි. මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළව පිළියෙල කරන ලද ශක්‍යතා අධ්‍යන වාර්තාව නැවත සකස් කිරීමට සිදු වීම හේතුවෙන් විදේශීය උපදේශක සේවා ආයතනය වෙත රු.මිලියන 161.09 ක අතිරේක මුදලක් ගෙවිය යුතුව පැවතුණි. පිළියෙල කරන ලද ශක්‍යතා අධ්‍යන වාර්තාව නැවත වෙනස් කිරීම සඳහා අතිරේකව වැඩි වූ අගය ඇගයීම් කිරීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කමිටුවක් පත් කර තිබුණි. එම කමිටුව විසින් 2017 සැප්තැම්බර් 30 දින වන විටද අනුමැතියක් ලබා දී නොතිබුණි. නමුත්, අතිරේක අගය වැඩිවීම මත ගෙවන ලද රු.මිලියන 30 ක මුදල සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමැතිය ලබා දී තිබුණි.

අනාර්ථික වියදම්

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහනැඟුම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන

1.5 ක් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් වියදම් කර ඉදිකරන ලද මීටර් 806.7 ක අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරන ලද පාර, මෝටර් ග්‍රේඩරයක් මඟින් මුළුමනින්ම එකී කුට්ටි ගල් ඉවත් කිරීම නිසා සිදු කර තිබුණු වියදම අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි.

අලෙවි කරනු ලබන ඛනිජ තෙල් ප්‍රමාණය මත ගාස්තු අයකර ගැනීම

2005 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව 2006 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විසින් විකුණනු ලබන සෑම ඩීසල් ලීටරයක් සඳහාම ශත 50 ක් බැගින්ද, පෙට්‍රල් ලීටරයක් සඳහා රු.1 ක් බැගින්ද, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට ගෙවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට 2015 හා 2016 වර්ෂවලට අදාළ රු.මිලියන 4,486 ක් අමාත්‍යාංශය විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වැඩියෙන් ගෙවීම

ඒකාබද්ධ මාර්ග ආයෝජන (i-Road) ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන්ට වැඩ පටන්ගැනීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 5,097 ක් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. එම අත්තිකාරම් ගණනය කිරීමේදී (වෙන්කල අගයන්- Provisional Sum) අඩු කිරීමකින් තොරව මුළු කොන්ත්‍රාත් මුදල වෙනම ගණනය කිරීම නිසා රු.මිලියන 974 ක් වැඩි පුර ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවා තිබුණු මුදල අයකර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන තිබුණු විධිමත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

පවරාගත් ඉඩම් පිළිබඳ වත්කම් වාර්තාව

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශාල වන්දි මුදලක් ගෙවා විශාල ඉඩම් ප්‍රමාණයක් අත්පත් කර ගෙන තිබුණි. කෙසේ වුවද, එම වන්දි ගෙවා රජය විසින් අත්පත් කර ගත් ඉඩම්වලට අදාළව පැහැදිලි වත්කම් වාර්තාවක් (ලෙජරය) අමාත්‍යාංශය විසින් පවත්වා නොතිබුණි. උදාහරණයක් ලෙස පිටත වටරවුම් මහාමාර්ග අදියර - II යටතේ වන්දි ගෙවා අත්පත් කර ගත් ලොට් 1,205 කින් ලොට් 614 ක් පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ අයිතිය පවරාදීමට කටයුතු කර තිබුණි. තවද, අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව ව්‍යාපෘති මඟින් පමණක් අත්පත් කරගනු ලබන ඉඩම් පිළිබඳ විස්තර වාර්තාවක්ද අමාත්‍යාංශයේ නොතිබුණි. බැඳුම්කර මඟින් අත්පත් කරගත් ඉඩම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

මහාමාර්ග ලේකම් කාර්යාලය වෙනුවෙන් ගොඩනැගිල්ල ඉදි කිරීම

මහාමාර්ග ලේකම් කාර්යාලය වෙනුවෙන් මහල් අටක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ පළමු අදියර වශයෙන් මහල් තුනක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට 2010 අගෝස්තු 17 දින රු.මිලියන 599.30 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පුද්ගලික පාර්ශවයක් වෙත පිරිනමා තිබුණි. එය 2011 නොවැම්බර් 04 දින වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, මහල් තුන ඉදිකිරීමේ කටයුතුවලින් සියයට 90 ක් සම්පූර්ණ වන විට, ගොඩනැගිල්ලේ අනෙක් මහල් පහ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව පළමු කොන්ත්‍රාත්තුවේ විචලනයක් ලෙස සලකා රු.මිලියන 568.14 ක අමතර පිරිවැයකට

එම කොන්ත්‍රාත්කරු වෙතම පිරිනමා තිබුණි. තවද රු.මිලියන795.72 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ගොඩනැගිල්ල තවත් මහල් දෙකකින් වැඩිකිරිමට 2012 ජුනි මාසයේදී ව්‍යාපෘති නියාමන ඒකකය තීරණය කර තිබුණි. එම නිසා මහල් දහයකින් සමන්විත ගොඩනැගිල්ලේ මුළු අපේක්ෂිත පිරිවැය රු.මිලියන 2,506.54 ක් වී තිබුණි. ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් අතිරේක පිරිවැය දැරීමට ඉහත සඳහන් සියලු අදියරයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණ සාරාංශ ගත කර පහත සඳහන් කර ඇත.

- විදුලි ජනක යන්ත්‍ර, භූගත ඉන්ධන ටැංකිය, දත්ත ජාලය, සේවා පද්ධතිය, විදුලි ආරෝහක හා වායුසමීකරණ පද්ධතිය ආදී උපාංග කිහිපයක් කොන්ත්‍රාත්කරුගෙන් රු.මිලියන 495.39 ක පිරිවැයකයට ප්‍රසම්පාදනය කර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රධාන කොන්ත්‍රාත්තුවේ විචලනයන් ලෙස සලකා තිබුණු බවත් මුල් ප්‍රමාණ පත්‍රයහි එම විෂයයන් ඇතුළත් කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. එමනිසා පොදුකාර්ය, සවිකිරීමේ ගාස්තු,ලාභ ආන්තික ආදීය මත සියයට 35ක් දක්වා අමතර ගාස්තු ඉල්ලීමට කොන්ත්‍රාත්තරුට ඉඩ සලසා තිබුණි. ඊට අමතරව වාහන ගාල් කිරීමේ කාර්යයන් සඳහා ඉඩකඩ සැලසුම් කර නොතිබුණු අතර ඒ සඳහා අමතර ස්ථාන ලබාදීමට සිදු වී තිබුණි.

- දත්ත ජාල පද්ධතිය, සේවා පද්ධතිය, පොදු ඇමතුම් පද්ධතිය, විද්‍යුත් සවිකිරීම්, වායුසමීකරණ පද්ධතිය, විදුලි සෝපාන ආදී ගොඩනැගිල්ලේ උපකරණ හා සවි කිරීම් රු.මිලියන 259.42 ක පිරිවැයකට ප්‍රසම්පාදන කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ ස්ථානීය පරීක්ෂණවලදී පැවැති අඩුපාඩු පෙන්වා දී තිබුණි. එම අඩුපාඩු පිළිසකර කිරිමට කටයුතු කර නොතිබුණු බවත්, උපකරණ හා සවි කිරීම් දිගු කාල පරිච්ඡේදයක් ඉදිකිරීම් වැඩබිමේ නිෂ්කාර්යව පැවතුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විට ඒවායේ වගකීම් කාලය ඉකුත් වී තිබුණි.

මාර්ගවල සම්පූර්ණ කරන ලද කොටස් පවරා ගැනීම

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ මොරටුව - පිළියන්දල පාර සහ රත්මලාන මිරිහාන මාර්ගයේ සම්පූර්ණ කරන ලද කොටස් කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 කොන්දේසිය ප්‍රකාරව මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුව නිසා කොන්ත්‍රාත්කරුගෙන් ලබාගත යුතුව තිබුණු රු. මිලියන 66.11 කින් රු.මිලියන 38.51 ක් පමණක් අයකර ගෙන තිබුණි.

නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව

අධ්‍යාපනය, වෘත්තීය හා තාක්ෂණ පුහුණුව මගින් තරුණයින් සවිබල ගැන්වීමෙන් නිපුණ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම හරහා ආර්ථික වර්ධනය වැඩිකිරීමට අවශ්‍ය කරන්නාවූ ප්‍රතිපත්ති හා රීතින් සම්පාදනය කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 10 ක් මඟින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණු වැඩසටහන් පසු විපරම් කිරීම හා ඇගයීම.
- විශ්වවිද්‍යාල අධ්‍යාපන සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවශ්‍යතා පුළුල් කිරීමට ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම.
- රැකියා වෙළඳපොළට උචිත ශ්‍රමබලකායක් ඇති කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම.
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම.
- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

මේ අනුව ගුණාත්මකභාවයෙන් පිරි වෘත්තීය පුහුණුවක් ලබාදීම තුළින් ලෝකයට අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 07 කට අනුබද්ධව දිවයින පුරා මධ්‍යස්ථාන 397 ක් ක්‍රියාත්මකව තිබුණි. එකී ආයතනයන්හි කාර්යසාධනය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

වෘත්තිය පුහුණු අවස්ථා සඳහා පහසුකම් සම්පාදනය කිරීම

කාර්මික හා වෘත්තීය පුහුණු ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා වර්ෂය තුළ නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය විසින් නව පුහුණු ආයතන හඳුන්වාදී තිබුණි. නමුත් අපේක්ෂිත පරිදි කාර්මික හා වෘත්තීය පුහුණු අවස්ථාවන් ප්‍රමාණාත්මක මට්ටමින් වර්ධනය වී නොතිබුණි. 2015 වර්ෂය වනවිට අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) අසමත්ව උසස් අධ්‍යාපනය අහිමි වූ සිසුන් 210,695 ක් පමණ වූ අතර 2016 වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල විද්‍යායතන ඇතුළු ආයතන 08 කින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව වෘත්තීය පුහුණුව සඳහා සිසුන් 97,925 ක් ඇතුළත් කර ගෙන තිබුණි. මේ අනුව උසස් අධ්‍යාපන අවස්ථා අහිමිවන සිසුන්ට සාපේක්ෂව වෘත්තීය පුහුණු අවස්ථා සම්පාදනය වී නොතිබුණි. එසේ හෙයින් උසස් තාක්ෂණ ආයතන, කාර්මික විද්‍යාල හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණාත්මකව ඉහළ නැංවීමට අමාත්‍යාංශයේ අවධානය යොමුවිය යුතුව තිබුණි.

පුහුණු වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම සිදුකළ යුතුව තිබුණි. එසේ වුවද, නිපුණතා

සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන පවත්වනු ලබන පාඨමාලා 2148 ක් අතරින් පාඨමාලා 526 ක් සම්බන්ධයෙන් පනතෙහි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. තවද විද්‍යාගාර පහසුකම් ප්‍රමාණාත්මක නොවීම හා විද්‍යාගාර භාවිතා කළ හැකි වන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කර නොතිබීම, පුහුණු පාඨමාලාවන්හි ගුණාත්මක තත්ත්වය අඩුවීම කෙරෙහි බලපා තිබුණි. ඒ අනුව නිසි ප්‍රමිතියකින් දේශීය හා විදේශීය පිළිගැනීම සහිත ගුණාත්මක පාඨමාලා පැවැත්වීම තුළින් ගෝලීයව සවිබල ගැන්වුණු රැකියා ගත කළ හැකි ශ්‍රම බලකායක් බිහිකිරීම අමාත්‍යාශයේ අරමුණ වී තිබුණත්, එය අපේක්ෂිත අයුරින් ඉටු වී නොතිබුණි.

පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය

පුහුණු පාඨමාලා සඳහා සිසු සහභාගීත්වය ප්‍රමාණාත්මකව වර්ධනය වී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව අමාත්‍යාංශයට අයත් විශ්වවිද්‍යාල විද්‍යායතන ඇතුළු ආයතන 09 ක සියයට 70 කට අඩු සිසුන් සංඛ්‍යාවක් බඳවා ගෙන තිබුණු පාඨමාලා 306 ක් පැවැතුණි. එසේම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 05ක වෘත්තීය පුහුණු සඳහා අවශ්‍ය පහසුකම් හා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම සහිත පාඨමාලා 375 ක් සඳහා බඳවාගත් සිසුන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පැවැතුණි. ඒ අනුව සිසුන් 5 ක සිට 10 ක් දක්වා සංඛ්‍යාවක් බඳවාගත් පාඨමාලා 204 ක් ද, සිසුන් 5 ට අඩු සිසුන් සංඛ්‍යාවක් බඳවාගත් පාඨමාලා 40 ක් ද පැවති අතර පාඨමාලා 131 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයින් බඳවාගෙන නොතිබුණි. මේ හේතුවෙන් වර්ෂය තුළ පුහුණු ආයතන සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කර නොතිබුණි. කෙසේ වුවද, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු ක්ෂේත්‍රය කෙරෙහි තරුණ ප්‍රජාවේ ආකර්ශනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසී නොතිබීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. එක් එක් ආයතනයන්හි පාඨමාලා පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් මගින් පාසල් සිසුන් හා පාසල් හැරගිය සිසුන් අඛණ්ඩ දැනුවත් කිරීම තුළින් පාඨමාලා සඳහා යොමුකරවා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, මේ සම්බන්ධයෙන් වූ අමාත්‍යාංශයේ දායකත්වය අවම මට්ටමක පැවතීම හේතුවෙන් පාඨමාලාවලින් අපේක්ෂිත ප්‍රමාණාත්මක ප්‍රතිඵලය කරා ලඟා වීමට නොහැකි වී තිබුණි.

පුහුණු මධ්‍යස්ථාන මධ්‍යගතව පිහිටා තිබීම

අමාත්‍යාංශය යටතේ ඇති විවිධ ආයතනවල සමාන පාඨමාලා පවත්වන පුහුණු මධ්‍යස්ථාන කේන්ද්‍රගතව පිහිටා තිබීම හේතුවෙන් සිසුන්ට පාඨමාලා තෝරාගැනීමේ ගැටළු ඇතිවිය හැකි අතර පාඨමාලා සඳහා සිසුන් සංඛ්‍යාව අඩු වීමට ද එය හේතු වී තිබුණි. ආර්ථික සමාජීය දුෂ්කරතා හමුවේ ගැටළුවලට මුහුණපාමින් සිටින සිසුන්ට අවස්ථාවක් ලබාදීම සඳහා පුහුණු මධ්‍යස්ථාන ප්‍රාදේශීයව පැවතීමේ අවශ්‍යතාවයක් පැවතියද මේ පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණි.

පාඨමාලා සඳහා සිසු ආකර්ෂණය වර්ධනය කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීම, පාඨමාලා ප්‍රතීතනය, නව පාඨමාලා හඳුන්වා දීම, ආයතනවල පාඨමාලා සම්බන්ධිකරණය, ප්‍රාදේශීය ආවේණික කර්මාන්තවලට අදාළ පාඨමාලා ඇතිකිරීම, ප්‍රාදේශීයව පුහුණු මධ්‍යස්ථාන ඇතිකිරීම, විද්‍යාගාර පහසුකම් හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ඉහත තත්ත්වයන් අවම

කර ගැනීමට අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතුව තිබුණි.

වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව, 2013 නොවැම්බර් 19 දින ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර මාස 36 ක් ඇතුළත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. උපදේශන සේවා කොන්ත්‍රාත්තුව පිරිනැමීමට මාස 09 ක කාලයක් ගතවීමත්, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ලංසු කැඳවූ දින සිට ලංසු ඇගයීම් කර කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා මාස 15 කට ආසන්න කාලයක් ගතවීමත් නිසා ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘති කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීමට නියමිත දිනය වූ 2016 නොවැම්බර් 19 දින සිට 2018 ජුනි 12 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීමට සිදු වී තිබුණි.

විශ්වවිද්‍යාල විද්‍යායතනවල ක්‍රියාකාරීත්වය

විශ්වවිද්‍යාල වරම් අභිමිවන තාක්ෂණ විෂය හැදෑරූ සිසුන් වෙනුවෙන් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ජාතික වෘත්තීය සුදුසුකම 5 හා 6 සහිත පාඨමාලා පවත්වමින් මධ්‍යම මට්ටමේ තාක්ෂණිකයන් බිහිකිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල විද්‍යායතන 20 ක් පිහිටුවීමට සැලැසුම් කර තිබුණි. 2016 වර්ෂය වන විට රත්මලාන, කුලියාපිටිය, යාපනය, මාතර, අනුරාධපුර සහ බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතන 06 ක් පමණක් ආරම්භ කර තිබුණි. විශ්වවිද්‍යාල විද්‍යායතනවල අධ්‍යක්ෂවරුන් සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය අතහැර යාම සහ වරින්වර විද්‍යායතන අතර තාවකාලික ස්ථාන මාරුවීම් ලබා දී තිබුණි. මේ හේතුවෙන් අඛණ්ඩ සේවාවක් එක් විද්‍යායතනයක් වෙත සැපයීමට නොහැකි වීම මත එම විද්‍යායතනයන්හි පරිපාලන කටයුතු මෙන්ම ශිෂ්‍යන්ගේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි විනය පවත්වාගෙන යාම කෙරෙහි බලපෑම් ඇති වී තිබුණි. එසේම විද්‍යායතනයන්හි පරිපාලන කටයුතු හා මූල්‍ය කළමණාකරණ කටයුතු රජයේ පරිපාලන විධිවිධාන, චක්‍රලේඛයන්ට හා මූල්‍ය පරිපාටින්ට අනුකූලව සිදු කිරීම සඳහා විධිමත් මඟපෙන්වීමක් හා අධීක්ෂණයක් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හෝ අමාත්‍යාංශය මට්ටමින් සිදු කර නොතිබුණි. විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීයමයභාවය හා වෘත්තීය පරිචයන් ආරක්ෂා කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් විද්‍යායතනවල විනය පවත්වාගෙන යාමට නොහැකිවන ආකාරයේ තත්ත්වයන් නිර්මාණය වූ අවස්ථාවන් පැවතුණි. එසේම විද්‍යායතනයන්හි පවත්වාගෙන යනු ලබන ඩිප්ලෝමා පාඨමාලා සඳහා තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීම හා ප්‍රතීතනය කිරීම කළ යුතු වුවද, කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පවත්වනු ලබන පාඨමාලා 8ක් හැර අනෙකුත් විද්‍යායතනවල පාඨමාලා ප්‍රතීතනය කර නොතිබුණි. එසේම පාඨමාලාවන්හි තත්ත්ව සහතික වීම සඳහා විද්‍යායතනවල පවත්වනු ලබන පාඨමාලාවලට අදාළව විෂය මාලාව හා නිර්දේශිත අධ්‍යයන කාලපරිච්ඡේදය, ශිෂ්‍ය වාර්තා පොත්, දේශන සටහන්, දේශක කාර්යසාධන වාර්තා හා අඛණ්ඩ ඇගයීම් වාර්තා පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විද්‍යායතනයන්ට හඳුන්වා දී නොතිබුණු අතර විද්‍යායතන සඳහා අඛණ්ඩ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි පාඨමාලා 49 ක් සඳහා මුළු ශිෂ්‍ය ධාරිතාවය 1470 ක්

පමණ විය.කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ සිසුන් 1380 ක් බඳවාගෙන තිබුණු අතර ඉන් සිසුන් 245 දෙනෙකු පාඨමාලා අතහැර තිබුණි. කථිකාචාර්යවරුන් 51 ක්, ප්‍රදර්ශක 22 ක් හා උපදේශක 01 ක් ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවති අතර පුහුණු උපකරණ භාවිතය සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම්, යටිතල පහසුකම් නොමැතිවීමේ අවස්ථා විගණනයේ දී අනාවරණය විය. මේ හේතුවෙන් විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි ක්‍රියාකාරීත්වය විධිමත් පරිදි සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

පාඨමාලා සඳහා තත්ත්ව සහතික ලබාගැනීම

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා සුදුසුකම් ලබාගත් අය වෙත උසස් අධ්‍යාපන අවස්ථාවන් ලබා දීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එසේම තාක්ෂණික හා වෘත්තිය අධ්‍යාපනය සඳහා විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා දායක විම, විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා පිළිගත හැකි සුදුසුකම් ලැබූ මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන් සඳහා අධ්‍යාපන පාඨමාලා සැපයීම, ජාතික වෘත්තීය සුදුසුකම්ලත් අයට ඔවුන්ගේ නිපුණතා උසස් කිරීම සඳහා අවශ්‍ය පාඨමාලා ඉදිරිපත් කිරීම හා අඛණ්ඩ වෘත්තීමය සංවර්ධනය සඳහා ව්‍යාප්ති පාඨමාලා ඉදිරිපත් කිරීමද අරමුණු වී තිබුණි. එකී අරමුණු ඉටුකර ගැනීමට අදාළව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ප්‍රතීතනය ලබා ගැනීමටත්, මොරටුව, පේරාදෙණිය හා කොළඹ විශ්වවිද්‍යාල මගින් පාඨමාලා ප්‍රතීතනයන් ලබා ගැනීමටත් අමතරව විදේශීය පිළිගත් විශ්වවිද්‍යාලවලින් ප්‍රතීතනයන් ලබාගැනීමටත් තීරණය කර තිබුණි. නමුත් විශ්වවිද්‍යාලය පිහිටුවා වර්ෂ 07 ක කාලයක් ගත වී තිබුණත්, අපේක්ෂිත මට්ටමට උපාධි පාඨමාලාවල තත්ත්ව සහතික කරවා ගැනීමට විශ්වවිද්‍යාලයට හැකියාව ලැබී නොතිබුණි.

උපාධි පාඨමාලා පැවැත්වීම

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය 2010 වර්ෂයේදී විසින් සිසුන් බඳවා ගැනීම ආරම්භ කර තිබුණු අතර, පූර්ණ කාලීන පාඨමාලා 07ක් හා 2012 වර්ෂයේදී පූර්ණ කාලීන පාඨමාලා 08 ක් පවත්වා තිබුණි. 2012 වර්ෂයේ සිට පූර්ණ කාලීන පාඨමාලා සඳහා නව පාඨමාලා හඳුන්වා දී නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය වන විට ඉන් පාඨමාලා 05 ක් වෙනුවෙන් පමණක් සිසුන් බඳවා ගෙන තිබුණු අතර අනෙකුත් පාඨමාලා සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි.

2013 වර්ෂයේ සිට පූර්ණ කාලීන පාඨමාලාවලට අමතරව සති අන්ත පාඨමාලා වෙනුවෙන් ද සිසුන් බඳවා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විට පූර්ණ කාලීන පාඨමාලාවලට සාපේක්ෂව සති අන්ත පාඨමාලා වෙනුවෙන් සිසුන් බඳවා ගැනීමට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

ජාතික වෘත්තීය සුදුසුකම් ඇති පුද්ගලයින්ගේ ප්‍රවීණත්වය වැඩි දියුණු කර ගැනීම සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ ප්‍රධාන අරමුණක් වුවද, එම අරමුණ ඉටුකර ගැනීමට අදාළව සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා උපරිම ධාරිතාවයෙන් පවත්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ පීඨයන්හි පාඨමාලා 06 ක සිසුන් බඳවා ගැනීම වෙන් වෙන්ව සැලකිමේදී ඌන උපයෝජනය සියයට 23 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක පැවැතුණි.

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයට බඳවාගත් සිසුන්ගෙන් සැලකිය යුතු

ප්‍රතිශතයක් පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව පාඨමාලා 11 ක් සඳහා බඳවාගත් සිසුන් 342 දෙනෙකුගෙන් සිසුන් 98 දෙනෙකු වර්ෂය තුළ පාඨමාලා හැර ගොස් තිබුණි. පාඨමාලා වෙන් වෙන්ව සැලකීමේදී පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 12 ක සිට සියයට 67 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණවලින් පැවතිණි. ඊට හේතු සොයාබලා පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතට අනුව විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා පිළිගත හැකි සුදුසුකම් ඇති මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන් සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම විශ්වවිද්‍යාලයේ අරමුණක් වී තිබුණි. නමුත් ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලාව (National Diploma in Technical Teacher Education) හැර වෙනත් ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2015 වර්ෂයේදී සිසුන් බඳවා ගෙන නොතිබුණි. තවද 2016 වර්ෂය වෙනුවෙන් කිසිදු පාඨමාලාවක් සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි.

විශ්වවිද්‍යාලය මගින් 2013 වර්ෂයේ පවත්වනු ලැබූ ජාතික වෘත්තීය සුදුසුකම 05 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා 02 ක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ලබාගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් පාඨමාලා හැදෑරූ සිසුන් වෙත ගුණාත්මකභාවයෙන් යුත් උසස් පාඨමාලා ලබාදීමට විශ්වවිද්‍යාලය අපොහොසත්වී තිබුණි.

ඩිප්ලෝමා පාඨමාලා සමත් සිසුන් පිළිබඳ පරීක්ෂාවේදී පාඨමාලා 03 ක් හැර අනෙකුත් පාඨමාලා සමත් වීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවති අතර එය සියයට 07 ක සිට සියයට 47 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයන්ගෙන් පැවතුණි.

රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය

2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් 5,6,7 මට්ටමේ පාඨමාලා හා ඒ සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අරමුණු ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, පාඨමාලා ආරම්භ කර වර්ෂ දෙකක් ඉක්මවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අරමුණු ඉටුකර ගැනීමට හැකි වන පරිදි පාඨමාලා සංවර්ධනය කර ගෙන නොතිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ සිට ආරම්භ කර පවත්වාගෙන යන පාඨමාලා 09 ක් සම්බන්ධයෙන් 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) සහිත පාඨමාලා ප්‍රතීතනය කිරීම සිදුකළ යුතු අතර පාඨමාලා ප්‍රතීතනය ලබාගැනීම සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් අපේක්ෂිත පරිදි ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මකභාවයෙන් යුත් පාඨමාලා ලබාදීමට විද්‍යායතනයට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හැකියාව ලැබී නොතිබුණි.

විද්‍යායතනයේ සෑම පාඨමාලාවක් සඳහාම අවම වශයෙන් සිසුන් 30 දෙනෙකු බැගින් බඳවා ගැනීමට පහසුකම් පැවතිය ද, පාඨමාලා 06 ක් සඳහා ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව 16 ක සිට 26 ක් දක්වා වූ පරාසයක පැවතිණි. ඒ අනුව විද්‍යායතනය සතු සම්පත් ඵලදායී ලෙස උපරිම ධාරිතාවයෙන් පාඨමාලා සඳහා යොදාගෙන නොතිබුණි.

විද්‍යායතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 9 කින් පාඨමාලා 8 කට බඳවාගත් සිසුන් 219 දෙනෙකුගෙන් සිසුන් 30 ක් වර්ෂය තුළ පාඨමාලා හැර ගොස් තිබුණි. ඒ අනුව එක් එක් පාඨමාලාව වෙන් වෙන්ව සැලකීමේදී බඳවාගත් සිසුන්ගෙන් සියයට 7 ක සිට සියයට 33 ක් දක්වා වූ ප්‍රමාණයක් පාඨමාලා හැර ගොස් තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

විද්‍යායතනය විසින් පිළියෙල කරන ලද අධ්‍යයන කාල සටහන තුළ ඒ ඒ කාණ්ඩ සඳහා සිසුන්ගේ ප්‍රතිඵල නිකුත් කිරීමට සැලැසුම් කළ කාලපරිච්ඡේදයන් ඇතුළත් වී නොතිබුණු අතර, සමාසික විභාග 03 ක විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ කාල ප්‍රමාදය මාස 06 ක සිට මාස 12 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන (Skills Sector Development Programme)

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය සඳහා සමස්ථ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයම නියෝජනය වන පරිදි සත් අවුරුදු සැලැස්මක් මත ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන 2014 වර්ෂයේ සිට නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙමින් පැවැතුණි. වැඩසටහනෙහි සමස්ථ පිරිවැය රු.මිලියන 125,891 (ඇ.ඩොලර් මිලියන 961) ක් වී තිබුණි. මේ සඳහා අයවැය සහයක ක්‍රමය යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 100 ක් බැගින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) මඟින්ද, වැඩසටහනට අයත් ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් ජර්මන් රජයෙන් ඩොලර් මිලියන 15.4 ක් හා කොරියානු ආනයන අපනයන බැංකුව මගින් ඩොලර් මිලියන 26 ක් ලබා දීමට එකඟවී තිබුණි. වැඩසටහන සඳහා ඩොලර් මිලියන 200 ක මූල්‍ය හිඟයක් පවතින අතර එම මූල්‍ය හිඟය පියවා ගැනීම සඳහා වැඩසටහනෙහි කාර්යසාධනය පදනම් කරගෙන 2016 වර්ෂයේ හෝ ඊට පසු එළඹෙන වර්ෂවල තවත් ඇමරිකන් ඩොලර් මිලියන 100 ක ණය ආධාර සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාවය පලකර තිබුණි. සමස්ථ මූල්‍ය අවශ්‍යතාවයෙන් සියයට 54 ක් එනම් ඩොලර් මිලියන 519.8 ක් ශ්‍රී ලංකා රජය විසින් වැය කළ යුතුව තිබුණි.

විශේෂයෙන් හඳුනාගත් ක්ෂේත්‍රයන්ට අදාළව වියපැහැදම් සම්බන්ධ දර්ශක (Disbursement Link Indicators) 9 ක් පාදක කර ගෙන වැඩසටහන ක්‍රියාත්මක වන අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. මිලියන 15,372 ක විදේශ ණය ඇතුළුව එකතුව රු.මිලියන 36,819 ක් ඒ සඳහා වැයකර තිබුණි. එහෙත් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලිපියට අනුව 2016 වර්ෂය අවසන් වන විට ආසියානු සංවර්ධන බැංකුවෙන් හා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් එකතුව රු.මිලියන 20,016 ක් ප්‍රතිපූර්ණය කර ගත යුතුව තිබුණි.

මෙම වැඩ සටහන සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබීම

වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලිපියට අනුව එහි සමස්ථ පිරිවැය රු. මිලියන 125,891 ක් බව සඳහන්ව තිබුණද, එම මුදල උපයෝජනය වන ආකාරය දැක්වෙන සංයුක්ත සැලස්මක් වැඩසටහන වෙනුවෙන් සකස් කර නොතිබුණි.

සැලැසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම

2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ආසියානු සංවර්ධන බැංකු සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ මූල්‍ය ප්‍රතිපාදන මගින් රු.මිලියන 3,020 ක් වැයකර ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ වැඩසටහන් 42 කින් රු. මිලියන 1,279.6 ක් වැයකර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන් 12 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. මෙම වැඩසටහන් ඇතුළත්ව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ වැඩසටහන් වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 11,100 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 7,939 ක් හෙවත් සලසා තිබුණු සියයට 72 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

වැඩසටහන යටතේ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ අරමුණින් පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව (Public Private Partnership) අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය නිම වන විට විශ්වවිද්‍යාල විද්‍යායතන 05 ක් ආරම්භ කළ යුතුව තිබුණත් ඉන් විද්‍යායතන 03 ක් පමණක් ආරම්භ කර තිබුණි.

වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පරමාර්ථය තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ තත්ත්වය හා පිළිගැනීම ඉහළ නැංවීම වුවත්, අමාත්‍යාංශය යටතේ පවතින පුහුණු ආයතනවල 2016 වර්ෂයේ ක්‍රියාත්මක වූ පුහුණු පාඨමාලා 442 ක් ප්‍රතීතනය කර නොතිබුණි.

විශ්ව විද්‍යාල විද්‍යායතන සම්බන්ධ කාර්යසාධනය

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) තාක්ෂණවේදය විෂයධාරාව හදාරා ජාතික විශ්වවිද්‍යාල සඳහා ඇතුළත්වීමට නොහැකිවන සිසුන් සඳහා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල විද්‍යායතන 20 ක් දිවයින පුරා ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. එමෙන්ම 2015 වර්ෂය නිමවන විට ඉන් විද්‍යායතන 14 ක පුහුණු පාඨමාලා ආරම්භ කළ යුතුව තිබුණි. එහෙත් 2017 ජුනි මාසය අවසන් වන විටත්, විශ්වවිද්‍යාල විද්‍යායතන 06 ක් පමණක් පුහුණු පාඨමාලා ආරම්භ කර තිබුණි.

2016 වර්ෂයේ සිට මෙම විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා ඇතුළත් වන සිසුන්ගෙන් පාඨමාලා ගාස්තු අය නොකිරීමට අමාත්‍යාංශය විසින් තීරණය කර තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව පාඨමාලා සඳහා අයදුම් කරන සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණි. එමෙන්ම බඳවාගත හැකි සිසුන් 1470 කින් 1380 ක් ඇතුළත් කර ගෙන තිබුණි. එහෙත් වර්ෂය තුළ පාඨමාලා සඳහා ඇතුළත්වූ සිසුන්ගෙන් 245 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 168 න් 74 ක් හෙවත් සියයට 44 ක් පුරප්පාඩුව පැවති අතර එය 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 2 ක වැඩිවීමක් වී තිබුණි.

රත්මලාන හා බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා 2015 වර්ෂයේ මිලදීගත් පිළිවෙලින් රු.මිලියන 2.83 ක් හා රු.මිලියන 98.69 ක් වටිනා පුහුණු උපකරණ නියමිත පාඨමාලා ආරම්භ නොකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවැතුණි. රත්මලාන පුහුණු මධ්‍යස්ථානය සඳහා මිලදීගත් රු.මිලියන 7.31 ක් වටිනා පුහුණු

උපකරණ විද්‍යාගාරවලට අවශ්‍ය විදුලිය, ජලය හා විද්‍යාගාර ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මත තවදුරටත් නිෂ්කාර්යව පැවැතුණි. .

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කර තිබුණි. ගෝලීය රැකියා වෙළඳපොලෙහි අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලංකාවේ ක්‍රියාශීලී හා නිර්මාණශීලී පුහුණුව සපයන ප්‍රමුඛතම ආයතනය වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ දැක්ම වේ. තවද වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නවීන ක්‍රමවේදයන් හා තාක්ෂණයන් මගින් පුද්ගලයන් තුළ නිපුණත්වයන් සංවර්ධනය කරමින් ගෝලීය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලීම පිණිස පහසුකම් සැලසීම අධිකාරියේ ප්‍රධාන කාර්යය වේ. අධිකාරිය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරික්ෂණවලදී අනාවරණය වූ විගණන නිරික්ෂණ පහත දැක්වේ.

වෘත්තීය පුහුණුව සැලැසුම් කිරීම හා පුහුණුව ලබා දීම

2016 වර්ෂයේදී ක්ෂේත්‍ර 18 කට අයත් වූ පුහුණු පාඨමාලා 133 ක් යටතේ වැඩසටහන් 1952 ක් සඳහා ආධුනිකයින් 31537 ක් බඳවා ගෙන තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එහි සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කෙරෙණි. පසුගිය වර්ෂයන්හි උපදේශකවරයෙකු නොමැතිව වසා දමා තිබූ පාඨමාලා 2016 වර්ෂයේදී නැවත ආරම්භ කිරීම හා ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව 13 කින් වැඩිවීම ඒ සඳහා හේතු වී තිබුණි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ ආධුනික බඳවා ගැනීම් ඉලක්කය 35,175 ක සිට 35,460 ක් දක්වා සියයට 0.81 කින්ද, සත්‍ය බඳවා ගැනීම් 28,745 සිට 31,537 ක් දක්වා සියයට 9.7 කින් ද වැඩිවී තිබුණි.

රැකියාගත කිරීම

රැකියාගත කිරීමේ වැඩපිළිවෙල යටතේ සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියෙහි ලියාපදිංචි වී සිටි විදේශීය රැකියා, දේශීය රැකියා හා ස්වයං රැකියා වශයෙන් පුහුණුලාභීන් 6,052 දෙනෙකු 2016 වර්ෂයේදී රැකියා ගත කර තිබුණි. ඉන් දේශීය රැකියාගත කිරීම් ප්‍රතිශතය සියයට 84 ක් වි තිබුණි. රැකියාගත කිරීම්වල ප්‍රතිශතයක් ලෙස විදේශීය රැකියාගත කිරීම් ප්‍රමාණය සියයට 3 වැනි අවම මට්ටමක පැවැතුණි. මේ නිසා වෘත්තීය පුහුණුව ලබන ආධුනිකයන් විදේශීය වශයෙන් රැකියා සඳහා නැඹුරුවීම පහළ මට්ටමක පැවැතුණි.

රැකියාගත කිරීම් ක්ෂේත්‍ර අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලෙහි ඉහළම ස්ථානය විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රයට හිමිව තිබූ අතර එම ක්ෂේත්‍රයේ සමස්ත රැකියාගත කිරීම් ප්‍රමාණය 978 ක් වී තිබුණි. එම ක්ෂේත්‍රය සඳහා බඳවා ගැනීම්වල ප්‍රතිශතයක් ලෙස එය සියයට 29 ක් වි තිබුණි. නමුත් එම ක්ෂේත්‍රය සඳහා 2016 වර්ෂයේදී ආධුනික බඳවා ගැනීම් ප්‍රමුඛතා අනුව පස්වන ස්ථානය හිමිව තිබුණි.

නිෂ්කාර්ය වත්කම්

නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් යටතේ ඉදිකෙරෙමින් පවතින අහංගම, කුච්චවෙලි හා කරෙයිනගර් හෝටල් පාසල් සඳහා ව්‍යාපෘති අරමුදල් යටතේ 2015 හා 2016 වර්ෂ තුළ දී මිලදී ගෙන තිබූ රු. 19,087,138 ක් වූ පුහුණු උපකරණ ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් 2017 ජූලි 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

ඉදිකිරීම්

නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් යටතේ රු.මිලියන 279.52 ක ඇස්තමේන්තු වටිනාකමක් යටතේ කුච්චවේලි හි ඉදි කරන හෝටල් පාසලෙහි සහ අහංගම ඉදිකරන ආදර්ශ හෝටලයෙහි ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂයේදී නිමකිරීමට නියමිත වුවද, 2017 මාර්තු 31 දින වන විටත් එම කටයුතු නිම කර නොතිබුණි.

ව්‍යාපෘති අරමුදල් භාවිතා කරමින් අහංගම හා පොතුවිල් හි ඉදිකර තිබුණු ආදර්ශ හෝටල්, දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ශනය ලබා ගැනීමේ අරමුණින් ඉදිකර තිබුණි. වර්තමානයේදී එම හෝටල් වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ආදර්ශ හෝටල් ලෙස පවත්වා තිබුණත්, ඒ සඳහා අවශ්‍යය විශේෂඥ දැනුම, මානව සම්පත් හා ව්‍යාපාරික ඥාණයද අධිකාරිය සතුව නොපවතින බව නිරීක්ෂණය විය.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

ආධුනික බඳවා ගැනීම්

2016 වර්ෂයේදී මධ්‍යස්ථාන පාදක කරගත්, ජාතික ආයතන හා කර්මාන්ත පාදක කරගත් යනාදි වශයෙන් සියළු පුහුණු කටයුතු සඳහා ආධුනිකයින් 27,625 ක් බඳවා ගැනීමට ඉලක්කගත කර තිබුණි. අධිකාරියේ කාර්යසාධන වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේදී ආධුනිකයන් 31,947 ක් බඳවාගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 40 ක වර්ධනයක් ලෙසද ප්‍රකාශ වී තිබුණත්, එම බඳවා ගැනීම්වල ගොඩනැගිලි හා ඉදිකිරීම් විශේෂ පුහුණු වැඩසටහනක් සඳහා බඳවාගත් ආධුනිකයින් 9,250 ක්ද ඇතුළත් වී තිබීම නිසා සාමාන්‍ය බඳවා ගැනීම් 22,697 ක් පමණක් වී තිබුණි. .

සමාලෝචිත වර්ෂයේදී ජාතික ආයතන සඳහා බඳවා ගැනීමට ඉලක්ක ගත කර තිබූ ආධුනික සංඛ්‍යාව 1,535 ක් වී තිබුණත්, ආධුනිකයින් 1,373 ක් බඳවා ගෙන තිබුණි. එසේ බඳවා ගත් ආධුනිකයින්ගෙන් සියයට 10 ක් හෙවත් 139 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි. 2016 වර්ෂයේදී මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ෆිටර් (විශේෂ) හා පොත් බැඳුම්කරු යන පාඨමාලා (NVQ) සඳහා ආධුනිකයන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද කිලිනොච්චිය පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා 11 ක් සඳහා ආධුනික බඳවා ගැනීම්වල සාමාන්‍ය සියයට 57 ක් වී තිබුණි.

අවිධිමත් බඳවා ගැනීම්

කටුනායක ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවේ 2016 කණ්ඩායම සඳහා ආධුනිකයන් බඳවා ගැනීමේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලබාගත යුතු අවම කඩයිම් ලකුණු සංඛ්‍යාව ලබා නොගත් ආධුනිකයින් 29 දෙනෙකු පාලන අධිකාරිය විසින් අක්‍රමවත්ව බඳවා ගෙන තිබුණි.

ඉදිකිරීම් හා පුනරුත්ථාපන කටයුතු

කොළඹ දිස්ත්‍රික් කාර්යාලය තුළ අංග සම්පූර්ණ රැස්වීම් ශාලාවක් සකස් කිරීම සඳහා රු. මිලියන 2 ක් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදලින් වෙන්කර තිබූ නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් රැස්වීම් ශාලාව සකස් කර නොතිබුණි.

වර්ෂය තුළදී පුහුණු මධ්‍යස්ථාන 03 ක් ඇගයීම් මධ්‍යස්ථාන 03 ක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීමට රු.මි. 9.5 ක් ක්‍රියාකාරී සැලැස්ම මගින් වෙන් කර තිබුණද අදාළ උපකරණ මිලදී ගෙන නොතිබුණි.

ආපදා කළමනාකරණය

ස්වභාවික හා මිනිසා විසින් ඇති කරන ආපදා අවම කිරීම හා වැළැක්වීමට ඵලදායි ක්‍රියාමාර්ග ගැනීම තුළින් ජීවත්වීමට සුදුසු සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන අරමුණ වී ඇත. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ආපදා කළමනාකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- ස්වභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් ලිහිල් කිරීම, ප්‍රතිචාර දැක්වීම, ප්‍රතිසාධනය (Recovery) හා සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
- ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණය සැලැස්ම හා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සැකැසීම.
- ව්‍යසන ලිහිල් කිරීම, ප්‍රතිචාර දැක්වීම් හා ප්‍රතිසාධනය (Recovery) පිළිබඳ විදේශාධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- පාරිසරික අවදානම්වලට ඔරොත්තු දිය හැකි තාක්ෂණික ප්‍රමිතියකින් යුත් නිවාස තැනීම ප්‍රවර්ධනය කිරීම.
- නිවාස ඉදිකිරීම යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම.
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදු කිරීම.
- ස්වභාවික ව්‍යසන පෙරයීම් කිරීම (Forecasting of natural disasters) හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම.
- ස්වභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසනවලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර මානුෂීය සහන සේවා වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

ඉහත සඳහන් ආයතන විසින් කාර්යභාරය ඉටු කිරීමේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ආපදා විපත් සංඛ්‍යාව ඉහළයාම

සමාලෝචිත වර්ෂයේදී ස්වාභාවික ආපදා සංඛ්‍යාව 602 ක් වී තිබුණු අතර, ස්වාභාවික නොවන ආපදා සංඛ්‍යාව 84 ක් වශයෙන් එකතුව ආපදා 686 ක් සිදු වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේ එය පිළිවෙලින් 571 ක් හා 70 ක් වශයෙන් එකතුව ආපදා 641 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්වභාවික හා ස්වභාවික නොවන ආපදා සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී වැඩි වී තිබුණි. මෙම තත්ත්වය ඉකුත් වර්ෂ 4 සමඟ සැසඳීමේදී සිදු වී තිබුණු ස්වභාවික ආපදාවලින් 2014 වර්ෂයට පසු වැඩිම ස්වභාවික ආපදා සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී සිදු වී තිබුණි. එමෙන්ම ස්වභාවික නොවන ආපදා සංඛ්‍යාව ක්‍රමිකව වර්ධනය වෙමින් පවතින ස්වභාවයක් නිරීක්ෂණය විය. එම තත්ත්වය පහත සඳහන් රූපසටහන 23 හි දැක්වේ.

රූපසටහන 23 - සිදු වූ ආපදා ගණන
මූලාශ්‍රය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

රූපසටහන : 24 - ආපදාවලින් සිදු වූ මරණ ගණන හා අතුරුදහන්වූවන් ගණන
මූලාශ්‍රය :- ආපදා කළමාකරණ මධ්‍යස්ථානය

පසුගිය වර්ෂ 5 ක කාලය තුළ සිදු වූ ආපදාවලින් පුද්ගල මරණ සංඛ්‍යාව හා අතුරුදහන් වුවන් ගණන වාර්ෂිකව ඉහළ ගොස් තිබුණි. විස්තර ප්‍රස්ථාරය 24 හි දැක්වේ. ආපදා සංඛ්‍යාව හා පුද්ගල මරණ හා අතුරුදහන් වීම් සංඛ්‍යාව පසුගිය වර්ෂ 5 ක කාලය තුළ වර්ධනය වී තිබුණත් පූර්ණ ලෙස නිවාස හානිවීම් සංඛ්‍යාව හා අර්ධ වශයෙන් නිවාස හානිවීම් සංඛ්‍යාවේ අඩුවීමක් නිරීක්ෂණය විය. විස්තර ප්‍රස්ථාර 25 හි දැක්වේ.

ප්‍රස්ථාරය 25 - පසුගිය වර්ෂ 5 හි ආපදාවලින් සිදු වූ නිවාස හානිවීම්

ආපදාවලින් පීඩාවට පත් ජනතාවට සහනාධාර ගෙවීම

2016 අප්‍රේල් මාසයේ සිට ජාතික රක්ෂණ භාරය හරහා පශ්චාත් ආපදා වන්දි ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වූ අතර ඒ අනුව ස්වාභාවික ආපදාවන් හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාවට සහනාධාර ගෙවීමේ කටයුතු ජාතික රක්ෂණ භාරය වෙත පවරා තිබුණි.

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සම්බන්ධ නීතිමය රාමුව

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධ නීතිමය විධිවිධාන 2005 අංක 13 දරන ව්‍යවසන කළමනාකරණ පනත මඟින් සලසා තිබුණි. ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් අනාගත අභියෝගයන් ජය ගැනීම සඳහා ව්‍යවසන කළමනාකරණ

පනතේ ඇතුළත් වූ නීතිමය අවශ්‍යතාවය පුළුල් කිරීමේ අවශ්‍යතාවයන් මතුවී තිබුණු නමුත් ව්‍යවසන කළමනාකරණ පනත සඳහා 2013 වර්ෂයේදී යෝජනා කරන ලද සංශෝධන සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, ව්‍යවස්ථාපිත විධිවිධාන මත ස්ථාපනය කරන ලද ආයතනයක් නොවන අතර ඒ හේතුවෙන් පර්යේෂණ සංවිධානය මඟින් මහජනතාව වෙත නිකුත් කරනු ලබන නායයාම් අවදානම පිළිබඳ තක්සේරු වාර්තා සම්බන්ධයෙන් නීතිමය පිලිගැනීමක් නොතිබුණි. මේ හේතුවෙන් අනතුරු ඇගයීම් නොසලකා ඉදිකිරීම් සිදුකරනු ලබන පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට පර්යේෂණ සංවිධානයට හැකිවී නොතිබුණි.

ශ්‍රී ලංකාව තුළ සිදුවිය හැකි ව්‍යවසනයන් හඳුනා ගැනීම

2015 අංක 13 ව්‍යවසන කළමනාකරණ පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සිදුවිය හැකි ව්‍යවසනයන් 21 ක් හඳුනාගෙන තිබුණු නමුත් න්‍යෂ්ටික හා වෙනත් පිපිරීම් මඟින් සිදුවිය හැකි ආපදාවන්, මහජන උද්ඝෝෂණ කැරලි වැනි දෑ මඟින් වන ආපදාවන්, ව්‍යවසනයන් වශයෙන් හඳුනා ගෙන නොතිබුණි. තවද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂයේ ඉටුකරන ලද ආපදා අවදානම අවම කිරීමේ කටයුතු ගංවතුර, නායයාම් සහ නියඟය යන ආපදාවන් කිහිපයකට පමණක් සීමාවී තිබුණි.

ආපදා අවම කිරීමේ සැලැසුම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද ආපදා අවම කිරීම් පිළිබඳ සැලැසුම් තර්කානුකූල පදනමක් මත පිළියෙල කර නොතිබුණි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉකුත් වර්ෂ තුනක ක්‍රියාකාරී සැලැස්මට අනුව දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් කරන ලද ප්‍රතිපාදන සහ එම වර්ෂයන් තුළ සිදුවූ ආපදාවන් පිළිබඳ විස්තර පහත වගුව 31 හි දැක්වේ.

දිස්ත්‍රික්කය	2014			2015			2016		
	ව්‍යාපෘති සංඛ්‍යාව	වෙන්කරන ලද ප්‍රතිපාදන	සිදුවූ ආපදා සංඛ්‍යාව	ව්‍යාපෘති සංඛ්‍යාව	වෙන්කරන ලද ප්‍රතිපාදන	සිදුවූ ආපදා සංඛ්‍යාව	ව්‍යාපෘති සංඛ්‍යාව	වෙන්කරන ලද ප්‍රතිපාදන	සිදුවූ ආපදා සංඛ්‍යාව
		රු.මිලියන			රු.මිලියන			රු.මිලියන	
යාපනය	-	-	08	01	30.00	20	01	19.94	13
වවුනියාව	02	10.20	10	04	10.00	16	02	21.20	06
කිලිනොච්චිය	01	23.79	04	06	4.30	07	01	7.89	01
මුලතිව්	01	3.06	09	03	28.90	16	03	23.50	08
මන්නාරම	01	26.50	04	-	-	03	-	-	01
අනුරාධපුරය	02	1.40	07	03	12.45	03	05	27.80	04
පොළොන්නරුව	05	7.11	02	01	18.83	03		33.37	06
ත්‍රිකුණාමලය	02	34.00	08	04	7.00	05	02	5.27	07
මඩකලපුව	01	4.00	03	01	4.41	09	02	5.63	01
අම්පාර	02	5.00	02	02	6.68	06	-	-	01
හම්බන්තොට	51	163.45	08	40	150.34	19	-	-	05
මාතර	01	6.17	10	01	685.00	18	-	-	14
ගාල්ල	01	1.00	07	04	6.127	26	01	9.50	20
කළුතර	02	7.15	06	01	10.00	10	01	24.00	04
කොළඹ	02	10.30	16	-	-	39	01	8.00	12
ගම්පහ	02	10.50	08	-	-	04	01	483.20	11
පුත්තලම	06	13.55	08	04	23.08	10	04	32.27	08
කුරුණෑගල	01	59.58	13	02	76.80	16	49	153.23	04
මාතලේ	01	1.33	07	02	23.76	04	01	5.20	03
මහනුවර	03	11.52	22	02	50.00	16	03	7.36	06
නුවරඑළිය	05	4.38	56	04	7.82	53	04	12.77	22
කෑගල්ල	02	7.43	36	04	14.38	75	01	16.32	44
රත්නපුර	05	4.77	09	07	9.22	07	49	63.79	16
බදුල්ල	03	10.91	10	01	925.96	03	03	10.14	01
මොණරාගල	05	6.04	13	02	4.40	12	02	7.00	03

වගුව - 31 - ආපදා අවම කිරීමේ ව්‍යාපෘති හා ඒ සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන
මූලාශ්‍රය - ආපදා දත්ත

උක්ත සටහන අනුව ආපදා අවම කිරීමේ කටයුතු සඳහා 2014 හා 2015 වර්ෂවල හම්බන්තොට දිස්ත්‍රික්කයට ඉහළ ප්‍රමුඛත්වයන් ලබාදී තිබුණු අතර 2016 වර්ෂයේදී කුරුණෑගල හා රත්නපුර දිස්ත්‍රික්ක වලට ප්‍රමුඛත්වයන් ලබාදී තිබුණි. ස්වාභාවික ආපදා වැඩි වශයෙන් සිදුවී තිබුණු නුවරඑළිය, කෑගල්ල සහ ගාල්ල දිස්ත්‍රික්කවල ප්‍රමාණවත් ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සැලැසුම් කර නොතිබුණි.

ආපදා අවදානම හඳුනාගැනීම සඳහා භාවිතා කරනු ලබන උපකරණ

ශ්‍රී ලංකාවේ ආපදා අවදානම හඳුනා ගැනීම හා කාලගුණ අනාවැකි පල කිරීම සඳහා භාවිතා කරනු ලබන උපකරණ පද්ධතිය එලදායීව යොදා නොගන්නා බව විගණනයේදී නිරීක්ෂණය විය. විවිධ විදේශීය නියෝජිත ආයතන මඟින් ලබාදී තිබුණු උපකරණ ශ්‍රී ලංකාවේ දේශගුණික තත්ත්වයන්ට අනුකූල නොවීම, නිසි සැලසුම් සකස් කිරීමෙන් තොරව උපකරණ ලබාගැනීම සහ පැරණි හා යල් පැනගිය උපකරණ අනාවැකි පල කිරීම සඳහා යොදා ගැනීම වැනි හේතුන් නිසා අදාළ උපකරණ

පද්ධතිය කාර්යක්ෂමව උපයෝජන කිරීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ කර පහත දක්වා ඇත.

- 2006 වර්ෂයේ අයවැය යෝජනාවන් අනුව වෙන්කරනු ලැබූ රු.මිලියන 400 ක ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් රු.මිලියන 320 ක් වටිනා ඩොප්ලර් රේඩාර් පද්ධතියක්, ලෝක කාලගුණ විද්‍යා සංගමයෙන් මිලදී ගෙන 2011 වර්ෂයේදී දෙනියාය ප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විටත් විවිධ තාක්ෂණික ගැටළු හේතුවෙන් එය ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී රේඩාර් පද්ධතිය නිෂ්පාදිත ආයතනය විසින් 2010 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදයේදී සිදුකරන ලද ක්‍රියාත්මක කිරීමේ පළමු පරීක්ෂණය අසාර්ථක වී තිබුණු බවත්, දෙවන පරීක්ෂණයේදී එය සාර්ථකව ක්‍රියාත්මක වන බවට තහවුරු කරන ලද නමුත් එම පරීක්ෂණයට ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වූ නොතිබුණු බවත් නිරීක්ෂණය විය. රේඩාර් පද්ධතිය ආනයනය කිරීමෙන් පසු දීර්ඝ කාලයක් නිෂ්කාර්යව පැවතීම එම පද්ධතිය අක්‍රිය වීමට හේතුවී තිබුණි. 2016 ජනවාරි 29 දින රේඩාර් පද්ධතියට අයත් රු.මිලියන 8.14 ක් වටිනා උපාංග පිටස්තර පාර්ශ්වයන් විසින් සොරකම් කර තිබුණු බව වාර්තා වූ අතර 2017 අප්‍රේල් 21 දින පද්ධතිය ගලවා අළුත්වැඩියා කටයුතු සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ නිෂ්පාදන ආයතනය වෙත ආපසු යවා තිබුණු බවත් නිරීක්ෂණය විය.

- කාලගුණ විද්‍යා තොරතුරු ලබාගැනීම සඳහා භාවිතා කරනු ලබන රසදිය කාරක උපකරණ භාවිතය ලෝකයෙන් තුරන් වෙමින් පවතින අතර ඒ සම්බන්ධයෙන් ලෝක කාලගුණ විද්‍යා සංගමයේ නිර්නායක අනුගතවෙමින් ස්වංක්‍රීය කාලගුණ විද්‍යා උපකරණ පද්ධතියක් පිහිටුවීමට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 2008 – 2009 කාලය තුළදී පියවර ගෙන තිබුණි. මේ සඳහා ජපාන අන්තර් ජාතික සහයෝගීතා සංවිධානයක් ලැබී තිබුණු රු.මිලියන 570 ක ප්‍රදානයන් උපයෝගී කරමින් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 37 ක ස්වයංක්‍රිය කාලගුණ විද්‍යා උපකරණ ස්ථාපිත කර තිබුණි. මෙම පද්ධතිය මඟින් තොරතුරු ලබාගැනීම චන්ද්‍රිකා මාර්ගයෙන් හා දත්ත ලොගරයක් හරහා සිදුකිරීමට සැලැසුම් කර තිබුණු නමුත් 2016 වර්ෂය වන විට අදාළ චන්ද්‍රිකාව පෘථිවි කක්ෂයෙන් බැහැරව පැවති හෙයින් සැලසුම් කළ පරිදි තොරතුරු ලබාගත නොහැකි විය. එසේම, දත්ත ලොගරය හරහා ලැබිය යුතු තොරතුරු මඩකලපුව, පොතුවිල්, මාලිම්බඩ, තවලම, කොළඹ හා සිරිකඳුර යන ප්‍රදේශවල පිහිටා තිබුණු මධ්‍යස්ථානවලින් සමාලෝචිත වර්ෂය තුළ ලැබී නොතිබුණි. මෙම පද්ධතිය අඛණ්ඩව විවිධ අක්‍රියවීම්වලට භාජනය වෙමින් පැවති අතර, 2011-2016 කාල පරිච්ඡේදය තුළ පද්ධතිය නඩත්තු කිරීම සඳහා රු.මිලියන 73.12 ක් වැය කර තිබුණි.

- දිවයින වටා සුනාමි අනතුරු ඇගයීමේ කුළුණු 77 ක් පිහිටුවා තිබෙන අතර ඒවා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පාලනය කරනු ලැබේ. මෙම කුළුණුවලින් නිකුත් කරනු ලබන සංඥා චන්ද්‍රිකා තාක්ෂණය හා විද්‍යුත් තරංග මාලා ආධාරයෙන් සන්නිවේදනය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් 2017 මාර්තු මාසයේදී සිදුකරන ලද විගණනය අනුව, විවිධ තාක්ෂණික ගැටළු හේතුවෙන්

2017 ජනවාරි මාසය තුළදී මෙම කුළුණුවලින් චන්ද්‍රිකා තාක්ෂණය හරහා තොරතුරු ලැබී නොතිබුණු අතර 2017 මාර්තු මාසයේදී එම තාක්ෂණය හරහා තොරතුරු කුළුණු 30 කින් පමණක් ලබාදී තිබුණි. තවද, 2017 මාර්තු 31 දින වන විට කුළුණු 30 කට වැඩි සංඛ්‍යාවක් මඟින් විද්‍යුත් තරංග හරහා තොරතුරු ලැබී නොතිබුණි.

මානව සම්පත් කළමනාකරණය

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ වූ ආයතන සඳහා විශේෂඥ දැනුම සහිත පුද්ගලයින්ගේ හිඟය, එම ආයතනවල අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රබල බාධකයක්ව පැවතුණි. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සඳහා විද්‍යාඥ තනතුරු 104 ක් අනුමත කර තිබුණු නමුත් එහි ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් වූ විද්‍යාඥයින් සංඛ්‍යාව 77 ක් පමණක් විය. පැවරුම් පදනම මත වෙනත් විද්‍යාඥයින් 35 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණු නමුත් රාජකාරී කටයුතු සඳහා ඔවුන්ගේ වගකීම ප්‍රශ්නකාරී විය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 344 ක් වුවද, 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් තනතුරු 114 ක් පුරප්පාඩුව පැවතුණි.

ක්‍රීඩා කටයුතු

ක්‍රියාශීලි ජාතියක් ගොඩනැගීම හා ජාතික ප්‍රතිරූපය අන්තර්ජාතිකව ඉහළ නැංවීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තර ක්‍රීඩාව වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම ක්‍රීඩාවට අදාළ ආයතන ව්‍යුහය තුළින් අපේක්ෂා කරන කාර්යභාරය වී තිබුණි. එහි ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක්, ව්‍යවස්ථාපිත ආයතන 04 ක්, අරමුදලක් හා ක්‍රීඩා සංගම් 61 ක් විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- ක්‍රීඩා විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම සහ ඇගැයීම.
- ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනිම හා ක්‍රීඩා ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරිම.
- ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර් ජාතික වශයෙන් ගොඩනැගිම සඳහා ක්‍රීඩාව යොදා ගැනිමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසිමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධිකරණය සිදු කිරිම.
- ආයතනයන් අධික්ෂණය.

ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ක්‍රීඩා සංවර්ධනයට යටිතල පහසුකම් සංවර්ධනය කිරිම

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ක්‍රීඩාංගණ 11 ක් සහ ක්‍රීඩා සංකීර්ණ 10 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 1,348 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කර ක්‍රීඩා සංකීර්ණ, ග්‍රාමීය ක්‍රීඩා පිටි, පාසල් ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති 54 ක්, දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන 01 ක්, ජාතික ක්‍රීඩා කෞතුකාගාර 01 ක් හා පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 18 ක් ඇතුළත් වූ ව්‍යාපෘති 74 ක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා 2016 වර්ෂයේ දී රු.මිලියන 1,136.39 ක් වැයකර තිබුණි. ඉන් ව්‍යාපෘති 54 ක් අවසන් කර තිබුණු අතර ඉතිරි ව්‍යාපෘති 20 හි වැඩ අවසන් කර නොතිබුණි.

ග්‍රාමීය ක්‍රීඩාංගණ 50 ක් ඉදිකිරීම

පළාත් 09 ක් ආවරණය වන පරිදි ග්‍රාමීය ක්‍රීඩාංගණ 50 ක් ඉදිකිරීම තුළින් ග්‍රාමීය ක්‍රීඩකයින් සඳහා ක්‍රීඩා පහසුකම් ඇති කිරීමේ අපේක්ෂාව මත රු.මිලියන 320 ක් 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වර්ෂයේදී රු.මිලියන 59.2 ක අතිරේක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණු අතර මේ යටතේ ග්‍රාමීය ක්‍රීඩාංගණ 263 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 363.09 ක් වැයකර තිබුණි. ඉන් ක්‍රීඩාංගන 242 ක වැඩ අවසන් කර තිබූ අතර ඉතිරි ක්‍රීඩාංගණ 21 හි වැඩ අවසන් කර නොතිබුණි.

ක්‍රීඩා ශක්ති වැඩසටහන

ග්‍රාමීය ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා කෞශල්‍ය දියුණු කිරීම සඳහා දක්ෂතා ඇති ක්‍රීඩකයින් තෝරාගෙන ක්‍රීඩාවට යොමු කිරීම ක්‍රීඩා ශක්ති වැඩසටහන මගින් අපේක්ෂිත මූලික අරමුණ වී තිබුණි. වාර්ෂිකව ක්‍රීඩකයින් හඳුනා ගැනීමද ක්‍රියාත්මක කළ යුතු වේ. ක්‍රීඩා ශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 60 ක ප්‍රතිපාදනය සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 25.7 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 34.3 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එම ඉතිරි ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතියක උපයෝජනය කර තිබුණි. 2016 වර්ෂයට අදාළව ළමුන් සඳහා ගෙවිය යුතු පෝෂණ දීමනාව සහ පුහුණුකරු දීමනාව වශයෙන් එකතුව රු.මිලියන 11 ක් 2017 වර්ෂයේ ප්‍රතිපාදනවලින් වැය කර තිබුණි. 2016 වර්ෂයේදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඊට පෙර වර්ෂයේ තෝරාගත් ළමුන් මෙම වැඩසටහන තුළ රැඳී නොසිටි නිසා 2016 වර්ෂයේ මාර්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

ජාත්‍යන්තර තරඟවලින් ජයග්‍රහනය කිරිම සඳහා පාසල්වල ළමුන් පුහුණු කිරිම

අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 2016 වර්ෂයේදී දිවයිනේ සියලුම පාසල්වල 7 වන වසරේ ඉගෙනුම ලබන සිසුන් 75,000 ක් තෝරාගෙන එම ළමුන්ගේ ක්‍රීඩා කෞෂල්‍යයන් විද්‍යාත්මක පදනමකින් හඳුනාගෙන 2024 සහ 2028 වර්ෂවලදී පැවැත්වෙන ඔලිම්පික් තරඟ හා ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණය කිරීම සඳහා ක්‍රීඩා කෞෂල්‍යයන් සඳහා ප්‍රවේශය සහතික කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා වාර්ෂිකව රු.මිලියන 400 ක් අනුමත කර තිබුණි. 2016 වර්ෂයේදී රු.මිලියන 174 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 119.9 ක් පමණක් වැය කර තිබුණි. පුහුණුව සඳහා ළමුන් තෝරා ගැනීම 2016 වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

2016 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව සිදු කර තිබීම නිසා ක්‍රීඩා උපකරණ වර්ග 2 ක් මිලදී ගැනීමේදී අවස්ථා දෙකකදී රු.මිලියන 14.49 ක අවාසිදායක ගෙවීමක් සිදුකර තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ වාර්තා නිසි පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා ව්‍යාපෘතිය සඳහා ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමේදී එක් ලංසුකරුවකු වෙත එකතු කළ අගය මත බදු ලෙස රු.මිලියන 1.45 ක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

දේශිය හා ජාත්‍යන්තර වශයෙන් මළල ක්‍රීඩා උළෙල පැවැත්වීමට සරිලන පරිදි සියලු පහසුකම්වලින් සමන්විත වූ ජාතික සුගතදාස ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයක් ලෙස 1999.09.01 දින සිට ජාතික සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය නමින් ක්‍රියාත්මක කර තිබුණි. මෙම අධිකාරියේ 2016 වර්ෂයේ මුළු වියදම රු.මිලියන 363.35 ක් වූ අතර උපයා තිබුණු අදායම රු.මිලියන 82.52 ක ආදායමක් රැස්කර තිබුණි.

මෙම ක්‍රීඩා සංකීර්ණයේ ධාවන පථය 2012 වර්ෂයේදී රු.මිලියන 126 ක් වැය කර

ඉදිකර තිබුණි. නමුත් එම ඉදිකිරීම්වල ප්‍රමිතිය අවශ්‍ය තත්ත්වයේ නොතිබීම නිසා එය භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. 2016 සහ 2017 වර්ෂවලදී අවස්ථා දෙකකදී එකතුව රු.350,159 ක් වැය කර ලංසු කැඳවා තිබුණු අතර එම ලංසු ප්‍රදානයට එරෙහිව ඉදිරිපත් වූ අභියාචනයන් හේතුවෙන් ධාවන පථය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නොහැකි වී තිබුණි. මේ නිසා වර්ෂ 05 ක් මුළුල්ලේ ධාවන පථය භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. එමඟින් ක්‍රීඩාව නැංවීම සඳහා යොදාගත හැකිව තිබූ මෙම ක්‍රීඩාපිටිය තුළ ජාත්‍යන්තර තරඟ පැවැත්වීමේ දායකත්වය අහිමි වී තිබීමෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ පසු බෑමකටද හේතුවක් වී තිබුණි.

ජාතික සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සඳහා රු.මිලියන 9.107 ක් වැය කර LED ඩිජිටල් නාම පුවරු දෙකක් සවිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඉන් එක් නාම පුවරුවක් පමණක් ඉදිකර ඉතිරි මුදල වෙනත් ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා වැය කර තිබුණි.

මෙම ක්‍රීඩා සංකීර්ණය තුළ පිහිටි ක්‍රීඩා හෝටලය නවීකරණය කිරීම සඳහා රු.මිලියන 63 ක ඇස්තමේන්තුවක් උපදේශක සේවා සමාගමක් විසින් සකස් කර තිබුණද, උපදේශක සමාගම අනුමැතියකින් තොරව අදියර 03 ක් යටතේ එය නවීකරණය කිරීමට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) විසින් ඇස්තමේන්තුව ඛාණ්ඩ කිරීම හේතුවෙන් එකිනෙකට සබැඳි නවීකරණ කටයුතු නිම කිරීමට නොහැකි වීම නිසා ක්‍රීඩා හෝටලය අපේක්ෂිත පරිදි නවීකරණය කර නොතිබුණි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබාගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වන වගන්තිය ප්‍රකාරව උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව රීති සම්පාදනය කර අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කර බලාත්මක කළ යුතුව තිබුණි. ආයතනය පිහිටුවා වර්ෂ තුනක් ගත වී තිබුණද, එකී තහනම් උත්තේජක ලබා ගැනීමට එරෙහිව ක්‍රියා කිරීමට අදාළ රීති සකස් කර නොතිබුණි.

බලාත්මක කරන ලද නීති, රීති නොමැතිව 2014 වර්ෂයේදී තහනම් උත්තේජක භාවිතය සම්බන්ධයෙන් ලෝක තහනම් උත්තේජක රීති මාලාවන්ට පටහැනිව ක්‍රීඩිකාවකට දෙන ලද මාස 08 ක තරග තහනම මත ලෝක තහනම් උත්තේජන මර්දන නියෝජ්‍යායතනය අන්තර් ජාතික බේරුම්කරන අධිකරණයෙන් නඩුවක් පැවරීමෙන් පසු ප්‍රංශ ෆෑන්ක් 5305 ක් හෙවත් රු.795,750 තුළ බේරුම් කරන ගාස්තු ගෙවන ලෙස අධිකරණය නියෝග කර තිබුණි.

ජාතික ක්‍රීඩා අරමුදල

2016 වර්ෂයේදී ජාතික ක්‍රීඩා අරමුදලේ සමස්ථ ආදායම රු. මිලියන 58.4 ක් වූ අතර සමස්ථ වියදම රු. මිලියන 119.3 ක් වී තිබුණි. දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ ජයග්‍රහක ක්‍රීඩකයන් සඳහා උපහාර දැක්වීම වෙනුවෙන් ඉන් රු. මිලියන 95.8 ක් වැය කර තිබුණි. මේ සඳහා අරමුදල් සපයා ගැනීමට අරමුදලේ ස්ථාවර තැන්පතුවලින් රු.මිලියන 63.3 ක් ලබා ගෙන තිබුණු අතර එම ස්ථාවර තැන්පතු කල්පිරීමට පෙර ආපසු ගැනීම නිසා අරමුදලට රු.440,228 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

ක්‍රීඩා සංගම් නියාමනය

ක්‍රීඩා සංගම් නියාමනය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ සිදු වන ප්‍රධාන කාර්යභාරයක් වේ. 2016 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි ක්‍රීඩා සංගම් 61 ක් අතරින් 2013, 2014 සහ 2015 වර්ෂවලට අදාළව පිළිවෙලින් ක්‍රීඩා සංගම් 19 ක, 18 ක සහ 29 ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට වර්ෂ 2 ක පමණක කාලයක් ප්‍රමාද කර තිබුණි. තවද 2016 වර්ෂයේදි ක්‍රීඩා සංගම් 47 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 226.97 ක් ලබා දී තිබුණි. ක්‍රීඩා සංගම් නියාමනයේදී ඒවායේ ගිණුම් කටයුතු විධිමත්ව පිළියෙල කිරීමේ අත්පොත යාවත්කාලීන කර නොතිබුණි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුව සඳහා වර්ෂ දෙකක කාලයක් සඳහා පත්වී සිටින සභාපතිවරයා ඇතුළු විධායක කමිටු සමාජිකයන් 09 දෙනකු සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් යාවජීව ලෙස අධ්‍යක්ෂකවරු වශයෙන් පත්වෙමින් ඇපයෙන් සීමිත සාමාගමක් පිහිටු වීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් රු.මිලියන 10.24 ක් ගෙවා තිබුණි. 2016 වර්ෂය අවසන් වන විටත් එම මුදල පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිල ලාංඡනය උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පමණක් ආදායම් ඉපයිය හැකිව තිබුණත්, ඊට පටහැනිව එම ලාංඡනය උපයෝගී කර ගනිමින් උක්ත සමාගමට ආදායම් ඉපයීමට අවස්ථාව සලසා ගෙන තිබුණි.

ගාල්ල මහ නගර සභාවෙන් ලැබිය යුතුව තිබුණු රු.මිලියන 5.59 ක් 2016 වර්ෂය වන විටත් පැවැති අතර, එම ලැබිය යුතු මුදල ක්‍රිකට් තරඟාවලි ප්‍රවේශ පත්‍ර මත වූ විනෝද බදු ගෙවීමේදී හිලව් කර තිබුණි. නැවත වරක් එම මුදලම ලැබී තිබුණද, එය ආපසු භාර නොදී ගෙවිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනය ඉදිකිරීමට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු රු.මිලියන 2,187.28 ක් වගකීම් හා ඊට අදාළ වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් වලින් ඉවත් කිරීමට ඇති හැකියාව තහවුරු කර ගැනීම සඳහා ආයතන දෙකකින් නිර්දේශ ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 2.40 ක වෘත්තීය ගාස්තු ලෙස ගෙවා තිබුණද, එසේ ගෙවීම් කළ නොහැකිවීම නිසා අදාළ වියදම නිෂ්කාර්ය වී තිබුණි.

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයේ මුළු ආදායම රු.මිලියන 168.32 ක් හා මුළු වියදම රු. මිලියන 164.32 වූයෙන් රු. මිලියන 3.99 ක අතිරික්තයක් පැවතුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂකව සියයට 8.5 කින් පිරිහී තිබුණි.

ඉකුත් වර්ෂයේදී සංගමයේ මූල්‍ය ප්‍රකාශනවල නිරීක්ෂණය වූ ගිණුම්කරණ සම්බන්ධව අඩුපාඩු හේතුවෙන් විගණන වාර්තාවේ මතය වියාචනය කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදීද අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හා ගිණුම් ශේෂ අතර පැවති නොගැලපීම් හේතුවෙන් වාර්තාවේ මතය වියාචනය කර ඇත.

ශ්‍රී ලංකා රග්බි පාපන්දු සම්මේලනය

ක්‍රීඩා සංගම් නිලවරණය සඳහා අයදුම් කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් වූ වගන්තියක් ඉවත් කිරීමේ අපේක්ෂාවෙන් රග්බි පාපන්දු මණ්ඩල සංගම් නිලධාරියෙකු විසින් නීතිමය ක්‍රියා මාර්ග ගැනීම වෙනුවෙන් 2015 හා 2016

වර්ෂ දෙක තුළ දී රු.මිලියන 1.93 ක් වැයකර තිබුණි.

ජාත්‍යන්තර ජයග්‍රහණ

ක්‍රීඩාව තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැඟීම සඳහා නව ක්‍රම උපාය මාර්ගයන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද ජාත්‍යන්තර තරඟාවලි 28 ක් තුළින් ලබා ගත් පදක්කම් එකතුව 371 ක් වී තිබුණි. එය පිළිවෙලින් රන් 85 ක්, රිදී 122 ක් හා ලෝකඩ 164 කින් සමන්විත වුවද, සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව පිළිබඳ දත්ත දෙපාර්තමේන්තුව තුළ ලේඛන ගත කර නොතිබුණි.

කාන්තා හා ළමා කටයුතු

කාන්තා හිංසනය හා ළමා අපයෝජනය නිදහස් සමාජයක් ඇතිකරලිම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. එම අපේක්ෂාව ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව ඇත.

- කාන්තා හා ළමා කටයුතු විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- රාජ්‍ය කටයුතුවලදි තීරණ ගැනිම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ නියෝජනය වැඩි කිරිම සඳහා ක්‍රමෝපායන් සැකැසිම සහ ක්‍රියාත්මක කිරිම.
- ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තා මූලික ගෘහ කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කර ගනිමින් කාන්තාවන් සවිබල ගැන්විම සඳහා අවශ්‍ය පියවර ගැනිම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඇති කිරිම.
- කාන්තා හා ළමා හිංසනය වැළැක්විම සඳහා නිති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරිම හා ක්‍රියාත්මක කිරිම.
- කාන්තා හා ළමා කටයුතුවලට අදාළ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම.
- කාන්තා හා ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම.
- ශාරිරක හා මානසික වශයෙන් නිරෝගි දරුවෙකු ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරිම.
- අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම්, ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලැපෙන සේ උසස් මට්ටමට පමුණුවා, සැලසුම් වැඩසටහන් හා ව්‍යාපාති සැකැසිම හා ක්‍රියාත්මක කිරිම.
- සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම.

ඉහත සඳහන් කාර්යභාරය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 කින් ඉටු කරනු ලබයි. එම කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

අමාත්‍යාංශය විසින් පිළියෙල කළ නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වූ අතර, ඒ සඳහා අමාත්‍යාංශය විසින් සම්පාදනය කළ හා සකස් කළ නීති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කර නොතිබුණි.

සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ල වැඩසටහන සඳහා රු.මිලියන 7,500 ක් ද, කිරි විදුරුව වැඩසටහන සඳහා රු.මිලියන 128 ක් ද වශයෙන් සුභසාධන වැඩසටහන් සඳහා එකතුව රු.මිලියන 7,628 ක ප්‍රතිපාදන

අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී පහත සඳහන් අඩුපාඩු ආවරණය වී තිබුණි.

- **ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබාදීමේ වැඩසටහන**

ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහන සඳහා දුන් රු.මිලියන 7,500 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 5,746 ක් වැය කර තිබුණි. පෝෂණ මල්ලක් ලබා දීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සිදුකළ වියදමවල එකතුව රු.මිලියන 4,354 ක් බව ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් තහවුරු කර තිබුණි. අමාත්‍යාංශය විසින් වාර්තා කර තිබුණු වියදම හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් තහවුරු කළ වියදම අතර රු.මිලියන 1,392 ක වෙනසක් අනාවරණය විය. එම වෙනස හඳුනාගෙන අදාළ නිවැරදි කිරීම් කර නොතිබුණි.

- **කිරි විදුරුව වැඩසටහන**

වයස අවුරුදු 2ක සිට අවුරුදු 5 ක් දක්වා දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමෙන් පෙර පාසල් ළමුන් සඳහා කිරි විදුරුවක් ලබා දීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණි. පෝෂ්‍යදායි වැඩිහිටි ආහාරවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු බැවින් සහ කිරි මිලි ලීටර් 100 ක මිලි ලීටර් 87.5 ක් ජලය අඩංගු බැවින් මෙම වැඩසටහනින් අපේක්ෂිත පෝෂණ මට්ටම් ඉහළ නැංවීමක් සිදු නොවන බව මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්ෂක විසින් පෙන්වාදී තිබුණි. නමුත් එම උපදේශය කෙරෙහි සැලැකිල්ල යොමු නොකර කිරි විදුරුව වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රු.මිලියන 127.9 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 106.43 ක් වැය කර තිබුණි.

චක්‍රීය ණය වැඩසටහන

ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය විසින් 1990 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු. මිලියන 93 ක් ලබා දෙමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 304 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව කොට්ඨාශ 274 ක විස්තර පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම තොරතුරු අනුව, එකී කොට්ඨාශවලට ලබා දී තිබූ එකතුව රු. මිලියන 85.46 කින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 51 ක ශේෂයක් බැංකු ගිණුම්වල රඳවා ගෙන තිබුණි. ඒ අනුව මෙම වැඩසටහන චක්‍රීය ණය වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණි.

කාන්තා රැකවරණ මධ්‍යස්ථාන

කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2015 වාර්තාවට අනුව ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් සියයට 60 කට වඩා ගෘහස්ථ හිංසනයට ලක් වී තිබුණි. එම තත්ත්වය වළක්වාලීමට ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත නීතිගත කර වින්දිතයින් හඳුනා ගෙන ඔවුන්ට රැකවරණය ලබා දීමත්, වෙළඳාමට ගොදුරු වූ කාන්තා හා ළමා වින්දිතයන්ට රැකවරණය ලබා දීමත් අරමුණු කර ගෙන කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවා තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂයේදී හා 2017 මුල් මාස 03 ක් ඇතුළත කාන්තා හිංසනය හා ළමා අපචාර 1,251 ක් සිදු වූ බව පුවත්පත්වල වාර්තා වී තිබුණි. රත්මලාන රැකවරණ මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ වින්දිතයන් 15

දෙනෙකුට රැකවරණය ලබා දී තිබූ අතර, මීරිගම රැකවරණ මධ්‍යස්ථානයේ කිසිදු වින්දිතයකු ඉදිරිපත් වී නොතිබුණි.

2015 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ රු.මිලියන 10.57 ක් වැය කරමින් ඉදිකළ රැකවරණ මධ්‍යස්ථානය 2017 ජූලි 31 දින වන විටත් අදාළ කාර්ය සඳහා යොදවා ගෙන නොතිබුණි. මහනුවර කාන්තා රැකවරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට රු.මිලියන 10 ක් 2015 ජූලි 17 දින ප්‍රාදේශීය ලේකම් වෙත යවා තිබුණි. නමුත් එම මධ්‍යස්ථාන ඉදිකළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම මධ්‍යස්ථානවල අඩුපාඩු සහ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පත්කර තිබුණු අනුකමිටුව කිසිදු අවස්ථාවක රැස්වී නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳ පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීම පිළිබඳ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 66 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ඉන් රු.මිලියන 37 ක් වැයකර තිබුණි. ළමා මව්වරුන්, සයිබර් අපරාධ හා කාන්තා හිංසනය පිළිබඳව හා වතුකරයේ කාන්තාවන්ට සිදුවන හිංසනය යනුවෙන් පර්යේෂණ තුනක් පෞද්ගලික ආයතන දෙකක් ලවා සිදු කර ඒ සඳහා රු. මිලියන 3.65 ක් වැය කර තිබුණි. 2016 මැයි මාසයේ දී එම වාර්තා ලැබී තිබුණත්, එම වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා නියෝජනය වැඩි කිරීම

ඉකුත් වර්ෂවලදී රු.මිලියන 6 ක් ද, සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 0.67 ක් ද වැය කරමින් දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය ප්‍රවර්ධනය කිරීමේ සය මාසික පාඨමාලා 5 ක් පවත්වා සිසුන් 141 කට සහතික පත් පදානය කර තිබුණි. ඉන් දේශපාලනයට අවතීරණ වී කටයුතු වල නිරත වන්නන් පිළිබඳ පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් ජාතික ප්‍රතිපත්තින් හා ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව සියලුම ළමුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථා උදා කර දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. සමාලෝචිත වර්ෂයේදී දෙපාරතමේන්තුව විසින් සිදු කළ කාර්යයන් සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත දැක්වේ.

ළමුන්ගේ අයිතාවාසිකම් හා ළමා නිවාස අධීක්ෂණය

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා නීති සම්පාදනය කිරීමේ කාර්යභාරය සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි.
දෙපාර්තමේන්තුව විසින් ළමා නිවාස 200 ක් අධීක්ෂණය කිරීම සඳහා රු.මිලියන 5 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් ළමා නිවාස 165 ක් අධීක්ෂණය කර තිබුණි. එහෙත් අධීක්ෂණ

වාර්තා හා නිරීක්ෂණ වාර්තා ලබා ගෙන ඉදිරි පියවරයන් ගෙන නොතිබූ බැවින්, අධීක්ෂණය කිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුවට ලැබී තිබූ ළමා අපයෝජන පැමිණිලි සංඛ්‍යාව 11,054 ක් වූ අතර, එයින් පැමිණිලි 7,031 ක් සඳහා පූර්ණ කාලීන විසඳුම්ද, පැමිණිලි 2,419 සඳහා කෙටි කාලීන විසඳුම් ද ලබා දී තිබුණි. පැමිණිලි 53 ක් සම්බන්ධව විසඳුම් ලබා දී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී පැමිණිලි 1,551 ක් වෙනත් ආයතන වෙත යොමු කර තිබූ අතර, එම පැමිණිලි සඳහා විසඳුම් ලැබීම සම්බන්ධව පසුවිපරම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ළමා සංවර්ධන අරමුදල

ළමා සංවර්ධන අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ යුධ වාතාවරණය හා වෙනත් ස්වභාවික ආපදාවන් නිසා තම දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වූ දරුවන්ට මෙන්ම ආර්ථික දුෂ්කරතා නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට හා සහජ කුසලතා හා වෙනත් දක්ෂතා වර්ධනය කර ගැනීමට ද නොහැකි වූ ශ්‍රී ලාංකීක දරුවන්ට මූල්‍යමය ආධාර ලබා දීමට වේ. 2014 ජනවාරි 24 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කොඩි අලෙවියෙන් ලැබෙන මුදල් උපයෝගි කර ගනිමින් අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් වැඩසටහන් වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කොඩි අලෙවියෙන් හා ස්ථාවර තැන්පත් ආයෝජන මඟින් ලැබුණු එකතුව රු.මිලියන 1.99 ක්ද ඇතුළත්ව වර්ෂය අවසානයේ ලැබී තිබුණු රු.මිලියන 4.74 කින් කිසිදු ළමයෙකුට ආධාර මුදල් ගෙවීමක් සිදුකර නොතිබුණි.

ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්ති නීතිගත කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා වර්ෂ 19 ක් ගත වී තිබුණත්, ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත කිරීමට සමාලෝචිත වර්ෂයේ දීද අපොහොසත් වී තිබුණි.

සේව් ද චිල්ඩ්‍රන්ස් (Save the Children) ව්‍යාපෘතිය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සේව් ද චිල්ඩ්‍රන්ස් (save the children) ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 23 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 10 ක් ළමා රක්ෂක අධිකාරිය වෙත 2016 අගෝස්තු 24 දින ලබා දී තිබුණද අධිකාරිය විසින් ඉන් රු.මිලියන 8 ක් පමණක් ඒ සඳහා උපයෝජනය කර තිබුණි.

පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම

2016 වර්ෂයේදී ජාතික ළමා රක්ෂක අධිකාරිය වෙත පැමිණිලි 9,540 ක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් පැමිණිලි 2,845 ක් පමණක් විසඳා තිබුණි. ඒ අනුව ලැබුණු පැමිණිලිවලින් සියයට 70 ක් විසඳා නොතිබුණි. 2011 – 2015 කාලය තුළ ලැබී තිබූ පැමිණිලි 48,417 කින් සියයට 51 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් විසඳා නොතිබුණි. අධිකාරිය වෙත වසරක් පාසා ලැබෙන පැමිණිලිවලට සම්බන්ධ තොරතුරු රැස්කර වාර්තා කිරීමට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරින්ගේ ඇති අකාර්යක්ෂමතාවය, තොරතුරු කැඳවීම් හා විමර්ෂණ කටයුතු පිළිබඳ පසුවිපරම් නොකිරීම සහ නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම යනාදිය නිසා නොවිසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වී තිබුණි.

ළමා ආරක්ෂාව පිළිබඳව දැණුවත් කිරීම

ළමා ආරක්ෂාව පිළිබඳ ළමයින්ව දැනුවත් කිරීම යන තේමාව යටතේ තත්පර 15 ක කාලයක් තුළ විකාශනය කිරීම සඳහා සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන් දැන්වීම් 09 ක් නිෂ්පාදනය කිරීමට පෞද්ගලික ආයතනයක් වෙත රු.මිලියන 4 ක් ජාතික ළමා රක්ෂක අධිකාරියා විසින් ගෙවා තිබුණි. එහෙත් ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත්වීමට ප්‍රමාණවත් පණිවිඩයක් එම දැන්වීම් තුළින් ලබා දී නොතිබුණි. නමුත් රූපවාහිනි, ගුවන්විදුලි මාධ්‍ය මඟින් විකාශනය කිරීමට රු.මිලියන 17.62 ක් වැය කර තිබුණි.

උපදේශක සේවා ලබාදීම

සමාලෝචිත වර්ෂයේ දී උපදේශන සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන 2.43 ක් පුද්ගලයන් 04 දෙනෙකු වෙත ගෙවා තිබුණත්, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් එම උපදේශන වාර්තා ලබා ගෙන එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව තුළ ඉහළ ගුණත්වයෙන් යුත් මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ අරමුණින් එක්සත් ජනපද ඩොලර් මිලියන 50 ක ලෝක බැංකු ණය ආධාර යටතේ මෙ ව්‍යාපාතිය ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 473 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු. මිලියන 115 ක් පමණක් වැය කර තිබුණි. මෙහිදී මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 4 ක් ඉදිකිරීමට රු.මිලියන 6 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ඉදිකිරීම් කටයුතු ඉටු කර නොතිබුණි. වැවිලි මානව සංවර්ධන භාරය යටතේ වැවිලි ක්ෂේත්‍රයේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 28 ක් ඉදිකිරීමට රු. මිලියන 112 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒවායේ ඉදිකීම් කටයුතු අවසන් කර නොතිබුණි. තවද, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 35 ක අලුත්වැඩියාව සඳහා හා සෙල්ලම් මිදුල් 77 ක් අලුත්වැඩියා / ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්දී තිබූ අතර, පිළිවෙලින් ඉන් මධ්‍යස්ථාන 23 ක් හා 46 ක කටයුතු අවසන් කර නොතිබුණි.

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත සිදුවන හිංසනය වැලැක්වීමේ ව්‍යාපෘතිය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනය වැලැක්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ ලබා දී තිබූ රු.මිලියන 78 කින් රු.මිලියන 38.36 ක් වැය කර ළමා කටයුතු, ආපදා කලමණාකරණ, ආර්ථික සංවර්ධන, අධ්‍යාපන, විදේශ, සෞඛ්‍ය, අධිකරණ, මාධ්‍ය, බලගැන්වීම් හා නිවාරණ යන අංශ ඒකාබද්ධ කර (2016 – 2020) පස් අවුරුදු සැලැස්මක් පිළියෙල කර තිබුණි. එහෙත් 2017 ජූලි මාසය වන විටත් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව වාර්තා වී නොතිබුණි.

සංචාරක කටයුතු

ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම මගින් ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උදා කිරීම තුළින් ආර්ථිකයට ඉහළ විදේශ විනිමයක් ඉපයීම සංචාරක කටයුතු අංශයේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා සංචාරක සංවර්ධනය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- සංචාරක සංවර්ධන කටයුතු පිළිබඳ විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගැයීම.
- සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම.
- සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම හා නියාමන කටයුතු කිරීම.
- විවේකය ගත කිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

සංචාරකයින්ගේ පැමිණීම හා විදේශ විනිමය ඉපැයීම

මනස්කාන්ත වෙරළවල්, හිතවාදී සහ මිත්‍රශීලි ජනයා සමඟ පොහොසත් ස්වභාව ධර්මය, සංස්කෘතිය හා අපූර්වත්වය මුසුව විශ්ව සංචාරකයන්ගේ මනස්කාන්තම ස්ථානය ලෙස ආසියානු සංචාරක සංකේතය වශයෙන් තම ප්‍රතිරූපය වඩවා ගනිමින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 512,293 ක විදේශ විනිමයක් ශ්‍රී ලංකාවට දායදකරමින් සංචාරකයන් 2,050,832 ක් පැමිණ තිබුණි.

රටක් වශයෙන් ගත් කළ සංචාරක කර්මාන්තයෙන් ශ්‍රී ලංකාව බලාපොරොත්තු වන්නේ ඉහළ විදේශ විනිමය ඉපැයීමක් වන අතර 2016 වර්ෂයේදී මෙම කර්මාන්තයෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 3,518.5 ක ආදායමක් උපයා තිබුණි.එම ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 18.1 ක ඉහළ වර්ධනයක් ලෙස සඳහන් කළ හැකිය.

2016 වර්ෂයේදී සංචාරක කර්මාන්තය යහපත් ක්‍රියාකාරීත්වයක් පෙන්වමින් සංචාරක පැමිණීම මිලියන 2 ක් වූ අතර සංචාරක ව්‍යාපාරය සඳහා වූ ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ යාම, යටිතල පහසුකම් සංවර්ධනය, නවතම සංචාරක ආකර්ෂණයකින් රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය මඟින් සිදුකරන ලද ප්‍රවර්ධන වැඩසටහන් මෙම සංචාරක පැමිණීම ඉහළ යාමට හේතු විය. කෙසේ වෙතත් 2016 වර්ෂයේ විදේශීය සංචාරකයින්ගේ පැමිණීමේ ඉලක්කය වූ මිලියන 2 ක ප්‍රමාණයට ලඟාවීමට හැකි වී තිබුණු නමුත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පැමිණීමේ වර්ධන වේගය 3.72 කින් අඩු වී තිබුණි.

ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රධාන කලාප බහුතරයක සංචාරක පැමිණීම වර්ධනය විය. ඒ අනුව නැගෙනහිර ආසියාවෙන් සියයට 17.2 ක්ද, මැදපෙරදිග කලාපයෙන් සියයට 6.5 ක්ද, බටහිර යුරෝපයෙන් සියයට 16.5 ක් හා දකුණු ආසියාවෙන් සියයට 11.8 ක් වශයෙන් ප්‍රමාණාත්මක වැඩිවීමක් දක්නට

ලැබුණි. එමෙන්ම රටක් වශයෙන් වැඩිම සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණ තිබුණේ ඉකුත් වර්ෂයේදී මෙන් ඉන්දියාවෙනි. එම ප්‍රමාණය 356,729 කි. මෙම වර්ෂයේ දී ඊළඟ ආකර්ෂණීයම පැමිණීම වැඩි වී තිබුණේ මහජන චීන සමූහ ආණ්ඩුවෙනි. එම ප්‍රමාණය 271,577 ක් වුවත්, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 26.4 ක වැඩි වීමකි. විස්තර රූපසටහන 26 හි දැක්වේ.

රූපසටහන 26 විදේශීය සංචාරකයින්ගේ පැමිණීම
මූලාශ්‍රය :- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික සංඛ්‍යාව වාර්තාව - 2016

විදේශීය සංචාරක පැමිණීම ඉහළයාම මෙන්ම සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන ඉහළ යාම සංචාරක ඉපැයුම් වර්ධනයවීමට ප්‍රධාන සාධකයක් ලෙස සඳහන් කළ හැකිය. 2016 වර්ෂයේදී සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 168.2 ක් වූ අතර එම ප්‍රමාණය 2015 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 164.1 ක් විය. ඒ අනුවද සංචාරක ඉපයීම් කිසියම් අනුපාතයකින් ඉහළ යාමටද මෙය බලපා තිබුණි. එමෙන්ම සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන 2016 වර්ෂයේ දින 10.2 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී දින 10.1 ක් විය. එහෙත් 1987 වර්ෂයේ සංචාරකයෙකු ශ්‍රී ලංකාවේ ගත කරන ලද සාමාන්‍ය දින ගණන 13.2 ක සමඟ සැසඳීමේදී එම ඉලක්කයට ළඟා වීමට සමාලෝචිත වර්ෂයේදීද නොහැකි වී තිබුණි.

හාපර් බසාර් සඟරාව (එක්සත් රාජධානිය) 2016 දී උණුසුම් චාරිකා ලැයිස්තුවේ මෙම වර්ෂයේ අත් නොහැරිය හැකි ගමනාන්තයන් යන වර්ගීකරණ අංක 03 යටතේ ශ්‍රී ලංකාව පෙළ ගස්වා තිබුණි. ශ්‍රී ලංකාවට මෙම තත්ත්වයන් ලබා ගැනීමට හා ලෝක සංචාරක කර්මාන්තයේ උච්චතම ස්ථානයට රැගෙන යාමට 2016 වර්ෂයේ සංචාරක සංවර්ධන අරමුදලෙන් රු.මිලියන 3,637 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රමාණය 2016 වර්ෂයේදී රු.මිලියන 3,637 කි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය යන ආයතන 04 ක් සඳහා සියයට 14 ක, සියයට 70 ක, සියයට 12 ක හා සියයට 4 ක් බැගින් මූල්‍යනය කර තිබුණි. එහෙත් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත මඟින් මෙම ආයතන 04 ට පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන්වලින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි නොවී චාරිකා හෝ සංචාරක සේවාවන්හි නිරත වන යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් වරදකට වරදකරු කිරීමට රීති පැනවීම, සංචාරක කර්මාන්තය හෝ ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාළව දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිත වැඩිදියුණු කිරීම, බලාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත් ලබා දීම, බලය ලබා දීම හා සංචාරක කර්මාන්තයට සහාය දීම සඳහා ආයතන සහ ව්‍යාපාර පිහිටුවීම යන කටයුතු සිදු කර නොතිබුණි.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති 69,70,72,73,74 හා සංචාරක කටයුතු පනතේ 40(7) වගන්තියට අනුකූල නොවන පරිදි සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට සුදුසුකම් නොමැති නිලධාරියෙකු 2016 පෙබරවාරි 08 දින කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරට බඳවා ගෙන රු.මිලියන 1.56 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

- අමාත්‍යාංශයේ අනුමැතියකින් හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව සුදුසුකම් නොමැති නිලධාරිනියක උත්සව අවස්ථා අධ්‍යක්ෂ තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන 2014 දෙසැම්බර් මාසයේ සිට 2016 මැයි මාසය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 1.69 ක් ගෙවා තිබුණි.

- 2016 වර්ෂයේ ප්‍රංශයේ සංචාරක නියෝජිත ජාතික සංගමයේ (SNAV) වාර්ෂික සම්මේලනය ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා එයාර්ලයින් සමාගමකට රු.මිලියන 37.44 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව හා 2016 ඔක්තෝබර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 7(iv) ට පටහැනිව එම සමාගමෙන් ලංසු කැඳවීමකින් තොරව හා මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 පටහැනිව ගෙවා තිබුණි.

- 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු.මිලියන 26.28 ක අනුග්‍රාහක වියදම් හා පරිත්‍යාග වශයෙන් ගෙවා තිබුණි.

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

- බඳවා ගැනීමේ පරිපාටියට අනුව මූලික සුදුසුකම් සපුරා නොතිබුණු සාමාන්‍යාධිකාරීවරයෙක් බඳවා ගෙන 2016 දෙසැම්බර් 01 දින සිට 2017 පෙබරවාරි 20 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.483,372ක් ගෙවා තිබුණි.

- වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව 2016 වර්ෂයේදී ව්‍යාපෘති 155 ක් නිම කිරීමට සැලැසුම් කර තිබුණද, ව්‍යාපෘති 97 ක් පමණක් නිම කර තිබුණි. ප්‍රධාන ක්‍රියාකාරකම් 14 ක් සඳහා රු.මිලියන 212.85 ක ප්‍රතිපාදන සලසා තිබුණත් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 104.14 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 49 ක් වැයකර තිබුණි.

- ප්‍රංශයේ සංචාරක නියෝජිත ජාතික සංගමයේ වාර්ෂික සම්මේලනය ශ්‍රී ලංකාවේ පවත්වා තිබුණි. එම සැසිය සඳහා විදේශිකයන් 286 දෙනෙකු සහභාගී වී තිබුණු අතර දේශීය අමුත්තන් සමඟ 325 දෙනෙකු පමණ සහභාගී වී තිබුණි. මේ සඳහා රු.මිලියන 83.5 ක් වැය කර තිබුණි.

  මෙම සැසියට සහභාගී වූ අය සඳහා හෝටල් පහසුකම් සැපයීමේදී තරු පහේ හොටල්වලින් ලංසු කැඳවා නොතිබුණි. හෝටල්කරුවන්ගේ සංගමයේ සභාපතිවරයාගෙන් ලබා ගත් ලංසුව පිළිගෙන ගෙවීම් කර තිබුණි. නමුත් සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පල කරන ලද මිල ගණන් පාදක කර ගෙන ලංසුව ඉදිරිපත් කර තිබුණත්, එම සැසිය වෙනුවෙන් එම ගැසට් නිවේදනයේ සඳහන් සියයට 10 ක්

අඩු නොකිරීම නිසා රු.740,306 ක මුදලක් හෝටල්වලට වැඩිපුර ගෙවා තිබුණි.

2016 සැප්තැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ වූ ඇමුණුම පරිදි හෝටල්වලට කාමර සඳහා බදු සමඟ ගෙවීමට එකඟ වී තිබුණ මුදල, තනි කාමර US$ 169 සහ ද්විත්ව කාමර US$ 180 ක් වුවත්, ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී ඊට වඩා වෙනස් වූ අගයන්ගෙන් ගෙවීම් කිරීම නිසා උක්ත හෝටල්වලට රු.329,592 ක් වැඩිපුර ගෙවා තිබුණි.

විදේශිකයන් 286 දෙනෙකු සහභාගී වූ සැසියට අතිරේක අමුත්තන් සමඟ 325 දෙනෙකු පමණ සහභාගී වූ බව අනිකුත් කරුණු සැසඳීමේදී නිරීක්ෂණය විය. 2016 ඔක්තෝබර් 31 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ආරම්භක සැසිය පැවැත්වීම සඳහා එක් මේ නිසා සැසියට සහභාගී වූ බවට තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් නොකළ 125 දෙනෙකු වෙනුවෙන් රු. 818,750 ක් ගෙවා තිබුණි.

සම්මේලනය පැවැත්වීම වෙනුවෙන් ප්‍රංශ සංචාරක නියෝජිත ජාතික සංගමයෙන් අයකළ යුතු මුදල්වලින් ගුවන් ගමන් ගාස්තු වෙනුවෙන් යැයි සඳහන් කර රු.4,029,000 ක් අඩු කර තිබුණත්, එය තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

සංචාරක කටයුතුවල වූ වර්ධනය

ඉකුත් වර්ෂවලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සංචාරකයින්ගේ පැමිණීම, ගත කළ රාත්‍රී දින ගණන, සංචාරකයින්ගෙන් ලද ආදායම, ඒක පුද්ගල සංචාරක ලැබීම්, මුළු රැකියා ලැබීම් ගණන වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 27 හි දැක්වේ.

රූපසටහන 27 - සංචාරක ව්‍යාපාරයේ වර්ධනය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික සංඛ්‍යාන වාර්තාව 2016

නාගරික සංවර්ධනය

සෑම එක් එක් නගරයක් සඳහා ආර්ථිකමය අවස්ථාවන් හා ගෝලීය තරඟකාරීත්වය ඉහළ නංවන නව නාගරික ආකෘතියක් නිර්මාණය කිරීම, කැලි කසළ, පැල්පත් වාසීන් සඳහා නිවාස ප්‍රශ්න නිරාකරණය සඳහා විසඳුම් සෙවීම සහ රටේ බස්නාහිර කළාපයේ හා තදාසන්න ප්‍රදේශවල නව නගර ඉදිකිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කිරීම සඳහා මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 02 කින් පහත සඳහන් කාර්යභාරයයන් ඉටු කළ යුතුව තිබුණි.

- මහානගර හා බස්නාහිර සංවර්ධන විෂයන්ට අදාළ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ ඒ ආශ්‍රිත කටයුතු.
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජික සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු.
- නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
- පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු.
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම.
- ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලැසුම් පිළියෙල කිරීම.
- ඒකාබද්ධ නාගරික සංවර්ධනයන් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලැසුම් පදනම් කරගෙන සියළු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය කිරීම.
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතනයන්හි පැවැරී ඇති අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු.

ඉහත සඳහන් ආයතන විසින් එම කාර්යභාරයයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත හා අනවසර ඉඩම්වල පදිංචි වී සිටින පදිංචිකරුවන් හට නිවාස ලබාදීම සඳහා නිවාස ඒකක 68,000 ක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට නිවාස ඒකක 5,203 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

නාගරික සංවර්ධනය කළ යුතු කළාප හඳුනා ගැනීම

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වගන්තිය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දිවයිනේ සංවර්ධනය කළ යුතු නාගරික කළාප හඳුනාගැනීම සහ එම කළාප සඳහා සංවර්ධන සැලැසුම් පිළියෙල කිරීම කළ යුතුව තිබුණි. කෙසේවුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විට නාගරික සංවර්ධන කළාප 243 ක් හඳුනාගෙන තිබුණද, එයින් කළාප 42 ක සඳහා පමණක් සංවර්ධන සැලැසුම් පිළියෙල කර තිබුණි.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

නාගරික සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර පළාත තුළ ව්‍යාපෘති 11 ක්ද, දකුණු පළාත තුළ ව්‍යාපෘති 09 ක්ද, උතුරු හා මධ්‍යම පළාත තුළ එක් ව්‍යාපෘතිය බැගින්, ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 3,252.09 ක් වූ ව්‍යාපෘති 22 ක් 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද ඉන් එක් ව්‍යාපෘතියක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

අනවසරයෙන් ඉඩම් ගොඩකිරීම පාලනය කිරීම

දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් පත්‍රයේ නිවේදන මගින් ප්‍රසිද්ධ කිරීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත මගින් සංස්ථාව වෙත පවරා තිබුණි. 2016 වර්ෂය අවසාන වන විටත් එලෙස නිවේදන මගින් ගැසට් පත්‍රයේ පල කර ප්‍රසිද්ධ කරන ලද පළාත් ගණන 04 කට පමණක් සීමා වී තිබුණි. එමෙන්ම සංවර්ධන කටයුතු වෙනුවෙන් 1995 වර්ෂයේදී සංස්ථාව පවරා ගනු ලැබූ ඉඩම් අක්කර 307 කින් වර්ෂය අවසාන වන විට සංවර්ධනය කළ ප්‍රමාණය අක්කර 97 ක පහළ අගයක පැවතුණි. 1996 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීම් කටයුතු සඳහා හෙක්ටයාර 378 ක පමණ වූ පහත් බිම් ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ආරක්ෂා කර ගැනීමට, මෙන්ම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට පවරා දී තිබුණි. 2016 වර්ෂය අවසාන වන විට ඉන් ඉඩම් අක්කර 400 ක් පමණ අනවසර පදිංචි කරුවන් විසින් අත්කරගෙන තිබීම හා සංස්ථාව විසින් අවසතුකරනය (Divesting) කර තිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සංස්ථාවෙන් අපේක්ෂා කරන ලද කාර්යය ඉටුකිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

මහ කොළඹ ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීම හා පරිසර ප්‍රවර්ධනය

මහ කොළඹ ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ හා පරිසර ප්‍රවර්ධන ව්‍යාපෘතියට සහ රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත භාණ්ඩාගාරයෙන් රු.මිලියන 2,360 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. නමුත් එයින් රු.මිලියන 1,010.75 ක් හෙවත් සියයට 43 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එසේම, සංස්ථාව විසින් 2016 වර්ෂයේදී රු.මිලියන 361.87 ක ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමකින් තොරව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 626.13 ක් වැය කර තිබුණි.

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය හා කොළඹ අගනගර ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 12,810 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වර්ෂයේදී ඉන් රු.මිලියන 3,054 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 77 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. අදාළ ව්‍යාපෘති නියමිත ඉලක්කගත කාලය තුළ නිම කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය යටතේ බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානය ඉදිකිරීම රජයට අනුබද්ධ ඉදිකිරීම් ආයතනයකට පවරා තිබුණු අතර එම ආයතනය උද්‍යානය ඉදිකිරීමේ කාර්යය නියමිත දිනයට මාස 07 ක ප්‍රමාදයකින් පසුව නිම කර තිබුණි. එසේම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී රු.මිලියන 92.07ක් වටිනා වැඩ කොටස් නිම කර නොතිබුණු අතර ප්‍රමිතියට අනුකූලව ඉදි කර නොතිබුණු කාර්යයන් සඳහාද කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවීම් කර තිබුණි. එසේම, මට්ටක්කුලිය කාක දූපත වෙරළ උද්‍යානය මාස 10 ක් තුළ ඉදිකිරීම සඳහා 2014 සැප්තැම්බර් මාසයේදී කොන්ත්‍රාත්කරුවෙකුට භාරදී තිබුණත්, ඉදිකිරීම් කටයුතුවල අසාමාන්‍ය ප්‍රමාදය නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විටද උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ කිරීමේ හැකියාව, එකවර වැඩ කිහිපයක් කිරීමට ඇති මූල්‍ය හා ශ්‍රම ශක්තිය පිළිබඳව සලකා බැලීමෙන් තොරව එකම කොන්ත්‍රාත්කරුවාට එකම කාල වකවානුව තුළ කොන්ත්‍රාත් කිහිපයක් පිරිනමා තිබීම මඟින් කොන්ත්‍රාත් නිම කිරීමට ප්‍රමාද වී තිබුණි.

කොළඹ අගනගරයේ ගංවතුර පාලනය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකය වන අතර එම අරමුණ ඉටුකිරීම සඳහා අගනුවර ගංවතුරින් යටවන සහ වැසිවතුර විශාල වශයෙන් එක් රැස්වන ප්‍රදේශ හඳුනාගෙන නව කාණු පද්ධති සැලැසුම් කිරීම, ඉදිරිකිරීම සහ පැරණි කාණු පද්ධති අළුත්වැඩියා කිරීම සිදුකිරීම අවසන් කරමින් පැවතුණද තවදුරටත් සාමාන්‍ය වර්ෂාපතනයකදී ක්ෂණිකව කොළඹ නගරයේ මාර්ග වතුරින් යටවන තත්ත්වයක් පවතින බැවින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ පරිසර බලපෑම තක්සේරුකිරීම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ක්‍රියාකාරි සැලසුමක් පිළියෙල කිරීමට ජාත්‍යන්තර උපදේශක ආයතනවල සහය ලබාගෙන එම ආයතනවලට සමාලෝචිත වර්ෂ අවසානයේදී රු. මිලියන 65.92 ක් ගෙවා තිබුණු අතර තවදුරටත් එම ආයතනවලින් අතිරේක උපදේශන වාර්තාද ලබාගෙන තිබුණි. කෙසේවුවද විදේශ ආයතනවලින් ලබාත් උපදේශක වාර්තාවලින් පෙන්වාදුන් කරුණු සහ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් සම්බන්ධීරණයක් ඇති කර ගැනීමට අපොහොසත්වී තිබුණි. ඉකුත් වර්ෂ දෙක තුළ අමාත්‍යාංශය වෙත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.මිලියන 4,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද එකී ප්‍රතිපාදනවලින් සියයට 99.9 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල ඉදිරියට ගෙනයාමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු විධිමත් ලෙස පත් කර නොතිබුණි. ඒ සඳහා අමාත්‍යාංශයේ නිලධාරින් වැඩබැලීමේ පදනම මත පත්කරමින් ව්‍යාපෘතියේ කටයුතු ඉතා මන්දගාමීව සිදුකර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අධ්‍යනය කටයුතු වෙනුවෙන් නිලධාරින් විදේශ ගත වී රු.546,778 ක් වැයකර තිබුණත්, එකී අධ්‍යයන කටයුතු පිළිබඳව කිසිදු වාර්තාවක්

සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘතිය

බස්නාහිර කලාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.මිලියන 133 ක් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාර හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතන විසින් වැය කර තිබුණු මුළු වියදම රු.මිලියන 279 ක් වී තිබුණි.

මෙම ව්‍යාපෘතිය මඟින් බස්නාහිර කළාපීය මහනගර අධිකාරිය පිහිටුවීමේ කෙටුම්පතක් සැකසීම, එහිදී ඊට බලපාන පළාත් පාලන අණපනත් සංශෝධනය කිරීම හා අධිකාරිය පිහිටුවීම මඟින් පළාත් පාලන ආයතන අතර ඇතිවන ගැටුම් හඳුනාගැනීම හා විසඳීමත් බස්නාහිර කළාපිය මහනගර අධිකාරියේ ව්‍යුහය කවරේද යන්න තීරණය කිරීම ප්‍රධාන අරමුණ වී තිබුණි. එම අරමුණුවලින් බැහැරව අධිකාරිය පිහිටුවීමෙන් පසු කළ යුතු ගොඩනැගිලි සැලැසුම් රෙගුලාසි පිළියෙල කිරීම විද්‍යා හා තාක්ෂණ නගර සැලසුම් සැකසීම, හොරණ, මිරිගම නාගරික සැලැසුම් පිළියෙල කිරීම වැනි කටයුතුවලට යොමුවී තිබුණද, මූලික අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

2003 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා රු.මිලියන 79.85 ක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වැය කර මෙම ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදුකර තිබුණි. එකී සැලැසුම් ව්‍යාපෘතියේ වර්තමාන සැලැසුම්වලට නොගැලපීම මත මුළුමනින්ම අත්හැර දැමීම නිසා වැය කරන ලද රු. මිලයන 79.85 කට ආසන්න මුදල නිෂ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

බස්නාහිර කළාපිය මහනගර සැලැසුම් පිළියෙල කිරීම සඳහා කාල රාමුවක් නොමැතිව දිගින් දිගටම ව්‍යාපෘතිය පවත්වාගෙන යන අතර, ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවෙන් කරන කාර්ය කර්තව්‍යම ව්‍යාපෘතිය මගින්ද සිදුකරනු ලබන අතර ව්‍යාපාතියේ කාර්ය කටයුතු පිළිබඳ ක්‍රියාකාරි සැලැසුම් පවා පිළියෙල කිරීමෙන් තොරව කටයුතු කර තිබුණි.

ව්‍යාපෘතිය සඳහා විධිමත් අනුමැතියකින් තොරව සහ බදවාගැනීමේ පරිපාටියකින් තොරව කාර්යමණ්ඩලය බදවාගෙන තිබුණු අතර එකී කාර්යමණ්ඩලය පලපුරුද්ද නොසලකා වසරකට ආසන්න කාලයක් තුළ උපදේශක තනතුරුවලට පත්කර ඉහළ වැටුප් ගෙවා තිබුණි. එලෙස සමාලෝචිත වර්ෂය තුළ පමණක් උපදේශකයන් 25 දෙනෙකුට රු.මිලියන 18.52 ක ගෙවීම් කර තිබුණි.

ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේදී නිලධාරින්ගේ විදේශ ගමන් වෙනුවෙන් ව්‍යාපෘතියෙන් රු.මිලියන 9.30 ක් වැයකර තිබූ අතර එකී විදේශ ගමන්වලින් නිලධාරින් ලබාගත් අත්දැකීම්, රටට ලබාගත හැකි ප්‍රයෝජන දැක්වෙන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

මහනගර සැලැස්ම එලිදැක්වීමේ උත්සවයක් වෙනුවෙන් රු. මිලියන 8 කට වැඩි මුදලක් වැයකර තිබූ අතර එහි ඇතැම් වියදම් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් තොරව සිදු කර තිබුණි.

කඩවත, කඩුවෙල, කොට්ටාව නගර සංවර්ධන සංරචකය සඳහා වූ ව්‍යාපෘතිය

මහ කොළඹ ප්‍රවාහනජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කඩවත,කඩුවෙල,කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මකව පැවති අතර නගර සංවර්ධනය වෙනුවට එකී

නගරවල මාර්ග කිහිපයක් අලුතින් කාපට් කිරීම සහ මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පර්යන්ත ඉදිකිරීම නිමකිරීමට සහ දුම්රිය හා බස් ඒකාබද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි.

මෙම ව්‍යාපෘතිය ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයෙන් (JICA) ණය මුදලක් මත ක්‍රියාත්මකව තිබූ අතර එකී ණය මුදල සම්පූර්ණයෙන් උපයෝජනය කිරීම හේතු කොටගෙන 2016 වර්ෂයේ සිට මුළු මනින්ම භාණ්ඩාගාර ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු. මිලියන 714.1 ක් විය.

මහකොළඹ ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීමේ හා පරිසර සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ කිලෝමීටර් 4 ක් දිග සුළු ඇලමාර්ග සහ කිලෝමීටර් 2 ක් දිග මහාපරිමාණ ඇලමාර්ග ශුද්ධ පවිත්‍ර කර සකසා ඇලමාර්ග නඩත්තු කිරීම සහ අක්කර 94 ක වැවක් ඉදිකිරීම සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් රු. මිලියන 218.3 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 78.16 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර අදාළ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව කිසිදු වාර්තාවක් අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි.

ඩෙංගු වැළැක්වීම සඳහා ඇලමාර්ග හා කාණු පිරිසිදු කිරීම

ඩෙංගු වැළැක්වීම සඳහා ඇලමාර්ග හා කාණු පිරිසිදු කිරීමට පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රු.මිලියන 11.11 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ඇලමාර්ග හා කාණු පිරිසිදු කිරීමක් හෝ ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

කර්මාන්ත හා වාණිජ කටයුතු

ගෝලීය වශයෙන් තරඟකාරී වූ දැණුම මත පදනම් වූ කාර්මික නිෂ්පාදන අංශයක් නිර්මාණය කිරිම, එකතු කළ අගය මත පදනම් වූ අපනයන ඉහළ නැංවිම හා ප්‍රවර්ධන තුළින් උපරිම ආදායමක් ලබාගැනීම හා හිතකර වාණිජමය ආර්ථිකයක් නිර්මාණය කිරිම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වි තිබුණි. එම අරමුණ ඉටු කර ගැනිම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 07 කින්, ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 12 කින් හා රාජ්‍ය ව්‍යාපාර 15 කින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- කර්මාන්ත හා වාණිජ විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසුවිපරම් කිරිම හා ඇගැයිම.
- කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය.
- වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්විම.
- දේශිය වෙළෙඳපොල තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිලකට සැපයිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරිම.
- පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිල ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවන්හි යෙදවීම.
- පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරිම.
- බුද්ධිමය දේපල පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල පිළිබඳ කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු.
- සීනි කර්මාන්තයට අදාළ රාජ්‍ය සම්පත් කළමනාකරණය හා සුරැකිම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයයන් ඉටු කිරීමේදී විගණනයේදි අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

කර්මාන්තපුර ඉදිකිරිම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන අංශය විසින් 2016 දෙසැම්බර් 31 දින වන විට කර්මාන්තපුර 55 ක කටයුතු වෙනුවෙන් රු.මිලියන 556.37 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව කර්මාන්තපුර 07 ක ඉදිකිරීමේ කටයුතු අවසන් කළ යුතුව තිබුණි. ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 153.88 ක් වැය කර තිබුණි. නමුත් එම වියදමට සරිලන භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. තවද ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 0.32 ක් වැයකර තිබුණද, අදාළ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආරම්භ කර නොතිබුණි. ආයෝජන අවස්ථා වැඩි කිරිම හා ප්‍රදේශයේ සමාජ හා ආර්ථික ව්‍යුහය නංවාලීමේ අරමුණින් ස්ථාපනය කිරිමට අපේක්ෂිත කර්මාන්තපුර 02 කට

අදාළව 2016 දෙසැම්බර් 31 දින වන විට අදාළ ඉඩම් හඳුනාගෙන කාර්යයන් ආරම්භ කළ යුතුව තිබුණත්, එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

සහල් ආරක්ෂිත තොග පවත්වා ගැනීම

2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව පිළියෙල කළ සංයුක්ත සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව සතුව මෙ.ටො. 50,000 ක ආරක්ෂිත සහල් තොගයක් පවත්වා ගෙන යාමට සැලැසුම් කර තිබුණි. ඊට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 2016 වර්ෂයේදී මෙ.ටො. 50,000 ක සහල් ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යාමට සැලසුම් කර තිබුණි. ආරක්ෂක සහල් තොග ගබඩා කිරීමට වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයෙහි අංක 9 සහ 10 ගබඩා විද්‍යාත්මක ගබඩා බවට පත් කිරීමට දෙපාර්තමේන්තුවට 2012-2014 කාලය තුළ රු.මිලියන 43.72 ක් වැය කර තිබුණි. එසේ වුවද, 2016 ජනවාරි 01 දින සිට 2017 ජුනි 30 දින දක්වා කාලය තුළ ගබඩාවල කිසිදු ආරක්ෂිත සහල් තොගයක් නොතිබුණි. තවද වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයෙහි තවත් ගබඩා 05 ක් විද්‍යාත්මක ගබඩා ලෙස වැඩිදියුණු කිරීම සඳහා 2016 අප්‍රේල් 27 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යටතේ රු.මිලියන 214.00 ක් අනුමත කර තිබුණත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු.මිලියන 38.22 ක් පමණක් වැය කර තිබුණි.

ජාතික මට්ටමේ සමුපකාර සමිති ස්ථාපිත කිරීම

ජාතික මට්ටමේ සමුපකාර සමිති 16 ක් ස්ථාපිත කිරීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සැලැසුම් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමිති 03 ක් පමණක් ස්ථාපිත කර තිබුණි.

සමුපකාර සමිතිවල අක්‍රමිකතා අවම කර ගැනීම

සමුපකාර සමිතිවල පවතින අක්‍රමිකතා අවම කිරීම සඳහා අදාල පරීක්ෂණ කටයුතු පැවැත්වීමට සමුපකාර සංවරධන දෙපාර්තමේන්තුව සැලැසුම් කර තිබුණත්, ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී සමුපකාර සමිතිවල පැවැති ආරවුල් බේරුම් කිරීම් සහ උසාවි බලගැන්වීම් 750 ක් අවසන් කිරීමේ ඉලක්ක කර තිබුණත්, ඉන් සත්‍ය වශයෙන් 129 කට පමණක් තීන්දු ලබා දී තිබුණි.

සමුපකාර සමිතිවල දායක මුදල් අයකිරීම

2016 වර්ෂය ආරම්භයේදී සමුපකාර සමිති සංගම් මඟින් දායක මුදල් ලෙස රු.මිලියන 44.77 ක් අයකර ගත යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 4.87 ක් පමණක් අයකර ගෙන තිබුණි. එමෙන්ම සමුපකාර අතිරික්ත සහ සමුපකාර සංවර්ධන අරමුදල මඟින් සමුපකාර සමිති වෙත ලබා දුන් ණයවලින් රු.මිලියන 616.18 ක් සමාලොචිත වර්ෂය ආරම්භයේදී අයකර ගත යුතුව තිබුණත්, වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3.00 ක් පමණක් අයකර ගෙන තිබුණි.

1977 ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම

පාරිභෝගිකයන්ට අධිකාරිය වෙත ක්ෂණිකව පැමිණිලි ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට හා ගොවීන්ට වෙළඳපළේ තොග හා සිල්ලර මිල ගණන් දැනගැනීම සඳහා 2013 හා 2014 වර්ෂවලදී රු.මිලියන 9.19 ක් වැයකර “ 1977

ව්‍යාපෘතිය " ස්ථාපිත කර තිබුණි. මෙම ව්‍යාපෘතිය හරහා ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීම සඳහා නිලධාරියෙකු සම්බන්ධ කර නොතිබුණු බැවින් පැමිණිලි ලබා ගැනීම නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් වෙළඳපළ මිල ගණන් තොරතුරු යාවත්කාලීන කර නොතිබීම නිසා මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

වෙළෙඳ ලකුණ ලියාපදිංචි කිරීම

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය විසින් ලියාපදිංචි කරන ලද වෙළඳ ලකුණු සංඛ්‍යාව 3,312 ක් වූ අතර ඒවා ලියාපදිංචි කිරීම සඳහා වර්ෂ 01 ක සිට වර්ෂ 39 ක් දක්වා කාලයක් ගත කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු අයදුම්පත් සංඛ්‍යාව 55,506 ක් විය. 2016 වර්ෂයේදී ලියාපදිංචි කර තිබුණු කාර්මික සැලැසුම් සංඛ්‍යාව 34 ක් වූ අතර, ඒ තුළ 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ලද අයදුම්පත් පැවැතුණි. මේ අනුව කාර්මික සැලැසුම් සඳහා වන අයදුම්පත් ලියාපදිංචි කිරීමට වර්ෂ 01 ක සිට වර්ෂ 07 ක් දක්වා කාලයක් ගත කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට කටයුතු නිම වී නොතිබුණු අයදුම්පත් සංඛ්‍යාව 825 ක් විය.

පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 124 ක් වී තිබුණි. එම පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම සඳහා මාස 09 ක සිට වර්ෂ 16 ක් දක්වා කාලයක් ගත කර තිබුණි. පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය සඳහා අධික කාලයක් ගත වීම නිසා නව නිපයුම්කරුවන්ට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට ඇති උනන්දුව අඩුවීමේ ප්‍රවනතාවයක් පැවැතුණි.

එමෙන්ම පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් බලපත්‍ර ප්‍රදානය කිරීම සම්බන්ධව බාහිර පාර්ශවයන් 11 ක් විසින් ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයට එරෙහිව අධිකරණවල නඩු 11 ක් ගොනු කර තිබුණි. තවද, කාර්යාලය විසින් ලියාපදිංචි කරන ලද වෙළඳ ලකුණු 131 ට අදාළව බාහිර පාර්ශව විසින් ගොනුකර තිබුණ නඩු කටයුතු සඳහා සාක්ෂිකරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය පෙනී සිට තිබුණි.

වෙළෙඳ ලකුණ ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම

වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා වන "මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශවීමේ ව්‍යාපෘතිය" සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් රු.මිලියන 38.00 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් රු.මිලියන 37.96 ක් උපයෝජනය කර තිබුණි. එම ප්‍රතිපාදන භෞතික සම්පත් ගොඩනැංවීම සඳහා වැයකර තිබුණි. 2016 මැයි 15 දින සිට 2018 මැයි 14 දින දක්වා මාසයකට රු.175,000 ක් බැගින් කුලියක් ගෙවීමේ පදනම මත ගොඩනැගිල්ලක් කුලියට ගෙන 2017 මැයි මාසය දක්වා එකතුව රු.මිලියන 2.43 ක කුලියක් ගෙවා තිබුණත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එමෙන්ම රු.මිලියන 3.88 ක් වැය කර කාර්යාල උපකරණ සහ ලී බඩු මිලදී ගෙන තිබුණද, එම භාණ්ඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. සර්වර් (Server) යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට රු.මිලියන 32.50 ක් ගෙවා තිබුණත්, 2017 ජුනි 28 දින වන විටත් ලංසු කැඳවා නොතිබුණි.

පේෂකර්ම හා ඇඟළුම් ක්ෂේත්‍රය පිළිබඳව පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන් පැවැත්වීමට

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය 2009 දී ස්ථාපිත කර 2015 වර්ෂය අවසන් වන විට වර්ෂ 06 ක කාලයක් ඉක්මවා තිබුණි. 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතන පනතේ 04 (අ) වගන්තිය ප්‍රකාරව පේෂකර්ම හා ඇඟළුම් ක්ෂේත්‍රය පිළිබඳව පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන් පැවැත්වීමට 2016 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය වැඩපිළිවෙල සකස් කර නොතිබුණි.

අනුකූලතා සහතික නිකුත් කිරීම

ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතිවලට සහ සමාගම් ප්‍රමිති පද්ධතිවලට අනුකූලව පේෂකර්ම හා ඇඟළුම් කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට අනුකූලතා සහතික නිකුත් කිරීම, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගළුම් ආයතනයේ පරමාර්ථයක් වී තිබුණත්, ආයතනය විසින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා ජාතික වෘත්තීය මට්ටමේ සුදුසුකම් තත්ත්වය (NVQ) ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

බඳවාගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීම

සීමාසහිත ලංකා සතොස සමාගම විසින් බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවාගෙන නොතිබුණු අතර අවිධිමත් පරිදි බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කර තිබුණි. එමෙන්ම සුදුසුකම් නිශ්චය කිරීමකින් හා නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව බඳවා ගත් කළමනාකරණ විශේෂඥයන් 04 දෙනෙකු සඳහා රු.මිලියන 1.86 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 3,075 ක් වුවත් 2016 වර්ෂයේ තත්‍ය කාර්ය මණ්ඩලය 3,641 ක් වූයෙන් අතිරික්ත කාර්ය මණ්ඩලය 566 ක් විය.

කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් ලබාදීම

2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව අදාළ නොවන නිලධාරීන් 22 කට ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් රු.මිලියන 13.63 ක් වැය කර තිබුණි. වෙන් කළ වාහන ලබාදී තිබුණු නිලධාරීන් දෙදෙනෙකු සඳහා රු.මිලියන 1.05 ක ප්‍රවාහන දීමනා වශයෙන් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

රජයේ ප්‍රසම්පාදනය ක්‍රියාවලිය අනුගමනය නොකිරීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් රු.මිලියන 108.36 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. ඒ තුළ පාරිසරික හා වෙළඳපළ අධ්‍යයනයකින් තොරව මිලදීගත් පිරිවැය රු.මිලියන 107.39 ක් වටිනා ජංගම ගබඩා 50 අතරින් පිරිවැය රු.මිලියන 75.17 ක් වූ ජංගම ගබඩා 35 ක් අලෙවි කර ගැනීමට නොහැකිව පැවැතුණි. එම ජංගම ගබඩා මිලදී ගැනීම වෙනුවෙන් ලබා ගෙන තිබූ රු. මිලියන 81.64 ක කෙටිකාලීන ණය සඳහා පොලී වශයෙන් රු.මිලියන 0.70 ක වියදමක් සිදු කර තිබුණි.

නිවාස හා ඉදිකිරීම්

රටේ සියළුම පවුල් සඳහා මූලික පහසුකම් සහිතව නිවාස ලබාදීම හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශන හා නීතිමය සේවා ලබා දීම හා පුහුණු ශිල්පීන් ඇති කිරීම මෙම ක්ෂේත්‍රයේ අපේක්ෂිත අරමුණු වි තිබුණි. එම අරමුණු ඉටු කර ගැනිම සඳහා නිවාස හා ඉදිකිරිම් අමාත්‍යාංශය යටතේ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව, ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව හා ඕෂන්වීව් සංවර්ධන සමාගම යන ආයතන ස්ථාපිත කර තිබුණි. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් පහත සඳහන් කාර්යාභාරයන් ඉටු කළ යුතුව තිබුණි. .

- ඉදිකිරීම් ක්ෂේත්‍රය නියාමනය, ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලෙන්නන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම.
- රාජ්‍ය ආයතන සඳහා ඉංජිනේරු සේවා සැපයීම.
- නිවාස සංවර්ධනය, අඩු පහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජා සංවර්ධනය කිරීම.
- යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සහාධිපත්‍ය ක්ෂේත්‍රයට අදාළ නියාමන කටයුතු වැඩි දියුණු කිරීම.

මෙම මූලික අරමුණු ළඟා කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් කාර්යභාරයන් ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ආදර්ශ ගම්මාන වැඩසටහන

“ආදර්ශ ගම්මාන වැඩසටහන” (Model Villages Programme) යටතේ රජයෙන් ලබා දෙන ඉඩමක නිවසක් සාදා ගැනීම සඳහා රු.300,000 ක ණය මුදලක් ප්‍රතිලාභින් වෙත ගෙවීම අරමුණ වී තිබුණි. එම ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 1,125 ක් වියදම් ඇස්තමේන්තු කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව එදින වන විට ඒ සඳහා රු.මිලියන 1,079 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී නිවාස 4500 ක් ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණත්, වර්ෂය අවසන් වන විට එම ඉලක්කයෙන් සියයට 6 ක් වූ නිවාස 259 ක් පමණක් ඉදිකර තිබුණි.

වැලිඔය නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වැලිඔය ප්‍රදේශයේ යුද්ධයෙන් අවතැන්වූවන් සඳහා නව නිවාස ඉදිකිරීම සහ පවතින නිවාස වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදි රු.මිලියන 350 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 311 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට නව නිවාස 500 ක් ඉදිකිරීමට හා නිවාස 500 ක් වැඩි දියුණු

කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට නිවාස 42 ක් හෙවත් ඇස්තමේන්තු කළ නිවාස ප්‍රමාණයෙන් සියයට 4.2 ක ප්‍රමාණයක නිවාස නිම කර තිබුණි.

පැරණි නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම

පැරණි නිවාස යෝජනා ක්‍රම 12 ක පොදු ස්ථාන හා යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කළ ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 240 ක් වී තිබුණි. ප්‍රගති වාර්තාව අනුව 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 240 ක ඇස්තමේන්තුගත මුදලම වැය කර තිබුණත්, එහි භෞතික ප්‍රගතිය සියයට 33 ක් පමණක් වී තිබුණි.

ලුනාව නිවාස ව්‍යාපෘතිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී නිවාස 356 ක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 340 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 339.99 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 100 ක පමණ උපයෝජනයක් කර තිබුණත්, එහි භෞතික ප්‍රගතිය සියයට 23 ක ප්‍රමාණයක් වී තිබුණි.

හිඟ හිටි ණය අයකර ගැනීම දුර්වල වී තිබීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ ණය වැඩසටහන් 13 ක් යටතේ 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,417.59 ක ණය ශේෂ හිඟහිට පැවැතුණි. 2016 වර්ෂය ආරම්භයේ පැවැති රු.මිලියන 3,102.79 ක් වී තිබුණත්, වර්ෂය අවසාන වන විට එහි වටිනාකම රු.මිලියන 3,417.59 කි වී තිබුණි. ඒ අනුව ණය අයකර ගැනීම ඉතාම දුර්වල මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ණය වැඩසටහන්වලට අදාළ ණයගැති සංඛ්‍යාව 348,466 ක් වුවද, සක්‍රීය ණයගැති සංඛ්‍යාව 100,353 ක් පමණක් වී තිබුණි. ඒ අනුව අක්‍රීය ණයගැති සංඛ්‍යාව සියයට 71 ක් වී තිබුණි.

පවරාගෙන තිබුණු ඉඩම් පිළිබඳ සමීක්ෂණය

2016 වර්ෂයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත්/පවරා ගෙන තිබූ ඉඩම් සම්බන්ධව සිදු කරන ලද ඉඩම් සමීක්ෂණ වාර්තාව අනුව හිස් ඉඩම් හෙක්ටයාර් 335.55 ක් ද, අනවසර පදිංචි ඉඩම් හෙක්ටයාර් 128.96 ක් ද හා යාබද ඉඩම් හෙක්ටයාර් 8.64 ක්ද පැවැති බව හඳුනාගෙන තිබුණි. උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක 04 ක ඉඩම් සමීක්ෂණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි.

දායක මුදල් ගෙවීම

2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දායක මුදල් ගෙවීමේදී, අදාළ කරගත යුතු වැටුපට වඩා අඩු වැටුපකට දායක මුදල් ගෙවා තිබුණි. මේ හේතුවෙන් අධිකාරියට 2016 වර්ෂයේ දී රු.මිලියන 71.93 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

අත්තිකාරම් ගෙවීම්

1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ චක්‍රලේඛයේ 2(ඇ) ඡේදය ප්‍රකාරව ඇණවුම් සමග චෙක්පත් මගින් අත්තිකාරම් ලබාදීමෙන් පසු දින 30 ක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතුව තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට ඇණවුම් සමග චෙක්පත් මගින් ගෙවා තිබුණු අත්තිකාරම්

ශේෂය රු.මිලියන 114.69 ක් වූ අතර ඉන් රු.මිලියන 68.19 ක් වර්ෂ 03 කටවැඩි කාලයක සිට පැවැතුණි.

සම්පත් ඌන උපයෝජනය

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාව වෙත රු.මිලියන 125 ක් වටිනා ඇස්පල්ට් යන්ත්‍රයක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණි. එම යන්ත්‍රය පොළොන්නරුවේ ස්ථානගත කර තිබුණි. එහි නිෂ්පාදන ධාරිතාවය දිනකට ඇස්පල්ට් මෙට්‍රික් ටොන් 600 ක් වී තිබුණි. කෙසේ වුවද, 2014 වර්ෂයෙන් පසු එහි නිෂ්පාදන අත්හිටුවීම හේතුවෙන් එම යන්ත්‍රය හා උපාංග උපයෝජනයකින් තොරව පැවතුණි.

ලැබිය යුතු මුදල් අයකිරීම

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ බද්ධ ව්‍යාපාර ආයතනයක් වූ ෆූජීමා ස්ටේට් කෝපරේෂන් (පෞද්ගලික) ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 මාර්තු 31 දිනට සංස්ථාවට ලැබිය යුතු මුදල රු.මිලියන 41.90 ක් වූ අතර ඉන්පසු කිසිඳු ගනුදෙනුවක් සිදු වී නොතිබුණි. කෙසේ වුවද ලැබිය යුතු මුදල අයකර ගැනීම සඳහා සංස්ථාවේ කළමනාකරණය විසින් කිසිඳු පියවරක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ගෙන නොතිබුණි.

ප්‍රවාහනය

ශ්‍රී ලංකාව, කළාපය තුළ ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය පද්ධතිය සහිත රට බවට පත් කිරීම සිය දැක්ම යටතේ හා ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය කිරීම හා තිරසාරව පවත්වාගෙන යාමේ මෙහෙවර සාක්ෂාත් කිරීම පිණිස ප්‍රධාන කාර්යයන් 18 ක් ඉටු කිරීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනා ගමන කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සහ ගුවන්තොටුපළ හා ගුවන් සේවා සමාගම, සිවිල් ගුවන් සේවා අධිකාරිය හා ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපිත කර තිබුණි.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් 2016 වර්ෂයේදී අදාළ කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

මාතර සිට කතරගම දක්වා නව දුම්රිය මාර්ගය

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විදේශ මූල්‍ය ණය යටතේ මාතර සිට කතරගම දක්වා නව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතියේ ණය ගිවිසුම හා ඉදිකිරීම් ගිවිසුම අනුව ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 36,166 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව රු. මිලියන 18,915 ක් වූ අතර එයින් රු. මිලියන 6,461 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව ඇස්තමේන්තුවෙන් සියයට 66 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. තවද ව්‍යාපෘතිය අවසන් කිරීමට 2016 ජූලි 31 දිනට සැලැසුම් කර තිබුණද, එදිනට භෞතික ප්‍රගතිය සියයට 72 ක් වූයෙන් මෙහි ඉදිකිරීමේ කාලය 2017 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

මාතර සිට කතරගම දක්වා නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය යටතේ උපදේශන කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත්කරුට රු.මිලියන 327 ක සමස්ථ ගෙවීමක් කර තිබුණි. මේ සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සකස් කර නොතිබීම හේතුවෙන් රු.මිලියන 28.57 ක ඇස්තමේන්තුගත මුදලක් ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලැසුම් කළ දිනය වූ 2016 ජූලි 31 දින වන විටද ඉතිරි කර තිබුණි.

දුම්රිය මාර්ග ව්‍යාපෘති

දුම්රිය මාර්ග ව්‍යාපෘති 07 ක් නව දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ලෙස හඳුනාගෙන ඒ සඳහා වර්ෂ 06 ක කාලයක සිට වාර්ෂිකව ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් ව්‍යාපෘති 06 සඳහා රු. මිලියන 41 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 39.9 ක් ඉතිරි වී තිබුණි.

දුම්රිය ප්‍රවාහනය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව දිනකට මඟී දුම්රිය 326 කට ආසන්න ප්‍රමාණයකින් සහ දිවයින පුරා නැවතුම් ස්ථාන 378 ක පාලනය යටතේ මඟීන් 370,000 කට ආසන්න ප්‍රමාණයකට දළ වශයෙන් ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් අලාභය

2016 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් අලාභය රු.මිලියන 6,773 ක් වී තිබුණි. එය 2012 වර්ෂයේ රු.මිලියන 3,796 ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ සියයට 78.42 කින් පිරිහී තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී මෙහෙයුම් ආදායම රු.මිලියන 1,771 කින් හෙවත් සියයට 36.50 කින් වර්ධනය වී තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය වන විට මෙහෙයුම් වියදම රු.මිලියන 4,748 කින් හෙවත් සියයට 54.90 කින් වැඩි වී තිබුණි. විස්තර වගුව 32 හි දැක්වේ.

ආදායම, වියදම හා මෙහෙයුම් අලාභය	2012	2013	2014	2015	2016
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
මෙහෙයුම් ආදායම	4,852	5,425	5,910	6,335	6,623
මෙහෙයුම් වියදම	8,648	10,586	16,943	14,048	13,396
මෙහෙයුම් අලාභය	3,796	5,161	11,033	7,713	6,773
මෙහෙයුම් අලාභය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස	78.24	95.13	186.68	121.75	102.26

වගුව 32 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ආදායම, වියදම හා අලාභය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව - 2016

2012 වර්ෂයේ මෙහෙයුම් අලාභය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 78 ක සිට 2016 වර්ෂය වන විට සියයට 102 දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණි. 2014 වර්ෂයේදී එම ප්‍රතිශතය සියයට 187 ක් වී තිබුණත්, 2016 වර්ෂය වන විට එය සියයට 102 දක්වා ක්‍රමිකව අඩුවෙමින් පැවැතුණි. විස්තර රූප සටහන 28 හි දැක්වේ.

වගුව 28 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය, මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව - 2016

සැලැසුම් කළ පරිදි දුම්රිය ධාවනය කිරීම

2015 වර්ෂයේ දී සැලැසුම් කරන ලද මගී දුම්රිය සංඛ්‍යාවෙන් සියයට 97.35 ක් ධාවනයෙහි යොදවා තිබූ අතර 2016 වර්ෂයේ දී එය සියයට 97.81 ක් වී තිබුණි. නමුත් සැලැසුම් කළ දුම්රිය වාර ප්‍රමාණය 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දී සියයට 8.4 කින් අඩු වී තිබුණු අතර, 2016 වර්ෂයේදී 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 3.9 කින් අඩු වී තිබුණි.

නියමිත වේලාවට දුම්රිය ගමන් ආරම්භ කිරීම

සැලැසුම් කළ පරිදි නියමිත වේලාවට මගී දුම්රිය ධාවනය ආරම්භ කිරීම කළ යුතුව තිබුණත්, 2015 වර්ෂයේදී සැලැසුම් කළ දුම්රිය ධාවන වාර ගණනෙන් සියයට 39.49 ක්ද, එය 2016 වර්ෂයේදි සියයට 47.47 ක්ද වශයෙන් මගී දුම්රිය නියමිත වේලාවට

ගමන් ආරම්භ කර තිබුණි. සැලැසුම් කළ වේලාවට වඩා විනාඩි 6 ක සිට විනාඩි 59 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව ගමන් ආරම්භ කළ වාර ගණන සැලැසුම් කළ දුම්රිය ධාවන වාර ගණනින් සියයට 52.21 ක් 2015 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර, එය 2016 වර්ෂයේදී සියයට 45.20 ක් වී තිබුණි. 2015 වර්ෂයේදී නියමිත වේලාවට වඩා පැය එකකට වැඩියෙන් ප්‍රමාද වී ධාවන කළ දුම්රිය වාර ගණන සැලැසුම් කළ දුම්රිය වාර ගණනින් සියයට 5.65 ක් වී තිබුණත්, 2016 වර්ෂයේදී එය සියයට 5.14 දක්වා අඩු කිරීමට සමත් වී තිබුණි. සැලැසුම් කළ පරිදි දුම්රිය ධාවනය නොකර දුම්රිය වාරය අවලංගු කළ අවස්ථා ගණන 2015 වර්ෂයේදී සියයට 2.65 ක්ද, 2016 වර්ෂයේ දී එය සියයට 2.19 දක්වා අඩු වී තිබුණි.

දුම්රිය මගීන් සංඛ්‍යාව වැඩිවීම

2015 වර්ෂයේදී මගීන් මිලියන 133.29 ක් ප්‍රවාහනය කර තිබුණු අතර 2016 වර්ෂයේදී එම සිමාව ඉක්මවා මගීන් මිලියන 2.76 ක් ප්‍රවාහනය කර තිබුණි. නමුත් ප්‍රවාහනය කරන ලද මගී සංඛ්‍යාව 2015 වර්ෂයේදී 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 2.93 කින් වර්ධනය වී තිබුණත්, 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී එය සියයට 2.07 ක් වී තිබීම නිසා 2016 වර්ෂයේදී වර්ධනයේ අඩු වීමක් නිරීක්ෂණය විය.

දුම්රිය මගී ප්‍රවාහන ආදායමේ කාර්යක්ෂමතාවය

2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 10 ක ආදායමක් වර්ධනය කර ගැනීමට සැලැසුම් කර ඇතත් ඇස්තමේන්තු සකස් කිරීමේ දී 2015 ඇස්තමේන්තුගත මුළු ආදායම ලෙස රු. මිලියන 6,000 ක් හා 2016 වර්ෂය සඳහා රු. මිලියන 6,300 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණි. එය 2015 ඇස්තමේන්තුගත මුළු ආදායමින් සියයට 5 ක වැඩිවීමකි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයට අනුව ඇස්තමේන්තු සකස් කිරීමක් සිදු කර නොතිබුණි.

2016 වර්ෂයේදී සිදු කළ නියැදි විගණන පරීක්ෂණයට අනුව දුම්රිය මගීන් වලංගු ප්‍රවේශ පත්‍රයක් නොමැතිව ගමන් ගත් මගීන් සංඛ්‍යාව 13,267 ක් වී තිබුණි. එය මසකට දළ වශයෙන් මගීන් 1,106 ක් පමණ ප්‍රමාණයක් වී තිබුණි. 2015 වර්ෂයේදී එම සංඛ්‍යා පිළිවෙලින් 12,826 ක් හා 1,069 ක් වී තිබුණි. මේ අනුව වලංගු ප්‍රවේශ පත්‍රයක් නොමැතිව ගමන් කරන මගීන් සංඛ්‍යාවේ වැඩිවීමක් පෙන්නුම් කර තිබුණු අතර අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයකින් විශාල මගී ප්‍රමාණයක් දුම්රියෙන් ප්‍රවේශපත්‍ර නොමැතිව ගමන් කිරීම සිදුවන බැවින් දෙපාර්තමේන්තුවට ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය විය. මෙය පාලනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගත් නව ක්‍රමවේදයක් යොදා ගැනීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි.

භාණ්ඩ ප්‍රවාහන ආදායමේ කාර්යක්ෂමතාවය

2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ ප්‍රවාහනය මෙට්‍රික් ටොන් සියයට 8.10 කින් ද, භාණ්ඩ ධාවන කිලෝමීටර් සියයට 7.6 කින්ද හා භාණ්ඩ ප්‍රවාහන ආදායම සියයට 5.3 කින් ද වශයෙන් වර්ධනය වී තිබුණි. තවද දුම්රියකින් භාණ්ඩ මෙට්‍රික් ටොන් එකක් කිලෝමීටරයක දුරක් ප්‍රවාහනය කිරීම සඳහා පිරිවැය රු. 58.10 ක් වී තිබුණි. දුම්රියෙන් භාණ්ඩ මෙට්‍රික් ටොන් එකක් ප්‍රවාහනය කිරීමෙන් කිලෝමීටර් 01 කට උපයාගත හැකි ආදායම රු. 1,024.20 ක් වී තිබුණි. ඒ සඳහා වන පිරිවැය සමඟ සැසඳීමේදී දෙපාර්තමේන්තුවට රු. 966.10 ක ආදායම් අතිරික්තයක් ලබා ගැනිමට හැකියා පැවැතුණි.

දේශීය අරමුදලින් මූල්‍යනය කළ ව්‍යාපෘති

දුම්රිය දෙපාර්තමේන්තුවේ අංක 4 ව්‍යාපෘතිය යටතේ සැලැසුම් කරන ලද රු. මිලියන 4,664 ක ව්‍යාපෘති 10 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව රු.මිලියන 992 ක ඇස්තමේන්තු වටිනාකමින් යුත් ව්‍යාපෘති 09 ක මූල්‍යමය කාර්යසාධනය සියයට 01 ක සිට සියයට 49.99 ක පරාසයකින් යුක්ත වූ අතර සමස්ත වියදමේ කාර්සාධනය සියයට 17.49 ක් වී තිබුණි. 2016 වර්ෂයේ දුම්රිය යටිතල පහසුකම් සඳහා රු. මිලියන 14,931.38 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 10,961.44 ක් වැය කර තිබුණි.

බදු කුලී ආදායම්

දෙපාර්තමේන්තුව සතු ඉඩම් බාහිර පාර්ශ්වයන්ට බදුදීම තුළින් 2016 වර්ෂය අවසාන වන විට හිඟ ආදායම රු.මිලියන 1,887.9 ක් විය.

මරණ පාරිතෝෂික ගෙවා නොතිබීම

දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටිය දී මියගිය නිලධාරීන්ට හිමි පාරිතෝෂිකය බාල වයස්කාර දරුවන් සඳහා ගෙවීම් කිරීම සම්බන්ධ පරීක්ෂාවේදී 1927 වර්ෂයේ සිට 1996 වර්ෂය දක්වා බාලවයස්කාර දරුවන් 1,482 කට අදාළ එකතුව රු.මිලියන 1.55 ක වටිනා හිමිකම්ද, 1996 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ මියගිය නිලධාරීන් 646 දෙනෙකුගේ බාලවයස්කාර දරුවන්ගේ හිමිකම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවර ගෙන නොතිබුණි.

ගබඩා අත්තිකාරම් ගිණුම

1993 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආනයනය කරන ලද තොග කාණ්ඩ 223 කට අදාළව ගෙවා තිබුණු රේගු ගාස්තු හා වෙනත් බදු සඳහා රු.මිලියන 166.16 ක් 2017 අගෝස්තු 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. එම තොග දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු බව විගණනයට තහවුරු කර නොතිබුණි.

භාණ්ඩ මිලදී ගැනීම සඳහා 1980 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වර්ෂ 35ක කාල සීමාව තුළ සැපයුම්කරුවන්ට අත්තිකාරම් ගෙවීම් කර තිබුණත්, ඉන් රු.මිලියන 12.06 ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව රු.මිලියන 10.89 ක් වශයෙන් එකතුව රු.මිලියන 22.95 ක අත්තිකාරම් ලබා ගැනිමට 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රමවත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

2016 වර්ෂයේදී අවස්ථා 28 කදී ඉන්වොයිස් 159ක් සඳහා දින 02 ක සිට දින 994 ක් දක්වා කාල පරාසයක් තුළදී භාණ්ඩ මුදා ගැනීම ප්‍රමාද කිරිම නිසා රු.මිලියන 2.44 ක ප්‍රමාද ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට නිෂ්කාර්යව ගෙවා තිබුණි.

1980 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වසර 36 ක කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ අඩුවෙන් ලැබීම්, දෙපාර්තමේන්තු අවශ්‍යතාවය අනුව නොලැබීම් හා හානිවීම්වල එකතුව රු.මිලියන 78.72 ක් වී තිබුණි.

2011 වර්ෂයේදී රු.මිලියන 5.09 ක ණයවර ලිපි නිකුත් කර විද්‍යුත් පාලන 1,000 ක් ඇණවුම් කළ පසු එම භාණ්ඩ ගබඩාවට ලැබී තිබුණි. අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැලපීමක් මත ඒ පිළිබඳව අදාළ සමාගම දැනුවත් කර තිබුණි. 2015 ජුනි 07 දින එම සමාගමේ නිලධාරීන් දෙපාර්තමේන්තුවට පැමිණ එම කටයුත්ත සපුරාලීමට අවස්ථාවක් ඉල්ලුම් කර තිබුණි. 2017 ජුනි මාසය දක්වා සැපයුම්කරුට එම කාර්යය අවසන් කරදීමට අවස්ථාව

දෙපාර්තමේන්තුව විසින් ලබා දී නොතිබුණි. මේ අනුව තොග අයිතම වටිනාකම රු. මිලියන 5.09 ක් භාණ්ඩ නිෂ්ක්‍රීයව වර්ෂ 06 ක් මුළුල්ලේ රඳවා ගෙන තිබුණි.

දුම්රිය එන්ජින් මිලදී ගැනීම

2001 වර්ෂයේ දී රු.මිලියන 810 ක් වැය කර මිලදී ගෙන තිබූ M 9 මාදිලියේ එන්ජින් 05ක් 2004 වර්ෂයේ සිට ධාවනයට යොදවා නොතිබුණි. M 9 873 දරන එන්ජිම මිලදී ගැනීමෙන් පසු වසර දෙකක් පමණක් ධාවනය කිරීමට හැකි වී තිබුණි.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.

1998 අංක 5 දරන මෝටර් වාහන (සංශෝධන) පනතින් සංශෝධිත 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 213(අ) වගන්තිය ප්‍රකාරව 2005 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය ප්‍රකාරව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ස්ථාපිත කර තිබුණි. මාර්ග ආරක්ෂාව අරමුණු සඳහා තෘතීය පාර්ශවයේ අවධානමක් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් හිමි රක්ෂකයකු හෝ තැනැත්තෙකු විසින් අරමුදලට වාරික මුදලින් සියයට 01 දායක මුදලක් වාර්ෂිකව ගෙවිය යුතුය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සිදු වූ වාහන අනතුරුවලින් මියගිය සංඛ්‍යාව 13,050 ක්ද, මාරක අනතුරු 12,181 ක්ද, බරපතල තුවාල 37,801 ක්ද, සුළු තුවාල 68,134 ක් හා අලාභ 73,979 ක්ද වශයෙන් වාර්තා වී තිබුණි. එයින් හඳුනා නොගත් වාහන මඟින් සිදු වූ අනතුරු කොපමණ ද යන්න තහවුරු නොවුණි. මාර්ග අනතුරු වලින් මියගිය සංඛ්‍යාව පෙර වර්ෂයට වඩා සියයට 07 ක වැඩිවීමක් සමාලෝචිත වර්ෂයේදී නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී වන්දි ගෙවීම් අයදුම්පත් 88 ක් සභාව වෙත ලැබී තිබුණු අතර ඉන් රු.මිලියන 7.7 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි.

- මෙම සභාව 2010 අගෝස්තු මාසයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙනුවට එහි සංයුතිය, ව්‍යුහය කාර්යභාරය ඇතුලත් නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඇතුළුව කරුණු 04 ක් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණ ද, අදාළ අනුමැතිය ලැබී වසර 06 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

- 2014 වර්ෂයේ චිරස්ථායි සංවර්ධනය පිළිබඳ අන්තර් රාජ්‍ය විවෘත ක්‍රියාකාරී කණ්ඩායම විසින් 2030 වර්ෂයේදී සාක්ෂාත් කරගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් හා ඊට සබැඳි අරමුණු 169 ක් යෝජනා කර තිබුණි. තිරසාර සංවර්ධන ඉලක්ක 03 මඟින් වාහන අනතුරුවලින් සිදුවන මරණ හා තුවාලකරුවන් ප්‍රමාණය අවම කිරීමට ඉලක්ක ඇති කර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලසුම්වල තිරසාර සංවර්ධන ඉලක්කයන් හා එම ඉලක්කයන්ට අදාළ සැලැසුම්ද කාර්යසාධන දර්ශකයන්ද ඇතුලත් කර නොතිබුණි.

- සභාව පිහිටුවීමේ ප්‍රධාන කාර්යයන් 11 ක් නිශ්චිතව හඳුන්වා දී තිබුණද, සභාව ආරම්භ කර වර්ෂ 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණද, එම කාර්යයන්වලින් කාර්යයන් 02 ක් කෙරෙහි පමණක් අවධානය යොමු කර

තිබුණි. අනෙකුත් කාර්යයන් සඳහා දීර්ඝ කාලීන සැලැසුමට හෝ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර නොතිබුණි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

2016 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන ඩිපෝ 108 කින් හා උප ඩිපෝ 15 කින් සමන්විතව ක්‍රියාත්මක වන අතර ප්‍රධාන කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය කාර්යාල 13 කින්ද, ප්‍රාදේශීය වැඩපලවල් 11 කින් ද, රියදුරු අභ්‍යාස විද්‍යාල 21 කින් ද, සංචාරක බංගලා 05 කින් හා විශ්‍රාම ශාලා 01 කින් ද සමන්විත වේ. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉටු කරන ලද මගී ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- **බස් රථ ධාවනය කිරීම**

මණ්ඩලයේ කාල සටහන් අවශ්‍යතාවයෙන් ධාවනය කළ බස් රථ සංඛ්‍යාව 2012 වර්ෂයේදී සියයට 56 ක්ව පැවතුනද, එය 2016 වර්ෂය වන විට ක්‍රමයෙන් වර්ධනය වී සියයට 72 ක් දක්වා වැඩි වී තිබුණි. එමෙන්ම මණ්ඩලය විසින් වාර්ෂිකව ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝ මීටර් ප්‍රමාණයෙන් 2012 වර්ෂයේදී සියයට 56 ක් ධාවනය කර තිබූ අතර 2016 වර්ෂය වන විට එය සියයට 72 ක් දක්වා වර්ධනය වී තිබුණි. අපේක්ෂිත කිලෝ මීටර් ප්‍රමාණයෙන් සියයට 28 ක් තවදුරටත් ධාවනය කිරීමට අපොහොසත් වී තිබුණි. තවද 2015 වර්ෂය වන විට බස්රථ 2200 ක් ලැබී තිබුණ ද, දෛනිකව ධාවනය කර තිබුණු බස්රථ ප්‍රමාණය ඒ අනුව වැඩිවී නොතිබුණි. පසුගිය වර්ෂ 05 ක කාලය තුළ මණ්ඩලයේ බස්රථ ධාවනයේ ප්‍රගතිය වගුව 33 හි දැක්වේ.

විස්තරය	2016	2015	2014	2013	2012
දෛනික බස්රථ ඇණිය	7,768	7,779	7,669	7,143	7,756
දෛනික කාල සටහන් අවශ්‍යතාවය	7,257	7,235	7,204	7,168	7,172
දෛනික ධාවනය කළ බස්රථ සංඛ්‍යාව	5,314	5,270	4,596	4,806	4,694
ධාවනය කළ බස් රථ ගණන දෛනික කාල සටහන් අවශ්‍යතාවේ ප්‍රතිශතයක් ලෙස	73	73	64	67	61
ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝ මීටර් මිලියන ප්‍රමාණය - වර්ෂයට	629.61	643.18	616.85	603.09	609.65
ධාවනය කළ කිලෝ මීටර් මිලියන ප්‍රමාණය- වර්ෂයට	451.52	440.42	371.24	343.70	337.83
ධාවනය කළ කිලෝ මීටර් මිලියන ප්‍රමාණය ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝ මීටර් මිලියන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස	72	68	60	57	55.5

වගුව 33 : මණ්ඩලයේ බස් රථ ධාවනයේ ප්‍රගතිය
ප්‍රභවය :බස්රථ ඇණි තත්ත්ව වාර්තාව, ධා.5 වාර්තාව, ආදායම් ප්‍රකාශන

අත්තිකාරම් පියවීම

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින දක්වා සැපයුම්කරුවන්ට ලබාදුන් අත්තිකාරම්වලට අදාළ අමතර කොටස් ප්‍රධාන කාර්යාලයට ලබා නොගෙන ඒවා ඩිපෝ වෙත සෘජුවම ලබාදීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,831.86 ක නොපියවූ ශේෂයක් පැවැතුණි. 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.මිලියන 1,907.29 ක් දක්වා වැඩි වී තිබුණි. අදාළ සැපයුම්කරුවන් විසින් අමතර කොටස් ඩිපෝ වෙත සපයා තිබුණු බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

සැලැසුම් කළ පරිදි හිඟ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමට නොහැකි වීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ආසන 42 ක හා ආසන 54 ක බස් රථ 2200 ක් ඉන්දියානු අශෝක් ලේලන්ඩ් සමාගම වෙතින් ඇමරිකානු ඩොලර් මිලියන 72.62 කට හෙවත් ආසන්න වශයෙන් රු.මිලියන 10,331.78 කට කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීම් සඳහා 2013 ඔක්තෝබර් 17 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණත්, එහි සඳහන් වූ මණ්ඩලය සතු ආර්ථික වශයෙන් ලාභදායී නොවන අළුත්වැඩියා කළ නොහැකි බස් රථ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් හිඟ සේවක අර්ථසාධක අරමුදල් සහ භාරකාර අරමුදල් ගෙවීමට උපදෙස්දී තිබුණි. නමුත් 2014 වර්ෂයේ වෙන්දේසිකර තිබූ බස්රථ 1,239 කින් රු.මිලියන 182 ක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් අපේක්ෂා කළ අරමුණ ඉටු කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

බැංකු අයිරාව වැඩිවීම

මහජන බැංකුවේ බැංකු අයිරා පහසුකම රු.මිලියන 721.62 ක් වුවද, 2014 දෙසැම්බර් 31 දින වන විට අයිරාව රු.මිලියන 745.22 දක්වා වැඩි වී තිබුණි. බැංකු අයිරාව වෙනුවෙන් බැංකු සුරක්ෂණයක් ලෙස රු.මිලියන 325 ක්වූ ස්ථාවර තැන්පතු ගිණුම පවත්වාගෙන යනු ලබන අතර බැංකු අයිරාව සඳහා සියයට 17 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 10.3 ක මාසික සාමාන්‍ය පොලී ප්‍රමාණයක් ගෙවා තිබුණි. බැංකු සුරක්ෂණයක් ලෙස තබා ඇති තැන්පතු සඳහා ලැබුණු පොලිය හා බැංකු අයිරා පොලිය සැසඳීමේදී ශුද්ධ වශයෙන් මාසිකව රු.මිලියන 7 ක පමණ පොලී පිරිවැයක් මණ්ඩලය විසින් වැය කරනු ලැබේ.

අතිරික්ත කාර්ය මණ්ඩලය

2016 වර්ෂය වන විට ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ රු.මිලියන 6,555 ක වන්දි ගෙවා සේවකයන් 3,227 ක් විශ්‍රාම ගැන්වීමෙන් පසුවද, මණ්ඩලයේ මුළු කාර්යය මණ්ඩලය 31,495 ක් වී තිබුණි. එහි ඇතුළත් ස්ථිර කාර්යය මණ්ඩලය 30,524 ක් වි තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩලය 24,886 ක් සමඟ සැසඳීමේදී තවදුරටත් මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ 5,638 ක අතිරික්තයක් පැවතුණි.

රියදුරු අභ්‍යාස විද්‍යාල

මණ්ඩලය මඟින් රියදුරු අභ්‍යාස විද්‍යාල 19 ක් පවත්වාගෙන යන අතර 2014 වර්ෂයේදී රියදුරු අභ්‍යාස විද්‍යාල මඟින් රු.මිලියන 32.28 ක ආදායමක් උපයා තිබුණි. ඒ සඳහා වන මුළු වියදම රු.මිලියන 37.84 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 5.56 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. අභ්‍යාස විද්‍යාල 19 හි

පොදු කාර්යය වියදම් වැඩිවීම මෙම අලාභයට හේතුවී තිබුණු අතර රියදුරු අභ්‍යාස විද්‍යාලවල පුහුණු උපදේශකවරුන් ඇතුළු අනිකුත් සම්පත් වැඩිකර ලාභදායීව පවත්වා ගෙන යාමට කළමනාකරණයේ නිසි අවධානය යොමු කර නොතිබුණි.

බස්රථ පුනරුත්ථාපනය කිරීම

බස් රථ 143 ක් රු. මිලියන 97.46 කට පුනරුත්ථාපනය කිරීම සඳහා 2002 වර්ෂයේදී වෙස්කෝ ආයතනයට යවා තිබුණි. නමුත් වෙස්කෝ ආයතනය 2016 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක තත්ත්වයක නොපවතින අතර අදාළ බස්රථ නැවත මණ්ඩලය වෙත ලබා ගෙන නොතිබුණි.

මණ්ඩලයේ බස් රථ සඳහා වායු විමෝචන සහතික ලබා ගැනීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ සඳහා වායු විමෝචන සහතික ලබා ගැනිමකින් තොරව දෛනිකව ධාවනය කර තිබුණි. විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2014 වර්ෂයට අදාළව ප්‍රාදේශිකයන් 10 ක මුළු බස් රථ 6,729 කින් බස්රථ සඳහා 5,356 ක් වායු විමෝචන සහතික ලබාගෙන නොතිබුණි. තවද 2016 වර්ෂයට අදාළව ලැබුණු තොරතුරු අනුව ප්‍රාදේශිකයන් 04 ක මුළු බස්රථ 2,810 කින්

බස්රථ 2,010 ක් සඳහා ඉහත සහතිකය ලබා ගෙන නොතිබීම නිසා පරිසරයට වන හානිය ගණනය කිරීමට නොහැකි විය.

සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට අධිභාර ගෙවීම

මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට ලබාදුන් තොරතුරු අනුව සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.මිලියන 9,200 ක් හා ඒ සඳහා අධිභාර රු.මිලියන 4,212 ක් සමග රු.මිලියන 13,412 ක් වී තිබුණි. එම මුළු ගෙවිය යුතු අගයෙන් රු.මිලියන 7,405 ක් ගෙවා තිබුණු බව මණ්ඩලය ප්‍රකාශ කර තිබුණු අතර, ඒ අනුව තවදුරටත් ගෙවිය යුතු ශේෂය රු.මිලියන 6,006 ක් ලෙස දක්වා තිබුණි.සේවක භාරකාර අරමුදලට ගෙවියයුතු මුදල රු.මිලියන 52 ක් වූ අතර ඒ සඳහා වූ අධිභාරය රු.මිලියන 11 ක් වී තිබුණි.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

2017 මැයි 28 දින විගණනයට ලබාදුන් තොරතුරුවලට අනුව ගමනාගමන කොමිෂන් සභාව විසින් ප්‍රධාන ආකාර 03 ක් යටතේ ගාස්තු අයකර වගුව 34 හි දැක්වෙන පරිදි බලපත්‍ර නිකුත් කර තිබුණි.

විස්තරය	බලපත්‍රලාභීන් ගණන
වාර්ෂිකව රු. 3,000 ක් අලුත් කිරීමේ ගාස්තුව පමණක් ගෙවන බලපත්‍ර ලාභීන් ගණන (ටෙන්ඩර් නොවන)	2,284
වාර්ෂිකව රු. 15,000 ක් අලුත් කිරීමේ ගාස්තුව පමණක් ගෙවන බලපත්‍ර ලාභීන් ගණන (ටෙන්ඩර් නොවන)	717
වාර්ෂිකව අලුත් කිරීමේ ගාස්තුව රු. 3,000 ක් හා වාර්ෂික ටෙන්ඩර් වටිනාකම යන දෙකම ගෙවන බලපත්‍රලාභීන් ගණන	276
එකතුව	3,277

වගුව 34 - ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අයකරනු ලබන ගාස්තු
මූලාශ්‍රය : 2017 මැයි 28 දින විගණනයට ලැබුණු තොරතුරු

අසමතුලිත මාර්ග බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු

එකම මාර්ගය වෙනුවෙන් වාර්ෂිකව අළුත් කිරීමේ ගාස්තු වශයෙන් රු.3,000 ක් හා රු.15,000 ක් ගෙවා බලපත්‍ර හිමිකරගත් බස් හිමියන් සහ එම මාර්ගය වෙනුවෙන්ම තවත් කොටසකට අවම තාක්ෂණික මුදල හෝ ඊට වැඩි ටෙන්ඩර් වටිනාකමත් සමග වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව වශයෙන් රු.3,000 ක් ගෙවා බලපත්‍ර හිමිකරගත් බස් හිමියන් සිටීම මත බලපත්‍ර ලබාදීමේදී අයකරන ගාස්තුවල දැඩි අසමතුලිතතාවයක් පැනනැඟී තිබුණි. එමෙන්ම 2017 මැයි 28 දිනට ලබාදී තිබූ මුළු බලපත්‍ර 3,277 කින් සියයට 70 ක්ම රු.3,000 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් මත ලබාදී තිබුණු අතර, මුළු බලපත්‍රවලින් සියයට 22 ක් රු.15,000 ක වාර්ෂික අළුත් කිරීමේ ගාස්තුව මත සිදු කර තිබුණි.ඒ අනුව කොමිෂන් සභාව විසින් ලබාදුන් මුළු බලපත්‍රවලින් සියයට 92 ක් අඩු වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් මත ලබා දී තිබුණි.

මඟී සේවා අවසර පත් නිකුත් කිරීම

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 25(ආ) වගන්තියට

අනුව එක් වර්ෂයකට නොඅඩු වර්ෂ තුනකට නොවැඩි කාල පරිච්ඡේදයක් බලාත්මක වන සේ මඟී සේවා අවසර පත් නිකුත් කළ යුතු වුවත්, 2015 ජූලි 25 දින සිට 2016 දෙසැම්බර් 28 දක්වා කාල පරිච්ඡේදය තුළ අධිවේගී මාර්ගයේ පමණක් සුඛෝපභෝගී බස් රථ 65 ක් හා සාමාන්‍ය බස් රථ 02 ක්, දිනකට රු.2,500 ක් බැගින් අයකර තාවකාලික බලපත්‍ර නිකුත් කර තිබුණි. මේ අනුව අවම තාක්ෂණික වටිනාකම පදනම් කරගෙන ටෙන්ඩර් මගින් මඟී සේවා අවසර පත් නිකුත් නොකිරීම නිසා ජාතික ගමනාගමන කොමිෂන් සභාවට විශාල බලපත්‍ර ආදායමක් අහිමි වී තිබුණි.

බස් රථ මගින් මඟී ප්‍රවාහනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය පිළියෙල කිරීම

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් පිහිටුවා ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මඟී

ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම එහි ප්‍රධාන අරමුණ වී තිබුණි. කෙසේ වුවද කොමිෂන් සභාව විසින් 2009 වර්ෂයේදී ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය මැයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ තොරතුරු ඇතුළත් වාර්තාවක් සහ 2016 වර්ෂයේදී ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛන වාර්තාව පමණක් 2016 දෙසැම්බර් 31 දින වන විට ඉදිරිපත් කර තිබුණි. බස් රථ මගින් මඟී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස්කර ඉදිරිපත් කර නොතිබුණි.

ගැමි සැරිය බස් සේවාව

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගැමි සැරිය බස් සේවා 40 ක් පවත්වා ගෙනයාමට සැලැසුම්කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විට සේවාවන් 03 ක් පමණක් ධාවනය කර තිබුණි. මේ සඳහා සලසා තිබුණු රු.මිලියන 23.5 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 19.78 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

අන්තර් පළාත් මාර්ග කාල සටහන් පිළියෙල කිරීම

සමාලෝචිත වර්ෂයේදී අන්තර් පළාත් මාර්ග 514 ක කාලසටහන් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. අන්තර් පළාත් මාර්ග 234 ක කාල සටහන් පමණක් පිළියෙල කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 2 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර තිබුණත්, සැලැසුම් කළ පරිදි කාල සටහන් 280 ක් පිළියෙල කිරිමට අපොහොසත් වී තිබුණි.

ජීපීඑස් පද්ධතිය ගොඩනැගීම

කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේදී රු.මිලියන 17.57 ක් වැයකර පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර මිලදී ගෙන ජීපීඑස් පද්ධතිය ගොඩනැඟීම සඳහා යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්කගත ජීපීඑස් ඒකක ගණන 2100 ක් වුවත්, 2016 වර්ෂයේදී එම ඉලක්කය ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත සම්ප්‍රේෂණ සිම් කාඩ්පත් නිකුත්කර නොතිබුණි. පූර්ව වර්ෂවල නිකුත්කර තිබූ දත්ත සම්ප්‍රේෂණ සිම්කාඩ් 438 ක් මඟින් ජීපීආර්එස් ඒකක 438 ක් ක්‍රියාකාරී තත්ත්වයට පත්කළ හැකි වුවත්, 2016 වර්ෂයේ අපේක්ෂිත මුළු ඉලක්කයෙන් සියයට 79 ක ඉලක්ක ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

බස් පර්යන්ත ඉදිකිරිම

කොමිෂන් සභාව විසින් පෞද්ගලික බස් කර්මාන්තය නඟා සිටුවීම, බස්රථ සේවා ගුණත්වය ඉහළ නැංවීම හා යටිතල පහසුකම් සංවර්ධනය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් රු.මිලියන 75 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිකළයුතු හිඟුරක්ගොඩ බස් පර්යන්තය හා බැස්ටියන් මාවතේ බස් පර්යන්තය නවීකරණය නොකර ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් රු.මිලියන 43 ක ප්‍රතිපාදන REPO හි ආයෝජනය කර රු.මිලියන 26.11 ක් වර්ෂය අවසානයේ භාණ්ඩාගාරය වෙත යවා තිබුණි.

බස් පර්යන්ත ඉදිකළ ඉඩම් පවරා ගැනීම

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 12 සහ 13 වගන්ති ප්‍රකාරව ඉඩම් හා රජයේ දේපළ පවරාගත හැකි අතර කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ දී බස් පර්යන්ත ඉදිකිරීම සඳහා රු.මිලියන 68.47 ක ප්‍රාග්ධන වියදමක් සිදු කර තිබුණි. එම ඉදිකිරීම් හා ඒවා පිහිටි ඉඩම් කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම මුදල

ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 වන වගන්තියේ ඇතුළත් කර්තව්‍යන් ඇතුළත් කර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. එහි සඳහන් අරමුණු 9 කින් වෛද්‍ය සහතික නිකුත් කිරීමේ කර්තව්‍යන් අදාළ අරමුණ පමණක් 2016 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් කර තිබුණු අතර අනෙකුත් සියළු කර්තව්‍යන් ඉටු කර ගැනීමට අදාළ ඉලක්ක හා සැලැසුම් සකස්කර නොතිබුණි.

දැනුමෙන් හා කුසලතාවයෙන් පරිපූර්ණ, දේශීයත්වය ගරු කරන ජාත්‍යන්තරය ජය ගත හැකි, විනයගරුක ශ්‍රී ලාංකේය තරුණ පරපුරක් බිහි කිරීමේ පරමාර්ථයෙන්, තරුණ සංවර්ධනයට අදාළව ප්‍රධාන අරමුණු 14 ක් යටතේ ජාතික තරුණ සේවා සභාව ක්‍රියාත්මක වේ. මෙම ජාතික මෙහෙවර වෙනුවෙන් 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 1,136 ක්ද, විදේශ සංවිධානවලින් රු. මිලියන 15 ක් ද, අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන ලැබීම් රු. මිලියන 375 ලෙස එකතුව රු. මිලියන 1,526 ක් ද ලැබී තිබුණි. තවද, පාඨමාලා ගාස්තු, ගොවිපල ආදායම්, වෙනත් අභ්‍යන්තර ඉපැයීම් රු.මිලියන 193 ක්ද, ඇතුළුව මුළු ආදායම රු.මිලියන 1,719 ක් වී තිබුණි. ඊට සාපේක්ෂව වර්ෂයේ මුළු වියදම රු. මිලියන 1,798 ක් වී තිබුණි. උක්ත අරමුණු පෙරදැරි කරගනිමින් තරුණ සංවර්ධනයට අදාළ විවිධ වැඩසටහන් 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ පිළිබඳව කරන ලද විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන

සමාජයේ ප්‍රජාතාන්ත්‍රීය රාමුවට තරුණ පරපුර අනුගත කිරීමේ අරමුණෙන් 2010 වර්ෂයේ ආරම්භ කළ යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන සඳහා 2016 වර්ෂය වන විට එකතුව රු.මිලියන 224 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදමින් රු.මිලියන 24 ක් හෙවත් සියයට 50 ක් යොවුන් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට වැයකර තිබුණද, ලියාපදිංචි වූ 334,026 ක ඡන්දදායකයින් ගෙන් සියයට 33 ක් හෙවත් ඡන්දදායකයින් 112,367 ක් පමණක් ඡන්දය ප්‍රකාශ කර තිබුණි.

2015 හා 2016 වර්ෂ සඳහා වූ පාර්ලිමේන්තු සැසිවාර 5 ක් තුළ පවත්වන ලද රැස්වීම් වාර 13 ක් සඳහා මන්ත්‍රීවරුන් 2,925 ක සහභාගීත්වයක් අපේක්ෂා කර තිබුණත්, ඒ සඳහා මන්ත්‍රීවරුන් 1,716 දෙනෙක් පමණක් සහභාගී වී තිබුණි. එමෙන්ම පළමු සැසිවාරය සඳහා මන්ත්‍රීවරුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය සියයට 98 ක් වුවත්, 4 වන හා 5 වන සැසිවාර සඳහා පැමිණීමේ ප්‍රතිශතය සියයට 44 ක් දක්වා අඩු වී තිබුණි.

2015/2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තු 5.1 ස්ථාවර නියෝගය අනුව එහි ගණ පූර්ණය 75 ක් විය යුතු වුවත්, සිව්වන හා පස්වන සැසිවාර සඳහා පිළිවෙලින් මන්ත්‍රීවරු 60 ක හා 57 ක සහභාගීත්වයෙන් සැසිවාර පවත්වා තිබුණි.

"යූත් ගොට් ටැලන්ට්" වැඩසටහන

යොවුන් පාර්ලිමේන්තු වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළ "යූත් ගොට් ටැලන්ට්" වැඩසටහන යටතේ දිවයින පුරා යෞවන සමාජ මට්ටමින් ක්ෂේත්‍රයන් 06 ක් යටතේ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති 1,500 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 112.5 ක් වැය කර තිබුණි. වැඩසටහන් සැලැස්මට අනුව ක්ෂේත්‍රයන් 06 ක් යටතේ ව්‍යාපෘති තෝරාගත හැකිව තිබුණත්, ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 1,500 කින් 1,375 ක් පොදු අවශ්‍යතා මත පදනම් වූ ව්‍යාපෘති විය. ප්‍රාදේශීය ස්වශේෂී වූ එක් ව්‍යාපෘතියක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම තෝරාගත් අනෙකුත් ක්ෂේත්‍රයන් ආර්ථික සංවර්ධනයට මෙන්ම නව රැකියා උත්පාදනයට ඉලක්ක කර සැලැසුම් කර තිබුණත්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දිරිගැන්වීම් සිදු කර නොතිබුණි.

ව්‍යාපෘති ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක 12 කින් ලැබුණු තොරතුරු අනුව, 2016 නොවැම්බර් 12 දින වන විට නිම කළ යුතු ව්‍යාපෘති 493 ක් සඳහා සභාව විසින් රු.මිලියන 33 ක් නිදහස් කර තිබුණත්, ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 76 ක් වූ ව්‍යාපෘති 162 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 26 ක් සම්බන්ධයෙන් සිදු කළ භෞතික විගණන පරීක්ෂාවට අනුව, ව්‍යාපෘති 6 කට අදාළව තාක්ෂණික නිලධාරී විසින් සහතික කළ වැඩවල වටිනාකම රු.මිලියන 1.29 ක් වී තිබුණත්, සත්‍ය වශයෙන් නිමකර තිබූ වැඩවල වටිනාකම රු. 678,366 ක් පමණක් වී තිබුණි. අරමුදල් නොමැති වීම මත ඇස්තමේන්තු ගත පිරිවැය රු. 814,252 ක් වූ ව්‍යාපෘති 05 ක් අත්හැර තිබුණු අතර, ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5.37 ක් වූ වෙනත් ව්‍යාපෘති 17 ක ඉදිකිරීම් කටයුතු 2017 පෙබරවාරි මාසය අවසන් වන විටත් නිම කර නොතිබුණි. එමෙන්ම අපේක්ෂිත ප්‍රමිතයට අනුව සිදු නොකළ පිරිවැය රු.831,234 ක් වූ ව්‍යාපෘති 04 ක් පැවැතුණි. වැඩ නිමකර තිබුණත්, ප්‍රයෝජනයට නොගෙන තිබුණු රු.814,120 ක පිරිවැය වූ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් සභාව රු.225,000 ක් ලබා දී තිබුණි. පිරිවැය රු.මිලියන 1.91 ක් වූ ව්‍යාපෘති 08 ක වියදම් තහවුරු කිරීමට අදාළ බිල්පත් හෝ වෙනත් පිළිගත හැකි සාක්ෂි ගොනුගත කර නොතිබුණි. මේ අනුව, යෞවන සමාජවල සක්‍රීය දායකත්වයෙන් රු.මිලියන 112.5 ක් වැය කර රු.මිලියන 337.5 ක් වටිනා ව්‍යාපෘති 1500 ක් නිම කිරීමේ අවසන් ඉලක්කයට ළඟාවීමට නොහැකි වී තිබුණි.

පුහුණු වැඩසටහන්වල තත්ත්වය ඉහල මට්ටමකින් පවත්වා ගැනීම

සමාලෝචිත වර්ෂයේදී සභාවේ පුහුණු මධ්‍යස්ථාන 49 ක ක්‍රියාත්මක කළ සිසුන් සංඛ්‍යාව 15,691 ක්වූ පුහුණු පාඨමාලා 471 ක් වූ අතර එය සිසුන් 6,793 ක් වූ පූර්ණ කාලීන පාඨමාලා 201 කින් හා භාෂා පුහුණු පාඨමාලා 77 ක් ඇතුළුව සිසුන් 8,898 ක්වූ අර්ධකාලීන පාඨමාලා 270 කින් සමන්විත විය. සිසුන් 2,293 ක් සහභාගී වූ පාඨමාලා 471 කින් පාඨමාලා 80 ක් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන පාඨමාලා විය.

බේරුවල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් තවදුරටත් ප්‍රමාදවීම

තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා බේරුවල පිහිටි අක්කර 01 ක ඉඩමක් 2000 ජූලි 07 දින සිට අවුරුදු 50 ක බදු සීමාවකට රු.මිලියන 3.33 ක් වැය කර නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගෙන තිබුණු අතර එම ඉඩම් සංවර්ධනය කිරීම සඳහා තවත් රු.467,184 ක් වැය කර තිබුණි. එහෙත් 2016 වර්ෂය අවසන් වන විට ඉඩම් ලබා ගෙන පුරා වර්ෂ 16 ක් ගතවී තිබුණත්, අදාළ මධ්‍යස්ථානය ඉදිකර නොතිබුණි.

අවිධිමත් ගනුදෙනු

සභාවට අයත් පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථානවල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් තැබීම වෙනුවෙන් එකතුව රු.මිලියන 2.79 ක් වැය කර අවස්ථා දෙකකදී ජාතික තරුණ සේවා සභාව විසින් ඇඟිලි සලකුණු යන්ත්‍ර 60 ක් මිලදී ගෙන තිබුණි. ඉන් යන්ත්‍ර 09 ක් විගණන දිනය වූ 2017 මැයි 31 දින වන විටත් අදාළ සැපයුම්කරු විසින් සභාව වෙත සපයා නොතිබුණි. සපයා තිබුණු යන්ත්‍ර 51 කින් අපේක්ෂිත අරමුණු සඳහා යන්ත්‍ර 03 ක් පමණක් යොදා ගෙන තිබුණි. සවිකරන ලද

යන්ත්‍ර 29 කට මෘදුකාංග ඇතුළත් කර නොතිබුණු අතර මෘදුකාංග ඇතුළත් කර තිබුණත්, පැමිණීමේ වාර්තා ලබාගැනීමට නොහැකි වූ යන්ත්‍ර ගණන 16 ක් වී තිබුණි. මෙම මිලදී ගැනීමට අදාළව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමකින් තොරව සහ යන්ත්‍ර නියමිත ප්‍රමාණයෙන් හා අපේක්ෂිත ගුණත්වයෙන් සපයා තිබුණු බව තහවුරු කර ගැනීමකින් තොරව ඉහත ගෙවීම සිදු කර තිබුණි.

සභාව විසින් යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන යටතේ මන්ත්‍රීවරුන් වෙත බෙදා හැරීම සඳහා රු.මිලියන 15.86 ක් වැයකර ටැබ් පරිගණක 327 ක් මිලදී ගෙන තිබුණි. එම ටැබ් පරිගණක යන්ත්‍ර 23 ක් සැපයුම්කරු ගබඩාව වෙත භාරදෙන අවස්ථාව වන විටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. එහෙත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම යන්ත්‍ර හොඳ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බව සහතික කර තිබුණි. තවද, සැපයූ ටැබ් යන්ත්‍ර බොහෝ දෝෂ සහිත බව යොවුන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විසින් විගණනයට ප්‍රකාශ කර තිබුණි. මිලදී ගත් ප්‍රමාණය අනුව වෙළඳ වට්ටම් ලබාගැනීමේ හැකියාව තිබුණත්, එසේ කිරීමෙන් තොරව පවතින වෙළඳ පොළ මිලට වඩා වැඩි මිලකට මෙම යන්ත්‍ර මිලදී ගෙන තිබුණි.

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ හලාවත පුහුණු මධ්‍යස්ථානය සඳහා රු.මිලියන 7.93 ක් වැයකර පරිගණක 75 ක් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ යුතු වුවත්, වෙළඳ පොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි.
- ආයතන 05 කින් ලංසු ඉදිරිපත් කර තිබුණත්, හේතු දැක්වීමකින් තොරව ලංසු 03 ක් ප්‍රතික්ෂේප කර තිබුණි.
- මිලදීගෙන තිබූ පරිගණක 75 කින් පරිගණක 07 ක් විවිධ තාක්ෂණික දෝෂ හේතුවෙන් මිලදීගත් අවස්ථාවේ සිටම ක්‍රියා විරහිත වී තිබුණි.
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් තබාගැනීමට හා වගකීම් කාල සීමාවේදී සිදුවිය හැකි හානි සම්බන්ධයෙන් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 5 ක් රඳවා තබා ගැනීමක්ද සිදු කර නොතිබුණි.

සභාවේ සේවකයින් වෙනත් ආයතනවල සේවයේ යොදවා තිබීම

1972 අංක 5 දරන සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේ පාලනයට හා අධීක්ෂණයට ලක්වන ආයතනයක් වන සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපාකාර සමිති සංගමයේ කටයුතු සඳහා විධිමත් අනුමැතියකින් තොරව සභාවේ සේවකයන් 19 දෙනෙකු පූර්ණකාලීනවද තවත් සේවකයන් දෙදෙනෙකු අර්ධ කාලීනවද සේවයේ නියුක්ත කර තිබුණි. ඉන් සේවකයින් 05 දෙනෙකු වර්ෂ 05 කට වඩා වැඩි කාලපරිච්ඡේදයක සිට එසේ සේවා නියුක්ත කර තිබුණි. පූර්ණ කාලීනව සේවයේ නියුක්ත සේවකයන් වෙනුවෙන් සභාව 2016 වර්ෂය සඳහා පමණක් එකතුව රු. මිලියන 8.47 ක පාරිශ්‍රමික ගෙවා තිබුණි.

1980 අංක 37 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ සමාජ සේවා සංවිධානයක් වශයෙන් ලියාපදිංචි වූ යෞවන සමාජ සම්මේලනය වෙත නීත්‍යානුකූල

පදනමකින් තොරව සභාවේ සේවකයින් 04 දෙනෙකු පූර්ණකාලීනව මුදාහැර ඔවුන් වෙනුවෙන් 2016 වර්ෂය සඳහා සභාව විසින් රු.මිලියන 1.39 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ කළමනාකරණ ඒකකය විසින් ජාතික තරුණ සේවා සභාව සඳහා පිළියෙල කරන ලද වැඩසටහනෙහි සමස්ථ ක්‍රියාකාරී සැලැස්ම අනුව (Disbursement Link Indicators) DLI 6 ක් යටතේ ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සඳහා රු.මිලියන 1,353 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂය නිම වන විට ඉන් රු. මිලියන 435 ක් පමණක් වැයකර තිබුණි. තවද 2016 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ප්‍රධාන වැඩසටහන් 06 ක් සඳහා රු.මිලියන 230 ක් වෙන්කර තිබූ අතර ප්‍රගති වාර්තා අනුව එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 218 ක් වැය කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට අපේක්ෂිත ඉලක්කයන්ගේ කාර්යසාධනය පහත සඳහන් පරිදි වී තිබුණි.

- 2016 වර්ෂය අවසන් වන විට පුහුණු මධ්‍යස්ථාන 10 ක නවීකරණ කටයුතු කිරීමට රු.මිලියන 385 ක් ඇස්තමේන්තු කර තිබුණි. සභාව විසින් 2016 වර්ෂය අවසන් වන විට රු. මිලියන 339 ක් වැයකර පුහුණු මධ්‍යස්ථාන 06 ක නවීකරණ කටයුතු සිදු කරමින් පැවතුණි. තවද, එම මධ්‍යස්ථාන සඳහා පුහුණු උපකරණ මිලදී ගැනීමට 2014 වර්ෂයේ ආරම්භ කර 2020 වර්ෂය දක්වා සිදුකළ යුතුව තිබුණු අතර, 2016 වර්ෂය නිම වන විට රු.මිලියන 16 ක උපකරණ මිලදී ගත යුතුව තිබුණි. එහෙත් 2016 වර්ෂය නිම වන විට රු.මිලියන 78 ක පමණ උපකරණ මිලදීගෙන තිබුණි. මෙසේ මුල් සැලැසුම නොසලකා කටයුතු කිරීම නිසා පුහුණු මධ්‍යස්ථාන නවීකරණය අවසන් කිරීමට පෙර මිලදී ගන්නා ලද රු.මිලියන 8 ක් පමණ වටිනා පුහුණු උපකරණ නිෂ්ක්‍රීයව තැබීමට සිදුවී තිබුණි. එමෙන්ම පාඨමාලා ආරම්භ කිරීමේ හා සිසුන් බඳවා ගැනීමේ ඉලක්කයන්ද ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

- වැඩසටහන යටතේ නවීකරණය කරන ලද පුහුණු මධ්‍යස්ථාන 04 ක පාඨමාලා ආරම්භ කර තිබුණු අතර පාඨමාලාවල හැරයාමේ ප්‍රතිශතය සියයට 35 ක සිට සියයට 50 ක් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

- වැඩසටහනෙහි විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව 2015 වර්ෂය අවසාන වන විට රු. මිලියන 1.5 ක් වැය කරමින් පුහුණු මධ්‍යස්ථාන 10 ක් සඳහා ව්‍යාපාර සැලසුම් 10 ක් සංවර්ධනය කර ක්‍රියාත්මක කළ යුතු වුවත්, එම සැලැසුම් 2016 වර්ෂය අවසාන වන විටත් සකස් කර නොතිබුණි.

- 2015 වර්ෂය නිම වන විට සභාවෙහි පුහුණු මධ්‍යස්ථානවල තොරතුරු කළමනාකරණ පද්ධති සමාලෝචනය කර තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කර ඊට අදාළ පුහුණුවක් ලබාදීම, සඳහා රු.මිලියන 7.5 ක් වෙන්කර ගෙන තිබුණු අතර පසුගිය වර්ෂ 3 ක කාලය තුළ මෙම කටයුත්ත සඳහා එකතුව රු.මිලියන 7.18 ක් වැයකර තිබුණි. එහෙත් 2016 වර්ෂය අවසාන වන විටත් පුහුණු මධ්‍යස්ථාන සඳහා අදාළ තත්ත්ව කළමනාකරණ පද්ධති හා තොරතුරු කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම අවසන් කර නොතිබුණි.

සී/ස තරුණ සේවා පුද්ගලික සමාගම

ජාතික තරුණ සේවා සභාවෙහි සියයට 98 ක කොටස් හිමිකාරත්වය මත ක්ෂේත්‍ර 56 ක් ඔස්සේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේ අරමුණෙන් සීමාසහිත තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේ ආරම්භ කර තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද 2015/2016 මූල්‍ය වර්ෂයට අයත් මූල්‍ය ප්‍රකාශන හා එහි කාර්යසාධන සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අනුකූල නොවීම්

සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ සෑම අධ්‍යක්ෂකවරයෙකුම අවම වශයෙන් කොටස් 100 ක් හෝ මිලදීගෙන තිබිය යුතු වුවද, සමාගමෙහි දැනට සිටින අධ්‍යක්ෂවරුන් විසින් කොටස් මිලදීගෙන නොතිබුණි.

2016 මාර්තු 31 වන දිනට සමාගමේ සේවයේ නියුතු මුළු කාර්ය මණ්ඩලය 767 ක් සඳහා වාර්ෂිකව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

සේවා සපයන ආයතනයක් වන සමාගම විසින් එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු පනත්වල දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව අදාළ බදු මුදල් ගෙවීම සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

2015 ඔක්තෝබර් මාසයේ සිට 2016 මාර්තු මාසය දක්වා වන මාස 06 ක කාලය තුළ ආයතනයේ සේවයේ නියුක්තව සිටි සේවකයන්ගෙන් සියයට 11 ක පමණ ප්‍රමාණයකට සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි.

සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී අන්තර් දීමනා හා විශේෂ දීමනා හැර අනෙකුත් ඉපයීම් අදාළ කර ගත යුතු වුවත්, සමාගම විසින් සේවකයන්ගේ මූලික වැටුප නොසලකා, ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරන අවම මාසික වේතනයට පමණක් දායක මුදල් ගණනය කර තිබුණි.

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව එක් එක් ලිත් වර්ෂයකට වරක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු වුවත්, 2015 හා 2016 වර්ෂවලට අදාළව මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාගමෙහි ඉලක්කයන් නිශ්චිතව හඳුනාගෙන දිගුකාලීන හා කෙටිකාලීන සැලසුම් සකස් කර ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම කෙරෙහි කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණු බව පහත සඳහන් කරුණු අනුව සනාථ වී තිබුණි.

- සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයට අනුව සී/ස තරුණ සේවා (පුද්) සමාගමට විවිධ ක්ෂේත්‍ර 56 ක් යටතේ තම සේවාවන් පුළුල් කර ව්‍යාපාරික කටයුතු කිරීමට හැකියාව තිබුණත්, සමාගම ආරම්භ කර වර්ෂ 35 ක් ඉක්මවා තිබුණ ද මුද්‍රණාලය, ආපන ශාලාව, පවිත්‍රතා සහ ආරක්ෂක යන ක්ෂේත්‍ර 4 ක් සඳහා පමණක් තම ව්‍යාපාරික කටයුතු සීමාකර තිබුණි.

- සමාගම වෙත ණය ප්‍රතිපත්තියක් මෙන්ම ණය පදනම මත සේවාවන් ලබාදීමේදී විධිමත් ක්‍රමවේදයක් හා ගිවිසුම්ගත බැඳීමක් නොතිබුණු අතර 2016 මාර්තු 31 දිනට සමාගම වෙත ලැබිය යුතු එකතුව රු.මිලියන 98ක් වූ ණය ශේෂවලින් රු.මිලියන 36 ක් වර්ෂකට වඩා පැරණි ශේෂ විය. එම ණය අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක්

සමාගමට නොමැති වීම හේතුවෙන් තම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ පොලියක් යටතේ බැංකු අයිරාවලින් සපුරාගෙන තිබුණි.

- නව බඳවාගැනීම් සිදුකිරීමේදී හා තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමේදී අනුමත බඳවාගැනීමේ පරිපාටියේ ඇතුළත් වැටුප් තලවල නිලධාරීන් පිහිටවිය යුතු වුවත්, එකම තනතුර සඳහා බඳවාගත් නිලධාරීන්ට විවිධ වැටුප් තලවල පිහිටුවා ඒ අනුව වැටුප් ගෙවා තිබුණි.

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධනය

ග්‍රාමීය ප්‍රජාව හා අවදානම් සහිත කණ්ඩායම් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම තුළින් සෞභාග්‍ය කරා යොමු කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව ඇත.

- සමාජ සවිබල ගැන්වීම හා සුභසාධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- වැඩිහිටියන් රැකබලා ගැනිම හා ආරක්ෂණය.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ දුබලතාවයන් හඳුනා ගැනීම සහ පුනරුත්ථාපනය සිදු කිරිම.
- දිවි නැගුම වැඩසටහන ක්‍රියාත්මක කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශිය ආර්ථික සංවර්ධනය කිරීම.
- මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගින්ට, ලාදුරු රෝගීන්ට, පිලිකා, තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ආධාර ලබාදීම.
- උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම.
- සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

සමාජ සවිබල ගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන 05 ක් මගින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

අඩු ආදායම්ලාභි වයස අවුරුදු 70 ට වැඩි පුරවැසියන් සඳහා දීමනාවක් ලබාදීම

අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70 ට වැඩි පුරවැසියන් සඳහා රු.2,000 ක දීමනාවක් ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 9,262.37 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත සලසා තිබුණි. ඉන් රු.මිලියන 9,059.59 ක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 202.78 ක් ඉතිරි වී තිබුණි. එසේම මෙම දීමනාවෙන් නැවත රු.100 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබා දීමට 2016 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී එසේ ලැබී තිබුණු රු.මිලියන 427.70 ක් 2017 ජූලි 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

වකුගඩු රෝගීන් සඳහා ආධාර ලබාදීම

වකුගඩු රෝගීන් සඳහා ආධාර ලබාදීම සඳහා රු.මිලියන 667.22 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 486.80 ක් උපයෝජනය කර තිබුණු අතර වර්ෂය අවසාන වන විට රු.මිලියන 180.42 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. 2016 වර්ෂයේදී හඳුනාගත් රෝගීන් 19,645 කින් රෝගීන් 15,453 කට පමණක් ආධාර ගෙවා තිබුණි. කෙසේ වුවද, පොරොත්තු ලේඛනයේ ආධාර අපේක්ෂිතව රෝගීන් 4,192 ක් සිටියද, ඒ පිළිබඳව අමාත්‍යාංශය අවධානය යොමු කර නොතිබුණි.

තීරු බදු සහන ලබාගත් භාණ්ඩ බෙදාදීම

සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය නොවන සංවිධාන විසින් සමාජ සත්කාරකයක් ලෙස ශ්‍රී ලංකාවට ලබාදී තිබූ ගණනය කළ හැකි වටිනාකම රු.මිලියන 1.5 ක උපකරණ වර්ග 08 ක ඒකක 24,610 ක් තීරු බදුවලින් නිදහස් කිරීමේ සහතිකයක් අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණි. කෙසේ නමුත් පරිත්‍යාග අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ආබාධිත පුද්ගලයන් අතර බෙදාදීමක් සිදු වී නොතිබුණි. එහෙයින් මෙම භාණ්ඩ බෙදා දුන් අය පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ආබාධිත පුද්ගලයින්ට නිවාස ආධාර ගෙවීම

අඩු ආදායම් ලබන ආබාධිත පුද්ගලයින්ට නිවාස ආධාර ගෙවීම 2007 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 22 ක ඉදිවෙමින් පවතින නිවාස 329 ක් සඳහා රු.මිලියන 3.58 ක් ලබාදිය යුතුව තිබුණද, ඒ සඳහා රු.මිලියන 21.58 ක් ලබා දී තිබුණි. ඒ අනුව නිවාස ආධාර ලබාදීමේ ක්‍රමවේදය සැලැසුම් සහගතව සිදු වී නොතිබුණි.

හඳුනා නොගත් තැන්පතු

සමාජ ආරක්ෂණ ක්‍රමය යටතේ බැංකු මගින් රැස් කරන වාරික සටහන් කිරීමේදී දායකයා හඳුනා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබුණි. මේ නිසා 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 9.57 ක හඳුනා නොගත් තැන්පතු ප්‍රමාණයක් පැවැතුණි.

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම් පවරා නොගැනීම

සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 08 කට අයත් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 24.45 ක් වූ අතර, එම ඉඩම් විධිමත් ලෙස පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවට අයත් ඉඩම්

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවට අයත් කතරගම වැඩිහිටි නිවාසය, කතරගම සංචාරක නිකේතනය, මාළිගාතැන්න වැඩිහිටි නිවාසය සහ නිවිතිගල නිල්වලා සෙවන ආබාධිත මධ්‍යස්ථානයන්ට අයත් ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කර විධිමත් ලෙස පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ස්ථාවර වත්කම් පාලනය

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ආයතන විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබීමත්, දෙපාර්තමේන්තුව විසින් වත්කම් ලේඛනගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබීමත් හේතුවෙන් ඒකාබද්ධ කරන ලද ආයතනවල ඇවර කිරීමේ ගිණුම්වල ඇතුළත් වූ රු.මිලියන 2,340.26 ක ස්ථාවර වත්කම් හා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමෙන් පසු මිලදී ගත් රු.මිලියන 29.04 ක ස්ථාවර වත්කම්වල නිවැරදිතාවය සනාථ කර ගැනිමට නොහැකි විය.

ලැබිය යුතු ණය ශේෂ අයකර ගැනීම

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි 03 හි 2013 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශවල අයවිය යුතු ශේෂ පිළිවෙලින් රු.මිලියන 289.03 ක්, රු.මිලියන 26.58 ක් හා රු. මිලියන 0.64 ක් වශයෙන් එකතුව රු.මිලියන 316.25 ක්

2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තු විෂය පථයට අයත් නොවූ කාර්යයන් සිදු කිරීම

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය පථයෙන් බැහැරවූ කාර්යයන් ලෙස පහත හේවාහැට ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, රිකිල්ලගස්කඩ බස් නැවතුම්පල සංවර්ධනය කිරීම හා පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල්වල දරුවන්ට ශිර්ෂාභරණ මිලදී ගැනීම යන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම පළාත් සභාවට රු. මිලියන 46.83 ක් ලබා දී තිබුණු අතර, එයින් පහත හේවාහැට ජලයොජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදුන් රු.මිලියන 32.5 ක් අදාළ කාර්යය ඉටු නොකර පළාත් සභා ගිණුමේ රඳවාගෙන තිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරවීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලින් බැහැරව කටයුතු කර රු.මිලියන 7.17 ක් වැය කරමින් සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන් මග සම්බන්ධ වැඩ මුළුවක් පැවැත්වීම, දෙපාර්තමේන්තුවේ තේමා ගීතය සංශෝධනය කිරීම හා පරිගණක ටැබ් යන්ත්‍ර 25 ක් මිලදී ගැනීම යන ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. සමෘද්ධි සංවර්ධන නිලධාරී පුරප්පාඩු 3771 ක් පිරවීමේ තරඟ විභාගය පැවැත්වීම සඳහා විධිමත් ලිඛිත ගිවිසුමකින් තොරව රු.මිලියන 97.58 ක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

මූල්‍ය අක්‍රමිකතා අයකර නොගැනීම

2014 ජනවාරි මාසයේ සිට 2016 ජනවාරි මාසය දක්වා කාලය තුළ මහනුවර දිස්ත්‍රික් දිවි නැගුම කාර්යාලයේ සිදුකර තිබු රු.මිලියන 23.41 ක මූල්‍ය වංචාව හා 2015 වර්ෂයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුකර තිබූ රු.මිලියන 1.02 ක මුදල් වංචාව අයකර ගැනීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

දිවි නැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 81 ක වර්ෂ ගණනාවක් මුළුල්ලේ සිදුකර තිබුණු එකතුව රු.මිලියන 120.93 ක් වූ මූල්‍ය වංචා සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර එම අලාභයන් අයකර ගැනීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. තවත් බැංකු හා බැංකු සමිති 25 ක සිදු කර තිබු මූල්‍ය වංචාවන්හි වටිනාකම ගණනය කර නොතිබුණි.

පාරිතෝෂික සඳහා අධිභාර ගෙවීම

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරි තුනෙහි නිලධාරීන් 14,403 දෙනෙකු සඳහා ගණනය කළ රු.මිලියන 3,327.66 ක් වූ පාරිතෝෂික මුදල ගෙවීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාද වීම හේතුවෙන් 1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව සියයට 30 ක් බැගින් ගණනය කළ අධිභාරය රු.මිලියන 998.30 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එයින් නිලධාරීන් 3,307 දෙනෙකුට අදාළ එකතුව රු.මිලියන 292.04 ක අධිභාර ගෙවා තිබුණි.

දිවි නැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති පවත්වා ගෙන යනු ලබන ඉඩම් හා ගොඩනැගිලි

දිවි නැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 1,405 ක් අතරින් බැංකු 1,115 ක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

දිවි නැගුම සමාජ සංවර්ධන පදනම

ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය නිමිති කර ගෙන පවත්වනු ලබන කොඩි අලෙවි වැඩසටහනින් රැස් කරන මුදලින් අඩු ආදායම්ලාභි දිළිඳු ජනතාවගේ ගැටළුවලට ආධාර උපකාර කිරීමේ අරමුණින් දිවි නැගුම ප්‍රජාමූල බැංකුවල පවත්වාගෙන යනු ලබන දිවි නැගුම සමාජ සංවර්ධන පදනම ව්‍යවස්ථාපිත කර එහි කාර්යයන් විධිමත් පරිදි සැලැසුම් කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම අරමුදලේ ශේෂය රු. මිලියන 218.28 ක් වී තිබුණි. තවද, නිශ්චිත අලෙවි මිලක් රහිතව කොඩි අලෙවි කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී රැස්කරගෙන තිබූ රු.මිලියන 229.63 ක ආදායමේ නිවැරදිතාවය සනාථ කර ගැනීමට නොහැකි විය.

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ

විද්‍යාත්මක පර්යේෂණවල නිරතවීමෙන් හා විද්‍යා හා තාක්ෂණය ප්‍රචලිත කිරීම හරහා ශ්‍රී ලංකාව විද්‍යාත්මකව හා තාක්ෂණකත්වයෙන් උසස් රටක් බවට දියුණු කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 13 ක් ස්ථාපිත කර තිබුණි. එම ආයතන විසින් පහත සඳහන් කාර්යභාරයයන් ඉටු කළ යුතුව තිබුණි.

- විද්‍යා, තාක්ෂණය හා පර්යේෂණ විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල අන්තර්ජාතිකව සිදුවන නව සොයාගැනීම්වලට අනුගත වනසේ දේශීය පර්යේෂණ හා සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- විද්‍යාත්මක, කාර්මික, සමාජ හා ආර්ථික පර්යේෂණ, සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලැසුම් කිරීම හා මෙහෙයවීම.
- නව පර්යේෂණ ප්‍රතිඵල අදාළ පාර්ශවයන් වෙත ලබාදීම.
- ප්‍රමිතීන් පැනවීම හා පාලනය.
- වෙනත් අමාත්‍යාංශ විෂය පථය යටතේ ගැනෙන පර්යේෂණ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ සඳහා තාක්ෂණික සහය ලබාදීම.
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ඉදිකිරීම් කර්මාන්තය ප්‍රවර්ධනය, සංවර්ධනය සඳහා වූ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

විදාතා මධ්‍යස්ථානවල අධීක්ෂණය

විද්‍යාත්මක, කාර්මික, සමාජ හා ආර්ථික පර්යේෂණ සංවර්ධන පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම වෙනුවෙන් ස්ථාපිත කර තිබූ විදාතා මධ්‍යස්ථානවල කටයුතු වෙනුවෙන් 2016 වර්ෂය සඳහා රු.මිලියන 30 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 23.8 ක් පමණක් උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශය යටතේ පවත්නා විදාත මධ්‍යස්ථාන පිළිබඳව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- මධ්‍යස්ථාන වෙත ප්‍රමාණවත් නිලධාරීන් හා සම්පත් ලබා දී නොතිබුණු බැවින් ඒවා විධිමත් පරිදි පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි.
- පැමිණීමේ හා පිටවීමේ ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණු අතර, අදාළ මධ්‍යස්ථානවල නිලධාරීන් රැඳී සිටීම පිළිබඳ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවැතුණි.
- විදාතා මධ්‍යස්ථාන විසින් කරනු ලබන කාර්යන් පිළිබඳව අමාත්‍යාංශයේ අධීක්ෂණය සිදු වී ඇති බව තහවුරු කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර, එම මධ්‍යස්ථාන හා අමාත්‍යාංශය අතර සම්බන්ධතාවය දුර්වල මට්ටමක පැවැතුණි.

- අමාත්‍යාංශය විසින් සපයා තිබූ සමහර යන්ත්‍ර උපකරණ ඌන උපයෝජිතව හෝ භාවිතයකින් තොරව පැවැතුණි.
- පිළියෙල කරන ලද සමහර ව්‍යාපෘතිවලට අමාත්‍යාංශයේ අනුමැතිය ලබාදීම හා ඒ සඳහා අවශ්‍ය මුදල් ලබාදීම ප්‍රමාද වී තිබුණි.

පරීක්ෂණාගාර සහ ක්‍රමාංකන ආයතන ප්‍රතීතනය

හඳුනාගත් ප්‍රතීතනයන්ට ලක්විය යුතු පරීක්ෂණාගාර සහ ක්‍රමාංකන ආයතන ප්‍රමාණය 184 ක් වුවද, 2016 දෙසැම්බර් 31 දින වන විට එයින් ආයතන 72 ක් පමණ ප්‍රතීතනය කර තිබුණි. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් ප්‍රතීතන සහතිකය ලබාගෙන තිබූ ආයතන 72 කින් ආයතන 11 ක් නැවත ප්‍රතීතනය සහතික ලබාගැනීමෙන් ඉවත් වී තිබුණි.

වෛද්‍ය රසායනාගාර ප්‍රතීතනය

හඳුනාගත් ප්‍රතීතනයන්ට ලක්විය යුතු වෛද්‍ය රසායනාගාර 311 ක් පැවතියද, 2016 දෙසැම්බර් 31 දින වන විට අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ආයතන 22 ක් පමණක් ප්‍රතීතනයට ලක්කර තිබුණි. ප්‍රතීතන සහතිකය ලබාගෙන තිබූ ආයතන 22 කින් ආයතන 05 ක් නැවත ප්‍රතීතන සහතික ලබා ගැනීමෙන් ඉවත් වී තිබුණි.

ආර්ථික නොවන වියදම්

ප්‍රතීතනයන්ට අයදුම්කිරීම කාර්යක්ෂම කිරීම සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් හඳුන්වා දී තිබූ මාර්ග ගත පරිගණක පද්ධතියේ සේවා කිරීමේ ගාස්තු වශයෙන් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.මිලියන 2.53 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. මෙම මෘදුකාංගයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව 2016 මාර්තු 31 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙන් (ICTA) විමසා තිබූ අතර එම ආයතනය විසින් එම මෘදුකාංගය වර්තමාන අවශ්‍යතාවයන්ට නොගැලපෙන බව ප්‍රකාශ කර තිබුණි. ඒ අනුව සිදු කර තිබුණු වියදම අනාර්ථික වී තිබුණි.

මාගරින් සඳහා වන ප්‍රමිතිය පරීක්ෂා කිරීම

සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික සමාගමක් විසින් අවස්ථා 32 කදී ආනයනය කරන ලද ඇ.ඩොලර් 501,472 ක් වටිනා මාගරින් කිලෝග්‍රෑම් 732,703 ක් සඳහා සාම්පල් පරීක්ෂාව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිදුකර තිබුණද, මාගරින් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති 1427:2011 හි 5.6 වගන්තිය ප්‍රකාරව සිදු කළ යුතු බැර ලෝහ පිළිබඳ පරීක්ෂාව කිසිදු අවස්ථාවක දි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිදුකර නොතිබුණි.

නව නිපයුම්කරුවන් වෙනුවෙන් මූල්‍ය, තාක්ෂණ හා වෙළඳ සහාය ලබාදීම

නව නිපැයුම්කරුවන් වෙනුවෙන් මූල්‍ය, තාක්ෂණික හා වෙළඳ ආධාර ලබාදීම සඳහා නව නිපැයුම්කරුවන් තෝරා ගැනීම සඳහා වැඩසටහන් දෙකක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම විසින් පවත්වා තිබුණි. ඉන් “Invent – 2015” වැඩසටහන යටතේ නිපැයුම්කරුවන් 14 දෙනෙකු ඇගයීම් කර එක් නිපැයුම්කරුවකු පමණක් තෝරා ගෙන තිබුණු අතර, නව නිපැයුම්කරුවන් 07 දෙනෙකුට තාක්ෂණික හා වෙළඳපොල සහාය ලබා දීමට සුදුසු බව ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. නමුත් එම සහාය ලබාදීමට කොමිෂම කටයුතු කර නොතිබුණි. “නව නිපැයුම් දිරිය - 2016” වැඩසටහනෙහි දී නව නිපැයුම්කරුවන් 16

දෙනෙකු වෙත මූල්‍ය තාක්ෂණික හා වාණිජ සහාය ලබාදීමට ඇගයීම් කමිටුව නිර්දේෂ කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

නව නිපැයුම් කව පිහිටුවීම හා සම්මන්ත්‍රණ පැවැත්වීම

සමාලෝචිත වර්ෂය තුළදී පාසල්, විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල, වණිජ ක්ෂේත්‍රය හා පර්යේෂණ ආයතන තුළ නව නිපැයුම් කව පිහිටුවීම හා නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිෂම විසින් රු.මිලියන 1.12 ක් වැය කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී කිසිදු නිර්මාණාත්මක කවයක් එම අංශවල පිහිටුවා නොතිබුණි. තවද, 2016 වර්ෂයට පෙර පිහිටුවා තිබූ නව නිපැයුම් කව 163 ක් අතරින් කව 136 ක් පාසල්වල සථාපිත කව විය. එසේ වුවද, පාසල් අංශයට සාපේක්ෂව කාර්මික විද්‍යාල හා විශ්ව විද්‍යාල සිසුන්ගේ නිර්මාණාත්මක හැකියාව හා නව නිපැයුම් වාණිජකරණ කිරීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතියද එම අංශවල එක් කවයක් පමණක් ස්ථාපිත කර තිබුණි.

නව නිපැයුම් ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි වාණිජකරණය කිරීම

නව නිපැයුම්කරුවන්ගේ, නව නිපැයුම් ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි වාණිජකරණය කිරීම සඳහා උපකාර කිරීම ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසමේ කාර්යයක් වුවද, සමාලෝචිත වර්ෂයේදී වාණිජකරණය සඳහා නව නිපැයුම් 04 ක් සඳහා පමණක් එම සහය ලබාදී තිබුණි.

සහසක් නිපැයුම් ප්‍රදර්ශනය 2016

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම විසින් ක්‍රියාත්මක කළ "සහසක් නිමැවුම ප්‍රදර්ශනය 2016" වැඩසටහන සඳහා විවෘත, විශ්ව විද්‍යාල, පාසල් සහ වාණිජ අංශයන්ගෙන් ඉදිරිපත් වූ නිමැවුම් සංඛ්‍යාව 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 41 කින් වැඩි වී තිබුණි. නමුත් 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී එය සියයට 4 කින් අඩු වී තිබුණි. එහෙත් 2016 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා වූ වියදම 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 25 කින් වර්ධනය වී තිබුණි. තවද පාසල් අංශය හැර අනිකුත් සියලුම අංශවලින් ඉදිරිපත් වූ නිමැවුම් ප්‍රමාණය අඩු වී තිබුණි.

පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ජාතික පර්යේෂණ සභාව විසින් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.මිලියන 303.08 ක් වටිනා පර්යේෂණ ව්‍යාපෘති 82 ක් අවසන් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- පර්යේෂණ ව්‍යාපෘති 41 ක් සඳහා රු.මිලියන 127.08 ක් වැය කර තිබුණද, එම පර්යේෂණවලින් කිසිදු දේශීය හෝ විදේශීය ප්‍රකාශනයක් පලකර නොතිබුණි.
- පර්යේෂණ ව්‍යාපෘති 51 ක් සඳහා රු.මිලියන 160.18 ක් වැය තිබුණද, භාණ්ඩයක් හෝ සේවයක් නිර්මාණය කර තිබූ ව්‍යාපෘති 31කින් ව්‍යාපෘති 02 ක් සඳහා පමණක් ජාතික පර්යේෂණ සභාව විසින් පේටන්ට් බලපත්‍ර ලබා දී තිබුණි.
- ජාතික පර්යේෂණ සභාව විසින් පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී පර්යේෂණය ආරම්භ කරන අවස්ථාවේදීම වර්ෂ 03 ක කාලපරිච්ඡේදයකට අදාළ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඒ ඒ ව්‍යාපෘති යටතේ වූ ජංගම ගිණුමකට බැර කර තිබුණි. ඒ අනුව මූල්‍ය අවශ්‍යතාවය හඳුනා නොගෙන එකවර මුදල් ලබාදී තිබුණි. මේ නිසා 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවලින් ව්‍යපෘති 138 කට අදාළව

රු.මිලියන 504.13 ක් එසේ ජංගම ගිණුම්වලට මුදල් තැන්පත් කර තිබුණි. මේ නිසා එම මුදල්වලින් ජංගම ගිණුම්වල වූ ශේෂ 2016 දෙසැම්බර් 31 දින වන විට කිසිදු ප්‍රතිලාභයක් නොලබා නිෂ්කාර්යව රඳවා තිබුණි.

පර්යේෂණ ව්‍යාපෘති සඳහා තාක්ෂණ පැවැරුම් ලබාදීම

2014 – 2016 කාලපරිච්ඡේදය තුළ වටිනාකම රු.මිලියන 111.29 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 64 ක් අවසන් කර තිබුණි. එම ව්‍යාපෘති 64 හි අවසාන ප්‍රතිඵල ලෙස දේශීය හා විදේශීය විද්‍යාත්මක ප්‍රකාශන ඵල කිරීම, පශ්චාත් දර්ශනපති, දර්ශනශූරි උපාධි සඳහා යොදා ගැනීම හා ජනාධිපති සම්මාන සඳහා නිර්දේශ වීම යන අරමුණු ඉටුවී තිබුණි. නමුත් ජාතික විද්‍යා පදනම විසින් එම ව්‍යාපෘති 64 කින් කිසිදු ව්‍යාපෘතියක් සඳහා තාක්ෂණ පැවරුම් (වාණිජකරණය කිරීම සඳහා වැඩිදියුණු කිරීම) ලබා දීම හෝ කිසිදු ව්‍යාපෘතියක් සඳහා පේටන්ට් ලබා ගැනීමද සිදු කර නොතිබුණි.

වාර්ෂික පර්යේෂණ සම්මාන හිමිකර නොගැනීම

ජාතික විද්‍යා පදනම විසින් 2015 වර්ෂයේ නිම කරන ලද රු.මිලියන 27.53 ක් වටිනා පර්යේෂණ ව්‍යාපෘති 21 ක් අතරින් එකම පර්යේෂණ ව්‍යාපෘතියක්වත් 2016 වර්ෂයේදී වාර්ෂික පර්යේෂණ සම්මාන හිමිකර ගැනීම සඳහා සුදුසුකම් ලබාගෙන නොතිබුණි.

සන්නිවේදනය

ඩිජිටල් කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවා ළගාකර ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම මගින්, ඩිජිටල් සේවා හා නිෂ්පාදන ජනප්‍රිය කරවීම මගින් හා ජනතාවගේ ඩිජිටල් සාක්ෂරතාවය ඉහළ නැංවීම මගින් ඩිජිටල් බලාත්මක ජාතියක් ගොඩනැගීම මෙම ක්ෂේත්‍ර යේ අරමුණ වි තිබුණි. එම අරමුණ සාකෂාත් කර ගැනිම සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය හා ඒ යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 ක් ස්ථාපිත කර තිබුණි. එම ආයතනවලින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට විදුලි සංදේශ පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම
- රාජ්‍ය අංශයේ සේවා සැපයීමේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා උචිත තොරතුරු තාක්ෂණ විසඳුම් යොදා ගැනීමට සහය විම.
- පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරිම දිරි ගැන්විම සඳහා ක්‍රමෝපායන් සැකසීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදි අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ස්ථාවර දුරකථන සේවා ග්‍රාහක සංඛ්‍යාව

ශ්‍රී ලංකාවේ ස්ථාවර දුරකථන සේවා ග්‍රාහක සංඛ්‍යාව 2011 වර්ෂයේ මිලියන 3.6 ක සිට 2016 වර්ෂය වන විට මිලියන 2.55 ක් දක්වා සියයට 29 ක් අඩු වී තිබුණු අතර පසුගිය වසර 10 ක කාලය තුල ජංගම දුරකථන අංශයේ සංයුක්ත වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරමින් 2005 වර්ෂයේ මිලියන 3.36 ක් වූ ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 2016 වර්ෂයේදී මිලියන 26.23 දක්වා සියයට 680 කින් වර්ධනය වී තිබුණි. මෙහිදී දුරකථන ඝනත්වය පුද්ගලයන් 100 කට 123.7 දක්වා වර්ධනය වී තිබුණද සක්‍රීය ග්‍රාහක අනන්‍යතා මොඩියුල් පත් (sim cards) සැලකිය යුතු ප්‍රමාණයක් තනි හා එකම පුද්ගලයකු විසින් භාවිතා කරන බැවින් මෙම සංඛ්‍යාවලින් සත්‍ය තත්ත්වය පිළිඹිබු වී නොතිබුණි. විස්තර රූපසටහන ..... හි දැක්වේ.

අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව

ස්ථාවර අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව 2015 වර්ෂයේ 682,512 ක සිට 2016 වර්ෂයේදී 929,089 ක් දක්වා සියයට 36 කින්ද, ජංගම දුරකථන අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව 2015 වර්ෂයේ 3,408,408 ක සිට 2016 වර්ෂයේදී 3,991,465 ක් දක්වා සියයට 17 කින්ද වර්ධනය වී තිබුණි. විස්තර රූපසටහන 29 හි දැක්වේ.

රූපසටහන 29 : ස්ථාවර දුරකථන, ජංගම දුරකථන හා අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව

රාජ්‍ය සමාගම අත්කර ගෙන ඇති වෙළඳපොළ කොටස

විදුලි සංදේශ කර්මාන්තය තුළ ස්ථාවර දුරකථන මුළු ග්‍රාහක සංඛ්‍යාව 2016 වර්ෂයේදී 2,550,432 ක් වී තිබුණත්, එම සීමාව ඉක්මවා ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 26,227,631 ක් වී තිබුණි. අන්තර් ජාල ග්‍රහක සංඛ්‍යාව ස්ථාවර දුරකථන මාර්ගයෙන් 929,089 ක් වී තිබුණත් එම ප්‍රමාණය ඉක්මවා ජංගම දුරකථන භාවිතයෙන් අන්තර්ජාල පහසුකම් ලබා ගන්නා ග්‍රාහක සංඛ්‍යාව 3,991,465 ක් වී තිබුණි. විස්තර රූපසටහන 30 හි දැක්වේ.

රූපසටහන - 30 - විදුලි සංදේශ කර්මාන්තයේ සථාවර හා ජංගම දූරකථන භාවිතය

විදුලි සංදේශ කර්මාන්තය තුළ ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල් සමාගම් විසින් මුළු විදුලි සංදේශ කර්මාන්තයේ වෙළඳපල කොටස සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දිනට දුරකථන, අන්තර්ජාල, ග්‍රාහක සංඛ්‍යාත්මක දත්ත පහත සඳහන් රූපසටහන 31 හි දැක්වේ.

රූපසටහන 31 - ශ්‍රී ලංකා ටෙලිකොම් හා මොබිටෙල් අත්පත් කර ගෙන ඇති වෙළෙඳපොළ කොටස

දුරකථන කතා කාලය සලකා බැලීමේදී 2015 වර්ෂය දක්වා ක්‍රමයෙන් වර්ධනය වූ දේශීය කතා කාලය 2016 වර්ෂයේදී මිනිත්තු 64,206,794 කින් එනම් සියයට 8 කින් අඩුවී තිබුණි. 2012 වර්ෂයේ මිනිත්තු 2,023,274,456 ක් වූ ජාත්‍යන්තර කතා කාලය 2016 වර්ෂයේ දී 1,083,162,251 දක්වා සියයට 46 කින් අඩුවී තිබුණි. ස්මාර්ට් ෆෝන් (smart phone) භාවිතයේ සහ ඕවර් ද ටොප් (Over – the – top) මොබයිල් ඇප්ලිකේෂන් භාවිතය සහ රජයේ බදු ප්‍රතිපත්තියේ වූ වෙනස්වීම් මේ සඳහා බලපා තිබුණි.

පාසල් පරිගණක විද්‍යාගාර ව්‍යාපෘතිය

2016 වර්ෂයේ, අදියර 1 යටතේ දැනට පරිගණක විද්‍යාගාර පවතින පාසල් 45 ක් සඳහා පරිගණක හා උපාංග සැපයීම සහ අදියර 2 යටතේ නව පරිගණක විද්‍යාගාර හා නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සැලසුම් කර තිබුණි. ඒ සඳහා රු. මිලියන 250 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට අදියර 1 යටතේ පරිගණක විද්‍යාගාර 38 ක් සඳහා පමණක් පරිගණක හා උපාංග ලබාදී තිබුණ අතර පාසල් 06 ක් සඳහා උපාංග කිහිපයක් ලබා දී තිබුණි. අදියර 2 යටතේ නව පරිගණක විද්‍යාගාර 59 ක් පිහිටුවා තිබුණි. ඒ සඳහා රු.මිලියන 146.37 ක් වැය වී තිබුණි. ඒ අනුව රු.මිලියන 103.63 ක ප්‍රතිපාදන අපේක්ෂිත කාර්ය සඳහා උපයෝජනය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් අනාවරණය විය.

- 2016 වර්ෂයේදී අදියර II යටතේ නව පරිගණක විද්‍යාගාර හා නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වූ ප්‍රමාණය ගණනය කර සැලැසුම් පිළියෙල කර නොතිබුණි.
- 2016 වර්ෂයේදී ස්ථාපිත කළ පරිගණක විද්‍යාගාර 59 කින් 30 ක් බදුල්ල දිස්ත්‍රික්කය ලබා දී තිබීම නිසා සම්පත් බෙදාදීමේ විෂමතාවයක් පැවැතුණි.
- බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් පරිගණක අළුත්වැඩියා කිරීමේ වැඩසටහන සඳහා බ/භාරති මහා විද්‍යාලයට හා බ/උදයරාජ මහා විද්‍යාලයට රු.200,000 ක් බැගින් රු.400,000 ක් ලබා දී තිබුණත්, එම පරිගණක සම්බන්ධයෙන් කිසිදු අළුත්වැඩියා කිරීමක් සිදු කර නොතිබුණි.
- ස්ථාපිත කරන ලද පරිගණක විද්‍යාගාර සඳහා 2016 වර්ෂයේදී ගුරුවරුන් 500 ක් පුහුණු කිරීමට යෝජිතව තිබුණු නමුත් ගුරුවරුන් 432 ක් පමණක් පුහුණු කර තිබුණි.

දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන

දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර, එමගින් දිවයින පුරා දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන 25 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් අනාවරණය වූ අඩුපාඩු පහත සඳහන් වේ.

- 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පරිගණක තාක්ෂණ මධ්‍යස්ථාන 06 ක් ස්ථාපිත කිරීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් කිසිදු තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර නොතිබුණි.
- 2014 වර්ෂයේ සිට අවිච්ඡේදව පැවති අම්පාර, කළුතර, පුත්තලම, ගාල්ල, මාතලේ, කෑගල්ල, වවුනියාව හා බදුල්ල යන ස්ථානවල දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 08 ක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂයේදී පරිගණක

හා අනෙකුත් උපකරණ ලබා දී තිබුණි. වියදම රු.මිලියන 19.02 ක් විය. එසේ වුවද, කෑගල්ල, ගාල්ල, බදුල්ල හා මාතලේ යන දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතිණි.

- වව්නියාව, අම්පාර, පුත්තලම හා කළුතර තොරතුරු මධ්‍යස්ථානවල ප්‍රගතිය වාර්තා වී නොතිබුණු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට අවබෝධයක්ද ලබාදී නොතිබුණි.

තොරතුරු තාක්ෂණ උද්‍යාන පිහිටුවීම

ප්‍රාදේශීය ජනතාවගේ තොරතුරු තාක්ෂණ දැනුම දියුණු කිරීමේ අරමුණ ඇතිව යාපනය හා මන්නාරම පිහිටුවා ඇති තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා වාර්ෂිකව පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණි.

යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය

2013 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා මෙම තාක්ෂණ උද්‍යානය සඳහා රු. මිලියන 27.98 ක් වැයකර, පරිගණක පුහුණුව 525 දෙනෙකුට පමණක් ලබාදී තිබුණි. මෙම කාලය තුළ ලද ආදායම රු. 953,489 ක් වී තිබුණත්, වියදමට සාපේක්ෂ ආදායම සියයට 3.4 ක් වී තිබුණි. 2016 වර්ෂය තුළදී පාඨමාලා 13 ක් පැවැත්වීමටත් හා එයින් සිසුන් 245 ක් පුහුණු කිරීමටත් අපේක්ෂා කර තිබුණි. එහෙත් පාඨමාලා දෙකකට පමණක් සිසුන් 81 ක් සහභාගි වී තිබුණි.

මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය

2013 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා මෙම තාක්ෂණ උද්‍යානය සඳහා රු. මිලියන 17.7 ක් වැයකර තිබුණ අතර පරිගණක පුහුණුව 868 දෙනෙකුට ලබා දී තිබුණි. එම කාලය තුළ රු.මිලියන 3.13 ක ආදායමක් ලබාගෙන තිබුණද, එය වියදමට සාපේක්ෂව සියයට 17.67 ක් වී තිබුණි.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ශ්‍රී ලංකා රජයට පූර්ණ වශයෙන් අයත් සමාගමක් ලෙස වර්ෂ 05 ක කාලයක් සඳහා 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත යටතේ 2003 මැයි 18 දින ස්ථාපිත කර තිබුණි. 2003 ජූලි 16 දින ආයතනයේ මූල්‍ය හා පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගෙන තිබුණු අතර එමඟින් සමාගමට පූර්ණ ස්වාධීනත්වයක් ලබාදී තිබුණි. වර්ෂ 05 ක කාලය නිමාවීමෙන් පසු ආයතනයේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙනයාමට 2008 අංක 33 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත ක්‍රියාත්මක කර තිබුණ ද, උක්ත තීරණය සංශෝධනය කර නොතිබුණි.

මුල් කාලය තුල "ඊ ශ්‍රී ලංකා ව්‍යාපෘතිය", ලෝක බැංකුව, කොරියානු EXIM බැංකුව සහ අනිකුත් සංවර්ධන සහාය ආයතන කිහිපයක් මගින් අරමුදල් සැපයීමෙන් ක්‍රියාත්මක වුවද, වර්තමානයේදී සම්පූර්ණයෙන්ම රජයේ අරමුදල් මත ක්‍රියාත්මක වේ. එසේ වුවද, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2003 අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි වර්තමානය දක්වාම පූර්ණ ස්වාධිනත්වයකින් කටයුතු කරන අතර රජයේ නීති, රීති හා රෙගුලාසි අනුගමනය කර නොතිබුණි.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ පරිපාලිත සමාගම් දෙකකි. Computer Emergency Response team සමාගම Cyber Security සඳහා 2005 මැයි 19 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව 2005 අගෝස්තු 15 දින පිහිටුවා තිබුණි. Lanka Government information infrastructure සමාගම 2011 ජුනි 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව ලංකා රාජ්‍ය ජාලය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2011 ජූලි 18 දින පිහිටුවා තිබුණි.

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයක් හා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොතිබුණි. පරිපාලනය හා මූල්‍ය අංශයේ නිලධාරීන් ඇතුළුව ආයතනයේ සියළුම නිලධාරීන්, උපදේශකවරුන් හා සේවකයන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට මෙසේ බඳවාගෙන තිබූ සංඛ්‍යාව 187 ක් විය. නියෝජිතායතනය 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන කිසිවක් අනුගමනය කර නොතිබුණි.

2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත හා 2008 අංක 33 දරන සංශෝධන පනතට අනුව පිහිටුවිය යුතු අන්තර් අමාත්‍යාංශ කමිටුව වර්ෂ 12 කට පසුව 2015 ඔක්තෝබර් 16 දින පිහිටුවා තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වර්ෂ 12 ක අන්තර් අමාත්‍යාංශ කමිටුවේ අධීක්ෂණයට භාජනය කර නොතිබුණි.

ව්‍යාපෘති කාර්යසාධනය

2016 වර්ෂයේදී ව්‍යාපෘතීන් 65 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු අතර ඒ අතරින් ව්‍යාපෘති 55 ක් සඳහා ජාතික සැලැසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමි වී තිබුණි. මෙම නියෝජිතායතනය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රු. මිලියන 963 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු. මිලියන 651 ක් අමාත්‍යාංශය මඟින් ලබා දී තිබුණි.

නියෝජිතායතනය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියන්හි භෞතික කාර්යසාධනය ඉතා පහළ මට්ටමක පැවති අතර " ඊ - ස්වභිමානි " හොඳම ජාතික ඉලෙක්ට්‍රොනික අන්තර්ගතය සඳහා වන සම්මාන උළෙල පමණක් පවත්වා තිබුණි.

ඉතිරි ව්‍යාපෘති 54 කින් ව්‍යාපෘති 20 ක් සියයට 0 ක සිට සියයට 30 ක් අතර ප්‍රමාණයක්ද, ව්‍යාපෘති 27 ක් සියයට 31 ක සිට සියයට 60 ක් දක්වා ප්‍රමාණයක්ද, ව්‍යාපෘති 7 ක් සියයට 61 ක සිට සියයට 96 ක් දක්වා ප්‍රමාණයකද කාර්යසාධනයන් අත්කර ගෙන තිබුණි. මේ සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීමේදී සිදුවූ ප්‍රමාදවීම්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාද වීම්, ව්‍යාපෘති හා සම්බන්ධ අනෙකුත් ආයතනවල එකඟතාවය ලබාගැනීම ප්‍රමාදවීම්, ව්‍යාපෘතින්හි විෂය පථය වෙනස් කිරීම්, ලංකා රාජ්‍ය ජාලය (LGN) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම විශේෂයෙන් හේතු වී තිබුණි. ඊට අමතරව අක් මුදල් ලබා ගැනීමේ ප්‍රමාදයන්ද මේ සඳහා බලපා තිබුණු බව ආයතනයේ අදහස විය.

ණැනසල ව්‍යාපෘතිය

ග්‍රාමීය ජනතාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත සේවාවන් සඳහා යොමු කිරීම වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එසේ වුවද, 2014 දෙසැම්බර් 31 දින වන විට ස්ථාපිත කර තිබූ ණැනසල මධ්‍යස්ථාන 1,005 කින් මධ්‍යස්ථාන 336 ක් සම්පූර්ණයෙන්ම වසාදමා තිබුණි.

උසස් අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම, ගුණාත්මක සංවර්ධනයක් සහ අන්තර් ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල හා පශ්චාත් උපාධි ආයතන බිහිකිරීම තුළින් දැනුම් පාදක ආර්ථිකයක් කරා ළඟාවීමට හැකිවන පරිදි පුළුල් අධ්‍යාපන අවස්ථාවන් තහවුරු කර ගැනීම මෙම ක්ෂේත්‍රයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 40 කින් සමන්විත ආයතන විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- උසස් අධ්‍යාපන විෂයයන්ට හා එහි ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධව ජාතික ප්‍රතිපත්ති පදනම් කරගත් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

ආසියාවේ තෝරාගත් රටවල්හි ජල කළමනාකරණය සහ කාලගුණික විපර්යාසවලට අනුවර්තනයවීම පිළිබඳව ආයතනයන්හි ධාරිතා වර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය

ඉහත සඳහන් ව්‍යාපෘතිය (WASO- ASIA) වෙනුවෙන් 2015 හා 2016 වර්ෂවල පිළිවෙළින් රු.මිලියන 20.6 ක් හා රු.මිලියන 25 ක්ද වශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වර්ෂයේදී එම ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 52 ක් පමණක් වී තිබුණි.

රුහුණු විශ්වවිද්‍යාලයේ කලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඉහත සඳහන් ව්‍යාපෘතිය වෙනුවෙන් 2015 සහ 2016 වර්ෂවල පිළිවෙළින් රු.මිලියන 306 ක් හා රු.මිලියන 180 ක්ද වශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ව්‍යාපෘතිය 2017 නොවැම්බර් 06 දින වන විට නිම කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂ අවසාන වනවිට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 30 ක් පමණක් වී තිබුණි.

21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- මෙම ව්‍යාපෘතිය යටතේ දෙහිවල ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගුණාත්මක සංවර්ධන හා නායකත්ව මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා රු .මිලියන 80 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර 2016 මැයි මාසය වන විට අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2016 ජුනි 30 දින වන විට එම ව්‍යාපෘතියේ ඉදිකිරිම්වල භෞතික ප්‍රගතිය සියයට 60 ක ප්‍රමාණයක් වී තිබුණි. නියමිත දිනයට ව්‍යාපෘතිය සම්පූර්ණ නොකිරීම නිසා ඒ සඳහා සලසා තිබුණු රු.මිලියන 19 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

- 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ ජාතික විශ්වවිද්‍යාල 13ක සහ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් 240 දෙනෙකු සඳහා දර්ශනපති පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා රු.මිලියන 367 ක ප්‍රදාන ලබා දී තිබුණි. ව්‍යාපෘතිය අවසන් වන විට ප්‍රතිලාභීන් 30 දෙනෙකු විසින් උපාධි පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි.

- ව්‍යාපෘතිය යටතේ සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයට අදාළව පිටත පුහුණු ඒකකය පිහිටුවීම සඳහා 2016 මාර්තු 29 දින රු.මිලියන 2.4 ක් වටිනා ක්‍රීඩා උපකරණ, ආරක්ෂිත හිස් වැසුම් හා පුහුණු උපකරණ මිලදී ගෙන තිබුණි. එම පරිශ්‍රය පිහිටුවීම සඳහා අවශ්‍ය ඉඩකඩ වෙන්කර නොගැනීම හා අදාළ සැලැසුම් පිළියෙල කර නොතිබීම නිසා 2017 අප්‍රේල් මාසය වන විටත් එම භාණ්ඩ හා උපකරණ අනාරක්ෂිතව පැවැතුණි.

විශ්වවිද්‍යාල සිසු සිසුවියන් සඳහා නේවාසිකාගාර 60 ක් ඉදිකිරීමේ කඩිනම් ව්‍යාපෘතිය

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ශිෂ්‍ය නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට නේවාසික ශිෂ්‍යයන් සංඛ්‍යාව 12,000 කින් වැඩි කිරීම සඳහා එක් නේවාසිකාගාරයක් වෙනුවෙන් රු.මිලියන 220 ක සාමාන්‍ය වියදම් ඇස්තමේන්තු කර විශ්වවිද්‍යාල තුළ නේවාසිකාගාර 60 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු සම්පින්ඩනය කර පහත දක්වා ඇත.

- එහි පළමු අදියර යටතේ නේවාසිකාගාර 30 ක වැඩ අවසන් කර තිබූ අතර , 2013 ජූලි 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉතිරි නේවාසිකාගාර 30 හි වැඩ කටයුතු 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. 2016 වර්ෂය අවසාන වන විට නේවාසිකාගාර 15 ක ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 50 ක සිට සියයට 95 ක් අතර පරාසයක පැවතුණි. ඒ වන විට නේවාසිකාගාර 45 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, සිසු පරිහරණයට භාර නොදුන් නේවාසිකාගාර සංඛ්‍යාව 11 ක් වී තිබුණි.

- නේවාසිකාගාර ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව විශ්වවිද්‍යාල වෙත අදාළ ගොඩනැගිල්ල පවරා දීමෙන් අනතුරුව වර්ෂයක් ඇතුළත ඉදිකිරීම්වල දෝෂයන් එම ගොඩනැගිලි පරිහරණය කිරීමෙන් හඳුනාගෙන එම දෝෂයන් කොන්ත්‍රාත්කරුට දැන්වීමෙන් අනතුරුව අදාළ නිවැරදි කිරීම් කරගැනීමට හැකියාව තිබුණද සිසු අයිතියට භාර නොදුන් නේවාසිකාගාර 11 ක්

සම්බන්ධව ඉදිකිරීම් දෝෂ හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවලට පරිභාහිරව ලී බඩු උපකරණ, ජලය, විදුලිය, අකුණු සන්නායක සවිකිරීම ආදී පහසුකම් මෙන්ම අදාළ යටිතල පහසුකම් ඉදිකිරීම් නිමවීමට සමගාමීව ඉටුකිරීම පිළිබඳ අධීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය පැන නැගී තිබුණි.

මතභේදයට තුඩුදුන් ගනුදෙනු

ශ්‍රී ලංකා රජයේ ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පේරදෙණිය කෘෂිකර්ම පීඨයේ සත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව සහ කෘෂි තාක්ෂණය හා කළමනාකරණ පාඨමාලා (BSC Animal Science and Fisheries and Agricultural Technology and Management)යන පාඨමාලා සඳහා පැමිණ ලියාපදිංචි වී සිටි පකිස්ථාන සිසුන් දෙදෙනෙකු පසුව රාජ්‍ය නොවන උපාධි ප්‍රදාන ආයතනයක වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කරවීමට 2013 වර්ෂයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. එම සිසුන් දෙදෙනා වෙනුවෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය නොවන උපාධි ප්‍රදාන ආයතනය වෙත 2017 ජුනි මාසය දක්වා රු.මිලියන 3.15 ක් ගෙවා තිබුණද ඊට අදාළ විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ඉහත සඳහන් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ විවිධ පාඨමාලාවන් සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වන විදේශීය සිසුන් අදාළ පාඨමාලාව සම්පූර්ණ නොකර 2012/2013, 2013/2014, 2014/2015 හා 2015/2016 දක්වා වූ අධ්‍යයන වර්ෂ 04 ක් තුළ පිළිවෙළින් 04 ක්, 07 ක්, 10 ක් හා එක් අයෙකු වශයෙන් පාඨමාලා හැර ගොස් තිබුණි. ඒ අනුව 2012/2013 අධ්‍යයන වර්ෂයේදී පාඨාමාලා හැර ගොස් තිබූ සිසුන් සිවුදෙනා වෙනුවෙන් රු. මිලියන 1.73 ක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාලවලට ගෙවා තිබුණි. එම මුදලින් එම සිසුන් සිවුදෙනාගේ ඉතිරි පාඨමාලා කාලපරිච්ඡේදයට අදාළ රු.335,000 ක මුදල අදාළ විශ්වවිද්‍යාලවලින් ආපසු ගෙන්වා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

විශ්වවිද්‍යාලවලට දේශීය සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් කොළඹ, කැළණිය, ජයවර්ධනපුර වැනි ප්‍රධාන විශ්වවිද්‍යාලවල මෙන්ම අනෙකුත් විශ්වවිද්‍යාලවල පවත්වාගෙන යනු ලබන භෞතික විද්‍යාව, කෘෂි තාක්ෂණය හා කළමනාකරණය, ආහාර විද්‍යාව හා තාක්ෂණය, පරිගණක විද්‍යාව, ජෛව විද්‍යාව වැනි පාඨමාලා සඳහා සුදුසුකම් සපුරන සමහර සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි වී නොතිබුණු අවස්ථා විය. එම හේතුවෙන් ඇති වන සිසු පුරප්පාඩු සඳහා තවදුරටත් ඉල්ලුම් කර ඇති සිසුන් අතරින් පසුව බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2013/2014 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂය දක්වා පිළිවෙළින් 1,794 ක්, 1,455 ක් හා 1,695 ක් සිසු පුරප්පාඩු පැවතුණි. ඒ අනුව විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ සුදුසුකම් ලබා ඇති සිසුන් විශාල ප්‍රමාණයකට විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමේ වරම් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.

2015/2016 අධ්‍යයන වර්ෂයේදී පැවති පුරප්පාඩු 1,695 කින් පුරප්පාඩු 990 ක් වෙනුවෙන් විශ්වවිද්‍යාලවල විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන් වෙත ලියාපදිංචි වන ලෙස දන්වා යවා තිබූ නමුත්, ඇතැම් පාඨමාලාවල පවතින යල්පැන ගිය හා ගතානුගතිකභාවය නිසා විශ්වවිද්‍යාල ප්‍රවේශය භාර නොගැනීම නිසා පුරප්පාඩු

ඇති වී තිබුණු බව අනාවරණය විය. එසේම පීඨාධිපතිවරුන් විසින් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව සිසුන් අනුයුක්ත නොකරන ලෙසට ප්‍රතිපාදන කොමිෂම වෙත දන්වා තිබීම හේතුවෙන් එම පුරප්පාඩු පැන නැගී තිබුණි.

විශ්වවිද්‍යාලවලට විදේශීය සිසුන් ඇතුළත් කරගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සිසුන් බඳවා ගැනීමට තීරණය කර තිබුණද පසුගිය අධ්‍යයන වර්ෂ 03 ක් සඳහා විශ්වවිද්‍යාලවලට විදේශ සිසුන් බඳවා ගැනීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව හා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව අතර විශාල ප්‍රමාණයක විචලතාවයක් පැවතිණි.

දේශීය විශ්වවිද්‍යාල සඳහා තෝරා ගනු ලබන විදේශීය සිසුන් කොළඹින් බැහැර විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් නොවීමේ ප්‍රවණතාවය මෙම පුරප්පාඩු කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණු අතර එම විශ්වවිද්‍යාල තත්ත්වය උසස් කිරීමත් සමඟ ප්‍රවාහන පහසුකම්, නවාතැන්, ආහාරපාන හා සනීපාරක්ෂක පහසුකම් ඇතුලු අනෙකුත් පහසුකම්ද ජාත්‍යන්තර තත්ත්වයට ගැලපෙන ලෙස වැඩි දියුණු නොවීම මේ සඳහා හේතු වී තිබුණි.

ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම්

ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් ආචාර්යවරුන්ගෙන් අයකරගත් මුදල් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 10 (2) හා 99(1) වගන්ති අනුව විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු වේ. කෙසේ වුවත්, ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් ද තොරව 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්විද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ අරමුදල "Bond Violation/ Breach Fund" නමින් අරමුදල පිහිටුවා එම මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදායම විශ්වවිද්‍යාලවල විවිධ වියදම් සඳහා යොදාගෙන තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව කොමිෂන් සභාව ඇතුළු විශ්වවිද්‍යාල 6 ක සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අරමුදල්වල එකතුව රු.මිලියන 265 ක් විය.

නියැදි විගණන පරීක්ෂණයකට අනුව විශ්වවිද්‍යාල 4 ක ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 189 ක් අයවිය යුතුව තිබූ අතර එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදය 7.6 සහ 7.8 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

අරමුදල් ඌන උපයෝජනය

භාණ්ඩාගාරය විසින් සමාලෝචිත වර්ෂයේදී පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් ප්‍රාග්ධන වැඩ 05 ක් සඳහා රු.මිලියන 3,855 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර ඉන් ප්‍රාග්ධන වැඩ 03 ක් සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 1,750 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට 2016 දෙසැම්බර් 29 දින ලබා දී තිබුණු රු.මිලියන 900 කින් රු.මිලියන 409 ක් ඉතිරි කර තිබුණි.

විවිධ වර්ගයේ ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා කොමිෂන් සභාව විසින් එකතුව රු.මිලියන 24 කින් යුත් අරමුදල් ගිණුම් 30 ක් පවත්වා තිබුණත්, අදාළ කාර්යය සඳහා අරමුදල් ගිණුම් 05 ක රු.මිලියන 15 ක් පමණක් උපයෝගී කර ගෙන තිබුණි. උපයෝගි කර නොගත් අරමුදල් ගිණුම් 25 හි එකතුව රු.මිලියන 9 ක ශේෂයක් පැවතුණි. එම මුදල් බැංකු ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත 2016 වර්ෂයේදීද රු.මිලියන

978 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු. මිලියන 545 ක් මුදලින් ලැබී තිබුණි. මෙම මුදලින් රු. මිලියන 395 ක් හෙවත් සියයට 72 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර රු.මිලියන 150 ක් එනම් සියයට 28 ක ප්‍රතිපාදන ඌන උපයෝජිතව පැවතුණි.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි හා උසස් තාක්ෂණ ආයතනවලට අයත් බැංකු ජංගම ගිණුම් 12 ක රු.මිලියන 518 ක ශේෂයක් පැවැති අතර අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගත් නවක සිසුන් වෙනුවෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල යටතේ පිරිනමනු ලබන ශිෂ්‍යත්ව වෙනුවෙන් සිසුන් තෝරා ගැනීම සඳහා අවශ්‍යතා සංගුණකය (Need Index) උපයෝගීකර ගෙන එම සංගුණකයට දත්ත ඇතුළත් කිරීමේදී ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් නොලබන ඉහළ ආදායම් ලබන දෙමාපියන්ගේ පවුල්වල සිසුන්, ආදායම් රහිත සිසුන් ලෙස සලකා දත්ත ඇතුළත් කර තිබුණි. මේ හේතුවෙන් මහපොළ ශිෂ්‍යත්ව සඳහා සුදුකම් නොලබන ඉහළ ආදායම් ලබන පවුල්වල සිසුන්ට මහපොළ අරමුදලින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව හිමිවීම තුළින් අඩු ආදායම් ලබන පවුල්වල ශිෂ්‍යයන්ට ශිෂ්‍යයත්ව ලැබීමේ අවස්ථාව අහිමිවී තිබෙන බව ශිෂ්‍යත්ව ලබාදීම් සම්බන්ධව කරන ලද නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය

ශ්‍රී ලංකාව බලශක්තියෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත් කරන අතර විදුලිබල උත්පාදනය වෙනුවෙන් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම සහ සමස්ථ විදුලිබල ඉල්ලුම පුනර්ජනනීය හා වෙනත් දේශීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සපුරා ගැනීමටත්, බලශක්ති අංශයේ ආයෝජනය කිරීම සඳහා බැඳුම්කර, ණයකර, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය සහ වෙනත් නව මූල්‍ය සානුබලයන් යොදා ගැනීම මෙම අංශයේ අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි.එම අරමුණ ඉටු කිරීම සඳහා විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා ඒ යටතේ ව්‍යවස්ථාපිත ආයතන 07 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමෙන් අපේක්ෂිත අරමුණ කරා ළඟා විය යුතුව තිබුණි.

- විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරිම හා ඇගයීම.
- විදුලිබල සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත විදුලිබල ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
- ජලය, තාපය, ගල් අඟුරු සහ සුළං යන මූලාශ්‍රයන් මගින් විදුලි බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේශනය, සැලැසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය.
- ග්‍රාමීය විද්‍යුත්තනය.
- බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය.

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන විසින් උක්ත කාර්යභාරයන් ඉටු කිරීමේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සැලසුම් කළ ගල් අඟුරු බලාගාර ආරම්භ කිරීම

2025 වර්ෂය වන විට ගල් අඟුරු බලාගාරවලින් මෙගා වොට් 2000 ක සමස්ත ධාරිතාවයක් විදුලිබල පද්ධතියට එකතු කිරීමට විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සැලසුම් කර තිබුණත්, මෙගා වොට් 500 ක ධාරිතාවයකින් යුත් සාම්පූර් යෝජිත ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණු අතර, මෙගාවොට් 600 ක ධාරිතාවයකින් යුත් හම්බන්තොට ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

විදේශාධාර උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී විදේශ මූල්‍යනය යටතේ ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීමට වාර්ෂික විසර්ජන පනතින් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ රු. මිලියන 768 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 161 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් ඉතිරි කර තිබුණි.

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 290 ක් වූ, 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ක්‍රියාත්මක වූ තිරසාර බලශක්ති අංශය අදියර 2 ව්‍යාපෘතිය (ADB), විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්ෂුද්‍ර ජල ව්‍යාපෘති 19 ක් අළුත්වැඩියා කර ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට සැලැසුම් කර තිබුණද එයින් එක් ක්ෂද්‍ර ජල

ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි. ජල ව්‍යාපෘති හිමියන් 18 දෙනෙකු තම දායකත්වය ඒ සඳහා ලබාදීමට එකඟ නොවීම හේතුවෙන් එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකිවී තිබුණද උපදේශක හා පරිපාලන වියදම් වෙනුවෙන් රු.මිලියන 6.89 ක් වැය කර තිබුණි.

ආසියානු සංවර්ධන බැංකු ආධාර මත පිවිතුරු බලශක්ති ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර පද්ධති පාලන මධ්‍යස්ථානය ඉදිකිරිම සඳහා රු.මිලියන 2,863 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2014 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් මාසය වන විට සැලැසුම් කළ කටයුතු නිම කළ යුතුව පැවතුණි. කෙසේ වුවද, 2016 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.මිලියන 714 ක් පමණක් වැය කර තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 37 ක් විය.

ආසියානු සංවර්ධන බැංකු ආධාර මත තිරසාර විදුලිබල අංශ සහාය ව්‍යාපෘතිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් කිරිබත්කුඹුර ජාල උපපොළ වර්ධනය කිරීම සඳහා 2015 වර්ෂයේ රු.මිලියන 1,042 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ නිම කළ යුතුව තිබුණත්, 2016 දෙසැම්බර් 31 දින දින වන විට ඉන් රු.මිලියන 862 ක් හෙවත් ඇස්තමේන්තු වටිනාකමෙන් සියයට 83 ක් උපයෝජනය කර තිබුණද, එදිනට එදිනට එහි භෞතික ප්‍රගතිය සියයට 47 ක් විය.

ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු ව්‍යාපෘති, සැලැසුම් කළ පරිදි ක්‍රියාත්මක කර නොතිබීම නිසා රු.මිලියන 60 ක ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි.

ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය

විගණනයට ඉදිරිපත් කළ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී රු. මිලියන 13,234 ක බදු පෙර අලාභයක් ලබා තිබුණු අතර ඉකුත් වර්ෂයේදී රු.මිලියන 19,409 ක බදු පෙර ලාභය සමඟ සැසඳීමේදී රු.මිලියන 32,643 ක පිරිහීමක් විය. ඉන්ධන ගැණුම් පිරිවැය සියයට 117 කින් වැඩිවීම හා තාප විදුලි බලය මිලදී ගැනීමේ පිරිවැය සියයට 59 කින් වැඩිවීම මෙම පිරිහීමට මූලිකවම හේතුවී තිබුණි.

විදුලි බලය නිෂ්පාදනය කරන ජලාශවල පහළ ජල මට්ටමක් පැවැතීම

විදුලි බලය නිෂ්පාදනය කරන ජලාශවල පහළ ජල මට්ටමක් පැවතීම නිසා 2016 වර්ෂයේ ජල විදුලි බල නිෂ්පාදනය ගි.වො. පැය 1,749 ක් හෙවත් සියයට 29 කින් පහළ යාමක් සිදු වී තිබුණි. තවද, 2016 වර්ෂයේ ගල් අඟුරු මත විදුලිබල නිෂ්පාදනය සියයට 14 කින් හා ඉන්ධන මත විදුලි බල නිෂ්පාදනය සියයට 96 කින් ඉහළ ගොස් තිබුණි. එක් එක් ප්‍රභවයෙන් ජනනය කරන ලද විදුලිය පිළිබඳව සාරාංශයක් වගුව 35 හි දැක්වේ.

මූලාශ්‍රය	විදුලිබලය නිෂ්පාදනය ගි.වො.පැය		ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම)	
	2016	2015	ගි.වො.පැය	ප්‍රතිශතය
ජල විදුලිය	4,220	5,969	(1,749)	(29.30)
ඉන්ධන	4,461	2,275	2,186	96.09
ගල් අඟුරු	5,047	4,443	604	13.59
සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බල ශක්තිය	421	402	19	4.73
එකතුව	14,149	13,089	1,060	8.10

වගුව 35 - එක් එක් ප්‍රභවයෙන් ජනනය කරන ලද විදුලිය
මූලාශ්‍රය : - ලංකා විදුලිබල මණ්ඩලය විසින් නිකුත් කර ඇති සංඛ්‍යා ලේඛන දත්ත වාර්තාව ඇසුරෙනි.

මණ්ඩලය විසින් පෞද්ගලික විදුලි උත්පාදකයින්ගෙන් තාප විදුලිය මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී වැඩි වියදමක් කර තිබුණි. එම වියදම වැඩිවීම රු. මිලියන 22,682 ක් හෙවත් සියයට 59 ක් වී තිබුණි.

උපයන විට බදු ගෙවීම

2007 දෙසැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2009 වර්ෂයේ වැටුප් සංශෝධනය මගින් සේවකයින්ගෙන් අයකර ගතයුතු උපයන විට ගෙවීම් බදු එසේ අයකිරීමෙන් තොරව ලංකා විදුලි බල මණ්ඩලය විසින්ම ගෙවා තිබුණු අතර ඒ මත මණ්ඩලයට රු.මිලියන 2,617 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම

1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව, කාර්ය මණ්ඩලය වෙත විවිධ දීමනා වශයෙන් 2016 වර්ෂයේදී රු. මිලියන 1,222 ක් හා ඉකුත් වර්ෂ දෙක සඳහා රු. මිලියන 1,993 ක් වශයෙන් එකතුව රු. මිලියන 3,215 ක් ගෙවා තිබුණි.

"විදුලක්පාය " ගොඩනැගිල්ල ඉදිකිරීම

ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා "විදුලක්පාය" ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 418 ක වියදමක් කළ පසු එම ඉදිකිරීම් කටයුතු 2014 වර්ෂයේ දී නතර කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් එය විකල්ප භාවිතයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

ලක්විජය බලාගාරය - නිෂ්කාර්ය වත්කම්

ගල් අඟුරු ප්‍රවාහනය සඳහා රු. මිලියන 1,077 ක පිරිවැයකට 2009 වර්ෂයේදී මිලදී ගත් ඇදගෙන යෑමේ බෝට්ටු 02 ක්, බත්තල් 03 ක් සහ ලයින් බෝට්ටුවක් ගල් අඟුරු ගොඩ බෑමේ මෙහෙයුම් සඳහා සුදුසු නොවූ බැවින්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යව පැවැතුණි. තවද, එම බෝට්ටු ත්‍රිකුණාමලය හා කොළඹ වරායන්හි රඳවා තැබීම වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.මිලියන 36 ක් ලංකා නැව් සංස්ථාව වෙත ගෙවා තිබුණි.

ලැබිය යුතු ගිණුම්

ලංකා විදුලිබල මණ්ඩලය විසින් කිසිදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව, 2016 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එන හිඟහිටි ශේෂය රු. මිලියන 2,289 ක් වී තිබුණි.

අයිතිය තහවුරු නොවූ වත්කම්

එවකට පැවති විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය නමින් 2009 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද රු.මිලියන 47 ක් වටිනා වාහන 06 ක් ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණත්, එම වත්කම් ලංකා විදුලි බල මණ්ඩලයට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

අස්ථාන ගත වූ වත්කම්

එවකට පැවති විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට මුදා හරින ලද රු.මිලියන 07 ක් පිරිවැය වූ වාහන 11 ක් වර්ෂ කිහිපයකට පෙර සිට අස්ථානගත වී තිබුණි.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධනය

දේශීය ඛනිජතෙල් හා ගෑස් ප්‍රශස්ත නිෂ්පාදනය තුළින් ශ්‍රී ලංකාව බලශක්තියෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත්කිරීම සහ රටේ ඛනිජ තෙල් නිෂ්පාදන ඉල්ලුම, දේශීය අනන්‍ය වූ නිෂ්පාදන ක්‍රියාදාමයන් මගින් සපුරාලන අතර ඉවතලන ප්ලාස්ටික් යොදා ගනිමින් ඛනිජතෙල් නිෂ්පාදනය සිදුකිරීම මගින් පරිසරයට සිදුවන හානි අවම කිරීම ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ ව්‍යවස්ථාපිත ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ඛනිජ තෙල් සම්පත් සංවර්ධනය පිළිබඳ විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩ සටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම.
- ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම.
- ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු.
- ඛනිජ තෙල් ගවේශණය හා ඒ ආශ්‍රිත කටයුතු.
- ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් නිෂ්පාදනය හා බෙදා හැරීම.
- ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය

1930 වර්ෂයේදී ස්ථාපිත කරන ලද භූගෝලීය පිහිටීම අනුව ලෝක ප්‍රජාවගේ අවධානය යොමු වී තිබුණු ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය ත්‍රිකුණාමල වරාය වී තිබුණි. එහි තෙල් ටැංකි පද්ධතිය ඝණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත විය. දැනට තෙල් ටැංකි 99 ක් පවතින අතර පහළ කොටසේ තෙල් ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරනු ලැබේ. භාවිතයට ගෙන නොමැති ඉහළ කොටසේ තෙල් ටැංකි 84 ක් නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2011 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් තීරණයකට එළඹ නොතිබීම නිසා නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් ඉන්ධන නිපදවීම

ඉවතලන ප්ලාස්ටික්වලින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම වලක්වා ලීම හා විදේශ විනිමය ඉතිරි කර ගැනීමේ අරමුණින් පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම ඉවතලන ප්ලාස්ටික්වලින් ඉන්ධන නිපදවීමේ නියමු ව්‍යාපෘතිය 2009 වර්ෂයේ මැද භාගයේදී ආරම්භ කර 2010 දෙසැම්බර් මාසයේදී නිම කර තිබුණි. මෙම නියමු ව්‍යාපෘතිය අර්ධ වාණිජ ව්‍යාපෘතියක් ලෙස නිර්මාණය කිරීම 2011 වර්ෂයේදී ආරම්භ කර 2014 මැයි 07 දින වාණිජ ව්‍යාපෘතියේ පළමු රාශි බලගැන්වීම සිදු කර තිබුණි. 2015 සැප්තැම්බර් 03 දින අර්ධ වාණිජ යන්ත්‍රාගාරය බලගන්වා තිබුණි. නියමු

ව්‍යාපෘතියද ඇතුළුව අර්ධ වාණිජ ව්‍යාපෘතිය සඳහා 2017 ජූලි 15 දින වන විට භාණ්ඩාගාරයෙන් වරින් වර රු. මිලියන 250.36 ක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විධිමත් පරිදි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයන් නොකිරීම, නිෂ්පාදන සඳහා වෙළඳපොළ හඳුනා නොගැනීම, නියමු ව්‍යාපෘතිය අර්ධ වාණිජ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධක හා ගැටළු හඳුනාගෙන ඒවා මග හරවා ගැනීම සඳහා සැලැසුම් සකස් කර ක්‍රියාත්මක නොකිරීම, ව්‍යාපෘතියට අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් නොතිබීම, අර්ධ වාණිජ ව්‍යාපෘතියට අරමුදල් නිසි කලට නොලැබීම හා අර්ධ වාණිජ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිෂ්පාදන කළමනාකරණය ඉතා දුර්වලව පැවතීම නිසා මෙම ව්‍යාපෘතියේ අරමුණු කරා ලඟා වීමට නොහැකි වී අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වී තිබුණි.

ව්‍යාපෘතියේ ඉලක්ක ලඟා කර ගැනීමට පහත සඳහන් කාර්යසාධන දර්ශකයන් අනුව කාර්යසාධනය ළඟා කර ගත යුතුව තිබුණත්, අර්ධ වාණිජ ව්‍යාපෘතියක් වශයෙන් 2016 වර්ෂයේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතියේ කාර්යසාධනය අදාළ කාර්යසාධන දර්ශකවලට අනුව ඉලක්ක කරා ලඟා වී නොතිබුණි. විස්තර වගුව 36 හි දැක්වේ.

ප්‍රධාන කාර්යසාධක දර්ශකය	කාර්යසාධනය	ඉලක්ක ලඟාකර ගැනීම ප්‍රතිශතය
ඉවතලන ප්ලාස්ටික් පරිසරයට මුදා හැරීම වැළැක්වීම සඳහා වර්ෂයකට ඉවතලන ප්ලාස්ටික් කිලෝග්‍රෑම් 660,000 ක් ප්‍රයෝජනයට ගැනීම.	නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කළ ඉවතලන ප්ලාස්ටික් කිලෝග්‍රෑම් 22,000 ක් ප්‍රයෝජනයට ගෙන තිබුණි.	සියයට 3.3
ඛනිජතෙල් නිෂ්පාදන ආනයන පිරිවැය අවම කිරීම තුළින් වාර්ෂිකව රු.මිලියන 30 ක විදේශ විනිමය ඉතිරි කිරීම.	නිෂ්පාදනය කරන ලද දැව් තෙල් ලීටර් 39,600 ක් රු.40 ක් බැගින් විකිණීමෙන් රු.මිලියන 1.584 ක ආදායමක් උපයා තිබුණි. නමුත් තෙල් ලීටරයක් නිපදවීම සඳහා රු.350 ක අධික වියදමක් කර තිබුණි.	ලීටරයකින් රු. 40 ක විදේශ විනිමය ඉතිරි කිරීමට යාමේදී ඒ සඳහා සත්‍ය වශයෙන් රු. 350 ක නිෂ්පාදන පිරිවැයක් දරා ඇති බැවින් ඉලක්ක ලඟා කර ගැනීම සියයට -40.92 කක් වී තිබුණි..

වගුව 36- ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් ඉන්ධන නිපදවීමේ ඉලක්ක ළඟා කර ගැනීම

ඛනිජතෙල් නිෂ්පාදන සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීම

ශ්‍රී ලංකාවේ වාර්ෂික ඛනිජතෙල් ආනයන වියදම මුළු ආනයන වියදමින් සියයට 12 ක් පමණ වන අතර එය රටේ සමස්ථ වාර්ෂික අපනයන ආදායමෙන් සියයට 20 ක සිට සියයට 40 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ලෝක වෙළඳපොළේ ඛනිජතෙල් මිල ගණන් උච්ඡාවචනය වන ප්‍රමාණයට සමගාමීව හෝ භාණ්ඩාගාරය විසින් ඛනිජතෙල් මත පනවන ලද විවිධ බදු ප්‍රමාණයන් අඩු වැඩි වන අනුපාතයට හෝ දේශීය වෙළඳපොළෙහි ඛනිජතෙල් අලෙවි කරන මිල ගණන් වෙනස් නොවන අවස්ථාවල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ඩීසල් හා පෙට්‍රල් ලීටරයක් ආනයනය කිරීමට යන වියදමට වඩා අඩු

මිලකට අලෙවි කිරීමට සිදු වී තිබුණි. මහජනයාට සහනදායී මිලට තෙල් අලෙවි කිරීම සඳහා රජය විසින් වරින් වර ගෙන ඇති ප්‍රතිපත්ති සහ අනෙකුත් විවිධ හේතු මත ඇති වී තිබුණු අහිතකර මූල්‍ය තත්ත්වය හේතුවෙන් ඛනිජතෙල් ප්‍රවාහන නල මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම, එක් අන්ත නැංගුරම්පොළ බෝයා පද්ධතිය සවි කිරීම සහ පිරිපහදුව නවීකරණය කිරිම ආදී ඛනිජතෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛ යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවල නිසිකලට ආයෝජනය කිරීමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට නොහැකි වී තිබුණි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති වීම මත එහි අකාර්යක්ෂම මෙහෙයුම් කටයුතු හේතුවෙන් දිනපතා විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

එබැවින් රටක සංවර්ධන ක්‍රියාවලියට සමගාමීව ඛනිජතෙල් මිල කළමනාකරණය තුළින් ඛනිජතෙල් මිල ස්ථාවරව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ඛනිජතෙල් නිෂ්පාදන සඳහා මූල්‍යමය හා ආර්ථිකමය වශයෙන් සාධාරණ සූත්‍රයන් සකස් කර ගැනීමට 2015 පෙබරවාරි 02 දින ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේදී තීරණය කර තිබුණි. නමුත් අදාළ කටයුතු 2016 වර්ෂය අවසන් වන විට ද නිම කර නොතිබුණි.

තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම

1969 ස්ථාපිත කරන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතුව පවතින තෙල් පිරිපහදුව මගින් ඛනිජතෙල් නිෂ්පාදනවල දේශීය අවශ්‍යතාවයෙන් සියයට 35 ක සිට සියයට 45 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් සපුරා ගෙන තිබුණි. වර්තමාන ඛනිජතෙල් නිෂ්පාදන වර්තමානයට ගැලැපෙන පරිදි පිහිපහදු කිරිම නවීකරණය හා පුළුල් කිරීම අත්‍යාවශ්‍ය වූ කාර්යයක් වී ඇත. ඒ තුළින් බලශක්ති සුරක්ෂිතභාවය, ආර්ථික සංවර්ධනයට දායකවීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවයට ගැටළු පැන නැගීම අවමවීම හා නිමි භාණ්ඩ ලෙස ඛනිජතෙල් ආනයනයේදී වැය කළ යුතු අධික පිරිවැය යම් ප්‍රමාණයකට හෝ අවම කිරීමට හැකි වීම වැනි වාසි අත්කර ගැනීමට හැකි වනු ඇත.

වර්තමාන තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම සම්බන්ධව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ අනුකාරක සභාවක් පත්කර තිබුණි. එම සභාව 2015 මාර්තු 15 දින සිට කමිටුවේ රැස්වීම් වාර කිහිපයකදී තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරිම සම්බන්ධයෙන් විස්තරාත්මකව සාකච්ඡා කර තිබුණි. 2016 අගෝස්තු 10 දින පැවති කමිටු රැස්වීකදී යෝජිත ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර තිබුණි. වර්තමාන තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම ඉතා වැදගත් හා අත්‍යවශ්‍ය කරුණක් වුවද, ඒ කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් ලබා දීමට අදාළ පාර්ශවයන් විසින් උනන්දුවී නොතිබුණි.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ සංරචක ලෙස අතිරේක ගබඩා පහසුකම් ඇති කිරීම, දැනට පවතින තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීමේ අංග ඇතුළත් වි තිබුණි. ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව ඇමරිකන් ඩොලර් මිලියන 61 ක් වී තිබුණි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම සඳහා

ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් ක්‍රියාවලියට අනුකූලව ජාත්‍යන්තර ලංසු කැඳවන ලෙස 2015 දෙසැම්බර් 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කර නොතිබුණි.

ඛනිජ තෙල් ආනයනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව 2016 වර්ෂයේදි ලංකාවට ඛනිජ තෙල් ආනයනය කිරිම සඳහා රු.බිලියන 333 ක් (එක්සත් ජනපද ඩොලර් බිලියන 2.3 ක්) වැය කර තිබුණි. එම ආනයන වියදම 2016 වර්ෂයේ වර්තමාන වෙළෙඳ පොළ මිලට දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 3 ක පමණ නියෝජනයක් වි තිබුණි. එමෙන්ම එම වියදම 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සමස්ථ ආනයන වියදමෙන් සියයට 12 ක ප්‍රමාණයක් නියෝජනය වී තිබුණි. නිමි තෙල් ආනයනය කිරීම සඳහා 2015 හා 2016 වරෂවල පිළිවෙලින් රු.බිලියන 244 ක් හා රු.බිලියන 246 ක් වැය කර තිබුණි.

සංස්ථාව විසින් ආනයනය කරනු ලබන බොර තෙල් බැරලයක වාර්ෂික සාමාන්‍ය මිල 2014 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් 104.53 ක් වූ අතර, එය 2015 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් 54.80 ක් දක්වා සියයට 47.6 කින්ද, 2016 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් 46 දක්වා සියයට 16 කින්ද අඩු වී තිබුණි. 2015 වර්ෂයේදී නිමි පෙට්‍රල් ඔක්ටේන් 92 හා නිමි පෙට්‍රල් ඔක්ටේන් 95 බැරලයක වාර්ෂික සාමාන්‍ය ආනයන මිල පිළිවෙලින් එකසත් ජනපද ඩොලර් 71 ක් හා එක්සත් ජනපද ඩොලර් 74 ක් වී තිබුණි. එය 2016 වර්ෂයේදි පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 58.2 ක් හා එක්සත් ජනපද ඩොලර් 60.5 ක් වි තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදි නිමි පෙට්‍රල් ඔක්ටේන් 92 හා නිමි පෙට්‍රල් ඔක්ට්‍රෙන් 95 බැරලයක වාර්ෂික සාමාන්‍ය ආනයන මිල 2015 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 18.0 කින් හා සියයට 18.2 කින් අඩු වි තිබුණි. තවද, 2015 වර්ෂයේදි නිමි ඩීසල් පිපිඑම් 10 හා ඩීසල් පිපිඑම් 500 බැරලයක සාමාන්‍ය ආනයනමිල පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 68.2 ක් හා එක්සත් ජනපද ඩොලර් 68.5 ක් වී තිබුණි. එය 2016 වරෂයේදි පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 56.9 ක් හා එක්සත් ජනපද ඩොලර 54.7 ක් වි තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදි නිමි ඩිසල් පිපිඑම් 10 හා නිමි ඩීසල් පිපිඑම්500 ක බැරලයක වාර්ෂික සාමාන්‍ය ආනයන මිල 2015 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 16.6 කින් හා සියයට 20.1 කින් අඩු වි තිබුණි.

ලංකා ඛනිජ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව (විගණනය නොකළ) 2016 වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලින් රු.මිලියන රු.මිලියන 69,620 ක බදු පෙර ශුද්ධ ලාභයට එරෙහිව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.මිලියන 19,886 ක් වි තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි වර්ධනය රු.මිලියන 89,506 ක් වි තිබුණි. ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ගණන්වල අඩුවීම නිසා ආනයන පිරිවැය අඩුවිම, දේශිය වෙළෙඳපොළේ ඛනිජ තෙල් ඉල්ලුම ඉහළයාම නිසා ඇති වූ විකුණුම් වර්ධනය, 2016 වර්ෂයේ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය හිනවීමේ ප්‍රවනතාවයයේ අඩුවීම හා ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය වියදම්වල අඩුවිමවැනි කරුණු මෙම ලාභයට හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදි සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනයෙහි වර්ධනයක් වී තිබුණත්, 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා (2014 වර්ෂයේ හැර) අධික අලාභ ලැබීම හේතුවෙන් සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය 2016 වර්ෂය අවසානයේදි

රු.මිලියන 185,886 ක අහිතකර තත්ත්වයක් දක්වා බාදනය වී තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙසට අඛන්ඩව පවත්වා ගැනිමට ඇති හැකියාව මතභේදයකට තුඩු දෙන්නක් වී තිබුණි. 2016 වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක් සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/අලාභය හා ශුද්ධ වත්කම් තත්ත්වය රූපසටහන 32 හි දැක්වේ.

රූප සටහන 32 - සංස්ථාවේ ශුද්ධ ලාභය)/අලාභය -(ශුද්ධ වත්කම්වල තත්ත්වය

මූලාශ්‍රය -සංස්ථාවේ සහතික කළ මූල්‍ය වාර්තා

සංස්ථාව විසින් 2016 වර්ෂයේදි රු.මිලියන 43,099 ක බදු පසු ශුද්ධ ලාභයක් ලබා ගෙන තිබුණු අතර, සංස්ථාව පවත්වා ගැනිම මගින් සේවකයින්ට වැටුප් ලබාදිම, රජයට බදු ගෙවිම, රජයට විශේෂ ගාස්තු ගෙවිම හා ක්ෂවිම් ප්‍රමාණය සැලැකිල්ලට ගත්විට 2016 වර්ෂයේදි සංස්ථාව විසින් රු.මිලියන 153,184 ක දායකත්වයක්ද ලබා දි තිබුණි. සංස්ථාව රටට ලබා දි තිබුණු දායකත්වය හා සංස්ථාව ලබා තිබුණු ලාභය/(අලාභය)/ පිළිබඳ තත්ත්වය රූපසටහන 33 හි දැක්වේ.

රූපසටහ 33 -සංස්ථාව ලැබූ ලාභය)/අලාභය (හා රටට එකතු කළ අගය

ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්)

සංස්ථාව විසින් සිදු කර තිබුණු ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) මගින් 2017 පෙබරවාරි 20 දින වන විට රට විසින්දැරූ සමස්ථ අලාභය රු.බිලියන 14.03 ක් වී තිබුණි. විස්තර වගුව 37 හි දැක්වේ.

විස්තරය	රුපියල්	රුපියල්
සුරැකුම් ගනුදෙනු (හෙජින්)මගින් සියලු ලැබීම්		
ගනුදෙනු මත ප්‍රතිලාභය	137,988,404	
බේරුම් කිරීම මත ලැබීම්	152,160,848	
		290,149,252
සංස්ථාව මගින් දැරූ වටිනාකම්		
ගනුදෙනු මත අලාභ	1,278,531,706	
බේරුම් කිරීම මත ගෙවීම්	11,577,356,580	
නීති වියදම්	799,393,492	
ගමන් වියදම්	5,261,827	
බැංකු පොළී	250,570,863	
අනෙකුත් වියදම්	20,139,947	
		13,931,254,415
ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්)මත සංස්ථාව දැරූ මුළු පාඩුව		**13,641,105,163**
සංස්ථාව වෙනුවෙන් මහ බැංකුව විසින් දැරූ නීති වියදම		
ප්‍රතිපූර්ණය නොකළ වියදම	3,145,971	
මහ බැංකුව විසින් දැරූ වියදම	370,558,963	
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකළ වෙන්කිරීම් - ඩොයිෂ් බැංකුව ඒජී	13,079,333	
		386,784,267
ඉදිරි සුරැකුම් ගනුදෙනුව (හෙජින්)මත රට විසින් දැරූ සමස්ථ අලාභය		**14,027,889,430**

වගුව 37 - ඉදිරි සුරැකුම් ගනුදෙනු) හෙජින් (මගින්2017 පෙබරවාරි 20 දින වන විට රය විසින් දැරූ සමස්ථ අලාභය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කිහිපයක් සමඟ එළඹ තිබුණු ඉදිරි සුරකුම් ගිවිසුම් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබුණු බේරුම් කිරීමේ ඔප්පු ක්‍රමය යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 60 ක් (රු.මිලියන 7,713 ක්) ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුව (SCB) 2013 ජුනි 03 දින ගෙවා තිබුණි. එමෙන්ම එක්සත් ජනපද ඩොලර් මිලියන 27 ක් (රු.මිලියන 3,881 ක්) ඩොයිෂ් බැංකුවට 2016 අගෝස්තු 04 දින ගෙවා තිබුණි. ලැබී තිබුණු තොරතුරුවලට අනුව 2017 පෙබරවාරි 20 දින වන විට සංස්ථාව විසින් රු.මිලියන 13,641 ක පාඩුවක් ලබා තිබුණි.

සංස්ථාව ඉදිරි සුරකුම් ගනුදෙනුව (හෙජින්) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීති වියදම් වශයෙන් රු.මිලියන 941.2 ක් වැය කර තිබුණි. එයින් රු.මිලියන 370.6 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වැය කර තිබුණු අතර, රු.මිලියන 567 ක් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සංස්ථාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රතිපූර්ණය කර තිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 3.1 ක් සංස්ථාව විසින් 2017 පෙබරවාරි 20 දින වන විට ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

ලැබී තිබුණු ශේෂ තහවුරු කිරීමේ ලිපිවලට අනුව එකතුව එක්සත් ජනපද ඩොලර් මිලියන 27.77 ක් සහ එක්සත් ජනපද ඩොලර් මිලියන 8.65 ක් (පෙලි හැර) පිළිවෙලින් මහජන බැංකුවට හා කොමර්ෂල්

බැංකුවට 2016 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව තිබුණත්, සංස්ථාවේ මූල්‍යප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් සටහනක් දක්වා නොතිබුණි.

තවද, ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාවට එරෙහිව එක්සත් ජනපද ඩොලර් මිලියන 8.65 ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ වාණිජ ඉමළ අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු

වර්ෂ 47 ක් පැරණි සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛනිජතෙල් නිෂ්පාදන අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී තිබුණි. ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව හා උපරිමව කිරීමට හැකි වන පරිදි නවීන ලෝකයේ උසස් තාක්ෂණයක් සහිත මෙහෙයුම් කෙරෙන වෙනත් පිරිපහදු සමඟ සැසඳීමේදි සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් යුතුව මෙහෙයුම් සිදු කර තිබුණි. කෙසේ වුවද, පිරිවැය ඵලදායි ආකාරයෙන් ඛනිජතෙල් නිෂ්පාදන වෙළෙඳපොළට සැපයීම තහවුරු කර ගැනිම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරිම හා නවිකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කර නොතිබුණු අතර, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 837 ක් වැය කර තිබුණත්, එම වියදම අනාර්ථික වි තිබුණි.

තෙල් ප්‍රවාහනය සඳහා නල මාර්ග ජාලය

කොළඹ වරාය සිට කොළොන්නාවේ පිහිටි ඛනිජතෙල් ස්ථාපිතයට ආනයනික පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් හා දැවිතෙල් වැනි ඛනිජ තෙල් නිමි නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම දශක කිහිපයකට පෙර ස්ථාපනය කරන ලද නල මාර්ග පද්ධතිය මගින් සිදු කර තිබුණි .එම නල මාර්ග අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින අතර ඉන් කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් දැනටමත් අත්හැර තිබුණි .ඛනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග මගින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී තිබුණි .එම අබලන් වූ නල මාර්ගවලින් ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් ඇතිවීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

මෙම නල මාර්ග පද්ධතියෙන් කොළඹ වරාය සිට සපුගස්කන්ද තෙල් පිරිපහදුව දක්වා බොර තෙල් ප්‍රවාහනය කිරීම සඳහා)විෂ්කම්භය"24 ක් වූ නලය (සහ පිරිපහදුවේ සිට කොළොන්නාව ඛනිජතෙල් ස්ථාපිතය දක්වා ඛනිජ තෙල් ආශ්‍රිත නිමි නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම සඳහා) විෂ්කම්භය 12", 8" හා 6" වූ නල) ස්ථාපනය කරන ලද නල මාර්ග පද්ධතිය සංස්ථාව සතුව පැවැතුණි . කොළඹ වරාය සිට කොළොන්නාව ඛනිජතෙල් ස්ථාපිතයට ආනයනික නිමි ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද නල මාර්ග පද්ධතිය සංස්ථාවේ පරිපාලිතය වන ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සතු වේ .ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම යටතේ පාලනය වන ඉන්ධන නල මාර්ග පිළිබඳ විස්තර වගුව 38 හි දැක්වේ.

නලයේ ප්‍රමාණය	නිෂ්පාදනය	වත්මන් තත්ත්වය
10″	ඩීසල්	ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.
10″	අනෙකුත් පිරිපහදු කළ ඉන්ධන)Other White Oil(	අක්‍රීයව පවතී)කොලොන්නාව සිට කැලණිතිස්ස දක්වා නැප්තා ප්‍රවාහනය සඳහා කොටසක් පමණක් භාවිතා කරයි(
10″	නැප්තා	අක්‍රීයව පවතී
12″	නැප්තා	අක්‍රීයව පවතී. CPSTL ආයතනය විසින් ප්‍රතිස්ථාපනය කරමින් පවතී.
14″	දැවිතෙල්	ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

වගුව 38

ග්‍රාමීය ආර්ථික කටයුතු

ආර්ථික හා සමාජ ප්‍රතිලාභ සාධාරණ ලෙස ග්‍රාමීය ජනතාව වෙත ළඟාකරවීම මෙම ක්ෂේත්‍රයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය හා ඒ යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 08 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ග්‍රාමීය ආර්ථික විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරිම, පසුවිපරම් කිරිම හා ඇගයීම.
- ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම.
- ප්‍රාදේශීය සහ ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සංවර්ධනය.
- ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූලාධාර සම්පාදනය.
- පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍යවන පහසුකම් සැපයීම.
- සත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු.
- පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- පශු ක්ෂේත්‍රයේ සත්වගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරිම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරිම හා නිරෝධායන කටයුතු.

එම ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිතවීම

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය විසින් කිරි පිටි ආනයනය අඩුකිරීම සඳහා කිරි නිෂ්පාදනය වැඩිකිරීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 7 ක කාලපරිච්ඡේදය තුළදී රු. මිලියන 5557.38 ක් වැය කර තිබුණි. (සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ වියදම් හැර) 2010 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 136.5 කින් වැඩි කර තිබුණි. ඒ අනුව ලීටරයක කිරි නිෂ්පාදනය වැඩිකිරීමට රු.40.72 ක් වැය කර තිබුණි. සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ වාර්තාවන්හි රටේ වාර්ෂික කිරි ආශ්‍රිත නිෂ්පාදනය හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය අනුව රටේ කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය 2010 වර්ෂයේදී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 22.29 ක් හා මෙට්‍රික් ටොන් 72.53 ක් විය. ඒ අනුව රටේ කිරි අවශ්‍යතාවයෙන් සියයට 23.5 ක් පමණක් 2010 වර්ෂයේදී රට තුළ නිෂ්පාදනය කර තිබුණු අතර 2014 වර්ෂයේදී එය සියයට 26.67 ක් වී තිබුණි. තවද 2014 වර්ෂයේදී කිරි පිටි මෙට්‍රික් ටොන් 86.37 ක් ආනයණය කර තිබූ අතර 2016 වර්ෂයේදී කිරි පිටි මෙට්‍රික් ටොන් 94.01 ක් ආනයණය කර තිබුණි. ඒ අනුව කිරි පිටි ආනයණය සැලැසුම් කළ පරිදි අඩුවී නොතිබුණි.

දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි සැල් 1250 පිහිටුවීමට සැලැසුම් කර තිබුණි. නමුත් 2013 දෙසැම්බර් 31 දින වන විට අලෙවි සැල් 685 ක් පමණක් ආරම්භ කර තිබුණි. ඉන් අලෙවි සැල් 283 ක් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මඟින් ආරම්භ කර තිබුණි. ශාක්‍යතා අධ්‍යයනයක් නොකර එම අලවි සැල් ආරම්භ කිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට අලෙවි සැල් 43 ක් හෙවත් සියයට 15 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. පළාත් මට්ටමින් අමාත්‍යාංශය ආරම්භ කළ ඉතිරි අලෙවි සැල් 402 න් වර්තමානයේ 112 ක් හෙවත් සියයට 28 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවැතුණි. නමුත් අලෙවිසැල් වැසීයෑම අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

ශීතාගාර ඉදිකිරීම

2016 වර්ෂයේ ග්‍රාමීය කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය වෙළඳපල මිල ස්ථායිකරණය කිරීමත්, පසු අස්වනු හානිය අවම කිරීම සඳහාත්, ශ්‍රී ලංකා රජය පෞද්ගලික අංශය හා ඒකාබද්ධව ශීතාගාර 5ක් ඉදිකිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් රු.මිලියන 2,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. අමාත්‍යාංශයේ ක්‍රියාකාරි සැලැස්ම තුළ මෙම ව්‍යාපෘතිය සංවර්ධන හා සැලැසුම් අංශය යටතේ 2016 ජනවාරි මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා වූ වර්ෂයක කාලය තුළ නිම කිරීමට සැලැසුම් කර තිබුණද, 2017 ජුනි 26 දින වන විටත් එය ඉදිකිරීම ආරම්භ කර හෝ නොතිබුණි.

ශීතාගාර සම්බන්ධව අධ්‍යයනයක් සිදු කිරීම සඳහා 2016 මාර්තු 02 දින සිට මාර්තු 10 දින දක්වා තායිලන්තය හා ඊශ්‍රායලයට නිලධාරීන් පස් දෙනෙකු සංචාරය කර තිබුණත්, එම සංචාරය සඳහා ශාක්‍යතා අධ්‍යයන කමිටුවෙන් පරිභාහිර නිලධාරින් තුන් දෙනෙකු හා අමාත්‍යවරයා සමඟ කමිටුවේ සභාපති පමණක් සහභාගී වී තිබුණි. මෙම සංචාරයේ වියදම් පිළිබඳව කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයට පත් කළ කමිටුව අවස්ථා 2 කදී රැස්වීම් පවත්වා තිබූ නමුත් අමාත්‍යාංශය විසින් අවස්ථා 05 කදී ලිඛිතව ඉල්ලීම් කිරීමෙන් පසුව 2016 අගොස්තු 10 දිනැති කමිටුවේ සභාපතිවරයාගේ අත්සන පමණක් යොදා අනෙකුත් කමිටු සමාජිකයින් දස දෙනාගේ අත්සන් රහිතව යෝජනා 6ක් පමණක් ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. නමුත් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක අවශ්‍යයෙන්ම තිබිය යුතු කරුණු එහි ඇතුළත් කර නොතිබුණි.

ආර්ථික මධ්‍යස්ථාන

ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවි කර ගැනීම සඳහාත්, නිෂ්පාදකයින් තොග වෙළෙන්දන් හා පාරිභෝගිකයින් සෘජුවම සම්බන්ධ කිරීම මගින් කාර්යයක්ෂම ලෙස මිල යන්ත්‍රණය ක්‍රියාත්මක කරවීම අරමුණු කරගෙන විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කර තිබුණත් එවැනි කාර්යයක්ෂම සාධාරන මිල යන්ත්‍රයක් ක්‍රියාත්මක වූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්,

කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 6 ක 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන 08 ක් 2017 ජූනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2003 පෙබරවාරි 05 දින ආරම්භ කර තිබුණු ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයේ 2003 සිට 2016 දක්වාම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

- කිලිනොච්චි හා අම්පාර ආර්ථික මධ්‍යස්ථානවල ඉදිකිරීම් 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 96.7 ක් හා රු. මිලියන 29.2ක් වැය කර අවසන් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් එම කඩ කාමර කුලියට දී නොතිබුණි.

- ශාක්‍යතා අධ්‍යයනයකින් තොරව ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීම හේතුවෙන් රු.මිලියන 136 ක් වැය කර ඉදිකරණ ලද ආර්ථික මධ්‍යස්ථාන 3 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන හා පළාත් පාලන ආයතන වෙත පවරා තිබුණි. 2014 වර්ෂයේදී රු.මිලියන 21 ක් වැය කර ආරම්භකර තිබුණු කඩ කාමර 25 කින් යුත් කන්දහන්දිය ආර්ථික මධ්‍යස්ථානය හා 2014 වර්ෂයේදී රු.මිලියන 6.9 ක් වැයකර අර්ධ වශයෙන් ඉදිකර තිබූ වැලිගම, දෙනිපිටිය පොල භූමියේ විශේෂ ආර්ථික මධ්‍යස්ථානයත් වෙනත් ආයතන වෙත පවරා දීමට කටයුතු කරමින් පැවැතුණි.

කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය

2013 වර්ෂයේදී HSBC බැංකුව හා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අතර හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා මිල්කෝ (පුද්ගලික) සමාගම අතර කර්මාන්ත ශාලා නවීකරණය කිරිම සඳහා වූ ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව ලබා ගෙන තිබුණු රු.මිලියන 5,854.45 ක (යුරෝ මිලියන 33.78) ණය මුදල සඳහා වාණිජ නොවන ණය සියයට 2 ක පොලියක් හා වාණිජ ණය සියයට 6+LIBOR ක පොලියක් ගෙවීමට එකඟ වී තිබුණි. පොලොන්නරුව, දිගන හා අඹේවෙල යන කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීමෙන් තොරව ටර්න්කී (Turnkey) ක්‍රමය යටතේ කොන්ත්‍රාත්කරු තෝරා ගෙන තිබුණි. මෙම ණය මුදල වෙනුවෙන් 2017 ජූනි 15 දින වන විට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 16.69 ක් හෙවත් රු.මිලියන 2,436.18 ක් ණය වාරික ලෙසත්, එක්සත් ජනපද ඩොලර් මිලියන 3.80 ක් හෙවත් රු.මිලියන 554.17 ක් ණය පොලී ලෙසත්, බැංකුව වෙත ගෙවා තිබුණි. සීමාසහිත මිල්කෝ සමාගම විසින් ණය හා ණය මත පොලී වශයෙන් කිසිදු මුදලක් මහා භාණ්ඩාගාරය වෙත පියවා නොතිබුණි.

මිල්කෝ පුද්ගලික සමාගම සහ කොන්ත්‍රාත්කාර සමාගම අතර එලඹ තිබුණු ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුවේ කාලය 2014 ජූලි 12 දිනෙන් අවසන් විය යුතුව තිබුණත්, දිගන හා අඹේවල කිරි කර්මාන්තශාලා නවීකරණ කටයුතු 2017 ජූලි 31 දින වන විටත් නිම කර නොතිබුණි. දෙපාර්ශවයෙන් කිසිදු පාර්ශවයක් කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කර ගැනීමට හෝ ප්‍රමාද ගාස්තු වශයෙන් එකඟ වී ඇති වටිනාකම අය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. ගිවිසුම මාස 36 කට වඩා ප්‍රමාදව පවතින අතර ප්‍රමාද ගාස්තුව වහයෙන් යුරෝ 1,688,961 ක් අයකර ගත යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට මේ සම්බන්ධයෙන් කිසිදු ලිපි ගනුදෙනුවක් හෝ සිදු කර නොතිබුණි.

අඹේවෙල හා දිගන කර්මාන්තශාලාවලට අදාළ ව්‍යාපෘති කාර්යයන් කොන්ත්‍රාත්කාර ආයතනය විසින් නියමිත දිනට අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් **HSBC** බැංකුව

හා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අතර පැවති ණය ගිවිසුම 2016 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. නමුත් ඉහත ව්‍යාපෘති කාර්යයන් 2017 ජූලි 31 දින වන විටත් අවසන් කර නොතිබුණත්, බැංකුව සමග පැවති ණය ගිවිසුම් කාල සීමාව දීර්ඝ කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත්කාර ආයතනයට ගෙවිය යුතු අවසාන රඳවාගැනීමේ ගාස්තුව වන කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක් වූ යුරෝ 3,071,693 ක් ගිවිසුමට පටහැනිව බැංකු ඇපකරයක් මත 2016 මාර්තු 27 දින ගෙවා තිබුණි.

කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානවල අධීක්ෂණය

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම විසින් රටේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම හා කිරි එකතු කරන කිරි මධ්‍යස්ථාන අධීක්ෂණය කළ හැකි වන පරිදි නවීකරණය නොකිරීම නිසා 2015 හා 2016 වර්ෂ දෙක තුළදී එකතු කර තිබුණු කිරි ලීටර් ප්‍රමාණයට වැඩියෙන් පිළිවෙලින් කිරි ලීටර් 320,893 ක් හා කිරි ලීටර් 587,247 ක් සඳහා ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 20.52 ක් හා රු.මිලියන 39.61 ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි. එමෙන්ම කර්මාන්ත ශාලා වෙත එකතු කරන ලද කිරි රැගෙන ආ පසු 2016 වර්ෂයේදී රු.මිලියන 2.50 ක් වටිනා කිරි ලීටර් 35,681 ක් නරක් වී තිබුණි.

2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රටේ කිරි නිෂ්පාදනය ක්‍රමිකව වැඩි වී තිබුණත්, සමස්ථ රටේ මුළු කිරි නිෂ්පාදනයෙන් සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම විසින් එකතු කළ කිරි ලීටර් ප්‍රමාණයේ ප්‍රතිශතය 2014 වර්ෂයේදී සියයට 19 ක සිට 2016 වර්ෂය වන විට සියයට 18 දක්වා අඩු වී තිබුණි. විස්තර රූපසටහන 34 හි දැක්වේ.

රූපසටහන 34 - රටේ මුළු කිරි නිෂ්පාදනය, සමාගම එකතු කළ කිරි ප්‍රමාණය හා එහි ප්‍රතිශතය
මූලාශ්‍රය- මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන වාර්තාව

කල්බඳු පදනමට මිලදීගත් යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම විසින් අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමෙන් තොරව කොළඹ කර්මාන්ත ශාලාවට යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් කල්බඳු ක්‍රමය යටතේ මිලදී ගැනිමට තීරණය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව 2011 ජනවාරි 20 දින කල්බඳු පදනම මත රු.මිලියන 104.17 ක් වැය කර මිලදී ගත් යෝගට් මිශ්‍රකිරීමේ යන්ත්‍රය පොලොන්නරුව කර්මාන්ත ශාලාවේ සවිකර 2017 ජූලි මාසය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

කිරි ගවයින් ආනයනය කිරීම

වෙලාඩ් ව්‍යාපෘතියෙහි 2 වන අදියර යටතේ 2014 ජූලි 14 දින සිට වර්ෂ 2 ක කාල පරිච්ඡේදයක් තුළදී එක් කිරි ගවයෙකු එක්සත් ජනපද ඩොලර් 3,032.87 ක් බැගින් කිරි ගවයින් 2500 ක් ආනයනය කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගිවිසුකට එළඹ තිබුණි. ඒ අනුව 2015 ජූලි 13 හා ඔක්තෝබර් 12 යන දෙදින තුළ කිරි ගවයන් 2495 ක් ආනයනය කර තිබුණි.

2016 ඔක්තෝබර් 11 දින වන විට රදවාගැනීමේ මුදල්ද ඇතුළත්ව එක්සත් ජනපද ඩොලර් 7,576,101 ක් ගෙවා තිබුණි. ඒ අනුව කිරි ගවයින් 5 ක් අඩුවෙන් සපයා තිබියදී හා ගිවිසුම්ගත මුදල එක්සත් ජනපද ඩොලර් 9,098.59 කින් ඉක්මවා ගෙවීම් කර තිබුණි. එක් කිරි ගවයකු වෙන්වෙන් රු.415,372 ක් බැගින් වන ලෙස රු.මිලියන 1,036.35 ක් වැය කර ආනයනය කළ කිරි ගවයින් රක්ෂණය නොකිරීම නිසා මිය ගිය කිරි ගවයින් 133 ක ගෙන් රු.මිලියන 55.24 ක අලාභහානිය ආවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. ගිවිසුම අනුව ආනයනය කරන අවස්ථාවේ ගැබ් ගෙන සිටිය යුතු වුවත් ගවයින් 79 ක් එසේ ගැබ් ගෙන නොතිබුණි. පළමුවර පැටියා ලැබීමෙන් පසු කිරි ලබාදීම අසාර්ථක වූ හා දෙවනවර කෘතීම සිංචන ක්‍රියාවලිය මඟින් අසාර්ථක වූ ගවයින් 260 ක්ද 2016 මැයි 30 දින වන විට ගැබ්ගෙන නොතිබුණි. ඒ අනුව ආනයනික කිරි ගවයින් 472 කට වැය කරන ලද රු.මිලියන 196.06 ක වියදම ව්‍යාපෘතියේ අරමුණු ලභාකර ගැනීමට දායක වී නොතිබුණි.

ඡායාරූපය 07 - ආනයනය කළ කිරි ගවයින්

කිරි ගවයින් 2500 ක් හම්බන්තොට වරායේ සිට රිදියගම ගොවිපලට කිලෝමීටර් 38 ක දුරක් ප්‍රවාහනය කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් 260,555 ක් ඇස්තමේන්තු කර තිබුණි. කිරි ගවයන් ප්‍රවාහනය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු වාහන වලින් අයකරන රේටයන් අනුව ගවයින් 2500 ක් කිලෝමීටර් 38 ක දුරක් ප්‍රවාහනය කිරීම සඳහා සාමාන්‍ය පිරිවැය රු.570,000 ක් විය. ඒ අනුව අසාමාන්‍ය ලෙස අධි ඇස්තමේන්තුවක් සකසා තිබීම හේතුවෙන් කිරි ගවයින් 2495 ක් ප්‍රවාහනයට එක්සත් ජනපද ඩොලර් 260,347.11 ක් එනම් රු.මිලියන 35.87 ක් ගෙවා තිබුණි. ගවයින් 2495 ක් මණ්ඩලය සතු රථ මගින් ප්‍රවාහනය කිරීම සඳහා දැරිය යුතු පිරිවැය රු.568,860 ක් වුවත්, ඒ සඳහා රු.35,299,208 කින් ඉක්මවා අධික වියදමක් කර තිබුණි.

කිරි ගවයින් ආනයන කිරීමේ දෙවන අදියර යටතේ 2013 ජූලි 11 දින අමාත්‍ය මණ්ඩල යෝජනාවට මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවලට අනුව ඒක පුද්ගල කිරි

පරිභෝජනය වැඩි කිරීමට 2012 වර්ෂයේදී පළමුවන අධියර යටතේ ආනයනය කරන ලද කිරි ගවයින් 2000 ක් සාර්ථකව දේශීය පරිසරයට අනුගත වී ඇති බව සඳහන් කර තිබුණි. ඒ අනුව දෙවන අදියර යටතේ කිරි ගවයින් 2500 ක් ආනයනය කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත්, ව්‍යාපෘතියේ පළවන අදියර ආරම්භයට පෙර 2009 මාර්තු 24 දිනැති ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව ආනයනිත එක් කිරි ගවයකුගෙන් දිනකට අපේක්ෂිත කිරි ප්‍රමාණයේ සාමාන්‍යය ලීටර් 20 ක් ලෙස තක්සේරු කර තිබුණි. නමුත් එම අපේක්ෂිත ප්‍රමාණයට ලගා වී නොතිබුණත්, දෙවන අදියරේ කිරි ගවයන් ආනයනයටද එම ප්‍රායෝගික තත්ත්වය නොසලකා අනුමැතිය ලබා දී තිබුණි.

බොරළු සහිත මාර්ග ඉදිකිරීම

දිගින් කිලෝමීටර් 5 ක බොරළු සහිත මාර්ගයක් සැකසීමේ ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුගත වටිනාකම එක්සත් ජනපද ඩොලර් 94,868.89 ක් වී තිබුණි.එම ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී එම ඇස්තමේන්තුගත මුදලට රු.12,734,155 ක් ගෙවා තිබුණි. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2015 වර්ෂයට නිකුත් කළ මාර්ග ඒකක මිල ගණන් අනුව එම මාර්ගය සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.1,450,228 ක් වී තිබුණත්, ව්‍යාපෘතිය වෙනුවෙන් රු.11,283,927 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඒ අනුව රට තුළ පවතින සාමාන්‍ය මිල ගණන් ඉක්මවා ඇස්තමේන්තුව අසාමාන්‍ය ලෙස වැඩියෙන් දැක්වීම නිසා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් වැඩිපුර ගෙවීම් කර තිබුණි. ඉදි කිරීමෙන් පසු වර්ෂයක් ගතවීමට පෙර 2016 ජුනි මාසයේදී සිදුකළ භෞතික පරීක්ෂාවේදී හෙළිදරව් වූ පරිදි එම මාර්ගය කැඩී තිබුණි. ඒ පිළිබඳ ඡායාරූපය 08 හි දැක්වේ.

ඡායාරූපය - 08 - මාර්ගය ඉදිකිරීමෙන් පසු කැඩී තිබුණු ආකාරය

වගා ළිං හා නල ළිං ඉදිකිරීම

ව්‍යාපෘතියේ පිරිවිතරයට අනුව **වගා ළිං 6 ක්** වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 31,267 ක් ප්‍රතිපාදන සලසා තිබුණත්, එක් **වගා ළිදක් හා නල ළිං 2 ක් පමණක්** නිමකර තිබුණි. ඒ අනුව ගෙවිය යුතුව තිබූ එක්සත් ජනපද ඩොලර් 15,633 ක් වෙනුවට එක්සත් ජනපද ඩොලර් 31,267 ක් හෙවත් රු.4,340,176 ක් ප්‍රතිපූර්ණය කිරීම නිසා එක්සත් ජනපද ඩොලර් 15,634 ක් හෙවත් රු.2,170,157 ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වැඩිපුර ගෙවා තිබුණි.

කොකුන් ගබඩා මිලදී ගැනීම

2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද වී තොග ගබඩා කිරීමට වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කොකුන් ගබඩා (තාවකාලික ගබඩා) 15 ක් මිලදී ගැනීම සඳහා රාජ්‍ය සංස්ථාවක් වෙත රු.මිලියන 39.33 ක් ගෙවා තිබුණි. ඉන් අනුරාධපුර හා ත්‍රිකුණාමලය කළාපවලට නිකුත් කරන ලද රු.මිලියන 10.49 ක්වූ ගබඩා 04 ක් 2017 පෙබරවාරි 06 දින වන විටත් වී ගබඩා කිරීම සඳහා යොදාගෙන නොතිබුණි.

කොකුන් ගබඩාවක් වර්ෂ 10 ක සිට වර්ෂ 15 ක් දක්වා කාලයක් භාවිතා කළ හැකි බව අදාළ සමාගම දන්වා තිබුණද, අම්පාර කළාපයට නිකුත් කරන ලද ගබඩා 06 කින් 2015 යල කන්නයේදී ගබඩා 02 ක් භාවිතා කර තිබුණු අතර ඊළඟ කන්නය සඳහා අලුත්වැඩියාවකින් තොරව භාවිතයට යොදා ගැනීමට නොහැකි බව අම්පාර කළාප කළමනාකරු විසින් වී අලෙවි මණ්ඩලය වෙත දන්වා තිබුණි.

නගර සැලැසුම් හා ජල සම්පාදනය

පුරවැසියන්ගේ සුරක්ෂිත පානීය ජලය සඳහා ඇති ප්‍රවේශය, දිවයින පුරා නල මාර්ග හා නල අපවහන ඉදිකිරීම, ආවරණය තහවුරු කිරීම සහ දිවයින පුරා නගර මනා ලෙස සැලැසුම්කරණය කිරීම මෙම ක්ෂේත්‍රයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කිරීම සඳහා නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුවේ.

- නගර සැලැසුම් හා ජල සම්පාදන විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- විශේෂ නගර සැලැසුම්කරණය හා සංවර්ධනය.
- නාගරික සංවර්ධන කාර්යයන් ඉටු කිරිම සඳහා ජාතික භෞතික සැලැසුම් පදනම් කරගෙන සියළු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම.
- සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම.
- ජල සම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් විමර්ශනය කිරිම.
- සැලැසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදිකිරීම, මෙහෙයවීම හා නඩත්තු කිරිම.
- ප්‍රජා ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ විධිමත්ව ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

ඉහත සඳහන් කාර්යභාරය එම ආයතන විසින් ඉටු කිරීමේදී අනාවර්ණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ජල හා සනීපාරක්ෂක සැපයුම

2016 වර්ෂය වනවිට මුළු ජල සැපයුම් සම්බන්ධතා 2,092,471 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ලබාදී තිබුණි. එය අපේක්ෂිත මට්ටමට වඩා 78,199 කින් අඩු වී තිබුණි. 2016 වර්ෂය වන විට මුළු ජනගහනයෙන් සියයට 47.7 කට පානීය නල ජලය සැපයීමත්, ජනගහනයෙන් සියයට 2.08 කට නල අපවහනය සලසාදීමටත් ජාතික ජල සම්පාදනය හා ජලාපවහන මණ්ඩලය සමත් වී තිබුණි.

ජල සැපයුම හා සනීපාරක්ෂාව වෙනුවෙන් මණ්ඩලය විසින් මහා පරිමාණ විදේශාධාර ව්‍යාපෘති 42 ක්ද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 62 ක්ද, සුනාමි බලපෑ ප්‍රදේශ සඳහා ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති 6 ක්ද, ජල ආංශික ප්‍රජා පහසුකම් සඳහා යෝජනාක්‍රම 14 ක්ද, දේශීය ණය ආධාර යටතේ ව්‍යාපෘතීන් 15 ක්ද, ක්‍රියාත්මක කර තිබුණු අතර 2016 වර්ෂයේ නව ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතීන් 12ක්ද ආරම්භ කර තිබුණි.

පිරිපහදු ජල නිෂ්පාදනය,බෙදාහැරීම හා පිරිවැය සමාලෝචනය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පිරිසිදු ජල නිෂ්පාදනය, පාරිභෝජනය කරන ලද ජල ප්‍රමාණය හා ආදායම් නොලබන ජල ප්‍රමාණය ඉකුත් වර්ෂවලදී මෙන් සමාලෝචිත වර්ෂයේදීද ඉහළ අගයක් ගෙන තිබුණි. විස්තර වගුව 39 හි දැක්වේ.

විස්තරය	2013	2014	2015	2016
පිරිසිදු ජල නිෂ්පාදනය (cum මිලියන)	547.00	575.00	600.14	649.00
පාරිභෝජනය කරන ලද ප්‍රමාණය (cum මිලියන)	381.60	410.92	436.27	483.00
ආදායම් නොලබන ජලය (cum මිලියන)	165.40	164.08	163.87	166.00

වගුව 39 - ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සැපයුම්

ජල නිෂ්පාදනය හා ජල පරිභෝජනය 2013 වර්ෂයේ සිට ක්‍රමිකව වැඩි වී තිබුණි. ආදායම් නොලබන ජල ප්‍රමාණය 2013 වර්ෂයේ සිට 2015 දක්වා ක්‍රමිකව අඩු වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එය 2013 වර්ෂයේ පැවැති ප්‍රමාණයද ඉක්මවා CUM මිලියන 166,000 ක් දක්වා වැඩි වී තිබුණි. ජලය කාන්දුවීම්, නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා හා නොමිලේ ලබාදෙන ජලය හේතුවෙන් ජලය නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි. රට පුරා සමස්ථයක් ලෙස ආදායම් නොලබන ජල අනුපාතය 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ක්‍රමයෙන් අඩු වී සියයට 25.58 ක ප්‍රතිශතයක් දක්වා පහළ වැටී තිබුණද, කොළඹ නගරයට අදාළ ජල නිෂ්පාදනයෙන් ආදායම් නොලබන ජල අනුපාතය 2016 වර්ෂයේදී සියයට 45.72 ක් වැනි ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර රූපසටහන 35 හි දැක්වේ.

රූපසටහන 35 - ආදායම් නොලබන ජල ප්‍රතිශතය
මූලාශ්‍රය : කළමනාකරණ තොරතුරු වාර්තාව - 2016 දෙසැම්බර්

මෙම කාලය තුළ ජල සම්පාදන ව්‍යාපෘතීන් ගනනාවක් නිමකර ජල නිෂ්පාදන කටයුතු අරඹා තිබුණත්, බොහෝ ව්‍යාපෘතීන් නිමකිරීම ප්‍රමාදවීම හේතුවෙන් සමස්ථ ජල නිෂ්පාදනයේ ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් සැපයුමක් වර්ධනයවී නොතිබීම නිසා ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සැපිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

ජාතික ජල සම්පාදනය හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය

2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා (2015 වර්ෂය හැර) මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය වාසිදායක වී තිබුණි. එමෙන්ම 2015 වර්ෂය හැර අනෙක් වර්ෂවල මුළු විස්තීර්ණ ආදායම ක්‍රමිකව වැඩිවෙමින් පැවැතුණි. විස්තර රූපසටහන 36 හි දක්වා ඇත.

රූපසටහන 36 - ඉකුත් වර්ෂ 06 තුල මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිපලය
මූලාශ්‍රය - ජාතික ජලසම්පාදනය හා ජලාපවහන මණ්ඩලයේ 2011 සිට 2016 දක්වා මූල්‍ය ප්‍රකාශන

සලකා බලන ලද වර්ෂ 6 ක දත්ත නිරීක්ෂණය කිරීමේදී ජල විකුණුම් ආදායමෙහි ක්‍රමික වර්ධනයක් නිරූපණය වන අතර ඊට සාපේක්ෂව වැඩි ප්‍රමාණයකින් විකුණුම් පිරිවැය වැඩිවීමක් (2013 වර්ෂය හැර) දක්නට ලැබුණි. 2015 වර්ෂයේ ආදායම 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 5 ක වර්ධනය වි තිබුණත්, විකුණුම් පිරිවැයෙහි සියයට 9 කින් වර්ධනයවීම හේතුවෙන් 2015 වර්ෂයේදී පිරිවැය ආන්තිකය සියයට 2 කින් වැඩිවී තිබුණි. තවද, මණ්ඩලයේ පිරිවැටුම 2015 වර්ෂය සමග සංසන්දනය කිරීමේදී සියයට 20 කින් වැඩි වී තිබුණි.

ශුද්ධ මූල්‍ය ආදායම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 215 කින් වර්ධනය වී තිබුණද, ඊට ප්‍රධාන හේතුව මණ්ඩලය මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදේශ ණය හා ඊට අදාළ පොලිය රජයේ හිමිකමට (Equity) පරිවර්තනය කිරීමට භාණ්ඩාගාරය අනුමැතිය ලබාදීම හා භාණ්ඩාගාරය ලබා දුන් බැඳුම්කර වල ආයෝජනය කිරීමෙන් ලද ආදායම බව නිරීක්ෂණය විය. පසුගිය වර්ෂ 6ක කාලය සලකා බැලීමේදී 2016 වර්ෂයේදී රු.මිලියන 2,914 ක වාර්තාගත බදු පසු ලාභයක් උපයා ගැනීමට මණ්ඩලය සමත්ව තිබූ අතර එය 2015 වර්ෂය සමග සැසඳීමේදී සියයට 183 කින් වර්ධනය වී තිබුණි.

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මෙහෙයුම් ලාභයෙහි ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළද, 2015 වර්ෂයේදී එය සියයට 104 කින් අඩු වී මෙහෙයුම් අලාභයක් බවට පත් වී තිබුණි. පරිපාලන වියදම්වල සියයට 43 ක වැඩිවීම මෙයට ප්‍රධාන හේතුව වී තිබුණි. එසේ වුවද, මණ්ඩලයේ පිරිවැටුම 2016 වර්ෂයේදී සියයට 20 කින් ඉහළයාම හේතුවෙන් මෙහෙයුම් ලාභයද ඊට සමගාමීව සියයට 1829 ක පමණ අසාමාන්‍ය අගයකින් වර්ධනය වී තිබුණි .

දේශීය අරමුදල් හා විදේශාධාර මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මකල ව්‍යාපෘති

ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාදවීම

ජල සම්පාදන ව්‍යාපෘති අපේක්ෂිත කාලපරිච්ඡේදය තුළදී නිම කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් අපේක්ෂිත ජල සම්බන්ධතා ප්‍රමාණය පද්ධතියට එකතු නොවීම තුළ ආදායම අහිමි වීම, ව්‍යාපෘති ඇස්තමේන්තු පිරිවැය ඉහළ යාම, විදේශ විනිමය විචලතා ඇතිවීම, උපදේශන ගාස්තු දිගටම දැරීමට සිදුවීම හා බැඳීම් ගාස්තු (Commitment Charges) වැඩිවීම නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මග හරවා ගැනීමට කටයුතු කිරීම තුළින් පිරිවැය අවම කර ගැනීමට හැකියාව තිබුණත්, මණ්ඩලය එසේ කර නොතිබුණි

කාර්යසාධන හැකියාව නොසලකා කොන්ත්‍රාත් ප්‍රදානය

විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය 2012 මාර්තු 06 දින ආරම්භ කර තිබුණු අතර 2014 සැප්තැම්බර් 05 දින නිම කළ යුතුව තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් කාලය වර්ෂ 2 මාස 06 ක් වී තිබුණි. නමුත් ප්‍රමාණවත් කම්කරුවන් නොමැතිවීම, උප කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත්තුව අතර මඟ අත්හැර යාම හා ආනයනික අමුද්‍රව්‍ය සැපයීමට අපොහොසත් වීම වැනි කරුණු මත ව්‍යාපෘතිය 2017 මැයි 31 දක්වා අවස්ථා 4කදී දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. 2017 ජුනි 30 දින වන විටත් මෙහි භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 88.6 ක් හා සියයට 85.0 ක ප්‍රමාණයක් වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘති ප්‍රමාද කාලය පමණක් වර්ෂ 2 මාස 09 ක් වී තිබුණි. එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එසේ අකාර්යක්ෂමතාවක් තිබියදී මණ්ඩලය විසින් එම කොන්ත්‍රාත්කරු වෙත පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 108 ක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 91.30 ක් වූ

ජලසම්පාදන කොන්ත්‍රාත්තු දෙකක් 2014 අප්‍රේල් 08 දින හා 2015 දෙසැම්බර් 02 දින ප්‍රදානය කර තිබුණි.

මහනුවර නාගරික අප ජල කළමණාකරන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලැසුම් කළ ආකාරයට ක්‍රියාත්මක නොකිරීම නිසා ණය ගිවිසුම මත ණය දායකය ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 104.51 ක බැඳීම් ගාස්තු ගෙවා තිබුණි.

උපදේශක සේවා ගාස්තු

විදේශාධාර ව්‍යාපෘති සඳහා උපදේශක සේවා වෙනත් ආයතන මගින් සපයා ගැනීම හේතුවෙන් ඒ සඳහා වන වියදම මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 4 ක සිට සියයට 10 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ජලසම්පාදන ව්‍යාපෘතිවල උපදේශන සේවා සපයා ගැනීම සඳහා ජලසම්පාදනය හා ඊට අදාළ කාර්යන් සම්බන්ධයෙන් විශේෂ දැනුමක් ඇති ආයතන හා නිලධාරීන් වෙතින් ලබාගත යුතුව තිබුණි. මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරුවරුන් 115 ක් ද, ඉංජිනේරුවරුන් 423 ක් ද, සේවයේ යෙදෙන අතර මණ්ඩලයේ උපදේශන සේවා සැපයිය හැකි නිලධාරීන් ව්‍යාපෘති උපදේශන සේවා කටයුතු සඳහා යොදා ගැනීමෙන් පිටත ආයතන වෙත ගලායන මුදල් රඳවා ගැනීමට හැකියාව තිබුණු අතර ණය ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් අඩුකර ගැනීමෙන් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය වඩාත් යහපත් මට්ටමකට ගෙන ඒමට තිබුණු හැකියාව සම්බන්ධයෙන් මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

පාරිසරික බලපෑම්

රත්මලාන / මොරටුව සහ ජා ඇල / ඒකල අපජල අපහරණ කිරීමේ ව්‍යාපෘතියේ අපජල පිරිපහදුවෙන් පිටවන අපජලය සහ රොන්බොර (Wastewater sludge) පරිසරයට හෝ මිනිසුන්ට අහිතකර නොවන අයුරින් නිසි පරිදි බැහැර කිරීම ව්‍යාපෘතියේ අරමුණක් වී තිබුණි. 2016 වර්ෂය අවසාන වන විටත් අපජල පිරිපහදුවලින් බැහැරවන රොන්බොර නිසි පරිදි බැහැර කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීමට මණ්ඩලයට නොහැකිවී තිබුණි.

කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම

දේශීය බැංකු ණය ව්‍යාපෘතිවල මූලික ඉංජිනේරු ඇස්තමේන්තුව, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු වටිනාකම් සමඟ සැසඳීමේදී ඉහළ ප්‍රතිශතයකින් වැඩිවී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිමත ගෙවීමට සිදුවන ණය සේවා පිරිවැය (පොලිය + වාරික මුදල) අසාමාන්‍ය ලෙස ඉහළ අගයක් ගැනීම හා මෙම ව්‍යාපෘතිවල වත්කම් ඉහළ අගයකට ප්‍රාග්ධනිත වීමෙන් වත්කම්වල අධි ක්ෂයවීමක් නිරූපණය විය හැක. ඒ තුළින් නිෂ්පාදන පිරිවැය ඉහළ යෑමට හේතු වන බව නිරීක්ෂණය විය. විස්තර වගුව 40 හි දැක්වේ.

ව්‍යාපෘතිය	මූලික ඉංජිනේරු ඇස්තමේන්තුව	කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ වටිනාකම	ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවීම	ඉක්මවීම ඉංජිනේරු ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	
ගලගෙදර - මාවතගම ජලසම්පාදන ව්‍යාපෘතිය	700	3,064	2,364	337
කන්දකැටිය ජලසම්පාදන ව්‍යාපෘතිය	750	1,662	912	121
අම්පාර බෙදාහැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය	3,000	6,848	3,848	128
විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය	1,000	3,113	2,113	211
කොළඹ නැගෙනහිර නගර ව්‍යාපෘතිය (පැකේජ් i)	3,000	5,170	2,170	72
කොළඹ නැගෙනහිර නගර ව්‍යාපෘතිය (පැකේජ් iii)	4,000	10,049	6,049	151

වගුව - 40 ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම

දේශීය බැංකු මඟින් ලබාගන්නා ණය වෙනුවෙන් වෙළඳපොල පොලී අනුපාතය පදනම් කරගෙන ණය ලබාගැනීමට සිදුවන නිසා විදේශාධාර ව්‍යාපෘති මඟින් ලබා ගන්නා ණයවලට සාපේක්ෂව පොලී අනුපාතය ඉහළ අගයක් ගන්නා බැවින් ණය සේවා පිරිවැය වැඩිවීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමු කර නොතිබුණි.

කොන්ත්‍රාත්කරුවන්ගෙන් බදු අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම

මහනුවර නාගරික අපජල කළමණාකරන ව්‍යාපෘතියේ හා මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල නියැලෙන කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවන අවස්ථාවේදී ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) රඳවා ගැනීමේ බද්දක් ලෙස අඩුකර නොගැනීම හේතුවෙන් රු.මිලියන 9.21ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා එම ව්‍යාපෘතිවලට නොහැකි වී තිබුණි.

අතහැර දමා තිබුණු අත්‍යාවශ්‍ය විෂයන්

බස්නාහිර පළාත් ප්‍රධාන ජල සම්පාදන ප්‍රධාන සැලැස්ම යාවත්කාලීන කිරීම, ආයතනික සංවර්ධන හා ආදායම් නොලබන ජල ප්‍රමාණ අධ්‍යයනය හා වාර්තාවේ නිර්දේශවලට අනුව ජල කුළුණු සහ භූගත

ජලාශවල ජලය ඇතුළත් වන හා පිටකරන ස්ථානවල ගැලීම්මාන (Flow meters) සවිකිරීම වැදගත් හා අත්‍යවශ්‍ය බවට පෙන්වාදී තිබුණි. මණ්ඩලය විසින් එම නිර්දේශ නොසලකා හරිමින් මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතියේ රු.මිලියන 12.86 ක් හා ජපාන යෙන් මිලියන 11.70 ක වටිනාකමින් යුත් ගැලීම්මාන සපයා සවිකිරීම හා සවිකිරීමේ කුටි ඉදිකිරීම් අත්හැර දැමීමට අනුමැතිය ලබා දී තිබුණි.

ජල මූලාශ්‍ර තීරණය කිරීම

යාපනය, කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මඟින් ඉරණමඩු ජලාශයෙන් ජලය ලබාගැනීම සම්බන්ධයෙන් පැන නැගුණු ගැටළු හේතුවෙන් එය අත්හැර දැමීමට සිදුවී තිබුණි. මේ වෙනුවෙන් ලබාගත් ණය මත බැඳීම් ගාස්තු, ඇගයීම් ගාස්තු, පොලිය හා ණය මුදල අවලංගු කිරීම නිසා ගෙවන හානි පූර්ණ වන්දි වශයෙන් 2015 වර්ෂය අවසන් වන විට රු.මිලියන 84.94 ක් ගෙවීමට සිදුවීම නිසා රටට අවාසි සහගත තත්ත්වයක් වී තිබුණි.

සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් උදෙසා වාර්මාර්ග පහසුකම් සැපයීම හා ජල සම්පත් කළමනාකරණය කිරීම මෙම ක්ෂේත්‍රයේ අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කිරීම සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ වාර්මාර්ග දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන 02 ක් මගින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- වාරිමාර්ග, ජලාශ, ජල සම්පත් කළමනාකරණ විෂය පථය යටතට එන සෑම විෂයයකටම අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- වාරිමාර්ග යෝජනා ක්‍රම ජලප්‍රවාහන සහ ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවන ජලය ඉවත් කිරීමේ යෝජනා ක්‍රම, ප්‍රවර්ධනය, ඉදිකිරීම, මෙහෙයවීම, නඩත්තු කිරිම, නැවත සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරිම.
- ගංගා, ඇළ දොළ සහ අනෙකුත් ජල මාර්ග දූෂණය වැලැක්වීම.
- වැසි ජලය රැස් කිරිම.
- ඉංජිනේරු උපදේශන සේවා සහ ඉදි කිරීම්.
- ජල සම්පත් මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය

වාර්මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේ දී රු.මිලියන 998.58 ක් ද, 2015 වර්ෂයේදී රු.මිලියන 3,012.48 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 4,011.05 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් විදේශීය සමාගමකට ගෙවා තිබුණ ද ව්‍යාපෘතියට අදාළ කිසිදු කාර්යයක් 2017 ජූලි 31 දින වන විටත් ඉටු කර නොතිබුණි. 2014 වර්ෂයේ දී ගෙවන ලද අත්තිකාරම් මුදල වන රු.මිලියන 998.58 ක් එම වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. 2015 වර්ෂයේදී ගෙවා තිබුණු අත්තිකාරම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් තැබීම නිසා එම වැය විෂයේ රු.මිලියන 2,972.49 ක අධිවැයක් සිදු කර තිබුණි. 2016 වර්ෂයේ දී රු.මිලියන 4,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද ඉන් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

අමාත්‍යාංශයේ විෂය පථයට නොවැටෙන කාර්යයන් ඉටු කිරීම

ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත බෙදාහැරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් පෙරසවි ගොඩනැගිලි මිලදී ගෙන වාරික 07 කින් ගෙවීම සඳහා 2012 ජූලි 05 දින චීන සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. 2015 වර්ෂයේ දී ඒ සඳහා රු.මිලියන 2,774.80 ක් ගෙවා තිබුණු අතර 2012 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 12,442.5 ක් ගෙවා තිබුණි. එම පෙරසවි ගොඩනැගිලි මිලදී ගැනීම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යභාරයක් නොවන අතර අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ද ඇතුළත් වී නොතිබුණි. තවද ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත භාර දුන් මුළු නිවාස සංඛ්‍යාව සහ එම නිවාස සතුටුදායක ලෙස සවිකළ බවට ආයතන ප්‍රධානීන්ගෙන් ලබාගත්

සහතික ද 2017 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

කූට ලේඛණ පදනම් කරගෙන සංයුක්ත දීමනා ලබා ගැනීම

සමාලෝචිත වර්ෂයේ දී විදේශ සංචාරයක යෙදුනු අමාත්‍යාංශයේ උසස් නිලධාරින් දෙදෙනෙකු කූට ලේඛනයක් උපයෝගී කර ගනිමින් එක්සත් ජනපද ඩොලර් 8,800 ක් ලබා ගෙන තිබුණි.

භූගත ජලය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම

භූගත ජලය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන අරමුණක් වී තිබුණු අතර, ඒ සඳහා 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පර්යේෂණ අධ්‍යයන 11 ක් ආරම්භ කර රු.මිලියන 112.29 ක් වැය කර තිබුණි. 2017 ජුනි 30 දින වන විටත් එම කිසිදු පර්යේෂණයක් සැලැසුම් කළ පරිදි නිම කර නොතිබුණි.

මණ්ඩලයේ සේවකයින් වෙනත් ආයතනවලට මුදා හැරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව මණ්ඩලයේ සේවකයන් 06 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතනවලට මුදාහැර වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 1.35 ක් ගෙවා තිබුණි.

තිරසර සංවර්ධනය හා වනජීවී සංරක්ෂණය

පරිසර වෙනස්වීම් සහ කාබන් මත රඳා පැවැතීම අවම කිරීම, වනජීවී සංරක්ෂණය හා වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු තුනක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතනයක් මගින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- තිරසර සංවර්ධනය හා වනජීවී විෂයයන්ට හා අදාළ දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති ස්ථාපිත කිරීම.
- පරිසර වෙනස්කම් සහ කාබන් භාවිතය අවම ආර්ථිකයක් සහිත තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා නීති සහ උපාය මාර්ග සම්පාදනය කිරීම.
- තිරසර මිණුම් සහ පාරසරික පියසටහන් දර්ශකය සම්පාදනය කිරීම.
- තිරසර සංවර්ධනය සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල් වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම.
- සිවුපාවුන්, පක්ෂීන් සහ උරගයින් ආදි විවිධ සතුන් ඒකරාශී කිරීම සහ ප්‍රදර්ශනය කිරීමට අදාළ කටයුතු.
- වනජීවී සම්පත් සංරක්ෂණය.
- වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම

ඉහත සඳහන් ආයතන විසින් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අලි හා මිනිස් ගැටුම්වලින් මියයාම් වැඩිවීම

භූමි පරිහරණ රටාවේ වෙනස්වීම හා භාවිත කළ හැකි වාසස්ථානවල ගුණාත්මකභාවය පිරිහීම හේතු කොට ගෙන ප්‍රශස්ථ ගුණාත්මකභාවයකින් යුතු වාසස්ථාන අඩුවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය, එහි පැවැත්මට ඇති තීරණාත්මක බාධාවලට මුහුණ දෙමින් සිටී. මේ හේතුව නිසා මිනිසා සමඟ ඇතිවන ගැටුමෙන් පාර්ශව දෙකටම හානිවන අතර මිනිස් මරණ, වනඅලි මරණ, ශාරීරික හානි හා දේපලවලට සිදුවන හානි මේ අතුරින් ප්‍රමුඛය. අලි මිනිස් ගැටුම ඇතිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව, අලි මරණ සංඛ්‍යාව සියයට 36 ක්, මිනිස් මරණ සංඛ්‍යාව සියයට 40 ක් හා දේපල හානි සියයට 8 ක් හා ශාරීරික හානි සියයට 50 කින්ද වැඩිවී තිබුණි. උක්ත ගැටළුවට විසඳුම් වශයෙන් විවිධ ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගෙන තිබුණු අතර ජනාවාස තුළට වන අලින්ගේ පිවිසීම බාධක වන පරිදි විදුලිවැට, ජීව වැට හා වෙනත් නවීන ක්‍රමවේද මගින් භෞතික බාධක ස්ථාපිත කිරීමට කටයුතු කර තිබුණි. නමුත්, ආසන්න වසර 05 ක කාලය තුළ සිදුවූ අලිමරණ හා මිනිස් මරණ සංඛ්‍යාව ඉහළ අගයන් ගෙන තිබුණි. විස්තර රූපසටහන 37 හි වේ.

රූපසටහන 37 - පසුගිය වර්ෂ 7 තුළ මිය ගිය අලි ගණන හා මිනිස් ජීවිත ගණන

විදුලිවැට ඉදිකිරීම

සමාලෝචිත වර්ෂය අවසන් වන විට වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා විදුලි වැට ඉදි කිරීම යොදාගනු ලබන ප්‍රධානතම මෙවලම වී තිබුණි. සමාලේචිත වර්ෂය අවසන් වන විට කිලෝ මීටර් 3,860.73 ක දුර ප්‍රමාණයක විදුලි වැට ඉදි කර තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේදී කිලෝමීටර් 287.1 ක් දුරකට විදුලිවැට ඉදිකර තිබුණි. විදුලි වැට ඉදිකිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සාරාංශ කර පහත සඳහන් කර ඇත.

- විල්මැන්න උරණය (මෝදරපැලැස්ස ඇදළ) විදුලිවැට කිලෝමීටර් 20 ඉදි කිරීම සඳහා රු.මිලියන 2.81 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, කිලෝමීටර් 6 ක දුරක් හා බලශක්ති කුටි 1 ක් පමණක් ඉදිකර තිබුණි. එකී අලිවැට ඉදි කිරීම් කටයුතු අතරමඟ අත්හැර දැමීම නිසා රු.මිලියන 2.03 ක වියදම නිෂඵල වී තිබුණි. තවද අලි වැට කණු පුළුස්සා දැමීමට ප්‍රදේශවාසීන් ක්‍රියාකර තිබුණි.

- කොහොලංකල සිට කරඹවැව දක්වා කිලෝමීටර් 46 මාර්ගය ඉදි කිරීම සඳහා රු.මිලියන 4.14 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් කිලෝමීටර් 25.5 දුරක් ඩෝසර් කිරීම් සිදුකිරීම සඳහා රු.මිලියන 2.95 ක් වියදම් කර තිබුණත්, දේශපාලන බලපෑම් හේතුවෙන් එය අතහැර දමා තිබුණි.

- ඉඩම් ගැටළු හේතුවෙන් අළුත්ගංආර - උනාතුවැව දක්වා කිලෝමීටර් 60 ක දුරක් ඉදි කළ යුතු විදුලි වැටෙන් කිලෝමීටර් 19.5 ක් දුරක් පමණක් ඉදි කර තිබුණු අතර විදුලි වැට සම්පූර්ණ නොකිරීම නිසා ඒ සඳහා වැය කළ රු.මිලියව 3.23 ක නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. එමෙන්ම සදගලගම ඉලුක්පැලැස්ස මහනෙටුල විදුලිවැට කිලෝමීටර් 24 දුරක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණද, එහිදී ඉඩම් ගැටළු පැන නැගීම නිසා එම කටයුතු අත්හැර තිබුණි.

- උඩවලව ජාතික උද්‍යානයේ ඉදිකළ තාවකාලික විදුලිවැට ඉදිකිරීම පිළිබඳව සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේදී අලිවැට නඩත්තු කටයුතු නිසිලෙස සිදු නොවන බව තහවුරු විය. අලින් විසින් අලිවැට කඩා කණු බිම දමා තිබුණු බව පහත සඳහන් ඡායාරූප අංක 01 හා 02 මගින් පැහැදිලි වේ.

ඡායාරූප අංක 09. - අලිවැට කඩා ඇති අයුරු

ඡායාරූප අංක 10. - අලිවැට කඩා ඇති අයුරු

රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

රාජ්‍ය සේවා විශ්‍රාමිකයින් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන්ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම තුළින් ආර්ථික හා සමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහිකිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර වේ.

2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සක්‍රීය විශ්‍රාමිකයින් 579,414 කට ප්‍රතිලාභ ලබා දී තිබුණි. 2016 වර්ෂයේ රු.මිලියන 172,276 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා තිබුණි. එය මුළු රජයේ පුනරාවර්තන වියදමෙන් සියයට 10 ක් වී තිබුණු අතර එය මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 9.8 ක් වී තිබුණි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගෙවීමේ දී වැඩිපුර ගෙවීම්, ද්විත්ව ගෙවීම්, වංචා සහගත ගෙවීම් සිදුවී තිබුණි. එම තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා 2014 වර්ෂයේ සිට ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ වූ විවිධ අදියරයන් යටතේ, 2015 ජනවාරි මාසයේ සිට මධ්‍යගත දත්ත පද්ධතියක් ආරම්භ කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කර තිබුණි. 2016 ඔක්තෝබර් මාසයේ සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය (PMS) මගින් 2,600 ක් පමණ වූ රාජ්‍ය ආයතන අන්තර්ජාලය හා මාර්ගගතව (Online) සම්බන්ධ වෙමින් ප්‍රථම විශ්‍රාම වැටුප් අයදුම්පත් ගෙන්වා විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. නමුත් 2014 වර්ෂයේ සිට සිදුකරනු ලබන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අදාළව සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සේවයේ නියුක්තව සිට විශ්‍රාම ගිය නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ කිහිපයක් සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම

විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිව්‍යුහගත කිරීමේ දී, විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය තුළ ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මාසික විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සිදුවී තිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- 2016 ජනවාරි මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය තුළ සිදුකළ නියැදි පරීක්ෂාවේදී විශ්‍රාමිකයින් 13දෙනෙකු සඳහා ඔවුන්ට හිමි මාසික විශ්‍රාම වැටුප දෙවරක් බැගින් ගෙවීම හේතුවෙන් රු. මිලියන 4.7 ක් ද, විශ්‍රාමිකයින් 10දෙනෙකු සඳහා හිඟ විශ්‍රාම වැටුප දෙවරක් බැගින් ගෙවීම හේතුවෙන් රු. මිලියන 0.58 ක් ද වැඩිපුර ගෙවා තිබුණි.

- 2006 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගිය නිලධාරීන් 4 දෙනෙකු සඳහා 2015 අගෝස්තු 06 දිනැති හා අංක 5/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප නිවැරදිව සංශෝධනය නොකිරීම හේතුවෙන් රු. මිලියන 0.55 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

- ඒකාබද්ධ කර ගෙවිය යුතු යුගල විශ්‍රාම වැටුප් ඒකාබද්ධ නොකර විශ්‍රාමිකයින් 18 දෙනෙකු සඳහා හිමි විශ්‍රාම වැටුප් යුගලයටම අන්තර් දීමනා ගෙවීම හේතුවෙන් රු. මිලියන 1.82 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- රජයේ සේවකයෙකු වශයෙන් ලැබිය යුතු උපරිම ජීවන වියදම් දීමනාව ඉක්මවා සිවිල් හා සන්නද්ධ සේවා විශ්‍රාමික නිලධාරින් 522 දෙනෙකු වෙත ජීවන වියදම් දීමනාව ගෙවීම හේතුවෙන් රු. මිලියන 81 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- විදේශ ගත වූ විශ්‍රාමිකයකුට ගෙවිය යුතු උපරිම සීමාව ඉක්මවා ජීවන වියදම් දීමනාව හා අන්තර් දීමනාව ගෙවීම හේතුවෙන් රු. මිලියන 0.16 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් රු.මිලියන 37.2 ක් වැඩිපුර ගෙවා තිබුණු බව අනාවරණය කර ගෙන තිබුණි.

- 2016 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම්වල වටිනාකම රු.මිලියන 320.25 ක් විය. එම විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි.102 සිට 113 දක්වා කටයුතු කර, මුදල් රෙගුලාසි 119 ප්‍රකාරව වගකිව යුත්තන් නිශ්චය කර ඔවුන්ට එය අධිභාර කළ යුතුව තිබුණත්, එසේ සිදු කර නොතිබුණි. 2015 හා 2016 වර්ෂ අවසානයට පිළිවෙලින් අවුරුදු 5 ට අඩු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් රු. 125,257,219 ක් හා රු.262,718,954 ක්ද, අවුරුදු 5-10 ත් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් රු. 63,789,453 ක් හා රු.168,088,603 ක්ද වශයෙන් තවදුරටත් පැවතුණි.

වාර්ෂිකව ජීවන සහතික ලබානොගෙන විශ්‍රාම වැටුප් ගෙවීම

විශ්‍රාම වැටුප් මධ්‍යගත දත්ත පද්ධතිය අනුව 2016 වර්ෂය සඳහා වාර්ෂිකව ජීවත්වන බවට සහතික ලබානොදුන් විශ්‍රාමිකයින් 109,842 ක් සඳහා විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

විශ්‍රාමික ලිපිගොනු නොමැති විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම

නියැදි විගණන පරීක්ෂාවට අනුව 2016 වර්ෂයේදී කොලොන්නාව සහ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම ලිපිගොනු නොමැති විශ්‍රාමිකයින් 112 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් ගෙවා තිබුණු බව අනාවරණය විය.

විශ්‍රාම වැටුප් සංශෝධන සකස් කිරීම

2015 ජූනි 25 දිනැති අංක 16/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව 2016 දෙසැම්බර් මාසය අවසන් වන විට, 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව විශ්‍රාමිකයින් 7,343 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර නොතිබුණි.

විශ්‍රාම තොරතුරු සත්‍යාක්ෂණය නොකර විශ්‍රාම වැටුප් ගෙවීම

විමධ්‍යගතව පැවති විශ්‍රාමික තොරතුරු ඒකරාශී කොට විශ්‍රාම වැටුප් මධ්‍යගත පද්ධතිය සකස් කිරීමේදී විමධ්‍යගතව තිබූ දත්ත විශ්‍රාමික සංගණනයක් මගින් සත්‍යාක්ෂණය නොකර ඍජුවම භාවිතා කොට තිබුණි.

බාලවයස්කරුවන්ගේ ඉතිරි කිරීමේ පාස් පොත්

විශ්‍රාම ප්‍රතිලාභ හිමිගැන්වීම් ක්‍රම යටතේ බාලවයස්කරුවන්ට හිමිවන මුදල්, ජාතික

ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු ගිණුමක හෝ ස්ථාවර තැන්පතුවක තැන්පත් කර වයස සම්පූර්ණ වූ විට බාලවයස්කරුවන්ට ලබාදීමේ වගකීම අදාළ රාජ්‍ය ආයතන වෙත පවරා තිබුණි. එම ක්‍රියාදාමය පිළිබඳව අධීක්ෂණයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතුව තිබුණි. වයස සම්පූර්ණ වූ බාලවයස්කරුවන්ට හිමි ප්‍රතිලාභ ගෙවා නොතිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- කොළොන්නාව හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ බාලවයස්කරුවන්ගේ වයස සම්පූර්ණ වී තිබුණු පිළිවෙළින් පාස් පොත් 24 ක් හා ස්ථාවර තැන්පතු 5 ක්ද, පාස් පොත් 8 ක්ද එම කාර්යාලවල පැවතුණි.
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව 1927 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා කාලය තුළදී බාලවයස්කරුවන් 1482 ක් වෙනුවෙන් තැන්පත් කරන ලද රු.මිලියන 1.55 ක් පැවතුනි. 2013 අගෝස්තු 30 දින වන විටද බාලවයස්කාරීත්වය සම්පූර්ණ කර තිබුණ ප්‍රතිලාභීන් වෙත එම පාස්පොත් ලබා දී නොතිබුණි. 1995 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළදී බාලවයස්කරුවන් 943 දෙනෙකුගේ වයස සම්පූර්ණ වුවද, ඔවුන්ගේ පාස්පොත් ලබා දී නොතිබුණි. මේ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් බාලවයස්කරුවන්ගේ පාස්පොත්වල තැන්පත් කරන ලද මුදලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.
- පාස්පොත් ලබා දීමේ පැරණි ක්‍රමවේදයේ පැවති දුර්වලතා හේතුවෙන් 2015 සැප්තැම්බර් 14 දිනැති අංක 09/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මඟින් බාලවයස්කරුවන්ට ප්‍රතිලාභ හිමිගන්වන මුල් අවස්ථාවේදීම පාස්පොත හාරකරුවා අතට පත් කර තිබුණි. කෙසේ නමුත් පැරණි ක්‍රමවේදය යටතේ පැවති පාස්පොත් සහ ස්ථාවර තැන්පතුවල ප්‍රතිලාභ හිමිකරුවන් වෙත ලබාදීමට විධිමත් වැඩපිළිවෙලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

විශ්‍රාම පාරිතෝෂිකයෙන් සිදුකරන අවකරණ

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම පාරිතෝෂිකයෙන් කරනු ලබන අවකරණයන් ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් නිවැරදිව ගිණුම්ගත කිරීම පිළිබඳව සිදු කර තිබුණු අධීක්ෂණය දුර්වල වී තිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 05 ක් විසින් 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් අනුව විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරින් විසින් ලබා ගෙන තිබුණු අත්තිකාරම් හා ණය ඔවුන්ගේ විශ්‍රාම පාර්තෝෂිකයෙන් හෝ මරණ පාරිතෝෂිකයෙන් එකතුව රු.මිලියන 94.99 ක් අවකරණය කර තිබුණත්, එම අවකරණයන් මගින් ඔවුන්ගේ වැටුප් අත්තිකාරම් ණය ශේෂයන් නිරවුල් කර නොතිබුණි.
- රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පිළිවෙලින් 27 කට හා 64 කට අදාළව මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම අනුව මියගිය නිලධාරීන්ගෙන් රු.මිලියන 21.58 ක්ද, විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් රු. මිලියන 116.44ක් ද, වශයෙන් රු.මිලියන 138.02 ක

විශ්‍රාමික පාරිතෝෂික අවකරණ ගිණුම් ගත කර නොතිබුණි.

- 2016 වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම රජයට අයත් නිලධාරින් 4318 දෙනෙකුගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් සිදු කළ අවකරණ රු.මිලියන 19.79 ක් වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

අවකරණ මුදල්ද සමඟ විශ්‍රාමිකයාට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම

විශ්‍රාමිකයාට විශ්‍රාම පාරිතෝෂිකයෙන් රජයට අයවිය යුතු අවකරණ අඩු නොකර මුළු පාරිතෝෂිකයම විශ්‍රාමිකයාට ගෙවීම හේතුවෙන් විශ්‍රාමිකයින් 182 දෙනෙකු සඳහා රු.මිලියන 9.96 ක් වැඩිපුර ගෙවා තිබුණි. විශ්‍රාම පාරිතෝෂිකය සියයට 12 ක පොලිය මත අවුරුදු 18 කින් බැංකු ණයක් මඟින් ගෙවීම හේතුවෙන් වැඩිපුර ගෙවන ලද පාරිතෝෂික වෙනුවෙන් වූ ණය සඳහා පමණක් වර්ෂ 18 ක් අවසානයට රු.මිලියන 10.80 ක පොලීය අමතරව ගෙවීමට සිදු වී තිබුණි.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2016 ජනවාරි 01 දිනට ගෙවීම් නොකළ අයදුම්පත් 5,604 ක් පැවැතුණි. සමාලෝචිත වර්ෂයේ ලද අයදුම්පත් ගණන ඇතුළුව ගෙවීම් කළ යුතුව පැවැති මුළු අයදුම්පත් ගණන 12,158 ක් වී තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේදී අයදුම් පත් 5,109 කට පමණක් ප්‍රතිලාභ ගෙවා තිබුණි.

පළාත් සභාවල විගණන නිරීක්ෂණවල සාරාංශය

බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා රු.මිලියන 36,929 ක් රජයේ ප්‍රදාන හා ඉතිරිවීම් මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 38,465 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 75,394 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 60,476 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 14,918 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 75,394 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 24,102 ක්ද, අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 41,203 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 65,305 ක ආදායම් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 54,326 ක් හා මූලධන වියදම රු.මිලියන 7,382 ක් වශයෙන් රු.මිලියන 61,708 ක් උපයෝජනය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී ආවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

ආදායම් කළමනාකරණය

දීර්ඝකාලීන හා වාර්ෂික ඉඩම් බදුදීම්වලට අදාළව සිදුකළ නියැදි පරීක්ෂාවන් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක රු.මිලියන 80.76 ක හිඟ ආදායමක් පැවතුණි.

මහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දීර්ඝකාලීන පදනම මත ආයතන 04 ක් වෙත ලබාදී තිබූ ඉඩම්වල අදාළ කර්මාන්ත නියමිත පරිදි ආරම්භ කර නොතිබුණි. මේ නිසා එකී ඉඩම්වලින් බදු මුදල් අයකිරීමක් සිදු කර නොතිබුණි. ආයතන දෙකක් වෙත ලබා දී තිබුණු ඉඩම්වල අදාළ කර්මාන්ත නියමිත පරිදි ආරම්භ කර නොතිබුණු බැවින් එම ආයතන 02 කින් අයකර ගත හැකිව තිබුණු රු.මිලියන 6.36 ක බදු මුදලක් අහිමි වී තිබුණි.

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැසිකිළි පද්ධති 04 ක් ස්ථාපනය කිරීම සඳහා පළාත් සංචාරක මණ්ඩලය විසින් රු.මිලියන 11.04 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් එක් වැසිකිළි පද්ධතියක් පමණක් භාවිතා කළ හැකි මට්ටමේ පැවැතුණි.

2013 වර්ෂයේදී රු.මිලියන 9.5 ක් පමණ මුදලක් වැයකර පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වෙරළ පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. මෙම යන්ත්‍රය පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධනය, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් මිලදීගෙන තිබුණද, එම අමාත්‍යාංශයෙන් මුදල් ලැබුණු බව හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම යන්ත්‍රය අදාළ පාර්ශවයන් වෙත පැවරීමක් කළ බවට හෝ ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදවා තිබුණු බව හෝ හඳුනා ගැනීමට නොහැකි විය.

කළමනාකරණ අකාර්යක්ෂමතා

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීමක් නොලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණියකට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට හිමි SL-01 වැටුප් තලය

වෙනුවට 2007 මැයි මාසයේ සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය හා ඊට අදාළ SL-03 වැටුප් තලය පදනම් කරගෙන වැටුප් ගෙවීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී තිබුණි. ඒ මත වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට, කලානුරූපීව සිදුවන වැටුප් සංශෝධනයන් සිදුකිරීමට සහ විශ්‍රාම වැටුප් ඉල්ලීම සඳහා හා ඊට අදාළ අනෙකුත් වරප්‍රසාද සඳහා SL-03 වැටුප් තලය අදාළ කරගෙන තිබුණි.

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ලෙස කටයුතු කළ නිලධාරිණියකට එරෙහිව මූලික විමර්ශනයක් සිදුකිරීමට තීරණය කර 2015 වර්ෂයේදී ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණි. එහෙත් එම නිලධාරිණියට බස්නාහිර පළාත් සභාව තුළ කාර්යාල ඉඩ පහසුකම් හා තනතුරක් ලබාදී රාජකාරි පැවරීමක් සිදුකර පළාත් සභාවට සේවයක් ලබාගෙන තිබුණු බව විගණනයේදී තහවුරු වී නොතිබුණි. එසේ සේවයක් ලබාගෙන නොතිබියදී 2015 පෙබරවාරි මාසයේ සිට 2017 ජනවාරි මාසය දක්වා පළාත් සභා අරමුදලින් වැටුප් හා දීමනා වශයෙන් එකතුව (අවකරණවලට පෙර) රු.මිලියන 2.11 ක් ගෙවා තිබුණි.

මෙහෙයුම් අකාර්යක්ෂමතා

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හා ප්‍රාදේශීය රෝහල් 09 ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී ඖෂධ වර්ග 129 ක් යටතේ ඒකක 1,270,611 ක් කල් ඉකුත්වීම හා ගුණත්වයෙන් බාලවීම හේතුවෙන් භාවිතයෙන් ඉවත්කර හෝ විනාශ කර තිබුණි. එම ඖෂධවල ගණනය කළ වටිනාකම රු.මිලියන 2.33 ක් විය.

මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කොළඹ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ජීව වෛද්‍ය ඒකකය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 22 ක පමණ සෞඛ්‍ය උපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම් සිදුකර තිබුණි. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණු අතර එක් සැපයුම්කරුවකුගේ ලංසුව පදනම් කරගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණි. එකී මිලදී ගැනීම් තුළ පිරිවිතරයන්ට අනුකූල නොවන බවට නිර්දේශ කළ භාණ්ඩ වර්ග 04 ක් යටතේ වටිනාකම රු.මිලියන 8.07 ක්වූ ඒකක 213 ක් හා පිරිවිතරයන්ට අනුකූලදැයි පරීක්ෂා කළ බවට සනාථ නොකළ භාණ්ඩ වර්ග 04 ක් යටතේ වටිනාකම රු.මිලියන 13.81 ක්වූ ඒකක 22 කට අයත් භාණ්ඩ පැවතුණි.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ගම්පහ කළාප අධ්‍යාපන බල ප්‍රදේශය තුළ පිහිටි පාසල් 57 ක අඩක් නිමකර තිබූ ගොඩනැගිලි 61 ක් නිරීක්ෂණය විය. එම ගොඩනැගිලි වෙනුවෙන් රු.මිලියන 277.69 ක් වැය කර තිබුණි. ඉන් පාසල් 04 ක රු.මිලියන 12.01 ක් වැයකර වෙනත් ගොඩනැගිලි 08 ක් ඉදිකර තිබුණි.

පළාතේ දහම් පාසල් නඟා සිටුවීම අරමුණු කරගත් "සරුදම් අරුණැල්ල" නැමති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ලේකම්ගේ වැය ශීර්ෂය යටතේ 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 665.73 ක් බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට ලබාදී තිබුණි. කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම මුදලින් රු.මිලියන 29.30 ක් වෙනත් ව්‍යාපෘති සඳහා වැය කර තිබුණු අතර, පළාතේ දහම් පාසල් නගාසිටුවීම සඳහා රු.මිලියන 572.80 ක් පමණක් වැය කර තිබුණි. ඉතිරි රු.මිලියන

63.63 කින් රු.මිලියන 13.06 ක් ආයතනයේ පරිපාලන වියදම් සඳහා ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉතිරි වී තිබුණු මුදල රු.මිලියන 5.41 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 45.16 ක මුදල පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

අඩු ආදායම්ලාභී පවුල් වෙත ඇස් කණ්නාඩි ලබාදීම අරමුණු කරගත් "නෙතට අරුණ" නැමති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ලේකම්ගේ වැය ශීර්ෂයෙන් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 53.36 ක මුදලක් බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය වෙත ලබාදී තිබුණි. කාර්යාංශය විසින් එම ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ ඇස් කණ්නාඩි ලබාදීම හා ඇස් පරීක්ෂාව සඳහා පිළිවෙලින් රු.මිලියන 39.59 ක් හා රු.මිලියන 2.56 ක් වශයෙන් එකතුව රු.මිලියන 42.15 ක් පමණක් වැයකර තිබුණි. ඉතිරි මුදලින් රු.මිලියන 1.90 ක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු වෙනත් ව්‍යපෘති වෙනුවෙන් වැය කර තිබුණි. ආයතන හා පරිපාලන වියදම් වශයෙන් රු.මිලියන 2.68 ක් රඳවා ගෙන තිබුණි. ඉන්ධන, බැනර්, උත්සව වැනි කටයුතු සඳහා රු.මිලියන 0.25 ක් (අදියර 2) වැය කර තිබුණි. ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලැබී තිබුණු මුදල සමඟ සැසැඳූ විට රු.මිලියන 6.38 ක මුදල සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා රු.මිලියන 12,989 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 6,766 ක් ද, වශයෙන් එකතුව රු. මිලියන 19,755 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 30,030 ක් ද මූලධන වියදම් වශයෙන් රු. මිලියන 12,989 ක් ද, එකතුව රු. මිලියන 43,019 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 5,097 ක් ද අභ්‍යන්තර මාර්ග මගින් රු. මිලියන 6,980 ක් ද වශයෙන් එකතුව රු. මිලියන 12,077 ක ආදායම් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු. මිලියන 29,299 ක් හා මූලධන වියදම රු.මිලියන 5,097 ක් වශයෙන් රු. මිලියන 34,396 ක් උපයෝජනය කර තිබුණි. 2016 වර්ෂයේදී රු.මිලියන 5,097 ක් ආයෝජනයන් සිදු කර තිබුණි.

මධ්‍යම පළාත් සභාවට අදාළව 2016 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම

මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය 2016 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර නොතිබුණු කෘෂි මාර්ග 4 ක් වෙනුවෙන් රු. මිලියන 8.12 ක් හා වතු මාර්ග 6 ක් වෙනුවෙන් රු. මිලියන 4.65 ක් වශයෙන් එකතුව රු.මිලියන 12.77 ක වැඩ අවසන් කර ඇති ලෙස සලකා ගෙවීම් කර තිබුණි.

මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ගොඩනැඟිලි ඉදිකිරීම් ව්‍යාපෘති 8 ක කටයුතු ඉටු කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 128.7 ක් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. 2017 මාර්තු 31 දින වන විටත් ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණි.

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නාලන්ද ගොවිපල මධ්‍යස්ථානය නවීකරණය සහ දේශීය ආහාර ප්‍රවර්ධන කිරීමේ ව්‍යාපෘතිය යටතේ හෙලබොජුන් හල් සඳහා ලී බඩු හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් පළාත් සභාවේ මූල්‍ය රීති 471.2 ට පටහැනිව රු.මිලියන 2.21 ක් අදාළ වෙළඳ ආයතන වෙත ගෙවීම් කර තිබුණි. එම උපකරණ 2017 මැයි 31 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගල්පාලම ගොවිපලෙහි ඉදිකිරීම් පිළිබඳව 2017 අප්‍රේල් මාසයේදී භෞතිකව සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී වැඩ අවසන් කර නොතිබුණු එක් කර්මාන්තයක් සඳහා රු.මිලියන 0.17 ක් හා තවත් කර්මාන්ත 4 ක කළ වැඩ වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයකින් තොරව රු.මිලියන 3.36 ක් වශයෙන් එකතුව රු.මිලියන 3.53 ක් ගෙවීම් කර තිබුණි.

චක්‍රලේඛ විධිවිධානවලට පටහැනි වීම

2013 මාර්තු 13 දිනැති අංක 2013/11 හා 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛවලට පටහැනිව සරසවි උයන මහා විද්‍යාලයේ 2014, 2015 හා 2016 වර්ෂවල පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදී එක් ළමයකුගෙන් රු.15,000ක් බැඟින් එකතුව රු.මිලියන 4.88 ක් අදාළ ළමුන්ගේ දෙමාපියන් විසින් එකවර

හා වාරික ලෙස පාසල් සංවර්ධන සමිතියේ බැංකු ගිණුමට බැර කර තිබුණි

2015 ජූනි 05 දිනැති අංක සීඑස්ඒ/1/1/83 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය ප්‍රකාර විදේශ සංචාර වහාම අත්හිටුවීමට ක්‍රියා කළ යුතු වුවද, එම උපදෙස්වලට පටහැනිව 2016 වර්ෂයේ මධ්‍යම පළාත් සභා ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් 83 ක් ඇතුළුව නිලධාරීන් 22 දෙනෙකු විදේශ සංචාර 02 ක් සඳහා පිළිවෙලින් රු.මිලියන 24.92 ක් හා රු.මිලියන 29.15 ක් වශයෙන් එකතුව රු.මිලියන 54.07 ක් පළාත් සභා අරමුදලින් වැය කර තිබුණි.

රජයේ ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව ගෘහභාණ්ඩ මිලදී ගැනීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව මධ්‍යම පළාත් ආණ්ඩුකාර නිල නිවාසය සඳහා රු.මිලියන 3.99 ක් වැය කර ගෘහ භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග නඩත්තු කිරීම සඳහා රු.මිලියන 190.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් සියයට 39ක් වන රු.මිලියන 73.94 ක් පමණක් මාර්ග නඩත්තු කටයුතු සඳහා වැය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 61ක් හෙවත් රු.මිලියන 116.06 ක ප්‍රතිපාදන, සේවක වැටුප් ගෙවීමට උපයෝගී කර ගෙන තිබුණි.

පාසල්වල ගුරුභවතුන්ගේ ඌනතා හා අතිරික්තතාවයන් පැවතීම

මධ්‍යම පළාතේ පාසල්වල ගුරුභවතුන් 4,308 දෙනෙකුගේ අතිරික්තයක් පැවතියද, ගලේවෙල කළාපයට අයත් පාසල් 108 ක විවිධ විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 157 ක් හා නුවරඑළිය හා කොත්මලේ කළාපවලට අදාළ පාසල්වල ගුරු පුරප්පාඩු 710 ක් පැවතුණි.

මෙහෙයුම් අකාර්යක්ෂමතා

මධ්‍යම පළාත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2009, 2010 හා 2011 යන වර්ෂවලදී විදුලි දිගු 9ක් සැකසීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත රු.මිලියන 2.73 ක් ගෙවා තිබුණි. එම ව්‍යාපෘති වෙනත් විකල්ප යෝජනා මගින් ක්‍රියාත්මක කර තිබුණු බව ලංකා විදුලිබල මණ්ඩලය විසින් දන්වා තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් විදුලි බල මණ්ඩලය වෙත ගෙවා තිබුණු මුදල පළාත් සභා අරමුදලට ලැබී නොතිබුණි.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක බීඩී/ජීපීඑස්/130/9/14/එම්සී දරන 2016 ජනවාරි 06 දිනැති චක්‍රලේඛය අනුව මධ්‍යම පළාත් ක්ෂේත්‍ර නිලධාරීන්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන යටතේ යතුරුපැදි ලබාගත් නිලධාරීන්, යතුරුපැදි හිමි නොවන තනතුරකට පත්වූ විට එම යතුරුපැදියේ වෙළඳපල වටිනාකම මාස 4 ක් තුළ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වුවද, එසේ යතුරු පැදි ලබාගෙන වෙනත් තනතුරුවලට ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,617,180 ක් 2017 මාර්තු 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

අවිධිමත් ගනුදෙනු

ගුරුදෙණිය අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ නේවාසිකාගාරය විධිමත් පරිදි වෙන්කර ගැනීමකින් තොරව 2010 ජනවාරි මාසයේ සිට 2015 ජනවාරි 09 දින දක්වා මධ්‍යම පළාත් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන්ගේ පරිහරණය සඳහා භාවිතා කර තිබුණි. ඊට අදාළව හිඟ නේවාසිකාගාර ගාස්තු වූ රු.මිලියන 2.54 ක්

සම්පත් මධ්‍යස්ථානයෙන් අය විය යුතුව පැවතුණි.

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට අයත් ජනසවිගම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම හා ඇවිදින මං තීරු සැකසීම සඳහා 2014 හා 2015 වර්ෂයන්වලදී මුදල් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව වත්කම් නඩත්තු වැය විෂයය යටතේ රු.මිලියන 7.13 ක් හා තුලිත ආර්ථික සංවර්ධන ව්‍යාපෘති අරමුදලින් රු.මිලියන 3.29 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 10.42 වැය කර ඉදිකර තිබුණු ඇවිදුම් මං තීරු භාවිතයට නොගෙන වල් බිහිවී තිබුණි.

දෘශ්‍ය අක්‍රමිකතා

හැටන් සීඩා මධ්‍යස්ථානයේ 2014 මාර්තු 21 දින සිට 2016 ජුනි 26 දින දක්වා බාහිර ආයතන විසින් පවත්වන ලද නේවාසික හා නේවාසික නොවන වැඩසටහන් වෙනුවෙන් අවස්ථා 407 ක දී රැස්කළ යුතු රු.මිලියන 2.63 ක ආදායම් බිල්කර ගිණුම්ගත කිරීමට ස්ථානය භාර සම්බන්ධීකරණ නිලධාරි විසින් කටයුතු කර නොතිබුණි.

උතුරු මැද පළාත් සභාව

පසුගිය වර්ෂ 29 ක කාලය තුළ උතුරු මැද පළාත් සභාව විසින් ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයට සියයට 5.4 ක් වැනි පහළ මට්ටමක දායකත්වය ලබා දී තිබුණි. පළාතේ දරිද්‍රතාවය සියයට 7.3 ක මට්ටමක පැවතුණි. මෙම තත්ත්වය හඳුනාගෙන උතුරු මැද පළාත් සභාව විසින් 2016 වර්ෂයේදී පළාත් කෘෂිකර්ම, අධ්‍යාපනය, සෞඛ්‍ය, ග්‍රාමීය යටිතල පහසුකම් වැනි ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 17,404 ක් රජයේ ප්‍රදාන මගින්ද, රු.මිලියන 20,981 ක අභ්‍යන්තර ආදායම් වශයෙන් එකතුව රු.මිලියන 38,385 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.මිලියන 16,914.5 ක්ද, මූලධන වියදම් වෙනුවෙන් රු.මිලියන 5,382.2 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 22,296.7 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව රජයේ ප්‍රදාන වශයෙන් රු.මිලියන 15,578 ක්ද, අභ්‍යන්තර ආදායම් මගින් රු.මිලියන 3,535 ක්ද වශයෙන් රු.මිලියන 19,113 ක ආදායමක් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 16,948 ක් හා මූලධන වියදම රු.මිලියන 3,145 ක්ද වශයෙන් රු.මිලියන 20,093 ක් වියදම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන කටයුතු වලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

කෘෂිකර්මය

උතුරු මැද පළාතේ ජීවත්වන මිලියන 1.4 ක් පමණ වූ ජනගහනයෙන් සියයට 79 ක පමණ ප්‍රමාණයක ප්‍රධාන ජීවන මාර්ගය කෘෂිකර්මය වේ. ඒ අනුව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් "ඉසුරුමත් භූමියක් අසිරිමත් ගොවිකැළක්" යන දැක්ම යටතේ පළාත් කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධනය සඳහා 2016 වර්ෂයේ රු.මිලියන 302.2 ක පුනරාවර්තන වියදම් හා රු.මිලියන 335.1 ක ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. පසුගිය වර්ෂයේ එම ප්‍රතිපාදනය පිළිවෙලින් රු.මිලියන 279.6 ක් හා රු.මිලියන 181.5 ක් වී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු.මිලියන 176.2 ක ප්‍රතිපාදන වැඩියෙන් සලසා තිබුණු නමුත්, අදාළ නිෂ්පාදනවල වර්ධනය අඩු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

	2016 වර්ෂය	2015 වර්ෂය	2015 වර්ෂයට සාපේක්ෂව අඩුවීම
වී වගා කරන භූමි ප්‍රමාණය			
මහ (හෙක්ටයාර දහස්)	161.5	174.6	13.1
යල (හෙක්ටයාර දහස්)	112.5	112.5	-
වාර්ෂික වී නිෂ්පාදනය (මෙ.ටොන් දහස්)			
මහ	657.3	703.5	46.2
යල	466.3	466.3	-
අතිරේක බෝග නිෂ්පාදනය (මෙ.ටොන්)	144	185	41
වාර්ෂික එළවළු නිෂ්පාදනය (මෙ.ටොන්)	93	101	07
වාර්ෂික මිරිදිය ධිවර නිෂ්පාදනය (මෙ.ටොන්)	7,705	23,860	16,155
වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර් දහස්)	35.56	32.03	3.53

වගුව - 41 උතුරු මැද පළාතේ කෘෂි නිෂ්පාදනය

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව - 2016 වාර්ෂික වාර්තාව හා උතුරු මැද පළාත් සභාවේ කාරයසාධන වාර්තාව

2016-2018 කාලපරිච්ඡේදයේ ජාතික ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන යටතේ යල කන්නයේ අක්කර 4000 ක බඩඉරිඟු වගා කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ගොවීන් වෙත බඩඉරිඟු බීජ ලබා දීම සඳහා බඩඉරිඟු බීජ මිලදී ගැනීම සිදු කර තිබුණි. ගොවීන්ගේ, කෘෂිකර්ම නිලධාරීන්ගේ ඉල්ලීම් හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශවලට අනුකූල නොවන ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් S.A 501 ප්‍රභේදයට අයත් බඩඉරිඟු බීජ කිලෝග්‍රෑම් 8,755 ක් මිලදී ගෙන ගොවීන් වෙත ලබාදී තිබුණි. නමුත්, එම බීජ පැලනොවීම හේතුවෙන් ජාතික ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන මගින් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණි.

ලොකු ඊෑණු බීජ නිෂ්පාදනයට අදාළ අක්කර 05 යාය 20 වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.5 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. එම වැඩසටහන යටතේ නියමිත කාලය තුළ ගොවීන් වෙත ලොකු ඊෑණු බීජ ලබාදීමට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අසමත් වී තිබුණි. මේ හේතුවෙන් අක්කර 100 ක ලොකු ඊෑණු අස්වැන්න ජාතික නිෂ්පාදනයට අහිමි වී තිබුණි.

අතුරු බෝගයක් ලෙස ගොවීන්ට අමතර ආදායමක් ලබාගැනීමට හැකිවන සේ ඉඟුරු වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 6.61 ක් වැය කර අක්කර 67.5 ක වගා ආදර්ශන 270 ක් ක්‍රියාවට නංවා තිබුණි. ඉන් අක්කර 5.75 ක වගා ආදර්ශන 23 ක් පමණක් ඵලදායි ලෙස සාර්ථක වී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සඵලදායීත්වය සියයට 8.5 ක් වූ අවම මට්ටමක පැවැතුණි.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ශීතාගාර 02 ක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම හා ශීතාගාර උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 6.55 ක ඇස්තමේන්තුවක් මත ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට සැලැසුම් කර තිබුණි .පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එකී කටයුතු පවරාගෙන ක්‍රියාත්මක කිරීම නිසා එම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 8.51 ක් වැය කර තිබුණු නමුත් එම කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි.

උතුරු මැද පළාතේ වැව් 18 ක් පුනරුත්ථාපනය සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේදී රු.මිලියන 26.55ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සංවර්ධන, නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය වෙත ලබාදී තිබුණි .එම ව්‍යාපෘතිය 2016 වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ගෙවා තිබුණු අත්තිකාරම්ද පියවා නොතිබුණි.

අධ්‍යාපනය

2016 වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනය මගින් සියයට 48.9 ක ප්‍රතිපාදන අධ්‍යාපන ක්ෂේත්‍රයට සලසා තිබුණි. ගුරු උපදේශකයින් 345 දෙනෙකු, විෂය අධ්‍යක්ෂවරුන් 46 දෙනෙකු සමග අලුතින් උපාධිධාරී ගුරුවරුන් 1065 දෙනෙකු සහ විද්‍යාපීඨ හා ඩිප්ලෝමා උපාධිධාරීන් 37 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ අධ්‍යාපන ක්ෂේත්‍රය නහා සිටුවීමට කටයුතු කර තිබුණි. නමුත් 2016 වර්ෂයේ අධ්‍යාපන කටයුතුවලට අදාළ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් උසස් පෙළට සුදුසුකම් ලත් සිසුන්ගේ ප්‍රතිශතය 2015 වර්ෂයේදී සියයට 66.61 ක සිට 2016 වර්ෂයේදී සියයට 66.34 ක් දක්වා අඩුවී තිබුණි. සමස්ථ ශ්‍රී ලංකාවේ උසස් පෙළ විභාගය සමත්වීමේ ප්‍රතිශතය වූ සියයට 69.94 සමඟ සැසඳීමේදී එය පහළ මට්ටමක පැවතුණි.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත විශ්ව

විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම්ලත් සංඛ්‍යාව 2015 වර්ෂයේ සියයට 59.56 ක සිට 2016 වර්ෂයේදී සියයට 59.27 ක් දක්වා අඩු වී තිබුණි. ශ්‍රී ලංකාවේ උසස් පෙළ විභාගය සමත්වීමේ ඊට අදාළ සාමාන්‍ය ප්‍රතිශතය වූ සියයට 63 සමඟ සැසඳීමේදී ද එය පහළ මට්ටමක පැවතුණි.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හා (සාමාන්‍ය පෙළ) විභාගවලට ඉදිරිපත් වූ ශිෂ්‍යයන්ගෙන් සියළුම විෂයයන් අසමත්වීමේ ප්‍රතිශතයේ සාමාන්‍යය 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් සියයට 8.56 ක් හා 4.01 ක් ව පැවැතුන නමුත් උතුරු මැද පළාතේ ඊට අදාළ අගයන් පිළිවෙලින් සියයට 9.64 ක් හා සියයට 10.51 ක් වී තිබුණි.

- උතුරු මැද පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 6 කට අයත් පාසල්වල රජයේ නිවාස 1,235 ක් තිබුණු නමුත්, එයින් නිවාස 691 ක් හෙවත් සියයට 56 ක් අභාවිතව පැවතුණි.

- 2016 වර්ෂය වන විට උතුරු මැද පළාත අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටමින් 7 වන ස්ථානය හිමිකරගෙන තිබුණු අතර අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 9 වන ස්ථානය හිමිකර ගෙන තිබුණි.

සෞඛ්‍ය

පසුගිය යුධ සමයේදී ක්‍රියාකාරී තත්ත්වයේ පැවති පදවිය රෝහලේ ශල්‍යාගාරය ශල්‍ය වෛද්‍යවරුන් නොමැතිකමින් වර්ෂය 5 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. සමාලෝචිත වර්ෂයේදී ශල්‍යාගාරයේ යන්ත්‍ර හා ශල්‍ය වෛද්‍ය උපකරණ රු.මිලියන1.47 ක් වැය කර අළුත්වැඩියාවක් සිදු කර තිබුණි. නමුත් මෙම රෝහල වෙත ශල්‍ය වෛද්‍යවරුන් අනුයුක්ත නොකිරීම හේතුවෙන් ප්‍රතිකාර ලබාගැනීමට පැමිණෙන රෝගීන්ට අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත පැමිණීමට සිදු වී තිබුණි.

මැදවච්චිය වකුගඩු ආයුර්වේද රෝහල ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ රු.මිලියන 5.84 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ නිමවී නොතිබුණත්, ඒ වන විට රු.මිලියන 85.37 ක් වැය කර තිබුණි. තවද, රෝහලේ වෛද්‍ය නිල නිවාස, හෙද නිල නිවාස යන නිවාසවල බිම ටයිල් කිරීම, දොරවල් සහ ජනෙල් සවිකිරීම, විදුලිය ලබාදීම වැනි කටයුතු සිදු කළ යුතුව පැවැතුණි. රෝහල වටා තාප්පය ඉදිකිරීමේ කටයුතුද නිමකර නොතිබුණි.

මිහින්තලේ මෛත්‍රිපාල සේනානායක ආයුර්වේද පර්යේෂණ රෝහල හා කෞතුකාගාරය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රු.මිලියන 31.3 ක් වැය කර තිබුණු නමුත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට නොගැනීම නිසා ගොඩනැගිල්ල අවට වල් බිහිවී පරවියන් ලගිමින් පැවැතුණි.

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 20 ක හා වෛද්‍ය සැපයුම් ඒකකයේ වටිනාකම රු.මිලියන 5.08 ක් ඖෂධ ඒකක 361 ක් සහ තවත් රෝහල් 4 ක වටිනාකම ගණනය කළ නොහැකි ඖෂධ ඒකක 98 ක් කල් ඉකුත් වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ රෝහල් හා සෞඛ්‍ය ආයතන වෙතින් වෛද්‍ය සැපයුම් අංශයට රු.මිලියන 5.43 ක් වටිනා තත්ත්වයෙන් අසමත් ඖෂධ ඒකක 48 ක් ලැබී තිබුණු අතර, රු95.265ක් වටිනා ඖෂධ වර්ග 10 ක් රෝහල් 4 ක ගබඩාවල පැවැතුණි.

වෛද්‍ය සැපයුම් අංශයෙන් සමාලෝචිත වර්ෂය තුළ තත්ත්වයෙන් අසමත් රු.මිලියන

1. 92ක් වටිනා ඖෂධ වර්ග 4 කට අයත් ඒකක 766,000 ක් උතුරු මැද පළාත් සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණි. ඉන් රු.මිලියන 1.38 ක් වටිනා ඖෂධ ඒකක 433,356 ක් රෝහල වෙත නිකුත් කර තිබුණි.

පළාත් මාර්ග සංවර්ධනය

උතුරු මැද පළාතේ මාර්ග 16 ක ඉදිකිරීම් හා සංවර්ධනය සඳහා 2016 වර්ෂයේ අයවැය ලේඛනය මගින් රු.මිලියන 341.83 ක ප්‍රතිපාදන සලසා දී තිබුණි .එම ප්‍රතිපාදන මත මාර්ග 7ක කිලෝමීටර් 16.9 ක් කාපට් ඇතිරීමට හා මාර්ග 5 ක කඩතොලු සකස් කර තාර දැමීමට සැලැසුම් කර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 336.42 කට ගිවිසුම්වලට එළඹ තිබුණි. 2016 දෙසැම්බර් 31දින වන විට මෙම මාර්ග 12 හි භෞතික ප්‍රගතිය සියයට10 ක සිට සියයට 85ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණු අතර, ඒ සඳහා රු.මිලියන 76.1 ක් වැය කර තිබුණි. එය ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 22.6ක් වී තිබුණි. ඊට අතිරේකව ගංවතුරින් හානි වූ මාර්ග 04ක් ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 18.1 ක් වටිනා ඇස්තමේන්තු සකස් කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති ප්‍රදානය කිරීමට අපොහොසත් වී තිබුණි.

පුබුදමු පොළාන්නරුව

2015 අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් ආරම්භ කර තිබූ පුබුදමු පොළොන්නරුව ජාතික වැඩසටහන සඳහා 2016-2020 කාල පරිච්ඡේදය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කර තිබුණි .ඒ අනුව ප්‍රධාන කාර්යයන් 5කට අදාළ ක්ෂේත්‍ර 20 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 60,000 ක් පිරිවැය වූ දළ වියදම් ඇස්තමේන්තුවක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. මේ සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කර වාර්ෂිකව නිම කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති දක්වමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුව තිබුණත්, එසේ කර නොතිබුණි. 2016 වර්ෂයේදී ලැබී තිබුණු රු.මිලියන 8,316 ක ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති 854 ක් අනුමත කර තිබුණි. නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් ව්‍යාපෘති 265 ක් නිමකර නොතිබුණු අතර, ව්‍යාපෘති 7 ක වැඩ ආරම්භ කර නොතිබුණි. වැඩ ආරම්භ කර තිබූ ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4,642ක වියදමක් කර තිබුණි. එය 2016 වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 57 ක් වී තිබුණි.

2016-2020 කාල පරිච්ඡේදය තුළ පුබුදමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහන 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම ආරම්භකිරීමට නියමිතව තිබුණි. නමුත් එම ව්‍යාපාතිය යටතේ 2016 වර්ෂය වන විටත් ප්‍රමාද කළ නොහැකි බවට හඳුනාගත් ව්‍යාපෘති 152 ක් 2015 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලැසුම් කර රු.මිලියන 756.42 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එයින් රු.මිලියන 360.73 ක් වටිනා ව්‍යාපෘති 11 ක් 2017 ජුනි 30 දින වන විටත් නිමකර නොතිබුණි.

දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා රු.මිලියන 28,692 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 7,449 ක්ද , වශයෙන් එකතුව රු. මිලියන 36,141 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමින් රු.මිලියන 29,543 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 8,753 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන්ද, උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 23,640 ක්ද, අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 7,229 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 30,869 ක ආදායම් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 28,239 ක් හා මූලධන වියදම රු.මිලියන 5,054 ක් වශයෙන් එකතුව රු.මිලියන 33,293 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව ආදායම ඉක්ම වූ වියදම් පැවතීමෙන් පළාත් සභා අරමුදලින් රු. මිලියන 1,473 ක් වියදම් කර තිබුණි.

දකුණු පළාත් සභාවට අදාළව 2016 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

සමාලෝචිත වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 66 ක්ද, උපමාන පාදක සංවර්ධන ප්‍රධාන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු ව්‍යාපෘති 65 ක් සහ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන - මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 97 ක වැඩ 2016 වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

හිඟ හිටි ආදායම් එකතු කිරීම

2016 වර්ෂය අවසාන වන විට ආදායම් සංකේත 7 ක් යටතේ එකතුව රු.මිලියන 952.91 ක ආදායම් හිඟහිටව පැවැතුණි. මේ අනුව හිඟහිටි ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක තත්ත්වයක නොතිබුණි.

දීර්ඝකාලීන බදු අයකර ගැනීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8 ක් විසින් දීර්ඝකාලීන බදු පදනම මත ඉඩම් බදුදීම වෙනුවෙන් බදුකර 73 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ බදු හා දඩ මුදල්වල එකතුව රු.මිලියන 33.45 ක් වී තිබුණි.

අරමුණුවලට පටහැනිව උපමාන පාදක අරමුදල් උපයෝජනය කිරීම

දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අරමුණු ප්‍රකාරව කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා උපමාන පාදක අරමුදලින් ක්‍රියාත්මක කර තිබූ " සරු බිම් " වැඩ සටහන යටතේ නිල නිවසක ආරක්ෂිත යකඩ වැට ඉදිකිරීමට හා උද්‍යාන අලංකරණය සඳහා රු.මිලියන 2.05 ක් වැයකර තිබුණි.

ලියාපදිංචිය අවලංගු කොන්ත්‍රාක්කරුවන් වෙත එකතු කළ අගය මත බදු ගෙවීම

පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, පළාත් මාර්ග හා සංනිවේදනය අමාත්‍යාංශය විසින් ලියාපදිංචිය අවලංගු කර තිබුණු කොන්ත්‍රාත්කරුවන් 17 දෙනෙකුට ඒ ගැන නොසලකා 2016 වර්ෂයේදී එකතුව රු.මිලියන 14.98 ක එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම් කර තිබුණි.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු ඉංජිනේරුවරුන්ට දීමනා ගෙවීම

2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවට අයත් නොවන අධිකාරියේ සේවයේ නියුතු ඉංජිනේරුවරුන් සඳහා මසකට රු.15,000 ක් බැගින් 2015 වර්ෂයේදී එකතුව රු.මිලියන 2.72 ක් සහ 2016 වර්ෂයේදී එකතුව රු.මිලියන 2.43 ක් වශයෙන් ඉංජිනේරු දීමනාව ගෙවා තිබුණි. කෙසේ වුවද, විගණනය විසින් කරන ලද විමසීමකට අනුව මෙම දීමනාව ලබා ගැනීම සඳහා එම අධිකාරියේ නිලධාරීන්ට හිමිකම් නොලබන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි.

නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පාසල් අධ්‍යාපනය දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (TSEP) යටතේ පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, පළාත් මාර්ග හා සංනිවේදනය අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කළාප කාර්යාල සහ තෝරාගත් පාසල් සඳහා සැපයීමට රු.මිලියන 24.31 ක් වැය කර මිලදී ගෙන තිබුණු පරිගණක යන්ත්‍රවලින් පාසල් වෙත බෙදා හැරීම සඳහා කළාප කාර්යාල 08 ක් වෙත ලබාදී තිබුණු පරිගණක 147 ක් වර්ෂයකට අධික කාලයක් මුළුල්ලේ එම කාර්යාලවල ගබඩා කර තිබුණි.

යථෝක්ත ව්‍යාපෘතිය යටතේ පාසල්වලට තූර්ය වාදක භාණ්ඩ සැපයීම සඳහා රු.මිලියන 3.33 ක් වැය කර මිලදී ගෙන තිබුණු පෙරදිග හා අපරදිග සංගීත භාණ්ඩවලින් රු.මිලියන 1.51 ක්වූ සංගීත භාණ්ඩ 224 ක් පාසල් වෙත බෙදා නොහැර අමාත්‍යාංශයේ ගබඩාවේ අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. එම භාණ්ඩවලින් පහතරට ගැටබෙර 25 ක්, තම්මැට්ටම් 22 ක් සහ බටනලා 04 ක් භාවිතයට ගැනීමට නොහැකි වන ලෙස සතුන් විසින් හානි කර තිබුණු අතර, අනෙකුත් භාණ්ඩද විනාශ වීමේ අවදානමක් පැවතුණි.

දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල

දකුණු පළාත් දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 29 ක ණයලාභීන් 242 දෙනෙකුට ලබාදී තිබුණු රු.මිලියන 1.82 ක ණය මුදල්වලින් කිසිදු මුදලක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අය කර නොතිබුණි.

ගුරුවරුන්ගේ ස්ථාන මාරු වීම්

2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය පරිදි ගුරුභවතුන්ගේ සේවා කාලය එක් පාසලක වර්ෂ 06 කට සීමා කළ යුතු වුවද, ඊට පටහැනිව දකුණු පළාතේ දිස්ත්‍රික්ක 03 ට අයත් පාසල් 1024 ක ගුරුවරුන් 11,960 ක් වර්ෂ 06 ක සිට 20 ක් දක්වා කාලයක් මුළුල්ලේ එකම පාසලේ සේවය කර තිබුණි. එමෙන්ම වර්ෂ 20 ට වැඩි කාලයක් ස්ථාන මාරු වීම් නොලබා එකම පාසලේ සේවය කරන ගුරුභවතුන් සංඛ්‍යාව 1518 ක් වී තිබුණි.

අනාර්ථික ගනුදෙනු

දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඇඹුල් තියල් නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂය ඇතුළුව ඉකුත් වර්ෂ දෙක තුළ රු.මිලියන 11.11 ක් වියදම් කර තිබුණි. එහි මෙහෙයුම් කටයුතු පවත්වා

ගෙනයාම සඳහා දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

නැගෙනහිර පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා රු.මිලියන 20,351 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 2,770 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 23,121 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 20,351 ක් හා මූලධන වියදම් සඳහා රු.මිලියන 4,882 ක් ද වශයෙන් එකතුව රු.25,233 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව, 2016 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 17,016 ක් ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 3,317 ක් ද වශයෙන් රු.මිලියන 20,333 ක ආදායම් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 20,276 ක් හා මූලධන වියදම රු.මිලියන 1,308 ක් වශයෙන් එකතුව රු.මිලියන 21,584 ක් උපයෝජනය කර තිබුණි.

නැගෙනහිර පළාත් සභාවට අදාලව 2016 වර්ෂයේදී සිදු කරනු ලැබූ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

වැඩ අතහැර දමා ඇති කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම

මළ පිරිපහදු කිරීමේ යන්ත්‍රයක් (Night Soil Treatment Plant) ඉදිකිරීම සඳහා 2012 ජනවාරි 28 දින ත්‍රිකුණාමලය නගර සභාව විසින් කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර එම කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 4.49 ක මුදලක් ලබාගැනීමෙන් පසු අදාල කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. කෙසේ වුවද, පළාත් ඉංජිනේරුවරයා විසින් ඔහුගේ 2014 නොවැම්බර් 20 දිනැති ලිපියෙන් සියලුම ඉදිකිරීම් කටයුතු සතුටුදායක ලෙස නිම කර ඇති බව සඳහන් කර තිබුණි. ඒ අනුව, නගර සභාව විසින් මේ වන විටත් සියයට 50 ක පමණක් වැඩ සම්පූර්ණ කර තිබුණු කොන්ත්‍රාත්කරුට රඳවා ගැනීමේ මුදල් නිදහස් කර තිබුණි.

නිෂ්ක්‍රීයව පවතින බවුසරය සහිත ට්‍රැක්ටරය

රාජ්‍ය නොවන සංවිධානයකින් (NGO) භාර දෙන අවස්ථාවේ කි.මී. 06 ක් පමණක් ධාවනය කර තිබූ බවුසරයක් සහිත ට්‍රැක්ටරයක් සායින්දමරුදු රෝහල වෙත ලබාදී තිබුණි. අදාළ රාජ්‍ය නොවන සංවිධානයෙන් භාර ගත් දින සිට වර්ෂ 10 කට අධික කාලයක් ගතවී තිබුණත් කිසිදු කිලෝමීටරයක් ධාවනය කිරීමකින් තොරව මෙම ට්‍රැක්ටරය නිෂ්ක්‍රීයව පැවතුණි.

නිෂ්ක්‍රීයව පවතින පරිගණක යන්ත්‍ර

තිරුක්කෝවිල් කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසලක පවතින මහින්දෝදය විද්‍යායතනයට සහ කන්තලේ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ද්විතීයික පාසලක පරිගණක සම්පත් මධ්‍යස්ථානයකට පිළිවෙලින් පරිගණක 64 ක් සහ 24 ක් ලබා දී තිබූ නමුත් මෙම පරිගණක වර්ෂ 03 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැති අතර එහි වගකීම් සහිත කාලයද ඉකුත් වී තිබුණි.

නිෂ්ක්‍රීයව පවතින වෛද්‍ය උපකරණ

මූතූර් සහ කින්නියා මූලික රෝහල්වල කාන්දු පෙරීමේ ඒකක (Dialysis Unit) නොමැති අතර මේ දක්වා වකුගඩු රෝගීන්ද මෙම රෝහල් දෙකෙහි වාර්තා වී නොතිබුණි. කෙසේ වුවද, මෙම රෝහල් දෙක සඳහා 2016 දෙසැම්බර් 19 දින

රු.මිලියන 19.17 ක පිරිවැයකට කාන්දු පෙරීමේ ප්‍රතිකාර සඳහා වන උපකරණ, පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනය කර තිබුණු අතර එම උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්ක්‍රීයව පැවැතුණි. කින්නියා මූලික රෝහලට අක්ෂි ශල්‍ය උපකරණ නිකුත් කර තිබුණු නමුත් අක්ෂි ශල්‍ය වෛද්‍යවරයෙකු නොමැති වීම හේතුවෙන් වර්ෂයකට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවැතුණි.

අක්‍රීයව පවතින කොම්පෝස්ට් අංගනය

නිලාවේලි ප්‍රදේශයේ රු.මිලියන 12.8 ක පිරිවැයකට කොම්පෝස්ට් පොහොර අංගනයක් ඉදිකර සියලුම උපකරණ සමඟ 2016 මාර්තු 26 දින නිලාවේලි ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අංගනය නිෂ්ක්‍රීයව පැවැතුණි.

මහජන මුදල් අයුතු පරිහරණය

නැගෙනහිර පළාතේ පවතින පළාත් සහ මධ්‍යම රජයේ ආයතනවලට උපදේශාත්මක සේවා සැපයීම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. එලෙස මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 සහ 2017 වර්ෂවලදී සිදුකරන ලද කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ උපදේශාත්මක සේවා සැපයීම වෙනුවෙන් ලද රු.මිලියන 6.30 ක් පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, ඉංජිනේරු සේවා ඇතුළු නිලධාරීන් 21දෙනෙකු අතරේ බෙදා හැර තිබුණි. පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතුව මෙවැනි උපදේශක සේවා සැපයීම සඳහා වූ විශේෂඥයින්ගේ හිඟයක් පැවතීම හේතුකොට ගෙන ඉන්පසුව දෙපාර්තමේන්තුව සමඟ වූ ගිවිසුම මඩකලපුව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අවසන් කරනු ලැබූ අතර කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු වර්ෂ 2 කට අධික කාලයක් දක්වා පමාවී තිබුණි.

මහන මැෂින් නිෂ්ක්‍රීයව පැවතීම

2015 දෙසැම්බර් 31 දින එකතුව රු.මිලියන 1.95 ක් වටිනා මහන මැෂින් 57 ක් මිලදී ගෙන තිබුණි. 2017 ජුනි 30 දින වන විටත් මැහුම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම නිසා මිලදී ගෙන තිබුණු මෙම මහන මැෂින් නිෂ්ක්‍රීයව පැවතුණි.

මාර්ග ඉදිකිරීම සඳහා භාවිතා කරන යන්ත්‍ර නිෂ්ක්‍රීයව පැවතීම

පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මාර්ග ඉදිකිරීමේ කටයුතු සඳහා යොදාගන්නා එකතුව රු.මිලියන 140.28 ක් වටිනා යන්ත්‍ර වර්ග 48 ක් වර්ෂ 6 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි. එම යන්ත්‍ර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

හිඟහිටි ඉඩම් බදු අයකිරීම

එකතුව රු.මිලියන 169.98 ක රජයේ ඉඩම් බදු ආදායම 1991 වර්ෂයේ සිට හිඟහිටව පැවතුණු අතර එම හිඟහිටි බදු ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් ලබාගත් ණය

හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් ලබාගෙන තිබුණු ණය වෙනුවෙන් ගෙවිය යුතු වූ ණය වාරික එකතුව රු.මිලියන 0.9 ක් වර්ෂ 07 ක සිට අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි.

නිෂ්ක්‍රීයව පවතින LED දර්ශක ප්‍රචාරක පුවරු

සේරුවිල ප්‍රාදේශීය සභාව විසින් 2014 මාර්තු 10 දින රු.මිලියන 0.94 ක පිරිවැයකට මිලදී

ගෙන තිබූ LED දර්ශක ප්‍රචාරක පුවරුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතා කර නොතිබුණි.

වංචනික ක්‍රියාකාරකම්

ආදායම් එකතුකිරීමේ නිලධාරීන් වෙත නිකුත් කරනු ලැබූ කුවිතාන්සි පොත් 09ක් මඟින් 2013 සහ 2014 වර්ෂවලදී එකතු කරනු ලැබූ කුලී හා වරිපනම් තම්බලගමුව ප්‍රාදේශීය සභාවට නිරවුල් කර නොතිබුණි. ඉන් පසුව, 2015 පෙබරවාරි 17 දින හිටපු ලේකම් සහ තවත් නිලධාරීන් 05 දෙනෙකු විසින් කුවිතාන්සි පොත් 09 න් පොත් 02 කින් එකතු කරගන්නා ලද රු.160,900 ක මුදලක් ආපසු ගෙවීමට එකඟ වී තිබුණි. කෙසේ වුවද, මෙම වංචනික ක්‍රියාකාරකමට සම්බන්ධ වූ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ආපසු භාරදී නොතිබුණු ලැප්ටොප් පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර

හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් ලැප්ටොප් පරිගණක 37 ක් සහ ෆැක්ස් යන්ත්‍ර 37 ක් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, මේවායින් ලැප්ටොප් පරිගණක 25 ක් සහ ෆැක්ස් යන්ත්‍ර 25 ක් 2017 ජුනි 30 දින වන විටත් ආපසු භාර දී නොතිබුණි.

නිවාස සංවර්ධන සැලසුම් ප්‍රකාරව නිවාස ඉදිකිරීම

පළාත් නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන සැලැස්ම අනුව, 2016 වර්ෂයේදී රු.මිලියන 2,687 ක පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ නිවාස 5000 ක් ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂය තුළදී කිසිඳු නිවාසයක් ඉදිකර නොතිබුණි.

කොරියානු භාෂා පන්ති සඳහා ගෙවූ අත්තිකාරම් නොපියවීම

රැකියා විරහිත තරුණයින්ට 2008 වර්ෂයේදී කොරියානු භාෂා පන්ති පැවැත්වීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ හිටපු ලේකම්වරයාට රු.මිලියන 2 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. කෙසේ වුවද, අපේක්ෂා කළ පරිදි ඉහත සඳහන් පන්ති පවත්වා නොතිබුණු අතර 2017 ජුනි 30 දින වන විටත් අත්තිකාරම් මුදල්ද නිරවුල් කර නොතිබුණි.

උතුරු පළාත් සභාව

උතුරු පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා රු.මිලියන 22,912 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 2,430 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 25,342 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 19,366 ක් ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 6,185 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 25,551 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 19,312 ක් සහ මූලධන වියදම රු.මිලියන 4,241 ක් වශයෙන් එකතුව රු.මිලියන 23,553 ක වියදම් සිදු කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමින් 2016 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 20,415 ක් ද අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 3,115 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 23,530 ක ආදායමක් රැස්කර ගෙන තිබුණි.

උතුරු පළාත් සභාවට අදාලව 2016 වර්ෂයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

ඉදිකිරීමේ කර්මාන්ත ආරම්භ නොකර චෙක්පත් ලියා තිබීම

වවුනියා දිස්ත්‍රික්කයේ කබඩ් පිටියක් (Court) ඉදිකිරීම සඳහා රු.මිලියන 5 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, ඉදිකිරීම් කටයුතු ඇරඹීමට ප්‍රථම, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී ඇතිවිය හැකි වියදම් සඳහා එකතුව රු.මිලියන 3.80 ක චෙක්පත් දෙකක් ලියා තබා තිබුණි. පසුව රු.මිලියන 1.98 ක් වටිනා චෙක්පතක් 2016 සැප්තැම්බර් 14 දින ආදායම් ගිණුමට බැර කර තිබූ අතර වටිනාකම රු.මිලියන 1.82 කට ලියන ලද අනෙක් චෙක්පත තැන්පත් ගිණුමේ අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකර තබා තිබුණි. මෙම කබඩ් පිටිය විගණිත දිනය වන 2017 අගෝස්තු 31 දින වන විටත් ඉදිකර නොතිබුණි.

පශු සම්පත් ගොවිපොළවල් මෙහෙයවීම

උතුරු පළාතේ පශු සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ අනින්චෙයින්කුලම් (Aninchainkulam) අභිජනන ගොවිපොළ ස්ථාපිත කර තිබුණි. 2013 වර්ෂයේදී ඉඩම් අක්කර 50 ක වපසරියකින් යුතු මෙම ගොවිපළේ අරමුණ අභිජනනය සඳහා වන වැස්සියන්, පට්ටි ගැසිය හැකි හරක් පැටවුන් සහ එළුවන් අනෙකුත් ගොවිපොළවල් වෙත බෙදාහැරීමයි. මේ අතරතුර කිරි ලීටර් 36,000 ක් සහ මස් මෙට්‍රික් ටොන් 25 ක් නිපදවීම මඟින් ඉලක්කගත ජාතික කිරි හා මාංශ පරිභෝජන අවශ්‍යතාවයට දායක වීම අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, මෙම ගොවිපොළ ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවූ අතර එළදෙනුන් 17 ක් සහ හරක් පැටවුන් 8 දෙනෙකු පමණක් එහි විය. තවද, කැළයකට ආසන්නව මෙම ගොවිපොළ පැවතීම නිසා එළදෙනුන් 8 දෙනෙකු වන සතුන් විසින් මරා දමා තිබුණි.

කිරි ලබාගැනීම සඳහා 2013 වර්ෂයේදී රු.මිලියන 3.7 කට මිලදී ගනු ලැබූ උපකරණ ගොවිපොළ විසින් ඒවා භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී රු.245,460 ක ආදායමක් ගොවිපොළ විසින් රැස්කර තිබුණු නමුත් ගොවිපොළේ කටයුතු වෙනුවෙන් රු.4,632,674 ක වියදමක් සිදුකර තිබුණි. රුපියල් මිලියන 1.2 ක වටිනාකමකට එළු මඩුවක්ද ඉදිකර තිබුණු නමුත් එහි එළුවන් දක්නට නොතිබුණි. එම ඉඩම පිහිටි ප්‍රදේශය

විගණන වාරක පරීක්ෂාවකට ලක් කළ අවස්ථාවේදී ගොවිපොළ ඉදිකිරීම සඳහා ඉවත් කරනු ලැබූ වටිනා ගස් පිළිබඳ විස්තර, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

විශේෂ අවශ්‍යතා සහිත පවුල්වලට ගෙවීම් සිදුකිරීම

උතුරු පළාතේ නැවත පදිංචි කළ පුද්ගලයන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය සංවර්ධන සමිති (Rural Development Societies - RDS) සහ කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිති (Women Rural Development Societies - WRDS) මාර්ගයෙන් පශු සම්පත් ගොවිපොළක් ස්ථාපිත කිරීම, නිපුණතා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ස්වයං රැකියා සඳහා සහාය ලබාදීම වැනි කටයුතු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ 2015 මැයි 26 දින නිකුත් කරනු ලැබූ ලිපිය මඟින් රු.මිලියන 56 ක් ලබාදීමට එකඟ වී තිබුණි. තවද, මුදල් කොමිෂන් සභාවේ අනුමැතියක් ලබා ගැනීමකින් තොරව පළාත් ආංශික සංවර්ධන ප්‍රදාන යෝජනා ව්‍යාපෘතිය (Provincial Specified Development Grant – PSDG) සහ උපමාන පාදක ප්‍රදාන (Criteria Based Grant – CBG) විසින් පිළිවෙලින් රු.මිලියන 20 ක් සහ රු.මිලියන 5 ක් ස්වයං රැකියාවන් සඳහා සහාය වීමට නැවත පදිංචි කළ අයට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඉහත සඳහන් මුදලින්, නැවත පදිංචි කළ පවුල් 1,377 ක් වෙනුවෙන් රු.මිලියන 68.8 ක් පමණක් වැය කර තිබුණි.
- RDS සහ WRDS මාර්ගයෙන් මුදල් කොමිෂන් සභාවේ උපදෙස් මත මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණත් එම උපදෙස් ආකාරයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. කෙසේ වෙතත්, ප්‍රතිලාභීන් අදාළ ග්‍රාම නිලධාරීගේ නිර්දේශ සහිත ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතියක් ද රහිතව දේශපාලන වාතාවරණය මත ගෞරව අමාත්‍යවරයාගේ සෘජු තේරීම මත සිදු වී ඇති බව පළාත් ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

නිෂ්කාර්යව පවතින වෛද්‍ය උපකරණ

පේදුරු තුඩුව, චාවකච්චේරි සහ තෙල්ලිප්පලෙහි යන මූලික රෝහල්වල කාන්දු පෙරීමේ ඒකක (Dialysis Units) නොතිබුණි. එසේ වුවද, යාපනය, මුලතිව්, මන්නාරම සහ වවුනියා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (Directorate) විසින් 2016 දෙසැම්බර් 19 දින කාන්දු පෙරීමේ යන්ත්‍ර සහ වෙනත් විවිධ වර්ගයේ උපාංග රු.මිලියන 107.48 ක පිරිවැයකට මිලදී ගෙන ඉහත මූලික රෝහල් තුන ඇතුළු රෝහල් 09 කට 2017 ජනවාරි 27 දින සපයා තිබුණි. 2017 වර්ෂයේ මුල් අර්ධ වර්ෂය තුළ වකුගඩු රෝගීන් 200 දෙනෙකු සෑම රෝහලකින්ම වාර්තා වී තිබුණි. කෙසේ වුවද, පුහුණු මානව සම්පත් සහ මෙම උපකරණ ස්ථාපිත කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් ගොඩනැගිලි ද ඉහත සඳහන් රෝහල්වල ඇතුළුව නොමැති වීම හේතුවෙන් මෙම උපකරණ භාවිතයට ගත නොහැකි වී තිබුණි.

විදුලිබලය උත්පාදක යන්ත්‍ර ස්ථාපිත කිරීම

උතුරු පළාත් ප්‍රධාන ලේකම් සහ පුද්ගලික සමාගම් දෙකක් අතර සුළං ට'බයිම (Wind Turbine) මඟින් බලය උත්පාදනය කිරීමේ යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා 2014 නොවැම්බර් 07 දින ගිවිසුමකට එළඹ තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව ඉහත ගිවිසුම ප්‍රකාරව පළමු වර්ෂ 10 සඳහා බදු කුලී රු.මිලියන 20 ක් සහ ඊළඟ වර්ෂ 10 සඳහා බදු කුලී රු.මිලියන 23

බැඟින් ද තීරණය කර තිබුණි. මේ සඳහා වන ඉඩම භාවිතා කිරීම සඳහා වන අනුමැතිය ද අදාළ බලධාරීන්ගෙන් ලබාගෙන නොතිබුණි. ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු.මිලියන 2,933.81 ක මුදලක් 2014 දෙසැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා ජාතික ජාලයට විදුලිය ලබාගැනීම වෙනුවෙන් ඉහත සමාගම් දෙකට ගෙවා තිබූ බවට තොරතුරු විගණනයට අනාවරණය වී තිබුණි.

මේ අතර, 2014 – 2017 කාල පරිච්ඡේදය සඳහා අදාළ සමාගම් දෙකෙන් ලැබී තිබුණු රු.මිලියන 60 ක බදු කුලී (lease rentals) පළාත් ආදායම් ගිණුමට බැර කර නොතිබුණු අතර මෙම මුදලින් පළාත් දෙපාර්තමේන්තු දෙකකට අනුයුක්ත නිලධාරීන් 20 දෙනෙකුට රු.මිලියන 0.84 ක දිරි දීමනා කිසිදු අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

අවිධිමත් මිලදී ගැනීම්

(අ) පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ පවතින ක්‍රීඩා සමාජ අතර බෙදා හැරීම සඳහා රු.මිලියන 3 ක් වටිනා ක්‍රීඩා උපකරණ ප්‍රසම්පාදනය කර තිබුණි. මෙම ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා සමාජ අතරේ බෙදා හැර තිබූ බවට හෝ ඒවා ලද බවට කිසිදු සාක්ෂියක් නොවීය. තවද, පළාත් මූල්‍ය රීති 107 ට පටහැනිව මෙම ගෙවීම් වවුචර් අනුමත කිරීම හා නිර්දේශ කිරීම ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විසින් සිදුකර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) උතුරු පළාතේ ක්‍රීඩාව සංවර්ධනය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ රු.මිලියන 1.2 ක් අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තැන්පත් ගිණුමේ තබා තිබුණි. ඉන් අනතුරුව, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී වෙනත් කාර්යයන් සඳහා මෙම මුදල් නිදහස් කරගෙන තිබුණි.

උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (North East Local Services Improvement Project - NELSIP) සිදු වී ඇති මූල්‍ය වංචාව

උතුරු පළාත් සභාවේ ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින් වැල්වෙටිතුරෙයි නගර සභාවේ සහ පේදුරු තුඩුව ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය (Authorisation) මත ප්‍රාදේශීය පාරවල් සහ මහජන පොළවල් ඉදිකිරීම් කර්මාන්තවලදී රු.මිලියන 4.35 ක මූල්‍ය වංචාවක් සිදුකර ඇති බව පළාත් සභාව විසින් පත්කරනු ලැබූ විශේෂ කමිටුවක් විසින් සිදු කරනු ලැබූ විමර්ශනයක් අනුව වාර්තා කර තිබුණි. ඉන් පසුව, ප්‍රධාන ලේකම්වරයා විසින් මෙම මූල්‍ය වංචාව විමර්ශනය සඳහා තවත් කමිටුවක් පත්කර තිබුණි. මෙම කමිටුව මඟින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාව අනුව, මෙම නිලධාරියා රු.මිලියන 57 ක මූල්‍ය වංචාවක් සිදුකර ඇති බව අනාවරණය විය. එසේ වුවත්, මෙම නිලධාරියාට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් පළාත් සභාව විසින් ගෙන නොතිබුණි.

නිරවුල් නොකළ අග්‍රිම

මන්නාරම දිස්ත්‍රික්කයේ 2012 වර්ෂයේ දී ගින්නෙන් විනාශයට පත් වෙළඳසැල් සඳහා එම වෙළඳසැල් හිමියන්ට වන්දි ගෙවීමට රු.මිලියන 6 ක අග්‍රිමයක් පළාත් පාලන දෙපාර්තමේන්තුවට නිදහස් කර තිබුණු අතර එම මුදලින් රු.මිලියන 4.97 ක් 2017 සැප්තැම්බර් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම මුදල් ගෙවා වර්ෂ 5 ක් ඉකුත්ව ගොස් තිබුණද, මේ සම්බන්ධයෙන් අදාළ බලධාරීන් මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

NELSIP ව්‍යාපෘතිය යටතේ ඉදි කළ නිෂ්කාර්ය වත්කම්

උතුරු පළාතේ දුෂ්කර එමෙන්ම ජනතාව ඉතා අඩු වශයෙන් පදිංචි මූසලී, නානාට්ටන්,

මන්නාරම, මාන්තායි බටහිර ප්‍රාදේශීය සභා ප්‍රදේශවල රු.මිලියන 459.9 ක් වැය කර ඉදිකරනු ලැබූ ළමා උද්‍යාන, වෙළඳපොළවල්, බස් නැවතුම් පර්යන්ත, සාප්පු සංකීර්ණ, පුහුණු මධ්‍යස්ථාන, සංස්කෘතික ශාලා ආදී සංවර්ධන කටයුතු 32 ක් ඉදිකර තිබුණත්, ඒවා වර්ෂ 03 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. තවද, තලෛයිමන්නාරම දුම්රිය ස්ථානය, ඉරනායි ඉලුප්පායිකුලම්, පෙරියමඩු සහ ආන්ඩාන්කුලම්වල ඉදිකරනු ලැබූ සාප්පු සංකීර්ණ සහ නල්ලූර් ප්‍රාදේශීය සභාවේ ඉදිකරනු ලැබූ ගෘහස්ථ ක්‍රීඩාංගනය, ළමා පුහුණු මධ්‍යස්ථානය සහ සංස්කෘතික ශාලාව සහිත ගොඩනැගිල්ල 2014 වර්ෂයේ සිට අදාළ අරමුණු සඳහා භාවිතා නොකර වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබුණි.

මහජන බැංකුව විසින් ගෙවන ලද ගුරුවරුන්ගේ වැටුප් නිරවුල් නොකිරීම

තුනුක්කායි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුරුවරුන්ගේ 2009 ජනවාරි මස වැටුප් ගෙවීම සඳහා ලංකා බැංකු මාන්කුලම් ශාඛාවේ රු.මිලියන 5.2 ක් වටිනා චෙක්පතක් මාන්කුලම් මහජන බැංකු කළමනාකරු වෙත නිකුත් කර තිබුණි. ඒ අනුව, මාන්කුලම් මහජන බැංකුව විසින් අදාළ පාසල්වල ගිණුම්වලට එම මුදල් බැර කර තිබුණි. පසුව මෙම චෙක්පත නිෂ්කාශනය සඳහා ලංකා බැකුවට යැවූ අවස්ථාවේදී ලංකා බැංකුව විසින් මෙම චෙක්පතට ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. වර්ෂ 08 ක් ඉක්ම ගොස් තිබුණ ද, මේ සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ගයක් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගෙන නොතිබුණි.

වාහන අනතුරුවලින් පාඩු සිදුකිරීම

මන්නාරම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට අනුයුක්ත කළ වාහනය 2015 ඔක්තෝබර් 16 දින අනතුරකට ලක් වූ අතර එහි ඇස්මේන්තුගත අළුත්වැඩියා වියදම රු.මිලියන 1.74 කි. කෙසේ වෙතත්, උතුරු පළාත් සභා මූල්‍ය රීති ප්‍රකාරව අනතුර සිදු වූ පසු පොලීසියට දන්වා මූලික විමර්ෂණයක් අනතුර සිදු වී සාධාරණ කාලසීමාවක් ඇතුළත කරගෙන නොතිබුණි. තවද, මෙයට පෙර අවස්ථා දෙකකදීම මෙම වාහනය අදාළ රියදුරු විසින් ධාවනය කිරීමේදී අනතුරුවලට භාජනය වී තිබුණි. මෙම වාහනය සර්වග්‍රාහී රක්ෂණය කර තිබුණද, රක්ෂණ සමාගමෙන් සිදු වූ අලාභ සඳහා වන්දි ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. තවද, අදාළ නිලධාරියාට විරුද්ධව හෝ වාහනය අලුත්වැඩියා කිරීමට 2017 සැප්තැම්බර් 30 දින වන විටත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම වාහනය වර්ෂ 2 කට අධික කාලයක සිට යාපනයේ පුද්ගලික ගරාජයක ගාල්කර තිබුණි.

හඳුනාගත් පාඩු

1995 – 2015 අතර කාල පරිච්ඡේදය තුළ සිදු වූ එකතුව රු.මිලියන 49.06 ක පාඩු සම්බන්ධයෙන් පළාත් දෙපාර්තමේන්තු 4 ක් විසින් නිසි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා රු.මිලියන 22,794 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 3,220 ක් ද, වශයෙන් එකතුව රු. මිලියන 26,014 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 21,439 ක් ද මූලධන වියදම් වශයෙන් රු. මිලියන 4,575 ක් ද, එකතුව රු. 26,014 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 20,766 ක් ද අභ්‍යන්තර මාර්ග මගින් රු. මිලියන 4,090 ක් ද වශයෙන් එකතුව රු. මිලියන 24,856 ක ආදායම් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු. මිලියන 22,116 ක් හා මූලධන වියදම රු.මිලියන 4,557 ක් වශයෙන් රු. මිලියන 26,673 ක් උපයෝජනය කර තිබුණි.

සබරගමුව පළාත් සභාවට අදාළව 2016 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

විදේශ සංචාර සඳහා වියදම් කිරීම

2015 හා 2016 වර්ෂවලට අදාළ විදේශ ගමන් වියදම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ප්‍රදායක ආයතනය විසින් නවාතැන්, ආහාරපාන හා අනෙකුත් පහසුකම් ලබා දෙන බව දන්වා තිබුණු විදේශ සංචාර 03 කදී එකතුව රු.මිලියන 4.01 ක් සංයුක්ත දීමනා වශයෙන් පළාත් අමාත්‍යවරුන් දෙදෙනෙකු හා නිලධාරීන් 05 දෙනෙකු වෙත ගෙවා තිබුණි. තවද එක් විදේශ සංචාරයකදී පළාත් අමාත්‍යවරයෙකුට හා නිලධාරීන් 04 දෙනෙකුට රු.මිලියන 0.81 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- විදේශ සංචාර 02 කදී පළාත් අමාත්‍යවරු 03 දෙනෙක් හා නිලධාරීන් 19 දෙනෙක් වෙත අනියම් දීමනා වශයෙන් රු.මිලියන 1.00 ක් හා සංග්‍රහ දීමනා ලෙස රු.මිලියන 0.11 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- විදේශ සංචාර 05 කදී යානා පත්‍ර මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත එකතුව රු.මිලියන 2.88 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවකදී එම සමාගමෙන් යානා පත්‍ර මිලදී ගැනීම නිසා විදේශ සංචාර 02 කට අදාළව පමණක් රු.මිලියන 1.01 ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි.

- 2015 ජුනි 05 දිනැති අංක සීඑස්ඒ/1/1/83 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සබරගමුව පළාත් සභාවේ අමාත්‍යවරු 02 දෙනෙක්, මන්ත්‍රීවරු 24 දෙනෙක් හා තෝරාගත් නිලධාරීන් 07 දෙනෙක් ඇතුළුව 33 දෙනෙකු ඉතාලියේ සංචාරය කිරීම වෙනුවෙන් පළාත් සභා අරමුදලෙන් රු.මිලියන 20.65 ක් වියදම් කර තිබුණි.

- පළාත තුළ විවිධ ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා අවස්ථාවන් ලබාගැනීමේ අරමුණින් පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හා එම පෞද්ගලික ලේකම්වරිය 2015 හා 2016 වර්ෂ දෙක තුළ විදේශ සංචාර දෙකක් හා පළාත් සමාජ සුභසාධන හා කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා 2015 වර්ෂයේදී

සිදුකර තිබූ එක් විදේශ සංචාරයක් සඳහා පළාත් සභා අරමුදලින් එකතුව රු.මිලියන 4.34 ක් වැයකර තිබුණි. එමගින් සබරගමුව පළාතට අත්වූ ප්‍රතිලාභ කිසිවක් 2017 ජුනි 30 දින වන විටත් හඳුනා ගෙන නොතිබුණි.

- වෛද්‍ය ක්ෂේත්‍ර පරිපාලනයේ නියැලෙන වෛද්‍ය නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහනක් සඳහා එක්සත් රාජධානියේ පෞද්ගලික රෝහලකින් කරන ලද ආරාධනයකට අනුව 2016 මාර්තු 27 දින සිට 2016 අප්‍රේල් 03 දින දක්වා, වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ කිසිඳු නිලධාරියෙකුගේ සහභාගිත්වයෙන් තොරව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහ එතුමාගේ පෞද්ගලික ලේකම් කරන ලද විදේශ සංචාරයක් සඳහා රු.මිලියන 1.67 ක් පළාත් සභා අරමුදලින් වැය කර තිබුණි. එම සංචාරයෙන් පසුව හෝ වෛද්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් වෙනුවෙන් පුහුණු අවස්ථා හිමිවී නොතිබීම හේතුවෙන් සිදු කර තිබුණු වියදම් නිෂ්ඵල වී තිබුණි.

ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී සිදු වී තිබුණු අක්‍රමිකතා

- සබරගමුව පළාත් සභා මන්ත්‍රී නිල නිවාසය අලුත්වැඩියාව හා නවීකරණ කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.මිලියන 4.92 ක් වැයකර තිබුණි. ඇස්තමේන්තු සකස් කිරීම, අනුමත කිරීම හා ගෙවීම් කිරීමේදී සිදුවී තිබුණු දුර්වලතා හා අක්‍රමිකතා හේතුවෙන් පළාත් සභා අරමුදලට රු.මිලියන 1.98 ක අලාභයක් සිදුවී තිබුණි.

- කිලෝමීටර් 15 ක දිගින් යුතු උඩවලව ජාතික වනෝද්‍යානයේ හඳගිරිය දෙවන පිවිසුම් මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා නිර්දේශ කරන ලද බිල්පත් අනුව ඉටු කරන ලද වැඩ සඳහා යන්ත්‍ර සූත්‍ර පැය ගණන සහ සත්‍ය වශයෙන් නිම කරන ලද වැඩ සඳහා යෙදවිය යුතු වූ යන්ත්‍ර පැය ගණන සලකා බැලීමේදී යන්ත්‍ර පැය 349.08 ක් සඳහා රු.මිලියන 1.33 ක් ඉටු නොකරන ලද වැඩ සඳහා ගෙවා තිබුණි.

බන්ධනාගාරගතව සිටි පළාත් සභාවේ මන්ත්‍රීවරුන් වෙත දීමනා ගෙවීම

පළාත් සභාව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන් දෙදෙනෙකු 2014 පෙබරවාරි මාසයේ සිට 2016 පෙබරවාරි මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාරගත වී තිබුණි. එකී කාලය තුළ එම මන්ත්‍රීවරුන් සබරගමුව පළාත් සභාව මගින් පැවැත්වූ සභා රැස්වීම් කිසිවකට හෝ සහභාගී වී නොතිබුණි. බන්ධනාගාර ගතව සිටි කාලය තුළ සබරගමුව පළාත් සභාව වෙත ඔවුන්ගේ සේවය ලැබී නොතිබුණද, එම කාලපරිච්ඡේදය සඳහා වැටුපට අමතරව රියදුරු දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා සහ සංග්‍රහ දීමනා වෙනුවෙන් එකතුව රු.මිලියන 1.19 ක් ගෙවා තිබුණි.

රජයේ නිවාස කුලී අයකිරීම් විධිමත් පරිදි සිදු නොකිරීම

පළාත් සභාවට අයත් රජයේ නිවාස 12 ක 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පදිංචිව සිටි නිලධාරින්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව නිවාස කුලී අයකිරීම හේතුවෙන් එකතුව රු. මිලියන 2.58 ක ආදායමක් පළාත් සභාවට අහිමි වී තිබුණි.

පළාත් සභා ප්‍රතිපාදනවලින් තිලිණ මිලදීගෙන ප්‍රදානය කිරීම

2015 වර්ෂයේදී ආණ්ඩුකාරවරයා විසින් විවිධ පාර්ශවයන් වෙත තිළිණ වශයෙන්

විවිධ භාණ්ඩ බෙදා හැරීම සඳහා රු. මිලියන 4.07 ක් වැයකර තිබුණි.

මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඌන උපයෝජිතව පැවතීම

- පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සබරගමුව පළාත තුළ තෝරා ගත් පාසල් 15 ක එකතුව රු.මිලියන 133.29 ක වියදමින් මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකර තිබුණි. එම ඉදිකිරීම් නිමකර වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වී තිබුණත්, තාක්ෂණික විද්‍යාගාර 5 ක් 2017 මාර්තු මාසය වන විටත් නිල වශයෙන් සිසු අයිතියට පත් කර නොතිබුණි.

- මහින්දෝදය විද්‍යාගාර සඳහා 2015 වර්ෂයේදී මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 83.50 ක් වූ පරිගණක හා උපාංග, පුටු හා මේස ඇතුළු උපකරණ වර්ග 25 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටද මිලදී ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එම උපකරණ ලැබී නොමැති පාසල්වල තාක්ෂණික විද්‍යාගාර ඌන උපයෝජිතව පැවතුණි.

නොදිරන කසල ගබඩා කිරීමට පහසුකම් ලබානොදීම

සබරගමුව පළාත් විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන පිළිබඳ රැස්වීම් වාර්තාවට අනුව නොදිරන කසල ගබඩා කිරීමට පහසුකම් නොතිබුණු පළාත් පාලන ආයතනවලට ගබඩා පහසුකම් සඳහා ගොඩනැගිලි ඉදිකරදීමට තීරණය කර තිබුණි. 2017 ජූනි 30 දින වන විටත් සබරගමුව පළාතේ ගබඩා පහසුකම් නොතිබුණු පළාත් පාලන ආයතන 12 ක් සඳහා ගබඩා පහසුකම් ලබා දී නොතිබුණි.

වයඹ පළාත් සභාව

වයඹ පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා රු.මිලියන 35,346 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 7,711 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 43,057 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 29,359 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 13,697 ක් වශයෙන්ද එකතුව රු මිලියන 43,056 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 25,701 ක්ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 7,518 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 33,219 ක ආදායම් රැස්කර තිබුණි. 2016 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 28,224 ක් හා මූලධන වියදම රු.මිලියන 4,778 ක් වශයෙන් රු.මිලියන රු.33,002 ක් උපයෝජනය කර තිබුණි.

වයඹ පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් 2016 වර්ෂයට අදාළව වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩණය කර පහත දැක්වේ.

බදු මුදල් අය නොකිරීම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මාදැල්පාඩු හිමිකරුවන් 12 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 0.36 ක්ද, ලුණු වෙක්කාල 167 කින් රු.මිලියන 3.68 ක් සහ ඉස්සන් ව්‍යාපෘතිවලින් රු.මිලියන0.18 ක් වශයෙන් එකතුව රු.මිලියන 4.22 ක් වූ බදු සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිඟහිටව පැවැති අතර, එම හිඟහිටි ආදායම් එකතු කිරීමට කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ වූ රජයේ ඉඩම් දීර්ඝ කාලීනව බදු දී තිබුණත්, 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාර්ෂිකව අයවිය යුතු එකතුව රු.මිලියන 1.46 ක බදු මුදල් අයකර ගැනීමට පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

වෛද්‍ය උපකරණ මිලදී ගැනීම

සමාලෝචිත වර්ෂයේ අවස්ථා 38 කදී පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 134.62 ක් වූ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයකින් තොරව තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ ලබාදී තිබුණි.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ එකතුවන කැලි කසල සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නවගත්තේගම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් යෝග්‍ය ඉඩමක් ලබා දී නොතිබුණි. එම කාර්ය සඳහා රු.මිලියන 1.78 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ව්‍යාපෘතිය ඉටු කිරීමට නොහැකිවීම නිසා එම ප්‍රතිපාදන ආපසු යවා තිබුණි.

අරමුදල් සඳහා දායක මුදල් නොගෙවීම

පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 6.19 ක දායක මුදල් ගෙවා නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම

දායක මුදල් නොගෙවීම මත රු.මිලියන 5.24 ක දණ්ඩනයක්ද නියම කර තිබුණි.

වකුගඩු රෝගීන් පරීක්ෂා කිරීම

අඹන්පොල, කොබෙයිගනේ, පොල්පිතිගම, ගල්ගමුව, ගිරිබාව, නිකවැරටිය සහ මහව ප්‍රදේශවල වකුගඩු රෝගීන් හඳුනාගැනීමට හා අදාළ රෝගීන් පරීක්ෂා කිරීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 5.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද, අග්‍රිම වශයෙන් රු.මිලියන 1.58 ක් පමණක් නිදහස් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී වකුගඩු රෝගීන් පරීක්ෂා කිරීම අපේක්ෂා කළ මට්ටමෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

පරිසර හානිය වැලැක්වීම

පරිසර බලපත්‍ර ලබා නොගෙන කර්මාන්ත පවත්වා ගෙන යන කර්මාන්ත හිමියන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පරිසර ප්‍රඥප්තිය බලාත්මක කර නොතිබුණි. එවැනි කර්මාන්ත මඟින් පරිසරයට සිදු කරන හානිය අවම කර ගැනීමට ගත යුතුව ඇති නීත්‍යානුකූල ක්‍රියාමාර්ග පිළිබඳ විධිමත් වැඩපිළිවෙලක් හඳුනාගෙන නොතිබුණි. වයඹ පරිසර අධිකාරිය පිහිටුවා වර්ෂ 21 ක් ඉක්මවා තිබුණත්, ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

තාක්ෂණ විද්‍යාගාර සඳහා ගුරුභවතුන් නොමැතිවීම

වයඹ පළාතේ පිහිටි ද්විතියික පාසල්වල තාක්ෂණ විද්‍යාගාර 126 ක් ස්ථාපිත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට පාසල් 36 ක පමණක් උසස් පෙළ විද්‍යා/ගණිත පංති ආරම්භ කර තිබුණි. එම විෂයයන්ට අදාළ ගුරු හිඟය 47 ක් වී තිබුණි. 2015 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පාසල් 20 කින් විද්‍යා / ගණිත අංශයෙන් සිසුන් 127 ක් පෙනී සිට තිබුණත්, ඉන් සිසුන් 11 දෙනෙක් පමණක් සමත් වී තිබුණි.

අවම ලංසුව ප්‍රතික්ෂේප කිරීම

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් Multipara Monitors 15 ක් මිලදී ගැනීමේදී සියලු තාක්ෂණික පිරිවිතරයන් සපුරා තිබූ නඩත්තු පිරිවැය සමඟ රු.මිලියන 3.75 කට ඉදිරිපත් කර තිබුණු ලංසුව ප්‍රතික්ෂේප කර, නඩත්තු පිරිවැය සමඟ රු.මිලියන 6.23 ක් සඳහන් කර තිබුණු ලංසුව පිළිගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ නිසා පළාත් සභා අරමුදලින් රු.මිලියන 2.48 වැඩි පුර ගෙවා තිබුණි.

අත්හැරදැමූ ඉදිකිරීම් කටයුතු

පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසින් අටමුනේ විද්‍යාල භූමියේ ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේදී රු.900,000 වැය කර තිබුණි. පසුව එම ඉදිකිරීම් කාර්ය අතහැර තිබුණි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබීම

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී පෙරමෝන උගුල් 20,300 ක්, ප්‍රතිරෝධී දැල් මීටර් 6250 ක්, පැපොල් නෙලන උපකරණ 120 ක්, ඉණිමං 20 ක්, කලු පොලිතීන් බඳුන් 755,300 ක්, පොලිතීන් කැබලි 700 ක් සහ ඇසුරුම් 20,000 ක් මිලදී ගැනීම සඳහා තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව එකතුව රු.මිලියන 13.35 කට මිලදී ගෙන තිබුණි.

5 වසර ශිෂ්‍යාධාර මුදල් නොගෙවීම

කුරුණෑගල කළාප අධ්‍යාපන කාර්යාලය විසින් පාසල් 15 ක ශිෂ්‍යත්වලාභීන් 176 ක් වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවල එකතුව රු.210,500 ක ශිෂ්‍යාධාර මුදල් ගෙවා නොතිබුණි.

ජල පිරිපහදු යන්ත්‍රය අක්‍රියවීම

වගකීම් කාල සීමාව තුළ සම්පූර්ණයෙන්ම අක්‍රියවී තිබුණු රු.මිලියන 3.40 ක් වටිනා ගිරිබාව ඉහළ මරදංකඩවල ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු පද්ධතිය වෙනුවට නව පිරිපහදු පද්ධතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

අරමුණුගත කාර්යයන් සඳහා සම්පත් යොදා නොගැනීම

පොල්පිතිගම රඹේ සංස්කෘතික මධ්‍යස්ථානය රු.මිලියන 9.02 ක් වැය කර 2016 වර්ෂයේදී ඉදිකිරීම් නිම කර තිබුණත්, 2017 මැයි මාසය වන විටත් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි.

මඩහපොල ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ ඉහළ මාලය පාවිච්චි කිරීමට සුදුසු පරිදි බෙදා වෙන්කිරීම වෙනුවෙන් රු.මිලියන 1.06 ක් වැය කර තිබුණත්, 2017 මැයි මාසය වන විටත් එම මහළ කිසිදු කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

ප්‍රමිතියෙන් තොරව යන්ත්‍ර මිලදී ගැනීම

2014 වර්ෂයේදී පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් කිලෝ ග්‍රෑම් 60 ක ධාරිතාවයෙන් යුත් නුල් වියලීමේ යන්ත්‍රයක් රු.මිලියන 1.76 කට මිලදී ගෙන තිබුණි. නමුත් එම යන්ත්‍රයෙන් වරකට වියලිය හැකි නුල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 12.5 ක් බවත් ඒ අනුව දිනකට කිලෝ ග්‍රෑම් 25 ක පමණ නුල් වියලීම සිදුකළ හැකි බව අනාවරණය වී තිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු යන්ත්‍රය අපේක්ෂිත ධාරිතා මට්ටමක නොතිබුණි.

කුලියාපිටිය රෝහලේ පල්දෝරු පද්ධතිය අක්‍රියවීම

2008 වර්ෂයේදී රු.මිලියන 18.5 ක් වැයකර කුලියාපිටිය මූලික රෝහලේ ඉදිකරන ලද පල්දෝරු පද්ධතිය 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දිගින් දිගටම අක්‍රියවීම නිසා ගලි බවුසරයකින් අපද්‍රව්‍ය ඉවත් කිරීමට සිදුවී තිබුණි. මෙම පල්දෝරු පද්ධතිය නැවත අළුත්වැඩියා කිරීම සඳහා 2016 වර්ෂයේදී පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ රු.මිලියන 15.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

ඌව පළාත් සභාව විසින් 2016 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 22,979 ක ආදායම රු.මිලියන 18,587 ක් රජයේ ප්‍රදාන මඟින් ලබාගැනීමට හා රු.මිලියන 2,685 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කිරීමටද, ඇස්තමේන්තු කර තිබුණි. ඉන් රු.මිලියන 18,935 ක් පුනරාවර්තන වියදම් සඳහා හා රු.මිලියන 3,570 ක් මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 18,588 ක් ලැබී තිබුණු අතර රු.මිලියන 3,296 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කර තිබුණි. තවද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 19,386 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 2,998 ක් වැය කර තිබුණි.

ඌව පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහතින් දක්වා ඇත.

පිලිපිනයේ හා තායිලන්තයේ වැඩමුළු

දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම (TSEP) ව්‍යාපෘතිය යටතේ 2016 ජනවාරි 10 දින සිට 24 දින දක්වා පිලිපීනයේ හා තායිලන්තයේ දී පැවති පාසල් පාදක කළමනාකරණය හා පාසල් පාදක ගුරු සම්බන්ධතා වැඩමුළුව සඳහා ඌව පළාත් සභාවේ රාජ්‍ය නිලධාරින් 30 දෙනෙකු සහභාගිවී තිබුණි. ඒ සඳහා ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.මිලියන 30.88 ක් වැය කර තිබුණි. 2016 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා තිබුණු ධාරිතා සංවර්ධනයේ අරමුණ වූ කළාප අධ්‍යාපන හා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ධාරිතා වර්ධනය කිරීමට පටහැනිව වෙනත් ක්ෂේත්‍රවල නිලධාරින් 10 දෙනෙකු සහභාගි කර ඒ වෙනුවෙන් රු.මිලියන 10.67 ක් වැය කර තිබුණි. තවද මෙම වැඩසටහන සඳහා තෝරාගෙන තිබුණු පුහුණු ආයතනයේ පරිණතභාවය හා හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු නොකර එම ආයතනයට රු.මිලියන 8.36 ක් ගෙවා තිබුණි.

ග්‍රාමීය විදුලිබල හා බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,නීතීය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය විදුලිබල හා බලශක්ති සඳහා රු.මිලියන 10.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම කාර්ය සඳහා 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 8.60 ක් වැයකර තිබුණි. මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ 2015 නොවැම්බර් 26 දිනැති අංක එෆ්සී/3/2/2016 දරන 2016 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 මාර්ගෝපදේශයේ විධිවිධාන පරිදි පොදු විදුලි දිගු සඳහා පමණක් ප්‍රතිපාදන යෙදවිය යුතු වුවද, ඊට පටහැනිව නිවාසවලට තනි විදුලි රැහැන් ඇදීම සඳහා ප්‍රතිපාදන වැය කර තිබුණු අවස්ථා අනාවරණය විය. තවද විකල්ප විදුලිය ජනනයන් ලබාදීම සහ විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම, සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

වැලිමඩ ප්‍රාදේශීය සභාව - මළප්‍රවාහන ව්‍යාපෘතිය

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත වැලිමඩ

නගරයේ මළප්‍රවාහන පද්ධතිය සකස් කිරීමට 2011 පෙබරවාරි 10 දින රු.මිලියන 92.51 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර, අතිරේක වැඩ ඇතුළත් කරමින් 2012 අප්‍රේල් 05 දින රු.මිලියන 109.61 ක නව ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත්කාර සමාගම විසින් 2013 ජනවාරි 14 දින වැලිමඩ ප්‍රාදේශීය සභාවට ව්‍යාපෘතිය භාර දී තිබුණු අතර, එහිදී රු.මිලියන 10.96 ක් වූ ප්‍රමාද ගාස්තුව අයකර නොගෙන රැඳවුම් මුදල් ඇතුළුව සම්පූර්ණ ගිවිසුම්ගත මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- ප්‍රතිලාභීන්ගේ වැසිකිළිවලට වඩා ඉහළින් ව්‍යාපෘතියේ මළප්‍රවාහන නල පද්ධතිය ගමන් කර තිබුණි.
- මළ අපද්‍රව්‍ය ගබඩා කරන ටැංකියට ජලය කාන්දුවීම,
- ඇස්තමේන්තුගත මළප්‍රවාහන සම්බන්ධතා සංඛ්‍යාව 300 ක් වුවද, පරීක්ෂණ අවස්ථාව වනවිට ලබාදී තිබුණු සම්බන්ධතා ගණන 17 ක් වී තිබුණි.
- මළප්‍රවාහන නල පද්ධතිය පුපුරායාම හා ප්‍රධාන පූතික ටැංකියේ මළ අපද්‍රව්‍ය සහිත ජලය බාහිර පරිසරයට කාන්දු වී තිබුණි.

රජයේ ඉඩම් වාණිජ කටයුතු සඳහා බදු දීම

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මීපිලිමාන පිහිටි හෙක්ටයාර 11.056 කින් බිම් කොටසක් වාණිජ කටයුත්තක් සඳහා වසර 30 ක කාලයකට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත බදු දීමට 2011 මැයි 09 දින ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කර තිබුණි. ඉඩම බදු දීම සම්බන්ධයෙන් බදු ගිවිසුමකට එළඹීමට හෝ බදු ඔප්පුවක් පිළියෙල කිරීමට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. මෙම ඉඩමෙන් අක්කර 19 ක භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් වසරකට රු.මිලියන 2.76 ක බදු කුලියකට 2012 නොවැම්බර් 06 දින සිට වගා කටයුතු සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබුණි. දිස්ත්‍රික් තක්සේරුකරුගේ 2012 ජූනි 14 දිනැති තක්සේරු වාර්තාව අනුව 2012 සිට 2016 වර්ෂය දක්වා ඌව පළාත් සභාවට ගුවන් විදුලි සංස්ථාවෙන් අය වියයුතු රු.මිලියන 8.68 ක් වූ බදු ආදායම අයකර ගෙන නොතිබුණි. මෙම ඉඩමෙහි නීත්‍යානුකූල අවසරයකින් තොරව වගා කටයුතු සහ නේවාසික කටයුතු කරගෙන යන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ජාතික යොවුන් සේනාංකය සහ පෞද්ගලික පාර්ශවයන් සම්බන්ධයෙන් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

උසාවි දඩ හා මුද්දර ගාස්තු

1979 අංක 42 දරන මහා නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මහා නගර සභා 02 කට, නගර සභා 01 කට හා ප්‍රාදේශීය සභා 25 කට අයවිය යුතු උසාවි දඩ රු.මිලියන 77.59 ක් හා මුද්දර ගාස්තු රු.මිලියන 74.32 ක් පළාත් පාලන ආයතන වෙත ගෙවා නොතිබුණි.

අධ්‍යාපන කටයුතු

ඌව පළාත් සභාවේ පළාත් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- බණ්ඩාරවෙල අධ්‍යාපන කළාපයේ 2014 – 2016 දක්වා කාල පරිච්ඡේදය තුළ පැවැත්වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හා 2014 – 2015 වර්ෂවල පැවැත්වූ අධ්‍යයන පොදු

සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් එකම පාසල් ලැයිස්තුවක වූ සිසුන සියයට 50 කට අඩු ප්‍රමාණයක් එම විභාග සමත් වී තිබුණි.

- ගුණාත්මක යෙදවුම් සංරචකය යටතේ පාසල් 68 ක් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 3.59 ක මුදලක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන 2016 ජුනි මාසයේදී රජයේ ආදායමට බැර කර තිබුණි. ඒ අනුව ගුණාත්මක යෙදවුම් සඳහා ලබා දුන් ප්‍රතිපාදනවලින් අපේක්ෂිත අරමුණු ඉටු කර නොතිබුණි.

- ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුභසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් රු.මිලියන 15.00 ක් වැය කර ඌව පළාතේ පාසල් සඳහා ළමා මේස 2600 ක්, ළමා පුටු 2600 ක්, ළදරු මේස 867 ක් හා ළදරු පුටු 1734 ක් මිලදී ගෙන තිබුණි. එම සමහර ළමා මේස හා පුටුවලට අනුමත පරිවිතරයන්ට අනුකූල නොවූ ලෑලි යොදා තිබුණු අතර ඇණ හිස් වසා නොතිබීම හා ලෑලි අතර හිඩැස්ද තිබුණි. සමහර ළමා මේසවල මතුපිට ලෑලි තට්ටුව පුපුරා තිබුණි.

කෘෂිකාර්මික කටයුතු

පළාත් කෘෂිකර්මය සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- ඌව පළාතේ ජීවත්වන මිලියන 1.33 ක් පමණ වූ ජනගහනයෙන් මිලියන 0.4 ක් හෙවත් සියයට 30 ක පමණ ප්‍රමාණයක ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මය වේ. ඒ අනුව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් "පෝෂණයෙන් සපිරි සෞභාග්‍යමත් ඌව වෙල්ලස්සක්" යන දැක්ම යටතේ පළාත් කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධනය සඳහා 2016 වර්ෂයේ රු.මිලියන 370 ක් වැය කර තිබුණි. පසුගිය වර්ෂයේ එම වියදම රු.මිලියන 80 ක් වී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු.මිලියන 290 ක් වැඩියෙන් වියදම් කර තිබුණු නමුත්, අදාළ නිෂ්පාදනවල ප්‍රමාණයන් අඩු වී තිබුණි. විස්තර වගුව 42 හි දැක්වේ.

බෝග වර්ගය	වර්ෂය		2015 වර්ෂයට සාපේක්ෂව අඩුවීම
	2015	2016	
වී වගා කරන භූමි ප්‍රමාණය			
මහ (හෙක්ටයාර්)	525,575	45,140	480,435
යල (හෙක්ටයාර්)	26,264	23,057	3,207
වාර්ෂික වී නිෂ්පාදනය			
මහ (මෙ.ටොන්)	1,944,627	167,017	1,777,610
යල (මෙ.ටොන්)	97,179	85,312	11,867
අර්තාපල්			
වගා කළ භූමි ප්‍රමාණය (හෙක්ටර් යාර)	4,296	3,757	539
වාර්ෂික නිෂ්පාදනය (මෙ.ටොන්)	64,438	56,367	8,071
අතිරේක බෝග			
අතිරේක බෝග නිෂ්පාදනය (හෙක්යර්යාර)	45,678	32,609	13,069
අතිරේක බෝග නිෂ්පාදනය (මෙ.ටොන්)	121,576	100,313	21,263
එළවළු			
එළවළු වගාකරන භූමි ප්‍රමාණය (හෙක්ටර්යාර)	13,114	12,202	912
වාර්ෂික එළවළු නිෂ්පාදනය (මෙ.ටොන්)	167,752	151,521	16,231

වගුව 42 - ඌව පළාතේ වගා කළ කෘෂි භූමි ප්‍රමාණය හා ඵලදාව
මූලාශ්‍රය - ඌව පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශයේ දත්ත

- ඔක්කම්පිටිය බීජ ගොවිපලේ ධාවනයෙන් ඉවත් කර තිබුණු ට්‍රැක්ටර් 03 ක්, අත්ට්‍රැක්ටරයක් සහ යතුරු පැදි 02 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

- ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කාර්යාල කාර්ය සහයක සේවයේ අනුමත සේවක සංඛ්‍යාවට අතිරේකව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය සඳහා යොදවාගත් කම්කරුවන් 06 දෙනෙකු සඳහා 2015 හා 2016 වර්ෂයේදී රු.මිලියන 3.19 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

- බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ කෘෂිකර්මාන්තය පාදක කර ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක වුවත්, ක්ෂේත්‍රයේ සම්බන්ධීකරණයට අවශ්‍ය කෘෂිකර්ම උපදේශකවරුන් 37 ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

- ඌව පළාත් මුදල් රීති 510.2 අනුව අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් උත්පාදනය වන ලාභ පළාත් සභා අරමුදලට බැර කළ යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය අනුව සමුච්චිත ලාභ රු.මිලියන 9.35 ක් පළාත් සභා අරමුදලට බැරකර නොතිබුණි.

- ඌව පළාත් මුදල් රීති 501.3.ඇ රීතියට පටහැනිව අදාළ විෂය අංක 71402 දරන ඔක්කම්පිටියේ බීජ ගොවිපළේ අත්තිකාරම් කටයුත්තේ 2016 වර්ෂයට අදාළව උපරිම හර ශේෂ සීමාව රු.මිලියන 1.91 කින් ඉක්මවා තිබුණි.

සෞඛ්‍ය කටයුතු

පළාත් සෞඛ්‍ය සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- 2016 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ සෞඛ්‍ය සේවාවේ අත්‍යවශ්‍ය තනතුරුවල අනුමත කාර්යය මණ්ඩල සේවක සංඛ්‍යාව 2,861 ක් වූ අතර ඉන් තනතුරු 608 ක් පුරප්පාඩුව පැවතුණි.

- පළාත් රෝහල් 06 ක 2016 වර්ෂයේ අමු / පිසූ ආහාර සැපයීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අදාළ නොවන පරිදි අවම මිල ගණන් ඉදිරිපත් කළ ලංසු ප්‍රතික්ෂේප කර ඊට ඉහළ මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසු පිළිගැනීම හේතුවෙන් පළාත් සභා අරමුදලට රු.මිලියන 7.80 ක අලාභයක් සිදුව තිබුණි.

- මහියංගණ රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු 2014 අගෝස්තු 13 දින සිට 2016 අගෝස්තු මාසය දක්වා කාලය තුළ හෝමාගම මූලික රෝහලට අනුයුක්ත කර තිබුණු අතර, ඒ සඳහා පළාත් සභා අරමුදලෙන් රු.මිලියන 2.08 ක වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

- මහවැලි ව්‍යාපෘතිය යටතේ 1984 වර්ෂයේදී ගිරාඳුරුකෝට්ටේ ප්‍රාදේශීය රෝහල ස්ථාපිත කර වර්ෂ 32 ක පමණ කාලයක් ගතවී තිබුණත්, රෝහලට අයත් භූමිය ඌව පළාත් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

- බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ධාවනයෙන් ඉවත් කරන ලද වාහන 06 ක් වර්ෂ 04 ක පමණ කාලයක සිට අදාළ අපහරණ කටයුතු සිදු නොකර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය අධ්‍යාපන ඒකකයේ ගාල් කර තිබුණි.

- වැලිමඩ මූලික රෝහල සතු හෙක්ටයාර් 0.409 ක ඉඩම් ප්‍රමාණයක් බාහිර පාර්ශවයන් 11 දෙනෙකු විසින් අනවසරයෙන් අත්පත් කර ගෙන භුක්ති විඳින අතර එම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ කටයුතු කර නොතිබුණි.

- වැලිමඩ මූලික රෝහල වෙත ලබාදී ඇති රු.මිලියන 9.29 ක් වටිනා ශල්‍ය උපකරණ හා රු.මිලියන 3.56 ක් වටිනා රෙදි සෝදන යන්ත්‍රයක් වර්ෂ 02 කට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

- දියතලාව මූලික රෝහල තුළ අක්ෂි ප්‍රතිකාර කටයුතු සිදුකිරීම සඳහා 2015 වර්ෂයේදී ලබාගත් Ophthalmoscopy උපකරණය 2017 පෙබරවාරි දක්වාම භාවිතා නොකර නිශ්කාර්යව දියතලාව මූලික රෝහලේ ශල්‍ය ද්‍රව්‍ය ගබඩාවේ ගබඩා කර තිබුණි.

- මහියංගණ රෝහල සතුව අංග සම්පූර්ණ අක්ෂි ශල්‍යාගාරයක් පැවතුණද, අක්ෂි ශල්‍ය විශේෂඥවරයෙකු අනුයුක්ත නොකිරීම හේතුවෙන් 2013 මැයි මාසයේ සිට එය නිෂ්ක්‍රීයව පැවතුණි.

- 2016 අගෝස්තු මාසයට අදාල සිදුකළ නියදි පරීක්ෂාවේදී මුරකුටියේ පැමිණීමේ හා පිටවීමේ ලේඛනයට අනුව බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන 05 ක් ධාවනයේ නොයොදා කාර්යාල පරිශ්‍රයේ නවතා තිබියදී, අවස්ථා 39 කදී

කිලෝමීටර් 6597 ක් ධාවනය වූ බවට ව්‍යාජ ලෙස ධාවන සටහන් ලියා තිබුණි.

- පළාත් සභා මුදල් රීති 762.1 ප්‍රකාර ප්‍රමාණවත් තොග මට්ටම් පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් දියතලාව මූලික රෝහලේ වටිනාකම රු. 888,184 ක්වූ වර්ග 29 කට අයත් ඖෂධ තොගයක්ද, වටිනාකම ගණනය නොකළ වර්ග 15 කට අයත් ඖෂධ තොගයක්ද කල් ඉකුත්ව, පළුදුවී භාවිතයෙන් ඉවත්කිරීමට සිදුවී තිබුණි.